ඒකාබද්ධ වාර්ෂික වාර්තාව - 2019

# අනාගතය වෙත ජවයෙන් පිරි ගමනක්

## එළඹෙන ඩිජිටල් යුගයෙන් දිරිමත්ව



ජාතික ඉතිරිකිරීමේ බැංකුව

# අනාගතය වෙත ජවයෙන් පිරි ගමනක්

**එළඹෙන ඩිජිටල් යුගයෙන් දිරිමත්ව**

විශ්වාසය, ආරක්ෂාව සහ ශක්තිය සමග මුහුවූ උරුමයක් සමග අපගේ ගනුදෙනුකරුවන් වෙත පූර්ණ මූල්‍ය විසඳුම් සැපයීමෙහිලා අපි අනාගතය වෙත ජවසම්පන්න ගමනක යෙදී සිටිමු. නිරන්තරයෙන් පරිණාමය වන ඩිජිටල් අවකාශය සහ එහි සියළු විභවයන් හේතුවෙන් ක්ෂේත්‍ර අතර පවත්නා සාම්ප්‍රදායික කඩඉම් සීමා මැකී යමින් තිබෙන අපූර්ව සන්ධිස්ථානයකට වර්තමානයේදී අපි පිවිස සිටිමු. අපි මෙලෙස ඉදිරි ගමනේ යෙදෙන අතරතුර ඉතිරිකිරීමේ සංස්කෘතියක් නිර්මාණය කිරීමෙහිලා අපගේ කැපවීම, තිරසාරභාවය කෙරෙහි වන අපගේ ප්‍රතිඥාව සහ ජාතියට සේවය කිරීම සඳහා වන අපගේ වගකීම නැවත බලගැන්වීමට අපි උත්සුක වෙමු. අපගේ ගමන දිරිමත්ය. අපගේ ගමන ජවසම්පන්නය.

# පටුන

ග්‍රන්ථය - 01
ඒකාබද්ධ වාර්ෂික වාර්තාව 2019

## පිටුව 4

### පූර්විකාව


4 මෙම වාර්තාව ගැන
7 ජාතික ඉතිරිකිරීමේ බැංකුව පිළිබඳව කෙටියෙන්
10 සන්ධිස්ථාන
11 වැදගත් මූල්‍ය තොරතුරු
12 සභාපතිතුමියගේ පණිවිඩය
16 සාමාන්‍යාධිකාරිනී/ප්‍රධාන විධායක නිළධාරිනියගේ සමාලෝචනය


## පිටුව 19

### අපගේ වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ දැක්ම, මෙහෙවර, වටිනාකම් සහ උපාය මාර්ග ආදියෙන් මාර්ගෝපදේශය ලැබූ බැංකුවේ වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය පිළිබඳ විස්තීර්ණ සාකච්ඡාවකි. වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය පිළිබඳ දළ විශ්ලේෂණයක් ඉදිරිපත්කරන ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ව්‍යාපාර ආකෘතිය මෙම කොටසට ඇතුළත් වේ. තවද, එමඟින් බැංකුවේ මෙහෙයුම් පරිසරය ඉදිරිපත් කරනු ලබන අතර, බැංකුවේ උපාය මාර්ග සකස් කිරීමට දායකවන බැංකුවේ ගනුදෙනුකරුවන් නිරතකර ගැනීමේ ක්‍රියාවලිය, සැලකියයුතු කරුණු හඳුනාගැනීමේ ක්‍රියාවලිය සහ තිරසාර ප්‍රතිපත්තිය කෙටියෙන් දක්වයි.


20 අපගේ තිරසාර ව්‍යාපාර ආකෘතිය
22 මෙහෙයුම් පරිසරය
49 උපායමාර්ග සහ සම්පත් වෙන්කිරීම
70 ඒකාබද්ධ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය
78 ප්‍රමාණාත්මක කරුණු


## පිටුව 89

### කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

මෙම කොටස එක් එක් ප්‍රාග්ධනයට අනුකූලව ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි මෙහෙයුම්, කාර්ය සාධනය, අභියෝග සහ අනාගත දර්ශනය පිළිබඳ සවිස්තරාත්මක සමාලෝචනයකි. තවද, අපගේ ව්‍යාපාරික කටයුතු සහ කාර්ය සාධනයේ බැඳෙන කොටසක් වන තිරසාරභාවය සම්බන්ධයෙන් ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි තත්ත්වය මෙමගින් ගෙන හැර දක්වයි.


90 මූල්‍ය ප්‍රාග්ධනය
112 නිෂ්පාදිත ප්‍රාග්ධනය
120 බුද්ධිමය ප්‍රාග්ධනය
130 මානව ප්‍රාග්ධනය
144 සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය
162 ස්වභාවික ප්‍රාග්ධනය
170 මූලික නිර්ණායකවලට අනුකූලව ගෝලීය වාර්තාකරණ මුලපිරීම් (GRI) දර්ශකය


## පිටුව 175

### පාලනය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආයතනික පාලනය, අනුකූලතාවය සහ අවදානම් කළමනාකරණ කාර්යරාමුව යන සාධක වලින් සුසැදි ඒකාබද්ධ පද්ධතිය පිළිබඳ සමාලෝචනයකි. බැංකුව තුල ආයතනික පාලනය ස්ථාපිත කිරීම තුළින් කාර්යක්ෂම මෙහෙයුම්, ප්‍රාග්ධනය සඳහා වැඩි දියුනු කළ ප්‍රවේශ හිමිවීම, අවදානම් අවම කිරීම, සහ ඇල්මැති පාර්ශවයන්ව ආරක්ෂා වීම සිදු වේ.


176 අධ්‍යක්ෂ මණ්ඩලය
180 ආයතනික කළමනාකාරීත්වය
182 විධායක කළමනාකාරීත්වය
184 ප්‍රධාන කළමනාකරුවන්
185 ආයතනික යහ පාලනය පිළිබඳ ප්‍රකාශය
186 අවදානම් කළමනාකරණය පිළිබඳ ප්‍රකාශය




ග්‍රන්ථය - 02
ඇමුණුම 2019

## පිටුව 187

## මූල්‍ය වාර්තා

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ 2019 වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධනය සහ මූල්‍ය තත්ත්වය, ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය මගින් නිරූපණය කරනු ලබයි. මූල්‍ය ප්‍රකාශන සමග මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් මූල්‍ය වාර්තා යටතේ ග්‍රන්ථය 02 හි දක්වා ඇත.


188 ආදායම් ප්‍රකාශය
189 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
190 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
192 ආයතනික තොරතුරු


## පාලනය (පිටුව 196)


196 ආයතනික පාලනය
233 අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව
237 අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවේ වාර්තාව
239 අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව
241 අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව
244 අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුවේ වාර්තාව
246 අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපාය මාර්ග කමිටුවේ වාර්තාව
248 අවදානම් කළමනාකරණය


## මූල්‍ය වාර්තා (පිටුව 275)



276 මූල්‍ය දින දර්ශනය
277 අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව
283 මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම සම්බන්ධ ප්‍රකාශය
285 මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය
287 අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතික වාර්තාව
288 ස්වාධීන සහතිකවීමේ වාර්තාව
291 සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ (මුදල් හා සැලසුම්) වගකීම පිළිබඳ ප්‍රකාශය
293 විගණකාධිපති වාර්තාව
295 මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගතය
296 ආදායම් ප්‍රකාශය
297 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
298 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
300 හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය
304 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
306 මූල්‍ය ප්‍රකාශනවලට සටහන්


## අතිරේක තොරතුරු (පිටුව 425)


426 නිමැවුම් හා සේවාවන්
430 ආදායම් ප්‍රකාශය - ඇමරිකානු ඩොලර් වලින්
431 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය - ඇමරිකානු ඩොලර් වලින්
432 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය - ඇමරිකානු ඩොලර් වලින්
433 2016 අංක 1 දරන බැංකු පනතේ නියෝගයෙහි III උපලේඛනය ප්‍රකාර බාසල් III හෙළිදරව්කිරීම්
446 දේශීය පද්ධති අනුව වැදගත් බැංකු තක්සේරු කිරීමේ ක්‍රියාකාරකම - 2019
448 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද අනෙකුත් හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන්
455 සංඛ්‍යාලේඛනාත්මක දර්ශකයන් 2010 - 2019
457 තැන්පතු විශ්ලේෂණය
458 අනුරූප බැංකු
459 විදේශ විනිමය හුවමාරු සමාගම්
461 යුරෝජයිරෝ සමාජිකත්වය
462 මූල්‍ය සහ බැංකුකරණයට අදාළ පාරිභාෂිත වචන මාලාව

# මෙම වාර්තාව ගැන

GRI 102-1




2019 ලිත් වර්ෂය සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව එහි 6 වන ඒකාබද්ධ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටිනි. පවතින ආර්ථික, සමාජයීය සහ පාරිසරික සන්දර්භය තුළ බැංකුවේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු මෙම වාර්ෂික වාර්තාවෙන් ඉදිරිපත් කෙරේ.

## වටිනාකම් නිර්මාණය සඳහා වන අපගේ ඒකාබද්ධ චින්තන ප්‍රවේශය

සංකීර්ණ ලෝකයක ක්‍රියාත්මක වන ආදර්ශමත් සංවිධානයක් ලෙස වටිනාකම් නිර්මාණයෙහිලා අපගේ හැකියාව කෙරෙහි බලපෑම් කරන අභ්‍යන්තර හා බාහිර සාධක හේතුවෙන් ඇති වන අභියෝග, අන්තර් යැපීම් සහ වෙළඳ ගැළපුම් මධ්‍යයේ අපි නොසැලී ඉදිරියට ගමන් කරමින් සිටිමු. තිරසාර වටිනාකම් නිර්මාණයෙහිලා අපගේ ක්‍රියාවලිය, අපගේ ගනුදෙනුකරුවන්, පාර්ශවකරුවන් සහ අපගේ උපායමාර්ග අපගේ ඒකාබද්ධ චින්තනය සමග අනුකූලවේ.

ඒකාබද්ධ චින්තනය, අප අපගේ ව්‍යාපාරය කළමනාකරණය කරගන්නේ කෙසේද යන්න සහ අපගේ අභ්‍යන්තර උපායමාර්ග සංවර්ධන සහ වාර්තාකරණ පරිචයන් යන සාධක වලට ආවේණික ලක්ෂණයක් වේ. කාලය ගතවීමත් සමග වටිනාකම් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය සම්පත් සහ සබඳතා අප නිසි පරිදි කළමනාකරණය කරගන්නා බව සහතික කිරීම සඳහා අපගේ උපායමාර්ගය සහ උපායමාර්ගික ස්ථර සය සකස් කර ඇත. එම ප්‍රාග්ධන සාධක සය (කාර්යරාමුවෙහි දැක්වෙන පරිදි) පිළිබඳ සැලකිලිමත් තක්සේරුවක් මගින් මෙම වාර්තාවේ අන්තර්ගතය සහ ව්‍යුහය තීරණය කිරීම සඳහා භාවිත කරන ලද අපගේ උපායමාර්ගය සහ අභ්‍යන්තර ප්‍රමාණාත්මකතා ක්‍රියාවලිය ශක්තිමත් කෙරිණ.

ඒ අනුව, මෙම වාර්තාවෙන් බැංකුවේ උපායමාර්ගය, පාලනය, කාර්යසාධනය සහ ශක්‍යතා පිළිබඳ ඇමුණුම හා ප්‍රමාණවත් තොරතුරු සපයා ඇත. ශීඝ්‍රයෙන් වෙනස් වන මූල්‍ය පරිසරයක් තුළ තිරසාර තරඟකාරී වාසියක් ජනනය කිරීම සඳහා වන අපගේ උපායමාර්ගය එමගින් විග්‍රහ කෙරේ. අපගේ උපායමාර්ගයේ හරය වන ගනුදෙනුකාර සේවාව සම්බන්ධයෙන් විශිෂ්ට ගුණාත්මකභාවයක් සහතික කිරීමෙහිලා අපගේ හැකියාව අපගේ පාර්ශවකරුවන් සමග වන අපගේ සබඳතාවයේ ගුණාත්මකභාවය මත රඳා පවතී. විශ්වාසකටයුතු ආයතනික පුරවැසියෙක් ලෙස අපගේ චලංගුභාවය අපගේ අනෙකුත් පාර්ශවකරුවන්ගේ සහයෝගය මත රඳා පවතී. එබැවින්, අපගේ වාර්තාව, අප ක්ෂේත්‍රයේ සහ සමාජයේ වෙසෙන සියළුම පාර්ශවකරුවන් ආමන්ත්‍රණය කරයි. වටිනාකම් නිර්මාණය කිරීමෙහිලා අප ඔවුන් සමග අත්වැල්බැඳ ගන්නා අතර ඒ සම්බන්ධයෙන් අපි ඔවුන් වෙත වග වෙමු.

## මෙම වාර්තාව කියවන්නේ කෙසේද?

මෙම වාර්තාව කොටස් දෙකක් ලෙස ඉදිරිපත් කර ඇත.

ග්‍රන්ථය 1

### ඒකාබද්ධ වාර්ෂික වාර්තාව 2019

ඒකාබද්ධ වාර්ෂික වාර්තාව 2019 මගින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ උපායමාර්ගය, ප්‍රාග්ධන කළමනාකරණය, අවදානම් කළමනාකරණය සහ පාලනය පිළිබඳව පුළුල් විමසුමක් සිදු කරයි. එය, එහි පාර්ශවකරුවන් වෙත කෙටි, මධ්‍ය සහ දිගු කාලයේදී බැංකුවේ වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය ආමන්ත්‍රණය කරයි. බැංකුවේ මෙහෙයුම්, එහි ජයග්‍රහණ, උපායමාර්ගික අභිමතාර්ථ ක්‍රියාවට නැංවීම, එහි නිමැවුම් කළඹ පුළුල් කිරීම, ප්‍රජාව වෙත එහි දායකත්වය සහ පරිසරය සමග වන සම්බන්ධතාවය, මෙම කොටස මගින් විග්‍රහ කෙරේ. අවශ්‍ය අවස්ථාවලදී වාර්තාකරණ කට්ටලයේ ග්‍රන්ථය 2 වෙතින් තොරතුරු උපුටාගෙන ඇත.

ග්‍රන්ථය 2

### ඇමුණුම

බැංකුවේ ආයතනික පාලනය සහ එහිදී අදාළ කරගන්නා අවදානම් කළමනාකරණ පරිචයන් පිළිබඳ සවිස්තරාත්මක සමාලෝචනයක් ඇමුණුමේ අන්තර්ගත වේ. 2019 මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ සහ සමූහයේ මූල්‍ය කාර්යසාධනය පිළිඹිබු කරන සටහන් සමග විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ සහ අතිරේක තොරතුරු සමග 2019 දෙසැම්බර් 31 දිනට එහි මූල්‍ය තත්ත්වය ඇමුණුමේ ඇතුළත්වේ.

### සංචලන සලකුණු (Navigation Icons)

පරිශීලනය පහසු කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී ලිඛිත අන්තර්ගතයට සාක්ෂ්‍ය දරන සන්නිවේදන මෙලමක් හෝ ඒ වෙනුවට යෙදීම සඳහා මෙම වාර්තාවේ රූපමය සලකුණු භාවිත කර ඇත. ප්‍රාග්ධනය, පාර්ශවකරුවන්, උපායමාර්ගික අභිමතාර්ථ සහ ප්‍රමාණාත්මකතාවය ආශ්‍රිත කරුණු නිරූපනය කිරීම සඳහා මූලික වශයෙන් රූපමය සලකුණු සකස් කර ඇත. මෙම වාර්තාවේ දැක්වෙන මූලික රූපමය සලකුණු වල ලැයිස්තුවක් 6 පිටුවේ දැක්වේ.

### වාර්තාකරණ විෂයය පථය සහ සීමාව

GRI 102-10, 45, 46, 48, 49, 50, 51 and 52

- **වාර්තාකරණ විෂයය පථය සහ සීමාව**

  ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ එහි පූර්ණ පරිපාලිත වන NSB ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව මෙම වාර්ෂික වාර්තාවේ සීමාවට අයත්වේ. වෙන්ව ගත් කළ "බැංකුව" ලෙසද එක්ව ගත් විට "සමූහය" ලෙසද බැංකුව නිසි පරිදි හඳුනාගෙන ඇත. 2014 වාර්ෂික වාර්තාවේ ව්‍යුහයට අනුකූලව බැංකුවේ හා සමූහයේ ප්‍රධාන මූල්‍ය සාධක පිළිබඳව සාකච්ඡා කර තිබෙන අතර නිශ්චිතව සඳහන් කර නොමැති නම් මූල්‍ය නොවන සාධක සාකච්ඡාවට ලක් කර තිබෙන්නේ බැංකුව සම්බන්ධයෙනි.

- **වාර්තාකරණ කාලපරිච්ඡේදය**

  ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ 2019 වාර්ෂික වාර්තාව 2019 ජනවාරි 1 වන දින සිට දෙසැම්බර් 31 දක්වා වන මාස 12 ක කාලපරිච්ඡේදය ආවරණය කරන අතර මූල්‍ය කටයුතු හා තිරසාරභාවය පිළිබඳ වාර්තාකරණය සඳහා වන වාර්ෂික

වාර්තාකරණ චක්‍රයට අනුකූලවේ. එදින සිට වාර්ෂික වාර්තාව සම්පාදනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලද දිනය වන 2020 මාර්තු 24 වන දින දක්වා වාර්තාවූ යම් ප්‍රමාණාත්මක සිදුවීම් ඇත්නම් ඒවාද මෙහි ඇතුළත් කර ඇත.

පෙර වර්ෂ වල වාර්තාකරණ කාලපරිච්ඡේද හා සසඳන කළ මෙම වාර්ෂික වාර්තාවේ විෂයය පථය හා ආංශික සීමා සම්බන්ධයෙන් සැලකිය යුතු වෙනස්කම් දක්නට නොමැත. අවසාන වරට 2019 මාර්තු 14 දිනැතිව පළවූ වාර්ෂික වාර්තාව ඔස්සේ 2018 දෙසැම්බර් 31 වන දින දක්වාවූ මාස 12 ක කාල පරිච්ඡේදය ආවරණය කෙරිණ. නැවත වර්ගීකරණය කරන ලද හෝ සඳහන් කරන ලද සංසන්දනාත්මක මූල්‍ය තොරතුරු අදාළ පරිච්ඡේද වලින් අනාවරණය කිරීම හා විස්තර කිරීම සිදු කර ඇත.

**GRI 102-46**

- **විෂයය පථය හා ප්‍රමාණවත්භාවය**

  මෙම වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය මූල්‍ය වාර්තාකරණයෙන් ඔබ්බට යන අතර වටිනාකම් නිර්මාණය කිරීමෙහිලා අපගේ හැකියාව කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන, අපගේ ප්‍රධාන පාර්ශවකරුවන් ආශ්‍රිත මූල්‍ය නොවන කාර්යසාධනය, අවස්ථා, අවදානම් සහ ප්‍රතිඵල එහි ඇතුළත්වේ. එසේම, එමගින් අපගේ උපායමාර්ගය හා ව්‍යාපාරික ආකෘතිය, මෙහෙයුම් සන්දර්භය, ප්‍රාමාණික අවදානම්, පාර්ශවකරුවන්ගේ අභිලාෂ, කාර්යසාධනය සහ පාලනය හා සම්බන්ධ ප්‍රාමාණික තොරතුරු එමගින් විග්‍රහ කෙරේ.

  මෙම වාර්තාව ඔස්සේ බැංකුවේ වැදගත් හා ප්‍රාමාණික සාධක කෙරෙහි අවධානය යොමු කර තිබේ. එය, කෙටි කාලයේදී, මධ්‍ය කාලයේදී හා දිගු කාලයේදී ගණුදෙනුකරුවන් උදෙසා වටිනාකම් නිර්මාණය කිරීමට බැංකුව සතු හැකියාව කෙරෙහි මෙම සාධක කෙතරම් දුරකට බලපවත්නේද යන්න මත පදනම්වූ තක්සේරුවකි. මෙම වාර්තාවේ 78 පිටුවේ දැක්වෙන "ප්‍රාමාණික කරුණු" යන පරිච්ඡේදය යටතේ ප්‍රමාණාත්මකභාවය තීරණය කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව සාකච්ඡා කර තිබේ.

  2019 වර්ෂය තුළදී බැංකුව අත්කරගත් උපායමාර්ගික ප්‍රගතිය මෙම වාර්තාවෙන් ආවරණය කෙරෙන අතර කෙටි, මධ්‍ය (වසර දෙකක් හෝ තුනක්) සහ දිගු (වසර පහක් හෝ වැඩි කාලයක්) කාලය සඳහා වන බැංකුවේ මූල්‍ය හා මූල්‍ය නොවන උපායමාර්ගය පිළිබඳව තොරතුරු සපයයි. කොවිඩ් - 19 වසංගත තත්ත්වයේ බලපෑම හේතුවෙන් 2020 වසර සඳහා වන මාර්ගෝපදේශය මෙම වාර්තාවෙන් ඉවත් කරන ලද අතර ප්‍රධාන ඉලක්ක සමාලෝචනය අවසන්වී නොමැත.

- **ඉලක්ක පාඨකයන්**

  අපගේ දිගු කාලීන ආයෝජකයන්ගේ (අපගේ කොටස්හිමිකරුවන්, බැඳුම්කර හිමිකරුවන් සහ ශක්‍ය ආයෝජකයන්) තොරතුරු අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම මූලික වශයෙන් මෙම වාර්තාවෙන් අපේක්ෂා කෙරේ. අපගේ කාර්යමණ්ඩලය, ගනුදෙනුකරුවන්, නියාමන ආයතන සහ සමාජය ඇතුළු අනෙකුත් පාර්ශවකරුවන් වෙනුවෙන් අප වටිනාකම් නිර්මාණය කරන ආකාරය පිළිබඳ තොරතුරුද එමගින් ඉදිරිපත් කර ඇත.

## වාර්තාකරණ කාර්යරාමුව සහ අනුකූලතාවය

**GRI 102-12, 54**

බැංකුවේ පෙර වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා සම්පාදනය කිරීමේදී ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ගෝලීය වාර්තාකරණය පිළිබඳ මූලපිරීම්හි [Global Reporting Initiative (GRI)] මාර්ගෝපදේශ අනුගමනය කරන ලදී. තිරසාරභාවය පිළිබඳ වාර්තාකරණය සඳහා 2017 වර්ෂයේ සිට අප විසින් මෑතකාලීනව ප්‍රකාශයට පත් කරන ලද ගෝලීය වාර්තාකරණ මූලපිරීම්හි ප්‍රමිතීන් අනුගමනය කරන ලද අතර ඒ අනුව මෙම වාර්තාව සකස් කර තිබෙන්නේ ගෝලීය වාර්තාකරණ මූලපිරීම්: ප්‍රධාන විකල්ප (Global Reporting Initiative: core options) වලට අනුකූලවය. තිරසාරභාවය බැංකුවේ සමස්ත ව්‍යාපාරික මෙහෙයුම්හි ඓන්ද්‍රීය කොටස් වන අතර එය බැංකුවේ පවතින බාහිර හා අභ්‍යන්තර පාලන හා සහතික කිරීමේ පද්ධති වලට යටත්ව ක්‍රියාත්මක කෙරේ.

1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ එහි සංශෝධන, 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධන, ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන හා මාර්ගෝපදේශ සහ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ රෙගුලාසි හා නියමයන් බැංකුවේ ක්‍රියාකාරකම් නියාමනය කරන මූලික ව්‍යවස්ථා වේ. පෙර පරිද්දෙන්ම මෙම වාර්තාවේ අන්තර්ගත මූල්‍ය තොරතුරු, අදාළ නීති, රෙගුලාසි හා ප්‍රමිති සමග අනුකූල වන අතර 296 පිටුවෙන් ඇරඹෙන මූල්‍ය වාර්තා පිළිබඳ පරිච්ඡේදයේ දැක්වෙන වාර්තා හා ප්‍රකාශන කිහිපයක් ඔස්සේ ඒ බව ප්‍රකාශ කර තිබේ.

මෙම ඒකාබද්ධ වාර්ෂික වාර්තාව පිළියෙල කිරීමේදී පහත දැක්වෙන මූලාශ්‍ර මගින් සපයා ඇති සංකල්ප, මූලධර්ම හා මාර්ගෝපදේශ අවශ්‍ය හා සුදුසු පරිදි උපයෝගී කරගන්නා ලදී.

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති [Sri Lanka Accounting Standards issued by the Institutie of Charthered Accountants of Ari Lanka (CA Sri Lanka)]
- ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ රාමුව (The International Integrated Reporting Framework) (IIRC) [www.theiire.org]
- ගෝලීය වාර්තාකරණ මූලපිරීම් - තිරසාරභාවය පිළිබඳ වාර්තාකරණ මාර්ගෝපදේශ ගෝලීය වාර්තාකරණ මූලපිරීම් ප්‍රමිති (Global Reporting Initiative (GRI) Sustainability Reporting Guidelines GRI Standards) [www.globalreporting.org]
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ යහපැවැත්ම සංග්‍රහය (Code of Best Practices on Corporate Governance issued by CA Sri Lanka)
- තිරසාර සංවර්ධන අභිමතාර්ථ - "ගෝලීය අභිමතාර්ථ" 17 ක් සමගින් එක්සත් ජාතීන්ගේ මූලපිරීම (Sustainable Development Goals (SDGs) - The UN Initiative with 17 aspirational "Global Goals")
- ස්මාර්ට් ඒකාබද්ධ වාර්තාකරණ ක්‍රමවේදය [Smart Integrated Reporting Methodology™ (www.smart.lk)]

## බාහිර පාර්ශවයන්ගේ සහතිකය

මෙම වාර්තාව සකස් කිරීමේදී බැංකුව සියළු නියාමන හා ව්‍යවස්ථාපිත අවශ්‍යතා සමග අනුකූලවී තිබේ. බැංකුවේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලද අතර තිරසාරභාවය පිළිබඳ වාර්තාකරණයට අදාළ නිරවද්‍යභාවය පිළිබඳ සහතිකය KPMG Sri Lanka ආයතනය වෙතින් ලැබී තිබේ.

## ඉදිරිය පිළිබඳ ප්‍රකාශ

අපගේ ව්‍යාපාර මෙහෙයුම් පිළිබඳව මෙම වාර්තාවේ අන්තර්ගත ඇතැම් ප්‍රකාශ ඉදිරිය පිළිබඳ හඟවන ප්‍රකාශ විය හැකිය. ඓතිහාසික කරුණු පිළිබඳ ප්‍රකාශ හැර මූල්‍ය තත්ත්වය, ව්‍යාපාර උපායමාර්ගය, කළමනාකරණ සැලසුම් සහ ඉදිරියේදී සිදු කිරීමට නියමිත මෙහෙයුම්

හා සම්බන්ධ ප්‍රකාශ ඇතුළු සියළු ප්‍රකාශ ඊට අයත්වේ. ඉදිරිය පිළිබඳ ප්‍රකාශ, වැරදි හෝ නිශ්චිත නොවන උපකල්පන, දත්ත හෝ ක්‍රමවේද මත පදනම්වීම හෝ යථාර්ථවත් කරගැනීමට නොහැකිවීම වැළැක්විය නොහැකි අතර එබැවින්, ඒවා අනාගත ප්‍රතිඵල පිළිබඳ වගකීමක් සපයන බවට අපේක්ෂා නොකෙරේ. එහෙත් එම ප්‍රකාශ මගින් සාධාරණ උපකල්පන මත පදනම්වූ අපගේ වර්තමාන අපේක්ෂා පිළිබිඹුවේ. මෙම තොරතුරු ප්‍රවේශමෙන් පරිශීලනය කරන ලෙස හා තීරණ ගැනීම සඳහා ප්‍රක්ෂේපිත දත්ත මත අනවශ්‍ය පරිදි විශ්වාසය නොතබන ලෙස පාඨකයන්ට අවවාද කෙරේ. නව තොරතුරක්, අනාගත සිදුවීමක් හෝ වෙනත් කරුණක් හේතුවෙන් මෙම වාර්තාවේ අන්තර්ගත යම් ඉදිරිය පිළිබඳ ප්‍රකාශයක් යාවත්කාලීන හෝ සංශෝධනය කිරීම සම්බන්ධයෙන් අප කිසිදු වගකීමක් නොදරන අතර එසේ දැරීමට අපි අපේක්ෂා නොකරමු.

## විමසීම්

GRI 102-53

මෙම වාර්තාව සම්බන්ධයෙන් ඔබේ අදහස් හා යෝජනා අප අගය කරන අතර ඒවා පහත දැක්වෙන ලිපිනයට යොමු කළ හැකිය.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මුදල් හා සැලසුම් අංශය)
ජාතික ඉතිරිකිරීමේ බැංකුව,
අංක. 255, ගාලු පාර, කොළඹ 03.
dgm.finance@nsb.lk

## තෝරාගත් තිරසාර සංවර්ධන ඉලක්ක

අප ආර්ථික, පාරිසරික සහ සමාජයීය වශයෙන් තිරසාර බව සහතික කිරීම අරමුණු කරගෙන අප පහත දැක්වෙන තිරසාර සංවර්ධන අභිමතාර්ථ (Sustainable Development Goals - SDGs) ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදී ඇත.

- 3 GOOD HEALTH AND WELL-BEING — මනා සෞඛ්‍යය සහ මනා පැවැත්ම
- 4 QUALITY EDUCATION — ගුණාත්මක අධ්‍යාපනය
- 6 CLEAN WATER AND SANITATION — පිරිසිදු පානීය ජලය සහ සනීපාරක්ෂාව
- 7 AFFORDABLE AND CLEAN ENERGY — දැරියහැකි මිලකට පිරිසිදු බලශක්තිය

## සංචලන සලකුණු (Navigation Icons)

### ප්‍රාග්ධනය

- මූල්‍ය ප්‍රාග්ධනය
- නිෂ්පාදිත ප්‍රාග්ධනය
- බුද්ධිමය ප්‍රාග්ධනය
- මානව ප්‍රාග්ධනය
- සමාජයීය සහ සබඳතා ප්‍රාග්ධනය
- ස්වාභාවික ප්‍රාග්ධනය

### පාර්ශවකරුවන්

- කොටස් හිමිකරු
- ගනුදෙනුකරු
- සේවානියුක්තිකයන්
- ව්‍යාපාර හවුල්කරුවන්
- සමාජය සහ පරිසරය
- නියාමන හා රජයේ ආයතන

### දිගු-කාලීන උපායමාර්ග

- ගනුදෙනුකරුවන් සඳහා
- පාලනය පිළිබඳ විශිෂ්ටත්වය
- ශක්තිය හා තිරසාරභාවය
- පරිවර්තනයේ නියමුවා

### කෙටි කාලයේ සිට මධ්‍ය කාලය දක්වා වන උපායමාර්ගික අභිමතාර්ථ

- ගනුදෙනුකාර අත්දැකීම ඉහළ නැංවීම
- සේවක නියුතු වීම වැඩි දියුණු කිරීම
- අවදානම් සංස්කෘතිය බලගැන්වීම
- ඓන්ද්‍රිය වර්ධනය ප්‍රවර්ධනය කිරීම
- ආදර්ශයෙන් පෙරමුණ ගැනීම

### ප්‍රාමාණික කරුණු

- ගනුදෙනුකාර සේවය සහ අත්දැකීම
- අවදානම මත අවධානය සහිත ආයතනික සංස්කෘතිය
- ඩිජිටල් පරිවර්තනය
- සයිබර් ආරක්ෂාව, වංචා වැළැක්වීම සහ මුදල් විශුද්ධිකරණය
- දායකත්වය දැක්වූ පාර්ශව සඳහා ආර්ථික වටිනාකම
- නියාමන අනුකූලතාවය
- වගකීම් සහගත ණයදීම
- මූල්‍ය අන්තර්ග්‍රහණය
- ආර්ථික සහ සමාජයීය බලපෑම
- කුසලතාවය ආකර්ෂණය කරගැනීම, වර්ධනය කරගැනීම සහ රඳවාගැනීම
- විවිධත්වය සහ අන්තර්ග්‍රහණය
- පාරිසරික සලකුණ
- කාර්යාලයේ සුරක්ෂිතාවය, සෞඛ්‍ය සහ යහපැවැත්ම
- සැපයුම් දාම වගකීම
- මෙහෙයුම් කාර්යක්ෂමතාවය

# ජාතික ඉතිරිකිරීමේ බැංකුව පිළිබඳව කෙටියෙන් GRI 102-7

1972 දී පාර්ලිමේන්තු පනතක් මගින් එවකට මෙරට පැවති සාම්ප්‍රදායික ඉතිරිකිරීමේ ආයතන සතරක් ඒකාබද්ධ කිරීම ඔස්සේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව ස්ථාපිත කෙරිණ. 1882 දී ස්ථාපිත කරන ලද එහි පූර්වගාමී ආයතනය වන සිලෝන් සේවින්ග්ස් බැංකුව වෙතින් ලද සියවසකට වඩා පැරණි ඉතිරිකිරීමේ උරුමයක් ආරම්භයේ සිටම ජාතික ඉතිරිකිරීමේ බැංකුව සතුවේ.

පන්තිය, වර්ගය සහ ස්ත්‍රී පුරුෂභාවය නොසලකා සියළු ශ්‍රී ලාංකිකයන් අතර ඉතිරිකිරීමේ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සඳහා 1988 අංක 30 දරන බැංකු පනත යටතේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස නම් කෙරිණ. අප සතු මිලියන 20.9 ක්වූ ගිණුම් සමුදාය සමාජයේ සියළු ජන කොටස්වල බැංකුව ලෙස අපගේ හිමිකම සනාථ කරයි.

## අපගේ දැක්ම

ඔබගේ ඉතිරිකිරීම් සඳහා වඩාත් විශ්වසනීය හා වැඩිම ඉල්ලුමක් පවතින විකල්පය බවට පත්වීම.

## අපගේ මෙහෙවර

ගනුදෙනුකරුවන්ගේ ඉතුරුම් හා ආයෝජන අවශ්‍යතා ප්‍රශස්ත ලෙස සපුරාලීමට අවශ්‍ය පරිපූර්ණ මූල්‍ය විසඳුම් සැපයීම හා බැංකුව පිළිබඳ උනන්දු වන සියළුම පාර්ශවයන්ගේ අපේක්ෂාවන් මුදුනුපැමිණවීම.

## අපගේ වටිනාකම්

අපි ව්‍යාපාර කටයුතු මෙහෙයවීමේදී දැඩි විශ්වාසය, අනොන්‍ය ගරුත්වය, අවංකභාවය සහ නිර්මාණශීලීත්වය කෙරෙහි තීරණාත්මකව ප්‍රතිචාර දක්වන්නෙමු.

## හිමිකම් ව්‍යුහය සහ කාර්යයන්

- ශාඛා බැංකුකරණය
- ආයතනික මූල්‍ය
- ජාත්‍යන්තර බැංකුකරණය
- භාණ්ඩාගාරය



ජාතික ඉතිරිකිරීමේ බැංකුව

- එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ් (100%)
- ප්‍රාථමික ගනුදෙනුකරු
- ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව
- කල්බදු, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ක්ෂුද්‍ර මූල්‍ය




## අපගේ විශේෂත්වය


- වඩාත් විශ්වසනීය හා වැඩිම ඉල්ලුමක් පවතින විකල්පය ලෙස සුවිශේෂී ආයතනික සංස්කෘතියක් සහ ප්‍රගතියක් පෙරදැරි කරගත් ව්‍යාපාරයකි.
- සියළු තැන්පතු සහ ඒ මත ඉපයෙන පොලිය සඳහා 100% ක රාජ්‍ය ආරක්ෂාවක් පිරිනමන මෙරට එකම බැංකුව ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව මෙරට සුරක්ෂිතම බැංකුව වේ.
- දිවයිනේ ප්‍රමුඛතම ඉතිරිකිරීමේ බැංකුව වන ජාතික ඉතිරිකිරීමේ බැංකුව, එහි ව්‍යවස්ථාව ප්‍රකාරව සිය තැන්පතු වලින් 60% ක් රාජ්‍ය සුරැකුම් වල ආයෝජනය කරයි.
- ආසන්න වශයෙන් මෙරට ජනගහනයෙන් 2/3 ක් වන මිලියන 20.9 ක ශ්‍රී ලාංකික ගිණුම් හිමියන්ගේ බැංකු අවශ්‍යතා අප විසින් සපුරාලනු ලබන්නේ සාඩම්බරයෙනි.
- ජාතික ආර්ථිකය තුල ශක්තිමත්ව මුල් බැසගත් ජාතික ඉතිරිකිරීමේ බැංකුව බදු, අයබදු, ගාස්තු හා ලාභාංශ වශයෙන් භාණ්ඩාගාරය වෙත දායකත්වය ලබාදීම ඔස්සේ සමස්ත ජාතියේ මූල්‍ය අවශ්‍යතාවය සපුරාලීමට කැපවේ.
- රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන දිගු කාලීන සංවර්ධන ව්‍යාපෘති සහ සමාජ ආර්ථික ව්‍යාපෘති සඳහා අරමුදල් සම්පාදනය කිරීම ඔස්සේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව ජාතිය ගොඩනැගීමෙහිලා දායක වේ.
- සමස්තයක් ලෙස ධනාත්මකව සමාජය ගොඩනැගීමෙහිලා දායක වන අයුරින් අපගේ ව්‍යාපාරය පවත්වාගැනීමට කැපවූ බැංකුවක් ලෙස ශක්තිමත්ව හා ස්ථාවරව සිටිමු.
- යහපාලනය සහ අත්දැකීම් සහිත කළමනාකරණ කණ්ඩායම්
- තොරාගත් අරමුදල් උත්පාදන ක්‍රමවේද සහ මනා අවදානම් කළමනාකරණය හේතුවෙන් අපගේ අක්‍රිය ණය අනුපාතිකය ක්ෂේත්‍රයේ සාමාන්‍යයට වඩා පහළ මට්ටමක පවත්වාගැනීමට හැකියාව ලැබී තිබේ.

## අප නිර්මාණය කළ වටිනාකම


### ශුද්ධ පොලී ආදායම





### ශුද්ධ පොලී ආන්තිකය





### බදු පෙර ලාභය





### සමස්ත වත්කම්





### ගනුදෙනුකරුවන්ගේ තැන්පතු





### ණය හා අත්තිකාරම්





### දළ අක්‍රිය ණය අනුපාතිකය





### වත්කම් මත ප්‍රතිලාභ





### හිමිකම් මත ප්‍රතිලාභ





### ආදායමට සාපේක්ෂ වියදම් අනුපාතිකය




### සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතිකය




### ද්‍රවශීල ආවරණය



## අපගේ ගනුදෙනුකරුවන්

ගිණුම්
මිලියන 20.9
(2018: මිලියන 20.4)

ගනුදෙනුකරුවන්ට ගෙවූ පොලිය
රු. මිලියන 89,898
(2018: රු. මි. 85,622)

ශාඛා
256
(2018: 255)

ATM/CRM/CDM
334
(2018: 310)

තැපැල් හා උපතැපැල් කාර්යාල 4,063
(2018: 4,062)

## අපගේ සේවා නියුක්තිකයන්

අප විසින් අපගේ සේවා නියුක්තිකයන් 4,715 වෙත රු. මිලියන 10,158 ක් ගෙවන ලදී.
(2018: සේවානියුක්තිකයන් 4,512 වෙත රු. මි. 9,263)

කුසලතා සංවර්ධනය සඳහා රු. මිලියන 40.3 ආයෝජනය කර ඇත. (2018: රු. මි. 38.7)

අපගේ සමස්ත සේවක සංඛ්‍යාවෙන 54% ක් කාන්තාවෝ වෙති.
(2018: 54%)

98.1%
රඳවාගැනීමේ අනුපාතය
(2018 : 97.9%)

නව රැකියා අවස්ථා 296 ක් සපයා ඇත.
(2018: 145)



## අපගේ සමාජය හා පරිසරය

ප්‍රසම්පාදනය සඳහා 351 ක් වන අපගේ දේශීය සැපයුම්කරුවන් වෙත රු. මිලියන 2,207 ක් ගෙවා ඇත.
(2018: දේශීය සැපයුම්කරුවන් 153 ක් වෙත රු. මි. 2,067)

අපගේ ස්ථිර සේවා සේවානියුක්තිකයන්ගෙන් 55% ක් කාන්තාවෝ වෙති.
(2018: 56%)

රු. මිලියන 193 වටිනා ඉකෝ (ECO) ණය පහසුකම් 222 ක් නිකුත් කර තිබේ.
(2018: රු. මි. 656.6 ක ණය පහසුකම් 781 ක් නිකුත් කර තිබේ)

අපි ගිගාජූල් 35,696 ක බලශක්තියක් පරිභෝජනය කළෙමු. (2018: ගිගාජූල් 33,417)

අපි ජලය ඝන මීටර 79,368 ක් පරිභෝජනය කළෙමු. (2018: ඝන මීටර 76,161)

## රජය

කොටස්හිමිකරුට
රු. බිලියන 2.0
(2018: රු. මි. 500)

රාජ්‍ය සුරැකුම්පත් ආයෝජන
රු. බිලියන 613
(2018: රු. බි. 523)

අපි සෘජු හා වක්‍ර බදු ලෙස රු. මිලියන 8.9 ක් ගෙවන ලදී.
(2018: රු. බි 6.6)

රාජ්‍ය සුරැකුම්පත් ආයෝජනය කළ සමස්ත තැන්පතු 60.9%
(2018: 60.9%)

# සන්ධිස්ථාන

**1972**
එවකට පැවති සාම්ප්‍රදායික ඉතිරිකිරීමේ ආයතන සතරක් ඒකාබද්ධ කිරීම ඔස්සේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව ස්ථාපිත කිරීම සඳහා පාර්ලිමේන්තු පනතක් මගින් පහසුකම් සැලසිණි.

**1979**
දිනුම් ඇදීමක් සහිත ඉතුරුම් සහතිකපත් හඳුන්වාදීම

**1981**
ග්‍රාමීය ජන කොටස් වෙත වඩාත් සමීපවීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ජංගම බැංකු සේවය හඳුන්වාදෙනු ලබයි.

**1994**
ප්‍රථම ATM යන්ත්‍රය ස්ථාපිත කිරීම

**1995**
ව්‍යාපාර කටයුතු පුළුල් කිරීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සංශෝධනය කෙරිණ.

**1998**
හපන් හා පුංචි හපන් ළමා ඉතිරිකිරීමේ ගිණුම් හඳුන්වාදෙන ලදී.

**1999**
ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ 100 වැනි ශාඛාව නිට්ටඹුවේදී විවෘත කෙරිණ.

ඉතුරුමිතුරු ගිණුම හඳුන්වාදීම

**2000**
ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පරිපාලිත සමාගම වන NSB ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම ස්ථාපිත කරන ලදී.

**2002**
ස්ත්‍රී ගිණුම හඳුන්වාදීම

**2003**
ජාතික ඉතිරිකිරීමේ බැංකුව ත්‍රිත්ව A ෆිච් ණය ශ්‍රේණිගත කිරීම හිමිකරගත් ප්‍රථම ශ්‍රී ලාංකික බැංකුව බවට පත්වීම

**2004**
ජාත්‍යන්තර බැංකු කටයුතු ආරම්භ කෙරිණ.

**2008**
ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම - 24 x 7

**2011**
බැංකුවේ 200 වැනි ශාඛාව මැදවච්චියේදී විවෘත කෙරිණ.

**2012**
ජාතික ඉතිරිකිරීමේ බැංකුව සිය 40 වන සංවත්සරය සමරයි.

**2013**
ශ්‍රී ලාංකික බැංකුවක් විසින් නිකුත් කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන 750 ක විශාලතම බැඳුම්කර නිකුතුව

**2014**
උසස් අධ්‍යාපන කටයුතු සඳහා ලබාදෙන බුද්ධි පුද්ගලික ණය ක්‍රමය හඳුන්වාදීම

ඩොලර් මිලියන 250 ක බැඳුම්කර නිකුතුව

**2016**
සිය 250 වන ශාඛාව කෝපායිහිදී ආරම්භ කෙරිණ.

ග්ලෝබල් ෆයිනෑන්ස් ආයතනය විසින් ශ්‍රී ලංකාවේ සුරක්ෂිතම බැංකුව ලෙස නම් කරනු ලැබීම

වෙළඳ මූල්‍ය කටයුතු ආරම්භ කිරීම

ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් රු. බිලියන 06ක වටිනාකමකින් යුත් සිය ප්‍රථම ණයකරය නිකුත් කරන ලදී.

**2017**
රුපියල් ට්‍රිලියනක වත්කම් පදනමක් හිමිකරගත් මෙරට ප්‍රථම විශේෂිත බැංකුව බවට පත්වීම

**2018**
ඇමරිකානු ඩොලර් මිලියන 750 ක බැඳුම්කරය සාර්ථකව ගෙවා අවසන් කිරීම.

ප්‍රථම විදේශ මුදල් කාලීන ණය පහසුකම ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කෙරිණ.

**2019**
ගෙවීම් කාඩ්පත් ක්ෂේත්‍රය - දත්ත ආරක්ෂණ ප්‍රමිතිය හිමි කරගත් ප්‍රථම ශ්‍රී ලාංකික රාජ්‍ය බැංකුව බවට පත්වීම.

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පූර්ණ පරිපාලිත සමාගමක් බවට පත් විය.

තැන්පතු පදනම රුපියල් ට්‍රිලියනය ඉක්මවීම

ඇමරිකානු ඩොලර් මිලියන 250 ක බැඳුම්කරය සාර්ථකව ගෙවා අවසන් කිරීම.

# වැදගත් මූල්‍ය තොරතුරු GRI 102-7

| | බැංකුව | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| | **2019** | 2018 | වෙනස % | **2019** | 2018 | වෙනස % |
| **වර්ෂයේ ප්‍රතිඵලය (රු.මිලියන)** | | | | | | |
| දළ ආදායම | **121,929** | 111,902 | 8.96 | **125,810** | 112,760 | 11.57 |
| මූල්‍ය බදුකරණයට පෙර ලාභය (වැට්, ජාතිය ගොඩනැගීමේ බද්ද සහ ණය ආපසු ගෙවීමේ අයබද්ද) | **15,659** | 11,171 | 40.17 | **18,487** | 11,181 | 65.34 |
| බදුකරණයට පෙර ලාභය | **10,462** | 7,941 | 31.74 | **13,092** | 7,944 | 64.79 |
| ආදායම් බදු වියදම් | **3,764** | 3,441 | 9.36 | **4,062** | 3,444 | 17.93 |
| බදුකරණයට පසු ලාභය | **6,698** | 4,500 | 48.84 | **9,030** | 4,500 | 100.66 |
| **වසර අවසානය වන විට මූල්‍ය තත්වය** | | | | | | |
| කොටස්කරුවන්ගේ අරමුදල් (මුළු හිමිකම්) | **44,377** | 43,095 | 2.97 | **47,834** | 44,118 | 8.42 |
| අනෙකුත් ගණුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු/ගණුදෙනුකරුවන්ගේ තැන්පතු | **1,016,574** | 839,574 | 21.08 | **1,015,635** | 839,574 | 20.97 |
| ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ (දළ) | **615,649** | 518,957 | 18.63 | **619,754** | 522,982 | 18.50 |
| දළ ණය සහ ලැබිය යුතු දෑ | **458,662** | 426,741 | 7.48 | **462,441** | 426,766 | 8.36 |
| මුළු වත්කම් | **1,157,967** | 1,036,846 | 11.68 | **1,175,575** | 1,051,316 | 11.82 |
| **සාමාන්‍ය කොටස් මත තොරතුරු (රු.)** | | | | | | |
| ඉපයුම් (මූලික) | **7.13** | 6.72 | 6.09 | **9.61** | 6.72 | 43.02 |
| ඉපයුම් (Diluted) | **7.13** | 6.72 | 6.09 | **9.61** | 6.72 | 43.02 |
| ශුද්ධ වත්කම් වටිනාකම | **47.21** | 45.85 | 2.97 | **50.89** | 46.93 | 8.42 |
| **අනුපාතික** | | | | | | |
| ශුද්ධ පොලී ආන්තිකය | **2.63** | 2.43 | 8.10 | **2.65** | 2.44 | 8.45 |
| සාමාන්‍ය කොටස්කරුවන්ගේ අරමුදල් මත ආදායම | **0.95** | 0.78 | 22.91 | **1.18** | 0.77 | 53.11 |
| සාමාන්‍ය කොටස් මත ආදායම | **15.32** | 10.95 | 39.86 | **19.64** | 10.68 | 83.87 |
| ඉපයීම් වල වර්ෂ අනුරූප වර්ධනය | **48.84** | (53.68) | 190.99 | **100.66** | (50.85) | 297.94 |
| **ව්‍යවස්ථාපිත ද්‍රවශීල අනුපාතික (%)** | | | | | | |
| ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් - අවම අවශ්‍යතාවය 20% | **60.20** | 54.88 | 9.69 | අදාළ නොවේ | අදාළ නොවේ | – |
| ද්‍රවශීල ආවරණ අනුපාතිකය (%) - රුපියල් (2019 - 100%, 2018 - 90%) | **278.12** | 245.06 | 13.49 | අදාළ නොවේ | අදාළ නොවේ | – |
| ද්‍රවශීල ආවරණ අනුපාතිකය (%) - සියළු මුදල් ඒකක (2019 - 100%, 2018 - 90%) | **276.64** | 321.29 | (13.90) | අදාළ නොවේ | අදාළ නොවේ | – |
| ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතිකය - අවම අවශ්‍යතාවය (100%) | **175.18** | 146.67 | 19.44 | අදාළ නොවේ | අදාළ නොවේ | – |
| **ව්‍යවස්ථාපිත ප්‍රාග්ධන අවශ්‍යතා - බාසල් III** | | | | | | |
| ස්ථර - 1 - අවම අවශ්‍යතාවය (2019 - 8.5%, 2018 - 8.875%) | **12.02** | 13.08 | (8.07) | **13.90** | 13.90 | 0.01 |
| සමස්ත ප්‍රාග්ධනය - අවම අවශ්‍යතාවය (2019 - 12.5%, 2018 - 12.875%) | **14.35** | 15.90 | (9.74) | **16.27** | 16.65 | (2.27) |
| ද්‍රවශීලතා අනුපාතිකය - අවම අවශ්‍යතාවය (3%) | **5.13** | 4.76 | 7.77 | **5.57** | 4.91 | 13.44 |

## මූල්‍ය ඉලක්ක සහ ජයග්‍රහණ - බැංකුව

| | ඉලක්ක | ජයග්‍රහණය | | | | |
|---|---|---|---|---|---|---|
| මූල්‍ය දර්ශකය | **2019** | **2019** | 2018 | 2017 | 2016 | 2015 |
| ශුද්ධ පොලී ආන්තිකය (%) | **2.45** | **2.63** | 2.43 | 2.61 | 2.89 | 3.32 |
| සාමාන්‍ය කොටස් මත ආදායම | **0.72** | **0.95** | 0.78 | 1.47 | 1.51 | 1.60 |
| සාමාන්‍ය කොටස්කරුවන්ගේ අරමුදල් මත ආදායම (%) | **9.31** | **15.32** | 10.95 | 27.24 | 29.37 | 31.15 |
| ආදායමේ වර්ධනය | **7.65** | **8.96** | 3.62 | 23.36 | 10.24 | 1.79 |
| වර්ෂය සඳහා ලාභයේ වර්ධනය (බදු පසු ලාභය) | **(5.90)** | **48.84** | (53.68) | 1.18 | 9.52 | 26.29 |
| සමස්ත වත්කම් වල වර්ධනය (%) | **8.20** | **11.68** | 2.56 | 11.01 | 7.50 | 8.80 |
| **ප්‍රාග්ධන අවශ්‍යතා - බාසල් III** | | | | | | |
| ස්ථර - 1- අවම අවශ්‍යතාවය (2019 - 8.5%, 2018 - 8.875%) | **Over 8.5%** | **12.02** | 13.08 | 11.93 | 11.31 | අදාළ නොවේ |
| ස්ථර - 1- අවම අවශ්‍යතාවය (2019 - 8.5%, 2018 - 8.875%) | **Over 12.5%** | **14.35** | 15.90 | 15.31 | 13.86 | අදාළ නොවේ |

# සභාපතිතුමියගේ පණිවිඩය

GRI 102-14



තැන්පතු සහ ඉන් ඉපයෙන පොලිය සඳහා 100% ක රාජ්‍ය ආරක්ෂාවක් පිරිනැමෙන ශ්‍රී ලංකාවේ එකම බැංකුව

**රු. බිලියන 3.1** ක් ආයෝජනයක් කරමින් ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව අත්පත් කරගන්නා ලදී.

සාර්ව ආර්ථික පරිසරය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කළ අනපේක්ෂිත සිදුවීම් වලින් පිරි අභියෝගාත්මක 2019 වර්ෂයට සාර්ථකව මුහුණදීම සඳහා වසර ගණනාවක් මුළුල්ලේ අප විසින් ක්‍රමානුකූලව ගොඩනගා ගන්නා ලද අපගේ ශක්තිමත් කාර්යසාධන වාර්තාව, ව්‍යාපාරික පදනම සහ සන්නාම කීර්තිය අප හට මහත් පිටුබලයක් සැපයීය.

රජය වෙත **රු. බිලියන 11.3** ක දායකත්වයක් දැක්වීය.

තැන්පතු වෙළඳපල කොටස **10.75%** දක්වා ඉහළ ගියේය.

**[SL] AAA** (ස්ථාවර) (ඉක්‍රා ලංකා ලිමිටඩ්)

අප ආරම්භ කළ පරිවර්තනය කරා යන ජවසම්පන්න ගමන සහ නව පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම මගින් වෙනස් ආරක ගනුදෙනුකාර අත්දැකීමක් සපයමින්, අපගේ ප්‍රධාන පාර්ශවකරුවන් සමග වන සම්බන්ධතාවය පවත්වා ගනිමින් සහ අපගේ අදාළබව රැකගනිමින් ඩිජිටල්කරණයේ ප්‍රතිලාභ ශ්‍රී ලාංකික ජනතාව වෙත ලැබෙන බව සහතික කරයි.

ශ්‍රී ලංකාවේ විශාලතම බලපත්‍රලාභී විශේෂ බැංකුව ලෙස සියළු ශ්‍රී ලාංකිකයන් අතර ඉතිරිකිරීමේ සංස්කෘතියක් නිර්මාණය කිරීමෙහිලා අපට පැවරී ඇති සුවිශේෂී කාර්යභාරය මැනවින් ඉටු කිරීමට අපි නිරන්තරයෙන් කැපවී සිටිමු. මෙරට සමාජයේ සියළු ජන කොටස් වල බැංකුව ලෙස අපගේ හිමිකම අප සතු මිලියන 20.9 ක ගිණුම් මගින් සනාථ වේ. සාර්ව ආර්ථික පරිසරය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කළ අනපේක්ෂිත සිදුවීම් වලින් පිරි අභියෝගාත්මක 2019 වර්ෂයට සාර්ථකව මුහුණදීම සඳහා වසර ගණනාවක් මුළුල්ලේ අප විසින් ක්‍රමානුකූලව ගොඩනගා ගන්නා ලද අපගේ ශක්තිමත් කාර්යසාධන වාර්තාව, ව්‍යාපාරික පදනම සහ සන්නාම කීර්තිය අප හට මහත් පිටුබලයක් සැපයීය. අපට මේ වනවිටත් මුහුණ පෑමට සිදුව තිබෙන අභියෝගාත්මක කාලසීමාව මධ්‍යයේ වුවද අපගේ කාර්යසාධනය පවත්වාගැනීමට ඉහත කී සාධක අපට සහය වන බව අපි විශ්වාස කරමු. වසර තුලදී පැවති අභියෝගාත්මක මෙහෙයුම් සන්දර්භය තුල වුවද වත්කම් වල ගුණාත්මකභාවය පවත්වා ගැනීම සහ අපගේ ශුද්ධ පොලී ආන්තිකය ආරක්ෂා කරගැනීම සිදු කරන අතරතුර අප විසින් මෙතෙක් වාර්තා කරන ලද ඉහළම තැන්පතු වර්ධනය සහ පැසසුම් සහගත බදු පසු ලාභයක් වාර්තා කිරීමට අපි සමත්වීමු.

## අභියෝගාත්මක මෙහෙයුම් සන්දර්භයක්

දිගු කාලීන වෙළඳ අර්බුද සහ පුළුල් පරාසයක පැතිරුණු ප්‍රතිපත්තිමය අවිනිශ්චිතතා මධ්‍යයේ ලෝක ආර්ථිකය පසුගිය වසර තුළදී සැලකිය යුතු පසුබෑමකට ලක් විය. 2019 වර්ෂයේදී ලෝක දළ දේශීය නිෂ්පාදිත වර්ධන වේගය 2.3% දක්වා පහළ ගිය අතර එය 2008 - 2009 කාල සීමාව තුල හටගත් ගෝලීය ආර්ථික අර්බුදය සමග වාර්තාවූ අඩුම වර්ධන වේගය වේ. ශීඝ්‍රයෙන් ව්‍යාප්තවූ අසමානතා සහ තීව්‍ර වන දේශගුණික අර්බුදය හමුවේ ආර්ථික වර්ධනයේ සමාජයීය සහ ආර්ථික ගුණාත්මකභාවය පිළිබඳ වර්ධනය වෙමින් පැවති අතෘප්තිය සමග එම ආර්ථික පසුබෑම සිදු විය. ජාත්‍යන්තර සැපයුම් දාම ආශ්‍රිතව සැලකිය යුතු බිඳවැටීම් වලට මගපාදමින් ඇමරිකා එක්සත් ජනපදය සහ චීනය අතර පැවති ද්විපාර්ශවික වෙළඳ සබඳතා ඉතා අවම මට්ටමකට පත් විය.

පාස්කු ඉරිදා එල්ලවූ ත්‍රස්ත ප්‍රහාර හේතුවෙන් දුර්වලවූ පාරිභෝගික විශ්වාසය සහ ආයෝජකයන්ගේ අපේක්ෂා මත පදනම්ව ශ්‍රී ලංකාවේ ආර්ථිකය 2019 වසර සඳහා 2.3% ක මධ්‍යස්ථ දළ දේශීය නිෂ්පාදන වර්ධන වේගයක් වාර්තා කළේය. මෙම ප්‍රහාර ආර්ථිකයේ සෑම ක්ෂේත්‍රයක් කෙරෙහිම බලපෑම් එල්ල කළ අතර විශේෂයෙන් සංචාරක, කෘෂිකාර්මික සහ ඉදිකිරීම් ක්ෂේත්‍ර දැඩි බලපෑමකට ලක් විය. ඉහළ මට්ටමක පැවති නාමික සහ තත්‍ය වෙළඳපොල පොලී අනුපාත මධ්‍යයේ පසුබෑමට ලක්වූ ආර්ථික වර්ධනය, උද්ධමන පීඩනය සහ පහළ බැස තිබූ පෞද්ගලික අංශ ණයදීම් යන සාධක හමුවේ ආර්ථිකය උත්තේජනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නම්‍යශීලී මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. එසේම, වෙළඳපොල පොලී අනුපාත පහළ දැමීම අරමුණු කරගෙන මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ආර්ථිකය වෙත යොමු කිරීම කඩිනම් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පියවර ගන්නා ලදී.

බැංකු ක්ෂේත්‍රය තුල අක්‍රිය ණය අනුපාතිකය ඉහළයාම මත පදනම්ව ණය වර්ධනය පහළයාම හා වත්කම් වල ගුණාත්මකභාවය පහළයාම සිදු විය.

## අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයක් මධ්‍යයේ නොසැලෙන කාර්යසාධනයක් පවත්වා ගනිමින්

2019 වර්ෂයේදී ජාතික ඉතිරිකිරීමේ බැංකුව වත්කම් සම්බන්ධයෙන් පෙර වර්ෂයට සාපේක්ෂව 11.7% ක වර්ධනයක් සමග රුපියල් ට්‍රිලියන 1.2 ක අගයක් වාර්තා කිරීමට සමත්විය. තැන්පතු පදනම රුපියල් ට්‍රිලියනයේ සන්ධිස්ථානය පසු කරමින් රුපියල් ට්‍රිලියන 1.02 ක අගයක් ගත් අතර ණය කළඹ පෙර වර්ෂයට සාපේක්ෂව 7.4% ක වර්ධනයක් පිළිබිඹු කරමින් රුපියල් බිලියන 454.4 දක්වා ඉහළ ගියේය. වත්කම් වල ගුණාත්මකභාවය පවත්වාගනිමින් හා ශුද්ධ පොලී ආන්තිකය ආරක්ෂා කරගනිමින් බදු පෙර ලාභය 48.8% ක වර්ධනයක් සමගින් රුපියල් බිලියන 6.7 ක් දක්වා ඉහළ ගියේය. එසේම, වියදමට සාපේක්ෂ ආදායම් අනුපාතිකය 49.35% දක්වා ඉහළ ගිය අතර මෙහෙයුම් කාර්යක්ෂමතාවයේ ප්‍රගතිය එමගින් පෙන්නුම් කෙරේ. සමාලෝචනයට ලක් කෙරෙන මූල්‍ය වර්ෂය සඳහා රුපියල් බිලියන 2.0 ක් ප්‍රකාශයට පත් කර ඇත.

අප විසින් පසු කරන ලද බොහෝ සන්ධිස්ථාන අභියෝගාත්මක මෙහෙයුම් සන්දර්භයක් තුල අපගේ නොසැලෙන ස්ථාවරය සහ සවලතාව විදහා දක්වමින් නොමැකෙන සලකුණක් සටහන් කර තිබේ. එහි ගනුදෙනුකරුවන්ගේ තැන්පතු සඳහා 100% ක රාජ්‍ය ආරක්ෂාවක් පිරිනමන එකම ශ්‍රී ලාංකික බැංකුව ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව තවදුරටත් සිය ස්ථානයෙහි රැඳී සිටී. එබැවින් අපි, විවිධවූ ගනුදෙනුකරුවන් පිරිසකට සේවය සලසන ශ්‍රී ලංකාවේ විශාලතම සහ සුරක්ෂිතම බලපත්‍රලාභී විශේෂිත බැංකුව වෙමු.

## ආයතනික පාලනය ශක්තිමත් කරමින්

දැඩි පාලන හා අවදානම් කළමනාකරණ පරිචයන් අනුගමනය කරමින් සහ අදාළ වන ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතා සමග අනුකූලවෙමින් බැංකුවේ තිරසාරභාවය ශක්තිමත් කෙරිණ. අභ්‍යන්තර පාලන, ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි කෙරෙහි අවධානය යොමු කරමින් ඵලදායී ආයතනික පාලනයක් සහ අවදානම් කළමනාකරණ අධීක්ෂණයක් පවත්වා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තරයෙන්ම කැපවී සිටී. අපගේ නියාමන ආයතන සහ ප්‍රධාන පාර්ශවකරුවන් සමග අප ඍජුව හා නිරතුරුව පවත්වන සම්බන්ධතාවය ඔස්සේ අප විසින් අනුගමනය කරනු ලබන විවෘත හා විනිවිදභාවයෙන් යුතු ප්‍රවේශය අපගේ පාර්ශවකරුවන් වෙත අඛණ්ඩව සේවය සලසන අතර හෙළිදරවු කිරීම් සම්බන්ධයෙන් සැලකිය යුතු වැඩිදියුණු කිරීම් සිදු කිරීමට මග පෑදුවේය.

නව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් පත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය සැලකිය යුතු අයුරින් ශක්තිමත් කිරීමට ආධාර වන අතර බැංකුවේ දිගු කාලීන තිරසාරභාවය ඉහළ නංවනු ඇත. එසේම, ප්‍රධාන ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම සහ නව ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම මගින් බැංකුව මනා වර්ධනයක් කරා මෙහෙයවීමෙහිලා ප්‍රබල මගපෙන්වීමක් සැපයෙනු ඇත. මෙහෙයුම් සන්දර්භය පිළිබඳ උද්යෝගීමත් අවබෝධයක් සමග ශක්තිමත් වටිනාකම් මත ගොඩනැගුණු අපගේ උපායමාර්ගය අපගේ සියළු පාර්ශවකරුවන් වෙත තිරසාර ප්‍රතිලාභ ලබාදෙන අතරම පාලනය හා අවදානම් කළමනාකරණ ශක්‍යතා වර්ධනය කරගැනීම කෙරෙහි බැංකුව යොමු කරනු ඇත. 2019 ඔක්තෝබර් 11

වන දින සිට බලපැවැත්වෙන පරිදි ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පූර්ණ පරිපාලිතයක් බවට පත්වූ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සිය අධීක්ෂණය සැපයීය. ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සම්බන්ධයෙන් පවතින ප්‍රධානතම ආයතනය ලෙස ස්ථානගත කිරීමට නියමිතය.

## ඩිජිටල් අනාගතයකට අනුගත වෙමින්

තාක්ෂණයේ බාධාකාරී බලපෑම අප ජීවිත වල සෑම අංශයක්ම පාහේ වෙනස් කරමින් තිබේ. සාම්ප්‍රදායික ව්‍යාපාර ආකෘති වල විප්ලවීය වෙනසක් ඇති කරමින් ගනුදෙනුකරුවන් නිරන්තරයෙන් අන්තර්ජාල පහසුකම සහිත මෙවලම් සහ කෘතිම බුද්ධිය සිය මිලදී ගැනීමේ ක්‍රම සහ ව්‍යාපාර සමග ඒකාබද්ධ කරගන්නේ කෙසේද යන්න විමසා බැලීමට වැඩි වශයෙන් පෙළඹෙමින් සිටී. එම ප්‍රවණතා සමග අනුගත වෙමින් අපගේ සන්නාමය බලගන්වන හා ඩිජිටල් වෙළඳපොල තුල කැපීපෙනෙන ආකාරයෙන් ගනුදෙනුකරුවන්ගේ වෙනස්වන ප්‍රමුඛතා සපුරාලීමට අපි උත්සුක වෙමු. අප ආරම්භ කළ පරිවර්තනය කරා යන ජවසම්පන්න ගමන සහ නව පරිසර පද්ධතියක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය මගින් වෙනස් ආරක ගනුදෙනුකාර අත්දැකීමක් සපයමින්, අපගේ ප්‍රධාන පාර්ශවකරුවන් සමග වන සම්බන්ධතාවය පවත්වා ගනිමින් සහ අපගේ අදාළබව රැකගනිමින් ඩිජිටල්කරණයේ ප්‍රතිලාභ ශ්‍රී ලාංකික ජනතාව වෙත ලැබෙන බව සහතික කරයි. නුදුරු අනාගතයේදී ක්‍රියාත්මක කිරීමට නියමිත මධ්‍යගත බැංකුකරණ පද්ධතිය, භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය සහ මානව සම්පත් කළමනාකරණ පද්ධතිය වැඩි කාර්යක්ෂයතාවයක් සමග විචක්ෂණශීලී වර්ධනයක් අත්කරගැනීමට අපට උපකාර කරනු ඇත. අපගේ මෙහෙයුම් සම්බන්ධයෙන් සිදු කෙරෙන ඩිජිටල් පරිවර්තනය ඔස්සේ අපගේ භාණ්ඩාගාර මෙහෙයුම් කාර්යක්ෂම අයුරින් විධිමත් කිරීමට, සේවානියුක්තිකයන්ගේ ඵලදායීතාවය වර්ධනය කිරීමට සහ පිරිවැය කාර්යක්ෂමතා ළඟා කරගැනීමට අපට හැකියාව ලබාදෙනු ඇත.

## අපගේ තිරසාරභාවය ගොඩනැගීම

අප ඔවුන්ට සිය ඉලක්ක කරා ළඟාවීමට සහයවීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග, අඛණ්ඩතාවය සහ එකිනෙකා සමග හුවමාරු කරගත් වටිනාකම් සමූහයක් මත පදනම් වන බව සහතික කරමින් අපගේ ගනුදෙනුකරුවන් අප කෙරෙහි තබන විශ්වාසය මත අපගේ සාර්ථකත්වය රඳා පවතියි. සේවානියුක්තිකයන්ගේ නියුක්තභාවය, සමාජ සහ පාරිසරික තිරසාරභාවය, මූල්‍ය ස්ථායීතාවය, අවදානම් කළමනාකරණය සහ ඊට අදාල ප්‍රතිපත්ති භාවිතය සහ වෙළඳපොල සංවර්ධනය ඔස්සේ තිරසාරභාවය අපගේ උපායමාර්ගය සමග බද්ධ කර ඇත.

අපගේ සේවානියුක්තිකයන් මෙම වගකීම ඉටුකිරීමට උදක්ම කැපවී සිටින අතර මූල්‍ය, සමාජයීය සහ පාරිසරික සාධක සාර්ථකව කළමනාකරණයෙහිලා අපගේ හැකියාව පිටුපස තිබෙන්නේ ඔවුන්ගේ අධිෂ්ඨානයයි. පාරිසරික තිරසාරභාවය උදෙසා වන අපගේ කැපවීම සහ අපගේ නිමැවුම් වෙත ප්‍රවේශවීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා මේ වන විටත් ක්‍රියාවට නංවා තිබෙන ක්‍රියාමාර්ග ඔස්සේ ගනුදෙනුකරුවන් සහ ප්‍රජාවන් ප්‍රතිලාභ ලබයි. වඩාත් විවිධවූ සහ සියළු ජන කාණ්ඩ නියෝජනය කරන පිරිස් ඇතුළත් ශ්‍රම බලකායක් ගොඩනැගීම සහ සේවකයන්ගේ රාජකාරී සහ පෞද්ගලික ජීවිතය අතර මනා තුලනයක් පවත්වා ගැනීම සම්බන්ධයෙන් අපි විශිෂ්ඨ ප්‍රගතියක් අත්කරගෙන සිටිමු. එසේම, අපි ජාතික සංවර්ධනය සහ ජාතික මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය සහ තිරසාරභාවය පවත්වා ගැනීම සඳහා සහයවීමට අඛණ්ඩව කටයුතු කළෙමු. 2019 වර්ෂයේදී අපි, බදු, අයබදු සහ ලාභාංශ වශයෙන් රුපියල් බිලියන 11.3 ක් රජය වෙත ප්‍රදානය කළ අතර එය රජය විසින් ආර්ථික සහ සමාජයීය ව්‍යාපෘති ඔස්සේ වටිනාකම් නිර්මාණය කිරීම සඳහා යොදා ගන්නා ලදී.

අප එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක සඳහා සහය පළ කරන ලද අතර අපගේ ව්‍යාපාරයට සහ මෙහෙයුම් සඳහා ඍජුව අදාළ වන තිරසර සංවර්ධන ඉලක්ක ආමන්ත්‍රණය කිරීමට අපි අඛණ්ඩව කටයුතු කරන්නෙමු. තිරසර සංවර්ධන ඉලක්ක ආමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් වන අපගේ කැපවීම සහ මේ වන විට අප විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග අපගේ වාර්ෂික වාර්තාවෙන් ඉදිරිපත් කර තිබේ.

## සාර්ථක අනාගතයක නිර්මාණය කරමින්

වසර 187 කට වැඩි පිරිපුන් මූල්‍ය උරුමයක් සහිත මෙරට විශාලතම විශේෂිත රාජ්‍ය බැංකුව ලෙස සංගත, තරඟකාරී, ලාභදායී සහ වගකීම් සහගතවූ තිරසාර වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියක් කෙරෙහි අවධානය යොමු කරමින් අපගේ පාර්ශවකරුවන් වෙත ඉහළ වටිනාකමක් සැපයීම සහ ශක්තිමත් සහ විචක්ෂණශීලී වර්ධනයක් ළඟා කරගැනීම සඳහා අපි අඛණ්ඩව ක්‍රියා කරමු. මෙහෙයුම් විශිෂ්ටත්වය, ආර්ථික අන්තර්ග්‍රහණය, ගනුදෙනුකාර සේවාව සහ ව්‍යාපාර ආචාර ධර්ම සහ අඛණ්ඩතාවය සම්බන්ධයෙන් ප්‍රමිතියක් ස්ථාපිත කරමින් අපි පූර්වාදර්ශයෙන් නායකත්වය සපයමු. අප ආයතනික පාලනය ආශ්‍රිතව ඉහළම ප්‍රමිති පවත්වාගැනීම සහ අනුකූලතා හා අවදානම් කළමනාකරණ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සිදු කරන හෙයින් පාලනය සහ අවදානම් කළමනාකරණය අප අවධානය යොමු කරන ප්‍රධාන ක්ෂේත්‍ර වේ.

ගනුදෙනුකරුවන්ට, වඩා පුද්ගලබද්ධවූ සහ ස්වකැමැත්ත මත පදනම්වූ බැංකුකරණ අත්දැකීමක් ලබාදීමට අපගේ මෙහෙයුම් තවදුරටත් විධිමත් කිරීම සඳහා තාක්ෂණයේ සහ දත්ත මත පදනම්වූ සංස්කෘතියක ශක්‍යතාවය සොයාබැලීමට අපි නිරන්තරයෙන් උත්සුක වෙමු. කැපවීමෙන් සේවය කරන අපගේ සේවානියුක්තිකයන් කණ්ඩායම අපගේ ශක්තිමත්ම වත්කම වේ. සෑම දිනකම අපගේ ගනුදෙනුකරුවන් වෙනුවෙන් වඩා හොඳ සේවයක් ලබාදෙන අතරතුර නිසි භූමිකා ඉටු කරන හොඳම සේවක කණ්ඩායම් අප සතු බව සහතික කිරීම සඳහා ඔවුන් සවිබලගැන්වීම සහ ඔවුන්ගේ කුසලතා වර්ධනය කිරීම සඳහා දැනටමත් සිදු කර තිබෙන ආයෝජන ඔස්සේ අපි අඛණ්ඩවම කටයුතු කරමු. පරිගණක වංචා අවම කිරීම මෙන්ම පුහුණු වැඩසටහන් පෙළක් ඔස්සේ අපගේ කාර්යමණ්ඩලය අතර අවදානම් සවිඥානික සංස්කෘතියක් නිර්මාණය කිරීම සඳහා අපි ඉහළම තත්ත්වයේ ආරක්ෂක පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කරන්නෙමු. අපගේ පූර්ණ පරිපාලිත සමාග මක් වන ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව ඔස්සේ නව නිමැවුම් සහ මූල්‍ය සේවා කළඹ සමගින් මෙතෙක් ග්‍රහණය කරනොගත් වෙළඳපොල ක්ෂේත්‍ර කරා ප්‍රවේශ වෙමින් ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රය තුල අපගේ මෙහෙයුම් විවිධාංගීකරණය සහ පුළුල් කිරීම සිදු කරමු. එසේම, අපි අපගේ සේවා ඔස්සේ සියළු ශ්‍රී ලාංකිකයන්ගේ ජීවිත ඔප්නැංවීමට අඛණ්ඩව උත්සුක වන අතර සියළු ව්‍යාපාරික ක්‍රියාවලි සහ සැපයුම් දාම ආශ්‍රිතව නවෝත්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ මතුවෙමින් තිබෙන අවස්ථා උපරිම වශයෙන් උපයෝජනය කිරීමටද උත්සුක වෙමු.

අප මෙම ලිපිය ලියන අවස්ථාව වන විට කොවිඩ් - 19 පැතිරීම ගෝලීය වසංගත තත්ත්වයක් ලෙස ප්‍රකාශයට පත් කර තිබෙන අතර 2020 සහ ඉන් ඉදිරියට ගෝලීය ආර්ථික සංවර්ධනය කෙරෙහි සැලකිය යුතු අභියෝග එල්ල කරමින් ගෝලීය සැපයුම් දාම සහ ජාත්‍යන්තර වෙළඳාම ආශ්‍රිත බරපතල බිඳවැටීම්, ජාත්‍යන්තර සංචාරක කර්මාන්තය සහ ව්‍යාපාරික සංචාරක අවම වීම සහ පරිභෝජනය


පහළයාම ආදිය සිදු විය හැකිය. මෙම තත්ත්වය හමුවේ අපගේ සේවානියුක්තිකයන්ගේ මෙන්ම ගනුදෙනුකරුවන්ගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සුදුසු පියවර ගෙන ඇති අතර බැංකුවේ තිරසාර කාර්යාසධනය පවත්වා ගැනීම සඳහා නිශ්චිත ක්‍රියා සැලැස්මක් ක්‍රියාවට නැංවීමට කටයුතු කෙරේ.

අපි තව දුරටත් දිරිමත්ව, අරමුණක් සහිතව සහ ධනාත්මකව කටයුතු කරමු. ශක්තිමත් සහ තිරසාර සංවිධානයක්ඃ ශක්තිමත් සහ විවිධාංගීකරණයවූ ව්‍යාපාරික මිශ්‍රයක්ඃ ශක්තිමත් ශේෂ පත්‍රයක් සහ ප්‍රාග්ධන තත්ත්වයක්ඃ නියාමන අනුකූලතාවය පවත්වා ගැනීම සඳහා වන නොසැලෙන කැපවීමක්ඃ බැංකුවේ සෑම මට්ටමකම කැපවීමෙන් කටයුතු කරන සේවකයන්, වටිනාකම් නිර්මාණය කරන උපායමාර්ගයක්, විවිධාංගීකරණය සහ අන්තර්ග්‍රහණය පිළිබඳ වගකීම සහ අවංකභාවය පිළිබඳ සංස්කෘතියක් අප සතුව ඇත.

## දායකත්වය අගයමින්

ශක්තිමත් සහ නිසි සහයෝගය මෙන්ම ප්‍රතිභාපූර්ණ මගපෙන්වීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ මාගේ සහෝදර සාමාජිකයන් වෙත කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. අපගේ නව වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, දමිතා කුමාරි රත්නායක මහත්මිය බැංකුව වෙත සාදරයෙන් පිළිගැනීමට මම මෙය අවස්ථාව කරගනිමි. ඉදිරි වසර වලදී ජාතික ඉතිරිකිරීමේ බැංකුව ඉහළ තල කරා රැගෙන යාමෙහිලා ඇය සුවිශේෂී දැනුම් සම්භාරයක් හා අත්දැකීම් සමුදායක් සමග දායකත්වය සපයනු ඇත. බැංකුව උදෙසා ලබාදුන් අමිල දායකත්වය වෙනුවෙන් බැංකුවේ හිටපු සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, එස් ඩී එන් පෙරේරා මහතා වෙත ස්තුතිය පළ කරමි.

කැපවීමෙන් හා හිතෛෂීභාවයෙන් යුතුව කටයුතු කරන සාමාන්‍යාධිකාරීතුමිය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය ප්‍රමුඛ අපගේ කණ්ඩායමට මාගේ හදපිරි ස්තුතිය පිරිනමමි. සාර්ථකත්වය වෙත ළඟාවීම, අපගේ ගනුදෙනුකරුවන් සමග සම්බන්ධවීම, නවෝත්පාදක විසඳුම් හඳුන්වාදීම සහ අපගේ සන්නාමය ශක්තිමත් කිරීම කෙරෙහිවූ ඔවුන්ගේ කැපවීම සහ අප්‍රතිහත අවධානය අපගේ සාර්ථකත්වයේ වෙනසක් ඇති කළේය. අපගේ ගණුදෙනුකරුවන්ගේ වටිනා අනුග්‍රහය සහ හිතෛෂීභාවය හා අපගේ පාර්ශවකරුවන් නිරතුරුව අප වෙත ලබාදුන් නොසැලෙන සහයෝගය වෙනුවෙන් මම ඔවුන්ට බෙහෙවින් ස්තුතිවන්ත වෙමි. අප වෙත ලබාදුන් අඛණ්ඩ සහයෝගය සහ උපකාරය වෙනුවෙන් ගරු මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා සහ රාජ්‍ය මුදල් අමාත්‍යතුමාට මාගේ කෘතඥතාවය පුද කරමි. දීපව්‍යාප්තව තැපැල් කාර්යාල වෙතින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවට ලබාදෙන වටිනා සහය වෙනුවෙන් තැපැල්පතිතුමා සහ තැපැල් දෙපාර්තමේන්තුවේ සියළු නිළධාරීන්ට මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි. භාණ්ඩාගාර ලේකම්තුමා සහ නිළධාරීන්, ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිතුමා සහ නිළධාරීන් විසින් අප වෙත ලබාදෙන ලද සහය හා මාර්ගෝපදේශකත්වය මම බෙහෙවින් අගය කරමි. එසේම, ගරු නීතිපතිතුමා සහ විගණකාධිපතිතුමා වෙතද මගේ කෘතඥතාව පුද කරමි.



**කේෂිලා ජයවර්ධන**

සභාපතිතුමිය

2020 මාර්තු 24

# සාමාන්‍යාධිකාරීනි/ප්‍රධාන විධායක නිළධාරීනියගේ සමාලෝචනය

GRI 102-14



අභියෝගාත්මක පරිසරයක් තුල ක්‍රියාත්මක වෙමින් අපගේ සේවානියුක්තිකයන්ගේ තිර අදිටන සහ බැංකුව විසින් අනුගමනය කරන ලද උපායමාර්ගික දිශානතිය ඔස්සේ ශක්තිමත් කාර්යසාධනයක් වාර්තා කිරීමට අපි සමත්වීමු.

| | | |
|---|---|---|
| පෙර වර්ෂයට සාපේක්ෂව බදු පසු ලාභය **48.8%** ක ශක්තිමත් වර්ධනයක් | ගනුදෙනුකරුවන්ගේ තැන්පතු **රු. ට්‍රිලියන 1.0** සන්ධිස්ථානය පසු කරයි | ක්ෂේත්‍රයේ අඩුම අක්‍රිය ණය අනුපාතිකය **1.57%** |
| ගෙවීම් කාඩ්පත් ක්ෂේත්‍රය - දත්ත ආරක්ෂණ ප්‍රමිතිය හිමිකරගත් පළමු රාජ්‍ය බැංකුව | ශ්‍රී ලංකාවේ සුරක්ෂිතම සහ විශාලතම බලපත්‍රලාභි විශේෂිත බැංකුව | පෙර වර්ෂයට සාපේක්ෂ **11.7%** ක වර්ධනයක් සමග වත්කම් රු. ට්‍රිලියන 1.2 |

රට පෙරට ගෙන යාමට උපකාර කරන ආයෝජන සඳහා උපයෝගී කරගත හැකි ඉතුරුම් ඉහළ නැංවීම ඔස්සේ අපි මෙරට සෘජු හා වක්‍ර සේවානියුක්තිය උත්තේජනය කරන අතර ජාතිය උදෙසා ධනය උත්පාදනයෙහි නිරතව සිටිමු.

වසර 187 ක නායකත්වයේ ශක්තිය හා කීර්තිය පසුබිම් කරගෙන ශ්‍රී ලංකාවේ සුරක්ෂිතම සහ විශාලතම බැංකුව ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව සියළුදෙනාටම සුදුසු, මනා, තිරසාර සහ සුරක්ෂිත ඉතිරිකිරීමේ සම්මුතියක් නිර්මාණය කිරීම සඳහා කැපවී සිටී. අභියෝගාත්මක පරිසරයක් තුල ක්‍රියාත්මක වෙමින් අපගේ සේවානියුක්තිකයන්ගේ තිර අදිටන සහ බැංකුව විසින් අනුගමනය කරන ලද උපායමාර්ගික දිශානතිය ඔස්සේ ශක්තිමත් කාර්යසාධනයක් වාර්තා කිරීමට අපි සමත්වීමු.

පාස්කු ඉරුදින ප්‍රහාර හේතුවෙන් පසුබෑමට ලක්වූ ආර්ථික වර්ධනය, ඉහළ වෙළඳපොල පොලී අනුපාත, ප්‍රතිපත්තිමය අවිනිශ්චිතතා සහ පළුදුවූ ව්‍යාපාරික විශ්වාසය වසර තුල පැවති මෙහෙයුම් සන්දර්භයේ විශේෂ ලක්ෂණ විය. ණය ගුණාත්මකභාවය ක්‍රමයෙන් පහළ ගිය පසුබිමක අවම ණය ඉල්ලුමක් සහ දැඩි කරන ලද ණය පරීක්ෂාව ඔස්සේ මෙම අහිතකර තත්ත්වයේ බලපෑම බැංකු ක්ෂේත්‍රය තුලින් පිළිබිඹු විය.

## සැලකිය යුතු කාර්යසාධනයක්

විචක්ෂණශීලී කළමනාකරණය සහ අපගේ වර්ධන සැලැස්ම කාර්යක්ෂමව ක්‍රියාවට නැංවීම පාදක කරගෙන අභියෝගාත්මක මෙහෙයුම් සන්දර්භය මධ්‍යයේ 2019 මූල්‍ය වර්ෂය තුලදී 48.8% ක පෙර වර්ෂයට සාපේක්ෂ වර්ධනයක් සමගින් රුපියල් බිලියන 6.7 ක බදු පසු ලාභයක් වාර්තා කළෙමු. 15.9% ක වර්ධනයක් සමග ශුද්ධ පොලී ආදායම රුපියල් බිලියන 28.8 ක් බවට පත්වූ අතර ශුද්ධ පොලී නොවන ආදායම පෙර වර්ෂයට සාපේක්ෂ 144.6% ක සැලකිය යුතු වර්ධනයක් සමග රුපියල් බිලියන 3.1 ක් ලෙස සටහන් විය. මෙහෙයුම් වියදම 11.2% න් ඉහළ ගියද බැංකුව තුල ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම පිළිබිඹු කරමින් ආදායමට සපේක්ෂ වියදම් අනුපාතිකය 49.35% ක් ලෙස සටහන් විය. ප්‍රධාන වශයෙන් ණය ආපසු ගෙවීමේ බද්ද හේතුවෙන් බදු 34.3% ක වර්ධනයක් සමගින් රුපියල් බිලියන 9.0 දක්වා ඉහළ ගියේය.

2019 වර්ෂයේදී වත්කම් පදනම 11.7% ක වර්ධනයක් සමග රුපියල් ට්‍රිලියන 1.2 ක් දක්වා ඉහළ ගියේය. රුපියල් ට්‍රිලියන 1.02 ක් ලෙස සටහන්වූ වත්කම් වල 21.1% ක වර්ධනය මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. සමාලෝචනයට ලක් කෙරෙන කාල පරිච්ඡේදය තුලදී බැංකුවේ තැන්පතු පදනම මෙතෙක් වාර්තා කරන ලද ඉහළම සංචලනය ළඟා කරගන්නා ලද අතර එය රුපියල් බිලියන 171.4 ක් විය. මෙය අපගේ ගනුදෙනුකරුවන් බැංකුව කෙරෙහි තබා ඇති ශක්තිමත් විශ්වාසය පිළිබඳ ශක්තිමත් පිළිබිඹුවකි. බැංකුවේ වත්කම් වල ඉහළ ගුණාත්මකභාවය විදහා දක්වමින් 1.57% ක අගයක් සටහන් කළ අක්‍රිය ණය අනුපාතිකය මගින් පෙන්නුම් කරන ලද වත්කම් වල ගුණාත්මකභාවය ආරක්ෂා කරගන්නා අතරතුර 7.4% ක වර්ධනයක් සමගින් අප අපගේ ණය පදනම රුපියල් බිලියන 454.4 ක් දක්වා වර්ධනය කරගෙන තිබේ.

එක්සත් ජනපද ඩොලර් 250 ක වටිනාකමක් සහිත එක්සත් ජනපද ඩොලර් මුදල් ඒකකයෙන් නිකුත් කරන ලද බැඳුම්කරය කල්පිරීමේදී ගෙවා අවසන් කිරීමට අපි කටයුතු කළෙමු. කෙසේවුවත්, ඉහත සඳහන් කළ එක්සත් ජනපද ඩොලර් බැඳුම්කරය මත අත්සන් තබන ලද එක්සත් ජනපද ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් ව්‍යුත්පන්න ගිවිසුමෙන් නිදහස්වීම සඳහා වන අරමුදල් අවශ්‍යතාවය මූල්‍යනය කිරීමට රුපියල් බිලියන 20.0 ක ජ්‍යෙෂ්ඨ ණයකරයක් නිකුත් කරන ලදී.

2019 ජනවාරි 1 වන දින සිට බලපැවැත්වෙන කල්බදු සම්බන්ධ නව ගිණුම්කරණ ප්‍රමිතිය වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය - 16 (SLFRS - 16) අප විසින් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. මෙහෙයුම් කල්බදු හෝ මූල්‍ය කල්බදු වශයෙන් බදුගැනුම්කරුගේ වර්ගීකරණය මෙම නව ගිණුම්කරණ ප්‍රමිතිය යටතේ ඉවත් වන අතර ඒ වෙනුවට ශේෂ පත්‍රයේ කල්බදු වගකීමක් හා වත්කම් උපයෝජනය කිරීමේ හිමිකම හඳුනාගැනීම ඔස්සේ සියළු කල්බදු "ප්‍රාග්ධනීකරණය" (Capitalized) කෙරේ.

වසර තුලදී අපි Near Field Communication (NFC) සම්මුතිය සහිත හර කාඩ්පත් හඳුන්වාදෙන ලද අතර අප විසින්ම මුද්‍රණය කරනු ලබන EMV චිපය සහිත හර කාඩ්පත් නිකුත් කිරීම ආරම්භ කෙරිණ. විදේශ සංක්‍රමණික සේවකයන්ට නිවසක් ඉදිකිරීම සඳහා මූල්‍ය සහය සැපයීම අරමුණු කරගෙන "සිහින මාළිගා" නමින් විශේෂ නිවාස ණය ක්‍රමයක් හඳුන්වාදෙන ලදී. ඒ යටතේ ලබාගත හැකි උපරිම ණය මුදල රුපියල් මිලියන 10 ක් වන අතර වසර 15 ක ආපසු ගෙවීමේ කාල සීමාවක් සහ වසර 2 ක සහන කාලයක් ඒ යටතේ හිමිවේ.

ගෙවීම් කාඩ්පත් ආරක්ෂණය සඳහා වන වඩාත්ම පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතිය වන "ගෙවීම් කාඩ්පත් ක්ෂේත්‍රය - දත්ත ආරක්ෂණ ප්‍රමිති සහතිකය" ලබාගත් ප්‍රථම රාජ්‍ය බැංකුව අපි වෙමු. එසේම, බ්‍රෑන්ඩ් ෆයිනෑන්ස් ආයතනය විසින් අපගේ සන්නාමය ශ්‍රී ලංකාවේ පස්වන වටිනාම සන්නාමය ලෙස නම් කරන ලදී.

මෙරට ජනතාවගේ බහුවිධවූ අරමුණු සඳහා සිත්ගන්නාසුළු සහ දැරිය හැකි ආකාරයේ නව නිමැවුම් ඉදිරිපත් කිරීමට අපි අඛණ්ඩව කටයුතු කරන්නෙමු. ඩිජිටල් බැංකුකරණ සේවා සැපයීම සඳහා වන සුහුරු කලාප ස්ථාපිත කිරීම, අන්තර්ජාල බැංකු සේවා හඳුන්වාදීම සහ iSaver සහ NSB රීච් වැනි නිමැවුම් මගින් අපගේ සියළු සේවා කවුළු ඔස්සේ විශිෂ්ට සේවා ඵලදායීතාවයක් සහ ගනුදෙනුකරුවන් සමග ඉහළ මට්ටමේ සබඳතාවයක් සහතික කර තිබේ.

2019 වර්ෂයේදී ග්ලෝබල් ෆයිනෑන්ස් සඟරාව විසින් අඛණ්ඩව 4 වන වරටත් ජාතික ඉතිරිකිරීමේ බැංකුව ශ්‍රී ලංකාවේ සුරක්ෂිතම බැංකුව ලෙස නම් කරන ලදී. එසේම, 2019 ජූනි මාසයේදී මූඩීස් ඉන්වෙස්ටර්ස් සර්විස්හි සමූහ සමාගමක් වන ඉක්‍රා ලංකා ලිමිටඩ් (ICRA Lanka Limited) විසින් අප වෙත ත්‍රිත්ව A ස්ථාවර ණය ශ්‍රේණිගත කිරීම ලබාදෙන ලදී. අප සතු 100% ක රාජ්‍ය ආරක්ෂාව සහ තැන්පතු මත සුවිශේෂී රාජ්‍ය වගකීම, උසස් තත්වයේ ණය කළඹ, වර්තමානය සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධන කළඹ සහ අවම අවදානමක් සහිත ආයෝජන කළඹ මෙම ණය ශ්‍රේණිගත කිරීම මගින් පිළිඹිබු කරයි.

## අපගේ උපායමාර්ගික න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් ශක්තිමත් ප්‍රගතියක්

2017 සිට 2019 දක්වා වන තෙවසර සඳහා වන අපගේ දිශානතිය දක්වන ත්‍රෛයිවාර්ෂික ව්‍යාපාරික සැලසුමෙහි උපායමාර්ගික න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් අප ශක්තිමත් ප්‍රගතියක් ලබා තිබේ. අපි තිරසාරභාවය අපගේ ආයතනික උපායමාර්ගය සහ ආයතිනක තිරසාරභාවය පිළිබඳ ප්‍රතිපත්ති ඔස්සේ ව්‍යාපාරික ආකෘතිය සමග ඒකාබද්ධ කිරීමට කටයුතු කළෙමු.

අපගේ තාක්ෂණික ආයෝජනය ගනුදෙනුකරුවන්ගේ බැංකුකරණ අත්දැකීම වැඩි දියුණු කරන අතර සියළු මට්ටම් වල සේවය කරන සේවානියුක්තිකයන්ගේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය ඉහළ නැංවීමට උපකාරී වේ. මානවයන් හා ඩිජිටල්කරණය අතර අන්තර්ක්‍රියා අසීමිත ලෙස ඒකාබද්ධ වීම ඔස්සේ අප අපගේ ගනුදෙනුකරුවන් වෙත තවදුරටත් සමීපවී

සිටින අතර ගනුදෙනුකරුවන් වෙත වැඩිදියුණු කරන ලද බැංකුකරණ අත්දැකීමක් ලබාදීමට අපට එමගින් අවස්ථාව සැලසේ. ගනුදෙනුකරුවන්ගේ නිශ්චිත අපේක්ෂා සහ සුරක්ෂිත, පහසු, වේගවත් සහ අවම පිරිවැයක් සහිත මූල්‍ය විසඳුම් සඳහා වන ඔවුන්ගේ අවශ්‍යතාවය අවබෝධ කරගැනීම ඔස්සේ මෙරට ඇති වෙනත් ඕනෑම වාණිජ බැංකුවකට සමානව වේගවත්, සුහුරු හා නව තාක්ෂණය මත පදනම්වූ සේවා සැපයීම සම්බන්ධයෙන් අප විසින් අර්ථවත් ප්‍රස්තුතයක් සපයනු ලැබ ඇත.

ජනතාවගේ ඉතුරුම්හි සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව ජාතියේ ප්‍රගමනය උදෙසා ඉතා වැදගත් වන බව අපගේ විශ්වාසයයි. ආචාර ධර්ම වලට අනුකූලව ක්‍රියාත්මකවීම, අවංකභාවයෙන් යුතුව කටයුතු කිරීම සහ අපගේ අවදානම් කළමනාකරණය කරගැනීම යන කරුණු වලින් හෙබි සංස්කෘතියක් සමග ණය අවදානම අවම කිරීම, තොරතුරු ආරක්ෂාව ශක්තිමත් කිරීම සහ ශක්තිමත් ප්‍රාග්ධන හා ද්‍රවශීලතා පදනමක් පවත්වා ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීමට අප විසින් පියවර ගන්නා ලදී.

අපගේ කාර්යමණ්ඩලය වෙනුවෙන් සිදු කරන ආයෝජනය කිරීම අපට සිදු කළ හැකි හොඳම ආයෝජන වලින් එකකි. බැංකුවේ ස්ථාවරත්වය සහ කාර්යක්ෂමතාවය අර්ථවත් ලෙස ඉහළ නංවමින් පසුගිය වසර කිහිපය තුළදී අපි අපගේ නායකත්ව කණ්ඩායම් වෙනුවෙන් සැලකිය යුතු අයුරින් ආයෝජනය කළෙමු. එසේම, ව්‍යාපාරික අවශ්‍යතා සහ වෘත්තිමය අභිලාෂ මැනවින් පෙළගස්වමින් අභ්‍යන්තර, බාහිර සහ විදේශ පුහුණු වැඩසටහන් ඔස්සේ අපගේ සේවානියුක්තිකයන් පුහුණු කිරීම හා සංවර්ධනය කිරීමෙහිලා අපි සැලකිය යුතු මට්ටමේ ආයෝජනයක් සිදු කළෙමු. ඉහළින් අභිප්‍රේරණයවූ, සේවයේ නියුක්තවූ සහ සේවයට කැපවූ සේවා නියුක්තිකයන් පිරිසක් පෝෂණය කරමින් අප විසින් කාර්යමණ්ඩලයේ සුභසාධක පහසුකම් වැඩි දියුණු කරන ලද අතර ඔවුනගේ රාජකාරී ජීවිතය හා පෞද්ගලික ජීවිතය අතර තුලනය ඉහළ නැංවීමට කටයුතු කෙරිණ. සේවා නියුක්තිකයන්ගේ විවිධත්වය හා ඇතුළත්බව සහතික කිරීමෙහිලා වන අපගේ ප්‍රයත්නය හේතුවෙන් ආයතනික කළමනාකාරීත්වයේ කාන්තා නියෝජනය ඉහළ ගොස් තිබේ. 2019 වසර අවසානයට බැංකුවේ ආයතිනක කළමනාකාරීත්වයෙන් 43% ක් කාන්තාවෝ වූහ.

ආයතනික සමාජ වගකීම සහ තිරසාර ව්‍යාපාරික පරිචයන් උදෙසා වන අපගේ කැපවීම අපගේ වටිනාකම් සහ ආයතනික සංස්කෘතියේ ඓන්ද්‍රීය කොටසක්වේ. මෙම කැපවීම ඔස්සේ අපගේ පාර්ශවකරුවන් සඳහා දිගු කාලීන වටිනාකම් එකතු කිරීමට අපට හැකියාව ලැබෙන අතර අපගේ සියළු සේවා සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් සමග ආයතනික සමාජ වගකීම ඒකාබද්ධ කිරීමට අප පියවර ගතිමු.

අප විසින් වායුගෝලයට මුදා හරිනු ලබන කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය (Carbon Footprint) අවම කිරීම සහ පාරිසරික තිරසාරභාවය සඳහා වන අපගේ ප්‍රයත්නය වෙනුවෙන් 2018 තක්සේරුකරණ වර්ෂය සඳහා ශ්‍රී ලංකා කාලගුණ පදනම (Sri Lanka Climate Fund) විසින් නිකුත් කරන ලද කාබන් උදාසීනකරණ සහතිකය (Carbon Neutral Certificate) ලබාගැනීමට අපට හැකි විය.

රජයට ණය සපයන ප්‍රධාන ආයතනයක් හා ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම රාජ්‍ය සුරැකුම් හිමිකරු ලෙස භාණ්ඩාගාරය වෙත බදු, අයබදු, ගාස්තු සහ ලාභාංශ වශයෙන් අපගේ දායකත්වය ලබාදෙමින් අපි ජාතියට සේවය සලසන්නෙමු. අපි මෙරට දිගු කාලීන සංවර්ධන ව්‍යාපෘති සහ වෙනත් සමාජයීය හා ආර්ථික ව්‍යාපෘති සඳහා අරමුදල් සම්පාදනය කිරීම ඔස්සේ ජාතිය ගොඩනැගීමේ කාර්යය වෙනුවෙන් රජය සමග අත්වැල් බැඳ සිටින අතර මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය සහ තිරසාරභාවය පවත්වාගැනීමෙහිලා රජයට සහය වෙමු. පුද්ගලයන් වෙත ණය ලබාදීම සැලකිල්ලට ගන්නා විට අපි ශ්‍රී ලංකාවේ නිවාස වෙළඳපොල තුල විශාලතම වෙළඳපොල කොටසට හිමිකම් කියන වැඩිම ණය ප්‍රමාණයක් සපයන ආයතනය වෙමු. රට පෙරට ගෙන යාමට උපකාර කරන ආයෝජන සඳහා උපයෝගී කරගත හැකි ඉතුරුම් ඉහළ නැංවීම ඔස්සේ අපි මෙරට සෘජු හා වක්‍ර සේවානියුක්තිය උත්තේජනය කරන අතර ජාතිය උදෙසා ධනය උත්පාදනයෙහි නිරතව සිටිමු.

## තිරසාර බැංකුවක් උදෙසා වන අපගේ දැක්ම

අප විසින් ශක්තිමත් හා ස්ථාවර බැංකුවක් ගොඩනගනු ලැබ තිබේ. අප ක්‍රියාත්මක වන පරිසරය වේගයෙන් වෙනස් වෙමින් පැවතියද අපගේ ගනුදෙනුකරුවන් වෙත ප්‍රශස්ත සේවයක් ලබාදීම සඳහා ඩිජිටල්කරණය සහ නව්‍යකරණය සඳහා වන අපගේ ප්‍රයත්නය ශක්තිමත් කිරීමට කටයුතු කරමු. මේ ක්‍රියාවලියේදී අපගේ සේවානියුක්තිකයන් සැලකිය යුතු භූමිකාවක් ඉටු කරනු ඇත.


මේ වන විට උද්ගතව ඇති කොවිඩ් - 19 ගෝලීය වසංගත තත්ත්වය හා එහි හානිකර ප්‍රතිඵල හමුවේ අපගේ ඇල්මැති පාර්ශවයන්ගේ අවශ්‍යතා සපුරාලීමට අපි අඛණ්ඩව කැපවී සිටිමු. එහිදී අපගේ ඇල්මැති පාර්ශවයන් ආරක්ෂා කරගැනීම සහ අපගේ ව්‍යාපාරික මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගැනීම සඳහා අප විසින් සුදුසු ආරක්ෂක ක්‍රමවේද සහ මෙහෙයුම් ක්‍රියාමාර්ග ස්ථාපිත කරනු ලැබ තිබේ.

100%ක රාජ්‍ය ආරක්ෂාව සහිත ශ්‍රී ලංකාවේ එකම විශේෂිත බැංකුව අපි වෙමු. ආරම්භයේ සිටම අප බැංකුව නිපුණ අධ්‍යක්ෂ මණ්ඩලයක් සහ කළමනාකාරීත්වයක් විසින් නිසි ලෙස පාලනය කෙරෙන අතර අපගේ ජනතාවගේ අපේක්ෂා සපුරාලීමට කටයුතු කර ඇත. බෙහෙවින් සාඩම්බර විය හැකි විශිෂ්ට සන්නාමයක් හා කීර්ති නාමයක් අප සතුය. ඉදිරියේදීද අපගේ සියළු ඇල්මැති පාර්ශවකරුවන් වෙත ඉහළ වටිනාකමක් සපයමින් අපගේ ජවය ඉහළ නංවාගැනීමට, අපගේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සඳහා අපගේ අදාළබව වර්ධනය කරගැනීමට හා වඩාත් හොඳ බැංකුවක් බවට පත්වීමට අපි උත්සුක වෙමු.

## ඇගයීම

අපගේ ගනුදෙනුකරුවන් අප වෙත දැක්වූ පක්ෂපාතීත්වය සහ අනුග්‍රහය සහ අපගේ කොටස් හිමියාගේ ස්ථිරසාර සහයෝගය වෙනුවෙන් මම ඔවුන්ට ස්තුතිවන්ත වෙමි. එසේම, සභාපතිතුමිය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදෙන ලද මගපෙන්වීම සහ විචක්ෂණශීලී නායකත්වය මම බෙහෙවින් අගය කරමි. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ හිටපු සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, එස් ඩී එන් පෙරේරා මහතාගේ වටිනා දායකත්වය වෙනුවෙන් එතුමාට ස්තුතිය පුද කරමි.

කළමනාකාරීත්ව කණ්ඩායමේ සහ කාර්ය මණ්ඩලයේ මිල කළ නොහැකි දායකත්වය සහ කැපවීම මම ඉතා අගය කරමි. ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත දැක්වූ සහයෝගය වෙනුවෙන් තැපැල්පතිතුමා සහ තැපැල් දෙපාර්තමේන්තුවේ සියළු නිළධාරීන් වෙත මාගේ කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. ගරු මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, රාජ්‍ය මුදල් අමාත්‍යතුමා, භාණ්ඩාගාර ලේකම්තුමා සහ නිළධාරීන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා සහ නිළධාරීන්, ගරු නීතිපතිතුමා, විගණකාධිපතිතුමා සහ එතුමාගේ කණ්ඩායම, අනෙකුත් නියාමන ආයතන ප්‍රධානීන් සහ ඔවුන්ගේ කණ්ඩායම් අප වෙත දැක්වූ අඛණ්ඩ සහයෝගය සහ මගපෙන්වීම වෙනුවෙන් මගේ කෘතඥතාව ප්‍රකාශ කරමි.



**දමිතා රත්නායක**

වැඩබලන සාමාන්‍යාධිකාරිනී/
ප්‍රධාන විධායක නිළධාරිනී

2020 මාර්තු 24

# අපගේ වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ දැක්ම, මෙහෙවර, වටිනාකම් සහ ක්‍රමෝපාය ආදියෙන් මාර්ගෝපදේශය ලැබූ බැංකුවේ වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය පිළිබඳ විස්තීර්ණ සාකච්ඡාවකි. වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය පිළිබඳ දළ විශ්ලේෂණයක් ඉදිරිපත්කරන ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ව්‍යාපාර ආකෘතිය මෙම කොටසට ඇතුළත් වේ. තවද, එමඟින් බැංකුවේ මෙහෙයුම් පරිසරය ඉදිරිපත් කරනු ලබන අතර, බැංකුවේ ක්‍රමෝපාය සකස් කිරීමට දායකවන බැංකුවේ ගනුදෙනුකරුවන් නිරතකර ගැනීමේ ක්‍රියාවලිය, සැලකියයුතු කරුණු හඳුනාගැනීමේ ක්‍රියාවලිය සහ තිරසාර ප්‍රතිපත්තිය කෙටියෙන් දක්වයි.


**20** අපගේ තිරසාර ව්‍යාපාර ආකෘතිය

**22** මෙහෙයුම් පරිසරය

**49** අපගේ ක්‍රමෝපාය

**70** පාර්ශ්වකරුවන්

**78** ප්‍රමාණාත්මක කරුණු




# අපගේ තිරසාර ව්‍යාපාර ආකෘතිය

මෙහෙයුම් පරිසරය (පිටු 22 - 48 බලන්න)

දේශපාලන හා ආර්ථික රටාවන්හී වෙනස්වීම් (යොමුව පිටු අංක 36 - 38)

**පාර්ශ්වකරුවන්**

70-77 පිටු බලන්න

- කොටස් හිමිකරු/ ආයෝජකයා
- ගනුදෙනුකරු
- සේවා නියුක්තිකයන්
- නියාමන හා රජයේ ආයතන
- ව්‍යාපාර හවුල්කරුවන්
- සමාජය සහ පරිසරය

**යෙදවුම්**

**මූල්‍ය ප්‍රාග්ධනය** 90 සිට 111 පිටු

ස්ථිර ප්‍රාග්ධන පදනම හා තුලනය කළ අරමුදල් මුසුව තැන්පතු ගැනීමේ හා ණයදීම පිළිබඳ මෙහෙයුම් හා ව්‍යාපාර කටයුතුවලට සහය වේ.

- කොටස් ප්‍රාග්ධනය හා සංචිත
- මුදල් හා මුදලට සමාන දෑ
- දිගුකාලීන සහ කෙටිකාලීන ණය ගැනීම්
- ගනුදෙනුකාර තැන්පතු

**නිෂ්පාදිත ප්‍රාග්ධනය** 112 සිට 119 පිටු

අපගේ ගනුදෙනුකරුවන්ට නිෂ්පාදන හා සේවා නිෂ්පාදනයේදී සහ බෙදාහැරීමේදී භාවිතා කරන තාක්ෂණය ඇතුළු යටිතලපහසුකම්.

- දේපල, පිරියත හා උපකරණ
- ඩිජිටල් යටිතලපහසුකම්
- ගනුදෙනුකාර පිවිසුම් ස්ථාන

**මානව ප්‍රාග්ධනය** 130 සිට 143 පිටු

සේවයට කැප වූ, නිරත වූ සහ ඉහළ කාර්යසාධනයක් සහිත සේවකයින්.

- නව බඳවාගැනීම් 296
- පුහුණු පැය 32,138
- උසස්වීම් 645
- සමාන අවස්ථා සේවායෝජක
- යහපත් රැකියා-ජීවිත තුලනය

**සමාජීය හා සම්බන්ධතා ප්‍රාග්ධනය** 144 සිට 161 පිටු

ගනුදෙනුකරුවන්, ව්‍යාපාර හවුල්කරුවන්, නියාමකයින් සහ අප ක්‍රියාත්මක ප්‍රජාවන් ඇතුළුව විවිධ පරාසයක පාර්ශ්වකරුවන් සමඟ සහයෝගී සම්බන්ධතා.

- ලියාපදිංචි ව්‍යාපාර හවුල්කරුවන් 351
- විස්තීර්ණ නිමැවුම් කළඹ
- තැන්පතු සහ ඒ මත වූ පොලී සඳහා 100% රජයේ සහතිකය
- විවිධ ගනුදෙනුකාර පිවිසුම් ස්ථාන
- 100% දේශීය සැපයුම්කරුවන්ගෙන් ප්‍රසම්පාදනය
- ව්‍යාපාර හවුල්කරුවන් සමඟ උසස් සම්බන්ධතා
- ආයතනික සමාජීය වගකීම් ව්‍යාපෘතිවල රු.මි. 30ක ආයෝජනය

**බුද්ධිමය ප්‍රාග්ධනය** 120 සිට 129 පිටු

ශක්තිමත් සන්නාමය, ගනුදෙනුකාර පක්ෂපාතීත්වය, අභ්‍යන්තර ක්‍රම සහ ක්‍රියාවලි, ආයතනික සාරධර්ම සහ විශේෂ නිපුණතා සහ දක්ෂ සේවකයින්.

- ආයතනික සංස්කෘතිය
- ආයතනගත දැනුම
- නව්‍යකරණ සංස්කෘතිය
- ප්‍රතිපත්ති, රාමු සහ ක්‍රියාවලි
- වගකීම් සහගත නායකත්වය

**ස්වභාවික ප්‍රාග්ධනය** 162 සිට 169 පිටු


බලශක්තිය, ජලය සහ අපද්‍රව්‍ය කළමනාකරණය සහ පාරිසරික තිරසාරත්වය.

- ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තිරසාරත්ව ප්‍රතිපත්තිය
- ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වන වගාව තුළ රු.මි. 1.3ක ආයෝජනය
- හරිත බැංකු මූලාරම්භයන්
- මෙහෙයුම් ඩිජිටල්කරණය
- වගකීම් සහගත ණයදීම
- හරිත ණය

නියාමන වෙනස්වීම් (පිටු අංක 46-47)

ජනවිකාශ වෙනස්වීම් (පිටු 44-46 බලන්න)

බාධාකාරී තාක්ෂණය සහිත ඩිජිටල් යුගයක ක්‍රියාත්මක වීම (පිටු 38-40 බලන්න)




පිටු 96-169 බලන්න

## නිමැවුම්

### නිෂ්පාදන

(පිටු 426-429)

**තැන්පතු**

(වාර්ෂිකව 21%ක වර්ධනය)

**ඉතුරුම් තැන්පතු**

**කාලීන තැන්පතු**

**ණය නිෂ්පාදන**

(වාර්ෂිකව 7.5%ක වර්ධනය)

පාරිභෝගික ණය

පුද්ගලණය

නිවාස ණය

උකස් අත්තිකාරම්

වාහන ණය

තැන්පතු මත ණය

ආයතනික ණයදීම

විදේශ ආයෝජනවලට සාජු ණය

ණය සම්මේලන

ව්‍යාපෘති ණය

### සේවා

ප්‍රේෂණ ගලාඒම සහ ගලායාම

වෙළෙඳ මූල්‍ය

ආරක්ෂිත තැන්පතු කුටි

### අගය එකතුකළ සේවා

කාඩ් සේවා

උපයෝගිතා බිල් ගෙවීම

### කාබන් පියසටහන

මධ්‍ය නිර්ණායකවලට අනුකූලව GRI අන්තර්ගත ප්‍රවේශය
(170-174 පිටු බලන්න)

## ප්‍රතිඵල

### මූල්‍ය ප්‍රාග්ධනය

**බදු පසු ලාභය රු.බි. 6.7**
**ගෙවන ලද ලාභාංශ රු.බි. 2**
**රඳවාගත් ඉපයීම් රු.බි. 4.5**
**රජයේ සුරැකුම්පත්වල ආයෝජනය රු.බි 612.7**
**ණය දීමේ වර්ධනය 7.4%**
**වත්කම් පදනම රු. ට්‍රි. 1.2**

- ක්‍රමෝපායික ප්‍රමුඛතා පදනම් අරමුදල් ක්‍රමෝපායක්
- විශිෂ්ඨ මූල්‍ය සහ සමාජ ප්‍රතිඵල ඇති කරන ප්‍රාග්ධන ආයෝජනය
- අඛණ්ඩ මූල්‍ය ස්ථාවරත්වය සහ ශක්තිය
- යහපත් සහ ස්ථාවර ණය කළඹ

### නිෂ්පාදිත ප්‍රාග්ධනය

**ශාඛා 256**
**සුහුරු කලාප (Smart Zones) 39**
**I Saver ස්ථාන 16000+**
**නව අන්තර්ජාල බැංකුකරණ ගනුදෙනුකරුවන් 17,847**

- ස්වයං සේවා මාර්ග තුළින් වටිනාකම් ජනනය කිරීමේ යෝජනා
- වටිනාකම් දාමය පුරා ඩිජිටල් පරිනාමනය
- ව්‍යාපාර අඛණ්ඩතාව
- භෞතික සහ ඩිජිටල් යටිතල පහසුකම්වල විශ්වසනීයත්වය
- මෙහෙයුම් කාර්යක්ෂමතා සහ වර්ධිත ඵලදායිතාව

### මානව ප්‍රාග්ධනය

**මුළු සේවා බලකාය 4,715**
**රඳවාගැනීමේ අනුපාතය 98.1%**
**පිරිවැටුම් අනුපාතය 1.9%**
**පුහුණු පැයවල සාමාන්‍ය ගණන 7**
**ප්‍රසූත නිවාඩුවලින් පසු ආපසු පැමිණීම 99.7%**
**කාන්තා සේවකයින් 54%**
**සේවකයෙකුට සාමාන්‍ය ආදායම රු.මි. 25.9**

- තොරාගැනීමේ සේවායෝජක
- දක්ෂ සහ පුහුණු සේවා බලකායක්
- ආරක්ෂිත සේවා පරිසරයක්
- සියලුම දෙනා ඇතුලත් විවිධ සේවා බලකායක්
- සමාන අවස්ථා සපයන සේවා යෝජක

### සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

**ගිණුම් හිමිකරුවන් මිලියන 20.9**
**නව ගනුදෙනුකාර ගිණුම් 495,000**
**දේශීය රැකියා නියුක්තිය 100%**
**රජයට දායකවීම් රු.බි. 11.3**
**පාසැල් සිසුන් 40000 කගේ ඉංග්‍රිසි දැනුම වැඩි කිරීම**

- ගනුදෙනුකාර කේන්ද්‍රීය සහ විශ්වාසි සේවා ලබාදීම
- ක්‍රියාත්මකවීමට සමාජ බලපත්‍රය දිරීම
- සාධාරණ සහ සමාන ටෙන්ඩර් ක්‍රියාවලිය
- සකීය සහ සහයෝගි සැපයුම්කාර සංවර්ධනය
- සාධාරණ, විනිවිද සහ සදාචාර කළමනාකරණය

### බුද්ධිමය ප්‍රාග්ධනය

**AAA ණය ශ්‍රේණිගතකරණය (ICRA Lanka Ltd)**
**AA සන්නාම ශ්‍රේණිගතකරණය**
**සන්නාම වටිනාකමේ 25% වැඩිවීම**
**ශ්‍රී ලංකාවේ ආරක්ෂිත බැංකුව**
**වසර 10ට වැඩි පළපුරුද්ද සහිත සේවකයින් 1,225**
**ප්‍රදාන සහ සම්මාන**

- විශේෂ නිෂ්පාදන සහ සේවා
- ශක්තිමත් පාලන ව්‍යුහය සහ අධීක්ෂණය
- වේගවත් ඩිජිටල් තාක්ෂණයන් සහ හැකියාවන්
- දැනුම පදනම් ආයතනයක්
- ඒකාබද්ධ සැලසුම්කරණය සහ සම්පත් වෙන්කිරීම
- නව්‍යකරණ සංස්කෘතිය
- උසස් ඒකාබද්ධ ඩිජිටල් අවකාශ තුළින් වැඩිකළ විනිවිදභාවය

### ස්වභාවික ප්‍රාග්ධනය

**බෙදාහැරි හරිත ණය 222**
**බෙදාහැරි පැල ගණන 6,500**
**ජල පරිභෝජනය 79,368 (M3)**
**සූර්ය බලශක්තියට පරිවර්තනය කළ ශාඛා 42**
**ශාඛා 26 ශුද්ධ මිණුම් කිරීම හරහා ජාලයට සම්බන්ධ කර ඇත.**
**සේවකයෙකුට බලශක්ති පරිභෝජනය 7.6 GJ**
**ශාඛාවකට බලශක්ති පරිභෝජනය 139.4 GJ**
**සේවකයෙකුට ජල පරිභෝජනය - ලීටර් 16.8**

- පාරිසරික භාරකාරත්වය
- බලශක්ති කාර්යක්ෂමතාව වර්ධනය
- බලශක්ති කාර්යක්ෂමතාව තුළින් පිරිවැය ඉතුරුම්
- හරිත ව්‍යාපාර සඳහා අවස්ථා හඳුනා ගැනීම

## ජාතික ඉතිරි කිරීමේ බැංකුව සඳහා එකතුකළ වටිනාකම

කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන කැළඹිලි සහිත ආර්ථිකයක මූල්‍ය ස්ථායීතාවය ඇති කිරීම සඳහා ප්‍රාග්ධනය කාර්යක්ෂමව හා ඵලදායීව කළමනාකරණය කිරීමයි.

- නිරන්තරයෙන් වෙනස්වන සමාජ ආර්ථික පරිසරයක් තුළ කඩිසරවීම
- සේවා ලබාදීම සහ ගනුදෙනුකාර කේන්ද්‍රීය ප්‍රවේශය අනුව අපගේ විශ්වාසනීයත්වය ශක්තිමත් කිරීම
- අපගේ සේවකයින්ගේ මානව හැකියාවන් සහ ඵලදායිතා හැකියාව ඉහළ නැංවීම
- අපගේ මෙහෙයුම්වල සදාචාරාත්මක ව්‍යාපාරික භාවිතයන් මෙන්ම යහපත් තිරසාර අදහස් ප්‍රවර්ධනය කිරීම
- වර්තමාන සහ අනාගත අවශ්‍යතා සපුරාලීමට සූදානම් විවිධ සහ පළපුරුදු දක්ෂතාවයෙන් සපිරුනු සේවක මණ්ඩලයක්
- තිරසාර වර්ධනය සඳහා හවුල්කාරිත්වයන් ගොඩනැගීම
- අපගේ මෙහෙයුම් තුළ අවශ්‍ය අනුකූලතා පවත්වා ගැනිමට නියාමන අවශ්‍යතාවන්ට අනුකූලවිම
- අරමුදල් වර්ධනයට ස්ථාවර ප්‍රාග්ධන සහ ද්‍රවශීලතාව ගොඩ නැගිම සහ විවිධ මූලාශ්‍රවලින් අරමුදල් ආකර්ෂණය කර ගැනීම

## අනෙක් පුද්ගලයින් සමඟ වටිනාකම් බෙදාගැනීම

අපගේ ක්‍රියාකාරකම් තුළින් අපගේ කොටස්කරුවන්ට, ආර්ථිකයට සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට මෙම ප්‍රතිඵල අපි ලබාදෙමු.

### ආර්ථික

- ගනුදෙනුකරුවන්ගේ ආයෝජන මත වැඩිකළ පොළී තුළින් ඔවුන්ගේ ධනය වැඩි කිරීම (ගනුදෙනුකරු, කොටස් හිමිකරු/ආයෝජක)*
- බැංකුකරණ කෂේත්‍රය තුළ ජනතාවගේ විශ්වාසය ශක්තිමත් කිරීම (ගනුදෙනුකරු, කොටස් හිමිකරු/ආයෝජක)*
- ශ්‍රී ලංකා ආර්ථිකය තුළ ස්ථාවරත්වය සහ විශ්වාසය ශක්තිමත් කිරීම (ගනුදෙනුකරු/සමාජය සහ පරිසරය)*
- මූල්‍ය සේවාවන් ලබාගැනීම සඳහා පිවිසීම පහසු කිරීම තුළින් ආර්ථික වර්ධනය හා මූල්‍ය අන්තර්කරණය (ගනුදෙනුකරු/සමාජය සහ පරිසරය)*
- වැඩිකළ සේවක ධනය තුළින් ජීවන තත්ත්වයන් ඉහළ නැංවීම (සේවකයන්, සමාජය සහ පරිසරය)*
- ශ්‍රී ලාංකිකයින්ට සෘජු සහ වක්‍ර රැකියා නිර්මාණය (සේවකයන්, සමාජය සහ පරිසරය)*
- වැඩිකළ ආර්ථික වටිනාකම උත්පාදනය (කොටස් හිමිකරු/ආයෝජක, රජය සහ නියාමන ආයතන)*

### සමාජ

- ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවන්ට පහසු බැංකුකරණ තුළින් මූල්‍ය නිෂ්පාදන සහ සේවා ලබා ගැනීම සඳහා ප්‍රවේශයන් වැඩි දියුණු කිරීම (ගනුදෙනුකරුවන්)*
- නියාමන සහ රජයේ රෙගුලාසිවලට සම්පූර්ණ අනුකූලතාව (රජයේ ආයතන සහ නියාමකයින්, සේවකයින් සහ ව්‍යාපාර හවුල්කරුවන්)*
- ඉහළ කාර්ය බහුල සහ දක්ෂ සේවා බලකායක් පෝෂණය කිරීම (සේවකයින්, සමාජය සහ පරිසරය, ගනුදෙනුකරුවන්)*
- ශ්‍රී ලංකා රැකියා වෙළෙඳපොල තුළ මානව හැකියාවන් සහ ඵලදායිතා හැකියාව වර්ධනය කර ඉහළ නැංවීම (සේවකයින්, සමාජය සහ පරිසරය)*
- ප්‍රජාවන්ගේ ආර්ථික සමාජ, සංස්කෘතික සහ පාරිසරික යහපැවැත්ම ඉහල නැංවිම (රජයේ ආයතන සහ නියාමකයින් , සමාජය සහ පරිසරය)*
- සම්මන්ත්‍රණ සහ අධ්‍යාපනික ණය තුළින් අනාගත පරම්පරාවන්ගේ දැනුම වැඩිකිරීම (සමාජය සහ පරිසරය)*
- තිරසාර ජාතික සංවර්ධනයට දායකවිම (රජයේ ආයතන සහ නියාමකයින්, සමාජය සහ පරිසරය)*
- තැපැල් ජාලය හරහා පුළුල් ප්‍රජාවක් තුළ ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සහ මූල්‍ය අන්තර්කරණයට දායකවීම (ගනුදෙනුකරු, සමාජය සහ පරිසරය)*
- අරමුදල් ව්‍යාපෘති මගින් යටිතල පහසුකම් සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම (රජයේ ආයතන සහ නියාමකයින්, සමාජය සහ පරිසරය)*
- අපගේ සේවකයින්ගේ සහ අප ක්‍රියාත්මක ප්‍රජාවන්ගේ භෞතික සහ මානව සුභසාධනය ඉහළ නැංවීම (සේවකයින්, සමාජය සහ පරිසරය)*

### පාරිසරික

- කාබන් අවම වූ සහ පරිසරියට හිතැති ආර්ථික වර්ධනයකට සහයවීම (සමාජය සහ පරිසරය, රජයේ ආයතන සහ නියාමකයින්)*
- තිරසාර සංවර්ධන අරමුණු අත්කරගැනීමට රජයට/ශ්‍රී ලංකාවට සහයවිම (සමාජය සහ පරිසරය)*
- හරිත ආර්ථිකයක් ප්‍රවර්ධනය කිරීම (සමාජය සහ පරිසරය)*
- අනාගත පරම්පරාවන්ගේ සම්පත් අවශ්‍යතා සපුරාලීමට ස්වභාවික පරිසරයේ ධාරිතාව ඉහළ නැංවීම (සමාජය සහ පරිසරය)*

* අදාළ පාර්ශ්වකරුවන්

පරිවර්තනීය සමාජය සහ පරිසරය (පිටු 41-43 බලන්න)

පරිච්ඡේදවල ඉතිරි කොටස ව්‍යාපාර ආකෘතිය හා බැඳෙන ආකාරය මින් කෙටියෙන් දැක්වේ.

1. **මෙහෙයුම් පරිසරය**

   ගෝලීය ආර්ථික තත්ත්වය, දේශීය ආර්ථිකය, භූගෝලීය අවිනිශ්චිතතා, කර්මාන්ත ප්‍රවණතා, මෙහෙයුම් අභියෝග සහ වැඩිවන පාරිසරික සහ සමාජීය ගැටළු ඇතුළුව අප ක්‍රියාත්මක පරිසරය, වටිනාකම් නිර්මාණය සඳහා අපගේ හැකියාවට බලපායි. අපගේ බාහිර මෙහෙයුම් සිදු කෙරෙන වාතාවරණය පිළිබඳ වැඩි විස්තර සඳහා 22 සිට 35 පිටු බලන්න.

2. **අවදානම් සහ අවස්ථා**

   අපගේ පාර්ශ්වකරුවන්ට වටිනාකම් ලබාදීම කෙරෙහි ප්‍රමාණාත්මකව බලපෑ හැකි අවදානම් සහ අවස්ථා මගින් අපගේ ක්‍රමෝපායට බලපෑම් සිදුවේ. අවදානම් කළමනාකරණයේ ප්‍රධාන අරමුණ වන්නේ අපගේ ක්‍රමෝපාය සහ වටිනාකම් නිර්මාණය ක්‍රියාත්මක කිරීම හා ප්‍රමාණාත්මකව බලපෑ හැකි අනාගත අවදානම් අවබෝධකරගෙන ප්‍රතිචාර දැක්වීම සඳහා බැංකුව ප්‍රමාණවත් පරිදි ස්ථානගත කිරීමයි. අවදානම් කළමනාකරණය පිළිබඳ වැඩි විස්තර සඳහා 248 සිට 274 පිටු බලන්න.

3. **පාර්ශ්වකරුවන්**

   පාර්ශ්වකරුවන්ට වටිනාකම් ලබාදීම අපගේ කීර්තිනාමයට බලපෑම් කරයි. අපගේ සාර්ථකත්වය සහ තිරසාරත්වය අපගේ පාර්ශ්වකරුවන් මත රඳා පවත්නා අතර, ඔවුන්ගේ අවශ්‍යතා සහ බැඳියාවන් අවබෝධකර ගෙන ප්‍රතිචාර දැක්වීම අත්‍යවශ්‍යය. පාර්ශ්වකාර සහභාගිත්වය පිළිබඳ වැඩි විස්තර සඳහා 70 සිට 77 පිටු බලන්න.

4. **අපගේ ක්‍රමෝපාය**

   කෙටි, මධ්‍යම සහ දිගුකාලීනව තිරසාර වටිනාකම ලබාදීම සඳහා අපගේ ක්‍රමෝපාය අපව අවධානයෙන් තබන අතර පැහැදිලි මාවතක් නිර්මාණය කරයි. අපගේ ව්‍යාපාරය තුළ වර්ධනය සඳහා අපගේ ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීමට අපට හැකියාව ඇතිකරන ශක්තිමත් පදනමක් අප සතු වේ. එමෙන්ම අපගේ දෛනික තීරණ ගැනීමේදී තිරසාර සමාජයක් කරා දායකවීම සඳහා අපගේ වගකීම අපි හඳුනා ගනිමු. තිරසාරත්වය යන සංකල්පය මත පිහිටා කටයුතු කරන අතරම එය අපගේ ක්‍රමෝපායන්ට පදනම් කර ගනිමු. අපගේ ක්‍රමෝපාය පිළිබඳ වැඩි විස්තර සඳහා 49 සිට 69 පිටු බලන්න.

5. **සය වැදෑරුම් ප්‍රාග්ධන**

   අපගේ ව්‍යාපාරය පාලනය කර වර්ධනය කරන ආකාරය පිළිබඳ තීරණ ගැනීමේදී, වටිනාකම් නිර්මාණය සඳහා අපගේ හැකියාවට තීරණාත්මක සම්පත් සහ සම්බන්ධතා අපි සැලකිල්ලට ගනිමු. අපි ඒවා සය වැදෑරුම් ප්‍රාග්ධනය ලෙස හඳුන්වමු. ඵලදායී නිෂ්පාදනය සහ අපගේ භාණ්ඩ හා සේවා ලබාදීම මෙන්ම නිමැවුම් හා ප්‍රතිඵල ඇතිකිරීමට එකී එක් එක් ප්‍රාග්ධනය අවශ්‍ය වන අතරම ඒ තුළින් අපගේ සියලුම පාර්ශ්වකරුවන් සඳහා වටිනාකම නිර්මාණය කරයි. මෙම ප්‍රාග්ධනය අතර වටිනාකම් සහ හුවමාරු කිරීම් නිර්මාණය කිරීමට අපි මෙම සය වැදෑරුම් ප්‍රාග්ධනය භාවිතා කරන ආකාරය පිළිබඳ වැඩි විස්තර සඳහා 90 සිට 169 පිටු බලන්න.

6. **ප්‍රමාණාත්මක කරුණු**

   ප්‍රමාණාත්මක කරුණු යනු අපගේ වටිනාකම් නිර්මාණය සහ අපගේ ක්‍රමෝපාය අත්කරගැනීමේ හැකියාව කෙරෙහි බලපාන කරුණු වේ. කෙටි, මධ්‍යම හෝ දිගුකාලීනව වටිනාකම නිර්මාණය සඳහා අපගේ හැකියාවට තිරසාරාත්මකව බලපෑ හැකි ප්‍රමාණාත්මක කරුණු පිළිබඳ විස්තරාත්මක සාකච්ඡාවක් අපි ලබා දෙන්නෙමු. (78 සිට 88 පිටු) මෙම කරුණු මෙම වාර්තාව පුරා අන්තර්ගතයේ පදනම සකස් කරයි.

7. **ශක්තිමත් පාලනය සහ ආචාරධර්ම මගින් සහයවීම**

   අපි ඉහළ ප්‍රමිතියේ අවංකකම සහ අචාරධර්ම හා බැඳුණු රජයට අයත් ආයතනයකි. සියලුම පාර්ශ්වකරුවන්ට වගවීම සහ වගකීම ප්‍රමුඛතාවයකි. අපගේ පාලනය පිළිබඳ වැඩි විස්තර සඳහා 196 සිට 247 පිටු වෙත යොමු වන්න.



# මෙහෙයුම් පරිසරය

## 2019 දී ගෝලීය ආර්ථිකය

2019 දී ගෝලීය ආර්ථික වර්ධනය මෙම දශකය තුළ පහළම වර්ධන අගය වාර්තා කළ අතර රටවල් අතර පොදු බලපෑම් සහ රටවල්වලට විශේෂිත සාධක පිළිබිඹු කරමින් එම අගය 2.9% දක්වා පහළ වැටුණි. (මූලාශ්‍රය: ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ලෝක ආර්ථික දර්ශනය)

එක්සත් ජනපදය, චීනය සහ යුරෝ ප්‍රදේශය තුළ දුර්වල වර්ධනය මෙන්ම එක්සත් ජනපදය හා චීනය අතර වෙළෙඳ ආරාවුල් 2019 දි සැලකියයුතු ලෙස ගෝලීය ආර්ථිකයට සෘණාත්මකව බලපාන ලදී. ලෝකයේ බොහෝ කලාපවල, නිෂ්පාදන අංශ අවපාත හෝ අවපාතයට ආසන්න විය. මෙයට ප්‍රතිචාරත්මකව, බොහෝ මධ්‍යම බැංකු වසරකට පෙර අපේක්ෂා කළ පරිදි මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම ආරම්භ කළ අතර සමහර රටවල් (විශේෂයෙන් එක්සත් ජනපදය හා චීනය) අමතර උත්තේජනයන්ද ලබාදෙන ලදී.

නැගීඑන වෙළෙඳපොල සහ සංවර්ධනය වන රටවල් (බ්‍රසීලය, ඉන්දියාව, මෙක්සිකෝව, රුසියාව සහ තුර්කිය ඇතුළු EMDEs රටවල්) තුළ රටට සුවිශේෂී දුර්වලතාවන්ගෙන් තවදුරටත් පීඩනය ඇතිකරන ලදී.

වඩා දැඩි මූල්‍ය කොන්දේසි (ආර්ජන්ටිනාව), භූ දේශපාලන තත්ත්වයන් (ඉරානය, සව්දි ආරාබිය, දකුණු චීන මුහුද) සහ සමාජ අසහනය (වෙනිසියුලාව, ලිබියාව සහ යේමනය) හා බැඳුණු වඩාත් දුර්වල ආර්ථික අස්ථාවරත්වයද ගෝලීය ආර්ථිකය පහළ හෙළීමට විශාල වශයෙන් දායක විය.

## ගෝලීය ආර්ථිකය පිළිබඳ සමාලෝචනය

### එක්සත් ජනපද චීන වෙළෙඳ යුද්ධය

එක්සත් ජනපදය හා චීනය අතර වෙළෙඳ ආරාවුල් ඇතිවීම සහ ආශ්‍රිත අවිනිශ්චිතතාව ජාත්‍යන්තර වෙළෙඳ, ව්‍යාපාර විශ්වාසය කෙරෙහි අහිතකර ලෙස බලපාන ලද අතර, ගෝලීය වෙළෙඳ හා ආයෝජනය තවදුරටත් දුර්වල කරන ලදී. පසුගිය වසර දෙක පුරා එක්සත් ජනපදය හා චීනය අතර මාස 18ක කාලයක් පැවති වෙළෙඳ ආරාවුල් ගෝලීය වෙළෙඳාම අසීරුතාවයට ඇදදමන ලද අතර ගෝලීය වර්ධනය කෙරෙහි සැලකියයුතු ලෙස බලපෑම් කරන ලදී. එසේවුවත්, මෙම තත්ත්වය එක්සත් ජනපදය හා චීනය අතර අදියර එක ගිවිසුම අනුව 2019 දෙසැම්බර් මස ලිහිල්විය.

### එක්සත් ජනපදය, චීනය සහ යුරෝ ප්‍රදේශය තුළ ආර්ථික තත්වය පහත වැටීම

ලොව විශාලතම ආර්ථිකයන් වන, එක්සත් ජනපදය, යුරෝ ප්‍රදේශය සහ චීනය 2019 දී ආර්ථික කටයුතුවල සැලකියයුතු පසුගාමී තත්ත්වයකට මුහුණපාන ලදී. මෙම එක් ආර්ථිකයක දැඩි පහත වැටීමක් සෘජු වෙළෙඳ සම්බන්ධතා සහ වෙළෙඳ ද්‍රව්‍ය මිලගණන් තුළින් මෙන්ම මූල්‍ය සහ විශ්වාසී මාර්ග තුළින් ලොව වටා රටවල ආර්ථික අපේක්ෂාවන් වඩාත් දුර්වල කරන ලදී. චීනයේ වෙළඳ කටයුතු මන්දගාමී වීමෙන් පසුකාලීනව උද්ගතවන බලපෑම රටේ වෙළෙඳ හවුල්කරුවන්ට සහ වෙළෙඳ ද්‍රව්‍ය නිෂ්පාදකයින්ට සැලකියයුතු අභියෝගයක් එල්ල කරනු ඇත.

නිෂ්පාදන කටයුතු සහ අපනයනවල පසුබෑම හමුවේවුවත් එක්සත් ජනපද ආර්ථිකය 2019 දී 2.3%කින් වර්ධනය විය. එක්සත් ජනපද ෆෙඩරල් සංචිතය විශාල බදු කපාහැරීම් සමඟ 2019 දී තුන්වරක් බදු අනුපාත පහළ දමන ලදී. චීනයේ, දේශීය ඉල්ලුම අඩුවීම සහ වැඩිවූ වෙළෙඳ අවිනිශ්චිතතා හමුවේ වර්ධනය 6.1% දක්වා අඩුවිය. රජය විසින් බදු කපාහැරීම් සහ පොදු ආයෝජන වියදම් සඳහා පළාත් පාලන ආයතනවලට මූල්‍ය සහය ලබාදෙමින් අනුග්‍රාහක මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කරනු ලැබීය.

යුරෝ ප්‍රදේශය තුළ ආර්ථික කටයුතු ද සැලකියයුතු පරිදි පිරිහීමට ලක්වී ඇත. ආසියාවේ පහත වැටෙන ඉල්ලුම බිඳවැටීම සහ කාර් නිෂ්පාදනයට බාධාවීමත් සමඟ ජර්මන් කර්මාන්ත ක්ෂේත්‍රයේ ඇති වූ විශේෂ දුර්වලතාවය සමඟ ආර්ථිකයන් කිහිපයක් පසුබෑමේ සීමාවට ආසන්න විය. වසර පුරා බ්‍රෙක්සිට් හා බැඳුණු අවිනිශ්චිතතාව ද ආර්ථිකය මත බරක් ඇති කරන ලදී. යුරෝපා මහ බැංකුව (ECB) එහි ප්‍රතිපත්තිමය අනුපාත පෙරට වඩා අඩු කරමින්, ප්‍රමාණාත්මක ලිහිල් කිරීම නැවත ආරම්භ කරමින් සහ බැංකුවලට පොලී අධික නොවන ණය ලබාදෙමින් මූල්‍යමය උත්තේජන ලබාදී ඇත.



## ලෝකය පුරා ලිහිල්කළ පිස්කල් සහ මූල්‍ය ප්‍රතිපත්තිය

වර්ධනය අඛණ්ඩව පහත වැටී ඇති බැවින්, බොහෝ ආර්ථිකයන් හී ප්‍රධාන මහ බැංකු පසුගිය වසරේ පෙර නොවූ විරූ අඩු අගයකට ළඟා වු පොළි අනුපාත සමඟ මූල්‍ය ප්‍රතිපත්ති ලිහිල් කරන ලදී. රජයන් විසින් බදු කපාහැරීම් සහ පොදු ආයෝජන වියදම් සඳහා පළාත් පාලන ආයතනවලට මූල්‍ය සහය සඳහා පියවර ගනු ලැබීය. එක්සත් ජනපදය තුළ, 2015 සහ 2018 අතර අඛණ්ඩව නවවරක් ඉහළ දැමීමෙන් පසු, ෆෙඩරල් සංචිතය 2018 දෙසැම්බර් හි 2.50% සිට 2019 කාලය තුළ 1.75% දක්වා එහි ඉලක්ක පොළී අනුපාතය තෙවරක් පහත දමන ලදී. යුරෝපා මහ බැංකුව (ECB) 2019 සැප්තැම්බර් -0.50%ක ඓතිහාසික පහළ මට්ටමක් දක්වා එහි තැන්පතු අනුපාතය කපා දමන ලදී. ජපානයේ බැංකු තැන්පතු අනුපාතය 2016 පෙබරවාරි සිට -0.10% මට්ටමේ පැවතී ඇත. එකී අඩු අනුපාත බැංකුකරණ පද්ධතීන් යහපැවැත්ම පිළිබඳ ගැටළු ඇති කරයි.

## විශාල ගෝලීය ණය

සංවර්ධිත සහ සංවර්ධනය වන රටවල් යන්න නොසලකා, ගෝලීය ණය වඩා ඉහළ මට්ටමක් වාර්තා කළ අතර, 2018 සිට වර්ධනය වී එය දළ දේශීය නිෂ්පාදනයෙන් 230%ක ඉහළ අගයක් කරා ළඟා වූ අතර (ලෝක බැංකුවේ විශේෂ වාර්තාව) එය යම් කම්පනයකට සමහර රටවල් විශේෂයෙන් ලක්කරන ලදී.

## වෙළෙඳ ද්‍රව්‍ය වෙළෙඳපොල සහ මිලගණන්

2019 දී ඉන්ධන මිලගණන් ඇ.ඒ.ඩො. 61/BBL මට්ටමේ පැවති අතර එය 2018 සිට 10% ක පහත වැටීමකි. මේ සඳහා පෙට්‍රෝලියම් අපනයන රටවල් (OPEC) සහ එහි හවුල්කරුවන් විසින් නිෂ්පාදනයන් කපාදැමීම මෙන්ම භූ දේශපාලන සහ ගෘහස්ථ සාධක හේතු කොට ගෙන ඉරානය, සවුදි ආරාබිය සහ වෙනිසියුලාව තුළ නිෂ්පාදන සංරෝධක ප්‍රධාන වශයෙන් හේතු විය. මෙයට සමානව බොහෝ බැර ලෝහ සඳහා මිලගණන් වඩා දුර්වල ගෝලීය වර්ධනය සහ වෙළෙඳ අවිනිශ්චිතතා පිළිබිඹු කරමින් 2019 දෙවන අර්ධය තුළ තවදුරටත් දුර්වල විය.

විශේෂයෙන් වෙළෙඳ ද්‍රව්‍ය සඳහා ඉල්ලුමේ වඩා විශාල ආදායම් නම්‍යතාවක් ඇති නැගීඑන සහ සංවර්ධනය වන රටවල්වල (EMDEs) වර්ධන අපේක්ෂාව තුළ පරිහානිය පිළිබිඹු කරමින් බොහෝ වෙළෙඳ ද්‍රව්‍යවල මිලගණන් 2019 දී පහත වැටුණි. බොහෝ බැර ලෝහ සඳහා මිලගණන් මූලික වශයෙන් වඩා දුර්වල ගෝලීය වර්ධනය සහ වෙළෙඳ අවිනිශ්චිතතා පිළිබිඹු කරමින් 2019 දෙවන අර්ධය තුළ තවදුරටත් දුර්වල විය. ධාන්‍ය සඳහා ඉහළ තොග මට්ටම් සහතික කරන වර්ධිත කාලගුණ තත්ත්වයන් හේතු කොට ගෙන කෘෂිකාර්මික මිලගණන් 2019 දෙවන අර්ධය තුළ පහත වැටුණි. (මූලාශයඃ ලෝක බැංකුවේ ගෝලීය ආර්ථික අනාගත කටයුතුඃ 2020 ජනවාරි)

## භූ දේශපාලන වාතාවරණය

භූ දේශපාලන අවදානම් ගෝලීය සහ සමහර කලාපවල තියුණුව පවතී. දුරවබෝධ දේශපාලන ප්‍රතිවිපාක ආයෝජක විශ්වාසය පළුදුකරන අතර සෞභාග්‍ය සහ ආර්ථික වර්ධනය සඳහා අත්‍යවශ්‍ය දේශපාලන ස්ථාවරත්වය හානියට පත් කරයි. එක්සත් ජනපද දේශපාලන ආයතනවල අස්ථාවරත්වය, යුරෝපය කැබලිවීම, ගෝලීය ගිවිසුම් විතැන්වීම සහ කලාපීය බලවත් දේශපාලකයින් ජනප්‍රිය සහ ජාතිවාදී ව්‍යාපාර මත කටයුතු කිරීම 2019 වසර තුළ පැවති දේශපාලන වාතාවරණයේ හසුරුවන්නන් විය.

සැප්තැම්බර් මැද සවුදි ඉන්ධන නිෂ්පාදනය බිඳවැටීම, මැද පෙරදිග නව අවිනිශ්චිතතා සඳහා විභවතා ඉස්මතු කරන ලදී. භූ දේශපාලන ගැටළු හමුවේ, තෙල් නිෂ්පාදනය තුළ පැවති බිඳවැටීම් මගින් සැපයුම්කරුවන් සහ වෙළෙඳ ද්‍රව්‍ය ආනයනකරුවන් පීඩාවට පත්කරමින් බලශක්ති මිලගණන් ඉහළ යා හැකිය. ඊට අමතරව, නැගෙනහිර යුරෝපය තුළ සහ දකුණු ආසියාව තුළ ආරාවුල් ඉහළ යන්නේනම්, ආශ්‍රිත කලාපයන්හී වර්ධනය සඳහා වැදගත් ප්‍රතිවිපාක ඇතිවිය හැකිය.

## සමාජීය කැළඹීම

අසමානතාව මගින් ඇති කරන සමාජ කැළඹීම් වර්ධනයට බාධා කරන අතර රටවල සාර්ව-ආර්ථික තත්ත්වයන්ට සහ ස්ථාවරත්වයටද හානි ඇති කරයි. සමාජ කැළඹීම් මගින් යටිතල පහසුකම්වලට හානි සිදුවීමද ක්‍රියාකාරකම්වලට බාධා වීමද සිදු විය හැකිය. එමෙන්ම එය, ආතතීන් අවම කිරීමට උත්සාහ දරන රජයන්හි මූල්‍ය ඒකාබද්ධතා ප්‍රයත්න වඩාත් අභියෝගයට ලක් කරන සුළු විය.

අසමානතාව, අඩු වර්ධනය, පාලනය සහ ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳ එකඟ නොවීම හේතු කොට ගෙන විවිධ කලාපයන් හී රටවල් ගණනාවක සමාජ අසහනය වර්ධනය වෙමින් පවතී. 2019 වසර තුළ බ්‍රසීලය, චිලී, ප්‍රංශය, හොංකොං, ලෙබනනය, ස්පාඤ්ඤය සහ වෙනත් රටවල දීර්ඝ කාල පරාසයක් තුළ සමාජ අසහනය දක්නට ලැබුණු අතර මෙය විශාල වශයෙන් අසමානතාව තුළින් මතුව ඇත.

## කාලගුණ වෙනස

කාලගුණයට අදාළ ආපදා පිළිබඳ වර්ධිත වාරගණන සහ තීව්‍රතාවයේ හසුරුවන්නා වන කාලගුණ වෙනස එය ඍජුවම බලපාන කලාපයන් සඳහා පමණක් සීමා නොවී සෞඛ්‍යය සහ ආර්ථික තත්වය අනතුරේ හෙලනු ලබයි. කාලගුණ වෙනස, බරපතල කාලගුණ තත්ත්වයන් වැඩි කරන අතර, සමහර කලාපයන් හී කෘෂිකාර්මික ඵලදායිතාව අඩුකරයි. මෙයට සමානවම, විශාල වශයෙන් මුහුදු තීරවල ජනතාවක් සහිත කලාපයන් දුරුණු කාලගුණයෙන් පමණක් නොව මුහුදු මට්ටම් ඉහළ යාමෙන් ද අවදානමට ලක් වේ.

නිවර්තන කුණාටු. ගංවතුර, උණුසුම් තරංග, නියඟ සහ ලැව්ගිනි වැනි කාලගුණයට අදාළ ආපදා මගින් මෑතකාලීන වසරවල විවිධ කලාප හරහා බරපතල මානව පිරිවැය සහ ජීවනෝපාය අහිමිකිරීම් ඇති කර ඇත. මෙහි ඍජු බලපෑමක් නොමැති වෙනත් ප්‍රදේශවලට පවා මායිම් හරහා සංක්‍රමණය හෝ මූල්‍ය පීඩනය තුළින් අභියෝග ඇති කළ හැක. මෙම ප්‍රවණතාවයන් අඛණ්ඩව පැවතියහොත් බොහෝ රටවල් තුළ විශාල අහිමිවීම්වලට මඟ පෑදිය හැකිය.

## අනාගත දැක්ම

දුර්වල වෙළෙඳ හා ආයෝජන හමුවේ වුවත් පසුගිය වසරේ වාර්තාකළ 2.3%ක පශ්චාත් අර්බුද අඩුවීමෙන් තරමක් ඉහළ අගයක් වන 2.5%ක ගෝලීය වර්ධනයක් 2020 වසර තුළ ඇති කරගැනීමට අපේක්ෂා කෙරේ. (මූලාශයඃ ලෝක බැංකුවේ ගෝලීය ආර්ථික අනාගත කටයුතුඃ 2020 ජනවාරි) කෙසේවෙතත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඇස්තමේන්තු පරිදි (මූලාශයඃ ලෝක බැංකුවේ ගෝලීය ආර්ථික අනාගත කටයුතුඃ 2020 ජනවාරි) 2019 දී 2.9% ට තක්සේරු කළ ගෝලීය වර්ධනය 2020 දී 3.3% දක්වා සහ 2020 වසර තුළ තවදුරටත් 3.4% දක්වා වැඩිකර ගැනීමට අපේක්ෂා කෙරේ.

උසස් ආර්ථිකයන් සහ චීනය ඔවුන්ගේ අනාගත වර්ධන අනුපාත ක්‍රමානුකූලව පහළ මට්ටමක පවත්වා ගනු ලැබුවත් තම ශක්තිමත් කාර්යසාධනය පවත්වා ගනිමින් සාපේක්ෂව යහපත් ලෙස නැගී එන වෙළෙඳපොල ආර්ථිකයන් කෙරෙහි විශ්වාසය තබයි. 2019 දි උසස් සහ නැගීඑන වෙළෙඳපොල ආර්ථිකයන් හරහා ලිහිල් කරන සැලකියයුතු මූල්‍යකරණයේ බලපෑම් 2020 දී ගෝලීය ආර්ථිකය තුළින් තවත් ඉදිරියට ගෙන යාමට අපේක්ෂා කෙරේ. විශේෂයෙන් දේශීය ඉල්ලුම සහ ආයෝජනය තුළ ප්‍රති සාධනයක් පිළිබිඹු කරමින් සහ ස්වයංක්‍රීය සහ තාක්ෂණික අංශවල යම් පසුබෑම් මඟහැර වෙළෙඳ වර්ධනය තුළ නැගීමක් මගින් ගෝලීය ප්‍රතිසාධනය යෝජනා කෙරේ.

එක්සත් ජනපද- චීන වෙළෙඳ අවිනිශ්චිතතා තවදුරටත් ඉහළයාම වැළැක්වීමේ ප්‍රමාණය, බ්‍රෙක්සිට් සමග කටයුතු කිරීම සහ පවත්නා සමාජ අසහනය සහ භූ දේශපාලන අවිනිශ්චිතතා පිදිබඳ ආර්ථික පිළියම් යෙදීම මත මෙම ප්‍රතිඵල රඳා පවතී.

විශේෂයෙන් එක්සත් ජනපදය හා ඉරානය අතර භූ දේශපාලන අවිනිශ්චිතතා ඇතිවීම ගෝලීය තෙල් සැපයුමට බාධා ඇති කරමින් එහි අභිප්‍රාය අනතුරේ හෙළමින් දැනට යාවත්කළ ව්‍යාපාර ආයෝජනය තවදුරටත් දුර්වල කළ හැකිය. තවද, බොහෝ රටවල් අතර සමාජ අසහනය අධික වීම තුළින් ක්‍රියාකාරකම් වලට බාධාකරමින්, ප්‍රතිසංස්කරණ උත්සාහයන් සංකීර්ණ කරමින් යෝජිත වර්ධනයට වඩා අඩු වර්ධනයකට ගෙන යමින් එහි අභිප්‍රාය දුර්වල කළ හැක.

### ශ්‍රී ලාංකීය ආර්ථිකය සඳහා ගම්‍යාර්ථඃ

- ගෝලීය ආර්ථිකය පිරිහීමට නැඹුරුවීම, ශ්‍රී ලංකාවේ වෙළෙඳ, සංචාරක සහ සේවක ප්‍රේෂණ සඳහා බලපෑ හැකිය.
- ශ්‍රී ලංකාවේ වෙළෙඳ හවුල්කරුවන් ආර්ථික පිරිහීමට නැඹුරුවීම, අනෙක් රටවල් හා දැඩිව සම්බන්ධ වන ප්‍රමාණයට ආර්ථිකය කෙරෙහි සැලකියයුතු බලපෑම් ඇති කරලයි. එය ආනයන, අපනයන සහ ආයෝජන කෙරෙහිද බලපෑ හැකිය.
- ගෝලීය මූලික වෙළෙඳ ද්‍රව්‍ය මිල ගණන් සැමවිටම ශ්‍රී ලංකාව තුළ උද්ධමනයට බලපා ඇති අතර උද්ධමනය සහ ප්‍රතිමිලදීගැනීම් අනුපාත සමාන ආකාරයක් ගෙන ඇත.
- මෙය ශ්‍රී ලංකාවේ බලශක්ති ආනයන සැලකියයුතු ලෙස ඉහළ දමන අතර, දැනටමත් පීඩනයට පත් මෙරට ගෙවීම් ශේෂ තත්ත්වය සහ විදේශ ව්‍යවහාර මුදල් සංචිත කෙරෙහි බරපතල පීඩනයක් ඇති කරයි.
- රටේ සාර්ව-ආර්ථික තත්ත්වයන්හී වෙනස්වීම් ශ්‍රී ලංකාවේ රුපියල් අගය අඩුකිරීමට/වැඩි කිරීමට හේතු විය හැකිය.
- රටේ ආර්ථික තත්වයන් ශක්තිමත් කිරීම හෝ දුර්වල කිරීම මූල්‍ය අභිප්‍රායන්, ආරක්ෂිත වත්කම් කරා කළඹ නැවත වෙන්කිරීම සිදුකළ හැකි අතර මූල්‍ය වෙළෙඳපොළ තුළ ආයෝජනයන් කෙරෙහි බලපායි (පොළී අනුපාත වෙනස්වීම් ශ්‍රී ලංකාවට සෘජු විදේශ ගලාඒම් තීරණය කරයි)
- මූල්‍ය වෙළෙඳපොළ සහ හුවමාරු අනුපාත උච්ඡාවචනය, විදේශීය ණයගැනීම්, බාහිර ණය ආපසු ගෙවීම් නියමයන්ට සහ ආනයනය සඳහා හැකියාවට බලපායි.
- වෙළෙඳ ආර්ථිකය තුළ කාලගුණ වෙනස මගින් ඇති කරන බාධා කිරීම් කෘෂිකාර්මික ධාරිතාව සහ වටිනාකමටත් ඉන්පසුව රටතුළ මිල මට්ටම්වලටත් බලපෑ හැකිය.
- එක්සත් ජනපදය හා එහි වෙළෙඳ හවුල්කරුවන් අතර වඩා ඉහළ තීරු ගාස්තු සීමාවන්, ව්‍යාපාර අභිප්‍රායන්ට සහ බොහෝ ආර්ථිකයන්හී සංයුක්ත කළ චක්‍රීය සහ ව්‍යුහගත පහත වැටීම්වලට බලපාන අතර ඉන්පසුව ගෝලීය සැපයුම් දාමයන්ට බලපායි.
- ජාතිය තුළ දේශපාලන සංවර්ධනයන් ශ්‍රී ලංකාවේ විදේශීය ප්‍රතිපත්තියට බලපෑම් කළ හැකිය.

**[2019 වසර තුළ ශ්‍රී ලංකාවේ ආර්ථිකය සහ එහි කාර්යසාධනය පිළිබඳ ගෝලිය ආර්ථික සංවර්ධනයන්හී බලපෑම ඉදිරි පරිච්ඡේදය වන "ශ්‍රී ලංකාවේ ආර්ථිකය" තුළ විස්තර කෙරේ. 25 සිට 35 දක්වා පිටු බලන්න]**

## ශ්‍රී ලංකාවේ ආර්ථිකය

**2019 ජනවාරි –** ශ්‍රී ලංකා නව ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව දැනට පවත්නා ආකෘති වෙනුවට මූල්‍ය ප්‍රකාශ පිළිබඳ නව ආකෘති කට්ටලයක් බලපත්‍රලාභී බැංකු විසින් වාර්ෂික හා කාර්තුමය මූල්‍ය ප්‍රකාශ සහ වෙනත් හෙළිකිරීම් සඳහා නිකුත් කරන ලදී.

**2019 මාර්තු –** දේශීය ගෙවීම් සඳහා ජාතික හදිසි ප්‍රතිචාර කේතයක් ස්ථාපිත කිරීම

– ඇ.එ.ඩො බිලියන 2.4 ක ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර නිකුත් කිරීම

**2019 අප්‍රේල් –** ආනයනික මෝටර් රථ සඳහා ණයවර ලිපි විවෘත කිරීම සඳහා සීමාවන් ඉවත් කිරීම

**2019 අප්‍රේල් –** පාස්කු ඉරිදා ත්‍රස්තවාදී ප්‍රහාර

**2019 අප්‍රේල් –** බාසල් III වැඩපිළිවෙල යටතේ ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා අවශ්‍යතා අරමුණු සඳහා සුළු හා මධ්‍ය ව්‍යාපාරිකයින් හඳුනාගැනීමට නියාමන අවශ්‍යතාවන්

**2019 අප්‍රේල් –** ශ්‍රී ලංකාවේ රුපියල් තැන්පතු මත පොළී අනුපාත සීමාවන් පැනවීම

**2019 මැයි –** 2020 මාර්තු 31 දක්වා හිඟ සක්‍රීය ණය පහසුකම් සම්බන්ධයෙන් සංචාරක ක්ෂේත්‍රය තුළ පුද්ගලයින් සහ ආයතන වෙත විලම්භන කාලසීමාවක් ලබාදීම

**2019 ජූනි –** මෝටර් රථ සම්බන්ධයෙන් ලබාදුන් ණය පහසුකම් සඳහා වටිනාකමට ණය අනුපාත පිළිබඳ 2018 අංක 01 දරන බැංකු නියෝග පනත සංශෝධනය කිරීම



**2019 ජූනි –** ඇ.එ.ඩො බිලියන 2ක් වටිනා ජාත්‍යන්තර රන් බැඳුම්කර නිකුත් කිරීමග

**2019 ජූලි –** ඇ.එ.ඩො 4,102ක ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනයක් සමඟ වැඩි වූ දළ ජාතික ආදායමෙහි ප්‍රතිඵලයක් ලෙස ඉහළ මැදි ආදායම් උපයන රටක් ලෙස ශ්‍රී ලංකාව උසස් කරන ලදී

**2019 අගෝස්තු –** SDFR සහ SLFR පිළිවෙලින් 7.00% සහ 8.00% දක්වා පදනම් ලකුණු 50කින් අඩුකරන ලදී

**2019 අගෝස්තු –** බලපත්‍රලාභී බැංකුවල වෙළෙඳපොළ හැසිරීම සහ භාණ්ඩාගාර මෙහෙයුම් පිළිබඳ බැංකුකරණ පනත් විධාන නිකුත් කරන ලදී

**2019 සැප්තැම්බර් –** මුදල් ණයටදීම සහ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර නියාමනය සහ අධීක්ෂණය කිරීම සඳහා මූල්‍ය මණ්ඩලය විසින් යෝජිත ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරි පනත අනුමත කර ඇත.

**2019 සැප්තැම්බර් –** ශ්‍රී ලංකා රුපියල් තැන්පතු මත උපරිම පොළී අනුපාත අවලංගු කරන ලදී

**2019 ඔක්තෝබර් –** ඉලක්ක දිනය අනුව රුපියල්වලින් අගයකළ ණය සහ අත්තිකාරම්වල පොළී අනුපාත අඩුකිරීම

**2019 නොවැම්බර් –** සමහර ණය නිමැවුම් (ණය කාඩ්, තාවකාලික අයිරා පහසුකම්) සඳහා පොළී අනුපාත සීමාවන් පනවන ලදී

**2019 නොවැම්බර් –** ජනාධිපතිවරණය

**2019 දෙසැම්බර් –** ජාත්‍යන්තර මනා පරිචයන්ට අනුකූලව දේශීය ක්‍රමානුකූලව වර්ධන බැංකු (D-SIB) සමඟ ගනුදෙනු සඳහා නව වැඩපිළිවෙලක් හඳුන්වාදීම සහ නව වැඩපිළිවෙල අනුව D-SIB ලෙස බලපත්‍රලාභී බැංකු හතරක් තීරණය කිරීම

## දේශපාලන සංවර්ධනය

2019 නොවැම්බර් හි ජනාධිපතිවරණය සහ 2020 දී පැවැත්වීමට නියමිත ඉදිරි පාර්ලිමේන්තු මහ මැතිවරණය, රජයේ ක්‍රියාවලිය සහ ව්‍යවස්ථාදායක කාර්යක්ෂමතාව වර්ධනය කරන අතර රජය තුළ මුල්බැසගත් කට්ටිවාදය හා බැඳුණු විශාල පරිමාණයේ දේශපාලන අවිනිශ්චිතතාව විසඳනු ඇත. දැනට පවත්නා දේශපාලන අභ්‍යන්තර ගැටුම් මෑතකාලීන වසරවල ප්‍රතිපත්ති සැකසීමේදී වගකීම්සහගතබව සහ අනාගතය දැකීමේ හැකියාවට බාධා පමුණුවා ඇති අතර ව්‍යාපාර විශ්වාසය, ආයෝජන සැලසුම් සහ සමස්ත වර්ධන හැකියාවන් කෙරෙහි විශේෂයෙන් බලපාන ලදී. මෑතකාලින වසරවල සිවිල් සමාජය තුළ ගම්‍යමාන පුළුල් බෙදීම් විශේෂයෙන් ජනවර්ග සහ ආගමික කණ්ඩායම් අතර බෙදීම් දේශපාලන ස්ථාවරත්වයට ඇති අවදානම වැඩි කරන ලදී.

## දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය 2015 සිට පහළට යන ගමන්පථයක පැවති අතර, 2018 දී පැවති 3.3%ට සාපේක්ෂව 2019 දී 2.3%ක අඩු වර්ධනයක් වාර්තා කරන ලදී මෙය 2001 සිට අඩුම වර්ධනය වේ. පාස්කු ඉරිදා ප්‍රහාර හේතුවෙන් මන්දගාමී වූ ආර්ථික කටයුතු සහ අහිතකර කාලගුණ තත්ත්වයන් හේතු කොට ගෙන කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වූ දුර්වල කාර්යසාධනය මීට ප්‍රධාන වශයෙන් හේතු විය.

ශ්‍රී ලංකාවේ 2018 වසරේ සිව්වන කාර්තුවේදී සිදු වූ දේශපාලනික අර්බුද කාලසීමාවෙන් පසු දළ දේශීය නිෂ්පාදිතය 2019 වසරේ පළමුවන කාර්තුවේදි ප්‍රතිසාධනය විය. කෙසේ වෙතත්, 2019 අප්‍රේල් පාස්කු ඉරිදා ප්‍රහාරය සේවා අංශය කෙරෙහි විනාශකාරී බලපෑමක් එල්ල කළ අතර මුල් කාර්තුව තුළ ලබාගත් ප්‍රවර්තක ශක්තිය ඉන් පහත වැටුණි. 2019 වසරේ තුන්වන කාර්තුව තුළ, සේවා සහ කර්මාන්ත අංශ ප්‍රතිසාධනය ආරම්භවූ අතර ධනාත්මක අභිප්‍රායන්ට සහය වූ 2019 නොවැම්බර් මැතිවරණයෙන් ආර්ථික කටයුතු පසු වර්ධනය විය. වසර තුළ, ඇඑඩො 4,102ක ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනයක් සමඟ වැඩි වූ දළ ජාතික ආදායමෙහි ප්‍රතිඵලයක් ලෙස ඉහළ මැදි ආදායම් උපයන රටක් ලෙස ශ්‍රී ලංකාව උසස් කරන ලදී.

### බැංකු ක්ෂේත්‍රය සඳහා ගම්‍යාර්ථ:

- අපේක්ෂිත ආර්ථික වර්ධනයට වඩා පහළ වර්ධනය ජනතාවගේ පරිභෝජනය, ආයෝජනය සහ මිලදී ගැනීමේ ශක්තිය අඩුකරන අතර එය අඩු ණය සහ තැන්පතු වර්ධනයට හේතු වේ
- ඉහළ මැදි ආදායම් තත්ත්වයන්ට ළඟාවීම තුළ වැඩිකළ පිරිවැය අවදානම් සමඟ වඩා වැඩි වාණිජ නියමයන් තුළ ණය ගැනීමට ශ්‍රී ලංකාවට සිදුවේ.
- විශේෂ අංශ (ඉදිකිරීම, සංචාරක සහ කෘෂිකර්මය) සඳහා ණය නිරාවරණයවීම් නැවත ගෙවීම් හැකියාවට බලපාන අතර බැංකු සහ මුදල් අංශවල අක්‍රීය ණය ඉහළ දමනු ඇත.

  **(වැඩිදුර කියවීම් සඳහා මෙම පරිච්ඡේදයේ "ණය වර්ධනය" සහ බැංකු ක්ෂේත්‍ර පිළිබඳ දළ විශ්ලේෂණය යටතේ "ණය සහ අත්තිකාරම්" බලන්න)**
- පූර්ව වසරවලට සාපේක්ෂව වත්කම් පදනම අඩු අගයකින් අඛණ්ඩව වර්ධනය විය.
- ව්‍යාපාර කොන්දේසි වර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති උත්තේජක අවශ්‍යය.

**(වැඩිදුර කියවීම් සඳහා, පොළී අනුපාත, ද්‍රවශීලතාව සහ මුදල් වෙළෙඳපොල සහ රජයේ සුරැකුම්පත් කොටස බලන්න)**

## උද්ධමනය

කොළඹ පාරිභෝගික මිල දර්ශනය (CCPI) සහ ජාතික පාරිභෝගික මිල දර්ශනය (NCPI) අනුව මනින ලද උද්ධමනය එක් තනි අංකයක මට්ටමක පැවතියද 2019 වසර තුළ පිළිවෙලින් එය 4.8% සහ 6.2% දක්වා වේගයෙන් වැඩි විය. තීරුබදු සංශෝධන සහ එක් වරක් වැඩි කළ නිවාස කුළී වල බලපෑම සමඟ අහිතකර කාලගුණ තත්ත්වයන්ගෙන් ඇති වූ ආහාර මිල ගණන්වල උච්ඡාවචනය මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. එක්වරක් ගැලපීමේ බලපෑම අඩු වූ ඉල්ලුම සමඟ ඉදිරියට යාම අපේක්ෂා කරන අතර 2020 තුළ 4% - 6% අතර අභිමත පරාසයක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. එතෙකුදුවුත්, මැදි කාලසීමාව පුරා කාලීන මුල්‍ය ප්‍රතිපත්ති මගින් තහවුරු කළ අභිමත පරාශයක් තුළ උද්ධමනය පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ. අඩු වූ ආර්ථික කටයුතු පිළිබිඹු කරමින්, විරැකියා අනුපාතය 2018 දී පැවති 4.4% සිට 2019 දී 4.8 දක්වා වැඩි විය.

### බැංකු ක්ෂේත්‍රය සඳහා ගම්‍යාර්ථ:

- උද්ධමනය පොදු ජනතාවගේ මිලදී ගැනීමේ ශක්තිය සහ බැංකු ක්ෂේත්‍රයේ වැටුප් හා වේතන කෙරෙහි බලපායි.
- තෙල්වල මිල ගණන්හි වෙනස්වීම් ප්‍රවාහන පිරිවැය මත බලපෑමක් ඇත.
- රත්‍රන් මිළ ගණන්වල වැඩිවීම තුළින් උකස් කළඹ පුළුල් වි ඇති අතර උකස් ව්‍යාපාරය තුළින් උපදවන ආදායම වැඩිකර ඇත.
- දැනට පවත්නා උද්ධමන අනුපාතය ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් ගනු ලබන මූල්‍ය ප්‍රතිපත්ති තීරණ විශාල වශයෙන් තීරණය කරයි.

## පොළී අනුපාත

2018 දී මහ බැංකුව උපකාරි මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරත්වයකට විතැන් විය. මෙය වර්ධනය වන උපකාරී ගෝලීය මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරත්වයට අනුකූල වූ අතර පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පසු අඩු වූ ආර්ථික වර්ධනය, මන්දගාමී පුද්ගලික අංශ ණය සහ නිහඬ උද්ධමනය වැනි දේශීය තත්ත්වයන් මූල්‍ය උත්තේජනයන් සඳහා මහ බැංකුව පොළඹවන ලදී. ආර්ථිකය තුළ පැවති තැන්පතු සහ ණය ලබාදීමේ නිෂ්පාදනවල ඉහළ තත්‍ය පොළී අනුපාත පිළිබඳ සලකා බලමින්, මූල්‍ය ආයතනවල අරමුදල් පිරිවැය අඩුකිරීමට සහ මූල්‍ය ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය කඩිනම් කිරීමට මූල්‍ය ආයතනවල තැන්පතු අනුපාත කෙරෙහි තාවකාලික සීමාවන් 2019 අප්‍රේල් සිට ක්‍රියාත්මක වන පරිදි පනවන ලදී.

කෙසේවෙතත්, වෙළෙඳපොල ණයදීමේ අනුපාත තැන්පතු පොළි අනුපාත තුළ නිරීක්ෂිත අඩුකිරීමට සාපේක්ෂව පහළට නොගලපන ලදී.

ණයදිමේ අනුපාත සඳහා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සම්ප්‍රේෂණය තුළ මෙම අවිධිමත් අඛණ්ඩව පවත්නා පරතර ආමන්ත්‍රණය කිරීම සඳහා, සම්ප්‍රේෂණයේ කාර්යක්ෂමතාව වැඩි කිරීමට 2019 සැප්තැම්බර් හි බලපත්‍රලාභි බැංකු මත තැන්පතු අනුපාත සීමා ඉවත් කරමින් සියලූම රුපියල්වලින් නම්කළ ණය සහ අත්තිකාරම් මත ණයදිමේ අනුපාත කෙරෙහි තාවකාලික සීමාවන් මහ බැංකුව විසින් පනවන ලදී. මෙම මූල්‍ය සහ නියාමන ක්‍රියාමාර්ගවලින් පසු, ණයදිමේ අනුපාතවල සෑහෙන දුරට අඩුවිමක් තුළින් ණය සඳහා ඉල්ලුම ක්‍රමානුකූලව

වැඩිකරමින් ආර්ථික කටයුතුවලට දායකවීමට අපේක්ෂා කරන ලදී. මෙම ක්‍රියාමාර්ගවල මෙන්ම මූල්‍ය කොන්දේසි ලිහිල් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, වෙළෙඳපොල පොළී අනුපාත විශේෂයෙන් වෙළෙඳපොල තැන්පතු අනුපාත සහ රජයේ සුරැකුම්පත් මත ඉපයීම් පහළට ගැලපීම ආරම්භ කරන ලදී.

**බැංකු ක්ෂේත්‍රය සඳහා ගම්‍යාර්ථ:**

- ශ්‍රී ලංකා රුපියල් තැන්පතු (2019 පසුකාලයේ ඉවත්කරන ලදී) සහ ණයදීම සඳහා උපරිම පොළී අනුපාත පිළිබඳ සීමාවන් බැංකුවලට තම තැන්පතු නිමැවුම් සහ ණයදීමේ නිමැවුම් ප්‍රතිමිලකරණය කිරීමට හේතු විය.
- ගනුදෙනුකරුවන්ට පිරිනමන පොළී අනුපාත මත පදනම් වෙමින් ක්ෂේත්‍රය තුළ තරඟකරුවන් අතර තරඟය තුරන් කිරීම.
- බැංකු ක්ෂේත්‍රයේ අරමුදල්වල අඩු පිරිවැය සහ ලාභදායීතාවය ඇති කිරීම

**(බැංකු ක්ෂේත්‍රය පිළිබඳ දළ විශ්ලේෂණය යටතේ "ණය සහ අත්තිකාරම්" සහ "ලාභදායීතාවය" කොටස් සමඟ මෙය කියවන්න)**

## ද්‍රවශීලතාවය සහ මූල්‍ය වෙළෙඳපොළ අනුපාත

සමාලෝචිත කාලසීමාව තුළ. වෙළෙඳපොල තුළ ද්‍රවශීලතාව උච්ඡාවචනය වූ අතර මිශ්‍ර ද්‍රවශීලතා තත්ත්වයක් වාර්තා කරන ලදි. ද්‍රවශීලතා හිඟය 2018 අවසාන කොටස තුළ මෙන්ම 2019 මුල් කාලය තුළ පැවතුණි. වෙළෙඳපොල තුළට ද්‍රවශීලතාව මුදාහැරීම පිණිස, ශ්‍රී ලංකා මහ බැංකුව 2019 මාර්තු අවසානයේදී පදනම් ලකුණු 100කින් ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) අඩුකරන ලද අතර පිළිවෙලින් 2019 මැයි සහ අගෝස්තු සමස්ත ලකුණු 100කින් ප්‍රතිපත්ති මත පහත හෙළන ලදී. පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පසු වඩා දුර්වල ණය ඉල්ලුම ද ද්‍රවශීලතාව ප්‍රතිසාධනයට සහය විය. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වන ලද සංචිත ප්‍රතිමිලදීග ැනීමේ වෙන්දේසි, 2019 මාර්තු සහ ජූනිවල ඇඑඩො බිලියන 2.4ක සහ ඇඑඩො බිලියන 2.0ක ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරවල (ISB) සාර්ථක නිකුතුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විසින් ඇඑඩො මිලියන 32.7ක් වූ ව්‍යාප්තකළ අරමුදල් පහසුකමෙන් (EFF) ලත් මුදල්, ද්‍රවශීලතාව පවත්වා ගැනීමට සහය විය. 2019 දෙසැම්බර් වන විට, ශ්‍රී ලංකා මහ බැංකුව හදිසි කටයුත්තක් ලෙස භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීම් තුළින් දේශීය මුදල් වෙළෙඳපොල වෙත රුපියල් බිලියන 47.7ක් යොදවන ලදී. මෙම ක්‍රියාමාර්ග 2019 අවසානයේදී රුපියල් බිලියන 37.8ක ද්‍රවශීලතා අතිරික්තයකට හේතු විය.

මුදල් වෙළෙඳපොළ පොළී අනුපාත පිළිබිඹු කරන සාමාන්‍ය බරතබන ලද ඇමතුම් මුදල් අනුපාතය (AWCMR) සහ සාමාන්‍ය බරතබන ලද ප්‍රතිමිලදිගැනීම් අනුපාතය (AWRR) ශ්‍රී ලංකා මහ බැංකුවේ ද්‍රවශීලතා යෙදවුම් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලැබූ අනෙකුත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල ආධාරය මත ක්‍රමානුකූලව අඩුවෙමින් පැවතිණ. භාණ්ඩාගාර බිල්පත් උපයීම පහත වැටීම තුළ මුදල් වෙළෙඳපොල තුළ පොළී අනුපාත පහත වැටීම පිළිබිඹු කරන ලදී. 2019 අවසානය වන විට, AWCMR සහ AWRR පිළිවෙලින් 7.45% සහ 7.53% මට්ටමේ පැවතුණි.

## රජයේ සුරැකුම්පත්

ද්විතියික වෙළෙඳපොළ තුළ විදේශීය ආයතනවල පහළ වැටීම හමුවේවුවත් මූලික වෙළෙඳපොල තුළ දේශීය ආයෝජකයින්ගේ දක්නට ලද ශක්තිමත් ඉල්ලුමේ ආධාරය මත රජයේ සුරැකුම්පත් වෙළෙඳපොල වසර තුළ (මුහුණත් වටිනාකම පදනම) ශක්තිමත්ව පුළුල්විය.

රජයේ සුරැකුම්පත් මත මූලික සහ ද්විතියික ඉපයීම් සැලකියයුතු පහත වැටීමක් දක්නට ලද අතර, ශක්තිමත් මිලදීගැනීමේ කැමැත්ත මගින් සහය වී වසරේ බොහෝ කොටස්වල පහත වැටීම දක්නට විය. විශේෂයෙන්, බැංකු විසින් ණය සහ අත්තිකාරම් සඳහා ඉල්ලුම පහළ වැටීමෙන් පසු අවදානම් රහිත රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට තම අමතර මුදල් මාරු කළ බැවින්, මූලික වෙළෙඳපොළ තුළ බැංකුවලින් අමතර ඉල්ලුම් නිරීක්ෂණය විය.

කෙසේවෙතත්, ගෝලීය වෙළෙඳපොළ තත්ත්වයන්ගේ වෙනස්වීම් සහ ආයෝජන විශ්වාසය පළුදුවීම රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතියික වෙළෙඳපොළෙන් තමන්ගේ ආයෝජන ආපසු ඇදගැනීමට විදේශීය ආයෝජකයින් පොළඹවන ලදී.

2019 වසර තුළ රජයේ සුරැකුම්පත්වලින් ශුද්ධ පිටවයාම් ඇඑඩො මිලියන 333.7ක් විය. භාණ්ඩාගාර බැඳුම්කර සහ භාණ්ඩාගාර බිල්පත්වල කැපිපෙනෙන විදේශීය ආයතන 2019 වසර අවසානයේදී රුපියල් බිලියන 103.9ක් වූ අතර එය 2018 දි පැවති රුපියල් බිලියන 158.6 සිට 34.5%ක පහළ වැටීමකි.

## භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළ

භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළ පසුගිය වසරේ අනුරූප කාලසීමාව තුළ 6.2% ක වර්ධනයට සාපේක්ෂව 2018 සැප්තැම්බර් අවසානයේදී පැවති රුපියල් බිලියන 4,007 සිට 2019 සැප්තැම්බර් අවසානයේදී රුපියල් බිලියන 4,550 දක්වා 13.5%ක වර්ධනයක් වාර්තා කරන ලදී. සමාලෝචිත කාලසීමාව තුළ, භාණ්ඩාග ාර බැඳුම්කර සඳහා මූලික වෙළෙඳපොළ තුළ දේශීය ආයෝජකයින්ගෙන් ලද අමතර ඉල්ලුම විශේෂයෙන් බැංකු අංශයෙන් ලද ඉල්ලුම නිරීක්ෂණය වූ අතර එය භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළ පුළුල්වීමට දායක විය.

මූලික සහ ද්විතියික වෙළෙඳපොළ තුළ භාණ්ඩාගාර බැඳුම්කර මත ඉපයීම 2019 දී සැලකියයුතු ලෙස අඩුවිය. කෙසේවෙතත්, වසර තුළ රජය නිකුත්කළ විදේශීය ව්‍යවහාර මුදලින් නම්කළ ණය සුරැකුම්පත් (SLDBs සහ ISBs) ඉපයීම් මත පීඩනය අඩුකරන ලදී. දේශීය වෙළෙඳපොළ ද්‍රවශීලතාව ද්විතියික බැඳුම්කර වෙළෙඳපොළ ඉපයීම් අනුපාත කෙරෙහි බලපාන ලදී. පොළී අනුපාතවල දිගුකාලීන විතැන්වීම පෙන්නුම්කරන භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ද්විතීයික වෙළෙඳපොළේ වසර පහක ඉපයීම් 2018 වසර අවසානයට පැවති ඉපයීම් හා සැසැඳීමේදී මෙම වසර තුළ අඛණ්ඩව පහත වැටී ඇත. ආයෝජකයින් අතර වඩා දිගුකාලීන කල්පිරීම් සඳහා අඩු රුචිය මින් පෙන්නුම් කරන ලදී.

වසර 2, වසර 5 සහ වසර 10 භාණ්ඩාගාර බැඳුම්කර මත ද්විතීයික වෙළෙඳපොළ ඉපයීම් 2019 වසර අවසානයේදී පිළිවෙලින් පදනම් ලකුණු 256 (bps), 191 (bps) සහ 182 (bps) කින් 8.6%, 9.67% සහ 10.05% දක්වා අඩුවිය.

## භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ

පොළී අනුපාතය විතැන්වීම අඩුකිරීමට ගන්නා ලද මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්වලින් පසු භාණ්ඩාගාර බිල්පත් සඳහා මූලික වෙළෙඳපොළ තුළ දේශීය ආයෝජකයින්ගෙන් ශක්තිමත් ඉල්ලුමක් නිරීක්ෂණය විය.

මූලික වෙළෙඳපොළ සංවර්ධනයනට අනුකූලව, දින 91, දින 182 සහ දින 364 භාණ්ඩාග ාර බිල්පත් සඳහා අදාළ ඉපයීම් අනුපාත 2019 වසර අවසානයේදී පිළිවෙලින් පදනම් ලකුණු 215 (bps), 208 (bps) සහ 255 (bps) කින් 7.25%, 7.88% සහ 8.36% දක්වා අඩුවූ බැවින් භාණ්ඩාගාර බිල්පත් සඳහා ද්විතියික වෙළෙඳපොළ තුළ ඉපයීම් සැලකියයුතු ලෙස 2019 ආරම්භයේදී පහත වැටුණි. ඒ අනුව,

2019 වසර තුළ දින 91, දින 182 සහ දින 364 භාණ්ඩාගාර බිල්පත් මත මූලික වෙළෙඳපොළ ඉපයීම් පිළිවෙලින් පදනම් ලකුණු 250, 197 සහ 275 කින් 7.51%, 8.02% සහ 8.45% දක්වා අඩුවිය.

රටට සුවිශේෂී සංවර්ධනයන් සමඟ ගෝලීය වෙළෙඳපොළ තත්ත්වයන් හී වෙනස්වීම් හේතු කොට ගෙන 2015 සිට 2019 ඔක්තෝබර් දක්වා භාණ්ඩාගාර බිල්පත්වල විදේශීය ආයෝජනයන් අඛණ්ඩව පහත වැටෙමින් පවතී.

## බැංකු ක්ෂේත්‍රය සඳහා ගම්‍යාර්ථ:

- රජයේ සුරැකුම්පත් සඳහා වෙළෙඳපොළ තුළ පවත්නා ද්‍රවශීලතා සහ පොළී අනුපාත සම්පත් වෙන්කිරීම්/ස්ථිර ආදායම සුරැකුම්පත්වල ආයෝජනයන් කෙරෙහි බලපායි
- ප්‍රාග්ධන ලාභ/අලාභ, සහ වෙළෙඳපොළ ලාභ/අලාභ සලකුණු කිරීම්, උපකරණවල මිලගණන් සහ ඉපයීම්වලින් ඇති වේ.
- මූල්‍ය උපකරණවල (භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, ණයකර, කොටස් සහතික සහ SLDBs) ස්වභාවය සහ එකී සුරැකුම්පත්වල සිදුකරන ආයෝජනවල ප්‍රමාණය අවදානම් බර තබනලද වත්කම්, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව සහ ක්ෂේත්‍රයේ ස්ථාවර අරමුදල් තත්ත්වය තීරණය කරයි.
- මුදල් වෙළෙඳපොල උපකරණ තබාග ැනීම මගින් ද්‍රවශීලතා තත්ත්වය ශක්තිමත් කරයි.

**(මෙම කොටස බැංකු ක්ෂේත්‍රය පිළිබඳ දළ විශ්ලේෂණය යටතේ "ද්‍රවශීලතාව", "අරමුදල් මූලාශ්‍ර", "ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව", "වත්කම් සහ වගකීම් වැරදි කල්පිරීම" යන කොටස් සමඟ කියවන්න.)**

## බාහිර අංශය

බාහිරින් සලකා බැලූ විට 2019 වසර තුළ, වර්ධිත ඇඟලුම් අපනයන සහ මෝටර්රථ සහ රත්‍රන් අපනයන සංකෝචනය විමේ ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳ හිඟය සංකෝචනය විය. පුද්ගලික මෝටර් රථ ආනයනය සඳහා සහ අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය සඳහා විවෘත කළ ණයවර ලිපි සඳහා ආන්තික තැන්පතු අවශ්‍යතා, අනුග්‍රාහක මෝටර් රථ බලපත්‍ර යටතේ ආනයනය කරන මෝටර් රථ සඳහා ණයවර ලිපි විවෘත කිරිම තාවකාලිකව අත්හිටුවීම, රත්‍රන් ආනයනය මත රේගු බදු පැනවීම සහ මෝටර් රථ ආනයන සඳහා බදුවල උඩුකුරු ගැලපීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. පසුගිය වසරේදී වාර්තාකළ ඇ.එ.ඩො මිලියන 10,343 ට සාපේක්ෂව 2019 වසර තුළ ඇ.එ.ඩො මිලියන 7,997 දක්වා වෙළෙඳ හිඟය පහත වැටුණි. දළ දේශීය නිෂ්පාදනයෙන් ප්‍රතිශතයක් ලෙස වෙළෙඳ හිඟය 2018 දී පැවති 11.7% සිට 2019 දී 9.5% ක් විය.

සංචාරක කර්මාන්තය සහ ප්‍රේෂණවලින් ඉපයීම් තුළ සැලකියයුතු පහත වැටීම හමුවේ, ජංගම ගිණුමේ හිඟය පසුගිය වසරේ පැවති ඇ.එ.ඩො මි. 2,709ට සාපෙක්ෂව 2019 දී ඇ.එ.ඩො මි. 1,808 දක්වා සීමාවිය. දේශීය නිෂ්පාදනයෙන් ප්‍රතිශතයක් ලෙස ජංගම ගිණුමේ හිඟය 2018 දී පැවති 3.2%ට අනුව 2019 දී 2.2% දක්වා වර්ධනය විය.

මූල්‍ය ගිණුම සම්බන්ධයෙන්, 2019 පළමු අර්ධය තුළ මෙයට පෙර දෙවරක් නිකුත්කළ ඇ.එ.ඩො බිලියන 1.5ක් වූ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර සඳහා රජය නැවත ගෙවන ලදී. මූල්‍ය වෙළෙඳපොළ තුළ අපේක්ෂිත විදේශීය ආයෝජනවලට වඩා අඩු ආයෝජන හා සෘජු විදේශ ආයෝජන, මූල්‍ය ගිණුම තවදුරටත් දුර්වල කරන ලදී. කෙසේ වෙතත්, 2019 දී ඇ.එ.ඩො බිලියන 4.4ක් වූ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර (ISB) නිකුතුව තුළින් ගලාඒම් සහ IMF – EFF හි වාරික දෙකක් ලඟාවීම මූල්‍ය ගිණුම මෙන්ම වෙළෙඳපොළ විශ්වාසය ශක්තිමත් කරන ලදී.

සියලූම තෙල් නිෂ්පාදනවල මිල ගණන් 2019 වසර තුළ සාපේක්ෂව පහළ මට්ටමක පැවතුණි. ලංකා ඛණිජ තෙල් සංස්ථාව (CPC) විසින් ආනයනය කරන බොර තෙල්වල සාමාන්‍ය මිල 2018 දී පැවති බැරලයක මිල ඇ.එ.ඩො 76.25 සිට 2019 දී ඇ.එ.ඩො 68.8 දක්වා පහත වැටුණි. දියමන්ති, මැණික් සහ ලෝහ ආනයන මත වියදම ද 2019 වසර තුළ අඩු විය. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර විවිධ තීරු ගාස්තුවලින් ඇතිවන අනාගත නීතිවිරෝධි පරස්පරතා අඩුකිරීමට 2018 අප්‍රේල් හි 15%ක රේගු බද්දක් පැනවීමෙන් පසු අඩු රත්‍රන් ආනයනයට මෙය හේතු විය.

## විදේශ විනිමය

2018 වසර තුළ සැලකියයුතු මිල අඩුවීමෙන් පසු, ශ්‍රී ලංකාවේ රුපියල 2018 දෙසැම්බර් වාර්තා කළ රු. 182.75 (16.4%කින් ක්ෂය වූ) ට සාපේක්ෂව 2019 අවසානයේදී රු. 181.63 දක්වා 0.61%කින් එක්සත් ජනපද ඩොලරයට අනුව සුළු වශයෙන් අගය ඉහළ යන ලදී. පාස්කු ඉරිදා ප්‍රහාර සහ විදේශීය ගලාඒම් හි පහත වැටීම විදේශ විනිමය මත අහිතකර බලපෑමක් තිබුණද, වෙළෙඳ හිඟය තුළ සැලකියයුතු සංකෝචනය සහ මූල්‍ය ප්‍රවාහයේ වැඩිවීම රුපියල ශක්තිමත් කරයි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලබන SWAP සහ භාණ්ඩාගාර බිල්පත් කල්පිරීමෙන් ඇතිවන වෙළෙඳපොළ තුළ ද්‍රවශීලතා හිඟය සහ රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළෙන් විදේශීය ආයෝජන ඉවත්කර ගැනීම, උපලේඛනගත විදේශීය ණය නැවත ගෙවීම් සහ මෝටර් රථ සහ තෙල් බිල්පත් සඳහා ආනයන ඉල්ලුම ක්‍රමානුකූල වැඩිවීමත් විදේශ විනිමය මත පීඩනය වැඩිකරන ලදී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ව්‍යාප්ත කළ අරමුදල් පහසුකම්වල වාරික මුදාහැරීම සහ ISB නිකුතුවෙන් ලත් මුදල්, ඩොලරයට එරෙහිව වටිනාකම නගාසිටුවීමට රුපියලට සහයවිය.

ඉන්දියාවේ සංචිත බැංකුව සහ ඕස්ට්‍රේලියාවේ සංචිත බැංකුව විසින් පොළි අනුපාත කපාදැමීම මෙන්ම යුරෝ කලාපයේ පැවති දේශපාලන අස්ථාවරත්වයන් අදාළ විදේශ විනිමයට අනුව අගය කිරීමට ශ්‍රී ලංකා රුපියලට ඉඩ දෙන ලදී. මේ අතර, 2019 දෙසැම්බර් හී එක්සත් රාජධානියේ පවත්වන ලද මහ මැතිවරණය සමඟ බ්‍රෙක්සිට් පිළිබඳ අපේක්ෂාවන් ස්ටර්ලින් පවුමට අනුව රුපියල පහළ දැමීමට හේතු විය. මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළෙඳපොල තුළ ශුද්ධ ගැණුම්කරුවෙක් වූ අතර, 2019 වසර තුළ ශුද්ධ පදනමක් මත දේශීය විදේශ විනිමය වෙළෙඳපොලෙන් මිලියන 387.0ක එක්සත් ජනපද ඩොලර් මිලදී ගන්නා ලදී.

## දළ නිල සංචිත

ඓතිහාසිකව ඉහළ ණය නැවත ගෙවීම් තිබියදීවුවත්, ස්වෛරී බැඳුම්කර මිලදීග ැනීම් තුළ ඇඑඩො බිලියන 4.4ක නිකුතුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ව්‍යාප්ත කළ අරමුදල් පහසුකම්වල හයවැනි සහ හත්වැනි ලැබීම සහ දේශීය වෙළෙඳපොලෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය මිලදී ගැනීම නිසා නිල සංචිත 2019 අවසානයට පැවති ඇඑඩො බිලියන 6.9 සිට 2019 අවසානයට ඇඑඩො බිලියන 7.6 දක්වා වැඩිවිය. 2019 අවසානයට මූල්‍ය ආනයන සඳහා සංචිත ආවරණය මාස 4.6ට ළඟා වූ අතර, බාහිර අනතුරට ලක්වීමේ හැකියාව සාපේක්ෂව ඉහළ කෙටි කාලීන වගකීම් සමඟ ඉහළින් පැවතුණි. ඉදිරි වසරේ විදේශීය නැවත ගෙවීම්වලට සහයවීම සඳහා සමුරායි බැඳුම්කරයක් තුළින් ඇඑඩො මිලියන 500ක් ඉහළ දැමීම පිළිබඳ මහ බැංකුව නිවේදනය කර ඇත.

### බැංකු ක්ෂේත්‍රය සඳහා ගම්‍යාර්ථ:

- මෝටර් රථ ආනයන මත ස්ථාපිත සීමාකිරීම් සහ රුපියලේ අගය අඩුවීම සහ වැඩිවීම තුළින් ආනයන සහ අපනයන ව්‍යාපාරය මත ඇතිවන බලපෑම ක්ෂේත්‍රයේ වෙළෙඳ මූල්‍ය කටයුතු සඳහා බලපායි.
- විදේශ විනිමය හුවමාරු ලාභ/ අලාභ සහ බැංකුවල ව්‍යුත්පන්න නිමැවුම්වල කාර්යසාධනය විදේශ විනිමයෙන් රඳවාගෙන ඇති තැන්පතු කෙරෙහි බලපානු ලබයි.
- විදේශ ව්‍යවහාර මුදල් ණයගැනීම් බැංකුවේ නැවත ගෙවීම්, පොළී සහ ලාභදායීතාව කෙරෙහි බලපායි.
- විදේශ ව්‍යවහාර මුදලින් නම්කළ මූල්‍ය නිමැවුම් (වත්කම් සහ වගකීම්) තබාග ැනීම මගින් බැංකුවල ශුද්ධ විවෘත ස්ථානය මෙන්ම නියාමන ප්‍රාග්ධනයේ ප්‍රමාණාත්මතාව තීරණය කරයි.

**(මෙම කොටස බැංකු ක්ෂේත්‍රය පිළිබඳ දළ විශ්ලේෂණය යටතේ "අරමුදල් මූලාශ්‍ර", "වත්කම් සහ වගකීම් වැදෙි කල්පිරීම" සහ "ලාභදායීතාව" යන කොටස් සමඟ කියවන්න.)**

## මූල්‍ය කාර්යසාධනය

වසර තුළ, රජය විසින් මූල්‍ය උත්තේජන වැඩසටහන් දෙකක් ආරම්භ කරන ලදී. පාස්කු ඉරිදා ප්‍රහාරවල බලපෑමට ප්‍රතිචාරාත්මකව ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ගවල පළමු වැනි වටය පවත්වන ලද අතර, ආර්ථික කටයුතු ඉහළ දැමීමේ අරමුණ ඇතිව ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ගවල දෙවැනි වටය ජනාධිපති මැතිවරණයෙන් පසු ආරම්භ කරන ලදී. එම ක්‍රියාමාර්ගවලට එකතුකළ අගය මත බදු පුළුල් පදනමකින් අඩුකිරීම සහ ජාතිය ගොඩගැනීමේ බදු සහ රඳවා ගැනීමේ බදු ඉවත් කිරීම සමඟ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට සංශෝධන ඇතුළත්ය.

පාස්කු ඉරිදා ප්‍රහාර විසින් ආර්ථික කටයුතු දුෂ්කරතාවට ඇදදමූ බැවින් සහ සංචාරක ඉපයීම් අඩුකළ බැවින්, පසුගිය වසර පුරා රජයේ මූල්‍ය තත්ත්වය දුර්වල වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, දේශීය ආදායම් පනත ක්‍රියාත්මක කිරීම හේතු කොට ගෙන සැලකියයුතු වැඩිවීමක් අපේක්ෂා කරනු ලැබූවද, මූලික අපේක්ෂාවන්ට පහළ මට්ටමක ආදායම් වර්ධනය පැවතිණ. ඒ සමගම, රජයේ වියදම ද වඩා ඉහළ ආරක්ෂාව හා බැඳුණු වියදම් සහ මැතිවරණ වියදම් හේතු කොට ගෙන වැඩිවිය.

මෝටර් රථ, පෙට්‍රෝලියම් නිෂ්පාදනවලින් තීරුබදු සහ ආනයන බදු එකතු කිරීමේ දුර්වලතාව නිසා අපේක්ෂිත ප්‍රමාණයට වඩා බදු ආදායම් පහත වැටුණ අතර, පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පසු සහන යෝජනා ක්‍රම සහ මැතිවරණ වර්ෂයක් තුළ පුනරාවර්තන වියදම් වැඩිකළ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම් නිසා වියදම ඉහළ ගියේය.

එහි ප්‍රතිඵලයක් ලෙස, අයවැය හිඟය 2018 දී පැවති 5.3% ට සාපේක්ෂව 2019 වසර තුළ දළ දේශීය නිෂ්පාදිතයෙන් 6.8% දක්වා ඉහළ ගියේය.

රජයේ ණය 2018 වසරේදී වාර්තා කළ රුපියල් බිලියන 12,030.5ට අනුව 2019 අවසානයේදී රුපියල් බිලියන 13,031.5 දක්වා 8.3%කින් ඉහළ ගියේය. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිත අනුපාතයට ණය 2018 දී පැවති 83.7%ට සාපේක්ෂව 2019 දී 86.8%ක් වූ අතර එය මැදි ආදායම් රටවල් අතර ඉහළම අගය ලෙස පැවතුණි. එමෙන්ම, 2019 දෙසැම්බර්වල ණය කළඹින් 49.1%ට වඩා විදේශ ව්‍යාවහාර මුදලින් නම්කර ඇත.

මූල්‍ය හිඟය සඳහා අරමුදල්කරණය විදේශීය සහ දේශීය ණය ගොඩ ගැසීමට හේතු වන අතර, එය ආර්ථිකය සහ මූල්‍ය ක්‍රමය උවදුරට ලක්කිරීමේ හැකියාව වැඩි කරයි. අයවැය හිඟය සඳහා 2019 වසර තුළ විශාල වශයෙන් දේශීය මූලාශ්‍රවලින් අරමුදල් ලබාගෙන ඇති අතර මෙම කාලසීමාව තුළ ශුද්ධ දේශීය අරමුදල්කරණය 2018 දී වාර්තා කළ රුපියල් බිලියන 437.2 ට සාපේක්ෂව රු.බි. 702.4ක් විය. දේශීය මූලාශ්‍රවලින් වඩාත් ඉහළ හිඟයට අරමුදල් ලබාගනු ලැබූවද, රජයේ බැඳුම්කර කොටස තුළ ඉහත සාකච්ඡා කළ පරිදි ඉපයීම් අනුපාත පහත වැටී ඇත. ISBs හි ශුද්ධ ණයගැනීම්, භාණ්ඩාගාර බිල්පත්වල විදේශීය අයෝජන, විදේශ ව්‍යවහාර මුදල් කාලීන මූල්‍ය පහසුකම්වල ශුද්ධ නැවත ගෙවීම් (FCTFF), විදේශීය ව්‍යාපෘති ණය සහ භාණ්ඩාගාර බැඳුම්කරවල විදේශීය අයෝජනවලින් සමන්විත ශුද්ධ විදේශීය මූල්‍යකරණය 2018 වසර තුළ වාර්තාකළ රුපියල් බිලියන 323.5 ට සාපේක්ෂව 2019 වසර තුළ රුපියල් බිලියන 314.1 දක්වා අඩුවී ඇත.

ශ්‍රී ලංකාවේ රජය (GOSL) සමාලෝචිත කාලසීමාව තුළ, රාජ්‍ය ණය බැඳීම් සේවාකරණය පිළිබඳ එහි නොකැලැල් ගමන්මග පිළිබඳ වාර්තාවක් පවත්වා ගනු ලැබීය. කෙසේවෙතත්, 2019 වසර තුළ ණය සේවා ගෙවීම් 2018 දී වාර්තාකළ රුපියල් බිලියන 2,088.6 සිට 3.2%ක අඩුකිරීමක් සමගින් රුපියල් බිලියන 2,022.5 ක් විය. ණය වගකීම් සපුරාලීමේ හැකියාව සම්බන්ධ ඉදිරි කල්පිරීම් ගැටළු ඇතිකරන අතර, දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස මුළු පොළී ගෙවීම් 2019 දී 6.0% (2018 දී 5.9%) දක්වා වැඩිවන බව සටහන්කරගත යුතුය.

එමෙන්ම භාණ්ඩ සහ සේවා අපනයනවලට විදේශීය ණය සේවා ගෙවීම් පිළිබඳ අනුපාතය 2019 දී 23.7% (2018 දී 16.0%) දක්වා වර්ධනය වී ඇත.

### බැංකු ක්ෂේත්‍රය සඳහා ගම්‍යාර්ථ:

- රජයේ සුරැකුම්පත් නිකුතුව තුළින් අයවැය හිඟයට අරමුදල් සැපයීමේ ප්‍රමාණය පිළිබඳ රජයේ තීරණය බැංකුවල (විශේෂයෙන් රාජ්‍ය බැංකු) ආයෝජනය සහ ලාභදායිතාව කෙරෙහි බලපෑනු ලබයි.
- නව බදු හඳුන්වාදීම හෝ දැනට පවත්නා බදුවලට සංශෝධනය බැංකුවේ ලාභදායීතාව කෙරෙහි බලපෑමක් ඇති කරයි.
- මූල්‍ය ප්‍රතිපත්තියේ කොටසක් ලෙස රජය විසින් ආරම්භ කරන වැඩපිළිවෙළ සහ වැඩසටහන්වලින් බැංකු ක්ෂේත්‍රයේ ව්‍යාපාර මෙහෙයුම් කෙරෙහි බලපෑමක් ඇතිකළ හැකිය.

**(මෙම කොටස තුළ "ද්‍රවශීලතාව සහ මුදල් වෙළෙඳපොල" සහ "රජයේ සුරැකුම්පත්" කොටස් සහ "ලාභදායීතාව" යන කොටස් හා බැංකු ක්ෂේත්‍රය පිළිබඳ දළ විශ්ලේෂණය යටතේ "අරමුදල් මූලාශ්‍ර" "වත්කම් සහ වගකීම් වැරදි කල්පිරීම" සහ "ලාභදායීතාව" යන කොටස් සමඟ කියවන්න.)**

### ණය ශ්‍රේණිගතකරණය

ආර්ථිකයේ මූල්‍ය තත්ත්වය තුළ සිදුවියහැකි දුර්වලවීම පිළිබිඹු කරමින්, ශ්‍රී ලංකාව සඳහා අනාගත දැක්ම සමාලෝචනය හමුවේ, 2019 දී ශ්‍රී ලංකාවේ ස්වෛරී ණය ශ්‍රේණිගතකරණය, ප්‍රධාන ජාත්‍යන්තර ශ්‍රේණිගතකරණ ආයතනය විසින් සහතික කරන ලදී. ෆිච් ශ්‍රේණිගතකරණය සහ S&P ගෝලීය ශ්‍රේණිගතකරණය විසින් ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගතකරණය 2019 දෙසැම්බර් මාසයේදී "බී" ලෙස සහතික කරන ලද අතර, මූඩිස් ණය ශ්‍රේණිගතකරණ ආයතනය 2019 දී එහි ශ්‍රේණිගතකරණය "බී2" ලෙස සහතික කරන ලදී.

### ණය වර්ධනය

දළ දේශීය නිෂ්පාදිත අනුපාතයට පුද්ගලික අංශයේ ණය, පහළ ආර්ථික කාර්යසාධනය හේතු කොට ගෙන ව්‍යාපාර විශ්වාසය නැතිවීම පිළිබිඹු කරමින් දිගුකාලීන ප්‍රවණතාව පහළ වැටුණි. ඒ අනුව, පුද්ගලික අංශය සඳහා ණය, වර්ධනය අඩුකළ වෙළෙඳපොල කටයුතු සහ වෙළෙඳපොල ඉහළ ණය අනුපාත ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන 2018 අවසානයේදී වාර්තාකළ 15.9%ට සාපේක්ෂව 2019 අවසානයට රුපියල් බිලියන 6,009.4 දක්වා ළඟාවෙමින් 4.3% දක්වා පහළ වැටුණි. මේ අතර පුද්ගලික අංශය සඳහා ණය 2018 අනුරූප කාලසීමාවට සාපේක්ෂව සමාලෝචිත කාලසීමාව තුළ අඩු අගයකින් වුවත් පුළුල් වූ අතර එය ණය වර්ධනය තුළ සමස්ත මන්දගාමී බව ලිහිල් කරන ලදී.

ආර්ථික කටයුතුවල ඇණහිටීම මූල්‍ය අතරමැදි කාර්යය පහත වැටීමත් සමඟ බැඳී තිබිණි. මූල්‍ය ආයතන ණයදීමේදී වඩාත් ආරක්ෂාකාරී වූ අතර ණය සඳහා ඉල්ලුම පැවති වෙළෙඳපොළ ණයදීමේ ඉහළ අනුපාත සහ අලස ආර්ථිකයක් තුළ අඩුවූ ව්‍යාපාරික අවස්ථාවන් සමඟ පහත වැටිණි.

ආර්ථික කටයුතුවල ඇණහිටීම සමඟ අඩු ණය වර්ධනය, පරිභෝජනය සහ ආයෝජනය මූල්‍ය ක්‍රමයේ වඩා ඉහළ අක්‍රීය ණය සඳහා හේතු විය. වඩා අඩු ගෘහස්ථ ආදායම්, වඩා ඉහළ අක්‍රීය ණය සහ ගෘහස්ථ පරිභෝජන අරමුණ සඳහා වැඩිපුර ණය ගැනීම, ආර්ථික කටයුතුවල ඇණහිටීමට හේතු විය.

මූල්‍ය ක්‍රමයේ වත්කම්වල ගුණාත්මකභාවය අංශ දෙකෙහිම අක්‍රීය ණය වර්ධනය වූ නිසා පහත වැටුණි. ආයතනික අංශය උවදුරට ලක්වී, අක්‍රීය ණය ඉහළයාමේ පසුබිමක් තුළ ආයතනවලට ණය දීමේදී පූර්වාරක්ෂාවන් ක්‍රියාත්මක කිරීමට පියවර ගැනිණි.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට (SMEs) දැඩි පහරක් වැදුණු අතර ණය සඳහා දුර්වල පිවිසුමෙන් පිඩාවට පත්විය. 2019 දෙවන කාර්තුව තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ පාරිභෝගික වර්ගීකරණ තුළ සැලකියයුතු ලෙස අක්‍රීය ණය වැඩි වූ අතර, අක්‍රීය ණය තුළ වඩා ඉහළ වැඩිවීමක් තෙවන කාර්තුව තුළ ආයතනික අංශයෙන් නිරීක්ෂණය විය. (මූලාශය: මූල්‍ය ක්‍රමයේ ස්ථාවරත්වය සහ සමාලෝචනය 2019).

### බැංකු ක්ෂේත්‍රය සඳහා ගම්‍යාර්ථ:

- පුද්ගලික අංශයේ ණය වර්ධනය බැංකු ක්ෂේත්‍රය ලබාදෙන ණය සහ අත්තිකාරම් සඳහා මෙන්ම ලාභදායිතාව සඳහා බලපායි.
- ණය සහ අත්තිකාරම් ආර්ථිකය තුළ මුදල් සංසරණය වේගවත් කරන අතර ණය නැවත ගෙවීම් හැකියාව වැඩිකරයි.

**(මෙම කොටස තුළ "දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය" සහ "පොළී අනුපාත" කොටස් සහ මෙම පරිච්ඡේදයේ "ද්‍රවශීලතාව සහ මුදල් වෙළෙඳපොල" සහ "රජයේ සුරැකුම්පත්" කොටස් හා බැංකු ක්ෂේත්‍රය පිළිබඳ දළ විශ්ලේෂණය යටතේ "අරමුදල් මූලාශ්‍ර" "වත්කම් සහ වගකීම් වැරදි කල්පිරීම" සහ "ලාභදායීතාව" යන කොටස් සමඟ කියවන්න.)**

### ආර්ථික දර්ශනය සහ අභියෝග

ශ්‍රී ලංකාවේ වර්ධනය 2020 දී 3.3% දක්වා ඉහළ දැමීමට සහ ඉන්පසුව ආයෝජන සහ අපනයන ප්‍රතිසාධනය කරමින් 2019 ආරක්ෂක අභියෝග සහ දේශපාලන අවිනිශ්චිතතාව පහකිරීම සහතික කරමින් වේගවත් කිරීමට අපේක්ෂා කෙරේ. අනාගත වර්ධනයට සමගාමීව 2020-2022 කාලසීමාව පුරා වර්ධනය 3.7% මට්ටමේ ස්ථායිකරණය කිරීමට යෝජිතය. (මූලාශ්‍රය: ලෝක බැංකුවේ 2020 ජනවාරි ගෝලීය ආර්ථික දර්ශනයන්). රජයේ ජාතික ප්‍රතිපත්ති වැඩරාමුව -"සෞභාග්‍යයේ සහ උත්කර්ෂයේ දැක්ම" අනුව, ශ්‍රී ලංකාව 2025 වනවිට 6.5%ක හෝ ඊට ඉහළ ආර්ථික වර්ධනයක් හෝ ඇළුඩො 6500 ඉක්මවන ඒක පුද්ගල ආදායමක් අත්කර ගැනීමට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා මහ බැංකුවට අනුව, ඉල්ලුම ශක්තිමත් කිරීමට ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය දේශපාලන ස්ථාවරත්වය සහ බලධාරීන් විසින් ගනු ලබන ඉලක්කගත ක්‍රියාමාර්ග හේතු කොට ගෙන ව්‍යාපාරික විශ්වාසය තුළ සැලකියයුතු වර්ධනය නිසා 2020 දී 4.0% ඉක්මවනු ඇත.

ආර්ථික වර්ධනය, සංචාරකයින් පැමිණීම යථා තත්ත්වයට පැමිණීම මෙන්ම ශක්තිමත් පරිභෝජනය සහ ආයෝජනයට වියදම් කිරීම තුළින් වර්තමාන චක්‍රීය දුර්වලතා මඟහැර ඉහළ යනු ඇත.

එකතුකළ අගය මත බදු (VAT) අනුපාතය අධික ලෙස කපාදැමීම සහ බදු අයිතම කිහිපයක් ඉවත් කිරීම ඇතුළුව අතුරු කැබිනට් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ මූල්‍ය උත්තේජක තුළින් පුද්ගලික පරිභෝජනය සහ ආයෝජන කටයුතු ශක්තිමත් කිරීම අපේක්ෂා කෙරේ. කෙසේවෙතත්, බදු එකතුකිරීම වර්ධනය කිරීමේ ප්‍රතිශෝධනවල ප්‍රගතිය අඩුවුවහොත් වඩා තියුණු ආර්ථික බිඳවැටීම්වලට හේතු විය හැකිය. එකතුකළ අගය මත බදු (VAT) අනුපාතය 15% සිට 8% තෙක් පහත හෙළීම, එකතුකළ අගය මත බදු (VAT) සඳහා පිරිවැටුම් සීමාව හතර ගුණයකින් ඉහළ දැමීම සහ 2% ක් වූ ජාතිය ගොඩනැගීමේ බද්ද ඉවත් කිරීම ඇතුළත් බදු කපාහැරීමේ ප්‍රධාන සංරචකයන් සැලකියයුතු ලෙස ආදායම් ඉපයීම් අඩුකරනු ඇත. මෙය මෝටර් රථ මිලදී ගැනීම මෙන්ම ප්‍රාග්ධන වියදම්වල තරමක අඩුකිරීම වැනි වියදම් අඩුකිරීම සඳහා රජයේ අපේක්ෂාව මත තාවකාලිකව ගන්නා ලද පියවර වේ.

තත්‍ය ඒක පුද්ගල ආදායම 2020 දී ආසන්න වශයෙන් ඇ.එ.ඩො 4,200 දක්වා ළඟා වනු ඇති බවට සහ 2019 -2022 තුළ තත්‍ය දළ දේශීය නිෂ්පාදිත වර්ධනය 3.8%හි තබාගැනීමට අපේක්ෂා කෙරේ. මෙය වසර 10ක බරතබන ලද සාමාන්‍යය පදනමක් මත 3.0%ක තත්‍ය ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතයක් කරා පරිවර්තනය කෙරේ. වර්ධන අනුපාතය, සමාන ආදායම් මට්ටම්වල සමාන රටවලට සමගාමී වුවත්, එය ශ්‍රී ලංකාවේ වර්ධන හැකියාවන්ට සැලකියයුතු ලෙස පහළ අගයකි. ඉහළ මැදි ආදායම් තත්ත්වයන්ට ළඟාවීම තුළින් වැඩි පිරිවැය සහ අවදානම් සහිත වඩාත් වාණිජ නියමයන් තුළ ණය ගැනීමට ශ්‍රී ලංකාව මෙහෙයවනු ඇත.

ශ්‍රී ලංකාවේ මූල්‍ය තත්ත්වය පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පසු බොහෝ සේ පසුබාන ලදී. ඉන් ප්‍රතිසාධනයක් අපේක්ෂා කරනු ලැබුවද, පුළුල් පරාසයක බදු කපාහැරීම් ක්‍රියාත්මක කිරීමෙන් පසු මූල්‍ය හිඟය තවදුරටත් පුළුල්වීම අපේක්ෂා කළ හැකිය. මින් රජයේ දැඩි ණය බර තවදුරටත් වැඩි කරන අතර ණය ආපසු ගෙවීමේ අභියෝගය වැඩිකරනු ඇත. ඩොලරයෙන් නම්කළ ණය නිරාවරණයේ වඩා ඉහළ කොටස සහ අවදානම් අභිප්‍රායන්හී රජයේ හදිසි විතැන්වීම මගින් බාහිර කළඹ දුර්වලව පැවතිණ.

රජයේ බාහිර මූල්‍යකරණ කොන්දේසි, විශාල බාහිර ණය වාරික සහ තෙල් මිල ඉහළයාම වැනි බාහිර කම්පනවල සංවේදීතාව හේතු කොට ගෙන අභියෝගාත්මකව පැවතිණ. විදේශ ව්‍යවහාර මුදලින් නම්කළ මුළු රාජ්‍ය ණය මුදලින් 40%ක වැඩි කොටසක් සමඟ, බාහිර තත්ත්වය අහිතකර හුවමාරු අනුපාත විතැන්වීම්වලට සහ ගෝලීය ණය කොන්දේසිවල වෙනස්වීමකට ලක්විය හැකි අතර, එය බාහිර අරමුදල් සඳහා රජයේ පිවිසුම තුළ තියුණු පරිහානියකට හේතු විය හැක. කෙසේවෙතත්, 2019 දී ඇ.එ.ඩො බිලියන 4.4 ක ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර දෙවරක් නිකුතුව අර්ධ වශයෙන් හේතු කොට ගෙන ආසන්න කාලීන බාහිර ණය බැඳීම් ආවරණය කිරීම සඳහා රජයට ප්‍රමාණවත් අරමුදල් ඇති බව පිළිගනී.

ආසන්නව පවත්නා රජයේ බාහිර ණය කල්පිරීම් මූල්‍ය ක්‍රමයේ ස්ථාවරත්වයට ක්‍රමානුකූල අවදානමක් ඇති කරයි. ඉදිරි බාහිර ණය කල්පිරීම්වල නැවත ගෙවීමට අරමුදල්කරණය සඳහා ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ අඛණ්ඩ ණය සුරැකුම්පත් නිකුතුව හෝ 2020 සිට 2025 දක්වා කාලසීමාව පුරා ණය නිර්මාණය නොවන ගලාඒම් මගින් අර්ධ වශයෙන් අරමුදල්කරණ අවශ්‍යතාව උද්ගත විය හැකිය. එකී අරමුදල්කරණය ISB නිකුතු මගින් අත්කර ගන්නේනම්, හුවමාරු අනුපාත අවදානමට අමතරව ආර්ථිකය, ස්වෛරී ණය අවදානමට නිරාවරණය කරනු ඇත. ISB කල්පිරීම් සමුච්චිතවීම මගින් ණය නැවත අරමුදල්කරණය පිළිබඳ අවදානම්, නැවත සකස්වීම සහ තිරසාරත්වය සම්බන්ධ ගැටළු මතුකර ඇත. කෙසේවෙතත්, රජය සහ පුද්ගලික අංශය යන ද්විත්වය සඳහා ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ අරමුදල් රැස්කිරීමේදී, ණය ඉහළයාම වඩා ඉහළ අවදානම් වාරිකවලට හේතු වේ. එමෙන්ම, බාහිර ණය ඉහළයාම බාහිර අභිප්‍රායන් සහ ප්‍රාග්ධන ප්‍රවාහයන්හි උච්ඡාවචනයට මූල්‍ය වෙළෙඳපොළ නිරාවරණය කරයි.

ඉහළ යන අවදානම සඳහා වැඩි පොලියක් ගෙවීමට සිදුවීම මගින් ස්වෛරී අවදානම ඉහළ යාම හා මූල්‍ය ක්‍රමයේ අස්ථාවරත්වය පෙන්නුම් කරයි. ෆිච් ශ්‍රේණිගතකරණය සහ ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර් (S&P ගෝලීය ශ්‍රේණිගතකරණ) යන ආයතන දෙක මගින් ශ්‍රී ලංකාවේ ස්වෛරී ශ්‍රේණිගතකරණය 'B+' (ස්ථාවර) සිට 'B' (ස්ථාවර) දක්වා පහළ දැමීම මගින් ස්වෛරී අවදානම තවදුරටත් වැඩි කරන ලදී.

සක්‍රිය වගකීම් කළමනාකරණ ප්‍රවේශය සහ ISB කල්පිරීම් නැවත ගෙවීම් සඳහා ස්වාරක්ෂක අරමුදලක් නිර්මාණය ඇතුළු ආර්ථිකය මත විභව බලපෑම අවම කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග ගණනාවක් හමුවේවුවත් 2018 අවසානයේදී මුහුණදුන් ව්‍යවස්ථානුකූල අර්බුදය නිසා මෙය සිදුවිය.

රජයේ සුරැකුම්පත්වල තත්‍ය කාලීන මිලගණන් පිළිබඳ තොරතුරු ගෙනයාමට විධිමත් යාන්ත්‍රණයක් නොමැතිකම, මධ්‍යගත නිෂ්කාශන සහ බේරුම් කිරීමේ වැඩපිළිවෙලක් නොමැතිකම සහ ද්විතියික වෙළෙඳපොළ තුළ තනුක භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණවත් නොවීම වැනි රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ වෙළෙඳපොළ යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ද්විතියික වෙළෙඳපොළ සංවර්ධනය තුළ සංරෝධක ලෙස පවතී. නවීන පන්නයේ විද්‍යුත් වෙළෙඳ අවස්ථාව (ETP), මධ්‍යම ප්‍රතිපූරණ නිෂ්කාශන සහ බේරුම් කිරීමේ ක්‍රමය (CCP), සහ මධ්‍යම සුරැකුම්පත් සුරක්ෂිතතා (CSD) ක්‍රමය හඳුන්වාදීම මගින් රජයේ සුරැකුම්පත්වල ද්විතියික වෙළෙඳපොළ තුළ ද්‍රවශීලතාව වැඩි කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කෙසේවෙතත්. වඩා ඉහළ ප්‍රාග්ධන අවශ්‍යතා සහ මූල්‍ය අංශය කෙරෙහි පනවනලද සක්‍රිය දැඩි ණය අලාභ වෙන්කිරීමේ ප්‍රතිපත්තිය වත්කම්වල ගුණාත්මකභාවය පහළ වැටුණද මූල්‍ය ක්‍රමය තුළ ප්‍රමාණවත් වැඩපිළිවෙලක් ගොඩ නැගීමට හේතු වී ඇති බැවින්, මූල්‍ය ක්‍රමය ස්ථාවරව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## බැංකු ක්ෂේත්‍රය

2019 අවසානය වන විට බැංකු ක්ෂේත්‍රය බලපත්‍රලාභී වාණිජ බැංකු (LCBs) 26 කින් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (LSB) 6 කින් සමන්විය විය. බැංකු ක්ෂේත්‍රය තුළ මුළු වත්කම් පදනම 2018 දෙසැම්බර් අවසානයට වාර්තාකළ රුපියල් ට්‍රිලියන 11.8 ට සාපේක්ෂව 6.2%ක වර්ධනයක් වාර්තා කරමින් 2019 අවසානයට රුපියල් ට්‍රිලියන 12.5 දක්වා වැඩිවී ඇත. වත්කමවල වැඩිවීම සඳහා ආයෝජනයන්හී පුළුල්වීම ප්‍රධාන වශයෙන් හේතු වී ඇති අතර ණය සහ අත්තිකාරම්වල මධ්‍යස්ථතාව ක්ෂේත්‍රයේ වත්කම් පදනම වර්ධනයට බාධා පමුණුවන ලදී.

ණය සඳහා වඩා අඩු ඉල්ලුම ආයෝජන සඳහා අරමුදල්වලින් මෙහෙය වූ අතර බැංකු ක්ෂේත්‍රය තුළ ආයෝජන 2018 දෙසැම්බර් වාර්තාකළ රුපියල් බිලියන 2.7 සිට 2019 අවසානයට රුපියල් ට්‍රිලියන 3.0 දක්වා 12.2%කින් වර්ධනය විය.

බැංකු ක්ෂේත්‍රයේ කාර්යසාධනය 2019 අප්‍රේල් පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පසු ඇති වූ වඩා අඩු ආර්ථික කටයුතු, දේශපාලන අස්ථාවරත්වය සහ ආයෝජන විශ්වාසය පළුදුවීම හේතු කොට ගෙන මධ්‍යස්ථව පැවතිණ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, බැංකු ක්ෂේත්‍රයේ ණය වර්ධන වේගය අඩු වූ අතර අක්‍රිය ණය වැඩිවිය. වත්කම් පදනම පසුගිය වසරවලට සාපේක්ෂව සුළු අගයකින් තවදුරටත් වර්ධනය විය. බැංකු ක්ෂේත්‍රයේ ලාභදායිතා වේගය ඉහළ ණය අලාභ වෙන්කිරීම, වඩා ඉහළ මෙහෙයුම් පිරිවැය සහ බදුවල ප්‍රතිඵලයක් ලෙස අඩුවිය.

## ණය සහ අත්තිකාරම්

බැංකු ක්ෂේත්‍රයේ ණය සහ අත්තිකාරම් 2018 අනුරූප කාලසීමාව සඳහා පැවති 19.6% ට සාපේක්ෂව 2019 වසර තුළ 5.6%කින් වර්ධනය විය. ණයදීමේ කටයුතුවල ස්ථාවර අරමුදල්කරණය පෙන්නුම් කරන මුළු තැන්පතු අනුපාතයට ණය, 2018 දෙසැම්බර්හි පැවති 90.6ට සාපේක්ෂව 2019 අවසානයේදී 88.7 දක්වා පහත වැටුණි. ණයදීමේ පූර්වාරක්ෂාවන් යොදා ගනිමින් සමාලෝචිත කාලසීමාව තුළ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කරා බැංකුවල අමතර අරමුදල් යෙදවීම දෙසට බැංකු යොමු වූ අතර ණය සඳහාවූ ඉල්ලුම, දුර්වල ආර්ථික වාතාවරණය තුළ පහත වැටුණි.

දළ අක්‍රීය ණය අනුපාතය 2014 ඔක්තෝබර් සිට ඉහළම වැඩිවීම වාර්තා කරමින් 2018 දෙසැම්බර් පැවති 3.4% සිට 2019 දී 4.7% දක්වා වැඩි විය. 2019 වසර තුළ, අක්‍රීය ණය අනුපාතය 5% ණය වර්ධනයට සාපේක්ෂව 46.9%කින් වැඩි වී ඇත.

2019 අප්‍රේල් පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පසු සංචාරක කර්මාන්තය තුළ පුද්ගලයින්ට සහ ආයතන වෙත ණය විලම්භන කාලයක් ලබාදෙන මෙන් බැංකු ක්ෂේත්‍රයෙන් රජය ඉල්ලා සිටියේය.

මෙම සහනය ප්‍රයෝජනයට ගෙන ණය නොගෙවීමේ ඉහළ හැකියාව නිසා පවත්නා අක්‍රීය ණය අනුපාතය සහ අනුරූප වෙන්කිරීම් ගාස්තු ප්‍රමාණවත් නොවිය හැකිය. බැංකු ක්ෂේත්‍රයට දෙවන විශාලතම නිරාවරණය සහිත ඉදිකිරීම් අංශය දළ දේශීය නිෂ්පාදිතයෙන් 6.9% කට දායක විය. 2019 අවසානයට ඉදිකිරීම් ක්ෂේත්‍රයට මුළු ණය නිරාවරණය 15.6%ක පැවතුණි. කෙසේවෙතත්, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අක්‍රීය ණය අනුපාතය 2018 දී වාර්තාකළ 3.8%ට සාපේක්ෂව 5.8% දක්වා ඉහළ ගියේය.

අක්‍රීය ණයවල විශාල කොටසක් වෙන් කිරීමක් නොමැති හෝ අඩුවෙන් වෙන්කිරීමක් අවශ්‍ය විශේෂයෙන් සඳහන්කළ උපප්‍රාමාණික වර්ගීකරණ වේ. විශේෂ වෙන්කිරීම් ආවරණ අනුපාතය සහ මුළු වෙන්කිරීම් ආවරණ අනුපාතය 2019 වසර අවසානයේදී පිළිවෙලින් 42.4% සහ 52.3% දක්වා අඩුවිය. වෙන්කිරීම්වල වඩා අඩු වැඩිවීම සඳහා වඩා අඩු වෙන්කිරීම් සහ එයට පාදක වූ ඇප ලබාගැනීම අවශ්‍යවන වර්ගීකරණ යටතේ වර්ගීකරණය කළ අක්‍රීය ණය හේතු විය.

## ද්‍රවශීලතාවය

බැංකු ක්ෂේත්‍රය 2019 තුළ යහපත් ද්‍රවශීලතා මට්ටම් සමඟ අඛණ්ඩව පැවති අතර ද්‍රවශීලතා අවදානමට එරෙහිව වඩා ඉහළ ස්ථාවරත්වයක් පෙන්නුම් කරන ලදී. භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලින් (SLDBs) සමන්විත රජයේ සුරැකුම්පත්වල ආයෝජනය මුළු ද්‍රවශීල වත්කම්වල බහුතරය නියෝජනය කරන ලදී. තැන්පතු හා ණයගැනීම්වලට අනුව ද්‍රවශීල වත්කම්වල ප්‍රමාණාත්මතාව අගයනු ලබන බැංකු ක්ෂේත්‍රයේ දේශීය බැංකු ඒකකවල (DBU) ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය (SLAR) නියාමන අවශ්‍යතාවන්ට වඩා ඉහළින් පැවතිණ. ලිත් දින 30 ආතති ක්‍රමවේදය තුළ උසස් තත්ත්වයේ ද්‍රවශීල වත්කම් (HQLA) ලබාගැනීමේ හැකියාව ගණනය කරන ද්‍රවශීලතා ආවරණ අනුපාත (LCR) 2019 අවසානය වන විට සැලකියයුතු ලෙස වර්ධනය විය. රුපියල් මුදල් මෙහෙයුම්වලට අනුව ගණනය කළ ද්‍රවශීලතා ආවරණ අනුපාතය 2018 දී පැවති 176.5 සිට 2019 දී 212.8 දක්වා වැඩි වූ අතර සියලුම ව්‍යවහාර මුදල් මෙහෙයුම් සඳහා ද්‍රවශීලතා ආවරණ අනුපාතය 2018 දී පැවති 152.1 සිට 2019 දී 178.2 දක්වා වැඩිවිය.

## අරමුදල් මූලාශ්‍ර

මුළු වත්කම්වලින් 73.2%කට දායක වන බැංකු ක්ෂේත්‍රයේ මුළු තැන්පතු 2018 දෙසැම්බර් වාර්තාකළ රුපියල් ට්‍රිලියන 8.5ට සාපේක්ෂව රුපියල් ට්‍රිලියන 9.2 දක්වා ළඟාවෙමින් 2019 වසර තුළ 7.9%ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය. වර්ධන අනුපාතවල මධ්‍යස්ථතාව තිබුණද, බැංකු ක්ෂේත්‍රය සඳහා ප්‍රධාන අරමුදල් මූලාශය ලෙස තැන්පතු තවදුරටත් පැවතිණ. එතෙකුදුවුවත්, තැන්පතු වර්ධනය තුළ වේගය අඩුවීම බැංකු ක්ෂේත්‍රයේ වත්කම් හා ණය වර්ධනය තුළ මධ්‍යස්ථතාව හා සමගාමී වේ.

තැන්පතුවලට පසුව, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අරමුණ සඳහා සහ ප්‍රතිමිලදීගැනීම් ණය සඳහා සුදුසුකම් සහිත ද්විතියික ණයකර බැංකු ක්ෂේත්‍රයේ ප්‍රධාන තැන්පතු නොවන දේශීය අරමුදල් මූලාශය ලෙස තවදුරටත් පවතී. 2019 ජනවාරි අවසන්කළ බාසල් III ප්‍රාග්ධන අදියර වැඩපිළිවෙල තුළ අවම ප්‍රාග්ධන වැඩිකිරීම් අවශ්‍යතාව ද්විතියික ණයකර තුළින් අරමුදල් ලබාගැනීමට බැංකු පොළඹවන ලදී. ණය වර්ධනයේ වේගය අඩුවීම සහ 2019 අප්‍රේල් හි ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව (SRR) අඩුකිරීමත් සමඟ, ප්‍රතිමිලදීගැනීම් ණය මත ස්ථාවරත්වය 2019 තුළ පහත වැටුණි. මේ අනුව, මුළු අරමුදල්කරණය තුළ ණයගැනීම් කොටස 2018 දී පැවති 15.0%ට අනුව 2019 දී 13.4% දක්වා අඩුවිය.

බැංකු ක්ෂේත්‍රයේ මුළු ණයගැනීම් 2018 දී පැවති රුපියල් බිලියන 1,763.4 ට සාපේක්ෂව 2019 වසර තුළ රුපියල් බිලියන 1,679.4 දක්වා අඩුවිය. මෙම අඩුවීම සඳහා 2019 දී 6.3%කින් පහත වැටුණු ශ්‍රී ලංකා රුපියල් ණයගැනීම්වල අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු විය. විදේශීය ව්‍යවහාර මුදලින් ණයගැනීම්, බැංකු ක්ෂේත්‍රයේ මුළු වත්කම්වලින් 7.8%ක් නියෝජනය කරන අතර 2019 තුළ මුළු ණයගැනීම්වලින් 55%කට වැඩි ප්‍රමාණයකට එය දායකවිය.

විදේශීය ව්‍යවහාර මුදලින් ණයගැනීමේ ඉහළ ප්‍රවණතාවය රුපියලේ අගය අඩුවන්නේනම් ක්ෂේත්‍රයේ ලාභදායීතාවට අහිතකර ලෙස බලපායි. එසේම, බාහිර ණයගැනීම් බැංකු ක්ෂේත්‍රයේ විදේශීය ව්‍යවහාර මුදලින් ණයගැනීමේ විශාලතම මූලාශ්‍රය ලෙස පැවති අතර අඩු ස්ථාවරත්වයක් ගනී. අධික රන්පවුම් අවදානම සහිත පරිසරයක් තුළ ප්‍රතිමූල්‍යකරණය අභියෝගාත්මක විය හැකිය.

## ස්ථාවර අරමුදල්කරණය

අවශ්‍ය ස්ථාවර අරමුදල්කරණයට සාපේක්ෂව එක් වසරක කාලසීමාවක් පුරා ස්ථාවර අරමුදල් ලබාගැනීමේ ප්‍රමාණය ගණනය කරන ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (NSFR) 2019 අවසානයට 130.1 මට්ටමේ වූ අතර එය අවම අවශ්‍යතාවයට වඩා ඉහළ අගයකි.

## ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව

අභියෝගාත්මක සාර්ව පරිසරය හමුවේ, නියාමන අවම අවශ්‍යතාවයට වඩා ඉහළ අගයක වූ යහපත් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතවල (CAR) සහය තුළින් බැංකු ක්ෂේත්‍රය ස්ථාවරව පැවතුණි. බැංකු ක්ෂේත්‍රය විසම පදනමක් මත අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය වැඩිකිරීමට අවශ්‍ය වූ 2019 ජනවාරි 1 වැඩපිළිවෙල තුළ එහි බාසල් III ප්‍රාග්ධන අදියර සාර්ථකව අවසන් කරන ලදී. ජාත්‍යන්තර ප්‍රමිතිවලට සමාගමීව 2019 දෙසැම්බර්වල සිට ක්‍රියාත්මක දේශීය ක්‍රමානුකූල වැදගත් බැංකු (D-SIBs) සමඟ ගනුදෙනුකිරීම සඳහා නව වැඩපිළිවෙලක් ශ්‍රී ලංකා මහ බැංකුව හඳුන්වාදෙන ලදී. ඒ අනුව, දේශීය ක්‍රමානුකූල වැදගත් බැංකු (D-SIBs) සහ එසේ නොවන බැංකු පිළිවෙලින් 14.0% සහ 12.5%ක අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතයක් පවත්වා ගැනීම අවශ්‍ය වේ.

බැංකු ක්ෂේත්‍රයේ ප්‍රාග්ධන සංරක්ෂක ස්වාරක්ෂකවලින් සමන්විත ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය සහ පළමු පෙළ ප්‍රාග ්ධන අනුපාතය පිළිවෙලින් 16.5% සහ 13.0% මට්ටමේ පැවතිණ. දේශීය ක්‍රමානුකූල වැදගත් බැංකු (D-SIBs) සහ එසේ නොවන බැංකුවල එකතුකළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය ස්ථාපිත නියාමන අවශ්‍යතාවයට වඩා ඉහළින් පැවතුණි. අවදානම බරතබන ලද වත්කම්වල (RWA) වර්ධනය ණය වර්ධන වේගය අඩුවීම පිළිබිඹු කරමින් 2019 වසර තුළ මධ්‍යස්ථ විය. ණය වර්ධනයේ මධ්‍යස්ථතාව සහ අවදානම් රහිත භාණ්ඩාගාර සුරැකුම්පත්වල වැඩිකළ ආයෝජන, බැංකු ක්ෂේත්‍රයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය වර්ධනය සඳහා ධනාත්මකව දායක වී ඇත.

## තෝලන අනුපාතය

ශේෂ පත්‍රය මත සහ ශේෂ පත්‍රයෙන් බැහැර අනාවරණ සඳහා පළමු පෙළ ප්‍රාග්ධනයේ ප්‍රමාණාත්මතාව අගය කරන අවදානම පදනම් නොවන ප්‍රාග්ධන මිනුමක් වන තෝලන අනුපාතය 2019 දෙසැම්බර් 6.8%ට ළඟා වූ අතර එය නියාමන අවමයට වඩා ඉහළ අගයකි. 2019 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක පරිදි බැංකු ක්ෂේත්‍රය සඳහා තෝලන අනුපාතය අනිවාර්ය කරන ලදී.

## ලාභදායිතාව

ණයවල ගුණාත්මකභාවය පිරිහීමෙන් ඇති වූ ණය අලාභ වෙන්කිරීම් තුළ වැඩිවීම සහ වැඩිකළ සංස්ථාපිත සහ අගය එකතුකළ බදු හේතු කොට ගෙන බැංකු ක්ෂේත්‍රයේ ලාභ 2017 සිට පහත වැටී ඇත. 2019 සඳහා ශුද්ධ ලාභය 2018 දි පැවති රුපියල් බිලියන 125.8 සිට රුපියල් බිලියන 111.1 දක්වා 11.7%කින් පහත වැටුණි.

ශුද්ධ පොළී අනුපාතය (NII) පසුගිය වසරට සාපේක්ෂව රුපියල් බිලියන 397.6 ට අනුව 2019 සඳහා රුපියල් බිලියන 429.8 දක්වා 8.1% කින් වර්ධනය විය. ශුද්ධ පොළී අනුපාතය තුළ වැඩිවීම හමුවේ, වර්ධන අනුපාත පසුගිය වසරට සාපේක්ෂව 2019 වසර තුළ මධ්‍යස්ථ විය. ශුද්ධ පොළී අනුපාතය තුළ වඩා අඩු වර්ධනය, ණයවල මධ්‍යස්ථතාව සහ අඩු ඉපයීම් සහිත ස්ථිර ආදායම් සුරැකුම්පත් සඳහා සම්පත් නැවත වෙන්කිරීම හේතු විය. කෙසේවෙතත්, ක්ෂේත්‍රයේ ශුද්ධ පොළී ආන්තිකය (NIM) සාමාන්‍ය වත්කම්වලින් 3.6%ක නොවෙනස්ව පැවතිණ.

පොළී නොවන ආදායම 2018 අනුරූප කාලසීමාව තුළ වාර්තාකළ රුපියල් බිලියන 147.7ට සාපේක්ෂව 2019 වසර තුළ රුපියල් බිලියන 132.1 දක්වා 10.6% කින් අඩුවිය. එක්සත් ජනපදය තුළ ප්‍රතිපත්ති අනුපාත ඉහළ දැමීම්වලින් පසු ඇමෙරිකානු ඩොලරය ශක්තිමත් වීමෙන් 2018 වසර තුළ අත්කරගත් විදේශ ව්‍යවහාර මුදල් ප්‍රත්‍යාගණන ලාභවල අඩුවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. වඩා ඉහළ ණය අලාභ වෙන්කිරීම් ඇති කරන වත්කම්වල දුර්වල ගුණාත්මකභාවය හේතුකොට ගෙන ශුද්ධ පොළී අනුපාතය පහත වැටුණි. ශුද්ධ පොළී අනුපාතය තුළ වැඩිවීම පොළී නොවන ආදායමේ අඩුවීම සහ පොළී නොවන වියදම්, බදු සහ වෙන්කිරීම්වලින් සමන්විත වියදම්වල වැඩිවීම සඳහා වන්දිපූරණය කිරීමට ප්‍රමාණවත් නොවීය. ආදායමට පිරිවැය අනුපාතය සහ කාර්යක්ෂමතා අනුපාත පිළිවෙලින් 77.8% සහ 52.7% දක්වා 2019 දී පහත වැටුණු අතර ඉන් මෙහෙයුම් වියදම්වල වැඩිවීම සහ පොළී නොවන ආදායමේ සංකෝචනය පෙන්නුම් කරන ලදී.


බැංකු ක්ෂේත්‍රයේ වත්කම් මත ඉපයීම (ROA) 2018 දී පැවති 1.8% සිට 2019 දී 1.4% දක්වා පහත වැටුණු අතර ස්කන්ධය මත ඉපයීම (ROE) 2018 දී පැවති 14.1% සිට 2019 දී 10.3% දක්වා පහත වැටුණි.

**බැංකු ක්ෂේත්‍රයේ සහ එහි දර්ශනයට බලපාන සාධක "අවදානම සහ අවස්ථා" කොටස යටතේ පිටු අංක 36 සිට 47 මගින් දක්වා ඇත.**

**ක්ෂේත්‍රයට අනුව/ සාපේක්ෂව බැංකුවේ කාර්යසාධනය "මූල්‍ය ප්‍රාග්ධනය" යටතේ "මූල්‍ය කාර්යසාධනය" යටතේ විස්තරාත්මකව විශ්ලේෂණය කරන අතර ඒ සඳහා පිටු අංක 93 සිට 107 වෙත යොමුවන්න.**

# කොවිඩ් 19 වසංගතයේ බලපෑම

**කොරෝනා වයිරස්**



## කොවිඩ් 19 වසංගතයේ බලපෑම

2019 නව කොරෝනා වයිරස් රෝගය "කොවිඩ් 19" චීනයේ හුබෙයි පළාතේ අගනුවර වන වූහාන්වල 2019 දෙසැම්බර් පළමුවෙන් හඳුනාගන්නා ලදී. එතැන් සිට, එහි පැතිරීම මායිම් හරහා සැලකියයුතු ලෙස ව්‍යාප්ත වි ඇති අතර, ලෝක සෞඛ්‍ය සංවිධානයට (WHO) 2020 මාර්තු 11 දින කොවිඩ් 19 වසංගතය ප්‍රකාශයට පත්කිරීමට සිදුවිය.

පැතිරීම අඛණ්ඩව ව්‍යාප්ත වන බැවින්, ලොවපුරා රාජ්‍යයන් විසින් වසංගතය පැතිරීම වැලැක්වීමට ගමනාගමන සීමාකිරීම්, ඇඳිරි නීතිය, සංචාරක තහනම් කිරීම් සහ දේශසීමා වසාදැමීම් ඇතුළුව පොදු සෞඛ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම ක්‍රියාමාර්ග පුද්ගලයින්, පවුල්, ව්‍යාපාර, ප්‍රජාවන්, සහ රටවල් කෙරෙහි සැලකියයුතු බලපෑමක් ඇතිකළ අතර ගෝලිය වෙළෙඳාම කෙරෙහි අති විශාල බලපෑමක් ඇත. මෙම වාර්තාව තුළ සාකච්ඡා කළ මෙහෙයුම් පරිසරය, ප්‍රමාණාත්මක කරුණු සහ උපාය මාර්ගික අවධානිත ප්‍රදේශ ඇතුළුව ප්‍රධාන ක්ෂේත්‍ර කෙරෙහි 2019 දි අවධානය යොමු කෙරේ. කෙසේවෙතත්, 2020 මාර්තු සිට, පුද්ගලයින්, පවුල්, ව්‍යාපාර, සමාජ සහ රටවල මත කොවිඩ් 19 වසංගතයේ බලපෑම අපි සියැසින් දුටු අතර, ආසාධිත අනුපාත ලොව තුල සහ 2020 මාර්තු සිට ශ්‍රී ලංකාවේද ක්‍රමයෙන් වැඩිවිය. තවද. අනාගත දැක්ම 2020 වසර අවසානය සඳහා ඇගයිම මත පදනම් වේ. කොවිඩ් 19 බලපෑම තුළින් ඉදිරි වර්ෂ සඳහා අපගේ ක්‍රමෝපායික ක්‍රියාවන් කෙරෙහි බලපෑමක් ඇති බැවින්. කෙටි හා මධ්‍ය කාලීන බලපෑම දැනට අවිනිශ්චිත වුවත් මෙම සන්දර්භය අපි කෙටියෙන් සාකච්ඡා කර ඇත.

## ගෝලීය සන්දර්භ

ලොවපුරා මූල්‍ය වෙළෙඳපොල තියුණු ලෙස පහත වැටි ඇති අතර වෙළෙඳපොල විතැන්වීම් 2008-09 ගෝලීය මූල්‍ය අර්බුද කාලයට වඩා වැඩියෙන් වෙනස්විම ආරම්භකර ඇත. ආයෝජකයින් තමන්ගේ අවදානම් රුචි මට්ටම් පහත දමන ලද අතර විශාල අවපීඩනයට වඩා දැඩිවේයයි අපේක්ෂිත වසංගතයේ ආර්ථික බලපෑම් පිළිබඳ පුරෝකථන හා කටයුතු කරන ලදී. ගෝලිය තෙල් සහ අනෙකුත් වෙළෙඳ ද්‍රව්‍ය වෙළෙඳපොල තියුණු ලෙස පහත වැටි ඇත.

එවැනි සිදුවීම් අතීශය ප්‍රතිවිපාක සමහ දුර්ලභ වන බැවින් සහ අනාවැකි පැවසිමට බොහෝ දුෂ්කර බැවින් බ්ලැක් ස්වෝනි සිදුවිම් ලෙස හඳුන්වයි. ආර්ථික වර්ධනය කෙරෙහි දීර්ඝ කාලීන බලපෑම කාලය පුරා මතුවන අතර 2020 දී ගෝලීය වර්ධනයේ සැලකියයුතු හැකිලීමක් ඇතිකළ හැකි අතර 2021 දී අර්ධ වශයෙන් ප්‍රතිසාධනයක් සිදු කෙරේ.

## ශ්‍රී ලංකා රජයේ ප්‍රතිචාරය

දින 50 කට වඩා වැඩි කාලයක් සඳහා අත්‍යවශ්‍ය නොවන සේවා වසා දැමීමට හේතු වෙමින් 2020 මාර්තු 21 සිට දිවයින පුරා ඇඳිරි නීතිය පනවන ලදී. ශ්‍රී ලංකාවේ රජය (GOSL) කොවිඩ් 19 පැතිරීම වැලැක්විමට සහ මහජන සෞඛ්‍ය සූදානම ශක්තිමත් කිරීමට ක්‍රියාමාර්ග කිහිපයක් ආරම්භ කරන ලදී. මෙම ක්‍රියාමාර්ගවලට සමාජීය දුරස්ථභාවය, පිඩාවට පත් රටවල් කරා සංචාර තහනම් කිරීම, වරාය සහ ගුවන් තොටුපල වසාදැමීම, දිවයින පුරා ඇඳිරි නීතිය පැනවීම, ශ්‍රී ලංකාවේ නිවාසවලට හදිසි සැපයීම් ලබාගැනිමට සහය පිණිස රාජ්‍ය - පුද්ගලික හවුල්කාරත්වයන් ඉදිරියට ගෙනයාම සහ හදිසි සෞඛ්‍ය සහ ආර්ථික ක්‍රියාමාර්ග ස්ථාපිත කිරීම ඇතුළත්ය. ආර්ථික සහන ක්‍රියාමාර්ග කිහිපයක් සමාජයේ වඩාත් දුප්පත් අංශ සහ උවදුරට පත්වන ව්‍යාපාර අංශ වෙත ලබාදෙන ලදී. සෞඛ්‍ය සහ සිමා කිරීම, නිරෝධායනය සහ සම්බන්ධිත ක්‍රියාමාර්ග ඵලදායී ආකාරයෙන් සම්බන්ධීකරණය කිරීම සඳහා කොරෝනා වයිරස් කාර්ය සාධක බලකායක් ස්ථාපිත කිරීම ඇතුළුව සෞඛ්‍යාරක්ෂාව සහ මහජන ආරක්ෂක ක්‍රියාමාර්ග මත රජයේ වැඩසටහන් සාර්ථක වී ඇත.

ආර්ථික කටයුතු කඩිනම් කරවිම සඳහා 2020 අප්‍රේල් දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගඃ

- මූල්‍ය මණ්ඩලය විසින්
  - ස්ථාවර තැන්පතු පහසුකම් අනුපාතය – (SDFR) 6.00% දක්වා පදනම් ලකුණු (bps) 50 කින් කපාදැමීම
  - ස්ථාවර ණයදීමේ පහසුකම් අනුපාතය (SDFR) 7.00% දක්වා පදනම් ලකුණු (bps) 50 කින් කපාදැමීම
  - බලපත්‍රලාභි වාණිජ බැංකුවල (LCBs) සියලූම රුපියල් තැන්පතු වගකිම් මත ව්‍යාවස්ථාපිත සංචිත අනුපාතය (SRR) 4% දක්වා 1%කින් අඩුකිරීම

- 2020 මාර්තු සිට ඉදිරි මාස තුන සඳහා සියලුම වර්ගයේ මෝටර් රථ සහ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය අත්හිටුවීම
- 2020 මාර්තු සිට ඉදිරිමාස තුන සඳහා ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභි බැංකු මගින් ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලදී ගැනීම අත්හිටුවීම
- ඇ.එ.ඩො 5,000ක අවමයක් දක්වා පමණක් සංචාරක දීමනාවක් ලෙස විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කිරීමට බලයලත් විනිමය හුවමාරු වෙළෙඳුන්ට අවසරදීම
- පුද්ගල ණය, කල්බදු වාරික මත විලම්භන කාලය, පීඩාවට පත් කර්මාන්ත සඳහා ණය විලම්භන කාලය, තෝරාගත් අංශ සඳහා පොළී ගෙවීම් කපාදැමීම, දේශීය ණයකාඩ් ගනුදෙනු මත අවම පොළී අනුපාත පැනවීම, චෙක්පත් සඳහා වලංගු කාල දීර්ඝ කිරීම යනාදී ස්වයං රැකියා සහ පුද්ගලයින් ඇතුළුව පීඩාවට පත් ව්‍යාපාර බේරාගැනීමට ආර්ථිකයට රු.බි. 50ක ප්‍රතිමූල්‍යකරණ පහසුකමක් වෙන්කිරීම.

බැංකුවල පීඩනය ලිහිල් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගඃ

- ලිහිල්කළ ප්‍රාග්ධන සංරක්ෂක බෆරය
- 2022 දක්වා වසර දෙකකින් බැංකු සඳහා අවම ප්‍රාග්ධන අවශ්‍යතාව වැඩිකිරීමේ අවසාන දිනය කල්දැමීම
- වෙනත් සහන සඳහා හිමිකම නොලද ණය ගැතියන්ට දින 60ක ණය ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීමක් ලබාදීමට බැංකුවලට අවසරදීම
- විදේශ ව්‍යවහාර මුදලින් ණය අයකරගැනීම දුෂ්කර වන අවස්ථාවන්වලදී අවසාන උපාය ලෙස රුපියල්වලින් ණය අයකර ගැනීමට බැංකුවලට ඉඩදීම
- බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ව්‍යවස්ථාපිත වාර්තා ඉදිරිපත් කිරීම සඳහා වූ අවසාන දින දීර්ඝ කිරීම

## බැංකු සහ මූල්‍ය සේවා ක්ෂේත්‍රය කෙරෙහි බලපෑම

සැලකියයුතු ආර්ථික කඩා වැටීම සෘජුවම බැංකුවලට බලපානු ඇත. දුෂ්කර මෙහෙයුම් කොන්දේසි හේතු කොට ගෙන, බැංකු ක්ෂේත්‍රයේ කාර්යසාධනය බොහෝ අභියෝග යට ලක් කරන අතර එය වත්කම්වල ගුණාත්මකභාවය, ලාභදායිතාව සහ අයකරගැනීම්වලට බලපානු ඇත. දැඩි ආරම්භක බලපෑම වනුයේ වසංගතය මගින් වඩාත් පීඩාවට පත් කර්මාන්තවලට ලබාදුන් අරමුදල් සඳහා වියහැකිය. විශේෂයෙන් සුළු හා මධ්‍ය පරිමාණ අංශයට වඩාත් නිරාවරණය සහිත බැංකු සහ මෙම අංශය තුළ සේවයේ නියුතු පුද්ගලයින් ණය පැහැර හැරීම තුළ විශාලතම අක්‍රීය ණය වැඩිවීම වාර්තා කළ හැකිය. ශ්‍රී ලංකාවේ රජය විසින් පනවන ලද සය මාසික ණය විලම්භන කාලය සහ අනෙකුත් ක්‍රියාමාර්ග තුළින් පුද්ගලයින්ට සහ ව්‍යාපාරවලට ඇති බලපෑම වඩා අඩු කිරීමට අපේක්ෂා කරනු ලැබුවත් 2020 දී අක්‍රීය ණය වැඩිවනු ඇත.

ෆිච් ශ්‍රේණිගතකිරීම් අනුව, ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍රය සඳහා අනාගත දැක්ම 2020 සඳහා සෘණාත්මක වේ. මූල්‍ය ආයතන සඳහා ද්‍රවශීලතා අවශ්‍යතාවන්හි අඩුවීම මගින් තරමක් දුරට හිලව් කරනු ලැබුවද. ණය විලම්භන කාලසීමා මගින් මූල්‍ය අංශයේ ද්‍රවශීලතාවයට බලපෑම් කරනු ලැබේ.

## ජාතික ඉතිරි කිරීමේ බැංකුව කෙරෙහි බලපෑම

අගුළු දමනලද කාලසීමාව පුරා බැංකු කටයුතු අත්‍යවශ්‍ය සේවාවක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස, ජාතික ඉතිරි කිරීමේ බැංකුව තම ගනුදෙනුකරුවන්ට නිරන්තර සේවාවක් පිරිනැමීම සඳහා විවෘතව තබන ලදී. අපගේ ගනුදෙනුකරුවන්ගේ සහ සේවකයින්ගේ ආරක්ෂාව අවශ්‍ය ආරක්ෂක පෙරාතු ලේඛන යොදා ගනිමින් සහතික කරන ලදී. කොවිඩ් 19 අභියෝගය මැඩපවත්වමින් අපගේ පාර්ශ්වකරුවන් සඳහා අපගේ බැඳීම ක්‍රියාත්මක කිරීමට අපි සෑම උත්සාහයක්ම අරගතිමු.



කොවිඩ් 19 වසංගතය ණය අවදානම, ද්‍රවශීලතා කළමනාකරණය සහ ප්‍රාග්ධන සංරක්ෂණය කෙරෙහි වැඩිකළ අවධානය සමඟ වඩා අභියෝගාත්මක ආර්ථික සන්දර්භයකට හේතු විය හැකිය. වසංගතයේ පසුකාලීන මූල්‍ය බලපෑම තවම මතුවෙමින් පවත්නා අතර සම්පූර්ණයෙන් ප්‍රමාණනය කළ නොහැක. ප්‍රධාන අවදානමට මන්දගාමී ණය කළඹ වර්ධනය, විශේෂයෙන් අඩාල වූ පාරිභෝගික ණයදීම සහ ආයතනවල අඩුකළ ආයෝජන, වඩා අඩු පොළි අනුපාත, ආදායම් වර්ධනය බලපාන වඩා අඩු ගනුදෙනු පරිමාවන් සහ රැකියා අහිමිවීම සහ සංස්ථාපිත පැහැරහැරීම් තුළින් ඇතිවන වඩා ඉහළ බොල් ණය ඇතුළත්ය. විකල්ප වැඩ ව්‍යවහාර සහ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ක්‍රියාත්මක කිරීම තුළින් කොවිඩ් 19 ට ආයතන ප්‍රතිචාර දක්වන බැවින්, නම්‍යශීලී වැඩ ව්‍යවහාර, සෞඛ්‍ය සහ ආරක්ෂාව, සහ සේවක යහපැවැත්ම වැඩිවන වැදගත්කමක් බවට පත්ව ඇත.

GRI 102-11

## අවදානම් සහ අවස්ථා

මූල්‍ය සේවා සපයන්නෙක් ලෙස, අපි සාර්ව ආර්ථික පරිසරය හා ඉහළින් සම්බන්ධවන අතර ඒ මත රඳා පවතී. අපි අඛණ්ඩව වෙනස්වන පරිසරයක ක්‍රියාත්මක වන අතර එහි දනට පවත්නා සහ මතුවන අවදානම් සහ අවස්ථාවන් පිළිබඳ සංකීර්ණ සහ අන්‍යෝන්‍ය ලෙස සම්බන්ධවන අවස්ථාවන් අපගේ ව්‍යාපාරයේ කටයුතුවලට බලපාන අතර අපගේ තිරසාරත්වය හැඩගස්වයි.

බැංකුවේ අවදානම් සහ අවස්ථා ඇතිකරන ප්‍රධාන ධාවකයින්, අපගේ වටිනාකම් නිර්මාණය කෙරෙහි ඒවායේ බලපෑම, ඒවාට අපගේ ප්‍රතිචාර සහ ඉදිරියේදී බාධා කිරීමට හෝ වටිනාකම් එකතු කිරීමට ඒවායේ හැකියාව පිළිබඳ විස්තරාත්මක සටහනක් පහතින් දක්වේ.

### දේශප ාලන සහ ආර්ථික රටාවන්හි වෙනස්වීම්

#### වැදගත් මූලිකාංග ෂහ පැතිකඩ

**ගෝලීය සන්දර්භය**

- ගෝලීය ආර්ථිකය සම්බන්ධ ගැටළු සහ එහි නැගීඑන වෙළෙඳපොල කෙරෙහි බලපෑම
- ගෝලීයකරණය සහ භූ දේශපාලන අවිනිශ්චිතතා දුර්වලවීම
- ආසියාව වෙත විතැන්වන කලාපීය බලය ශක්තිමත්කිරීම සහිත ආර්ථික බණ්ඩණීකරණය
- වැඩිවන පිරිවැය, ප්‍රාග්ධනය සහ අරමුදල්වල හිඟය සහ ගෝලීය වෙළෙඳපොල හරහා අරමුදල් සහ ද්‍රවශීලතා ගැටළු

**දේශීය සන්දර්භය**

- අඩුකළ ආර්ථික වර්ධනය, වැඩි වූ අසමානතාවය සහ අඩු ආයෝජක සහ ගනුදෙනුකාර විශ්වාසය
- දේශීය පරිභෝජනය තුළ උච්චාවචනය
- පාරිභෝගික සංස්කෘතිය තුළ වැඩිවීම
- මූල්‍ය අන්තර්කරණය, ඩිජිටල්කරණය පිළිබඳ රජයේ වැඩපිළිවෙල සහ රජයේ අවධානිත ක්ෂේත්‍රවල වෙනස්වීම්
- වැඩිවන ණය බර සමග රජයේ මූල්‍ය තුළ පරිහානිය
- පිරිවැය වැඩිවීම සහ ප්‍රාග්ධන, අරමුදල් සහ ද්‍රවශීලතාවයේ හිඟය
- සාර්ව ආර්ථික අස්ථාවරත්වය නිසා රන්පවුම් පහළ වැටීම
- ආර්ථික උත්තේජක සමඟ වඩා අඩු පොළී අනුපාත පාලනය (මූල්‍ය සහ පිස්කල්)
- මැතිවරණ සහ ප්‍රතිපත්ති අවිනිශ්චිතතාවලින් ඇතිවන දේශපාලන අවදානම
- පාස්කු ඉරිදා ප්‍රහාරවල විපාක

#### අපගේ වටිනාකම කෙරෙහි බලපෑම

සාර්ව ආර්ථික වාතාවරණය අපගේ ව්‍යාපාරයේ පැවැත්ම සහ අපගේ වෙළෙඳපොල බැදීම් අත්කරගැනීම සඳහා අපගේ හැකියාවට බලපාන අතර, දේශපාලන පරිසරය මෙහෙයුම් පරිසරයට බලපායි. වැඩිවන අභාශය, නාගරිකරණය. පරිභෝජනය සහ යටිතල පහසුකම් ආයෝජන සහ පොදුවේ හිතකර ජනවිකාශ, බැංකු සඳහා අවස්ථාවන් ඇති කරයි.

## අවදානම් සහ අවස්ථා

| අවස්ථා | බලපෑම | | අවදානම් | බලපෑම | |
|---|---|---|---|---|---|
| | කෙටිකාලින සිට මධ්‍ය කාලින | දිගු කාලින | | කෙටිකාලින සිට මධ්‍ය කාලින | දිගු කාලීන |
| වඩා අඩු පොළී අනුපාත ක්‍රමය පිරිවැය පීඩනය පහසු කරයි | △ | ⊖ | පාරිභෝගික බැංකුකරණ ආන්තිකවල පහළ වැටීම් | ▲ | ▽ |
| සමාජීය සහ ආර්ථික සංවර්ධනයන් ආමන්ත්‍රණය කිරීම කෙරෙහි අවධානය යොමු වූ නව්‍යකරණ මූල්‍ය විසඳුම් | △ | △ | ණයකරුවන්ගේ වඩා අඩු නැවත ගෙවීම් හැකියාව නිසා අක්‍රිය ණයවල තියුණු වැඩිවීමක් පිළිබඳ අවදානමට බැංකුවේ ශේෂ පත්‍රය නිරාවරණය වේ. | ▲ | ▲ |
| බැංකුවේ විවිධ ජාල තුළින් පුළුල් වූ කලාපීය ආවරණය | △ | △ | වැඩි වූ මූල්‍ය බර සහ ඉතුරුම් සහ ණයදීම කෙරෙහි බලපෑම | ▲ | ▲ |
| | | | සැලකියයුතු වෙළෙඳපොල උච්ඡාවචන | ▲ | ⊖ |
| | | | අහිතකර ව්‍යාපාර වාතාවරණය නිසා අඩු ණය වර්ධනය | ▲ | ⊖ |
| | | | ඉතුරුම් නිෂ්පාදනවල ආකර්ෂණය පහත වැටීම | ▲ | ▲ |
| | | | තැන්පතු සහ ණයදීමේ අනුපාත මත සීමා නිසා පාරිභෝගික බැංකුකරණ ආන්තිකවල පහත වැටීම | ▲ | ⊖ |
| | | | ස්වෛරීත්ව ශ්‍රේණිගතකිරීම පහත වැටීම බැංකුවේ ශ්‍රේණිගතකරණයට සහ විදේශ ව්‍යවහාර මුදල් ණයට ගැනීම් කෙරෙහි බලපායි | △ | ⊖ |

△ 2018 වසරේ සිට අවස්ථාව වැඩිවිය

▼ 2018 වසරේ සිට අවස්ථාව අඩුවිය

▲ 2018 වසරේ සිට අවදානම වැඩිවිය

▽ 2018 වසරේ සිට අවදානම අඩුවිය

⊖ 2018 වසරේ සිට අවදානම/අවස්ථාව පුළුල් වශයෙන් සමානව පැවතුණි.

## අපගේ ප්‍රවේශය සහ කාර්යසාධනය

- අඩුකළ ප්‍රතිපත්ති අනුපාත පිරිවැය පීඩනය අඩුකරන විට, තැන්පතු අනුපාත සහ ණයදීමේ අනුපාත මත සිමා පැනවීම බැංකු අතර පොළී ආන්තිකවල විචලනය අඩුකරන ලදි. 100%ක් රජය සහතික කරන රජයේ බැංකුවක් ලෙස ජාතික ඉතිරි කිරීමේ බැංකුව විවිධාංගීකරණය මගින් තැන්පතු සේවයේ යොදවමින් අපගේ පොළී ආන්තිකය වර්ධනය කරගැනීමට සමත් වි ඇත.
- ශක්තිමත් ශේෂ පත්‍රයක් සමඟ විවිධ ව්‍යාපාර මාර්ග අඛණ්ඩව අවදානම අවමකිරීමට සහ අවස්ථාවන් ග්‍රහනය සඳහා අපව ශක්තිමත් කරයි.
- අපගේ ස්ථාවර අරමුදල් පදනම සහ ෂේශ පත්‍රයේ තත්ත්වය තුළ වාසි ලබා ගැනීම.
- අපගේ ඉතුරුම් සහ එහි ප්‍රතිලාභ පිළිබඳ දැනුවත්කම ඇති කිරීම අපි අඛණ්ඩව සිදුකරන අතර අපගේ දීර්ඝ කාලින ඉතුරුම් ගිණුම්වල ඉතුරු කිරීමට ගනුදෙනුකරුවන් දිරිමත් කිරීම.
- ආර්ථික අවදානම් ඵලදායි ආකාරයෙන් කළමනාකරණය කරන බව සහතික කිරිමට ණයදීමේ දර්ශක අපි නියාමනය කිරීම.
- ණය කළඹ තුළ අවදානම සහ සක්‍රියව කළමනාකරණය කර සුදුසු පරිදි පොළී අනුපාත අවදානම සහ විදේශ විනිමය අවදානම වැටයීම
- ගෝලිය, කලාපීය සහ ප්‍රාදේශිය සංවර්ධනයන් හි පවත්නා ඇගයීම මත පදනම් වි අවදානම් ක්‍රමෝපාය සහ රුචිය නියාමනය කර පාලනය කිරීම. අවස්ථාවන් හඹායමින් ඇතිවන අවදානම හඳුනාගෙන අවම කිරිමට මෙය සහය වේ.
- වත්කම් වර්ගය සහ කාලසීමාව අනුව වත්කම් සහ වගකීම් ගලපමින් ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරිම.
- අනාගත ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් පහතවැටීම්හි බලපෑම තක්සේරු කිරීමට එම ක්‍රියාදාමය විශ්ලේෂණය.

## ප්‍රමාණාත්මක කරුණු



## අනාගත දැක්ම

2020 දී ගෝලීය ආර්ථිකය 2007/08 තුළ ගෝලීය මූල්‍ය අර්බුදය වලක්වමින් මහ පරිහානියේ සිට එහි දරුණුම පසුබැසීමට මුහුණපාන බවට පුරෝකථනය කෙරේ. කොවිඩ් 19 වසංගතය තුළින් ඇතිවන ඉහළ අගුළු දැමීමේ කාලසීමාව මගින් 2020 දී ගෝලීය ආර්ථික වර්ධනය සංකෝචනය කරනු ඇති බවට සහ 2021 දී අර්ධ වශයෙන් ප්‍රතිසාධනය කිරීමට අපේක්ෂා කෙරේ.

වර්ධිත ව්‍යාපාර විශ්වාසය සමඟ 2020 වසරේදී ආරම්භකළ ශ්‍රී ලංකාවේ ආර්ථිකය, කොවිඩ් 19 වසංගතයේ පැතිරීම ව්‍යාපාර සහ පුද්ගලයින්ට සමානව අහිතකර ලෙස බලපාන තුරු, පළමු මාස දෙක තුළ කටයුතුවල නැගිටීමක් වාර්තා කර ඇති බවට අපේක්ෂා කෙරේ. 2019 අවසන් සහ 2020 මුල් කොටසේ රජය විසින් හඳුන්වා දුන් සෘජු හා වක්‍ර බදු සහන ක්‍රියාමාර්ග මගින් පුද්ගලයින්ගේ මිලදී ගැනීමේ ශක්තිය වැඩිකිරීමට සහ දේශීය ආයෝජනය දිරිමත් කිරීමට අපේක්ෂා කෙරේ. උද්ධමනය මධ්‍යම කාලය පුරා 4 - 6 පරාශය තුළ පවත්වා ගැනීමට අපේක්ෂිතය.

පුද්ගලික අංශය සඳහා ණයවල වර්ධනය වසංගතය හේතුවෙන් ආර්ථික කටයුතුවල සැලකියයුතු බිඳවැටීම හේතු කොට ගෙන අඩු මට්ටමක පවතිනු ඇති බවට අපේක්ෂා කෙරේ. කෙසේවෙතත්, කොවිඩ් 19 පැතිරීමෙන් මෙරට ප්‍රතිසාධනය වීම මගින් පුද්ගලික අංශය සඳහා ණයවල වර්ධනය වේගවත් කිරීමට යෝජිතය. අඩු වෙළෙඳපොළ ණය අනුපාත, පිස්කල් සහ මූල්‍ය උත්තේජක, ව්‍යාපාර සඳහා පිරිනමනලද ණය විලම්භන කාලය සහ විශේෂයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා විශේෂ ණය සහන යෝජනා ක්‍රම මගින් ශක්තිමත් කරන ආර්ථික කටයුතුවල අපේක්ෂිත පුළුල්වීම මෙයට සහය වනු ඇත. කොවිඩ් 19 වසංගතය පැතිරීම හමුවේ අහිතකර සංවර්ධනයන් හේතු කොට ගෙන ආසන්න කාලීන අභියෝග තුළ ආසන්න කාලින අභියෝග තිබියදි පවා මධ්‍ය කාලය තුළ මූල්‍ය අංශය ස්ථාවරව පවතිනු ඇති බවට අපේක්ෂා කෙරේ.

## බාධාකාරී තාක්ෂණය සහිත ඩිජිටල් යුගයත ක්‍රියාත්මකවීම

### වැදගත් මූලිකාංග සහ පැතිකඩ

- ඕනෑම උපාංගයකින් ඕනෑම ස්ථානයක, ඕනෑම වේලාවක පහසු, කාර්යක්ෂම සහ කඩිනම් බැංකු කටයුතු අපේක්ෂිත ගනුදෙනුකරුවන් සමඟ ඩිජිටල්කරණය ගනුදෙනුකාර හැසිරීම වෙනස් කර ඇත.
- පුද්ගලගත සේවා, පරිශීලක පහසු ක්‍රම සහ සංකීර්ණ මූල්‍ය ගැටළු පිළිබඳ යහපත් අවවාද සහ සහය සඳහා වැඩිකළ ගනුදෙනුකාර අවශ්‍යතාව.
- සම්ප්‍රදායික බැංකු ආදර්ශයන්ට අභියෝග කරන මොබයිල් තාක්ෂණය, පින්ටෙක් හවුල්කාරත්වයන්. බ්ලොක් චේන් තාක්ෂණය, කෘතිම බුද්ධිය, රොබෝවරු වැනි නව තාක්ෂණයන් ස්ථිරව ක්‍රියාත්මක කිරීම
- අන්තර්ජාලය තුළ වැඩි වූ අවබෝධය සහ ඉ-වාණිජ කර්මාන්තයේ වර්ධනය
- මූල්‍ය නිෂ්පාදන සහ සේවා විශාල පරාශයක් පිරිනමමින් නව්‍යකරණ තාක්ෂණය සහ ව්‍යාපාර ආදර්ශ සමඟ සම්ප්‍රදායික නොවන  වෙළෙඳපොල තරඟකරුවන් පිවිසීම. මෙයට පින්ටෙක් සමාගම, ගෙවීම් පහසුකම් සපයන්නන්, ගූගල්, ඇමේසන්, මුහුණුපොත සහ ඇපල් යනාදිය ඇතුළත්ය.
- වංචා සේවීමේ සහ සයිබර් ප්‍රහාර, බිඳීම් සහ බාධාකිරීම් වැළැක්වීම සඳහා අවශ්‍යතාව.
- පුද්ගලික දත්ත, සයිබර් ආරක්ෂාව, වංචාව පිළිබඳ අවදානම සහ මූල්‍ය අපරාධවල ආරක්ෂාව පිළිබඳ ගැටළු.

### අපගේ වටිනාකම කෙරෙහි බලපෑම්

සීමිත ගනුදෙනුකාර සේවා ස්ථාන, සේවා සහ ගෙවීම් විකල්ප සඳහා සීමිත පිවිසීම වැනි බැංකු කටයුතු සඳහා සම්ප්‍රදායික බාධාවන් ජයගැනීම සඳහා ඩිජිටල් තාක්ෂණයට හැකියාව ඇත. අපගේ ගනුදෙනුකරුවන්ට සහ මෙහෙයුම් අවදානම් මට්ටම් වැඩිකරමින් තාක්ෂණයේ ඉහළම වැඩිදියුණු කිරීම ක්ෂේත්‍රය තුළ අපගේ තරඟකාරිත්වයට අදාළව රඳා පැවතිම සඳහාවන අපගේ හැකියාව කෙරෙහි බලපාන වේගවත් තරඟය වැඩි කරයි.

## අවදානම් සහ අවස්ථාවන්

| අවස්ථා | බලපෑම කෙටිකාලීන සිට මධ්‍ය කාලීන | බලපෑම දිගු කාලීන | අවදානම් | බලපෑම කෙටිකාලීන සිට මධ්‍ය කාලීන | බලපෑම දිගු කාලීන |
|---|---|---|---|---|---|
| ගනුදෙනුකාර සම්බන්ධතාවන්ට සහයවීමට නව තාක්ෂණය යොදා ගැනීම සහ වඩා පහසු වඩාත් පුද්ගලගත සහ වඩාත් කාර්යක්ෂම සේවා සංවර්ධනය කිරීම. | △ | △ | මූල්‍ය සේවා ක්ෂේත්‍රය වඩාත් තරඟකාරී කරමින් තාක්ෂණය පිවිසීමේ බාධා ඉවත් කරයි. | ▲ | ▲ |
| ගනුදෙනුකරුවන්ට පිරිනමන විවිධ ප්‍රවිනත්ව සහ සේවා පරාශය. | △ | △ | අධික තරඟය සහ වැඩිවන පිරිවැය හේතුකොට ගෙන ලාභදායිතාව සහ වෙළෙඳපොළ කොටස අඩුවීම. | ▲ | ▲ |
| දිවයින පුරා පුළුල් පැවැත්ම සහිත සැබැවින්ම බහු නාලිකා බැංකුවක් ලෙස ස්ථානගතවීම. | △ | △ | අභ්‍යන්තර ක්‍රියාවලි, බෙදාහැරීම සහ සේවාවන්ට තාක්ෂණය අඩුවෙන් යොදා ගැනීම. | ▲ | ▲ |
| නව්‍යකරණය වේගවත් කිරීම සහ බැංකුවේ කඩිසරකම වැඩි කිරීම මගින් ගනුදෙනුකාර අත්දැකීම ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය. | △ | △ | ෆින්ටෙක් සමාගම් යොදාගැනීම ප්‍රමාදවීම හෝ මන්දගාමීවීම සහ හවුල්කාරත්වයන් ඇති කිරීමේ දුෂ්කරතා. | ⊖ | ▲ |
| මාර්ගගත මැදිහත්වීම වඩාත් පුද්ගලික, ක්ෂණික, පහසු සහ අදාළ කිරීමට පරිමාණ කළහැකි බැංකුකරණ අවස්ථාවක් ක්‍රියාත්මක කිරීම. | △ | △ | සයිබර් ප්‍රහාරයක් ඇති වූ විට, බැංකු මෙහෙයුම්වලට තාවකාලිකව සැලකියයුතු බාධාවන් ඇත. | ▲ | ▲ |
| මූල්‍ය උපදේශ ඩිජිටල් ලෙස ලබාදීම සහ ගනුදෙනුකරුගේ තීරණ ගැනීමේ වර්ධනයට සහයවීම. | △ | △ | නව්‍යකරණය සහ තොරතුරු තාක්ෂණය තුළ ඉහළ ආයෝජන සඳහා අවශ්‍යතාව සහ සයිබර් ප්‍රහාර අවදානම වැඩිවන අතරම සේවක හැකියාවන් වැඩිකිරීම. | ▲ | ▲ |
| සයිබර් ආරක්ෂාව වැඩිකරන සහ ගනුදෙනුකාර දත්තවල රහස්‍යතාව සහතික කරන ශක්තිමත් තොරතුරු පද්ධති. | △ | △ | වැඩසටහන්කරණය, දත්ත විශ්ලේෂණය සහ අවදානම් කළමනාකරණය වැනි විශේෂිත සහ දුර්ලභ කුසලතා සඳහා වැඩිවන ඉල්ලුම. | ▲ | ▲ |
| ෆින්ටෙක් ආයතන සහ ස්ටාර්ට් අප් සමඟ හවුල්කාරත්වයන්. | △ | △ | ගනුදෙනුකාර දත්ත අහිමිවීම, රහස්‍යතාව කඩකිරීම, වංචාව සහ මූල්‍ය අවදානම් අවස්ථාවක කීර්තිනාම අවදානමට නිරාවරණය. | ▲ | ▲ |
| දත්ත පදනම් සංස්කෘතියක් ඇතිකිරීම. | △ | △ | ආයතනික වෙනස්වීම් යොදාගත හැකි සේවකයින්. | ▲ | ▲ |
| ගාස්තු පදනම් ආදායම ඇති කිරීම. | △ | △ | සුදුසු අංශ සඳහා ගැලපෙන නිෂ්පාදන සංවර්ධනය කිරීම බැංකු සඳහා මෙහෙයුම් සහ ණය පිරිවැය වැඩිකරනු ඇති අතර කොටස්හිමි වටිනාකම පහත හෙලනු ඇත. | ⊖ | ⊖ |
| සරල ගනුදෙනු ස්වයංක්‍රීයකරණය තුළින් මෙහෙයුම් කාර්යක්ෂමතාව වර්ධනය සහ දීර්ඝ කාලීනව පිරිවැය අඩුකරන සංකීර්ණ සහ අගය එකතුකළ ගනුදෙනු කෙරෙහි අවධානය වැඩි කිරීම. | △ | △ | | | |
| යටිතල පහසුකම් සහ තාක්ෂණය ඉහළ දැමීම මගින් අදාළව පැවතීමට සහ නව ප්‍රවේශකයින්ගේ තරඟයට මුහුණදීමට අපව ශක්තිමත් කරයි. | △ | △ | | | |

△ 2018 වසරේ සිට අවස්ථාව වැඩිවිය
▽ 2018 වසරේ සිට අවස්ථාව අඩුවිය
▲ 2018 වසරේ සිට අවදානම වැඩිවිය
▼ 2018 වසරේ සිට අවදානම අඩුවිය
⊖ 2018 වසරේ සිට අවදානම/අවස්ථාව පුළුල් වශයෙන් සමානව පැවතුණි.

## අපගේ ප්‍රවේශය සහ කාර්යසාධනය

- යහපත් ඩිජිටල් අත්දැකීමක් පිරිනමන අපගේ බහුනාලිකා බෙදාහැරීම් ජාලය තුළින් කාලීන ආකාරයකින් අනාගත ගනුදෙනුකරුවන් කරා ළඟාවීමට අපව සූදානම් කෙරේ.
- වෙළෙඳපොළ විනිවිදයාම වැඩිකිරීමට සහ එය ග්‍රහනය සඳහා අපි ඩිජිටල් අලෙවිකරණය සහ දත්ත විශ්ලේෂණ භාවිතා කරමු. 2019 දී ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර ගනුදෙනු සංඛ්‍යාව වැඩි වී ඇති අතර අන්තර්ජාල බැංකුකරණ පරිශීලකයින් වැඩිවීමකට මෙය හේතු වී ඇත.
- ගනුදෙනුකාර අවශ්‍යතා ඵලදායී ආකාරයෙන් සපුරාලීමට එක් එක් වසරේ අපගේ නිෂ්පාදන කළඹට අගය එකතුකිරීම් බලපාන ලදී.
- ඉතුරුම් තුළින් අරමුදල් ස්ථාවරත්වය, ආරක්ෂාව සහ වර්ධනය පිළිබඳ දැනුවත්කම ඇති කිරීමට බහු නාලිකා තුළින් අපි ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධ වෙමු.
- තාක්ෂණික අවස්ථාවන්, ක්‍රියාවලි සහ පාලනයන් වැඩි කිරීම, ෆින්ටෙක් සමඟ සහයෝගිත්වය සහ දැඩි නියාමනය ක්‍රියාත්මක කිරීම තුළ අඛණ්ඩ ආයෝජනය
- සයිබර් අවදානම වැළැක්වීම සහ ආයතනික වෙනස්වීමට ගැලපීම පිළිබඳ අඛණ්ඩ සේවක අධ්‍යාපනය
- සයිබර් අවදානම් වලක්වා පාලනය කිරීම සඳහා සම්ප නියාමනය ඇතුළුව සුදුසු පරීක්ෂාකිරීම් සහ තුලනයන් ස්ථාපිත කිරීම
- සයිබර් ස්ථාවරත්වය ශක්තිමත් කිරීම තුළ ආයෝජනය සහ බැංකුවේ සයිබර් ආරක්ෂක ප්‍රතිපත්තියට අනුකූලවීම
- ගනුදෙනුකාර විශ්වාසය ශක්තිමත් කිරීමට සහ අපගේ බැංකුව වෙනස් කිරීමට සයිබර් ආරක්ෂක ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම

## ප්‍රමාණාත්මක කරුණු



## අනාගත දැක්ම

ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) ශ්‍රී ලංකාව තුළ ඩිජිටල් ගනුදෙනු පිළිබඳ වසර ලෙස 2020 වසර ප්‍රකාශයට පත්කර ඇත. මෙම ප්‍රවේශයේ ප්‍රධාන අරමුණ වන්නේ ඩිජිටල් ගෙවීම් යෝජනා ක්‍රම ජනප්‍රිය කිරීමත් මුදල් භාවිතය අඩු සමාජයක් ප්‍රවර්ධනය කිරීමත්ය. ඩිජිටල් ගෙවීම් යෙදුම් භාවිතය ප්‍රවර්ධනය කිරීම මගින් නව්‍යකරණ කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇතිකිරීමට, තරඟකාරිත්වය මතුවීමට සහයවීම අපේක්ෂා කරන අතර ඒ තුළින් වඩා ඉහළ මට්ටමේ ඩිජිටල් ගෙවීම් කටයුතු මෙන්ම ආර්ථික කටයුතු සඳහා මෙහෙයවීම මූල්‍ය සේවාවන්හී වර්ධනය දිරිගන්වනු ඇත. LankaQR Code සහ the Fintech Regulatory Sandbox සහ the Blockchain based Shared Know-Your Customer (KYC) දත්තඑදබල සහ Open Banking project වැනි ව්‍යාපාති කිහිපයක් ශ්‍රී ලංකා මහ බැංකුව දියත් කර ඇත.

## පරිවර්තනීය සමාජය සහ පරිසරය

### වැදගත් මූලිකාංග සහ පැතිකඩ

- අතිශය පාරිසරික ආපදාවන් තුළ ඇතිවන අහිතකර කාලගුණ කොන්දේසි
- කාලගුණ වෙනස මැඩපැවැත්වීමට සහ ජෛව-විවිධත්වය ආරක්ෂා කිරීමට ගෝලීය බැඳීම.
- පුළුල් පරාශයක සමාජීය. පාරිසරික සහ පාලනය ආශ්‍රිත කරුණු කෙරෙහි අවධානය යොමුකළ නව නියාමන සහ වාර්තාකරණ අවශ්‍යතා.
- ආයෝජන තීරණවල ආයතනික තිරසාරාත්මක ගැටළු පිළිබඳ වැඩිකළ පාර්ශ්වකාර අවධානය.
- ක්‍රියාකාරීබව වැඩි කිරීම සහ  සමාජ විෂමතා පුළුල්කිරීම.
- කාලගුණ වෙනසේ ගම්‍යාර්ථ නිවැරදිව පුරෝකථනය කිරීමට දත්ත ලබාගැනීමේ සංකීර්ණතාව
- පාලන ප්‍රමිතිවල දක්වා ඇති පරිදි ගනුදෙනුකරුවන් සමඟ අවංකව, විනිවිදව සහ සාධාරණව ගනුදෙනු කිරීමට බැංකු සඳහා අවශ්‍යතාව
- ගනුදෙනුකාර විශ්වාසය අපගේ ව්‍යාපාරය පවත්වාගැනීමට අවශ්‍යය.
- කාලගුණ වෙනස ගෝලීය ආර්ථිකයට බරපතල තර්ජන ඇති කරයි.
- වගකීම් සහගත අරමුදල්කරුවන් වීම සඳහා බැංකුවලට වර්ධනය වන ඉල්ලුම
- ආයතනික නිරාවරණ තුළ වැඩිකළ විනිවිදභාවය සඳහා අවශ්‍යතාවග

### අපගේ වටිනාකම කෙරෙහි බලපෑම

සමාජීය, පාලන සහ පාරිසරික අදහස් සඳහා වර්ධනය වන ගැටළු බැංකු, ගනුදෙනුකරුවන් සහ මෙහෙයුම් පරිසරයට බලපායි. කාලගුණ වෙනස ප්‍රජාවන්ගේ තිරසාරත්වයට බරපතල අභියෝග ඇති කරන අතර එය සැලකියයුතු ණය අවදානම් ගම්‍යාර්ථයන්ට හේතු වේ. බැංකු විසින් තමන්ගේ නිෂ්පාදන පිරිනැමීමේදී, ආයෝජන තීරණවලදී සහ දුර්ලභ සම්පත් භාවිතයේදී සමාජීය සහ පාරිසරිකව වගකීම්සහගත වීම අවශ්‍ය වේ. තිරසාර ව්‍යාපාර ව්‍යවහාර යොදාගැනීම සහ රජය විසින් නියම කළ රෙගුලාසි පිළිපැදීම මගින් එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණුවලට අනුකූලවීමට බැංකුවලට ඉහළ අවශ්‍යතාවක් ඇත. අනුකූලවීමට අසමත්වීම බැංකුව කෙරෙහි පාර්ශ්වකාර විශ්වාසය පළුදුවීමට සහ කීර්තිනාම අවදානමට නිරාවරණය සඳහා හේතු වේ.

කාලගුණ වෙනස, සම්පත් හිඟය, පරිසර පද්ධති සංරක්ෂණය, විෂමතාවය, මානව හිමිකම් ඇතුළුව සමාජීය සහ පාරිසරික ගැටළු සඳහා විසඳුම් සේවීම ව්‍යාපාර අවශ්‍යතාවක් බවට පත්ව ඇත. එමනිසා, අපගේ වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතියට සමාජීය සහ පාරිසරික අදහස් අපි ඇතුළත් කරන අතර, අපගේ පාර්ශ්වකරුවන්ට තිරසාර වටිනාකම ඇති කිරීමට අපි නව්‍යකරණ විසඳුම් සොයා අර්ථවත් හවුල්කාරත්වයන් ඇතිකරමු. අඩු කාබන් ආර්ථිකයක් කරා පරිවර්තනය තුළ අපි අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටුකරමු.

### අවදානම් සහ අවස්ථා

| අවස්ථා | බලපෑම | | අවදානම් | බලපෑම | |
|---|---|---|---|---|---|
| | කෙටිකාලින සිට මධ්‍ය කාලින | දිගු කාලින | | කෙටිකාලින සිට මධ්‍ය කාලින | දිගු කාලීන |
| තිරසාර මූල්‍ය සඳහා වැඩිකළ ඉල්ලුම. අඩු කාබන් ආර්ථිකයක් කරා මූල්‍යකරණය තුළ විතැන්වීම සහ සමාජීය අභියෝග. | ▲ | ▲ | තමන්ගේ ව්‍යාපාර තීරණ තුළ පාරිසරික සහ සමාජීය අවදානම් සලකා බැලීම බැංකුවලට අවශ්‍යයග | ▲ | ▲ |
| වැඩිකළ විනිවිදභාවය බැංකුව කෙරෙහි විශ්වාසය හා කීර්තිනාමය වර්ධනය කරයිග | ▲ | ▲ | දූෂණය සහ විනිවිද නොවීම කීර්තිනාම අවදානමට හේතු වේ. | ▲ | ▲ |

| අවස්ථා | බලපෑම |  | අවදානම් | බලපෑම |  |
|---|---|---|---|---|---|
|  | කෙටිකාලීන සිට මධ්‍ය කාලීන | දිගු කාලීන |  | කෙටිකාලීන සිට මධ්‍ය කාලීන | දිගු කාලීන |
| නව ව්‍යාපාර ආදර්ශ යොදා ගැනීමට මූල්‍ය නව්‍යකරණය. | ▲ | ▲ | බැංකුවේ වත්කම් සහ ව්‍යාපාරය තුළින් සෘජුවම සහ ගනුදෙනුකාර කටයුතු තුළින් වක්‍රව කාලගුණ වෙනසේ ප්‍රතිවිපාක හේතු කොට ගෙන ඉහළ පිරිවැය සහ ආර්ථික අලාභ දැරීම. | ▲ | ▲ |
| අඩු කාබන් ආර්ථිකයක් යොදා ගැනීමට ආයතනික ගනුදෙනුකරුවන්, ව්‍යාපාර සහ වෘත්තිකයින්ට සහයවන ආයෝජන සහ මූල්‍ය විසඳුම් සංවර්ධනය. | ▲ | ▲ | නිෂ්පාදන හා සේවා පාරිසරිකව යහපත් නොවේනම් වෙළෙඳපොළ කොටස අහිමි වේ. | – | ▲ |
| හරිත විසඳුම් යොදා ගැනීමට ගනුදෙනුකරුවන් ශක්තිමත් කරන නිෂ්පාදන සහ සේවා සංවර්ධනය. | ▲ | ▲ | ස්වභාවධර්මයේ අවිනිශ්චිතතාව සහ අඩු කාබන් ආර්ථිකයකට මාරුවීම. | – | ▲ |
| මූලාශ්‍ර තුළ හරිත ව්‍යවහාර යොදා ගැනීමෙන් සැපයුම් දාමය තුළ ස්ථාවරත්වය ගොඩ නැගීම කෙරෙහි අවධානය. | ▲ | ▲ | ආර්ථිකය තුළ බලපෑම් සහගත ආයෝජන සඳහා අවශ්‍යතාව. | ▲ | ▲ |
| යහපාලනය සහ තිරණ ගැනීම ප්‍රවර්ධනය කිරීමට විනිවිදභාවය ඇති කිරීම. | ▲ | ▲ | කාලගුණ වෙනසේ බලපෑම් ණයගැනීම්වල මුදල් ප්‍රවාහයන්ට විශේෂයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහ ආශ්‍රිත ව්‍යාපාරවලට බලපායි. | ▲ | ▲ |
|  |  |  | ආර්ථික හා දේශපාලන අස්ථාවර භාවය පරිසරය හා බද්ධවූ සමහර ව්‍යාපාරයන්හි රැකියා අහිමි කරමින් කර්මාන්ත වඩාත් අවදානමට ලක්කරයි. | ▲ | ▲ |
|  |  |  | ස්වභාවික විපත් බැංකුවේ ණය නිරාවරණය වැඩිකරමින් බැංකුවේ ගනුදෙනුකරුවන්ට බලපෑ හැකිය. | ▲ | ▲ |
| වැඩිකළ විනිවිදභාවය බැංකුව කෙරෙහි විශ්වාසය හා කීර්තිනාමය වර්ධනය කරයි. | ▲ | ▲ | අඩු කාබන් ආර්ථිකයකට මාරුවීම විස්තීර්ණ ප්‍රතිපත්ති, නෛතික, තාක්ෂණික සහ වෙළෙඳපොළ අභියෝග අවශ්‍යයෙන්ම ඇති කරන අතර ඉන් ණය, මෙහෙයුම් සහ කීර්තිනාම අවදානම උපදවයි. | ▲ | ▲ |
|  |  |  | වගකීම් සහගත මූල්‍යකරණය මත පොදු ඉල්ලුම හා අනුකූලවීමට අසමත්වීම ණය සහ කීර්තිනාම අවදානමට හේතු වේ. | – | ▲ |

▲ 2018 වසරේ සිට අවස්ථාව වැඩිවිය

▼ 2018 වසරේ සිට අවස්ථාව අඩුවිය

▲ 2018 වසරේ සිට අවදානම වැඩිවිය

▼ 2018 වසරේ සිට අවදානම අඩුවිය

– 2018 වසරේ සිට අවදානම/අවස්ථාව පුළුල් වශයෙන් සමානව පැවතුණි.

## අපගේ ප්‍රවේශය සහ කාර්යසාධනය

- සමාජය තුළ සක්‍රිය කාර්යභාරයන් ඉටුකිරීම සඳහා අපගේ බැඳිමේ කොටසක් ලෙස ප්‍රජාව සමඟ සහභාගිත්වය සහ ප්‍රජාවැඩසටහන්වලට සහයවීම.
- සමාජීය අභියෝගවලට නව සහ නව්‍යකරණ විසඳුම් සඳහා දායකවීමට ක්ෂේත්‍රයේ උපදේශක කණ්ඩායම් සමඟ සහභාගිත්වය.
- වෙනස්වන පාරිසරික සාධක සහ අපගේ අවදානම් පැතිකඩ කෙරෙහි එහි බලපෑමට අනුව අපගේ නිෂ්පාදන සහ ගනුදෙනුකාර වටිනාකම් කොටසේ යෝග්‍යතාව සහ ක්‍රමෝපායික ගැලපීම අඛණ්ඩව ඇගයීම.
- අල්ලස් සහ දූෂණය සඳහා ශුන්‍ය ඉවසුම් ප්‍රතිපත්තියක් යොදා ගැනීම.
- මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදී මූල්‍යකරණය, අනුමැතිය, අනුකූලතාව, බැඳියා පිළිගැටුම සහ දූෂණය ඇතුළුව මූල්‍ය නොවන අවදානම් පිළිබඳ අපගේ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම.
- බැංකුවේ තිරසාරාත්මක ප්‍රතිපත්තිය අපගේ තිරසාර ක්‍රමෝපාය තහවුරු කරන අතර එය අපගේ දීර්ඝ කාලීන ක්‍රමෝපායික පරමාර්ථ හා සම්බන්ධ කෙරේ.
- කණ්ඩායම් අතර තිරසාරාත්මක වැඩසටහන් තුළින් පාර්ශ්වකරුවන් සමඟ සහභාගිත්වය සහ බලපෑම් සහ අවස්ථා ඇගයීම.
- අපගේ ණයකරුවන්ගේ සහ ඔවුන්ගේ ආයෝජන තීරණවල දැඩි නිවාරණ ක්‍රියාවලිය යොදාගනිමින් අපගේ ණයදීමේ ව්‍යවහාරයන් තුළ පාරිසරික, සමාජීය සහ පාලන (ESG) අවදානම් ශක්තිමත් කිරීම.

## ප්‍රමාණාත්මක කරුණු



## අනාගත දැක්ම

මූල්‍ය ක්‍රමයේ තිරසාරභාවය කාර්යක්ෂමව සහ සාර්ථකව ආරක්ෂා කිරීමට ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන රාමුව තුළට කාලගුණ වෙනස සහ කාලගුණ ස්ථාවරත්වය ඇතුළත් කිරීමේ වැදගත්කම හඳුනාගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුව "තිරසාර මූල්‍යකරණය සඳහා මාර්ග සිතියම" දියත් කරන ලදී. ශ්‍රී ලංකාව තුළ කාලගුණ වෙනස ජයගැනීමට කාලගුණයට ඔරොත්තු දෙන ව්‍යාපෘති සඳහා අරමුදල්කරණය ප්‍රවර්ධනය කිරීමට මූල්‍ය ක්‍රමය මින් දිරිමත් කරයි. මෙම මාර්ග සිතියම තුළින් තමන් විසින් මුදල් සපයන ව්‍යාපාති හා බැඳුණු පාරිසරික, සමාජීය සහ පාලන (ESG) අවදානම් ඵලදායි ආකාරයෙන් කළමනාකරණය කර ගැනීමට මූල්‍ය නියාමකයින්ට සහ මූල්‍ය ආයතනවලට පුළුල් උපදේශයක් ලබා දේ. එමෙන්ම එය වඩා හරිත, කාලගුණයට හිතකර සහ සමාජය ඇතුළත්කළ ව්‍යාපාර සඳහා සහය ප්‍රවර්ධනය කරයි. මෙම මාර්ග සිතියමෙන් වඩාත් ස්ථාවර, තිරසාර හරිත ආර්ථිකයක් ගොඩනැගීමට සහවීම සඳහා මූල්‍ය අංශයේ දායකත්වය ඉහළ නැංවීමට උත්සාහ දරයි.

## ජනවිකාශ වෙනස්වීම්

### වැදගත් මූලිකාංග සහ පැතිකඩ

- වැඩිකළ ශ්‍රමබලකායේ සහභාගිත්වය සහ උසස් අධ්‍යාපනය සඳහා බඳවාගැනීම.
- ශ්‍රම බලකාය සමන්විත වැඩිවන සහශ්‍ර සහ පරම්පරා ගණන
- නාගරික ප්‍රදේශ තුළ සංකේන්ද්‍රිත වර්ධනීය නාගරීකරණය සහ වැඩිපුර රැකියා අවස්ථා.
- වයස්ගත ජනගහනය සහ වැඩි වූ ස්වායක්තතාව :තනිපුද්ගලභාවය කරා නැමියාව*
- රැකියා වර්ගීකරණ සහ විවිධ වෘත්තීය මාර්ග විවිධාංගීකරණයග
- වැඩි වූ ජංගමතාව.
- දක්ෂ පුද්ගලයින් සෙවීමේදී අවශ්‍ය නිපුණතා සහ අභියෝගවල හිඟය.
- ගනුදෙනුකරුවන් වැළඳගත් තාක්ෂණික සංවර්ධනයන්
- කාලය අඩුකරන සහ ඵලදායිතාව වැඩිකරන සුහුරු වැඩකිරීමේ ක්‍රම සඳහා ඉල්ලුම
- අඩු උත්සාහ අවශ්‍යකරන උසස් පද්ධති සඳහා ඉල්ලුම

### අපගේ වටිනාකම කෙරෙහි බලපෑම

සමාජයේ ජනවිකාශයට ඉතුරුම්, ආයෝජන සහ ණය කෙරෙහි බලපෑමක් ඇති අතර සේවා ලබාදීම කෙරෙහි දිගුකාලීන ගම්‍යාර්ථ නිර්මාණය කරයි. ජනවිකාශ ව්‍යුහය සහ හැසිරීම තුළ වෙනස්වීම් නිෂ්පාදන සහ සේවා, බෙදාහැරීමේ මාර්ග සහ ගනුදෙනුකරුවන්ට පිරිනමන අගය කොටසට බලපෑම් කරයි. අපි ප්‍රාදේශීය වශයෙන් දක්ෂයින් බඳවාගන්නා අතර එබැවින් ජනවිකාශ විද්‍යාව අපගේ වටිනාකම් නිර්මාණය සහ ව්‍යාපාර වර්ධනයට බලපෑම් කරයි. සමාජය තුළ ප්‍රවණතාවන් අප බැංකුවේ සමාජීය අදාළත්වය තීරණය කරන අතර දක්ෂයින් ආකර්ෂණය කර රඳවාගැනීමට අසමත්වීම අපගේ අනුප්‍රාප්ත සැලැස්ම සහ ව්‍යාප්ති සැලසුම්වලට බාධා කරයි.

### අවදානම් සහ අවස්ථා

| අවස්ථා | බලපෑම | | අවදානම් | බලපෑම | |
|---|---|---|---|---|---|
| | කෙටිකාලීන සිට මධ්‍ය කාලීන | දිගු කාලීන | | කෙටිකාලීන සිට මධ්‍ය කාලීන | දිගු කාලීන |
| මෙහෙයුම් පරිසරය තුළ වෙනස්වීම්වලට ප්‍රතිචාර දැක්වීමේදී කඩිසරවීමේ හැකියාවග | ▲ | ▲ | නව සහ නැගී එන හැකියාවන් සහිත ඉහළ දක්ෂතා ඇති සේවකයින් බඳවාගැනීම මිල අධික බවට පත්වෙමින් ඇති අතර දක්ෂයින්ගේ අධ්‍යාපනික සංක්‍රමණය වැඩිවීම හමුවේ රඳවාගැනීම දුෂ්කරවී ඇත. | ▲ | ▲ |
| දක්ෂයින් රඳවාගෙන සංවර්ධනය තුළ ආයෝජනය ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සන්නාමය ගොඩ නැගීමට සහ ජාතිය සංවර්ධනයට හැකියාව ලබා දේ. | ▲ | ▲ | අත්‍යවශ්‍ය දක්ෂතා සඳහා හිඟය සහ තරගය. | ▲ | ▲ |
| නිෂ්පාදන සහ සේවා සහ ක්‍රියාවලි තුළ නව්‍යකරණය සංවර්ධනයට අවස්ථාව | ▲ | ▲ | වෙනස්වන ගනුදෙනුකාර වරණ යොදා ගැනීම. | ▲ | ▲ |


| අවස්ථා | බලපෑම | | අවදානම් | බලපෑම | |
|---|---|---|---|---|---|
| | කෙටිකාලීන සිට මධ්‍ය කාලීන | දිගු කාලීන | | කෙටිකාලීන සිට මධ්‍ය කාලීන | දිගු කාලීන |
| අපගේ ශ්‍රම බලකාය නව්‍යකරණ. ඩිජිටල් දැනුමැති සහ දත්ත මත ඉදිරියට යන සේවා බලකායක් වෙත සංක්‍රමණය කිරීමට අවස්ථාව. | – | △ | වර්ධනය වන විෂමතාව, දේශපාලන අස්ථාවරත්වය සහ ඉහල යන ජීවන වියදම වැනි සාර්ව පාරිසරික අභියෝග සේවකයින් මත පීඩනය වැඩිකරන අතර අපගේ ව්‍යාපාර ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම සහ සේවකයින්ගේ සේවා-ජීවිත තුලනය කෙරෙහි බලපායි. | ▲ | – |
| ශ්‍රම බලකාය තුළ තරුණ ජනගහනයේ වැඩිවීම සහ වර්ධනීය ඒක පුද්ගල ආදායම ධනය සංවර්ධනය සහ ධනය නිර්මාණය සඳහා අවස්ථාවක් නිර්මාණය කරයි. | – | △ | සේවකයින් ඩිජිටල් යුගයේ කාර්යසාධනය පවත්වා ගැනීමට අවශ්‍ය දක්ෂතා සමඟ යාවත් නොවුවහොත් ඔවුන් යල්පැනීම පිළිබඳ අවදානමට මුහුණ දේ. | ▲ | ▲ |
| | | | දක්ෂයින් ආකර්ෂණය කර රඳවාගැනීමට අසමත්වීම අපගේ අනුප්‍රාප්ත සැලැස්ම සහ ව්‍යාප්ති සැලසුම්වලට බාධා කරයි. | ▲ | ▲ |

△ 2018 වසරේ සිට අවස්ථාව වැඩිවිය
▽ 2018 වසරේ සිට අවස්ථාව අඩුවිය
▲ 2018 වසරේ සිට අවදානම වැඩිවිය
▼ 2018 වසරේ සිට අවදානම අඩුවිය
– 2018 වසරේ සිට අවදානම/අවස්ථාව පුළුල් වශයෙන් සමානව පැවතුණි.

## අපගේ ප්‍රවේශය සහ කාර්යසාධනය

- විවිධ පාරිභෝගික අංශ සඳහා සේවය සැලසීම සහ අඛණ්ඩ වටිනාකම් එකතුකිරීම් සමඟ අපගේ පුළුල් බෙදාහැරීමේ නාලිකා සහ නිෂ්පාදන තුළින් ඔවුන්ගේ ජීවිතවල සෑම අවස්ථාවකදීම ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කිරීම
- ගනුදෙනුකාර දැනුම අඛණ්ඩව වැඩි කිරීම සහ තරුණ ජනතාවගෙන් සැලකියයුතු වෙළෙඳපොල කොටසක් ග්‍රහනයකර ගැනීමට නව්‍යකරණ නිෂ්පාදන සංවර්ධනය කිරීම. අඩු පොළී අනුපාතවලට පිරිනමන ප්‍රාර්ථනා සහ බුද්ධි ණය නිෂ්පාදන මෙයට ඇතුළත්ය.
- වර්ධනය වන තරුණ ජනතාව ධනය නිර්මාන නිෂ්පාදන, ධනය සැලසුම් කිරීමේ නිෂ්පාදන සහ විශ්‍රාම සැලසුම් සංවර්ධනය සඳහා ප්‍රමාණවත් අවස්ථාවක් ලබා දේ.
- සේවක යහපැවැත්ම ප්‍රවර්ධනය කරන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- අපගේ සේවකයින්ගේ දක්ෂතා නැවත ඇති කිරීම සහ ඒවා වැඩි කිරීම සහ අනාගතයට සුදුසු සේවා බලකායක් ඇති කිරීම සඳහා නිපුණතා සංවර්ධනය සහ නායකත්ව වැඩසටහන්වල අඛණ්ඩ ආයෝජනය.

## ප්‍රමාණාත්මක කරුණු



## අනාගත දැක්ම

ශ්‍රී ලංකාව වර්ධනීය වයස්ගත ජනගහනයක් සහිත ජනවිකාශ සංක්‍රමණයේ ඉහළ අවස්ථාවකට ලඟා වී ඇත. මේ තුළින් සේවය ලබාදීම (සෞඛ්‍ය සහ අධ්‍යාපනය), විශ්‍රාම වැටුප්, සේවා නියුක්තිය සහ රාජ්‍ය අරමුදල් සඳහා දිගුකාලීන ගම්‍යාර්ථයන් අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාවේ වැඩකරන වයසේ ජනගහනයේ කොටස 2005 දී උපරිමයට පැමිණ ක්‍රමානුකූලව පහත දැමීමට අපේක්ෂා කෙරේ. මින් මධ්‍ය කාලය තුළ වර්ධනය අඩුකිරීම අපේක්ෂිතය. වැඩකරන වයසේ ජනගහනයට තරුණ සහ වැඩිහිටි අනුපාතය වන යැපුම් අනුපාතය 2015 දී 51%ක් විය. ජනගහනයෙන් හතරෙන් එකක් පමණ අවුරුදු 15ට අඩු අය වන අතර දහයෙන් එකක් අවුරුදු 65 හෝ ඊට වැඩි වයස්ගත පුද්ගලයන්ය. 2050 වන විට. 17%ක් වියහැකි බවට තක්සේරු කළ තරුණයින් අභිභවමින් වයස්ගත ජනගහනය 23%ක් වනු ඇති බවට තක්සේරු කෙරේ.

ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ සහභාගිත්ව අනුපාතය 2019 දෙසැම්බර් හි 53.4%ක් සාමාන්‍යය අගයක විය. සේවකයින්ගේ සංඛ්‍යාව තුළ අඩුවීමෙන් ඇතිවන බලපෑම මින් අඩුකරන බැවින් සහ වර්ධනය කෙරෙහි ජනවිකාශ විද්‍යාවේ බලපෑම අවම කළ හැකි බැවින්, පිරිමි සහ කාන්තා අතර ශ්‍රම බලකායේ සහභාගිත්ව අනුපාතය තුළ පරතරය අඩුකිරීමට එය වැදගත්ය. ශ්‍රම වෙළෙඳපොළට කාන්තාවන්ගේ පිවිසීම පෝෂණය කරන ප්‍රතිපත්ති තිබීම වැදගත්ය. අධ්‍යාපනය අත්කරගැනීම් තුළ වැඩිවීම් ඵලදායිතාව වැඩිකරන අතර තරුණ ජනතාවගේ සහභාගිත්ව අනුපාත වඩා ඵලදායි අංශ කරා ශ්‍රමය නැවත වෙනස්කිරීම ඵලදායිතා ඉපයීම්වලට මෙහෙයවනු ඇත.

## නියාමන වෙනස්වීම්

### වැදගත් මූලිකාංග සහ පැතිකඩ

- වැඩිවන අගය සහ නියාමන සහ ව්‍යස්ථාපිත අවශ්‍යතා සහ දැඩි විචක්ෂණ නියමයන් හී වෙනස්වන සංකීර්ණතා
- රෙගුලාසි මගින් ගනුදෙනුකරුවන් සහ ආයෝජකයින් සඳහා වඩා ශක්තිමත් ආරක්ෂාව.
- මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල්කරණයට විරුද්ධව සටහන් කිරීම
- කාලගුණ අවදානම සහ දීර්ඝ නිර්ණායක ඒකාබද්ධකිරීම සහ ආයතනික සමාජ වගකීම් වැඩසටහන්වල විනිවිදභාවය සඳහා ඉල්ලුම
- මූල්‍ය අන්තර්කරණය ඇතිකිරීම.
- ක්ෂේත්‍රය තුළ තරගය ප්‍රවර්ධනය කිරීම.
- සක්‍රිය නියාමකයින්, දැඩි නියාමනය සහ ශක්තිමත් පාලන ව්‍යවහාර
- ස්ථාවරත්වය සහ මූල්‍ය ස්ථාවරත්වය ශක්තිමත් කිරීම

### අපගේ වටිනාකම කෙරෙහි බලපෑම

බාසල් ප්‍රතිසංස්කරණ, ගිණුම්කරණ ප්‍රමිතිවල වෙනස්වීම්, මූල්‍ය සහ පිස්කල් ප්‍රතිපත්තිවල වෙනස්වීම්, මූල්‍ය අපරාධ මත රෙගුලාසි, මතුවන රහස්‍යතාව, සයිබර් ආරක්ෂාව සහ චර්යාව මත නිතිකරණය ඇතුළුව වෙනස්වන නියාමන සහ වාර්තාකරණ භූ දර්ශනය අපගේ ව්‍යාපාර ආකෘතියට බලපෑම් කළ හැකි අතර අනුකූලතා අවදානම ඇති කරයි. රෙගුලාසිය තුළ වෙනස්වීම් පොළී අනුපාත මෙන්ම බදු කෙරෙහි බලපෑමක් ඇති අතර අවසානයේදී එය බැංකුවේ ලාභය කෙරෙහි බලපායි. රජයේ ප්‍රතිපත්තිවල වෙනස්වීම් මගින් අභාෂය ලත් නියාමන සහ සමාජ ආර්ථික සාධක ඒකාබද්ධ කිරීම බැංකුකරණ ව්‍යාපාර ආකෘතියට බලපෑමක් ඇත.

### අවදානම් සහ අවස්ථා

| අවස්ථා | බලපෑම | | අවදානම් | බලපෑම | |
|---|---|---|---|---|---|
| | කෙටිකාලින සිට මධ්‍ය කාලින | දිගු කාලින | | කෙටිකාලින සිට මධ්‍ය කාලින | දිගු කාලින |
| අඛණ්ඩව බැංකුවේ ක්‍රියාවලි සහ අචාරධර්ම වැඩපිළිවෙල වර්ධනය කිරීම. | ⊖ | ▲ | ඉහළ ප්‍රාග්ධන අවශ්‍යතා සහ දැඩි ද්‍රවශීලතා කළමනාකරණය. | ▲ | ▲ |
| ආර්ථිකයට මුදල් සපයන්නෙක් ලෙස ශක්තිමත් කළ කාර්යභාරය. | ▲ | ▲ | අනුකූලතා ආශ්‍රිත වියදම් සහ මෙහෙයුම් පිරිවැය වැඩිකිරීම. | ▲ | ▲ |

| අවස්ථා | බලපෑම | | අවදානම් | බලපෑම | |
|---|---|---|---|---|---|
| | කෙටිකාලීන සිට මධ්‍ය කාලීන | දිගු කාලීන | | කෙටිකාලීන සිට මධ්‍ය කාලීන | දිගු කාලීන |
| නව අවදානම් හඳුනාගැනීම සහ කළමනාකරණය තුළ ප්‍රගතිය | ▲ | ▲ | අඩු නියාමන තරඟකරුවන් සමග විපරීත තරඟය | ▲ | ▲ |
| ආකර්ෂණීය නිෂ්පාදන පිරිනැමීම සමඟ වැඩිකළ නව්‍යකරණය | ▲ | ▲ | පොළී අනුපාතවල ප්‍රතිපත්ති වෙනස්වීම් සීමා අනුපාතවලට බලපෑම් කරය | ▲ | – |
| ප්‍රාග්ධනය නියාමන අවශ්‍යතාවන්ට ඉහළින් පැවතීමත් සමඟ, දැනට සිටින සහ නව ගනුදෙනුකරුවන්ට සේවය කිරීමට ශක්තිමත් ස්ථානයක අපි සිටින අතර ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා සැලසුම්කිරීම තුළ වඩා ඉහළ නම්‍යතාවක් ඇත. | ▲ | ▲ | සීමා අනුපාත පහත දැමීමට පෙර තැන්පතු අනුපාත අඩුකරන විට තැන්පතුකරුවන්ගේ අවදානම ස්කන්ධ සහ අනෝන්‍ය අරමුදල් වෙත විතැන් වේ. | ▼ | – |
| ශ්‍රී ලංකවේ ප්‍රමුඛ බැංකුවක් ලෙස, නියාමන අවශ්‍යතා පිළිබඳ සුදුසු ප්‍රතිචාර සහ ප්‍රතිපත්ති සම්පාදකයින් ලබාදීමට අපි මනාව ස්ථානගත වී ඇත. | ▲ | ▲ | ප්‍රමිතිවලට අනුකූලවීමට අසමත්වීම අනුකූලතා සහ කීර්තිනාම අවදානම ඇතිකරන අතර බැංකුව පිළිබඳ පාර්ශ්වකාර විශ්වාසය පළුදු වේ. | ▲ | ▲ |
| යහපත කීර්තිනාමයකන් ගනුදෙනුකරුවන් සහ ආයෝජකයින්ආකර්ෂණය නර රඳවාගැනිමට සහය වේ. | ▲ | ▲ | | | |

▲ 2018 වසරේ සිට අවස්ථාව වැඩිවිය
▼ 2018 වසරේ සිට අවස්ථාව අඩුවිය
▲ 2018 වසරේ සිට අවදානම වැඩිවිය
▼ 2018 වසරේ සිට අවදානම අඩුවිය
– 2018 වසරේ සිට අවදානම/අවස්ථාව පුළුල් වශයෙන් සමානව පැවතුණි.

## අපගේ ප්‍රවේශය සහ කාර්යසාධනය

- නියාමන වෙනස්වීම් ඇගයීමට, ප්‍රතිචාර දැක්වීමට සහ නියාමනය සඳහා සම්බන්ධිකරණ, විස්තීර්ණ සහ අනාගතය දකින ප්‍රවේශයක් පවත්වාගැනීම. බැංකුවේ සේවකයින්, ක්‍රියාවලි සහ ක්‍රම තුළ දැනට සිදුවන ආයෝජනය තුළින් මෙය සිදු කෙරේ.
- දේශීය සහ ජාත්‍යන්තර නියාමන සහ ව්‍යවස්ථාපිත උපදේශන කණ්ඩායම් තුළ සහභාගිවීම.
- අවදානම් තක්සේරු කිරීම සහ එම අවදානම් අවමකිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.
- අදාළ කමිටු විසින් විවිධ ඇගයීම්, ප්‍රවනතා නිරීක්ෂණ සහ ආවර්ජනය කිරීම් පැවැත්වීමෙන් පසු සීමා වෙනස්වීම් සිදු කෙරේ.

## ප්‍රමාණාත්මක කරුණු



## අනාගත දැක්ම

නව බැංකුකරණ පනතක් 2021 දී පනවනු ලබන අතර, එහි බැංකු සඳහා රෙගුලාසි පුළුල් කිරීමට විධිවිධාන ඇතුළත්ය. එය කොළඹ ජාත්‍යන්තර මුදල් මධ්‍යස්ථානයේ ස්ථාපිත කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකුවල අර්බුද සූදානම සහ ස්ථාවරත්වය ශක්තිමත් කිරීමට වෙනත් යම් විධිවිධාන ද හඳුන්වා දෙනු ලැබේ. බැංකුවල තොරතුරු තාක්ෂණය සහ ආරක්ෂාව සම්බන්ධයෙන් නියාමන සහ අධීක්ෂණ වැඩපිළිවෙල තුළ වෙනස්වීම් හඳුන්වා දෙනු ලැබේ. ජාත්‍යන්තර ප්‍රමිති සහ මනා පරිචයන්ට අනුව, යෝජිත රෙගුලාසි වර්ධිත ආපදා කළමනාකරණය ශක්තිමත් කරමින් බැංකුවලට තම තොරතුරු පද්ධති සහ අදාළ තාක්ෂණික අවස්ථා යාවත්කර ශක්තිමත් කිරීම සඳහා පොළඹවනු ඇත.

## ක්ෂේත්‍රයේ ආකර්ෂණීයබව සහ තරඟකාරිබව

ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍රය තුළ ප්‍රධාන තරඟකරුවෙක් ලෙස අපගේ වෙළෙඳපොල තත්ත්වය පවත්වා ගැනිම සඳහා, මයිකල් පෝර්ටර් විසින් හඳුන්වා දෙන ලද ෆයිව් ෆෝසස් විශ්ලේෂණය අපි පැවැත්වුවෙමු. අප කර්මාන්තයේ පරිසරයට වැදගත්වන බාහිර සාධක අවබෝධ කරගැනීමට, බැංකුවේ වැදගත් ගැටළු හඳුනාගැනිමට සහ අපගේ උපායමාර්ගික ප්‍රමුඛතා සකස්කර ගැනීමට මෙය සහාය විය. මෙම ගැටළු උපායමාර්ගිකව ආමන්ත්‍රණය කිරිම සඳහා අපගේ හැකියාව බැංකුවේ ස්ථාවරත්වය කෙරෙහි බලපායි. බැංකුකරණ කර්මාන්ත පරිසරයේ බලකායන් පහේ තීව්‍රතාවන් පහත පරිදි වේ:

**01**

**නව පිවිසෙන්නන් වෙතින් එන තර්ජන**

- ඉතා ඉහළ ප්‍රාග්ධන අවශ්‍යතා හේතුවෙන් බැංකුවක් ලෙස ස්ථාපනය විම සඳහා බලපත්‍රයක් ලබාගැනිමේ අපහසුතාව
- බාසල් III අවශ්‍යතාවන්ට අනුකූලවිමට ඉහළ ආයෝජන අවශ්‍යවීම
- සේවකයින්, තොරතුරු තාක්ෂණය සහ බෙදාහැරිමේ මාර්ග තුළ ඉහළ ප්‍රාග්ධන ආයෝජනයන් හි අවශ්‍යතාව
- නියාමන සහ අනුකූලතා අවශ්‍යතා සඳහා වැඩිවන ඉල්ලුම

**02**


**ගනුදෙනුකරුවන්ගේ කේවල් කිරීමේ බලය**

- පුද්ගලගත සහ ඉහළ ප්‍රමිතියේ සේවාව සඳහා ගනුදෙනුකරුවන්ගෙන් වැඩිවන ඉල්ලුම
- සමාන නිෂ්පාදන සහ සේවාවන් වෙළෙඳපොල තුළ පැවතිම
- ඉහළ පිරිවැයක් නොමැතිව තරඟකරුවන් හා විකල්පයන් වෙත යාමට ගනුදෙනුකරුවන්ට ඇති හැකියාව
- නව පරම්පරාවේ ගනුදෙනුකරුවන්ට ගනුදෙනුකාර පක්ෂපාතිත්වය නොමැතිවීම
- ඉහළ ශුද්ධ අගයක් ඇති ගනුදෙනුකරුවන්ට අඩු අනුපාත පිළිබඳ සාකච්ඡා කිරීමට ඇති හැකියාව

**03**

**ඊර්ට්සබසබට වදඇර දේමවවකසැරි**

- ඉහළ ප්‍රතිලාභ සහ අඩු අවදානම් සඳහා තැන්පතුකරුවන්ගෙන් ඉල්ලුම
- ඩිජිටල් සේවාවන් සපයන්නන් මත වැඩි වශයෙන් රඳාපැවැත්ම
- සේවකයින් හට වෘත්තිය සංගම් හරහා කේවල් කිරීමේ වැඩි බලය
- ලිපිද්‍රව්‍ය සැපයුම්කරුවන්, බාහිරින් සේවයේ යොදවන සහ කොන්ත්‍රාත් මත සේවයේ යොදවන සේවකයින් යනාදී අනෙකුත් සැපයුම්කරුවන් මත ඇති රඳා පැවැත්ම අඩුවීම




**04**

**තරඟකාරී විරුද්ධවාදීන්**

- කර්මාන්තය තුළ සිටින ඉහළ තරඟකරුවන් ගණන (බලපත්‍රලාභි වාණිජ බැංකු 26ක් සහ බලපත්‍රලාභි විශේෂිත බැංකු 6 ක් ඇත)
- ගනුදෙනුකරුවන්ට වඩා අඩු පිරිවැයකට සේවා සැලසීමට සිදුවීම සහ සමාන නිෂ්පාදන හා සේවා වෙත මාරුවිමේදී ගනුදෙනුකරුවන්ට අඩු පිරිවැයක් යටතේ එය කළ හැකිවීම හේතු කොට ගෙන තරඟකරුවන් අතර දැඩි තරඟකාරිත්වය

**05**

**විකල්ප පිළිබඳ අවදානම**

- විදුලි සංදේශ සමාගම්වල සහ ගෙවීම් විසඳුම් සපයනු ලබන අනෙකුත් ගෙවීම් සපයන්නන් (ෆින්ටෙක් සමාගම්) වෙතින් වැඩිවන තර්ජන
- මිලෙහි, ගුණාත්මකභාවයෙහි හෝ ලක්ෂණවල කිසිදු වෙනසක් නොමැතිව අඩු පිරිවැයට සමාන නිෂ්පාදන ලබාගැනීමේ හැකියාව
- මිල ගණන් වෙනස් කිරිම සම්බන්ධයෙන් තැන්පතුකරුවන්ගේ සහ ණය ලබා දෙන්නන්ගේ දැඩි සංවේදීතාවය

# උපායමාර්ග සහ සම්පත් වෙන්කිරීම


ශක්තිමත් වටිනාකම් මත ගොඩනගන ලද අපගේ උපායමාර්ග තුළින් මෙහෙයුම් සංදර්භය පිළිබඳ අපගේ තියුණු අවබෝධය පිළිබිඹු කරන අතර එය අපගේ සියලුම පාර්ශ්වකරුවන්ට තිරසාරාත්මක ප්‍රතිඵල ලබාදෙමින් පාලන සහ අවදානම් කළමනාකරණ හැකියාවන් වර්ධනය කිරීම කරා මෙහෙයවයි.

## ඒකාබද්ධ චින්තනය සමඟ උපායමාර්ගික සැලසුම් කිරීමේ ක්‍රියාවලිය




අපගේ උපායමාර්ග අප, අපගේ හැකියාවන්, වර්තමාන සහ අනාගත අවශ්‍යතා, අපගේ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් සහ අපගේ මෙහෙයුම් පරිසරය පිළිබඳ සලකා බලන ඒකාබද්ධ චින්තනය තුළින් ව්‍යුත්පන්න වේ. අපගේ ඒකාබද්ධ උපායමාර්ගික සැලසුම් කිරීමේ ක්‍රියාවලියේ වැදගත් අංගයක් වන්නේ කෙටි, මධ්‍ය සහ දිගුකාලීනව අප බැංකුවේ වටිනාකම් නිර්මාණය කිරීමේ හැකියාවට බලපාන සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියට බලපාන සයවදෑරුම් ප්‍රාග්ධනය අතර සම්බන්ධතාවය, අන්‍යෝන්‍ය රඳාපැවැත්ම සහ විභව සමතුලිතතාවයයි. අපගේ ඒකාබද්ධ උපායමාර්ගික සැලසුම් කිරීමේ ක්‍රියාවලිය උපායමාර්ගික සංවර්ධනය සහ කෙටි, මධ්‍ය සහ දිගුකාලීන සංවර්ධනය ක්‍රියාවට නැංවීම ප්‍රේරණය කරයි.


අපගේ ඒකාබද්ධ උපායමාර්ගික සැලසුම් කිරීමේ ක්‍රියාවලියේ අංග තුනඃ



උපායමාර්ගික සංවර්ධනය



උපායමාර්ගික යෙදවීම සහ සම්පත් වෙන් කිරීම



අධීක්ෂණ අදියර

## උපායමාර්ගික සංවර්ධනය

අපගේ උපායමාර්ගයන් පැහැදිලිවම අපගේ දැක්ම, මෙහෙවර සහ වටිනාකම් හා සම්බන්ධ කර ඇත. උපායමාර්ගික සංවර්ධන ක්‍රියාවලිය බාහිර සහ අභ්‍යන්තර ව්‍යාපාරික පරිසරය, අවස්ථාවන්, අභියෝග සහ අතීත ඉගෙනුම් සැලකිල්ලට ගනිමින් සිදු කරයි.

අපගේ උපායමාර්ගික සැලසුම් කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස, බැංකු ක්ෂේත්‍රය කෙරෙහි බාහිර නැමියාවන් බලපාන ආකාරය අවබෝධ කරගැනීම සඳහා අපි බාහිර පරිසරය සුපරීක්ෂණය කරමු. සක්‍රිය පාර්ශ්වකාර සහභාගිත්වය සමඟ අපගේ ව්‍යාපාර ආකෘතිය සහ මෙහෙයුම් පරිසරය තක්සේරු කිරීම මගින් වටිනාකම් එකතු කරන හෝ වියවුල් කරන අපගේ වැදගත් ගැටළු සහ අංග හැඩ ගස්වයි.

වැදගත් කරුණු වලින් ඇතිවන අවදානම් සහ අවස්ථා කෙටි, මධ්‍ය සහ දිගුකාලය සඳහා අපගේ උපායමාර්ගික පරමාර්ථ වෙන්කිරීමට යෙදවුම් ලබා දේ.

## උපායමාර්ගික යෙදවීම සහ සම්පත් වෙන්කිරීම

අපගේ ඒකාබද්ධ සැලසුම් කිරීමේ ක්‍රියාවලිය මගින් අපගේ උපායමාර්ග සහ ප්‍රධාන සම්පත් යෙදවීම් අපගේ මූල්‍ය සහ ක්‍රියාත්මක කිරීමේ සැලසුම්වලට එකතුකරන බව සහතික කරයි. අනාගත වර්ධනය සහ වගකීම් සහගත අවදානම් කළමනාකරණය අතර තුලනය කළ ප්‍රවේශයක් සහතික කිරීම සඳහා ඇතිවියහැකි අවස්ථාවන් අපගේ අවදානම් අභිරුචි රාමුව තුළ තක්සේරු කෙරේ.

අදාළ කළමනාකරණ කමිටු මගින් ඇගයීම් සිදුකර අනුමත කරන අපගේ දිගුකාලීන උපායමාර්ගික ප්‍රමුඛතා ක්‍රියාත්මක කිරීම සඳහා දිගුකාලීන සැලසුම් කිරීමේ ක්‍රියාවලියට ඇතුළත් කර ඇත. කෙටි කාලීන හා මධ්‍ය කාලීන උපායමාර්ගයන් සහ ඉලක්ක දිගුකාලීන උපායමාර්ගික පරමාර්ථවලට සම්බන්ධකර බැංකුව තුළ ක්‍රියාත්මක කෙරේ. මෙම උපායමාර්ගයන් සහ සැලසුම් පැහැදිලිව දක්වා ඇති වගකීම් සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක සමඟ එක් එක් අංශ සඳහා බෙදා වෙන් කර ඇත.


අපගේ උපායමාර්ගික ව්‍යාපාරික සැලසුම් වැඩපිළිවෙල මගින් ප්‍රකාශිත උපායමාර්ගික පරමාර්ථ අත්කර ගැනීමට අවශ්‍ය කරන සම්පත් (තොරතුරු තාක්ෂණය, මානව සම්පත, මූල්‍ය සම්පත) හඳුනා ගැනීමට අපට හැකියාව ඇති කරයි. කෙටි කාලයේ සිට මධ්‍ය කාලය දක්වා සකසා ඇති අපගේ ක්‍රියාකාරී සැලැස්ම තුළින් දක්වා ඇති අපගේ අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය සම්පත් ඇති බවට ක්‍රියාකාරී කණ්ඩායම් විසින් සහතික කරනු ලබයි. සම්පත් ලබාගැනීමේ හැකියාව සහ පවත්නා සහ අපේක්ෂිත අවශ්‍යතා මත පදනම් වී, වැඩපියවර සහ නව ව්‍යාපෘති නැවත ප්‍රමුඛතාවයට පත්කරන සමහර විභව සමතුලිතතා සිදු කෙරේ.

## අධීක්ෂණ අදියර

පරිසරය තුළ වෙනස්වීම්වලට ප්‍රබල ආකාරයෙන් ප්‍රතිචාර දැක්වීමට බැංකුව ශක්තිමත් කිරීම සඳහා, ක්‍රමෝපායන් සහ සැලසුම්වල ප්‍රගතිය කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විවිධ වාර්තා තුළින් කලින් කළ පසුවිපරම් කරන අතර, නිශ්චිත කාලපරාසයන් හි දී සමාලෝචනය කෙරේ. මෙම ක්‍රියාවලිය අත්කරගත් ප්‍රගතියට අනුව අපගේ උපායමාර්ගික වැඩපියවරවල ශක්තිමත්භාවය හඳුනාගැනීමට සහ පරීක්ෂා කිරීමට මෙන්ම අනාගතය තුළ සිදුවියහැකි සිදුවීම් පරීක්ෂා කිරීමට අපට හැකියාව ඇති කරයි.

කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS)/ දර්ශක විශ්ලේෂණය තුළින් මාසික පදනමක් මත අයවැය සහ පෙර කාලපරිච්ඡේදවල කාර්යසාධනයට අනුව අපගේ කාර්යසාධනය ඇගයීමට ලක් කෙරේ. කාර්තුමය විශ්ලේෂණයක් තුළින්, ප්‍රධාන ව්‍යාපාතිවල තත්වය ඉලක්කවලට අනුව අපගේ උපායමාර්ගික කාර්යසාධනය නියාමනය කරන අතර අවශ්‍යනම් ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය තුළින් උපායමාර්ගික ඉදිරි දැක්ම මත පදනම් වී සමාලෝචන සිදුකරමු.

අපගේ කාර්යසාධනය සමාලෝචනය කිරිම සඳහා තුළනය කළ මිනුම් දර්ශකය මත පදනම් වි අපගේ ප්‍රධාන කාර්යසාධන දර්ශක නිර්වචනය කොට ඇත. ඒවාට මූල්‍ය සහ මූල්‍ය නොවන දර්ශක මෙන්ම ප්‍රමාණාත්මක සහ ගුණාත්මක සාධකද ඇතුළත් කර ඇත. අඛණ්ඩ නියාමනය මගින් මෙහෙයුම් ගැටළු ක්ෂේත්‍ර හඳුනාගැනිමට, වෙළෙඳපොළ ප්‍රවණතා සමාලෝචනය කිරිමට, ගනුදෙනුකාර අවශ්‍යතා සහ අපේක්ෂාවන් තක්සේරු කිරීමට, ව්‍යාපාරික ප්‍රතිඵල සහ ඉහළම ප්‍රමුඛතා විශ්ලේෂණය කිරීමට සහ අදාළ සහ තරඟකාරී ආකාරයෙන් රැඳි පැවතිම සඳහා අපගේ උපායමාර්ග සහ ව්‍යාපාර ආකෘතිය නැවත සකස් කිරීමට අපට හැකියාව ලබා දේ.



## වඩාත් තිරසාර බැංකුවක් ගොඩනැගීම


අප ජීවත්වන සහ අප ක්‍රියාත්මක වන්නා වූ ගනුදෙනුකරුවන් සහ ප්‍රජාවන් සඳහා වඩා යහපත්, වඩා සෞභාග්‍යමත් අනාගයක් ඇති කිරීමට අපි අපේක්ෂා කරමු. අපගේ කොටස්කරුවන්ට ප්‍රතිඵල ලබාදෙන අතරම, අපගේ ගනුදෙනුකරුවන්, සේවකයින් ප්‍රජාවන් සහ අපගේ මිහිතලය සඳහා ආර්ථික, සමාජීය සහ පාරිසරික වටිනාකම නිර්මාණය කිරීම මගින් අපි මෙය අත්කර ගනිමු. රජයට අයත් ප්‍රමුඛ මූල්‍ය ආයතනයක් ලෙස, ධනාත්මක සමාජීය සහ පාරිසරික බලපෑමක් ඇති කිරීමට ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ කේන්ද්‍රීය කාර්යභාරයක් අපි ඉටු කරමු. අපගේ පැවැත්ම සහ බලපෑම්සහගතබව තිරසාර සංවර්ධනයක් ගොඩ නැගිම තුළ නායකයෙක් වීමේ අවස්ථාවක් අප වෙත ලබා දෙන අතර, මෙම අභිලාෂය ඉටුකර ගැනීම සඳහා නිවැරදි වටිනාකම්, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි අප සතුව ඇත. බැංකු කටයුතු වඩාත් තිරසාර කිරීමට සහ වඩා යහපත් ලොවක් සඳහා දායකවීමට අපි දැඩි ලෙස බැඳී සිටිමු.

## අපගේ තිරසාර ව්‍යාපාර ආකෘතිය

අපගේ ව්‍යාපාර ආකෘතිය අපගේ දැක්ම, මෙහෙවර සහ වටිනාකම් මගින් මෙහෙයවන සහ ශක්තිමත් පාලනය සහ ආචාරධර්මවලින් සහයවන බැංකුවේ අගය නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ දළ සැලැස්මක් ලබා දේ. සියලුම සමාජ-ආර්ථික, පරිසරික සහ සමාජීය ගැටළු අපගේ ව්‍යාපාර ආකෘතිය සහ මධ්‍ය ව්‍යාපාර ක්‍රියාවලි තුළට ඒකාබද්ධ කෙරේ. අපගේ ඒකායන අරමුණ වන්නේ තිරසාර සමාජීය වටිනාකමක් සහ ආයතනික වටිනාකමක් නිර්මාණය කිරීමයි. සෑම ක්‍රියාවකටම වටිනාකම එකතුකිරීමට සහ බැංකුවට, පාර්ශ්වකරුවන්ට සහ සමස්ථයක් ලෙස ප්‍රජාවට වටිනාකම නිර්මාණය කිරිමට අපගේ හර ශක්තීන්, අපගේ ප්‍රවීණත්වය සහ අපගේ සම්පත්වල වාසිය ලබා ගැනිම මගින් අපි මෙය සිදු කරමු. වෙනස්වන පරිසරයක් තුළ අභියෝග බලාපොරොත්තු වෙමින් සහ ලබාගතහැකි අවස්ථාවන් ප්‍රයෝජනයට ගැනීම තුළින් ශ්‍රී ලංකාව තුළ ඉතුරුම් දැවැන්තයා ලෙස අපගේ ස්ථානය අපි රඳවාගෙන ඇත.

අපගේ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡාවන් සිදු කිරීම මගින්, ඔවුන්ගේ අවශ්‍යතා අපි හඳුනාගන්නා අතර ඵලදායි සහ අර්ථවත් ආකාරයකින් මෙම අවශ්‍යතා සපුරාලීමට සඳහා අපි බැඳි සිටිමු. අභ්‍යන්තර සහභාගිත්වය සහ තිරසාර ක්‍රමෝපායික සංවර්ධනය තුළ අවශ්‍යයෙන්ම කළ යුතු කරුණු ප්‍රමුඛ කිරිම සඳහා ප්‍රමාණාත්මක ඇගයීම පවත්වනු ලැබේ.

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වටිනාකම් එකතු කිරීමේ ආකෘතිය සඳහා පිටු අංක 20 - 21 බලන්න



## ව්‍යාපාරික උපායමාර්ගයේ කොටසක් වශයෙන් තිරසාර ක්‍රමෝපාය

ආයතනික උපායමාර්ග අරමුදල් තීරණ සහ නිෂ්පාදන/සේවා නිර්වචන ක්‍රියාවලියට තිරසාරභාවය පිළිබඳ මූලධර්ම අපි ඇතුළත් කර ඇත. පහතින් විස්තර කර ඇති පරිදි තිරසාරභාවය අපගේ උපායමාර්ග තුළට ඒකාබද්ධ කර ඇත:

**සේවක සහභාගිත්වය**


අපගේ ව්‍යාපාරයෙහි සහ ප්‍රජාවන්ගේ තිරසාරභාවය ඉහළ නැංවීමට අපගේ සේවකයින් සමඟ සහයෝගිත්වය

**පාරිසරික තිරසාරභාවය**

පරිසර පිළිබඳ දැනුමැති සංස්කෘතියක් යොදාගැනීම, සීමිත සම්පත්වල තිරසාර භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ අපගේ ජාලය තුළ හරිතාගාර විමෝචනයන් අඩු කිරීම.

**සමාජීය තිරසාරභාවය**

මානම හිමිකම්, සාධාරණ සේවා තත්ව, විවිධත්වය සහ ස්ත්‍රී පුරුෂ සමානත්වය සක්‍රිය ලෙස ප්‍රවර්ධනය කරමින් සමාජය සංවර්ධනයට දායකවීම.




**මූල්‍ය තිරසාරභාවය**

බැංකුවේ දිගුකාලීන තරඟකාරිත්වය ශක්තිමත් කිරීම සහ ඒ තුළින් ශක්තිමත් තිරසාර ආර්ථිකයක් වර්ධනය කිරීම.

**අවදානම් කළමනාකරණය**

අපගේ මූල්‍ය කටයුතු හා බැඳුණු පාරිසරික හා සමාජීය අවදානම් ඵලදායී ආකාරයෙන් කළමනාකරණය කිරීම.

**ප්‍රතිපත්තිමය කටයුතුවල සහභාගිත්වය සහ වෙළෙඳපොළ සංවර්ධනය**

පාර්ශ්වකරුවන් සමඟ හවුල්වෙමින් මනා පරිචයන් සහ නව අවස්ථාවන් ඉදිරියට ගෙනයාම සහ උසස් කිරීම.

### තිරසාර උපායමාර්ග

ජාතික ඉතිරි කිරීමේ බැංකුව මධ්‍යස්ථ අවදානම් පැතිකඩක් සමඟ ලාභදායී, මනාව ප්‍රාග්ධනියකරණය වූ බැංකුවක් ලෙස අඛණ්ඩව කටයුතු කරයි. ශක්තිමත් ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතා ස්වාරක්ෂක මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීමට අවශ්‍ය වේ. එබැවින්, අපි ශක්තිමත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා තත්ත්වයක් සහ පැහැදිලි සහ ශක්තිමත් මූල්‍ය තත්ත්වයත් පවත්වා ගන්නා අතර එය අපගේ පාර්ශ්වකරුවන් සඳහා දිගු කාලීන වටිනාකම නිර්මාණය කිරීමට හැකියාව ඇති කරයි. ආයතනික තිරසාර ප්‍රතිපත්තිය තුළින් අපගේ ව්‍යාපාර ආකෘතිය තුළට තිරසාරභාවය ඇතුළත් කරනු ලැබ ඇත. අපගේ තිරසාර රාමුව පාරිසරික ප්‍රතිපත්තිය, මානව හිමිකම් ප්‍රතිපත්තිය, ආයතනික සමාජීය වගකීම් (CSR) ප්‍රතිපත්තිය, සහ පාරිසරික, සමාජීය සහ අවදානම් කළමනාකරණ (ESRM) ප්‍රතිපත්තිය මගින් වර්ධනය කර ඇත. ආයතනික කළමනාකරණය ඇතුළුව සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සහ හැකියා සංවර්ධන වැඩසටහන් පවත්වන ලදී.

තිරසාර සංවර්ධන අරමුණු (SDGs) සමඟ අපගේ කටයුතු හැඩගැස්වීම සඳහා අපගේ ව්‍යාපාරය තුළ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කර ඇති අතර ඒ තුළින් සමාජීය සහ පාරිසරික අංගයන් කෙරෙහි අපගේ අවධානය වැඩි කරන ලදී. තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් අප විසින් ගෙන ඇති වැඩපිළිවෙළ පිළිබඳ වැඩි විස්තර සඳහා පිටු අංක 90 සිට 169 දක්වා බලන්න.

### තිරසාර පාලනය

සාර්ථකත්වය සඳහා බැංකුව ස්ථානගත කිරීමේදී බැංකුව සඳහා දිගුකාලීන වටිනාකම ඉදිරියට ගෙනයාම පිණිස අපගේ විවිධ පාර්ශ්වකරුවන්ගේ බැඳියාවන් පරිස්සමින් තුලනය කිරීමට අවශ්‍ය වේ. බැංකුවේ ආර්ථික, සමාජීය සහ පාරිසරික (ESE) බලපෑම් සහ අවදානම් පාලනය සහ අධීක්ෂණය අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම දෙනාගේ වගකීමකි. ආර්ථික, සමාජීය සහ පාරිසරික ගැටළු බැංකුවේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට ඇතුළත් කරන අතර වටිනාකම නිර්මාණය සඳහා වැදගත්වන කරුණු සේවකයින්ගේ කාර්යසාධනය මැනීම සඳහා උපයෝගී කරගනු ලබන තුලනය කරන ලද මිනුම් දර්ශකයට ඒකාබද්ධ කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී වෙත පවරා ඇත. ඔහු ආයතනික කළමනාකරණ කණ්ඩායම මෙහෙයවන අතර අප බැංකුවේ එදිනෙදා මෙහෙයුම් කළමනාකරණය සඳහා වගකීමට බැඳී සිටී. ආයතනික සමාජීය වගකීම් සහ තිරසාර කමිටුව (CSRC) ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලය සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡාවන් පවත්වයි.

## තිරසාරභාවය සඳහා අපගේ කැපවීම

### යටිතල පහසුකම් සංවර්ධනය

අපගේ තිරසාර ව්‍යාපාර ප්‍රවේශයට අපගේ රට තුළ ක්‍රියාත්මක වන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවලට සහාය දැක්වීම ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතිවලින් ආර්ථික සංවර්ධනය ඇති කර දේශීය ප්‍රජාව සවිබල ගන්වන අතර, ශ්‍රී ලංකාවේ ජනතාවගේ ජීවන තත්ත්වයන් නඟා සිටුවයි. රජයේ ආයතන සමඟ සහයෝගිත්වයෙන්, ප්‍රවාහනය, ජලය, විදුලි සංදේශ සහ අධ්‍යාපනය ඇතුළු විවිධ ක්ෂේත්‍රවල අපි ආයෝජනය කරමු.

වැඩි විස්තර සඳහා 159 පිටුව බලන්න.

### අධ්‍යාපනය, ඉගෙනුම සහ සංවර්ධනය නගා සිටුවීම

අපි අඛණ්ඩවම ඉහළ මට්ටමේ සහභාගිත්වය අපේක්ෂා කරන අතර ඩිජිටල් ආර්ථිකයට දැනට පවත්නා සංක්‍රාන්ති සමය තුළ එයට අදාළ දැනුම සහ නිපුණතාවන් වර්ධනයට අපි අයෝජනය කරමු. මෙම උත්සාහයන් තුළින්, සියලුම සේවකයින්ගේ අනාගතය ගොඩනැගීමට අපි බලාපොරොත්තු වෙමු. අපත් සමඟ වෘත්තීය ගොඩනැගීමට පාසල් හැරගියවුන් සහ උපාධිධාරීන්ට අපි අවස්ථාවන් නිර්මාණය කර ඇත. අධ්‍යාපනයට සහයවන සහ තරඟකාරී විභාගවල ජයග්‍රහකයින් පිළිගැනීම ලබාදෙන ආයතනික සමාජීය වගකීම් වැඩසටහන් අපි ප්‍රමුඛ කොට ඇත. විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ට ඔවුන්ගේ සෞන්දර්ය සහ වෙනත් හැකියාවන් පෝෂණය කරගැනීමට අපගේ සහය ලබාදෙමු.

වැඩි විස්තර සඳහා 136 සිට 137 සහ 160 සිට 161 පිටු බලන්න.

### සියල්ල අන්තර්ගත, තිරසාර වර්ධනයට සහයවීම

රට තුළ සමාජීය සහ ආර්ථික ප්‍රගතිය ඇති කිරීමට මූල්‍ය අන්තර්කරණය අපි ප්‍රවර්ධනය කරමු. රජය ආරම්භ කළ ණය වැඩසටහන් අනුව යමින්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට අරමුදල් ලබාදීම තුළින් තිරසාර සහ සියල්ල ඇතුළත් ආර්ථිකයක් අපි සෘජුවම ප්‍රවර්ධනය කරමු. එමෙන්ම අපි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ණය ලබා දෙන පුද්ගලික අංශයේ ආයතනවලට අරමුදල් ලබා දෙන්නෙමු.

වැඩි විස්තර සඳහා 109 සහ 159 පිටු බලන්න.

### මූල්‍ය අපරාධ මැඩපැවැත්වීම

අරමුදල් රැස්කිරීම සහ මූල්‍ය ප්‍රවාහයේදී බැංකු පද්ධතිය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ලබන අතර මූල්‍ය ක්‍රමයේ අවංකත්වය ආරක්ෂා කරන පාලන පද්ධති ඵලදායී ආකාරයෙන් පාලනය කරයි. මුදල් විශුද්ධිකරණ පද්ධතියක් අපි ක්‍රියාත්මත කර ඇති අතර, සැකසහිත මුදල් ගනුදෙනු සොයාබලා වාර්තා කිරීම අපි අඛණ්ඩව සිදුකරමු. වංචාව, දූෂණය වැළැක්වීමට සහ නීතිවිරෝධී මෙහෙයුම් සහ ආයතන වෙත අරමුදල් ලබාදීම අඩු කිරීමට මෙය ප්‍රධාන වේ. අපගේ ශක්තිමත් පාලන ක්‍රමය පද්ධතියේ අඛණ්ඩතාවය ආරක්ෂා කර අපගේ ගනුදෙනුකරුවන්ගේ අරමුදල් සුරක්ෂිත කරයි.

වැඩි විස්තර සඳහා 119, 127, 152 සහ 158 පිටු බලන්න.

### කාබන් අවම වූ ආර්ථිකයක් සඳහා දායකවීම

ශ්‍රී ලංකාවේ විදුලි සැපයීම විවිධාංගිකරණය ඇතිකරන පුනර්ජනනීය බලශක්තිවල කොටස වැඩි කිරීම පිළිබඳ රජයේ ක්‍රමෝපාය සමඟ අපි පෙළ ගැසෙමු. පුනර්ජනනීය බලශක්ති උත්පාදනය කරන ව්‍යාපෘති සහ හරිත නිෂ්පාදන සහ සේවා නිෂ්පාදනය තුළ යෙදී සිටින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණයදීමට අපි බැඳී සිටිමු. ලංකා විදුලිබල මණ්ඩලය (CEB) සමඟ සමීප සහයෝගීත්වයෙන් සූර්යබල ව්‍යාපෘතිවලට සහයදීම අපගේ ප්‍රධාන අවධානය වේ. අපට අයත් ගොඩනැගිලි තුළ සූර්ය බල ශක්ති ජනනය කරන උපකරණ ස්ථාපිත කර ඇත.

වැඩි විස්තර සඳහා 166 සිට 169 පිටු බලන්න.

### නිරෝගිමත් ප්‍රජාවන් ගොඩනැගීම

ප්‍රජාවන් ආර්ථික සහ සමාජ දේහයේ අත්‍යවශ්‍ය කොටසකි. ප්‍රජාව තුළ ආයෝජනය තුළින්, වඩාත් ශක්තිමත්, සෞභාග්‍යමත් අනාගතයක් ගොඩ නැගීමට අපි සහය වෙමු. අපගේ සේවකයින් සඳහා සෞඛ්‍යාරක්ෂිත සේවා පරිසරයක් නිර්මාණය කරමින්, ශ්‍රී ලංකාව තුළ සෞඛ්‍යමය වශයෙන් උවදුරට පත්වියහැකි වැඩිහිටි පුද්ගලයින් වෙනුවෙන් ජංගම වෛද්‍ය කඳවුරු සඳහා අපි අනුග්‍රහය දක්වමු. නිරෝගිමත් සහ සෞභාග්‍යමත් දේශයක් ගොඩ නැගීම සඳහා, ශාඛ සහ පැල බෙදාදීම තුළින් ගෙවතු වගාව සහ කාබනික වගා නිෂ්පාදන අපි ප්‍රවර්ධනය කරමු.

වැඩි විස්තර සඳහා 161 පිටුව බලන්න.

### විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම

හුදු අනුකූලතාවයෙන් ඔබ්බට යමින්, අපගේ මෙහෙයුම්වල විනිවිදභාවය පවත්වා ගැනීමට අපගේ සියලුම පාර්ශ්වකරුවන් සමඟ විවෘත සාකච්ඡාවක් අපි පවත්වා ගනිමු. අපගේ පාර්ශ්වකරුවන්ගේ ඇතිවන අපේක්ෂාවන්ට වඩාත් හොඳින් ප්‍රතිචාර දැක්වීමට මින් අපට හැකියාව ලබා දේ.

වැඩි විස්තර සඳහා 70 සිට 77 පිටු බලන්න.

වෙනස්වන මෙහෙයුම් සංදර්භය තුළ, කෙටි, මධ්‍ය සහ දීර්ඝ කාලීනව අපගේ පාර්ශ්වකරුවන් සඳහා තිරසාර වටිනාකම නිර්මාණය කිරීමට ශක්තිමත් උපායමාර්ග අවශ්‍යය. මෙහෙයුම් පරිසරය පිළිබිඹු කරන ශක්තිමත් පදනම් මත අපගේ උපායමාර්ග පෙළගස්වා ඇත. අප ආයතනයේ සෑම මට්ටමකම සේවකයින්ගේ යෙදවුම් සැලකිල්ලට අරගනිමින් බැංකුවට වැදගත් වන සාධක විශ්ලේෂණය කිරීමට බැංකුව තුළ සියල්ල ඇතුළත් ප්‍රවේශයක් අපි අනුගමනය කරමු.

## ශදුඅත (SWOT) විශ්ලේෂණය

අපගේ උපායමාර්ග සකස් කිරීම සහ උපායමාර්ගික ප්‍රමුඛතාවන් ක්‍රියාත්මක කිරීමේ මූලික පියවරක් ලෙස අපි SWOT විශ්ලේෂණයක් පවත්වන ලදී. අපගේ අභ්‍යන්තර ශක්තීන් සහ දුර්වලතා මෙන්ම බාහිර පරිසරය තුළ අවස්ථා සහ තර්ජන පිළිබඳ දැක්මක් ඒ තුළින් ලබා දේ.

### ශක්තීන්

- තැන්පතු හා පොළී ගෙවීම් රජය විසින් සම්පූර්ණයෙන්ම සහතික කිරීම
- වසර 187ක බැංකුකරණ උරුමය
- 100% රජය සතු බැංකුව
- අඛණ්ඩව හතරවැනි වරටත් ශ්‍රී ලංකාවේ ආරක්ෂිතම බැංකුව
- ශක්තිමත් සන්නාම කීර්තිනාමය - ශ්‍රී ලංකාව තුළ පස් වැනි විශිෂ්ටතම සන්නාමය ලෙස පිළිගැනීම
- සේවා ස්ථාන 4000 ඉක්මවමින් දිවයින පුරා විස්තීර්ණ ගනුදෙනුකාර ලඟාවීම
- ඉහළ රඳවා ගැනීමේ අනුපාතය සමඟ ශක්තිමත් සේවක පක්ෂපාතිත්වය
- ICRA ලංකා සමාගම මඟින් AAA ණය ශ්‍රේණිගතකරණය
- යටිතල පහසුකම් ව්‍යාපෘති සහ පිරිසිදු බලශක්තිය සඳහා මූල්‍යකරණය තුළ විශේෂවීම
- ක්ෂේත්‍රයේ සාමාන්‍යය අගයට සාපේක්ෂව අඩු අක්‍රීය ණය අනුපාතය

### ශක්තීන් උත්තේජනය කරමින් අවස්ථා උපරිම ගැනීම

- ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධනයට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ප්‍රවීණත්වය භාවිතා කිරීම
- සේවකයින් සංවර්ධනය සහ අභිප්‍රේරණය කරමින් ගනුදෙනුකාර සේවා අත්දැකීම ඉහළ නැංවීම
- විවිධ ණයදීමේ අවස්ථාවලින් ආදායම සහ ලාභදායිතාව වැඩි කිරීම
- හරිත ආර්ථිකයට සම්බන්ධ නිෂ්පාදන පුළුල් කිරීම සහ පිරිසිදු බලශක්ති ප්‍රවර්ධනය සඳහා මූල්‍යකරණයෙහි විශේෂ නිපුණතා ප්‍රයෝජනයට ගැනීම



### දුර්වලතා

- ජාතික ඉතිරි කිරීමේ පනත තුළින් ව්‍යාපාර පුළුල්කිරීම කෙරෙහි පනවනලද සීමාවන් (ක්ෂුද්‍ර මූල්‍ය, SME අංශයට ණයදීම)
- රජයේ සුරැකුම්පත්වල තැන්පතුවලින් 60%ක් ආයෝජනය කිරීමේ අනිවාර්ය අවශ්‍යතාව
- නිලධාරිවාදී ක්‍රියාවලි සහ ක්‍රියාපටිපාටි
- පූර්ණ වශයෙන් ඒකාබද්ධ වූ පද්ධති නොපැවතිම හේතුවෙන් නවශ්‍යශීලීභාවය සීමා වී ඇත
- දැඩි ක්‍රියාපටිපාටි නව තාක්ෂණයන් භාවිතා කිරීම මන්දගාමී කරයි.
- අරමුදල් සැපයීමේ මූලික ප්‍රභව කාලීන තැන්පතු වීම.
- ගාස්තු සහ කොමිස් පදනම් කරගත් ආදායම උත්පාදනය සඳහා ඇති සීමාවන්
- මධ්‍යස්ථ අවදානම් සංස්කෘතිය සහ ව්‍යාපාර ප්‍රතිපත්තිය

### අවස්ථා උපරිම කිරීම සඳහා ශක්තීන් උත්තේජනය කිරීම

- විශේෂිත දැනුම භාවිතයෙන් රටේ යටිතල පහසුකම් ප්‍රවර්ධනය
- අභිප්‍රේරණය සහ නිපුණතා පෝෂණය කිරීම තුළින් සේවා අනර්ඝත්වය ඉහළ නැංවීම
- පුළුල් පරාශයක ප්‍රවේශ මධ්‍යස්ථාන තුළින් දායකත්වය වැඩි කරමින් ණයදීමේ අවස්ථා මගින් ඇතිවන ආදායම සහ ලාභදායිතාව වැඩි කිරීම
- හරිත ආර්ථිකයට සම්බන්ධ ණය ලබාදීමේ නිෂ්පාදන සැපයීම සහ පිරිසිදු බලශක්ති මූල්‍යකරණය තුළ විශේෂී දක්ෂතා යෙදවීම

### තර්ජන

- අඩු ආර්ථික වර්ධනය සහ දේශපාලනික අස්ථාවරත්වය
- වාණිජ බැංකු මෙන්ම බැංකු නොවන තරඟකරුවන් වෙතින් දැඩි තරඟකාරිත්වය
- බැංකු හා මූල්‍ය සේවා ක්ෂේත්‍රය කෙරෙහි දැඩි නියාමන හා අධීක්ෂණ වැඩපිළිවෙල
- සම්ප්‍රදායික ව්‍යාපාර ආකෘතින්ට අභියෝග කරන බාධාකාරී තාක්ෂණික ක්‍රම
- ගනුදෙනුකාර අවශ්‍යතා සහ අපේක්ෂා නිරන්තරයෙන් වෙනස්වීම
- ණය ශ්‍රේණිගත කිරීම් පහතවැටීම
- ශක්තීන් උත්තේජනය කරමින් තර්ජන අවම කිරීම
- අපගේ නිෂ්පාදන විශේෂණය කිරීමට 100%ක් රජයේ සහතිකය සහිත සන්නාමය සහ අසමසම තත්ත්වයන් භාවිතා කිරීම
- අපගේ ඩිජිටල් යටිතල පහසුකම් භාවිතයෙන් අපගේ ගනුදෙනුකාර පිවිසුම් ස්ථාන පුළුල් කිරීම සහ අපගේ ගනුදෙනුකාර පදනම වර්ධනය
- අපගේ පුළුල් පිවිසුම් මාර්ග තුළින් සුවිශේෂී ගනුදෙනුකාර අත්දැකීමක් පිරිනැමීම

## ශදුඅත (SWOT) විශ්ලේෂණය

### දුර්වලතා හා තර්ජනවලට මුහුණදීම

- අපගේ තාක්ෂණික දියුණුව භාවිතා කරමින් අපගේ පද්ධති සහ
- ක්‍රියාවලීන් වැඩිදියුණු කරමින් සහ වඩාත් වේගවත් කරමින්
- ගනුදෙනුකාර අත්දැකීම වර්ධනය කිරීම
- තොරතුරු තාක්‍ෂණය හා දත්ත විශ්ලේෂණය වැනි අනාගත
- බැංකුකරණය සඳහා අවශ්‍ය නව කුසලතා ලබාගැනීම
- අඩු වියදම් තැන්පතු, දිගුකාලීන තැන්පතු සහ දිගුකාලීන ණය ගැනීම්
- වර්ධනය සඳහා අවධානය යොමු කිරීම

### අවස්ථාවන් වලින් වාසි ලබාගැනීම තුළින දුර්වලතා මඟහරවා ගැනීම

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ණය වැඩි කිරීම සහ අපගේ ගනුදෙනුකාර පදනම වර්ධනය කර ආදායම් උත්පාදනය වැඩි කිරීම
- කාර්යක්ෂමතාව, ඵලදායිතාව වැඩි කිරීමට සහ දෝෂ අවම කිරීමට තාක්ෂණය යොදාගැනීම
- ණය කළඹ වර්ධනය කරන අතරම වඩා අඩු අක්‍රීය ණය අනුපාතයක් පවත්වා ගැනීමට අවදානම පිළිබඳ දැනුවත් සංස්කෘතියක් යොදා ගැනීම
- ඉතුරුම් තැන්පතු වැඩි කිරීම සඳහා ක්‍රියාවලි ස්වයංක්‍රියකරණය
- ප්‍රේෂණ වෙළෙඳපොල පැතිරවීම සහ ගාස්තු පදනම් ආදායම ඉහළ නැංවීම

### අවස්ථා

- ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් වර්ධනය කිරීම සඳහා රජයේ වගකීම ක්‍රියාත්මක කිරීමේදී ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ කාර්යභාරය
- එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු සඳහා රජයේ බැඳීම
- දේශගුණික වෙනස කෙරෙහි වර්ධනය වන අවධානය සහ හරිත ආර්ථිකයක් කරා විතැන්වීම
- වැඩිවන පරිභෝජනය සහ ණය සංස්කෘතිය
- ආර්ථික සංවර්ධනය තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය සහ එහි වැදගත්කම වැඩිකිරීම
- බැංකු කටයුතුවල ගතික තාක්ෂණික වැඩි දියුණු වීම
- විදේශ විනිමය ප්‍රේෂණ සඳහා වර්ධනය වන වෙළෙඳපොල

# උපාය මාර්ගික සිතියම

## දිගු කාලින උපාය මාර්ග

### ගනුදෙනුකරු මත පදනම්වීම

ජාතික ඉතිරි කිරීමේ බැංකුව තුළ, ගනුදෙනුකරුවන් අපගේ "ඉහළම වස්තුව" වන අතර ඔවුන්ගේ ප්‍රතිඵල අප කරන සෑම දෙයක්ම මෙහෙයවයි. තෝරාගත් බැංකුව බවට පත්වීමේ උපගේ උත්සාහයන්හී අපගේ ගනුදෙනුකාර මැදහත්වීම් තුළ සුපිරි ගනුදෙනුකාර අත්දැකීමක් ලබාදීමට අපි කැප වී සිටිමු. ගනුදෙනුකාර අවශ්‍යතා සමඟ අපගේ සම්පත් වෙන්කිරීමේ ක්‍රමෝපාය පෙළ ගස්වමින්, අපි නිරන්තරව ගනුදෙනුකරු මත පදනම් බැංකුවක් වන අතර ඉන් අපගේ ගනුදෙනුකරුවන්, ඔවුන් සමඟ අපගේ සම්බන්ධතා සහ ඔවුන් කෙරෙහි අපගේ කැපවීම අගය කරමු.

### පාලනය තුළ විශිෂ්ඨත්වය

ආයතනික පාලනය තුළ ඉහළම ප්‍රමිති පවත්වා ගනිමින් අනුකූලතාව සහ අවදානම් කළමනාකරණය පිළිබඳ සංස්කෘතියක් අපි පෝෂණය කරමු. ව්‍යාපාර ක්‍රියාවලිය සහ බැංකුව තුළ පාලන පරීක්ෂාවන් කාර්යක්ෂම, ශක්තිමත් සහ ජාත්‍යන්තර යහ පරිචයන් හා සමගාමීබව සහතික කිරීම මගින් උපාය මාර්ග සහ තරගකාරී වෙන්ස්කිරීම් කරන්නෙක් ලෙස පාලනය මෙහෙයවීම.


### ශක්තිය සහ තිරසාරභාවය

තරගකාරී, ලාභදායී සහ වගකීම් සහගත වටිනාකම මත අවධානය යොමු කරමින් ශක්තිමත්. තිරසාර සහ තුලනය කළ වර්ධනයක් අත්කර ගැනිම. මේ සම්බන්ධයෙන්. මූල්‍ය නුබුන්වත්කම්, ප්‍රාග්ධන තත්ත්වය, ආදායම් මාර්ග වැඩි කිරීම, නව්‍යකරණය සහ තිරසාරභාවය ශක්තිමත් කිරීම මගින් දිගුකාලින වටිනාකම උපරිම කිරීම කෙරෙහි අපි අවධානය යොමු කරමු.

### පරිවර්තනිය නායකයා

රජයට අයත් විශේෂිත බැංකුවක් ලෙස. ආදර්ශය, මෙහෙයුම් අනර්ඝත්වය, මූල්‍ය අන්තර්කරණය, ගනුදෙනුකාර සේවාව, සහ ව්‍යාපාර ආචාරධර්ම හා අවංකකම පිළිබඳ නියමයන් සැකසීම තුළින් සෑමවිටම අපි මෙහෙයවා ඇත. අපගේ සේවා සහ සියලුම ව්‍යාපාර ක්‍රියාවලීන්, බෙදාහැරීමේ මාර්ගවල නව්‍යකරණය ප්‍රවර්ධනය තුළින් සහ සහ මතුවන අවස්ථාවන් හී ප්‍රාග්ධනීයකරණය මගින් සියලුම ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත අපි අඛණ්ඩව ඉහළ නංවමු.

උපාය මාර්ග




කෙටි කාලයේ සිට මධ්‍ය කාලීන උපායමාර්ගික ප්‍රමුඛතා පිටු අංක 58 සිට 69 දක්වා පිටුවල විස්තරාත්මකව සාකච්ඡා කෙරේ.

පරිවර්තනීය නායකයා

ඓන්ද්‍රිය වර්ධනය ප්‍රවර්ධනය

ආදර්ශය මගින් මෙහෙයවීම

## කෙටි හා මධ්‍ය කාලීන උපාය මාර්ග

- දුරස්ථ සහ ඩිජිටල් ගනුදෙනුකාර ආකෘතිය ඉහළ නැංවීම
- සමස්ථ බැංකුව සඳහා ඇතිවියහැකි විශාල දත්ත සඳහා සන්නද්ධවීම
- මූල්‍ය උපදේශන මධ්‍යස්ථාන බවට ශාඛා පරිවර්තනය
- ගනුදෙනුකාර කොටස්කිරිම සහ ගමන්මග විශ්ලේෂණය
- ක්‍රියාවලි සහ ව්‍යුහ සරලකිරීම
- ගනුදෙනුකරුවන්ගේ දත්ත ආරක්ෂාව

- කඩිසර වැඩ තාක්ෂණය භාවිතයෙන් කණ්ඩායම් වැඩි කිරීම
- නවෝත්පාදන ලබාදීම සහ ප්‍රවර්ධනය සඳහා ප්‍රතිලාභ ලබාදීම
- වෘත්තීය හැකියාවන් සංවර්ධනය
- යහපත් සහ විවිධත්වය පිළිබඳ සංස්කෘතියක් ශක්තිමත් කිරිම
- සවිබලගැන්වීම මත පදනම් වී කළමනාකරණ ආකෘතිය ප්‍රවර්ධනය කිරිම
- විවිධත්වය, සමාන අවස්ථා සහ රැකියා දිවියේ තුලනය

- සේවක හැසිරීම සහ වටිනාකම් කෙරෙහි ශක්තිමත් අවධානය
- මුල්‍ය අපරාධ සහ සයිබර් අවදානම් අවම කිරීමේ හැකියාවන් ඉහළ නැංවිම
- අනුකූල නොවීම ශූන්‍ය කිරීම
- විනිවිදභාවය පිළිබඳ සංස්කෘතියක් ප්‍රවර්ධනය

- වෙළෙඳපොල කොටස වැඩිකිරිම
- ගනුදෙනුකරුවන් අත්කර ගැනීම සහ රඳවා ගැනීම
- වැදගත් ක්ෂේත්‍ර තුළ තිරසාර වර්ධනය
- ප්‍රාග්ධන පිරිවැය ඉක්මවීම සඳහා ලාභදායිතාව ඉහළ නැංවිම
- වත්කම් - වගකීම් නොගැලපිම අඩුකරමින් ශේෂ පත්‍රයේ ගුණාත්මතභාවය ඉහළ නැංවිම

- මූල්‍ය අන්තර්කරණය සඳහා කැපවීම
- වගකීම් සහගත සහ තිරසාර මුල්‍යකරණය ප්‍රවර්ධනය කිරීම
- හරිත ව්‍යාපාර ප්‍රවර්ධනය කිරිම
- පාරිසරික බලපෑම අවම කිරීම (පරිසරයට හිතැති වැඩසටහන් තුළින් කාබන් පාසටහන අඩුකිරීම)
- අර්ථවත් ප්‍රජා සහභාගිත්වය

## උපාය මාර්ගික සක්‍රිය කාරකයන්

තාක්ෂණය

අවදානම් කළමනාකරණය

නායකත්වය සහ පාලනය

ජනතාව සහ සංස්කෘතිය

නව්‍යකරණය

ක්‍රියාවලිය

## 2019 උපාය මාර්ගවල ප්‍රගතිය

- මිලියන 20.9ක් වූ ගිණුම්
- ඒකාබද්ධ තොරතුරු තාක්ෂණ පද්ධති
- යහපත් ශේෂපත්‍ර ආදායම/ලාභ වර්ධනය
- වැඩිදියුණු කළ ආන්තිකය සහ ප්‍රාග්ධන වර්ධනය
- අඩු මට්ටමේ අක්‍රීය ණය
- වැඩි සේවක රඳවාගැනීම
- රජයේ සුරැකුම්පත්වල දෙවැනි විශාලතම ආයෝජක

# ගනුදෙනුකරුවන්ගේ සේවා සහ අත්දැකීම ඉහළ නැංවීම

ගනුදෙනුකාර අත්දැකිම ඉහළ නැංවීම ප්‍රමුඛතාවන් හතරෙන් එකකි. සමස්ථ ගනුදෙනුකාර අත්දැකිම වැඩි කිරිමට විවිධ ගනුදෙනුකාර අවශ්‍යතා සපුරාලීම සඳහා අපි බහු -නාලිකා ප්‍රවේශයක් ගනිමු. අපගේ සන්නාමය සමඟ ගනුදෙනුකරුවෙක් නිරතවන සෑම ස්ථානයකදිම අද්විතීය ගනුදෙනුකාර අත්දැකීමක් ලබාදිමට අපි බැඳි සිටිමු. තාක්ෂණය, සේවකයින්, ක්‍රියාවලි, නිෂ්පාදන සහ සේවා කොටස තුළ අපගේ ආයෝජනයන් තුළින් ඒකාබද්ධ සහ වෙනස්කළ ගනුදෙනුකාර අත්දැකිම ලබාදීම සඳහා අපගේ උත්සාහයන් තහවුරු කරයි. අපගේ ඩිජිටල් යටිතලපහසුකම් සංවර්ධනය කරන අතරම, අපි අපගේ භෞතික පිවිසුම් ස්ථාන පවත්වාගෙන වර්ධනය කරන බැවින් මාර්ග අතර වඩා පහසු සංක්‍රාන්තියක් අපගේ ගනුදෙනුකරුවන්ට ඇති කරයි.

## එය වඩාත්ම වැදගත් වන්නේ ඇයි

ගනුදෙනුකාර සේවය උපායමාර්ගික වෙනස්කිරීමක් වන අතර ශක්තිමත් සහ තිරසාර මුල්‍ය කාර්යසාධනයක් ලබාදිම සඳහා ඒ තුළින් අපට හැකියාව ඇති කරමින් තරඟකාරි වාසියක් ලබා දේ. බලවත් සහ ස්ථාවර පාරිභෝගික සේවාවක් සහ අත්දැකීම් ලබාදීම තුළින් සහ මිනිසුන් සවිබල ගැන්වීම සහ ස්වයං විශ්වාසය තැබීම තුළ අපගේ ව්‍යාපාරයෙහි අනාගතය රඳා පවත්නා බව අප විශ්වාස කරමු.

## අපගේ සම්පත් වෙන්කිරිම

තොරතුරු තාක්ෂණ හැකියාවන්, තොරතුරු තාක්ෂණ ආරක්ෂාව සහ හැකියා ගොඩනැගිම තුළ ආයෝජන වැඩි කිරිමට අපගේ මූල්‍ය සහ මානව ප්‍රාග්ධනය අපි වෙන්කරන අතර එය භෞතික සහ ඩිජිටල් වත්කම් ඇතුළුව නිෂ්පාදන ප්‍රාග්ධනය මෙන්ම බුද්ධිමය ප්‍රාග ්ධනයද අත්පාදනය කරනු ඇත.



## අදාළ ප්‍රමාණාත්මක කරුණු

අපගේ ප්‍රමාණාත්මක කරුණු අප කළමනාකරණය කරන ආකාරය පිලිබඳ වැඩිදුර තොරතුරු සඳහා, 78 සිට 88 දක්වා පිටු බලන්න.



## දිගුකාලින පරමාර්ථ සහ තිරසාර සංවර්ධන අරමුණු සඳහා දායකත්වය

ගනුදෙනුකාර අත්දැකීම් ඉහළ නැංවීම සඳහා අප නව්‍යකරණය, ඩිජිටල් යටිතල පහසුකම්වල ආයෝජනය සහ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කරන අතර එය දිගුකාලීන තිරසාරභාවය ශක්තිමත් කරයි.




## විභව සමතුලිතතාව

- ගනුදෙනුකාර අත්දැකීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතා වර්ධනය කිරිමට ඩිජිටල්කරණය වැඩි කිරිම සඳහා අමතර තොරතුරු තාක්ෂණ සංවර්ධනය සහ ස්ථාවර සහ ආරක්ෂිත තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහතික කිරිමේ නඩත්තු පිරිවැය තුළ වැඩිවීමක් සහ අපගේ තොරතුරු තාක්ෂණ වත්කම පිලීබඳ වැඩිවන ක්ෂයකිරීමක් සහ ක්‍රමක්ෂය අවශ්‍යවේ.
- නව්‍යකරණ, පිවිසියහැකි සහ ඩිජිටල් වශයෙන් සකස් කළ විසඳුම් සංවර්ධනය කිරීම සයිබර් ආරක්ෂක අවදානම අවම කරමින් ගනුදෙනුකරුවන්ගේ පුද්ගලික තොරතුරු සහ රහස්‍යතාව සුරක්ෂිත කරමින් සිදුකළ යුතුය.

## උපායමාර්ගික ප්‍රමුඛතා අත්කර ගැනිම සඳහා ක්‍රියාමාර්ග

| | | | | | |
|---|---|---|---|---|---|
| 2019 දී ප්‍රමුඛතා | අපගේ ඩිජිටල් යටිතලපහසුකම් වර්ධනය කරමින් අපගේ ගනුදෙනුකරුවන්ගේ ඩිජිටල් අත්දැකිම අඛණ්ඩව වැඩි කිරීම | ක්‍රියාවලි කාර්යක්ෂමතාව සරලකිරිම සහ වැඩි කිරිම සහ ප්‍රමාද සහ දෝෂ අඩු කිරිමට ගෙවීම් ස්වයංක්‍රියකරණය | සම්මත තාක්ෂණික අවස්ථාවන් කරා සංක්‍රමණය | වඩාත් සම්බන්ධිත. අවධානිත ගනුදෙනුකාර අත්දැකිමක් ලබාදිම සඳහා දත්ත විශ්ලේෂණ පැවැත්විම | ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඩිජිටල් අවස්ථා සහ භෞතික පිවිසුම් ස්ථාන අතර පහසු විතැන්විම සඳහා අපගේ ගනුදෙනුකරුවන්ට හැකියාව ලබාදිම |
| ප්‍රගතිය | ගනුදෙනුකරුවන්ට පහසු බැංකුකරණ අත්දැකීම වැඩිකිරිම සහ ලබාදිම සඳහා වසර තුළ නව මධ්‍ය බැංකුකරණ විසඳුම අපි අත්කරගෙන ඇත | මුදල් කළමනාකරණ පද්ධතිවල ප්‍රසම්පාදනය, JustPay/ LPOPP/USD මාර්ගගත ගනුදෙනු වැනි ලංකා පේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | "Tier 3" සම්මතයට නිෂ්පාදන දත්ත මධ්‍යස්ථානය උසස් කිරීම | වඩා යහපත් ගනුදෙනුකාර අත්දැකිමක් ලබාදීමට තවදුරටත් බැංකුවට වර්ධනය කළ යුතු ස්ථාන ඇගයිමට MIS තුළින් දත්ත විශ්ලේෂණය අපි පවැත්වුවෙමු. | මාකෝල නව ශාඛාවක් විවෘත කළ අතර ඉන්ස්ටග්‍රෑම් ආරම්භ කර වෙබ් අඩවිය, මුහුණු පොත, ට්විටර්, ලින්ක්ඩ්ඉන්, යු ටියුබ් තුළින් පහසුකම් අඛණ්ඩව ලබා දේ |

**සාක්ෂාත් කරගන්නා ලදී**

## උපාය මාර්ගවලට අනුව අපගේ කාර්යසාධනය

| මූලික කාර්යසාධන දර්ශක | වටිනාකම් නිර්මාණයට එය දායක වන ආකාරය | වාර්ෂික වෙනස | 2019 | 2018 | අනාගත දැක්ම/ඉලක්ක |
|---|---|---|---|---|---|
| ශාඛා විවෘත කිරීම | පිවිසුම් හැකියාව සහ පහසුව වැඩිකිරීම | 1 ▲ | **256** | 255 | විවෘත කිරීමේදී හා ස්ථාන මාරු කිරීමේදී උපාය මාර්ගික ස්ථාන කෙරෙහි අවධානය |
| ශාඛා නැවත ස්ථානගත කිරීම | | (5) ▼ | **7** | 12 | |
| ස්ථාපිත නව ATM/CRM | ස්වයං සේවා මාර්ග ශක්තිමත් කිරීම සහ ගනුදෙනුකරුවන් රැඳී සිටින කාලය අවම කිරීම | 24 ▲ | **334** | 310 | ගනුදෙනුකරුවන්ට තම පහසුව පරිදි මුදල් පාලනය කිරීමට ඔවුන් ශක්තිමත් කිරීම |
| අන්තර්ජාල බැංකු පරිශීලකයින්ගේ ගණන | | 6,261 ▲ | **18,928** | 12,667 | |
| අන්තර්ජාල බැංකු ගනුදෙනු ගණන | | 194,738 ▲ | **495,426** | 300,688 | |
| ගනුදෙනුකාර පැමිණිලි ගණන | ගනුදෙනුකාර සේවා තත්ත්වය සහ තෘප්තිය | 1,034 ▲ | **3,678** | 2,644 | ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි අඩුකිරීම |
| ශ්‍රී ලංකාවේ සන්නාම වටිනාකම් ශ්‍රේණිගතකරණය (Brand Finance විසින්) | ගනුදෙනුකරුවන්ගේ කැමතිම සන්නාමය | – | **5** | 5 | සන්නාම ශ්‍රේණිගතකරණය වර්ධනය |
| තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතිවල ආයෝජනය (රු. මි.) | ඩිජිටල් ආකාරයෙන් ශක්තිමත් කළ විසඳුම් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව | (82) ▼ | **691** | 773 | ඩිජිටල් භාවිතාව සහ අත්දැකීම අඛණ්ඩව වැඩි කිරීම |
| ආදර්ශ ශාඛා ලෙස පරිවර්තනය කළ නවීන ආකාරයෙන් සැලසුම් කළ ශාඛා ගණන | පිවිසුම් හැකියාව සහ පහසුව | 34 ▲ | **39** | 5 | ශාඛාවල ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම ඉහළ නැංවීම |

## අනාගතය දැකීම

- ගනුදෙනුකාර අපේක්ෂාවන් සහ වෙනස්වන අවශ්‍යතාවන්ට අනුව අපගේ නිෂ්පාදන, සේවා සහ ගනුදෙනුකරු වෙත ළඟා වන මාර්ග අඛණ්ඩව ඉහළ නැංවීම
- දුරස්ථ සහ ඩිජිටල් ගනුදෙනුකාර සේවා ආකෘතිය වැඩි දියුණු කිරීම
- නව්‍යකරණ, පිවිසියහැකි සහ ඩිජිටල් වශයෙන් සකස් කළ විසඳුම් සංවර්ධනය කිරීම සයිබර් ආරක්ෂක අවදානම අවම කරමින් ගනුදෙනුකරුවන්ගේ පුද්ගලික තොරතුරු සහ රහස්‍යතාව උල්ලංඝනය නොකරමින් සිදු කිරීම.
- අපගේ පිය සටහන ශක්තිමත් කිරීමට තැපැල් ජාලය පුළුල් කිරීම



# සේවක සහභාගිත්වය වැඩි කිරීම

වඩා යහපත් ගනුදෙනුකාර ප්‍රතිඵල සහ අත්දැකීම් ලබාදීම සඳහා අපගේ සේවකයින් මත අපි රැඳී සිටිමු. නිවැදි දක්ෂතා සහිත සේවයේ නිරත අභිප්‍රේරිත සේවක කණ්ඩායම් නිර්මාණය කිරීම අපගේ ව්‍යාපාරය ඵලදායී ආකාරයෙන් මෙහෙයවීමට මෙන්ම අපගේ පාර්ශ්වකරුවන් සඳහා වටිනාකම් නිර්මාණය කිරීමට අත්‍යවශ්‍යය. එමනිසා, ආරක්ෂිත සහ අගනා ප්‍රතිඵල ලබාදෙන පරිසරයන් නිර්මාණය කිරීම සහ ආදර්ශය මගින් මෙහෙයවන ඉහළින් දක්ෂ අභිප්‍රේරිත, මනා සන්නිවේදනය, නිපුණතා සහිත ප්‍රතිග්‍රාහී සහ වගකීම්සහගත සේවයෙහි නියැලුනු සේවක කණ්ඩායම් පෝෂණය කිරීම මගින් නිවැරදි සේවකයින් ආකර්ෂණය කර රඳවාගැනීමට අපි කැප වී සිටිමු.

## එය වඩාත්ම වැදගත් වන්නේ ඇයි

අපගේ ගනුදෙනුකාර කේන්ද්‍රීය ව්‍යාපාරයට සහයවීමට අවශ්‍යවන සුදුසුකම්, දැනුම සහ සේවක නිපුණතා ඇති පුද්ගලයින් බඳවා ගැනීම සහ සංවර්ධනය කිරීම අපට පවත්නා අභියෝගයකි. රාජකාරියෙන් ඔබ්බට අපගේ සේවකයින් ගෙනයාමට සහ ජාතියේ ඉතුරුම් සඳහා වඩාත් විශ්වාසී සහ බෝහෝ දෙනාට ප්‍රිය වූ තෝරාගත් බැංකුව වීමේ අපගේ දැක්මට සහයවීමට ඔවුන් පොළඹවන ලබයි.

## සම්පත් වෙන්කිරීම

වැඩිකළ සේවක ඵලදායිතාව, දායකත්වය සහ සහභාගිත්වය මෙන්ම අපගේ සන්නාමය සහ කීර්තිනාමය ඉහළ දැමීමට හේතු වන අපගේ සේවකයින් සහ ඔවුන්ගේ යහපැවැත්ම සංවර්ධනය කිරීමෙහි ලා අපගේ කාලය සහ මුදල්වලින් සැලකියයුතු ආයෝජනයක් අපි සිදුකරමු.

## අදාළ ප්‍රමාණාත්මක කරුණු

අපගේ ප්‍රමාණාත්මක කරුණු අප කළමනාකරණය කරන ආකාරය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා, 78 සිට 88 දක්වා පිටු බලන්න.

## දිගුකාලීන පරමාර්ථ සහ තිරසාර සංවර්ධන අරමුණු සඳහා දායකත්වය

අපගේ නිපුණතා සංවර්ධන වැඩසටහන් තුළින් වටිනා දැනුම, පුහුණුව සහ අත්දැකීම ලබාගැනීම දිගුකාලීනව බැංකුවේ තිරසාරභාවය ශක්තිමත් කරයි.

4 QUALITY EDUCATION | 10 REDUCED INEQUALITIES | 11 SUSTAINABLE CITIES AND COMMUNITIES

## විභවසමතුලිතතාව

- අපගේ උපායමාර්ගික පරමාර්ථ අත්කර ගැනීමට අවශ්‍ය නිවැරදි දක්ෂයින් ආකර්ෂණය කර ගැනීමට සහ ඔවුන් සංවර්ධනය කර රඳවාගැනීමට පුහුණු සහ සංවර්ධනය සහ සේවක යහපැවැත්ම ඇති කිරීමට අවශ්‍ය සැලකියයුතු ආයෝජනයක් සිදු කිරීමට අවශ්‍ය වේ.
- අපගේ අනාගත තරඟකාරිත්වයට ප්‍රධාන වන ඩිජිටල්කරණය අප ව්‍යාපාරය කරන ආකාරය වෙනස් කරයි. අපගේ අනාගත හැකියා අවශ්‍යතා තුළ විතැන්වීම් වාණිජ සහ සමාජ ප්‍රතිෂ්ඨාවන් තුලනය කරමින් වගකීම්සහගත ආකාරයකින් කළමනාකරණය කිරීම අවශ්‍යය

## උපාය මාර්ගික ප්‍රමුඛතා අත්කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග

| | | | | |
|---|---|---|---|---|
| 2019 ප්‍රමුඛතා | ජාතික ඉතිරි කිරීමේ බැංකුවට දක්ෂයින් හඳුනාගෙන ආකර්ෂණය කිරීම සහ සේවක රඳවාගැනීමේ උත්සාහය අඛණ්ඩව ඉදිරියට ගෙන යාම | පාසල් හැරගියවුන් සහ උපාධිධාරීන් සඳහා පළමු රැකියා අත්දැකීම ලබාදීම | සේවක පුහුණු අවශ්‍යතා සහ අපේක්ෂාවන් සපුරාලීමට පුහුණු සහ සංවර්ධන වැඩසටහන් ප්‍රශස්ථ කිරීම | ගනුදෙනුකාර අපේක්ෂාවන් වඩා හොඳින් සපුරාලීමට සේවකයින්ට සහයවීම සඳහා සියලුම ඩිජිටල් අවකාශ සහ අභ්‍යන්තර ඩිජිටල් ක්‍රම ඉහළ නැංවීම |
| ප්‍රගතිය | රඳවාගැනීමේ අනුපාතය 0.2% ක වැඩිකිරීමක් සමඟ 98.01% දක්වා ඉහළ නංවා ඇති අතර හීඊ පවුලට සේවකයින් 296ක් පිළිගෙන ඇත | රැකියා සහ සීමාවාසික අවස්ථා 317ක් ලබාදී ඇත | එක් සේවකයෙක්ට පුහුණු පැය 7ක් ලබාදී ඇත. | අන්තර්ජාල ඇඑඩො ගෙවීම් පහසුකම්. සෘජු ණය පහසුකම් සහ Just Pay පහසුකම් ක්‍රියාත්මක කිරීම |

සාක්ෂාත් කරගන්නා ලදී

## උපාය මාර්ගවලට අනුව අපගේ කාර්යසාධනය

| මූලික කාර්යසාධක දර්ශක | වටිනාකම් නිර්මාණයට එය දායක වන ආකාරය | වාර්ෂික වෙනස | 2019 | 2018 | අනාගත දැක්ම/ඉලක්ක |
|---|---|---|---|---|---|
| සේවක පිරිවැය (රු.බි.) | වේතන. දිරිදීමනා සහ අනෙකුත් ප්‍රතිලාභ | 895 ▲ | **10,158** | 9,263 | තරඟකාරී වේතන ව්‍යුහයක් පවත්වා ගැනීම |
| වෘත්තීය සමිති වැටුප් වැඩිවීම් (%) | කේවල් කිරීම මත වැටුප් වැඩිකිරීම් | – | **22** | 22 | තරඟකාරී වැටුප් ගෙවනු ලබන සේවායෝජකයෙක් වීම |
| සේවක පිරිවැටුම (%) | දක්ෂයින් රඳවාගැනීමේ හැකියාව | 0.2 ▼ | **1.9** | 2.1 | රඳවාගැනීමේ අනුපාතය පවත්වාගෙන යාම හා වර්ධනය කිරීම |
| සෑම මට්ටමකදිම ස්ත්‍රීපුරුෂ (පිරිමි : ගැහැණු) අනුපාතය | විවිධ සහ සමාන අවස්ථා සපයන සේව ාස්ථානයක් වීම | 1:0 ▲ | **5:5** | 6:5 | වෙනස්කම් සිදු කිරීම ඉදිරියට ගෙනයාම |
| විධායක මට්ටම සහ ඊට ඉහළ කාන්තා ප්‍රතිශතය | | 1 ▲ | **25** | 24 | |
| වයස අවුරුදු 35ට අඩු සේවක ප්‍රතිශතය | අනාගත පරම්පරාවල සිටින දක්ෂයින් බඳවාගැනිම සහ රඳවාගැනීම | 1 ▼ | **67** | 68 | අඛණ්ඩව දේශීය රැකියා සපයන්නෙක් විම |
| සේවක මැසිවිලි මුළු සේවකයින්ගෙන් ප්‍රතිශතයක් ලෙස | සේවක තෘප්තිය සහ ඔවුන්ගේ අදහස් සහ මැසිවිලි ඉදිරිපත් කිරිමට හැකියාව ලබාදිම | 0.16 ▼ | **0.69%** | 0.85% | ධනාත්මක වැඩ පරිසරයක් ඇති කරමින් මැසිවිලි අඩුකිරීම |
| පුහුණුව සහ සංවර්ධනය තුළ ආයෝජනය (රු.මි.) | හැකියා වර්ධනය සහ ඉහල නිපුණතා සහිත සේවයේ නියුක්ත ශ්‍රම බලකාය වැඩි කිරීම | 0.8 ▲ | **39.4** | 38.6 | පුහුණු සහ සංවර්ධනය තුළ අඛණ්ඩ ආයෝජනය |
| පුහුණු පැය ගණන | | 26,452 ▼ | **32,138** | 58,590 | |
| ඉගෙනුම් වැඩසටහන් ගණන | | 181 ▼ | **131** | 312 | අනාගත නිපුණතා අවශ්‍යතා පිළිබඳ පුහුණු වැඩසටහන් ගණන වැඩිකිරීම |
| දුරස්ථ ඉගෙනුම් කටයුතු සහ සහභාගිවූවන්ගේ ගණන (Webinars) | දැැය හැකි පහසු සහ ඵලදාය පුහුණු ක්‍රම | 6 ▲ | **9** | 3 | ඉ-පුහුණු ක්‍රම වැඩිකිරීම |

## අනාගතය දැකීම

- රැකියා-ජීවිත සමබරතාව සමඟ රැකියාවේදී සේවක සතුට සහ පක්ෂපාතිත්වය වැඩිකිරීම
- සේවක සංවර්ධනය සහ සහභාගිත්වය කෙරෙහි විශේෂ අවධානය සමඟ ධනාත්මක වැඩ සංස්කෘතියක් බිහිකිරීම
- ඉ-ඉගෙනුම් සංස්කෘතියක් නිර්මාණය කිරීම
- ඩිජිටල් පරිනාමනය සඳහා අවශ්‍ය වන වෙනස කළමනාකරණය
- උසස් තත්ත්වයේ ගනුදෙනුකාර සේවය ලබාදීමට
- අවශ්‍ය කාර්ය මණ්ඩල සංවර්ධනය සඳහා පුහුණුව
- ඉලක්ක සපුරාලීම මත ගෙවනු ලබන වැටුප් ක්‍රමයක් නිර්මාණය කිරීම
- වෘත්තිය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ තෝරා ගැනීමේදී සහ අභ්‍යන්තර උසස්වීම් ලබාදීමේදී කුසලතා පදනම්ව සිදු කිරීම



# අවදානම් සංස්කෘතියක් සවිබලගැන්වීම

නිරන්තරයෙන් වෙනස්වන පරිසරයක් තුළ ඇතිවන විවිධ අවදානම් ඵලදායි ආකාරයෙන් අපේක්ෂාකර පාලනය කිරිමට යහපත් අවදානම් සංස්කාතියක් ස්ථාපිත කිරීම. අවදානම් විචක්ෂණශීලීව කළමනාකරණය කිරීම සඳහා අපගේ උපාය මාර්ග සහ මෙහෙයුම් වැඩිදියුණු කිරීම සහ අපගේ ව්‍යාපාර ආකෘතියට අනුව පෙළගස්වමින් එය වැඩි දියුණු කළ හැකි ආකාරය ගවේෂණය කරමු. අදාළ සියලූම රෙගුලාසි, ප්‍රමිති සහ මනා පරිචයන් සමඟ සම්පූර්ණයෙන් අනුකූලවිම මගින් සහ අපගේ අවදානම් හැකියාවන් ශක්තිමත් කිරීමට නව තාක්ෂණයන් යොදා ගනිමින් සදාචාරාත්මකව මෙහෙයවීමට සහ යහපත් අවදානම් සංස්කෘතියක් සවිබලගැන්විමට අපි තවදුරටත් බැඳි සිටිමු.

## එය වඩාත්ම වැදගත් වන්නේ ඇයි

මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සහ ආරක්ෂාව සහතික කිරීමේදී බැංකුව අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. මහජන ධනයේ භාරකරුවෙක් ලෙස, අවදානම් සංස්කෘතියක් සවිබලගැන්වීම මගින් ඉහළම ප්‍රමිතියේ ආචාරධර්ම සහ අවංකකම පිළිබඳ වගකීමට සහ දරාගැනීම අපට අවශ්‍යය. නිති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම සැලකියයුතු දඩ, දඩුවම්, තහංචි හෝ බලපත්‍රය ඉවත් කිරීමකට හේතු විය හැක.

## සම්පත් වෙන් කිරීම

සියලූම ආකාරයේ අක්‍රමිකතා සහ මූල්‍ය අපරාධ හඳුනාගැනීමට සහ වැලැක්වීමට ශක්තිමත් ලේඛන සහ ක්‍රියාවලි ස්ථාපිත කිරීමට ක්‍රම සහ සේවකයින් ඒ වෙනුවෙන් පුහුණු කිරීම සඳහා මුදල් ප්‍රාග්ධනය අපි ආයෝජනය කරමු.

## අදාළ ප්‍රමාණාත්මක කරුණු

අපගේ වැදගත් කරුණු අප කළමනාකරණය කරන ආකාරය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා, 78 සිට 88 දක්වා පිටු බලන්න.

## දිගුකාලින පරමාර්ථ සහ තිරසාර සංවර්ධන අරමුණු සඳහා දායකත්වය

අනුකූලතාව සහ මනා පරිචයන් සහතික කිරීම සඳහා අපගේ ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි පිළිබඳ අඛණ්ඩ තක්සේරුව සහ ගැලපීම. මූල්‍ය පරිසර පද්ධතිය තුළ අපට ස්ථාවර, ආරක්ෂිත සහ ශක්තිමත් ආයතනයක් වීමට පෙළඹීම ඇති කරයි.

8 DECENT WORK AND ECONOMIC GROWTH

16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS

## විභව සමතුලිතතා

- ගනුදෙනුකාර වර්ධනයට සහ අපගේ ආදායම් උත්පාදන හැකියාවට බාධා පමුණුවන සමාජීය සහ ආර්ථික අංග සැලකිල්ලට ගනිමින් අපගේ ණය නිරාවරණය කළමනාකරණය කිරීමේදි අපගේ අවදානම් රුචිය දැඩි කිරීමට අවශ්‍ය වේ.
- නිරතුරුව වෙනස්වන නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතා කඩිනම් සහ පහසු ආකාරයකින් ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් සපුරාලිමට අපට ඇති හැකියාව පහළ දමයි.
- නව නියාමන අවශ්‍යතාවන්ට අනුකූලවීම තුළින් අනුකූලතාවය සඳහා පිරිවැය දැරීමට, තාක්ෂණය පදනම් අවදානම් විසඳුම් ස්ථාපිත කිරීමට, අපගේ සේවකයින් පුළුල්ව පුහුණු කිරීමට සහ විශ්වාසි ආයතනයක් ලෙස අපගේ කීර්තිනාමය ආරක්ෂා කිරීමට ව්‍යාපාර ක්‍රම යොදා ගැනීමට අවශ්‍ය වේ.

## උපාය මාර්ගික ප්‍රමුඛතා අත්කර ගැනිම සඳහා ක්‍රියාමාර්ග

| | | | | | |
|---|---|---|---|---|---|
| 2019 දී ප්‍රමුඛතා | වෙනස්වන සංදර්භයට ප්‍රතිචාරාත්මකව අවදානම් රුචිය කලින් කල සමාලෝචනය සහ සංශෝධනය | මෙහෙයුම් පරිසරය තුළ වෙනස්විම්වලට වඩා හොඳින් ප්‍රතිචාර දැක්වීමට අපගේ උපාය මාර්ග, අවදානම, අනුකූලතාව සහ ක්‍රියාවලි පෙළගැසිම | අවදානම විචක්ෂණශීලී ලෙස කළමනාකරණයව | සදාචාර හැසිරීම සහිත සංස්කෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කරයි. | මූල්‍ය අපරාධ සහ සයිබර් අවදානම් මැඩ පැවැත්විමට තොරතුරු තාක්ෂණ හැකියාවන් හි ආයෝජනය |
| ප්‍රගතිය | බැංකුවේ උපාය මාර්ග සහ මෙහෙයුම් වාතාවරණය පිළිබඳ සලකා බලමින් වසර තුළ අවදානම් අභිරුචි රාමුව සමාලෝචනය කරන ලදී. | බැංකුවේ ත්‍රෛවාර්ෂික උපාය මාර්ගික සැලැස්ම අදාළ කාලයේ උපාය මාර්ග, අවදානම, අනුකූලතාවය සහ බැංකුව මෙහෙයුම් පරිසරයේ වෙනස්වීම්වලට වඩා හොඳින් ප්‍රතිචාර දක්වන ආකාරය ඇතුළත් කර ඇත. | බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත අවදානම් රුචි මට්ටම් තුළ මෙහෙයවන අතර සැමවිටම සක්‍රීය අවදානම් කළමනාකරණ ප්‍රවේශයක් අනුගමනය කරයි. | බැංකුවේ අචාරධර්ම සංග්‍රහය සියලූම සේවකයින් අතර බෙදාදෙන අතර සදාචාර හැසිරීම අඛණ්ඩ දැනුවත් කිරීම සිදු කෙරේ. | ගෙවීම් කාඩ් ක්ෂේත්‍රයේ දත්ත ආරක්ෂක ප්‍රමිති (PCI DSS) ක්‍රියාත්මක කරනු ලැබූවේ එය ක්‍රියාත්මක කළ පළමු රජයේ බැංකු බවට පත්වෙමිනි. |

**සාක්ෂාත් කරගන්නා ලදී**

## උපාය මාර්ගවලට අනුව අපගේ කාර්යසාධනය

| මූලික කාර්යසාධක දර්ශක | වටිනාකම් නිර්මාණයට එය දායක වන ආකාරය | වාර්ෂික වෙනස | **2019** | 2018 | අනාගත දැක්ම/ඉලක්කය |
|---|---|---|---|---|---|
| ස්ථර I ප්‍රාග්ධන අනුපාතය - බාසල් III අනුකූලතවය | ප්‍රාග්ධන තත්ත්වයෙහි ප්‍රබලතාව | 1.06 ▼ | **12.02** | 13.08 | පළමු පෙළ 8.5% සහ මුළු ප්‍රාග්ධනය 12.5% ක නියාමන අවමයට ඉහළ අනුපාතයක් අත්කර ගැනිම |
| CAR – මුළු ප්‍රාග්ධන අනුපාතය - බාසල් III අනුකූලතවය | | 1.55 ▼ | **14.35** | 15.90 | |
| LCR – බාසල් III අනුකූලතවය | ද්‍රවශීල තත්ත්වයෙහි ප්‍රබලතාව | 44.65 ▼ | **276.64** | 321.29 | 100% ක නියාමන අවමයට ඉහළ අනුපාතයක් අත්කර ගැනිම |
| NSFR – බාසල් III අනුකූලතවය | ස්ථාවර අරමුදල්වල ප්‍රබලතාව | 28.51 ▲ | **175.18** | 146.67 | |
| තෝලනය - බාසල් III අනුකූලතවය | ණයගැනීම් තත්ත්වයෙහි ප්‍රබලතාව | 0.37 ▲ | **5.13** | 4.76 | 3.0% ක නියාමන අවමයට ඉහළ අනුපාතයක් අත්කර ගැනිම |
| අක්‍රිය ණය අනුපාතය | වත්කම්වල ගුණාත්මකභාවයෙහි ප්‍රබලතාව | 0.13 ▲ | **1.57** | 1.44 | ක්ෂේත්‍රයේ සාමාන්‍යයට පහළ පවත්වා ගැනීම |
| නියාමන දඩ සහ දණ්ඩන | නියාමන අවශ්‍යතාවන්ට අනුකූලවීමේ ප්‍රමාණය | – | **0** | 0 | දඩමුදල්වල අවදානම වැඩි වී තිබුනද ශූන්‍ය |
| තොරතුරු දූනුම්දීමේ ප්‍රතිපත්තිය යටතේ ලද අනාවරණ ගණන | අක්‍රමිකතාව හෝ අවපරිචය පිළිබඳ ගැටළු මතුවීම | – | **0** | 0 | ශූන්‍ය |
| තාක්ෂණික සිදුවීම්වල අඩුවිම | තොරතුරු තාක්ෂණ ක්‍රම සහ ක්‍රියාවලිවල ස්ථාවරත්වය | – | **0** | 0 | ශූන්‍ය |

## අනාගතය දැකීම

- විචක්ෂණ සහ විනය ගරුක ආකාරයකින් ව්‍යාපාර වර්ධනය ඇති කිරීමට ශක්තිමත් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව රඳවා ගැනීම
- පාරිසරික, සමාජීය සහ පාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරිම සහ එයට ඒකාබද්ධ කිරීම
- අක්‍රමිකතා හඳුනාගෙන වැලැක්විමට සඳහා ඩිජිටල් හැකියාවන් යොදාගැනිම
- සයිබර් අරක්ෂාව ඇති කිරීමට ශක්තිමත් ක්‍රියාවලි සහ පාලනයන් පවත්වා ගැනිම



# ඓන්ද්‍රීය වර්ධනය ප්‍රවර්ධනය

අපගේ ආරම්භයේ සිට, ශ්‍රී ලංකාව තුළ ඉතුරුම් සංස්කෘතියක් ඇති කිරීම සඳහා අපගේ විධි නියෝගය අත්කර ගැනීමට අපගේ ක්‍රම. මෙහෙයුම් සහ උපාය මාර්ගික ප්‍රමුඛතා අපි මෙහෙයවා ඇත. වසර 46ක මෙහෙයුම තුළ, සියලුම ශ්‍රී ලාංකිකයින් විසින් විශ්වාස කරන ආයතනය බවට අප පත්ව ඇත.

මූල්‍ය ස්ථාවරත්වය සහ ඓන්ද්‍රීය වර්ධනය අත්කර ගැනීමට අපගේ ක්‍රම සහ ක්‍රියාවලි අපි උපයෝගී කර ගනිමු. බැංකුව තුළ බහු මාර්ගික උත්සාහ තුළින්, අපගේ පාර්ශ්වකරුවන්ට තිරසාර ප්‍රතිඵල වර්ධනය කර නිර්මාණය කිරීමට ගනුදෙනුකාර අත්දැකීම, සේවක සහභාගිත්වය සහ විචක්ෂණ අවදානම් කළමනාකරණය වර්ධන කිරීම කෙරෙහි අපි අවධානය යොමු කරමු.

## එය වඩාත් වැදගත් වන්නේ ඇයි

ක්ෂේත්‍රය තුළ අපගේ තරගකරුවන් සමඟ තරග කිරීම සඳහා සහ ආර්ථික වියවුල්වලින් ඇතිවන පීඩනයට ඔරොත්තුදීම සඳහා අපගේ හැකියාව පෙන්වාදීම අවශ්‍යය. ඒ සමගම, අපගේ සියලුම පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතාවන් තෘප්තිමත් කිරීමට ප්‍රමාණවත් ප්‍රතිඵල උත්පාදනය කිරීම අවශ්‍ය වේ.

## සම්පත් වෙන් කිරීම

අපගේ අවදානම් රුචි මට්ටම් තුළ ප්‍රතිඵල ප්‍රශස්ත කිරීම සඳහා ලාභදායි මාවත්වල ආයෝජනය කිරීම කෙරෙහි අපි අවධානය යොමු කරන අතර අපේක්ෂිත අලාභ අවම කිරීමට සහ අනපේක්ෂිත අලාභවලින් බැංකුව සුරක්ෂිත කිරීමට ශක්තිමත් අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි භාවිතා කරමු.

## අදාළ ප්‍රමාණාත්මක කරුණු

අපගේ වැදගත් කරුණු අප කළමනාකරණය කරන ආකාරය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා, 78 සිට 88 දක්වා පිටු බලන්න.

## දිගුකාලීන පරමාර්ථ සහ තිරසාර සංවර්ධන අරමුණු සඳහා දායකත්වය

අප ක්‍රියාත්මක වන මෙහෙයුම් පරිසරයේ ජනතාව සහ ප්‍රජාවන්ට ප්‍රයෝජනවත් වන නිෂ්පාදන. සේවා සහ පහසුකම් ලබාදෙමින් සමාජය සඳහා වටිනාකම් උත්පාදනය කිරීම සඳහා අපගේ හැකියාව මත අපගේ දිගුකාලීන සාර්ථකත්වය රඳා පවතී.

8 DECENT WORK AND ECONOMIC GROWTH

## විභව සමතුලිතතා

- වත්කම් වර්ධනය සඳහා අපට අවශ්‍ය අරමුදල් සඳහා ප්‍රාග්ධනය ආකර්ෂණය කිරීමට තැන්පතුකරුවන් ඇතුළුව අපගේ කොටස්හිමියන් සහ ණය සපයන්නන් වෙත සුදුසු ප්‍රතිලාභ ලබාදීම බැංකුවට අවශ්‍ය වේ. මේ සඳහා පිරිවැය දරමින් අපගේ සේවාදායකයින්ගේ අවශ්‍යතා අඛණ්ඩව සහ තිරසාරව සපුරාලීම සහ අපගේ තරගකාරී ස්ථානය ශක්තිමත් කිරීම මගින් අපගේ ආදායම් උත්පාදනය වැඩිකරගැනීම අවශ්‍ය වේ.

## උපාය මාර්ගික ප්‍රමුඛතා අත්කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග

| | | | | | |
|---|---|---|---|---|---|
| 2019 දී ප්‍රමුඛතා | ආදායම උත්පාදනය හා ඉපයීම් උච්ඡාවචනය අඩුකිරීමට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ පිරිනැමීම් අඛණ්ඩව විවිධාංගීකරණය කිරීම | ඓන්ද්‍රීය වර්ධනය ඉදිරියට ගෙනයාමට අභ්‍යන්තර ක්‍රම සහ ක්‍රියාවලි ක්‍රමවත් කිරීම | 10%-15% පරාසය තුළ මධ්‍යකාලීන ස්කන්ධය මත ඉපයීම් අනුපාතය ඉහළ දමමින් කොටස්හිමියන්ගේ ඉපැයීම් ඉහළ දැමීම | ක්ෂේත්‍රයේ වර්ධනයට සමගාමීව තැන්පතු සහ ණය වර්ධනය ඉහළ නැංවීම | වෙළෙඳපොල කොටස පහත වැටීම පාලනය කර එය ඉහළ නැංවීම |
| ප්‍රගතිය | ණය නිෂ්පාදන ව්‍යුහයේ ගාස්තු ප්‍රතිශෝධනය, PFCA ගනුදෙනුකරුවන් සඳහා ATM කාඩ්පත් හඳුන්වාදීම, ජාත්‍යන්තර මෙහෙයුම් පුළුල් කිරීමට එමිරේට්ස් NBD සහ Gmoney Trans සමඟ නව ව්‍යාපාරික සම්බන්ධතාවන්ට ඇතුළත්වීම | අධිකාරී සීමාවන් වෙනස් කිරීම, පද්ධතිවල තොරතුරු ආරක්ෂාව වර්ධනය කිරීම, උසස් තොරතුරු තාක්ෂණ විසඳුම් ප්‍රසම්පාදනය | 10%-15% ක ස්කන්ධය මත ඉපයීම් අත්කරගෙන ඇත | **ණයදීමේ වර්ධනය**<br>බැංකුව – 7.44%<br>ක්ෂේත්‍රය – 5.6%<br><br>**තැන්පතු වර්ධනය**<br>බැංකුව – 21.1%<br>ක්ෂේත්‍රය – 7.9% | (see table below) |

| වෙළෙඳපොල කොටස | 2019 (%) | 2018 (%) |
|---|---|---|
| මුළු වත්කම් | **9.26** | 8.81 |
| තැන්පතු | **10.75** | 9.58 |
| ණය සහ අත්තිකාරම් | **5.72** | 5.60 |
| ප්‍රේෂණ | **3.29** | 3.07 |

සාක්ෂාත් කරගන්නා ලදී

මේ සම්බන්ධයෙන්, පහත සඳහන් අරමුණු සඳහා ආයෝජනය කිරීම අවශ්‍ය වේ:

- **තොරතුරු තාක්ෂණ ක්‍රම සහ හැකියාවන්:** අපගේ නිමැවුම්, සේවාවන් හා විසඳුම් ඩිජිටල්කරණය කිරීම සඳහා සහ දැරිය හැකි මුදලකට පහසු මාර්ග ලබාදීම සඳහා සැලකිය යුතු පිරිවැයක් දරමින් අපගේ ඩිජිටල් අවකාශ නව්‍යකරණය කළයුතු වේ.
- **ශක්තිමත් සහ නිරත සේවකයින්:** නිවැරදි සේවකයින් ආකර්ෂණය කර රඳවාගැනීම තුළ අපි ආයෝජනය කරන අතර ඔවුන්ගේ කඩිසරබව ඇති කරමින් පුහුණු සහ අනෙකුත් සහභාගිත්ව වැඩසටහන් තුළින් සහ සුවිශේෂී සේවාදායක අත්දැකීම් ලබාදෙමින් ඔහුන්ගේ හැකියාව ගොඩනගමු.
- **සමාජ ආර්ථික සංවර්ධනය:** ප්‍රජා සහභාගිත්ව වැඩසටහන්වල අපි ආයෝජනය කරන අතර ඉන් සමාජ ආර්ථික සහ පාරිසරික තිරසාරභාවය උත්තේජනය කරයි. එමෙන්ම අපි වගකීම්සහගත ආකාරයකින් අපගේ පාරිසරික පාසටහන් අවම කිරීමට සහ මෙහෙයවීමට සේවකයින්, ක්‍රම, සහ ක්‍රියාවලි තුළ ආයෝජනය කරමු.

## උපාය මාර්ග වලට අනුව අපගේ කාර්යසාධනය

| මූලික කාර්යසාධක දර්ශක | වටිනාකම් නිර්මාණයට එය දායක වන ආකාරය | වාර්ෂික වෙනස | | 2019 | 2018 | අනාගත දැක්ම/ඉලක්කය |
|---|---|---|---|---|---|---|
| කොටසකට ලාභාංශය | කොටස් හිමියාට ලාභාංශය | 1.38 | ▲ | **2.13** | 0.75 | වැඩිපුර ලාභාංශ ගෙවීම සඳහා හැකියාව වර්ධනය කිරීම |
| බදු පෙර ලාභය (රු.මි.)* | කොටස්හිමියන් සඳහා වටිනාකම ඉහළ නැංවීම | 2,198 | ▲ | **6,698** | 4,500 | අඛණ්ඩව වර්ධනය ඉදිරියට ගෙනයාම |
| කොටස්හිමියන්ගේ හිමිකම (රු.මි.) | අනාගත වර්ධනය සඳහා රඳවාගැනීම | 1,282 | ▲ | **44,377** | 43,095 | |
| ගාස්තු මත පදනම් ආදායම (රු.මි.) | පොළී ආදායම මත ඉපයීම් උච්චාවචනය සහ යැපීම අඩුකිරීම | 256 | ▲ | **1,261** | 1,005 | කාඩ්පත්, ජාත්‍යන්තර සහ ණය මෙහෙයුම් තුළින් ගාස්තු මත පදනම් ආදායම වැඩි කිරීම |
| ආදායමට පිරිවැය අනුපාතය (%) | පිරිවැය ඵලදායි ආකාරයෙන් කළමනාකරණය | 4.83 | ▼ | **49.35** | 54.18 | ක්ෂේත්‍රයේ සාමාන්‍ය මට්ටමට පහළ අනුපාතයක් පවත්වාගැනීම |
| ශ්‍රී ලංකාව තුළ සන්නාම වටිනාකම් ශ්‍රේණිගතකරණය | ගනුදෙනුකරුවන්ගේ දැනුම, සහය සහ පක්ෂපාතිත්වය වැඩිකිරීම | – | | **5** | 5 | සන්නාම ශ්‍රේණිගතකරණය ඉහළ නැංවීම |
| වෙළෙඳපොල කොටස - තැන්පතු (%) | ගනුදෙනුකරුවන්ගේ පක්ෂපාතිත්වය පවත්වාගැනීම සඳහා ආකර්ෂණිය අරමුදල් මූලාශ්‍රයක් වීම | 1.17 | ▲ | **10.75** | 9.58 | කෙටි කාලය තුළ පවත්නා වෙළෙඳපොල කොටස පවත්වා ගැනීම සහ මධ්‍යකාලයේ සිට දිගුකාලය දක්වා 11% දක්වා වැඩි කිරීම |
| වෙළෙඳපොල කොටස - පාරිභෝගික ණය (%) | ආදායම් වර්ධනයේ මූලිකයෙක්වීම | 0.12 | ▲ | **5.72** | 5.60 | 2020 වන විට >15% |
| ශුද්ධ පොළී ආන්තිකය (%) | පොළී ආදායම පොළී වියදම ආවරණය කරන ප්‍රමාණය | 0.20 | ▲ | **2.63** | 2.43 | මධ්‍යකාලයේ සිට දිගුකාලය දක්වා 2.6% |
| ස්කන්ධය මත ඉපයීම (ROE) | කොටස්හිමියන් තම ප්‍රාග්ධනය මත ලබන ප්‍රතිඵල | 4.37 | ▲ | **15.32** | 10.95 | 2020 වන විට >10 |

## අනාගතය දැකීම

- විවිධ ඩිජිටල්කරණ වැඩසටහන් තුළින් මෙහෙයුම් කාර්යක්ෂමතාව වර්ධනය කිරීම
- ගාස්තු මත පදනම් ආදායම වැඩි කිරීමට නව මාර්ග ගවේශනය
- සක්‍රීය ණය අවදානම් කළමනාකරණය තුළින් ශක්තිමත් ගුණාත්මක වත්කම් පවත්වා ගැනීම
- ශේෂ පත්‍රයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම සහ උපාය මාර්ගික නොවන වත්කම් අඩු කිරීම
- මූල්‍ය පිරිවැය පාලනය කෙරෙහි අවධානය
- වෙළෙඳපොල කොටස වර්ධනය කිරීම
- ප්‍රාග්ධන පිරිවැය අභිබවායාමට ලාභදායිතාව වැඩි කිරීම
- පසු පෙළ කාර්යාල ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම



# ආදර්ශය මගින් මෙහෙයවීම

සමාජ-ආර්ථික සහ පාරිසරික අභියෝග ආමන්ත්‍රණය කරන විසඳුම්වලට දායකවීම මගින් බැංකුවේ ධනාත්මක බලපෑම විශාල කිරීමට අපි අරමුණු කරමු. ව්‍යාපාර මෙහෙයුම්වල සෑම ක්ෂේත්‍රයක් තුළම තිරසාරභාවය ඒකාබද්ධ කරන අතර එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු (SDGs) අත්කර ගැනීමට අපි බැඳී සිටිමු. සමාජය සහ පරිසරය කෙරෙහි අපගේ බලපෑම පිළිබඳ අප දැනුවත් අතර වගකීම් සහගත සහ තිරසාර ව්‍යාපාර ව්‍යවහාරයන්හි සහභාගි වෙමින් සමාජීය වටිනාකම නිර්මාණය කිරීමට අපි අඛණ්ඩව කැප වෙමු. දැඩි සමාජීය මූලයක් සහිත රජයේ ආයතනයක් ලෙස, ජාතික ඉතිරි කිරීමේ බැංකුවට ආදර්ශවත් ආයතනික පුරවැසියෙක් වීමේ සහ ආදර්ශය මගින් මෙහෙයවීමේ වගකීම ඇත.

## එය වඩාත්ම වැදගත් වන්නේ ඇයි

අප ක්‍රියාත්මකවන සමාජයේ සහ පරිසරයේ යහපැවැත්ම සමග අපගේ සාර්ථකත්වය අනෝන්‍ය වශයෙන් සම්බන්ධ වේ. බැංකුව සහ මූල්‍ය ක්‍රමය අතර පවතින ශක්තිමත් අන්තර් සම්බන්ධතාව හේතු කොට ගෙන, බැංකු ක්‍රමයේ හෝ මූල්‍ය ක්‍රමයේ යම් බිඳවැටීමක් බැංකුව කෙරෙහි ශක්තිමත් බලපෑමක් නිර්මාණය කරයි.

## සම්පත් වෙන් කිරීම

අපගේ සය වැදෑරුම් ප්‍රාග්ධනය කෙරෙහි බලපෑමත් ඇති කරන ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා හැකි ක්‍රම සහ ක්‍රියාවලි තුළ සැලකියයුතු මුදල්, සේවකයින් සහ කාලය අපි වෙන්කරමු.



## අදාළ ප්‍රමාණාත්මක කරුණු

අපගේ වැදගත් කරුණු අප කළමනාකරණය කරන ආකාරය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා, 78 සිට 88 දක්වා පිටු බලන්න.



## දිගුකාලීන පරමාර්ථ සහ තිරසාර සංවර්ධන අරමුණු සඳහා දායකත්වය

බැංකුව එහි පා සටහන/සම්පත් පරිභෝජනය තුළින් පරිසරය. සමාජය සහ ප්‍රජාව කෙරෙහි සෘජුවම බලපාන අතර මූල්‍ය අතරමැදියාව (ණයදීම සහ ආයෝජන ව්‍යවහාර) සඳහා එහි කාර්යභාරය තුළින් වක්‍රව බලපායි.

රටේ සෞඛ්‍ය තත්වය සහ ස්ථාවරත්වය දිගු කාලය තුළ තිරසාර වර්ධනය අත්කර ගැනීම සඳහා අපගේ හැකියාව කෙරෙහි බලපෑම් ඇති කරයි. තිරසාර සංවර්ධන අරමුණු (SDGs) අත්කර ගැනීමට උපකාරීවන වැඩසටහන්වලින් ද රට කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇත.




## විභව සමතුලිතතා

- සැලකියයුතු ආයෝජන සමග පද්ධති සහ ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම සහ වගකීම් සහගතව ක්‍රියාත්මකවීමට සහ තිරසාරභාවය පවත්වාගැනීමට හැකියාව සංවර්ධනය කිරීම.
- ගෙවීම් පැහැරහැරීමේ අවදානම පාලනය කරන අතරම ණයදීම තුළින් උවදුරට පත්විය හැකි ක්ෂේත්‍රය තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට සහයවීම
- කාලගුණ වෙනස මගින් පීඩාවට පත් අංශයන් හි ණය ප්‍රතිව්‍යුහගතකරණය ගනුදෙනුකරුවන්ගේ ව්‍යාපාරයේ ස්වශක්තතාවය සඳහා බලපායි

## උපාය මාර්ගික ප්‍රමුඛතා අත්කර ගැනිම සඳහා ක්‍රියාමාර්ග

| | | | | |
|---|---|---|---|---|
| 2019 දී ප්‍රමුඛතා | අපගේ සියලුම ව්‍යාපාර මෙහෙයුම් තුළ අපගේ පාරිසරික පිය සටහන් අඩුකිරීම | දේශීය ප්‍රජාව නගාසිටුවීම සහ ප්‍රජාව ගොඩනැගීමේ වැඩසටහන්වලට සහයවීම | ණයදීමේදී මෙහෙයුම් හා සම්බන්ධ සමාජීය හා පාරිසරික ගැටළු කළමනාකරණය | එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු අත්කරගැනිම සඳහා අපගේ උත්සාහයන් දිගටම කරගෙන යාම සහ අපගේ ක්‍රමෝපාය සහ ව්‍යාපාර මෙහෙයුම සමඟ තිරසාර සංවර්ධන අරමුණු පෙලගැස්වීම. |
| ප්‍රගතිය | 2018 තක්සේරු කාලසීමාව සඳහා 2019 දී ශ්‍රී ලංකා කාලගුණ අරමුදල විසින් ඉදිරිපත්කළ 1460එකධ2 සහිත කාබන් උදාසීන සහතිකය ලබාගන්නා ලදී. | ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සඳහා රු.මි. 30ක් වියදම් කර ඇත | ණයදීමේ ක්‍රියාකාරකම්වලදී සමාජීය හා පාරිසරික අංග සැලකිල්ලට ගනු ලබන පාරිසරික සමාජීය අවදානම් කළමනාකරණ (ESRM) ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවන ලදී | වැඩිදුර තොරතුරු සඳහා 90 සිට 169 දක්වා පිටු බලන්න. |

සාක්ෂාත් කරගන්නා ලදී

## උපාය මාර්ග වලට අනුව අපගේ කාර්යසාධනය

| මූලික කාර්යසාධක දර්ශක | වටිනාකම් නිර්මාණයට එය දායක වන ආකාරය | වාර්ෂික වෙනස | | **2019** | 2018 | අනාගත දැක්ම/ඉලක්කය |
|---|---|---|---|---|---|---|
| **සමාජ** | | | | | | |
| ප්‍රජා සහභාගිත්ව වැඩසටහන්වල මුළු ආයෝජනය (රු.මි.) | සමාජයට දායකත්වය | 13 | ▲ | **30** | 17 | අයවැය ඉලක්ක අත්කර ගනිමින් සමාජයට ධනාත්මක බලපෑමක් ඇති කිරීම |
| අඩු ආදායම් උපයන්නන් සඳහා ණය ලබාදීමේ යෝජනා ක්‍රම ගණන | මූල්‍ය අන්තර්කරණය | – | | **3** | 3 | අයවැය ඉලක්කවලට අනුව සිදු කිරීම |
| විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ට පිරිනමන ලද ශිෂ්‍යත්ව ගණන | අධ්‍යාපනයට සහයවීම | 5 | ▲ | **25** | 20 | උපාය මාර්ග සමඟ එයට ඇති බලපෑම තීරණය කිරීම |
| වසර තුළ පවත්වන ලද සම්මන්ත්‍රණවල සහභාගි වූ සිසුන් ගණන | | | | | | |
| සහය වූ ව්‍යවසායකයින් ගණන | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ගනුදෙනුකරුවන්ට පිවිසියහැකි මූල්‍යකරණය | 562 | ▼ | **963** | 1,525 | ණයදීමේ ඉලක්කවලට අනුව සිදු කිරීම |
| විධායක හෝ ඊට ඉහළ මට්ටමේ කාන්තා සහභාගිත්වය (%) | කාන්තා සවිබලගැන්වීම සහ විවිධත්වය | 1 | ▲ | **25** | 24 | විවිධත්වය ඉදිරියට ගෙන යාම |
| සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන් ගණන | දේශීය ප්‍රජා සංවර්ධනයට දායකවීම | 198 | ▲ | **351** | 153 | දේශීය සැපයුම්කරුවන්ට අඛණ්ඩව සහයවීම |
| දේශීය සැපයුම්කරුවන් මත දරන ලද වියදම් කොටස (%) | | – | | **100** | 100 | |
| **ආර්ථික** | | | | | | |
| යටිතලපහසුකම් මූල්‍යකරණය (රු.මි.) | ආර්ථික සංවර්ධනයට දායකවීම | 2,458 | ▲ | **7,520** | 5,062 | ආර්ථික යටිතලපහසුකම් සංවර්ධනයට අඛණ්ඩව සහයවීම |
| ගෙවන ලද සෘජු සහ වක්‍ර බදු (රු.මි.) | මහා භාණ්ඩාගාරයට දායකවීම | 2,290 | ▲ | **8,961** | 6,671 | සෘජුවම ජාතික ආර්ථිකයට අඛණ්ඩව සහයවීම |
| **පරිසරය** | | | | | | |
| ලබාදෙන ලද පරිසර ණය ගණන | කාබන් අවම වූ ආර්ථිකයට සහයවීම | 559 | ▼ | **222** | 781 | ඉලක්ක අත්කර ගැනිම සහ සහ තිරසාර වැඩසටහන්වල ආයෝජන අඛණ්ඩව වැඩිකිරීම/ඉදිරියට ගෙනයාම |
| සූර්ය විදුලි කෝෂ ස්ථාපිත හා ශුද්ධ මිනුම් ක්‍රමයට සම්බන්ධිත ශාඛා ගණන | | 13 | ▲ | **26** | 13 | |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වනවගාව යටතේ බෙදාහරින ලද පැල ගණන | | 69,400 | ▼ | **6,600** | 76,000 | |

## අනාගතය දැකීම

- මූල්‍ය සේවා, අධ්‍යාපනය, රැකියා අවස්ථා සහ ආර්ථික
- වර්ධනය කරා පිවිසීම වැනි සමාජ අභියෝග ආමන්ත්‍රණය කිරීම
- ප්‍රජා සංවර්ධනය තුළ උපාය මාර්ගික හවුල්කාරත්වයන් සඳහා අරමුදල්කරණය
- අපගේ ණයදීමේ ක්‍රියාවලිය තුළදී පාරිසරික සහ සමාජීය බලපෑම කළමනාකාරණය කිරීම
- අපගේ පාරිසරික පියසටහන කළමනාකරණය කිරීම
- අධ්‍යාපනය සහ සෞඛ්‍ය අංශවලට සහයවීම



# ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව අත්පත් කරගැනීම GRI 102-10

ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් 2019 ඔක්තෝබර් 11 දින සිට ක්‍රියාත්මක වන පරිදි සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව පූර්ණ පරිපාලිත සමාගමක් ලෙස අත්පත් කරගනු ලැබිය. ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව තැන්පතු සංචලනයට අමතරව කල්බදු/කුලීපිට ගැනීමේ පහසුකම්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) ණය, ව්‍යාපාරික ණය, ක්ෂුද්‍ර මූල්‍ය ණය සහ උකස් වැනි පුළුල් පරාසයක ණය පහසුකම් පිරිනමන ලදී.

ගෙවීම් පැහැර හැරි ප්‍රමුඛ ඉතිරිකිරීමේ සහ සංවර්ධන බැංකුව (PSDB) සඳහා සහන යෝජනාවලිය පරිපාලනය කිරීම ආරම්භ කළ දින සිට, ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව විවිධ ගනුදෙනුකාර කණ්ඩායම් රාශියකට සේවය කරන අංග සම්පූර්ණ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් (LSB) බවට පරිවර්තනය වී ඇත.

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ ගෙවීම් පැහැර හැරි ප්‍රමුඛ ඉතිරිකිරීමේ සහ සංවර්ධන බැංකුවේ තැන්පත්කරුවන්ට සහනයක් ලබාදීමයි. ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව එහි තැන්පතු වගකීම්වලින් කොටසක් ණයකර ලෙස පරිවර්තනය කර ඇති අතර ඒවා 2017 අවසානයේදී නිරවුල් කළ යුතු විය. කෙසේවෙතත්, එම නිරවුල් කිරීමෙන් රු.මි. 264 ක ශේෂයක් 2019 දෙසැම්බර් 31 දිනට පැවතිණ. ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව ජාතික සංවර්ධන භාරකාර අරමුදල් සමාගම (NDTFC) සමඟ ඒකාබද්ධවීමත් සමඟ සහ ගෙවීම් පැහැර හැරි ජාතික සංවර්ධන භාර අරමුදලේ (NDTF) වත්කම් සහ වගකීම් පැවරීම තුළින් ප්‍රාග්ධන අරමුදල්වල ඌණතාවය සපුරාලීමට හැකි විය. ජාතික සංවර්ධන භාර අරමුදල සහ ජාතික සංවර්ධන භාරකාර අරමුදල් සමාගම සමඟ ඒකාබද්ධවීමත් සමඟ සාංගමික සංස්ථා පත්‍රය ඒකාබද්ධ කිරීම ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවට අංග සම්පූර්ණ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වීමට සහ ව්‍යාපරික කටයුතු කරගෙන යාමට හැකියාව ලබාදෙන ලදී.

**2006**
ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව 1988 අංක 20 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස ස්ථාපිත කෙරේ.

**2007**
ගෙවීම් පැහැර හැරි ප්‍රමුඛ ඉතිරිකිරීමේ සහ සංවර්ධන බැංකුවේ වත්කම් සහ වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව වෙත පවරනු ලබයි.



**2008**
රජයට අයත් ඉතිරිකිරීමේ බැංකුවක් ලෙස මෙහෙයුම් ආරම්භ කරන ලදී.

**2010**
ජාතික සංවර්ධන භාරකාර අරමුදල් සමාගම සමඟ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව සමඟ ඒකාබද්ධවීම. කැබිනට් තීරණයක් අනුව, ගෙවීම් පැහැර හැරි ජාතික සංවර්ධන භාර අරමුදලේ වත්කම් සහ වගකීම් පැවරීම.

**2011**
සාංගමික සංස්ථා පත්‍රය සංශෝධනය කිරීමත් සමඟ ණය දීමේ කටයුතු ආරම්භ කිරීම

**2012**
කල්බදු සහ කුලීපිට ගැනීමේ පහසුකම් ව්‍යාපාර ආරම්භ කිරීම

**2016**
ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමඟ ඒකාබද්ධවීමට ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව සඳහා රජයේ අයවැය යෝජනාව

**2017**
ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් පරිදි ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව නිසි සුපරීක්ෂාකාරී බවින් පවත්වාගෙන යාම

**2020**
ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව සඳහා වසර තුනක පශ්චාත් අත්පත් කර ගැනීමේ ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම

## උපාය මාර්ගික දර්ශනය/ අවධානිත ක්ෂේත්‍ර

### ශ්‍රී ලංකාව තුළ සංවර්ධන මූල්‍යකරණය සඳහා ප්‍රධාන ආයතනය බවට පත්වීම

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව එහි මව් සමාගමේ ව්‍යාපාර කළඹට අනුපූරකව තෝරාගත් පාරිභෝගික නිෂ්පාදන පිරිනමමින් සංවර්ධන බැංකුකරණ වෙළෙඳපොළ (සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, ක්ෂුද්‍ර මූල්‍යකරණය) සඳහා ප්‍රධාන ආයතනය ලෙස කටයුතු කරනු ඇත. ප්‍රධාන වශයෙන් නිෂ්පාදන අවධානය ඉදිරියට ගෙනයාමට අදහස් කරනු ලබන්නේ තොග සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (මූල්‍ය ආයතන/ හවුල්කාර ආයතනවලට ණයදීම), ක්ෂුද්‍ර මූල්‍ය ණයදිම, සෘජු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණයදිම, පාරිභෝගික ණයදීම, කල්බදු (මව් සමාගමේ කළඹට අනුපූරක වීමට) සහ ඉතුරුම් සංචලනය (බාලවයස්කාර ගිණුම්, කාන්තා ඉතුරුම් ගිණුම් වැනි විශේෂිත ඉතුරුම්) වැනි ක්ෂේත්‍ර වලයි. තවද, අවසානයේදී පූර්ණ සේවා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය බැංකුවක් බවට පරිවර්තනය විම සඳහා හැකියා වර්ධනය, උපදේශන සේවා සහ ව්‍යාපෘති පදනම් මූල්‍යකරණ විසඳුම් වැනි අගය එකතුකළ සේවා ලබා දේ.

### හැකියා වර්ධනය

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව, ක්ෂුද්‍ර ව්‍යවසායකත්වය සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (MSME) අංශය තුළ අරමුදල් පරතර පියවා ගැනීමට ණය ලබාදීමේ හැකියාව (පාලනය කරගත හැකි අක්‍රීය ණය මට්ටම් පවත්වා ගනිමින්) වැඩිකරනු ඇති අතර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා විදේශීය අරමුදල් මාර්ග, රජයේ අරමුදල් මාර්ග සහ වෙනත් අරමුදල් පහසුකම් සඳහා සහ දූනට ශ්‍රී ලංකා මහ බැංකුව සහ මුදල් අමාත්‍යංශය තුළින් පහසුකම් සලසන සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රමුඛ ආයතනය විම තුළින් දේශීය බැංකුකරණ වෙළෙඳපොල තුළ හිඩැස පුරවනු ඇත. ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව ප්‍රාග්ධන අවශ්‍යතා සහ ණයදීමේ අරමුණු සඳහා අවශ්‍ය අරමුදල් සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ මුදල් ලබාගනිමින් ඉහළ මට්ටමේ වර්ධනයක් ලබා ගැනීමට සහ ප්‍රාග්ධන අරමුදල් උපරිමයෙන් භාවිතා කිරීමට උත්සාහ දරයි.

### දෙමුහුන් විධි නියෝගය

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව විශේෂයෙන් බාල වයස්කාර ඉතුරුම් ගිණුම් හරහා ඉතුරුම් තැන්පතුවල වර්ධනය ඉදිරියට ගෙනයාමට සීමාකර ඇත. එහි පරිපාලකයා (ජාතික ඉතිරිකිරීමේ බැංකුව) හා සම්බන්ධ වී, ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව මූල්‍ය නිෂ්පාදන හා සේවා විශාල ප්‍රමාණයක් ආවරණය කරයි. ක්ෂුද්‍ර සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය අතර වියපැහැදම් සඳහා ජාත්‍යන්තර සහ රාජ්‍ය අංශයේ අරමුදල්කරණය ආකර්ශනය කර ගැනීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සන්නාමය සහ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ ක්ෂුද්‍ර සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණයදීමේ වාර්තාව එක්ව ක්‍රියා කරයි. කල්බදු සහ ණයකාඩ් පත් වැනි ප්‍රධාන නිෂ්පාදන ලබාදීමට බැංකුවට ඇති හැකියාව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව යන බැංකු දෙකෙහිම උපාය මාර්ගික ජයග්‍රහණයක් වනු ඇත.

### අඩු පිරිවැය මෙහෙයුම් ආකෘතිය

වර්තමානයේ, ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවට කොළඹ, අනුරාධපුර, මාතර සහ මන්නාරම යන ශාඛා 04 ක් සහිත සීමිත භූගෝලීය ප්‍රවේශයක් ඇති බැවින් අඩු පිරිවැය මෙහෙයුම් ආකෘතියක් තුළ ක්‍රියාත්මක වේ. සාම්ප්‍රදායික ශාඛා ප්‍රවේශය තුළින් සීමිත භූගෝලිය පැවැත්මක් ඇතිව ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව අදහස් කරන අතර ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ශාඛා ජාලය සහ හවුල්කාර ආයතනවල වෙළෙඳපොළ ප්‍රවේශය හරහා ආවරණය පුළුල් කිරීමට අපේක්ෂා කරයි. ප්‍රධාන ක්‍රියාකාරකම් සහ කුසලතා ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය (පළාත්) ප්‍රධාන ශාඛාවල මධ්‍යගත කෙරේ. දූනට පවත්නා ශාඛා සහ නව ශාඛා "ප්‍රාදේශීය සංවර්ධන මධ්‍යස්ථාන" (RDC) බවට පරිවර්තනය මගින් ආවරණය පුළුල් කිරීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ශාඛාජාලය භාවිතා කිරීමට ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව අපේක්ෂා කරයි. ප්‍රාදේශීය සංවර්ධන මධ්‍යස්ථාන, කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වෙමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ජාලය, තැපැල් කාර්යාල සහ උපතැපැල් කාර්යාලවල පුළුල් ජාලයක් ඇති කරමින් තෝරාගත් ප්‍රදේශවල ස්ථාපිත කිරීමට නියමිතය. ප්‍රාදේශීය සංවර්ධන මධ්‍යස්ථාන මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණයදිම සහ උපදේශන සේවා සහ ක්ෂුද්‍ර මූල්‍ය සහය සේවා ඇතුළුව වර්තමාන ශාඛා සේවා පුළුල් කෙරේ. නිපුණතා සංවර්ධනය තුළින් විකුණුම් සහ සේවා නැඹුරු වෙළෙඳපොළ ප්‍රවේශය ප්‍රවර්ධනය කළ යුතුයි.

### පිරිවැය ප්‍රශස්තකරණය

සැහැල්ලු මෙහෙයුම් ආකෘතිය පවත්වා ගනිමින් සහ පුළුල් කිරීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ජාලය භාවිතා කරමින් පිරිවැයට ආදායම අනුපාතිකය අඩු අගයක අඛණ්ඩව පවත්වා ගනී.

### සේවක ඵලදායිතාව

වර්ධනයේ ඉදිරි අදියර සඳහා ගමන් කිරීමට සේවක ඵලදායිතාව වැඩි කිරීම සහ හැකියා සංවර්ධනය සහතික කිරීම

### ගනුදෙනුකාර තෘප්තිය

ගනුදෙනුකරුවන් වෙත සේවාවල ගුණාත්මකභාවය වැඩි කිරීම සහ ගනුදෙනුකරුවන් වෙත ලඟාවීම වැඩි කිරීමට සේවා ස්ථාන පුළුල් කරන අතර ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම් සහ පහසුව වැඩි දියුණු කිරීම පිණිස යටිතල පහසුකම් සහ පද්ධති යාවත්කාලීන කර පවත්වා ගැනීම.

| මූලික කාර්යසාධන දර්ශක | ඒකකය | 2019 | 2020-2022 |
|---|---|---|---|
| ණය කළඹ | රු. මිලියන | 2,222 | 2020 දී දෙගුණයකින් වැඩි කිරීම සහ ඉදිරි වසර දෙක තුළ අංක දෙකක වර්ධනය (double digit) |
| මුළු වත්කම් | රු. මිලියන | 8,717 | ඉදිරි වසර තුන වන විට 20.0%ක සාමාන්‍ය වර්ධනය |
| තැන්පතු පදනම | රු. මිලියන | 1,076 | ඉදිරි වසර තුන වන විට 20.0% වඩා වැඩි සාමාන්‍ය වර්ධනය |
| මුළු වගකීම් | රු. මිලියන | 3,786 | ඉදිරි වසර තුන තුළ 31.2%ක සාමාන්‍ය වැඩිවීම |
| මුළු මෙහෙයුම් ආදායම | රු. මිලියන | 1,062 | 2020 දී තනි අංකයක (Single digit) වර්ධනය සහ ඉදිරි වසර දෙක තුළ අංක දෙකක වර්ධනය (double digit) |
| පිරිවැයට ආදායම අනුපාතිකය | % | 23.5 | 50%ක සාමාන්‍ය අනුපාතය පවත්වාගැනීම |
| මෙහෙයුම් ලාභය | රු. මිලියන | 634 | සමාන මට්ටමේම පවත්වාගැනීම |
| ශුද්ධ ලාභය | රු. මිලියන | 448 | සමාන මට්ටමේම පවත්වාගැනීම |
| ශාඛා | රු. මිලියන | 4 | 2020 දී ශාඛා ගණන දෙගුණ කිරීම සහ සැම වසරකම 2කින් වැඩි කිරීම |

අත්පත් කරගැනිම පිළිබඳ මූල්‍ය විස්තර සඳහා 357 පිටුවේ සංග්‍රහය 02 හි මූල්‍ය ප්‍රකාශයනවලට සටහන් පිළිබඳ 24 සටහන බලන්න.

# ඒකාබද්ධ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය

GRI 102-40, 42, 43 & 44


අපි, අපගේ මෙහෙයුම් වටා පැතිරී ඇති විවිධ පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වෙමු. ඔවුන් විවිධාකාරයෙන් අපට අභියෝග කර පොලඹවයි. අපගේ සියලුම ව්‍යාපාරික කටයුතුවල ක්‍රියාකාරී ප්‍රවේශයක් පවත්වා ගනිමින් ඔවුන්ගේ වෙනස්වන අවශ්‍යතා නිරන්තරයෙන් සපුරාලීමට, ගරුකිරීමට සහ පිළිගැනීමට අපි අඛණ්ඩව වෙහෙස දරමු.

අපගේ ශක්තිමත් පාර්ශ්වකාර සහභාගිත්ව ක්‍රියාවලිය අපගේ වටිනාකම් නිර්මාණ ක්‍රියාවලියේ සෑම පියවරක් සමඟම ඒකාබද්ධ කෙරේ. අපගේ ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ අර්ථවත් සංවාදයක් තුළින්. නිර්මාණය කරන ලද වටිනාකම බෙදාහැරීම සමතුලිත කරන අතරම, ඔවුන්ගේ අවශ්‍යතා වඩා හොඳින් අවබෝධ කරගැනීමට සහ ඒවා සපුරාලීමට අපට හැකිවේ. ඔවුන්ට වඩාත් වැදගත්වන සහ අපගේ ව්‍යාපාරයට අදාළවන අංශ පිළිබඳ ගැඹුරු අවබෝධයක් ඇති කර ගැනීම මගින් අපි මෙය සිදුකරමු. සාකච්ඡාව, සහයෝගය සහ සහයෝගිතාව තුළින් නිශ්චය කරන ලද පාර්ශ්වකාර ප්‍රතිචාර තුළින් රැස්කළ ඔවුන්ගේ අපේක්ෂාවන් සහ සිතුවිලි සැලකිල්ලට ගනිමින් සහ අපගේ ව්‍යාපාරය තුළ පාරිසරික. සමාජීය සහ පාලන අවදානම් සහ අවස්ථාවන් තක්සේරු කරමින් අපි මෙය සිදුකරමු. අපගේ පාර්ශ්වකරුවන්ගෙන් ලැබෙන ප්‍රතිචාර මත පදනම් වී අපගේ ව්‍යාපාර ආකෘතිය සහ උපාය මාර්ගික සැලසුම් කිරීමේ ක්‍රියාවලිය අප අඛණ්ඩව ඉහළ නංවන බැවින්, මේ ආකාරයේ ඵලදායි පාර්ශ්වකාර සහභාගිත්වය තවදුරටත් අනාගතය සඳහා සූදානම්විමට අපව පොළඹවනු ඇත.


මෙම ප්‍රවේශය, අප සඳහා පමණක් නොව අපගේ පාර්ශ්වකරුවන් සඳහා ආර්ථික, පාරිසරික සහ සමාජීය වටිනාකම නිර්මාණය කිරීමට, සුරක්ෂිත කිරීමට හෝ අවම කිරීම සඳහා අප බැංකුවේ හැකියාව කෙරෙහි ඍජු හෝ වක්‍ර බලපෑමක් ඇති මාතෘකා හඳුනාග ැනීමට අපට ඉඩකඩ ලබා දේ. අපගේ පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිචාර අපගේ උපාය මාර්ගය ගොඩනැගීම සඳහා සහය වන අතර ඒ තුළ අපගේ පාර්ශ්වකරුවන් වෙත තිරසාර වටිනාකමක් ලබාදීම, අපගේ පිරිනැමීම් පුළුල් කිරීම සහ අපගේ පාර්ශ්වකරුවන් වෙත වඩා හොඳින් සේවා සැපයීම සඳහා වැඩසටහන් සහ සේවාවන් ආරම්භ කිරීම සඳහා වූ අපගේ කැපවීම පැහැදිලිව දක්වා ඇත.

## අපගේ ඒකාබද්ධ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්ව ක්‍රියාවලිය


අපගේ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්ව ක්‍රියාවලිය පහත සඳහන් අදියරවලින් සමන්විත වේ:




පාර්ශ්වකරුවන් හඳුනාගැනිම



ප්‍රධාන පාර්ශ්වකරුවන් ප්‍රමුඛකරණය සහ හඳුනාගැනිම



සහභාගිවීමේ ක්‍රමය අර්ථ දැක්වීම සහ ඔවුන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් හඳුනාගැනිම



සම්බන්ධතාවය නියාමනය සහ ඇගයීම සඳහා මෙවලමක් ස්ථාපිත කිරීම

## පාර්ශ්වකරුවන් හඳුනාගැනීම

අපගේ ක්‍රියාවන්, නිෂ්පාදන සහ සේවාවන් මගින් සැලකියයුතු ලෙස බලපානු ලබන පුද්ගලයින් හෝ කණ්ඩායමක් ලෙස අපගේ පාර්ශ්වකරුවන් අපි අර්ථ දක්වමු. ඒ අනුව, ඔවුන්ගේ සංජානන සහ ක්‍රියාවන් අපගේ කටයුතු පවත්වා ගැනීමට සහ උපාය මාර්ගික අරමුණු සපුරා ගැනිමට අපට ඇති හැකියාව කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇතිකළ හැකිය.

පහත සඳහන් පාර්ශ්වකාර කණ්ඩායම් අපි හඳුනාගෙන ඇති අතර, ඔවුන් ඍජුව හෝ වක්‍රව අපගේ මෙහෙයුම් කෙරෙහි බලපායි. ඔවුන් සමඟ සුහද සම්බන්ධතා අඛණ්ඩව ගොඩ නැගීමට සහ පවත්වා ගැනිමට අපි උත්සාහ කරමු.

- කොටස්හිමියා/ආයෝජකයා
- ගනුදෙනුකරුවන්
- සේවකයින්
- නියාමකයින් සහ රාජ්‍ය ආයතන
- ව්‍යාපාර හවුල්කරුවන්
- සමාජය සහ පරිසරය

## ප්‍රධාන පාර්ශ්වකරුවන් ප්‍රමුඛකරණය සහ හඳුනාගැනිම

අපගේ ක්‍රියාකාරකම් පාර්ශ්වකරුවන් කෙරෙහි බලපාන ආකාරය සහ ඔවුන්ගේ ගැටළු විසඳීමේදී අපගේ උපාය මාර්ගයේ අදාළත්වය මත පදනම් වෙමින් ඉලක්කගත සහභාගිත්වය සඳහා අපි අපගේ ප්‍රධාන පාර්ශ්වකරුවන් හඳුනාගෙන ප්‍රමුඛතාවය දී ඇත. පාර්ශ්වකරුවන්ට අප කෙරෙහි සහ අපට ඔවුන් කෙරෙහි සැලකියයුතු බලපෑමක් ඇති බැවින්, ඔවුන් හඳුනාගෙන, ඵලදායී ආකාරයෙන් ඔවුන් සමඟ සන්නිවේදනය කිරීම අත්‍යවශ්‍ය වේ. අපගේ ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධතාව, නිර්මාණය කළ වටිනාකම බෙදාහැරීම සමතුලිත කරන අතරම, ඔවුන්ගේ ගැටළු අවබෝධකර ගැනීමට හා ඒවා විසඳීමට අපට උපකාරී වේ.

අපගේ ආයතනය කෙරෙහි ඇල්මක් ඇති පුද්ගලයින් සහ ආයතන ප්‍රමුඛ කිරීමට අපි පහත සඳහන් නිර්ණායක භාවිතා කරමු.

- බැංකුවේ රඳාපැවැත්මට අත්‍යවශ්‍ය අය
- අදාළ තර්ජන සහ අවස්ථාවන් හා සම්බන්ධ අය
- බැංකුවේ හැසිරීම කෙරෙහි බලපෑම් කිරීමට සදාචාරාත්මක හෝ නෛතික හැකියාවක් ඇති අය
- තමන් විසින් නොගන්නා තීරණ ගැනීම සඳහා අන්‍යයන්ට බලපෑම් කළ හැකි අය
- සම්බන්ධතාවය බැංකුවට වැදගත් වන අය

අපගේ ප්‍රධාන පාර්ශ්වකරුවන් බැංකුව කෙරෙහි ඔවුන් දක්වන උනන්දුව මත සහ අපගේ මෙහෙයුම් කෙරෙහි බලපෑම් කිරීමේ ඔවුන්ගේ බලය මත පදනම් වී සරල ශ්‍රේණිගත කිරීමේ පරිමාණයක් භාවිතා කරමින් පහත සඳහන් අනුකෘතියේ පාර්ශ්වකරුවන් සිතියම්ගත කිරීමෙන් හඳුනාගනු ලැබේ.


## සහභාගී ක්‍රමය අර්ථ දැක්වීම සහ ඔවුන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් හඳුනා ගැනීම

අපගේ පාර්ශ්වකාර කණ්ඩායම් සමඟ සම්බන්ධතාව පවත්වා ගැනීමට විධිමත් යාන්ත්‍රණ ගණනාවක් අපි පවත්වා ගනිමු. අපගේ අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්වකරුවන් සමඟ අඛණ්ඩ සහ ක්‍රමානුකූල සංවාදයක් ප්‍රධාන ගැටළු නිශ්චය කිරීමේදී වැදගත් අංගයකි. අපගේ පාර්ශ්වකරුවන් සමඟ දීර්ඝකාලීන, අන්‍යෝන්‍ය, වශයෙන් වාසිදායක සම්බන්ධතා ගොඩනගා ගැනීම හා පෝෂණය කිරීම සඳහා හිතකර, අඛණ්ඩ හා සවිස්තරාත්මක පාර්ශ්වකරුවන්ගේ සංවාදයක නිරත විමට අපි උත්සාහ ගනිමු. අපගේ ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ සංවාද පැවැත්විමට විවිධ මාදිලියේ සන්නිවේදන ක්‍රම ඇත. මුහුණට මුහුණ සාකච්ඡාවන්, සම්මන්ත්‍රණ සහ සමාජ මාධ්‍ය අවකාශ මෙයට ඇතුළත්ය. ඔවුන්ගේ අපේක්ෂාවන් සහ සිතුවිලි අවබෝධකරගෙන වටිනාකම් නිර්මාණය සඳහා ඵලදායි උපාය මාර්ග සංවර්ධනය කිරීමට මෙම ප්‍රතිචාර අපට සහය වේ.

## සම්බන්ධතාව නියාමනය සහ ඇගයීම සඳහා මෙවලවක් ස්ථාපිත කිරීම

අපගේ වටිනාකම් නිර්මාණය කිරීමේ හැකියාම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළහැකි පාර්ශ්වකාර කණ්ඩායම්, වටිනාකම් නිර්මාණය කිරීමට ඔවුන්ගේ දායකත්වය, ඔවුන් සමඟ අප කටයුතු කරන ආකාරය සහ අපගේ අන්තර්ක්‍රියා මත පදනම්ව ඔවුන්ගේ ප්‍රධාන අවශ්‍යතා, උත්සුකයන් සහ අපේක්ෂාවන්, පහත දැක්වෙන වගු මගින් දක්වා ඇත. තිරසාර ආකාරයකින් අපගේ පොදු අරමුණු කරා අපි ළඟාවන බව සහතික කිරීමට ප්‍රමාණාත්මක කරුණු නිශ්චය කර ගැනීමට මෙම ක්‍රියාවලිය අපව ශක්තිමත් කරයි.

පහතින් සඳහන් වන්නේ අපගේ ප්‍රධාන පාර්ශ්වකාර කණ්ඩායම් සමඟ සම්බන්ධතාවල ගුණාත්මකභාවය පිළිබඳ තක්සේරුවකි. මෙම පරිමාණය අපගේ සම්බන්ධතාවල ගුණාත්මකභාවය පිළිබඳ අපගේ අභ්‍යන්තර තක්සේරු කිරීම නියෝජනය කරයි.




| | |
|---|---|
| ★ | දැනට පවත්නා සම්බන්ධතාවයක් නොමැත |
| ★★ | සම්බන්ධතා ස්ථාපිත නමුත් සම්බන්ධතාවයේ ගුණාත්මකභාවය වර්ධනය සඳහා තවදුරටත් වැඩකළයුතු |
| ★★★ | සම්බන්ධතා ස්ථාපිතය වටිනාකම උත්පාදනය කරන සම්බන්ධතාවයකි. නමුත් වර්ධනය කිරීමට ඉඩකඩ ඇත. |
| ★★★★ | හොඳ තත්වයේ, අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක සම්බන්ධතාවයක්, වැඩි දියුණු කිරීම සඳහා යම් ඉඩක් ඇත. |
| ★★★★★ | අන්‍යෝන්‍ය ප්‍රතිලාභ පිළිබඳ ශක්තිමත් සම්බන්ධතාවයකි |

## කොටස්හිමියා/ආයෝජකයා

ශ්‍රී ලංකාවේ රජය

### අපට එය වැදගත් වන ආකාරය

එකම කොටස් හිමියා ලෙස,
මූල්‍ය ස්ථාවරත්වය සහ ආර්ථිකයේ
ස්ථාවරත්වය සඳහා අපි ප්‍රධාන දායකත්වයක්
සපයනු ඇතැයි ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරයි.

| අප නිරතවන ආකාරය | නිරතවන වාර ගණන |
|---|---|
| වාර්ෂික වාර්තාව | වාර්ෂික |
| මූල්‍ය ප්‍රකාශන | කාර්තුමය |
| ආයතනික වෙබ් අඩවිය | අඛණ්ඩව |
| එකිනෙකා සමඟ වන රැස්වීම් | නිතිපතා |
| ආයෝජක ඉදිරිපත් කිරීම් සහ මාර්ග සංදර්ශන | කලින්කල |
| පුවත්පත් සාකච්ඡා සහ නිවේදන | අවශ්‍ය පරිදි |

| ප්‍රමුඛතා | ප්‍රමාණාත්මක කරුණ | අපගේ ප්‍රතිචාරය | ප්‍රාග්ධනයට අදාළත්වය සහ තිරසර සංවර්ධන අරමුණුවලට දායකත්වය | ප්‍රාග්ධනය කෙරෙහි බලපෑම |
|---|---|---|---|---|
| තිසාර මූල්‍ය ප්‍රතිඵල හා වර්ධනය<br>ආකර්ශනිය ලාභාංශ ක්‍රමය<br>ඇතිවන අවධානමෙන් ආරක්ෂාවීමට යහපත් ශේෂ පත්‍රය | | • ආදායමෙහි වර්ධනය තුළින් තිරසාර මූල්‍ය ප්‍රතිඵල උත්පාදනය කිරීම (පාරිසරික තිරසාරභාවයට අනුකූලව), පිළිගතහැකි අවදානම් රුචිය සීමාවක් තුළ අවදානම කළමනාකරණය, විචක්ෂණශීලී වියදම් කළමනාකරණය සහ පිරිවැය පදනම ප්‍රශස්ථ කිරීම | 8 DECENT WORK AND ECONOMIC GROWTH<br>17 PARTNERSHIPS FOR THE GOALS<br>**මූල්‍ය කාර්යසාධනය පිටු 93 සිට 107 දක්වා ඇත.** | |
| ශක්තිමත් හා පළපුරුදු කළමනාකරණය<br>ශක්තිමත් පාලනය සහ විනිවිදයන අනාවරණය<br>අභියෝගාත්මක ආර්ථික කොන්දේසිවලට කණ්ඩායමේ ප්‍රත්‍යස්ථිතිය<br>උපාය මාර්ගයට අනුරූප බෙදාහැරීම<br>පැහැදිලි, ස්ථාවර. සහ විනිවිදභාවයකින් යුතුව සන්නිවේදනය කිරීම | | • ආරක්ෂිත සහ ස්ථාවර බැංකු පද්ධතියකට දායකවන, විශ්වාසය ඇති කරන සහ ඇතිවන අවදානමෙන් ආරක්ෂා කරන ශක්තිමත් ශේෂ පත්‍රයක් පවත්වා ගැනීම | | |

සම්බන්ධතා දර්ශකයේ ගුණාත්මකභාවය ★★★★

# ගනුදෙනුකරුවන්

තනිපුද්ගලයන්, ආයතන, සංස්ථා සහ ව්‍යවසායකයින්.

## අපට එය වැදගත් වන ආකාරය

- අපගේ ව්‍යාපාරයේ කේන්ද්‍රය ගනුදෙනුකරුවන් වන අතර, අසමසම පාරිභෝගික අත්දැකීමක් ලබාදීම, ලාභදායි සහ තිරසාර වර්ධනයක් අත්කර ගැනීමට අත්‍යවශ්‍ය වේ.
- ණය ගනුදෙනු සඳහා මුදල් ලබාගැනීමට අපට හැකියාව ඇති වන මූලාශ්‍රය වන්නේ ගනුදෙනුකරුවන්ය.

| අප නිරතවන ආකාරය | නිරතවන වාර ගණන |
|---|---|
| ශාඛා,තැපැල් ජාලයල ATM/ CRM, ඇමතුම් මධ්‍යස්ථාන සහ අන්තර්ජාල බැංකුකරණය ඇතුළුව විවිධ මාර්ග | අඛණ්ඩව |
| ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්/ප්‍රවර්ධන වැඩසටහන් | නිතරම |
| මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය | නිතිපතා |
| සමාජ මාධ්‍ය නාලිකා | අඛණ්ඩව |
| ගනුදෙනුකරුවන්ගේ තෘප්තිය පිළිබඳ සමීක්ෂණ | කලින්කල |
| ආයතනික සිදුවීම් | අවශ්‍ය පරිදි |
| ආයතනික වෙබ්අඩවිය | අඛණ්ඩව |
| ආයතනික සමාජීය වගකීම් කටයුතු | අඛණ්ඩව |

| ප්‍රමුඛතා | ප්‍රමාණාත්මක කරුණ | අපගේ ප්‍රතිචාරය | ප්‍රාග්ධනයට අදාළත්වය සහ තිරසර සංවර්ධන අරමුණුවලට කෙරෙහි දායකත්වය | ප්‍රාග්ධනය කෙරෙහි බලපෑම |
|---|---|---|---|---|
| වඩාත් ලාභදායි සහ වඩාත් පහසු බැංකුකරණ සේවාව<br>වැඩිකළ නිෂ්පාදන සහ පිවිසුම් ස්ථාන<br>මුදලට අගය බැංකුකරණය<br>ගනුදෙනුකාර සේවන්හි විශිෂ්ටත්වය<br>බැංකුකරණ අත්දැකීම සහ සේවා පිළිබඳ විශ්වාසය ඉහළ නැංවීම<br>ක්‍රියාවලි තුළ ප්‍රමාද, දෝෂ, සහ සංකීර්ණතාව අවම කිරීම<br>තම මුදල් සහ ආයෝජන සඳහා ආරක්ෂාව<br>වගකීම් සහගත බැංකුකරණ සේවා සහ විසඳුම්<br>වංචාවෙන් ආරක්ෂා කිරීම සහ පුද්ගලික දත්තවල ආරක්ෂාව<br>නව නිෂ්පාදන, සේවා සහ අවස්ථා පිළිබඳ තොරතුරු | | • ප්‍රතිලාභ වර්ධනය කරන අතරම තැන්පතු සහ ආයෝජන සුරක්ෂිත කිරීම<br>• කාර්යක්ෂම මාර්ග දියත් කිරීම සහ පිරිවැය-ඵලදායි පහසු බැංකුකරණ විකල්ප ලබාදීම<br>• අපගේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා අවබෝධකරගනිමින් පුද්ගලගත හා විස්තීර්ණ විසඳුම් පිරිනැමීම<br>• සැමවිටම සුවිශේෂී ගනුදෙනුකාර අත්දැකීමක් ලබාදීමට අපගේ සේවකයින් සූදානම් කිරීම සහ බල ගැන්වීම<br>• ඩිජිටල්කරණය සහ නව්‍යකරණය ආරක්ෂිත බවට පත් කරන අතරම ඒවා වැඩි වශයෙන් යොදා ගැනීම<br>• සයිබර් සුරක්ෂිතතා තර්ජන වලට සක්‍රීයව ප්‍රතිචාර දැක්වීම සහ ගනුදෙනුකාර රහස්‍යතාව සහ ආරක්ෂාව සහතික කිරීම<br>• අපගේ තොරතුරු තාක්ෂණ පද්ධතිවල ස්ථායීතාවය, ආරක්ෂාව සහ වේගය පවත්වා ගැනිම<br>• අපගේ නිෂ්පාදන, බෙදාහැරීමේ මාර්ග සහ වෙළෙඳපොල තුළින් මූල්‍ය අන්තර්කරණයට දායකවීම<br>• ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතාවය සහ ස්වයංක්‍රීයකරණය වැඩි කිරීම<br>• අපගේ බහු - මාධ්‍යය නිකුත් කිරීම් ශක්තිමත් කිරීම<br>• ක්‍රියාවලි සරල කිරීම | 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE<br>12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION<br>7 AFFORDABLE AND CLEAN ENERGY<br>**අපගේ ළඟාවීම වැඩි කිරීම පිටුව - 116**<br>**අපගේ ඩිජිටල් පිය සටහන පුළුල්කිරීම පිටුව - 117**<br>**ශක්තිමත් පද්ධති සහ ක්‍රියාවලි පිටුව - 126**<br>**පක්ෂපාතී ගනුදෙනුකාර පදනමක් ගොඩනැගීම පිටුව - 148** | |

සම්බන්ධතා දර්ශකයේ ගුණාත්මකභාවය ★★★



## සේවකයින්

ස්ථීර සේවකයින්, කොන්ත්‍රාත් පදනම මත සේවකයින්, බාහිරින් සපයාගන්නා පුද්ගලයින් සහ වෘත්තීය සමිති

### අපට එය වැදගත් වන ආකාරය

- අපගේ සේවකයින් අප ව්‍යාපාරයේ දෛනික මෙහෙයුම් ඉදිරියට ගෙනයාම මගින් බැංකුවේ උපාය මාර්ග සාක්ෂාත් කරගැනිමට පහසුකම් සපයයි.
- අපගේ සේවකයින්ගේ අභිප්‍රේරණ මට්ටම ගනුදෙනුකාර තෘප්තිමත් මට්ටම් සමඟ සෘජුව සම්බන්ධ වේ.

| අප නිරතවන ආකාරය | නිරතවන වාර ගණන |
|---|---|
| විධිමත් රැස්වීම් | නිතරම |
| අවිධිමත්/ඉඳහිට පවත්වන රැස්වීම් | අවශ්‍ය වූ විට |
| කාර්යසාධන සමාලෝචන | වාර්ෂික |
| අභ්‍යන්තර පුවත් ලිපි | කලින්කල |
| රේඛිය කළමනාකරණය සහ සහභාගිත්වය | දිනට පවත්නා |
| මෙහෙයුම් චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ | නිතරම |
| පුහුණු සහ සංවර්ධන වැඩසටහන් | නිතිපතා |
| අභ්‍යන්තරජාලය | අඛණ්ඩව |
| සුභසාධන අවස්ථා සහ ක්‍රියාකාරකම් | නිතිපතා |
| පිළිගත් වෘත්තිය සමිති සහභාගිත්වයන් | නිතිපතා |
| දුක්ගැනවිලි හැසිරවීමේ යාන්ත්‍රණය | අඛණ්ඩව |

| ප්‍රමුඛතා | ප්‍රමාණාත්මක කරුණ | අපගේ ප්‍රතිචාරය | ප්‍රාග්ධනයට අදාළත්වය සහ තිරසර සංවර්ධන අරමුණුවලට දායකත්වය | ප්‍රාග්ධනය කෙරෙහි බලපෑම |
|---|---|---|---|---|
| පිළිගැනීම සහ වෘත්තීය වර්ධනයේ අවස්ථා<br>වත්මන් නිපුණතා වර්ධනය කර ගැනීමට සහ වෙනස්වන මෙහෙයුම් පරිසරයක නව නිපුණතා ඇති කර ගැනීමට පුහුණුව සහ වර්ධනය<br>තරඟකාරි වැටුප් සහ ඵලදායි කාර්යසාධන කලමනාකරණය<br>විශ්‍රාම ප්‍රතිලාභ |  | • වටිනාකම නිර්මාණය සහ එකතුව සඳහා තම දායකත්වය වෙනුවෙන් ආකර්ශනීය වැටුප් හා ප්‍රදාන පිරිනැමීම<br>• වේගයෙන් වෙනස්වන පරිසරයට අදාළ වන පරිදි කඩිනම් ශ්‍රම බලකායක් වර්ධනය කිරීම<br>• සිත් ඇදගන්නාසුළු සහ ආකර්ෂණීය සේවා පරිසරයක් නිර්මාණය කිරීම<br>• අප ක්‍රියාත්මක වන ප්‍රජාවෙන් පුද්ගලයින් සේවයේ යොදවා විවිධත්වය සහ සියළු දෙනාම ඇතුළත් සේවා ස්ථානයක් නිර්මාණය කිරීමට දායකවීම<br>• රැකියාවේ සුරක්ෂිතභාවය සහ සාමූහික කේවල්කිරීමේ නිදහස<br>• ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන් දියත් කිරීම<br>• අදාළ වන සියලුම රැකියා නීතිවලට අනුකූලවීම<br>• සාමූහික කේවල්කිරීමේ අයිතිය පිලිගැනිම සහ ගරුකිරීම සහ සාමූහික කේවල්කිරීමේ බැඳියාව ආරක්ෂා කිරීම | <br>ජයග්‍රාහි කණ්ඩායමක් පෝෂණය සහ සංවර්ධන කිරීම පිටුව 136.<br>වඩාත්සුදුසු දක්ෂයින් ආකර්ෂණය කර ගැනීම පිටුව 135.<br>අපගේ දක්ෂයින් කළමනාකරණය පිටුව 138.<br>සේවක රඳවාගැනීම පිටුව 142.<br>ඵලදාය සන්නිවේදනය පිටුව 142, |  |
| ආරක්ෂිත, ධනාත්මක සහ ආකර්ෂණීය සේවා පරිසරය<br>වෙනස්වන සමාජ-ආර්ථික පරිසරයක සේවක සෞඛ්‍යය සහ සුභසාධනය<br>තනි තනිව සහ සාමූහික වශයෙන් හඬනැගීමේ සහ දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමේ හැකියාව |  | | | |
| වැටුප් සහ උසස්වීම් සඳහා සමාන අවස්ථාව<br>විවිධත්වය සහ අන්තර්ග්‍රහණය අවධාරණය කරමින් රැකියා අවස්ථා ලබාදීම<br>සාමූහික ගිවිසුම් පිළිබඳ සාකච්ඡා |  | | | |

සම්බන්ධතා දර්ශකයේ ගුණාත්මකභාවය ★★★★

## නියාමකයින් සහ රාජ්‍ය ආයතන

ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL), මුදල් අමාත්‍යංශය. විගණකාධිපති දෙපාර්තමේන්තුව, අනෙකුත් රාජ්‍ය සහ වෘත්තීය සංවිධාන

### අපට එය වැදගත් වන ආකාරය

යහපත් සහ කාර්යක්ෂම බැංකු පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට සහ ඇති කිරීමට බලපත්‍රය ඔවුන් ලබා දේ.

| අප නිරතවන ආකාරය | නිරතවන වාර ගණන |
|---|---|
| නියෝග සහ චක්‍රලේඛ | අවශ්‍ය වූ විට |
| මූල්‍ය ප්‍රකාශන | කලින් කලට |
| ව්‍යවස්ථාපිත පරීක්‍ෂණ | නිතරම/කලින් කලට |
| නියාමන වාර්තාකරණය | නිතරම/කලින් කලට |
| නියාමකයන්ගේ නියෝජිතයින් සමඟ සම්මුඛ සාකච්ඡා සහ රැස්වීම් | අඛණ්ඩව |
| කර්මාන්තශාලා පෝරම සහ රැස්වීම් | නිතිපතා |
| වැඩබිම් අධීක්ෂණය | නිතරම |

| ප්‍රමුඛතා | ප්‍රමාණාත්මක කරුණු | අපගේ ප්‍රතිචාරය | ප්‍රාග්ධනයට අදාළත්වය සහ තිරසර සංවර්ධන අරමුණුවලට දායකත්වය | ප්‍රාග්ධනය කෙරෙහි බලපෑම |
|---|---|---|---|---|
| සියලුම නෛතික හා නියාමන අවශ්‍යතා සමඟ අනුකූලවීම | | • පද්ධතික අවදානම් අවම කිරීමට නීති සහ රෙගුලාසිවලට අනුකූලවීම<br>• ආරක්ෂිත සහ ස්ථායී බැංකුකරණ පද්ධතියක් සහ ශක්තිමත් සමාජයක් ඇති කරවන තිරසාර බැංකු පරිචයන් සහ නියාමන අනුකූලතා අදාළ කර ගැනීම<br>• බැංකුව සම්බන්ධයෙන් පාරිභෝගික විශ්වාසය සහතික කිරීම සහ ජනප්‍රියත්වය හීනවීමේ අවදානම් සඳහා ඇති හැකියාවන් අවම කිරීම<br>• කාලෝචිත සහ සවිස්තරාත්මක නියාමන යාවත්කාලීන කිරීම් සහ අනාවරණයන් සැපයීම<br>• අපගේ බදු සහ ලාභාංශ හරහා රජයේ අයවැය වෙත අර්ථවත් ආකාරයෙන් දායකවීම<br>• රැකියා නිර්මාණය<br>• රජයේ සුරැකුම්පත් ආයෝජන සඳහා ක්‍රියාකාරී සහභාගිත්වය<br>• රජයේ සංවර්ධන සැලසුම් සහ ජාතික ප්‍රමුඛතාවන්ට දායකවීම<br>• පාරිසරික සහ සමාජීය වශයෙන් වගකීමෙන් යුතුව මෙහෙයුම් කළමනාකරණය කිරීම | 16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS<br>17 PARTNERSHIPS FOR THE GOALS<br>9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE<br>**නියාමන අනුකූලතාව ශක්තිමත් කිරීම පිටුව 157.**<br>**අපගේ ප්‍රාග්ධනය ශක්තිමත්ව පැවතීම පිටුව 101.**<br>**අරමුදල් සහ ද්‍රවශීලතා අවදානම කළමනාකරණය පිටුව 106.**<br>**කීර්තිමත් සංවිධානයක් ගොඩනැගීම පිටුව 124.**<br>**වටිනාකම් සහ සදාචාර පිටුව 124.**<br>**ශක්තිමත් පද්ධති සහ ක්‍රියාවල පිටුව 126.** | |
| අවදානම් සවිඥානක සහ අනුකූලතා සංස්කෘතිය කාවද්දා ගැනීම | | | | |
| ක්ෂේත්‍රය තුළ වගකිවයුතු තරඟකරුවෙක්විම | | | | |
| ජාතික න්‍යායපත්‍රයට සහ ප්‍රතිපත්තිවලට සහයවීම | | | | |
| විශ්වාසය ඉහළ නැංවීම සහ බැංකු ක්ෂේත්‍රයේ ස්ථායීතාවය පවත්වාගෙන යාම | | | | |
| තිරසාර සංවර්ධනය සහ නව්‍යකරණය ප්‍රවර්ධනය | | | | |
| මූල්‍ය අපරාධ, සයිබර් ආරක්ෂාව, දත්ත පාලනය සහ දත්තවල රහස්‍යතාව, සාධාරණ ගනුදෙනු සහ හැසිරීම මෙන්ම ණය අවදානම් කළමනාකරණය | | | | |

සම්බන්ධතා දර්ශකයේ ගුණාත්මකභාවය ★★★

## ව්‍යාපාර හවුල්කරුවන්

සැපයුම්කරුවන්. උපයෝගීතා සේවා සැපයුම්කරුවන්, අනෙකුත් සේවා සැපයුම්කරුවන්, අනුරූප බැංකු සහ විදේශ විනිමය හුවමාරු සමාගම්.

### අපට එය වැදගත් වන ආකාරය

- අපගේ මෙහෙයුම් සංවර්ධනය කර පවත්වා ගැනිමට අවශ්‍ය උපකරණ සහ ප්‍රවීනත්ව සහය සේවා ඔවුන් ලබා දේ.
- පිරිවැය ඵලදායී ආකාරයෙන් නිෂ්පාදන සහ සේවා සැපයීම සඳහා අපට ඇති හැකියාව කෙරෙහි බලපෑමක් ඇති කරයි.

| අප නිරතවන ආකාරය | නිරතවන වාර ගණන |
|---|---|
| ප්‍රසම්පාදන සැලැස්ම | කලින් කලට |
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය | අවශ්‍ය වූ විට |
| සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන් සමඟ රැස්වීම් | නිතරම/කලින් කලට |
| අඩවි අධීක්ෂණ | අවශ්‍ය වූ විට |
| ටෙන්ඩර් දැන්වීම් | අවශ්‍ය වූ විට |
| තොරතුරු/දැන්වීම් පලකිරීම් | අවශ්‍ය වූ විට |
| නිෂ්පාදන පිළිබඳ දැනුවත් කිරීම් | අවශ්‍ය වූ විට |

| ප්‍රමුඛතා | ප්‍රමාණාත්මක කරුණු | අපගේ ප්‍රතිචාරය | ප්‍රාග්ධනයට අදාළත්වය සහ තිරසර සංවර්ධන අරමුණුවලට දායකත්වය | ප්‍රාග්ධනය කෙරෙහ බලපෑම |
|---|---|---|---|---|
| වේගවත් ගෙවීම් සමඟින් කොන්ත්‍රාත් පදනම මත වන වගකීම් ඉටු කිරීම<br>ප්‍රසම්පාදන පරිච වලදී විනිවිදභාවය<br>දිර්ඝකාලීන ව්‍යාපාරික සම්බන්ධතා | | • සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන් සමඟ යහපත්, අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභි සම්බන්ධතා පවත්වා ගෙන යාම<br>• ප්‍රධාන සැපයුම්කරුවන් සමඟ නිරන්තර ඍජු සන්නිවේදන පැවැත්වීම<br>• දියහැකි අවම කාලසීමාවක් තුළ කොන්ත්‍රාත් පිරිනැමීම සහ ගෙවීම් වහාම සිදු කිරීම<br>• දේශීය සැපයුම්කරුවන් වෙතින් මිලදී ගැනීම් | 17 PARTNERSHIPS FOR THE GOALS<br>**ව්‍යාපාර හවුල්කරුවන් සමඟ ශක්තිමත් සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම පිටුව 154.** | |

සම්බන්ධතා දර්ශකයේ ගුණාත්මකභාවය ★★★

## සමාජය සහ පරිසරය

විශාල වශයෙන් සමාජය, පීඩන කණ්ඩායම්, ප්‍රජා සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන සහ මාධ්‍යය.

### අපට එය වැදගත් වන ආකාරය

- අපගේ පැවැත්මට සහ සාර්ථකත්වයට සමාජීය අදාළත්වය අත්‍යාවශ්‍ය වන අතර අපගේ අරමුණු සහ දැක්ම සඳහා ආධාරයක් සපයයි.
- ව්‍යාපාරයේ අඛණ්ඩ ස්වශක්තතාව දීර්ඝකාලීන වශයෙන් සහතික කරයි.
- අප ක්‍රියාත්මක වන ප්‍රජාව සහ පරිසරය කෙරෙහි ධනාත්මකව දායකවීමට අපි අරමුණු කරමු.

| අප නිරතවන ආකාරය | නිරතවන වාර ගණන |
|---|---|
| නිකුත් කිරීම් මාධ්‍යය | අඛණ්ඩව |
| ආයතනික වෙබ් අඩවිය | අඛණ්ඩව |
| පුවත්පත් නිවේදන, සම්මන්ත්‍රණ, සහ මාධ්‍ය ව්‍යාපාර | නිතිපතා |
| ආයතනික සමාජීය වගකීම් කටයුතු සහ අනුග්‍රාහ දැක්වීම් | නිතිපතා |
| රජයේ යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා ආධාර කිරීම | අඛණ්ඩව |
| ආයතනික සමාජීය වගකීම් ව්‍යාපෘති | අඛණ්ඩව |

| ප්‍රමුඛතා | ප්‍රමාණාත්මක කරුණු |
|---|---|
| සමාජීය, ආර්ථික සහ පාරිසරික සැලකීම් සමඟ සමාජය තුළ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කිරිම | |
| ජාතියේ සමාජීය, ආර්ථික සහ පාරිසරික අභියෝග අමතන මුලපිරීම් වලට දායකවීම | |
| සම්පත් ඵලදායි ආකාරයෙන් භාවිතා කරමින් පාරිසරික පියසටහන අවම කිරීම | |
| දැරිය හැකි මිල ගණන්වලට එදිනෙදා බැංකු පහසුකම් සඳහා ප්‍රවේශය | |
| රැකියා උත්පාදනය | |

**අපගේ ප්‍රතිචාරය**

- සියළුම සාධක ඇතුළත් ආර්ථික වර්ධනයන් ඇති කර ගැනීම සහ ආර්ථික වටිනාකම් හුවමාරුවේ වඩාත් වැදගත් ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම.
- සමාජීය සංවර්ධනය කිරීමට සහ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට දායක වන ස්ථාවර සහ ස්ථිර රැකියා නිර්මාණය කිරීම
- තිරසාර සංවර්ධන ඉලක්කවලට (SDGs) සහයවීම තුළින් ආර්ථිකය සහ සමාජය ධනාත්මකව පරිවර්තනය කිරීම
- අපගේ ප්‍රජා සම්බන්ධතා ව්‍යාපෘති හරහා වෙනසක් සිදු කිරීම
- ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම්වල විශේෂයෙන්ම ප්‍රවාහනය, සෞඛ්‍යය සහ කෘෂිකාර්මික යන අංශවල ආයෝජනය කිරීම
- යටිතල පහසුකම් සංවර්ධනය සහ රැකියා අවස්ථාවන් ලබාදීම තුළින් ජනතාවගේ ජීවිතවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට දායකවීම
- වගකීම් සහගතව මෙහෙයුම් කළමනාකරණය සහ පාරිසරික බලපෑම අවම කිරීම

**ප්‍රාග්ධනයට අදාළත්වය සහ තිරසර සංවර්ධන අරමුණුවලට දායකත්වය**




තිරසාර මූල්‍යකරණය පිටුව 168.

දියුණු වෙමින් පවතින ප්‍රජාවන් ගොඩනැගීම පිටුව 158.

තිරසාර ලොවක් සඳහා දායකවීම පිටුව 165.

වගකීම්සහගත පරිභෝජනය පිටුව 166.

**ප්‍රාග්ධනය කෙරෙහි බලපෑම**

සම්බන්ධතා දර්ශකයේ ගුණාත්මකභාවය ★★★

# ප්‍රමාණාත්මක කරුණු

## අපගේ ප්‍රමාණාත්මක කරුණු කළමනාකරණ ක්‍රියාවලිය

ප්‍රමාණාත්මක ඇගයීම් ක්‍රියාවලිය අපගේ ඒකාබද්ධ චින්තනය තුළ වැදගත් අංගයක් වන අතර. අපගේ ව්‍යාපාරයේ දිගු කාලීන තිරසාරභාවය සහ අපගේ පාර්ශ්වකරුවන් සඳහා වටිනාකම නිර්මාණය සහතික කරයි. අප හඳුනාගන්නා ප්‍රමාණාත්මක කරුණු, අපගේ අභ්‍යන්තර හා බාහිර වාර්තාකරණයේ පදනම සාදන අතර වටිනාකම නිර්මාණය කිරීමට ඇති අපගේ හැකියාව කෙරෙහි මෙන්ම පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා හා සංජානන සහ මෙහෙයුම් පරිසරය තුළ මතුවෙමින් පවතින අවස්ථා හා අවදානම් කෙරෙහි විශාලතම බලපෑමක් ඇති කළ හැකි ගැටළු පිළිබිඹු කරයි.

ප්‍රමාණාත්මක මාතෘකා හඳුනා ගැනීම සහ ඒවා බැංකුවේ උපාය මාර්ග සංවර්ධනය සමඟ සමගාමීව ඒකාබද්ධ කිරීම සඳහා පසුගිය වසර කිහිපය තුළ ජාතික ඉතිරිකිරීමේ බැංකුව සිය ක්‍රියාදාමයන් අඛණ්ඩව පුළුල් කර ඇත. මෙම කරුණු අවදානම් කළමනාකරණය කිරීමට සහ ඉන් ඇතිවන අවස්ථාවන් උපරිම කිරීම සඳහා අපගේ උපාය මාර්ගය තුළ දැනුම් දේ.

### 1. හඳුනාගැනිම

ඒකාබද්ධ චින්තනය යොදාගනිමින් ක්‍රමානුකූල අඛණ්ඩ අභ්‍යන්තර ක්‍රියාවලියක් මත පදනම් වි අපගේ ප්‍රමාණාත්මක කරුණු අපි තීරණය කරමු. මෙහෙයුම පරිසරය. අපගේ සම්පත්, අභ්‍යන්තර වාර්තා සහ සියලූම අංශවල යෙදවුම් මෙන්ම අපගේ පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිචාර (අභ්‍යන්තර සහ බාහිර) සැලකිල්ලට ගනිමින් අපගේ ව්‍යාපාර සන්දර්භය විශ්ලේෂණය කිරීමට පුළුල් පර්යේෂණ පවත්වනු ලැබේ. මූල්‍ය, කීර්තිනාම, මෙහෙයුම්, පාරිසරික, සමාජීය, උපාය මාර්ගික හෝ ව්‍යවස්ථාදායක යන සැලකියයුතු කරුණු මෙම ක්‍රියාවලිය තුළින් හඳුනාගනී.


සමාජ, ආර්ථික සහ පාරිසරික  උත්සුකයන් පදනම් කරගෙන අපගේ ප්‍රමාණාත්මක මාතෘකා අපි රැස් කරමු. එහිදී ශ්‍රී ලංකාවේ දේශීය කොන්දේසිවලට පමණක් නොව, ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ සභාව (IIRC) පිළිබඳ ජාත්‍යන්තර මාර්ගෝපදේශ, එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුණු මෙන්ම ගෝලිය වාර්තාකරණ ප්‍රවේශය (GRI) විසින් නිකුත් කළ තිරසාර වාර්තාකරණය පිළිබඳ (GRI) ප්‍රමිතිවලට අනුකූලව අපි කටයුතු කරමු.

අපගේ මෙහෙයුම් පරිසරය සහ අපගේ උපාය මාර්ගය විතැන්වීමේ සන්දර්භය තුළ වැඩිදියුණු කරන ලද පසුගිය වසරේ ප්‍රමාණාත්මක කරුණු මෙම වසරේ ක්‍රියාවලිය සඳහා ආරම්භක ස්ථානය විය. 2019 වසර සඳහා හඳුනාගත් ප්‍රමාණාත්මක කරුණු පසුගිය වසරේ වාර්තාකරන ලද කරුණුවලට වඩා වෙනස් නොවේ.

### 2. ප්‍රමුඛතාකරණය

ප්‍රමාණාත්මකතා අනුකෘතියේ නිරූපණය කර ඇති පරිදි, මෙම විශ්ලේෂණයේ  ප්‍රතිඵල සහ හඳුනාගත් ප්‍රධාන අවදානම් සහ අවස්ථාවන් භාවිතා කරමින්, අපගේ උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීමට සහ අපගේ පාර්ශ්වකරුවන්ට කෙටි, මධ්‍යම සහ දිගු කාලීන වටිනාකමින් තිරසාර වටිනාකමක්  නිර්මාණය කිරීමට අපට ඇති හැකියාව සඳහා වඩාත් වැදගත් වන කරුණු වලට අපි ප්‍රමුඛත්වය දෙමු.

## අපගේ ප්‍රමාණාත්මක ඇගයීම් ක්‍රියාවලිය



පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිෂ්ඨාවේ මට්ටම සහ අපගේ ව්‍යාපාරයේ ශක්‍යතාව සහ පාර්ශ්වකරුවන් සමඟ ඇති සම්බන්ධතාවයේ බලපෑම පුළුල් කිරීම මෙන්ම මාතෘකාවේ සීමාව මත පදනම්ව හඳුනාගත් ගැටළු අපි ප්‍රමාණාත්මක සිතියමක ලකුණු කළෙමු. අපගේ සමාජීය. ආර්ථික සහ පාරිසරික කරුණු අත්‍යවශ්‍ය, ඉතා වැදගත් සහ වැදගත් ලෙස කණ්ඩායම් තුනකට වර්ගීකරණය කෙරේ.


### 3. අදාළ කිරීම සහ තක්සේරු කිරීම

අපගේ ප්‍රමාණාත්මක කරුණු අපගේ උපාය මාර්ග සහ මෙහෙයුම් සැලසුම්වලට අපි යොදා ගනිමු. මෙම කරුණු අපගේ සය වැදෑරුම් ප්‍රාග්ධනය අතර වෙළඳ ගැලපුම් ඇගයීමට ලක්කරමින් අපගේ උපාය මාර්ගික වටිනාකම් ධාවකයින් සමඟ සම්බන්ධ වන අතර අපගේ තීරණ ගැනීම සහ වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය තුළ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඒවායේ බලපෑම අගය කරමින් සහ වටිනාකම නිර්මාණයට බාධා කිරීමට ඇති හැකියාව අවම කිරීම සඳහා සුදුසු උපාය මාර්ග සකස් කිරීමෙන් මෙන්ම වැඩි වටිනාකමක් නිර්මාණය කිරීමට අවස්ථාව ලබාදුන් එම සාධක උපයෝගී කර ගැනීම සඳහා කළමනාකරණ මැදිහත්වීම් වලින් අපි ප්‍රතිචාර දක්වමු.

බැංකුව තුළ ක්‍රියාත්මක කරන හඳුනාගත් මූලික කාර්යසාධන දර්ශක (KPIs) භාවිතා කරමින් මෙම උපාය මාර්ගයට එරෙහිව අපගේ කාර්යසාධනය අපි නිරීක්ෂණය කරමු. මෙම කරුණු අඛණ්ඩව අපි තක්සේරු කරන අතර අපගේ උපාය මාර්ගය අදාළ වන බව සහතික කිරීම සඳහා වාර්ෂික උපාය මාර්ගික ව්‍යාපාර සැලසුම් වැඩමුළුව තුළ සමාලෝචනය කරමු.

### ප්‍රමාණාත්මක අනුකෘතිය

අපගේ ප්‍රමාණාත්මක ඇගයීම් ක්‍රියාවලියෙන් පසුව, අපගේ මෙහෙයුම් කෙරෙහි බලපෑම් ඇති කළහැකි සහ අපගේ පාර්ශ්වකරුවන් වෙත විශාල වැදගත්කමක් ඇති ප්‍රමාණාත්මක කරුණු 15 ක් හඳුනාගෙන ඇත. පහත රූපසටහනේ දැක්වෙන පරිදි ප්‍රමාණාත්මක කරුණු ආර්ථික, පාරිසරික සහ සමාජීය වශයෙන් ප්‍රධාන කාණ්ඩ තුනක් යටතට ගොනු කර ඇත. අපි මෙම කරුණු ප්‍රමුඛකරණය ද කර පහත ප්‍රමාණාත්මක අනුකෘති රූපසටහනෙහි ස්ථානගත කර ඇතඃ




## පාරිසරික

12 පාරිසරික පියසටහන

## සමාජ

1 පාරිභෝගික සේවාව සහ අත්දැකීම

2 අවදානම් ඉලක්ක කරගත් ආයතනික සංස්කෘතිය

3 ඩිජිටල් පරිවර්තනය

4 සයිබර් ආරක්ෂාව, වංචා වැලැක්වීම සහ මුදල් විශුද්ධිකරණයට විරුද්ධව ක්‍රියා කිරීම

6 නියාමන අනුකූලතාවය

7 වගකීම්සහගත ණය ලබාදීම

9 ආර්ථික සහ සමාජීය බලපෑම

10 දක්ෂයින් ආකර්ෂණය කර ගැනීම සංවර්ධනය සහ රඳවා ගැනීම

11 විවිධත්වය සහ අන්තර්ග්‍රහණය

13 සේවා ස්ථානයේ ආරක්ෂාව, සෞඛ්‍ය සහ සුභසාධනය

14 සැපයුම් දාම වගකීම

## ආර්ථික

5 දායකයන් සඳහා ආර්ථික වටිනාකම

9 ආර්ථික හා සමාජීය බලපෑම

8 මූල්‍ය අන්තර්ග්‍රහණය

15 මෙහෙයුම් කාර්යක්ෂමතාව

ණය අවදානම

වෙළඳපොළ අවදානම

ද්‍රවශීලතා අවදානම

මෙහෙයුම් අවදානම

කීර්තිනාම අවදානම

උපායමාර්ගික අවදානම

## ගනුදෙනුකාර සේවය සහ අත්දැකීම

ඉහළ මට්ටමේ ගනුදෙනුකාර තෘප්තිය සහ ආයතනය කෙරෙහි විශ්වාසය ඇති කරන නව්‍යකරණ හා ඵලදායී ගනුදෙනුකාර විසඳුම්, ව්‍යාපාර ආචාරධර්ම කෙරෙහි දැඩි කැපවීමක් සහිත උසස් සේවා තත්ත්වයකින් සමන්විත අසමසම ගනුදෙනුකාර වටිනාකම් කොටසක් පිරිනැමීම.

**එය වැදගත්වන ආකාරය: අවදානම සහ අවස්ථාවන්**

විශිෂ්ඨ ගනුදෙනුකාර සේවාවක් ලබාදීම විශ්වාසය, මූල්‍යමය ශක්තිය සහ ස්ථාවරත්වය ගොඩ නැගීමට අත්‍යවශ්‍යය. දුර්වල ගනුදෙනුකාර සේවය සහ ධාරිතා සීමාවන්, ගනුදෙනුකාර සම්බන්ධතා අඩාලවීමට සහ ව්‍යාපාරය පාඩු ලැබීමට හේතු වේ.

ගනුදෙනුකරුවන් සහ සේවාදායකයින් අත්කර ගැනීම හා රඳවා තබා ගැනීම සඳහා, නව්‍යකරණ සහ පිරිවැය - ඵලදායි නිෂ්පාදන සහ විසඳුම් පිරිනැමීම මගින් රඳාපැවැත්මට අපට සිදුවේ.

**කළමනාකරණ ප්‍රවේශය**

- විස්තීර්ණ ඩිජිටල් සහ භෞතික පැවැත්ම තුළින් පක්ෂපාති සහ තෘප්තිමත් ගනුදෙනුකාර පදනමක් පවත්වා ගැනිම සහ වර්ධනය කිරීම
- තාක්ෂණය තුළින් සියලුම මාර්ග හරහා අපගේ ගනුදෙනුකාර සේවාවේ ගුණාත්මකභාවය සහ වේගය වේගවත් කිරීම
- කාර්යක්ෂම ගනුදෙනුකාර අත්දැකීමක් ලබාදිම සඳහා නිෂ්පාදන සහ ක්‍රියාවලි නව්‍යකරණය

කාලරාමුව - කෙටිකාලීන සිට දිගුකාලීන

**කරුණු මතු කළ අය**

| GRI මාතෘකාව | GRI සීමාව |
| --- | --- |
| 416 – ගනුදෙනුකාර සෞඛ්‍ය සහ ආරක්ෂාව | පිටත |
| 417 – අලෙවිකරණය සහ ලේබල්කරණය | පිටත |

**අදාළ උපාය මාර්ගික ප්‍රමුඛතා**

**අදාළ ප්‍රාග්ධනය**

**අදාළ ඇල්මැති පාර්ශ්වකරුවන්**

බලපාන ලද SDGs

9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE

17 PARTNERSHIPS FOR THE GOALS

## දායකවන්නන් සඳහා ආර්ථික වටිනාකම

අපගේ ආයෝජකයාට ස්ථාවර ප්‍රතිලාභ ලබාදීම සහ බදු, රැකියා අවස්ථා නිර්මාණය, වෙළෙඳ සහ කර්මාන්ත සඳහා පහසුකම් සැලසීම සහ අපගේ පාර්ශ්වකරුවන්ගේ මූල්‍යමය ප්‍රත්‍යස්ථිතිය ශක්තිමත් කිරීම තුළින් දේශීය ආර්ථිකයේ සමාජ-ආර්ථික ප්‍රගතියට දායකවීම.

**එය වැදගත්වන ආකාරයඃ අවදානම සහ අවස්ථාවන්**

අපගේ පාර්ශ්වකරුවන්ගේ ඍජු හා වක්‍ර ආර්ථික වටිනාකම වැඩිදියුණු කිරීම තුළින් තිරසාර තරඟකාරී වාසියක් පවත්වා ගැනීමට අපට හැකිවීම.

**කළමනාකරණ ප්‍රවේශය**

- ආයතනික කාර්යසාධනය වර්ධනය සඳහා අයවැයකරණය සහ උපාය මාර්ගික සැලසුම්කරණය
- කාබනික වර්ධනය කෙරෙහි යොමුවීම සහ මූල්‍යමය කාර්යසාධනය වැඩි දියුණු කිරීමට වෙළෙඳපොල කොටස ඉහළ නැංවීම
- ආර්ථික වර්ධනය ඉදිරියට ගෙන යාමට ඵලදායි පිරිවැය කළමනාකරණය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම
- ඵලදායිතා වැඩිදියුණු කිරීම් සාක්ෂාත් කර ගැනීම සඳහා අභ්‍යන්තර ක්‍රියාවලි, පද්ධති සහ පාලනයන් අඛණ්ඩව වැඩිදියුණු කිරීම.
- බැංකුවේ ස්ථාවරත්වය ඉහළ නැංවීම පිණිස අපේක්ෂිත අවදානම් රුචිය සමග සක්‍රිය අවදානම් කළමනාකරණය

කාලරාමුව – කෙටිකාලීන සිට දිගුකාලීන

**කරුණු මතු කළ අය**

| GRI මාතෘකාව | GRI සීමාව |
|---|---|
| 201 – ආර්ථික කාර්යසාධනය | ඇතුළත සහ පිටත |
| 203 – වක්‍ර ආර්ථික බලපෑම් | පිටත |

**අදාළ උපාය මාර්ගික ප්‍රමුඛතා**

**අදාළ ප්‍රාග්ධනය**

**අදාළ ඇල්මැති පාර්ශ්වකරුවන්**

**බලපාන ලද SDGs**

10 REDUCED INEQUALITIES | 8 DECENT WORK AND ECONOMIC GROWTH | 1 NO POVERTY

## නියාමන අනුකූලතාව

අදාළ වන නීතිරීති, රෙගුලාසි සහ ප්‍රමිතිවලට අනුකූලවීමෙන් වෘත්තීය හා සාදාචාරාත්මක හැසිරීම්වල ඉහළම ප්‍රමිතීන් පවත්වා ගැනීම සහ යහපත් අවදානම් කළමනාකරණ රාමුවක් පවත්වා ගැනීම.

**එය වැදගත්වන ආකාරයඃ අවදානම සහ අවස්ථාවන්**

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය බැංකුවක් සහ මහජන අරමුදල්වල භාරකරුවෙකු වන අප ක්‍රියාත්මක වන්නේ ඉහළ නියාමනය කළ පරිසරයක් තුළයි. අනුකූලතාවයේ යම් අසමත්කමක්, අපගේ බැංකුව කෙරෙහි ජනතා විශ්වාසය සහ භක්තිය බිඳවැටීමට සහ ජාතියේ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය අඩපණ වීමට හේතු වේ.

**කළමනාකරණ ප්‍රවේශය**

- ආරක්ෂිත, සුරක්ෂිත සහ විශ්වාසදායක බැංකු ආයතනයක් ලෙස අපගේ කාර්යභාරය නගාසිටුවීම සඳහා සක්‍රියව සහ විවෘත සහ විනිවිදභාවයෙන් යුතුව නියාමකයින් සමග කටයුතු කිරීම
- අපගේ කීර්තිනාමය සුරක්ෂිත කිරීමට අපගේ අවදානම් කළමනාකරණය සහ අනුකූලතා හැකියාවන් ශක්තිමත් කිරීම
- අපගේ ව්‍යාපාරයේ තිරසාරභාවය ආරක්ෂා කිරීමට අනුකූල නොවීමේ අවධානම ශුන්‍ය වන ප්‍රවේශයක් තිබීම

කාලරාමුව – කෙටිකාලීන සිට දිගුකාලීන

**කරුණු මතු කළ අය**

| GRI මාතෘකාව | GRI සීමාව |
|---|---|
| 205 – දූෂණ විරෝධී | ඇතුළත සහ පිටත |
| 206 – තරඟකාරී හැසිරීමට විරෝධය | ඇතුළත සහ පිටත |

**අදාළ උපාය මාර්ගික ප්‍රමුඛතා**

**අදාළ ප්‍රාග්ධනය**

**අදාළ ඇල්මැති පාර්ශ්වකරුවන්**

**බලපාන ලද SDGs**

11 SUSTAINABLE CITIES AND COMMUNITIES | 16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS | 17 PARTNERSHIPS FOR THE GOALS

## මෙහෙයුම් කාර්යක්ෂමතාව

කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ඉහළ නැංවීම තුළින් මෙහෙයුම් විශිෂ්ටත්වය හරහා අසමසම පාරිභෝගික අත්දැකීමක් ලබාදීම, ඵලදායී පිරිවැය කළමනාකරණයට සහ යම් දේවල් කළහැකි හොඳම මාර්ගවලට මඟ පාදයි.

**එය වැදගත්වන ආකාරයඃ අවදානම සහ අවස්ථාවන්**

සේවයට වාර්තා නොකිරීම හෝ මෙහෙයුම් අකාර්යක්ෂමතාව හේතු කොටගෙන ඇතිවන අඩු ඵලදායිතා මට්ටම්, දුර්වල සේවා ගුණාත්මකභාවය, විශ්වාසය අහිමිවීම සහ දුර්වල වත්කම් කාර්යසාධනයට හේතු වේ. ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව ලබාගැනීම දිගුකාලීනව අපගේ බැංකුවට වටිනාකම් කොටසක් ඇතිකරමින් තරඟකාරී වාසියක් ලබා දේ.



**කළමනාකරණ ප්‍රවේශය**

- ස්වයංක්‍රීයකරණය, ඩිජිටල්කරණය සහ තාක්ෂණය ඒකාබද්ධකිරීම තුළින් මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම
- අනවශ්‍ය ලේඛන කටයුතු අවම කිරීම සහ කාර්ය ප්‍රවාහ විධිමත් කිරීම සහ දැඩි අභ්‍යන්තර පාලනයන් අනුගමනය කිරීම
- දත්ත ග්‍රහනය වර්ධනය සහ අතින් සිදුවන දෝෂ අඩුකිරීමට වාර්තා කිරීම සහ ක්‍රියාවලියේ වේගය වැඩි කිරීම


කාලරාමුව – කෙටිකාලීන සිට මධ්‍යකාලීන

**කරුණු මතු කළ අය**



| GRI මාතෘකාව | GRI සීමාව |
|---|---|
| 205 – දූෂණ විරෝධී | ඇතුළත |
| 404 – පුහුණුව සහ අධ්‍යාපනය | ඇතුළත |

**අදාළ උපාය මාර්ගික ප්‍රමුඛතා**



**අදාළ ප්‍රාග්ධනය**



**අදාළ ඇල්මැති පාර්ශ්වකරුවන්**



බලපාන ලද SDGs




## නිපුණතා ආකර්ෂණය, සංවර්ධනය සහ රඳවාගැනීම

නිවැරදි නිපුණතා ආකර්ෂණය, සංවර්ධනය සහ රඳවාගැනීම තුළින් වටිනාකම නිර්මාණය කිරීමේ අපගේ හැකියාව වැඩි කිරීම සඳහා හිතකර පරිසරියක් තුළ ජයග්‍රාහී කණ්ඩායමක ක්‍රියාකාරීත්වය සංවර්ධනය කිරීම.

**එය වැදගත්වන ආකාරයඃ අවදානම සහ අවස්ථාවන්**

නිවැරදි නිපුණතා ආකර්ෂණය, සංවර්ධනය සහ රඳවාගැනීම, හුවමාරු වටිනාකම අඛණ්ඩව නිර්මාණය සඳහා සහ ව්‍යාපාර අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපගේ උපායමාර්ග කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ඉතා වැදගත් වේ.

හිඟ කුසලතා සඳහා අවශ්‍යතාවය සහ විශේෂිත කුසලතා සඳහා තරඟ කිරීම.



**කළමනාකරණ ප්‍රවේශය**

- නිශ්චිත කළමනාකරණ මට්ටම් ඉලක්ක කර ගනිමින් නායකත්ව වැඩසටහන් පැවැත්වීම සහ පුහුණු කිරීම
- උපකාරි පරිසරයක් නිර්මාණය කිරීම සහ වෘත්තීය දියුණුව සඳහා අවස්ථාවන් ලබාදීම සහ සේවක කුසලතා මුවහත් කිරීමට පුහුණුව
- අනාගතයට සූදානම් කරවීම සඳහා අපගේ ශ්‍රම බලකාය නැවත පුහුණු කිරීම සහ සහාය දීම

කාලරාමුව – කෙටිකාලීන සිට දිගුකාලීන

**කරුණු මතු කළ අය**



| GRI මාතෘකාව | GRI සීමාව |
|---|---|
| 202 – වෙළෙඳපොල පැවැත්ම | පිටත |
| 401 – සේවා නියුක්තිය | ඇතුළත සහ පිටත |
| 404 – පුහුණුව සහ අධ්‍යාපනය | ඇතුළත |
| 407 – එක්රැස්වීමට සහ සාමූහික කේවල්කරණයට ඇති නිදහස | ඇතුළත |

**අදාළ උපාය මාර්ගික ප්‍රමුඛතා**



**අදාළ ප්‍රාග්ධනය**



**අදාළ ඇල්මැති පාර්ශ්වකරුවන්**



බලපාන ලද SDGs



## ඩිජිටල් පරිවර්තනය

ගනුදෙනුකරුවන්ගේ වෙනස්වන අවශ්‍යතා සපුරාලීම සහ අපගේ වෙළෙඳපොළ අවකාශය තුළ ඩිජිටල් සහ දත්ත විශේෂඥයින් සඳහා අපගේ ක්‍රියාවලි පරිවර්තනය කිරීම සහ නව දක්ෂතා ඇති කිරීම මගින් උසස් ගනුදෙනුකාර අත්දැකීමක් ලබාදීමට ඩිජිටල්කරණය තුළ ආයෝජනය.

**එය වැදගත්වන ආකාරයː අවදානම සහ අවස්ථාවන්**

නැගීඑන තාක්ෂණය සමග මුසුවීම අපගේ බැංකුවේ තිරසාරභාවය ශක්තිමත් කරන අතර ස්ථාවර මූල්‍ය වර්ධනයකට එය හේතු වේ. එමෙන්ම එය අපගේ සේවා හැකියාවන් වර්ධනය කර අපගේ සේවකයින්ගේ ඵලදායිතාව ඉහළ නංවමින් නවෝත්පාදන සංස්කෘතියක් පෝෂණය කරයි.

**කළමනාකරණ ප්‍රවේශය**

- සියලුම නිෂ්පාදන හා සේවා ඩිජිටල් මාර්ගවලින් ලබාගැනීමට සැලැස්වීම
- අපගේ ක්‍රියාවලි නැවත සැකසීම, ඩිජිටල්කරණය සහ ස්වයංක්‍රීයකරණය
- අපගේ තොරතුරු තාක්ෂණ ගෘහ නිර්මාණ ශිල්පය සහ පද්ධති විකාශනය කිරීම
- අපගේ එදිනෙදා මෙහෙයුම්වලදී නව තාක්ෂණයන් යොදා ගැනීම
- කඩිනම් දත්ත මත පදනම් ආයතනයක් බවට පත්වීම

**කාලරාමුව – කෙටිකාලීන සිට මධ්‍යකාලීන**

**කරුණු මතු කළ අය**

| GRI මාතෘකාව | GRI සීමාව |
|---|---|
| 401 – සේවා නියුක්තිය | ඇතුළත |
| 413 – දේශීය ප්‍රජාව | පිටත |
| 418 – පාරිභෝගික පුද්ගලිකත්වය | ඇතුළත |

**අදාළ උපාය මාර්ගික ප්‍රමුඛතා**

**අදාළ ප්‍රාග්ධනය**

**අදාළ ඇල්මැති පාර්ශ්වකරුවන්**

**බලපාන ලද SDGs**

9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE | 11 SUSTAINABLE CITIES AND COMMUNITIES | 13 CLIMATE ACTION | 17 PARTNERSHIPS FOR THE GOALS

## අවදානම කේන්ද්‍රීය ආයතනික සංස්කෘතිය

දැනුවත් අවදානම පදනම් තීරන ගැණීම තුළින් ස්ථාවර සහ තිරසාර වර්ධනයක් අත්කර ගැනීමට ශක්තිමත් අවදානම් සංස්කෘතියක් සංවර්ධනය කිරීම.

**එය වැදගත්වන ආකාරයː අවදානම සහ අවස්ථාවන්**

අවදානම් කේන්ද්‍රීය සංස්කෘතියක් සංවර්ධනය ගනුදෙනුකාර ප්‍රතිඵල වැඩිකර, ගනුදෙනුකාර විශ්වාසය ඉහළ නංවන අතර, මූල්‍ය ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මකවීමේ බලපත්‍රය සහ විශ්වාසය ප්‍රවර්ධනය කිරීමට අවස්ථාව අපට ලබා දේ.

**කළමනාකරණ ප්‍රවේශය**

- ශක්තිමත් අභ්‍යන්තර ක්‍රියාවලි සහ පාර්ශ්වකාර ප්‍රතිචාර තුළින් වියහැකි අවදානම් අවමකිරීම
- මෙහෙයුම් පරිසරයට බැංකුවේ අවදානම් රුචිය ගැලපීම සහ අපගේ අවදානම් නිරාවරණ සඳහා විචක්ෂණ කළමනාකරණය
- සදාචාරාත්මක හැසිරීම් සංස්කෘතියක් කා වැද්දීම සහ නිවැරදි ව්‍යාපාරය නිවැරදි ආකාරයෙන් කිරීම
- පාර්ශ්වකාර බැඳියාවන් ආරක්ෂා කිරීම සඳහා විශිෂ්ඨ ආයතනික පාලන ව්‍යවහාර සහ ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුවක් අනුගමනය කිරීම.

**කාලරාමුව – කෙටිකාලීන සිට දිගුකාලීන**

**කරුණු මතු කළ අය**

| GRI මාතෘකාව | GRI සීමාව |
|---|---|
| 205 – දූෂණ විරෝධී | ඇතුළත සහ පිටත |
| 206 – තරඟකාරීත්ව හැසිරීම් වලට විරෝධය | ඇතුළත සහ පිටත |
| 403 – වෘත්තීමය සෞඛ්‍ය සහ ආරක්ෂාව | ඇතුළත |
| 418 – පාරිභෝගික පුද්ගලිකත්වය | ඇතුළත සහ පිටත |

**අදාළ උපාය මාර්ගික ප්‍රමුඛතා**

**අදාළ ප්‍රාග්ධනය**

**අදාළ ඇල්මැති පාර්ශ්වකරුවන්**

**බලපාන ලද SDGs**

11 SUSTAINABLE CITIES AND COMMUNITIES | 17 PARTNERSHIPS FOR THE GOALS | 16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS | 12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION

## සයිබර් ආරක්ෂාව, වංචාව වැලැක්වීම සහ මුදල් විශුද්ධිකරණයට එරෙහි

සයිබර් ආරක්ෂාව, වංචාව වැලැක්විම සහ මුදල් විශුද්ධකරණයට එරෙහිවීමට ප්‍රමුඛතාවය දී සුරක්ෂිත සහ විශ්වාසදායක බැංකු පරිසරයකට දායක වීම.

**එය වැදගත්වන ආකාරයඃ අවදානම සහ අවස්ථාවන්**

බැංකුකරණ සේවාවල ඩිජිටල්කරණය සහ ව්‍යාපාර ක්‍රියාවලීන් හී ස්වයංක්‍රීයකරණය සඳහා වැඩිවන ප්‍රවණතාව සමඟ, සයිබර් ආරක්ෂාව, වංචාව වැලැක්විම සහ මුදල් විශුද්ධකරණයට එරෙහිවීම බැංකුවේ කීර්තිනාමයට ශක්තිමත් ආකාරයෙන් බලපාන බැවින් ඉහළ ප්‍රමුඛතා ක්ෂේත්‍ර බවට පත්ව ඇත

**කළමනාකරණ ප්‍රවේශය**

- උපායමාර්ගික වෙනස්කරුවෙක් ලෙස සයිබර් ආරක්ෂාව සහ දත්ත කළමනාකරණය තුළ අඛණ්ඩ ආයෝජනය
- ගනුදෙනුකරුගේ දත්තවල ආරක්ෂාව ශක්තිමත් කිරීමට සහ වංචාව වැලැක්වීමට ශක්තිමත් අවදානම් කළමනාකරණ පද්ධති සහ ක්‍රියාවලි
- ගනුදෙනුකරුවන්ගේ තොරතුරු සහ රහස්‍යතාව සුරක්ෂිත කිරීමට ඵලදායි ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම.
- මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය ශක්තිමත් කිරිමට සහ තර්ජනවල බලපෑම අවමකිරීමට රජය සහ අදාළ ආයතන හා සමකර්මාන්ත සමඟ සහයෝගිත්වය
- සයිබර් අපරාධ, මුදල් විශුද්ධකරණය සහ ත්‍රස්තවාදී මූල්‍යකරණය වැලැක්වීමට නියාමකයින්ට සහයවීම

කාලරාමුව – කෙටිකාලීන සිට දිගුකාලීන

**කරුණු මතු කළ අය**

| GRI මාතෘකාව | GRI සීමාව |
|---|---|
| 418 – පාරිභෝගික පුද්ගලිකත්වය | ඇතුළත සහ පිටත |
| 205 – දූෂණ විරෝධී | ඇතුළත සහ පිටත |

**අදාළ උපාය මාර්ගික ප්‍රමුඛතා**

**අදාළ ප්‍රාග්ධනය**

**අදාළ ඇල්මැති පාර්ශ්වකරුවන්**

බලපාන ලද SDGs

16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS
9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE
12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION

## සේවා ස්ථානයේ ආරක්ෂාව, සෞඛ්‍ය සහ යහ පැවැත්ම

සේවකයින්ගේ භෞතික, මානසික සහ සමාජීය යහපැවැත්ම සහතික කිරිම සඳහා ආරක්ෂිත සහ සෞඛ්‍ය සම්පන්න සේවා පරිසරයක් නිර්මාණය කිරිම.

**එය වැදගත්වන ආකාරයඃ අවදානම සහ අවස්ථාවන්**

ආරක්ෂිත සහ සෞඛ්‍ය සම්පන්න සේවා ස්ථානයක් පවත්වා ගැනීම, සේවක යහපැවැත්ම, රැකියා තෘප්තිය සහ සේවක අභිප්‍රේරණය වර්ධනය තුළින් ඉහළ කාර්යසාධනයක් ළඟාකර ගැනීම අපගේ සාර්ථකත්වය සඳහා මූලික වේ.

**කළමනාකරණ ප්‍රවේශය**

- සේවක යහපැවැත්ම සහ සමිප සහභාගිත්වය ඉදිරියට ගෙනයන හිතකර සේවා ස්ථානයක් සඳහා අවශ්‍ය පහසුකම් ලබාදිම
- ආරක්ෂිත පෙරහුරු පැවැත්විම ඇතුළුව සේවකයින්ගේ සෞඛ්‍ය සහ ආරක්ෂාවට අදාළ කරුණු සන්නිවේදනය කිරිම
- සේවා ස්ථානය තුළ උවදුරු සහ අවදානම් අවම කිරීමට ආරක්ෂිත ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි ශක්තිමත් කිරිම

කාලරාමුව – කෙටිකාලීන සිට දිගුකාලීන

**කරුණු මතු කළ අය**

| GRI මාතෘකාව | GRI සීමාව |
|---|---|
| 403 – වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව | ඇතුළත |

**අදාළ උපාය මාර්ගික ප්‍රමුඛතා**

**අදාළ ප්‍රාග්ධනය**

**අදාළ ඇල්මැති පාර්ශ්වකරුවන්**

බලපාන ලද SDGs

8 DECENT WORK AND ECONOMIC GROWTH
9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE
3 GOOD HEALTH AND WELL-BEING

## පාරිසරික පියසටහන

බැංකුවේ දිගුකාලීන තිරසාර අගය නිර්මාණය සහතික කිරීමට අපගේ පාරිසරක පියසටහන අවම කරමින් සහ අපගේ මිහිතලය ආරක්ෂා කරමින් කාබන් අවම වූ ආර්ථිකයක් ගොඩනැගීම කරා දායකවීම.

**එය වැදගත්වන ආකාරයඃ අවදානම සහ අවස්ථාවන්**

මිහිතලය ආරක්ෂා කිරීම සහ අපගේ දෛනික මෙහෙයුම්වලදී අපගේ පාර්ශ්වකරුවන් සඳහා ධනාත්මක දිගුකාලීන ප්‍රතිඵල නිර්මාණය කිරිම ආයතනයේ දිගුකාලින තිරසාරභාවය සඳහා අත්‍යවශ්‍ය වේ.

**කළමනාකරණ ප්‍රවේශය**

- රජයේ සහ එක්සත් ජාතින්ගේ තිරසාර සංවර්ධන අරමුණු සමඟ  අපගේ පරමාර්ථ හැඩගැස්විම
- කඩදාසි, ජලය සහ බලශක්ති පාරිභෝජනය අවම කිරීම සහ කාර්යක්ෂම අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙහි පුළුල්ව අවධානය යොමු කරමින් අපගේ සම්පත් කළමනාකරණය කිරීම
- වගකීම්සහගත මූල්‍යකරණය සහ බලශක්ති සංරක්ෂණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම

කාලරාමුව – කෙටිකාලීන සිට දිගුකාලීන

**කරුණු මතු කළ අය**

| GRI මාතෘකාව | GRI සීමාව |
|---|---|
| 302 – බලශක්තිය | ඇතුළත සහ පිටත |
| 303 – ජලය | ඇතුළත සහ පිටත |

**අදාළ උපාය මාර්ගික ප්‍රමුඛතා**

**අදාළ ප්‍රාග්ධනය**

**අදාළ ඇල්මැති පාර්ශ්වකරුවන්**

බලපාන ලද SDGs

## ආර්ථීක හා සමාජීය බලපෑම

ප්‍රජා සංවර්ධනයට සහයවීම සහ ශක්තිමත් ප්‍රජාවන් ගොඩනැගීම මගින් අපගේ සමාජ ව්‍යුහය ශක්තිමත් කිරීම.

**එය වැදගත්වන ආකාරයඃ අවදානම සහ අවස්ථාවන්**

රජයට අයත් බැංකුවක් ලෙස, සියලූම පුරවැසියන්ගේ ජීවන තත්ත්වයන් වැඩි දියුණු කිරීමට සහ අපගේ සියලූම පාර්ශ්වකරුවන් සඳහා ධනාත්මක දිගුකාලීන ප්‍රතිඵල ඇති කිරීමට ඉවහල් වන ආයෝජන වර්ධනය සඳහා අපි ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරමු.

**කළමනාකරණ ප්‍රවේශය**

- රජයේ සහ එක්සත් ජාතින්ගේ තිරසාර සංවර්ධන අරමුණු සමඟ  අපගේ පරමාර්ථ හැඩගැස්විම
- ශක්තිමත් ප්‍රජා බලපෑමක් ඇතිවන ව්‍යාපෘතිවල ආයෝජනය
- යටිතලපහසුකම් සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ රජයේ මූල්‍යකරණය තුළ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කිරීම
- තීරණ ගැනිමේදී පාරිසරික, සමාජීය සහ පාලන ගැටළු සලකා බැලීම

කාලරාමුව – කෙටිකාලීන සිට දිගුකාලීන

**කරුණු මතු කළ අය**

| GRI මාතෘකාව | GRI සීමාව |
|---|---|
| 202 – වෙළෙඳපොල පැවැත්ම | පිටත |
| 203 – වක්‍ර ආර්ථික බලපෑම් | පිටත |
| 413 – දේශීය ප්‍රජා | පිටත |

**අදාළ උපාය මාර්ගික ප්‍රමුඛතා**

**අදාළ ප්‍රාග්ධනය**

**අදාළ ඇල්මැති පාර්ශ්වකරුවන්**

බලපාන ලද SDGs

## විවිධත්වය සහ අන්තර්ග්‍රහණය

අප ක්‍රියාත්මක වන සමාජය නියෝජනය කරන විවිධ පසුබිම් වලින් සේවකයින් ඇතුළත් සංස්කෘතියක් බැංකුව තුළ නිර්මාණය කිරීම.

**එය වැදගත්වන ආකාරයː අවදානම සහ අවස්ථාවන්**

විවිධ සේවකයින් කණ්ඩායමක් කුලියට ගැනීම සහ පෝෂණය කිරීම තුළින් අපගේ බැංකුව වඩාත් ශක්තිමත් කරන සහ වඩා ඵලදායී වන විවිධාකාර අත්දැකීම්, ඉදිරි දර්ශන සහ කුසලතා උපයෝගී කරගත හැකි වේ.

**කළමනාකරණ ප්‍රවේශය**

- සේවකයින්ගේ විවිධත්වය පිලිගැනිම සහ අගය කිරීම සහ බැංකුව තුළ විවිධ ආගමික සහ සංස්කෘතික පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම.
- සමාන වගකීම් සහිත සමාන රැකියා භූමිකාවන් සඳහා කාන්තාවන් සහ පිරිමින් සඳහා සමාන වැටුපක් ලබාදීම
- බැංකුව තුළ වෙනස් කොට නොසැලකීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

**කාලරාමුව – කෙටිකාලීන සිට මධ්‍යකාලීන**

**කරුණු මතු කළ අය**

| GRI මාතෘකාව | GRI සීමාව |
|---|---|
| 401 – සේවා නියුක්තිය | ඇතුළත |
| 405 – විවිධත්වය සහ සමාන අවස්ථාව | ඇතුළත |
| 413 – දේශීය ප්‍රජා | පිටත |
| 203 – වක්‍ර ආර්ථික බලපෑම් | පිටත |

**අදාළ උපාය මාර්ගික ප්‍රමුඛතා**

**අදාළ ප්‍රාග්ධනය**

**අදාළ ඇල්මැති පාර්ශ්වකරුවන්**

**බලපාන ලද SDGs**

8 DECENT WORK AND ECONOMIC GROWTH; 11 SUSTAINABLE CITIES AND COMMUNITIES; 5 GENDER EQUALITY; 10 REDUCED INEQUALITIES

## මූල්‍ය අන්තර්ග්‍රහණය

රට පුරා සමාජයේ විවිධ කොටස් සඳහා දැරිය හැකි මූල්‍ය විසඳුම් කරා පිවිසීම ලබාදීම මගින් ප්‍රජාවන් සවිබල ගැන්වීම.

**එය වැදගත්වන ආකාරයː අවදානම සහ අවස්ථාවන්**

නව ගනුදෙනුකරුවන් අත්කර ගැනිමට සහ අපගේ වෙළෙඳපොල කොටස වැඩිකර ගැනීමට නව්‍ය සහ පිරිවැය ඵලදායී මූල්‍ය නිෂ්පාදන සහ සේවාවන් සඳහා ප්‍රවේශය ලබාදිම.

**කළමනාකරණ ප්‍රවේශය**

- භෞතික සහ ඩිජිටල් යන දෙආකාරයෙන් ගනුදෙනුකාර පිවිසුම් ස්ථානවල පුළුල් ජාලයක් සංවර්ධනය කිරීම
- පිවිසීම, ගනුදෙනුකාර පහසුව සහ දැරිය හැකි මූල්‍ය විසඳුම් වර්ධනය කිරීම
- ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ මූල්‍ය කටයුතු වඩාත් ඵලදායී ලෙස කළමනාකරණය කර ගැනීමට දැනුවත් කිරීම
- ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ අවශ්‍යතාවන්ට අනුව ඉතුරු කිරීමට. ආයෝජනය කිරීමට සහ අනාගත සැලසුම් කිරිමට සහයවීම

**කාලරාමුව – කෙටිකාලීන සිට දිගුකාලීන**

**කරුණු මතු කළ අය**

| GRI මාතෘකාව | GRI සීමාව |
|---|---|
| 413 – දේශීය ප්‍රජා | පිටත |
| 203 – වක්‍ර ආර්ථික බලපෑම් | පිටත |

**අදාළ උපාය මාර්ගික ප්‍රමුඛතා**

**අදාළ ප්‍රාග්ධනය**

**අදාළ ඇල්මැති පාර්ශ්වකරුවන්**

**බලපාන ලද SDGs**

10 REDUCED INEQUALITIES; 11 SUSTAINABLE CITIES AND COMMUNITIES

## සැපයුම් දාම වගකීම

අපගේ සැපයුම්කරුවන්ගේ ව්‍යාපාර පරිචයන්, පරිසර හිතකාමී සහ ප්‍රසම්පාදන ප්‍රතිපත්තියේ අවශ්‍යතාවන්ට අනුකූල බව සහතික කිරීම මගින් අපගේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය වගකීමෙන් පවත්වා ගැනීම.

**එය වැදගත්වන ආකාරයඃ අවදානම සහ අවස්ථාවන්**

අපගේ සැපයුම් දාමයේ සමාජ සහ පාරිසරික අනුකූලතාවය සහතික කිරීම තුළින් අපගේ කීර්තිනාමය ශක්තිමත් කර, පිරිවැය කාර්යක්ෂමතා වර්ධනය කර, අවදානම අවම කරමින්, සමාජය සහ බැංකුව සඳහා ප්‍රතිඵල ඉහළ නංවයි.

**කළමනාකරණ ප්‍රවේශය**

- තරඟකාරී සහ විනිවිද මූලාශ්‍ර ක්‍රියාවලියක් තුළින් සැපයුම්කරුවන් ඒකාබද්ධ කිරීම
- ප්‍රසම්පාදනය පිළිබඳ නෛතික සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලවීම
- පාරිසරික, සමාජීය සහ පාලන අවශ්‍යතාවන්ට අනුකූලවීම

කාලරාමුව – කෙටිකාලීන සිට දිගුකාලීන

**කරුණු මතු කළ අය**

| GRI මාතෘකාව | GRI සීමාව |
|---|---|
| 204 – ප්‍රසම්පාදන පරිචයන් | ඇතුළත සහ පිටත |

**අදාළ උපාය මාර්ගික ප්‍රමුඛතා**

**අදාළ ප්‍රාග්ධනය**

**අදාළ ඇල්මැති පාර්ශ්වකරුවන්**

බලපාන ලද SDGs

12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION

## වගකීම්සහගත ණය ලබාදීම

අපගේ ගනුදෙනුකරුවන්ගේ අයිතිවාසිකම් සුරැකීම සහ අපගේ නිෂ්පාදන සහ සේවාවන්, නිෂ්පාදන හා අලෙවිකරණය සහ පාරිසරික අනුකූලතාවයට අදාළ රෙගුලාසිවලට අනුකූලවන බවට සහතික කරයි.

**එය වැදගත්වන ආකාරයඃ අවදානම සහ අවස්ථාවන්**

සංවර්ධන ව්‍යාපෘති සඳහා දිරිය ලබාදෙන අපගේ ණය ලබාදීම අප ක්‍රියාත්මක වන පරිසරය සහ ප්‍රජාව කෙරෙහි බලපෑමක් තිබිය හැකිය.

**කළමනාකරණ ප්‍රවේශය**

- ණය ලබාදීමේ තීරණ ගැනීමේදී පාරිසරික, සමාජීය සහ පාලන ගැටළු සලකා බැලීම
- නියමයන් සහ කොන්දේසි වල සාධාරණ හා විනිවිදභාවය සහතික කිරීමට ගනුදෙනුකරුවන්ගේ ඉහළම බැඳියාවන් සමඟ කටයුතු කිරීම
- මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දෙන ගනුදෙනුකරුවන්ට සහයවීම
- සියලුම නෛතික සහ නියාමන අලෙවිකරණ සහ ප්‍රචාරණ අවශ්‍යතා සහ අදාළ කර්මාන්ත සංග්‍රහවලට අනුකූලවීම
- තිරසාරභාවය කරා ගෙන යන නව සහ ශක්‍ය ව්‍යාපාර අවස්ථාවන්ට සහයවීම.

කාලරාමුව – කෙටිකාලීන සිට දිගුකාලීන

**කරුණු මතු කළ අය**

| GRI මාතෘකාව | GRI සීමාව |
|---|---|
| 204 – ප්‍රසම්පාදන පරිචයන් | පිටත |
| 203 – වක්‍ර ආර්ථික බලපෑම් | පිටත |
| 417 – අලෙවිකරණය සහ ලේබල්කරණය | ඇතුළත සහ පිටත |
| 418 – පාරිභෝගික පුද්ගලිකත්වය | පිටත |

**අදාළ උපාය මාර්ගික ප්‍රමුඛතා**

**අදාළ ප්‍රාග්ධනය**

**අදාළ ඇල්මැති පාර්ශ්වකරුවන්**

බලපාන ලද SDGs

12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION

16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS

# කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

මෙම කොටස එක් එක් ප්‍රාග්ධනයට අනුකූලව ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි මෙහෙයුම්, කාර්ය සාධනය, අභියෝග සහ අනාගත දර්ශනය පිළිබඳ සවිස්තරාත්මක සමාලෝචනයකි. තවද, අපගේ ව්‍යාපාරික කටයුතු සහ කාර්ය සාධනයේ බැඳෙන කොටසක් වන තිරසාරභාවය සම්බන්ධයෙන් ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි තත්ත්වය මෙමගින් ගෙන හැර දක්වයි.


**90**
මූල්‍ය ප්‍රාග්ධනය

**112**
නිෂ්පාදිත ප්‍රාග්ධනය


**120**
බුද්ධිමය ප්‍රාග්ධනය

**130**
මානව ප්‍රාග්ධනය

**144**
සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය

**162**
ස්වභාවික ප්‍රාග්ධනය

**170**
මූලික නිර්ණායකවලට අනුකූලව ගෝලීය වාර්තාකරණ මුලපිරීම් දර්ශකය (GRI)

# මූල්‍ය ප්‍රාග්ධනය

**පාර්ශ්වකරුවන් සඳහා වටිනාකම නිර්මාණය කිරීමට බැංකුව විසින් භාවිතා කරන මුදල්මය වත්කම් මූල්‍ය ප්‍රාග්ධනයට ඇතුළත් වේ. බැංකුවේ දිගුකාලීන තිරසාරභාවය සහතික කිරීමට මූල්‍ය ප්‍රාග්ධනයේ වටිනාකම වැඩි කිරීමට අපි අඛණ්ඩව උත්සාහ ගනිමු.**

## එයට ඇතුළත් දෑ

අපගේ මූල්‍ය ප්‍රාග්ධනයට මහ භාණ්ඩාගාරය (ශ්‍රී ලංකා රජය) විසින් දායක කරන සහ අපගේ ව්‍යාපාර මෙහෙයුම් තුළින් උපදවා ගන්නා මූල්‍යමය සම්පත් ඇතුළත් වේ.

## යෙදවුම්

- කොටස් ප්‍රාග්ධනය සහ සංචිත
- ගනුදෙනුකරුවන්ගේ තැන්පතු
- ණයගැනීම්

## වටිනාකම් එකතු කරන ආකාරය

අපගේ මූල්‍ය තිරසාරභාවය අපට අයත් සහ ණයට ගත් අරමුදල් ප්‍රයෝජනයට යෙදිය හැකි බව සහ කළමනාකරණය මත විශ්වාසය තබයි. මූල්‍ය ප්‍රාග්ධනය අපගේ අනෙකුත් ප්‍රාග්ධනය සමඟ වටිනාකම නිර්මාණය ශක්තිමත් කරයි. කොටස් ප්‍රාග්ධනය, සංචිත සහ ණයගැනීම් වැනි ප්‍රාග්ධන යෙදවුම්වල ඒකාබද්ධ භාවිතය තුළින්, අපි ණය ලබාදීම, ව්‍යාපෘති සඳහා අරමුදල් ලබාදීම, නිෂ්පාදිත වත්කම් ගොඩනැගීම, තාක්ෂණය සහ සේවා පිළිබඳ පුහුණුව සහ නව්‍යකරණය තුළින් අපගේ සේවකයින්ගේ ඵලදායිතාව ඉහළ නැංවීම සහ ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් මුල් පිරීම් වල අපගේ ආයෝජනය තුළින් අපගේ ප්‍රජා සම්බන්ධතාවල ප්‍රතිලාභ ඇති කිරීම සිදුකරමු.

## අපගේ ප්‍රවේශය

- ආදායම් මාර්ග විවිධාංගිකරණය
- දැඩි පිරිවැය පාලනය සහ පිරිවැය ප්‍රශස්ථකරණය
- පිරිවැය ඵලදායී ව්‍යුහගත අරමුදල්කරණය පවත්වා ගැනිම
- ණය ශ්‍රේණිගත කිරීම් පවත්වා ගැනිම

## 2019 වසර සඳහා ප්‍රධාන අභියෝග සහ අවස්ථාවන්

**ප්‍රධාන අභියෝග** →

- පුද්ගලික අංශයට ණය වර්ධනය පහත වැටිම
- ආර්ථික කටයුතුවල මන්දගාමීබව
- ප්‍රාග්ධනය මත නියාමන පීඩන
- රජයේ සුරැකුම්පත්වල අනිවාර්ය ආයෝජනයෙන් උත්පාදනය වන ආදායම් සහ ණය සහ අත්තිකාරම් ලබාදිම අතර සමතුලිතතාව
- අඩු පිරිවැය මූලාශ්‍ර වැඩිවීම

**අවස්ථා**


- අරමුදල් පිරිවැය අඩුකිරීමට සහ ණය වර්ධනය පොළඹවීමට මූල්‍යමය ප්‍රතිපත්ති
- රජයේ සුරැකුම්පත් වෙළෙඳපලෙහි කාර්යසාධනය



## මූල්‍ය ප්‍රාග්ධනයේ වටිනාකම ඉහළ නැංවීමේ උපායමාර්ග

- උපායමාර්ගික ප්‍රමුඛතා මත පදනම් අරමුදල් ක්‍රමෝපාය
- සමාජ සහ පාරිසරික ප්‍රතිඵලවල පිරිවැයට නොව ඉහළම මූල්‍ය ප්‍රතිඵල ඉපයිය හැකි ප්‍රාග්ධන ආයෝජන
- මූල්‍ය ස්ථාවරත්වය සහ ශක්තිය ඉදිරියට ගෙන යාම


## වැදගත් තේමාවන්



## අදාළ ඇල්මැති පාර්ශ්වකරුවන්



## කෙටි කාලීන සිට මධ්‍ය කාලීන උපායමාර්ගික ප්‍රමුඛතාවන්



## වැදගත් සිදුවීම්



**රු. බිලියන 171.4**

සංචලනය වූ තැන්පතු



**රු. බිලියන 10.5**

බදු පෙර ලාභය



**1.57%**


අක්‍රීය ණය අනුපාතය




**14.35%**


සමස්ථ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය


## වටිනාකම් නිර්මාණයේ මූලිකාංග



- I ශක්තිමත් ස්ථිර ශුද්ධ පොලී ආදායම් වර්ධනය
- II පොලී නොවන ආදායම් මත ඉපයීම් වර්ධනය
- III සැලකියයුතු ලෙස වර්ධනය වූ ණය හානිකරණය
- IV මනාව කළමනාකරණය කළ පිරිවැය
- V ඵලදායි බදු අනුපාතය සාපේක්ෂව ඉහළින් පැවතීම
- VI අභියෝග මධ්‍යයේ ණය ලබාදීමෙහි මධ්‍යස්ථ වර්ධනයක් පවත්වා ගැනීම
- VII ආයෝජනවල අවස්ථාවන් තෝලනය කිරීම
- VIII ප්‍රශස්ථ ප්‍රතිඵල
- IX ශක්තිමත් ශේෂ පත්‍ර වර්ධනය
- X අපගේ ණය ආකෘතිය විචක්ෂණව කළමනාකරණය
- XI අපගේ ශක්තිමත් ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතා කළමනාකරණය

## උත්පාදිත සහ බෙදාහැරි සෘජු ආර්ථික වටිනාකම




| | 2019 % | 2018 % |
|---|---|---|
| A – මෙහෙයුම් වියදම් | **4.8** | 4.9 |
| B – තැන්පත්කරුවන් | **73.7** | 76.5 |
| C – සේවකයින් | **8.3** | 8.3 |
| D – ප්‍රාග්ධනය සපයන්නන් | **1.7** | 0.5 |
| E – රජයට (ලාභාංශ හැර) | **7.7** | 6.3 |
| F – රඳවාගත් සෘජු ආර්ථික වටිනාකම | **3.8** | 3.5 |

## මිණුම් දර්ශකය

| | වැඩිවීම/ (අඩුවීම) | 2019 % | 2018 % |
|---|---|---|---|
| සාමාන්‍ය වත්කම් මත ඉපයීම | 0.17 | **0.95** | 0.78 |
| සාමාන්‍ය ස්කන්ධය මත ඉපයීම | 4.37 | **15.32** | 10.95 |
| ආදායමට පිරිවැය අනුපාතය | (4.83) | **49.35** | 54.18 |
| අක්‍රීය ණය අනුපාතය | 0.13 | **1.57** | 1.44 |
| මුළු වෙන්කිරීම් ආවරණය | 8.16 | **50.75** | 42.59 |
| තැන්පතුවලට ණය | (3.36) | **44.70** | 48.06 |
| සේවකයෙකුට දළ ආදායම (රු. මිලියන) | 1.06 | **25.86** | 24.80 |

## උත්පාදිත සහ බෙදාහැරි සෘජු ආර්ථික වටිනාකම

| | 2019 රු. මිලියන | 2018 රු. මිලියන |
|---|---|---|
| උත්පාදිත සෘජු ආර්ථික වටිනාකම: | **121,929** | 111,902 |
| මෙහෙයුම් වියදම් | **5,894** | 5,526 |
| තැන්පත්කරුවන් | **89,898** | 85,622 |
| සේවකයන් | **10,158** | 9,263 |
| ප්‍රාග්ධනය සපයන්නන් | **2,000** | 500 |
| රජයට (ලාභාංශ හැර) | **9,348** | 7,036 |
| **රඳවාගත් සෘජු ආර්ථික වටිනාකම** | **4,631** | 3,955 |
| **බෙදාහැරි සෘජු ආර්ථික වටිනාකම** | **117,298** | 107,947 |

## අනෙකුත් ප්‍රාග්ධනයට සම්බන්ධය

ඉගෙනුම් සහ සංවර්ධනය තුළ ආයෝජනය සේවා බලකායේ හැකියාව වැඩි දියුණු කරයි

සන්නාම සහ නිපුණතා සංවර්ධනය තුළ ආයෝජනය බැංකුවේ බුද්ධිමය ප්‍රාග්ධනය ඉහළ නංවයි

සමාජ සත්කාරක ව්‍යාපෘතිවල ආයෝජනය ප්‍රජා ප්‍රාග්ධනය ගොඩනගයි

භෞතික සහ ඩිජිටල් යටිතල පහසුකම්වල ආයෝජනය ගනුදෙනුකාර පහසුව වැඩිකර සැපයුම්කාර සම්බන්ධතා ශක්තිමත් කරයි




භෞතික සහ ඩිජිටල් යටිතල පහසුකම්වල ආයෝජනය නිෂ්පාදිත ප්‍රාග්ධනය ගොඩනගයි


බලශක්ති කාර්යක්ෂමතා ගොඩනැගිලි, බලශක්ති පිරිමැසුම් වැඩසටහන් වල ආයෝජනය සහ ඩිජිටල් මාර්ග වැඩි දියුනු කිරීම කාබන් අවම වූ ආර්ථිකයක් කරා දායක වේ.

## විභව සමතුලිතතා

- භෞතික සහ ඩිජිටල් යටිතල පහසුකම් පුළුල්කිරීම තුළ ආයෝජනය
- පුද්ගලික පිරිවැය තුළ ආයෝජනය
- නිපුණතා සංවර්ධනය සඳහා කළ ආයෝජනය



- ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිවල ආයෝජන




## තිරසර සංවර්ධන අරමුණුවලට දායකවීම




නව්‍යකරණ නිෂ්පාදනය සහ විසඳුම් ලබාදීමට භෞතික සහ ඩිජිටල් යටිතල පහසුකම්වල ආයෝජනය කිරීමට කැපවීම

අපගේ ජනතාව් (රැකියා අවස්ථා සහ ප්‍රතිලාභ) සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති මත ආයෝජනය තුළින් ආර්ථික සංවර්ධනය කඩිනම්කර ප්‍රජාවගේ ජීවන තත්ත්වයන් උසස් කිරිම

## නිමැවුම්

- බදු පෙර මෙහෙයුම් ලාභය
- බදු පසු ලාභය
- ප්‍රාග්ධනය
- තෝලනය
- ප්‍රාග්ධන ආයෝජනය
- ලාභාංශ ගෙවීම
- රජයට දායකත්වය

## අනාගත දැක්ම/අනාගත ප්‍රමුඛතා

- අයවැය මෙන්ම උපාය මාර්ගික ව්‍යාපාර සැලැස්මේ දක්වා ඇති මූල්‍ය ඉලක්ක ළඟා කරගැනීම
- පොළී නොවන ඉපයීම් වර්ධනය
- අඛණ්ඩව දැඩි පිරිවැය කළමනාකරණය
- සියලුම නියාමන අවශ්‍යතාවන්ට අනුකූල වෙමින් ප්‍රාග්ධනය ප්‍රශස්ථ අයුරින් උපයෝජනය කිරීම

## සාරාංශ කළ ආදායම් පිළිබඳ ප්‍රකාශය

| | | | 2019<br>රු. මිලියන | 2018<br>රු. මිලියන | 2017<br>රු. මිලියන | (2018ට එදිරිව 2019) වාර්ෂික වෙනස<br>% |
|---|---|---|---|---|---|---|
| පිටුව 94 | A | ශුද්ධ පොළී ආදායම | **28,832.0** | 24,884.7 | 25,134.0 | 15.9 |
| පිටුව 94 | B | ශුද්ධ පොළී නොවන ආදායම | **3,067.3** | 1,253.9 | 4,307.9 | 144.6 |
| | | මුළු මෙහෙයුම් ආදායම | **31,899.3** | 26,138.6 | 29,441.9 | 22.0 |
| පිටුව 95 | C | හානිකරණ වියදම | **565.5** | 871.0 | 765.9 | (35.1) |
| | | ශුද්ධ මෙහෙයුම් ආදායම | **31,333.8** | 25,267.6 | 28,676.0 | 24.0 |
| පිටුව 95 | D | මෙහෙයුම් වියදම් | **15,674.9** | 14,096.5 | 11,047.4 | 11.2 |
| | | මෙහෙයුම් ලාභය | **15,658.9** | 11,171.1 | 17,628.6 | 40.2 |
| පිටුව 95 | E | මූල්‍ය සේවා මත බදු | **5,197.3** | 3,229.7 | 3,493.6 | 60.9 |
| පිටුව 96 | F | ආදායමට පෙර ලාභ බදු | **10,461.6** | 7,941.4 | 14,135.0 | 31.7 |
| | | ආදායම් බදු වියදම් | **3,763.4** | 3,441.2 | 4,419.0 | 9.4 |
| පිටුව 96 | F | වසර සඳහා ලාභය | **6,698.2** | 4,500.2 | 9,716.0 | 48.8 |

## A ශුද්ධ පොලී ආදායම් වර්ධනය


පොලී ආදායම 7.4% ක වර්ධනයක් වාර්තා කරමින් පසුගිය වසර තුළ පැවති රු.බි. 110.5 ට වඩා 2019 දී රු.බි. 118.7ක් වාර්තා කළ අතර එය 2018 වසරට වඩා ණය කළඹ තුළ 7.4% ක ශක්තිමත් පුළුල්වීමකි. වසර තුළ 21.1%කින් ගනුදෙනුකාර තැන්පතු වැඩිවීම හමුවේ වුවත්, පොලී අනුපාත අඩුකිරීම හේතු කොට ගෙන, පොලී වියදම පසුගිය වසරේ වාර්තාකළ රු.බි. 85.6 ට සාපේක්ෂව රු.බි. 89.9 දක්වා 5.0%කින් පමණක් වැඩි වී ඇත.

මෙය ණයදීමේ අනුපාතවල පසුකාලීන අඩුකිරීමක් අපේක්ෂාවෙන් බැංකුවල අරමුදල් පිරිවැය අඩු කිරීමේ අදහස ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2019 අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා ශ්‍රී ලංකා රුපියල් තැන්පතු මත උපරිම පොළී අනුපාත පැනවීමේ ප්‍රතිඵලයක් විය. ඉන්පසුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2019 සැප්තැම්බර්වල ණය පොලී අනුපාත මත සීමා පනවන ලදී. කෙසේවෙතත්, තැන්පතු ප්‍රතිමිලකරණය කළ වේගයෙන් ණය සහ අත්තිකාරම් ප්‍රතිමිලකරණය නොකල බැවින් පොලී අදායම මත ඉක්මන් බලපෑමක් නොවීය.

වසර තුළ, පොළී ආදායම තුළ වර්ධනය පොළී වියදම්වල වර්ධනය වැඩිපුර හිලව්කළ බැවින්, මූලිකවම තැන්පතු අනුපාතවල අඩුවීම සහ ණය කළඹ තුළ පුළුල්වීම නිසා 2018 දී වාර්තාකළ රු.බි. 24.9ට සාපේක්ෂව සමාලෝචිත වසර තුළ ශුද්ධ පොලී ආදායම රු.බි. 28.8 දක්වා 15.9%කින් වර්ධනය විය. තවද, තැන්පතු වසරේ මුල් කොටසේදී ප්‍රතිමිලකරණය කරන ලද බැවින්, වසරේ අවසාන කොටසේදී ණයදීමේ අනුපාත ප්‍රතිමිලකරණය කරන තුරු ඉහළ ආන්තිකයක් භුක්ති විඳීමට බැංකුවට හැකිවිය.

එහි ප්‍රතිඵලයක් ලෙස, ශුද්ධ පොළී ආදායම (NII) රු.බි. 28.8 දක්වා 15.9% කින් වර්ධනය වූ අතර, පොලී ඉපයීමේ වත්කම් රු.බි. 1,093.49 දක්වා 11.94%කින් වර්ධනය විය. ශුද්ධ පොළී ආන්තිකය (NIM) මුළු වත්කම්වල සාමාන්‍යයේ ප්‍රතිශතයක් ලෙස ශුද්ධ පොළී ආදායම පසුගිය වසරේ වාර්තාකළ 2.43%ට සාපේක්ෂව 2019 වසර අවසානයේදී 2.63% දක්වා වර්ධනය විය.

**ශුද්ධ පොළී ආදායම සහ ශුදධ පොළී ආන්තිකය**




### අනාගත දැක්ම

ශුද්ධ පොළී ආන්තිකය මධ්‍ය සිට ඉහළ තනි අංක මට්ටමකට වර්ධනය කිරීම.

## B පොලී නොවන ආදායම් ඉපයීම් වර්ධනය


2019 වසර තුළ ශුද්ධ පොළී ආදායම (NII), සහ ශුද්ධ පොලී නොවන ආදායම ඇතුළත් මුළු මෙහෙයුම් ආදායම පසුගිය වසරේ වාර්තාකළ රු.බි. 26.1 ට සාපේක්ෂව රු.බි. 31.9 දක්වා 22.0%කින් වැඩිවී ඇත.

ණය පරිමාවන් හී වැඩිවීම හේතු කොට ගෙන සැකසුම් ගාස්තුවල වාර්තාකළ වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස, ශුද්ධ ගාස්තු සහ කොමිස් පදනම් ආදායම 2018 වසරේ වාර්තාකළ රු.බි. 0.9ට සාපේක්ෂව මෙම වසරේ රු.බි. 1.1 දක්වා 30.7%කින් ඉහළ ගියේය.

මෙහෙයුම් ආදායම තුළ වර්ධනයට බලපෑ හැකි අනෙකුත් ප්‍රධාන හේතුව වන්නේ වෙළෙඳ කළඹෙහි වෙළඳපොළට ලකුණු කළ ආදායමේ සැලකියයුතු වර්ධනය වන අතර එය 2018 වසරේ වාර්තාකළ රු.බි. 0.7ක් වූ පාඩුවට සාපේක්ෂව මෙම වසරේ රු.බි. 1.5 ක ලාභයක් දක්වා 310.9%කින් වර්ධනය විය. වෙළෙඳ ආදායමෙන් 79%ක් සඳහා දායක වන ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල මිල ගණන්වල වැඩිවීම් සහ 2018 වසර පුරා එය දෙගුණයකින් වර්ධනය වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතුවිය.

අනෙකුත් මෙහෙයුම් ආදායම තුළ 2018 වසරේ වාර්තාකළ රු.බි. 1.1 සිට වසර තුළ රු.බි. 0.4 දක්වා 61.1%කින් පහළ වැටීම නිරීක්ෂණය විය. බැංකුවේ විදේශ ව්‍යවහාර මුදල්වලට අදාළ මෙහෙයුම් මත විනිමය හුවමාරු අනුපාතය විතැන්වීම හේතු කොට ගෙන ප්‍රත්‍යාගණන අලාභ මෙයට හේතුවිය. වසර තුළ ශ්‍රී ලංකා රුපියල ස්ථාවර මට්ටමක පැවති අතර 2018 දී රුපියලේ අගය ඇ.එ.ජ. ඩොලරයට සාපේක්ෂව 19.6%ක අවප්‍රමාණය විය. මේ වසරේ එය 1% ක සුළු අධිප්‍රමාණය වූ අතර 2019 වසර අවසන් වන විට ඇ.එ.ජ.ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය රු. 181.63 ක් ලෙස අවසන් විය.

**පොළී නොවන ආදායමේ විශ්ලේෂණය**




### අනාගත දැක්ම


පහළ සිට මධ්‍ය තනි අංක මට්ටමකට වර්ධනය කිරීම.

## C සැලකියයුතු ලෙස වර්ධනය වූ ණය හානිකරණය

ආදායම් ප්‍රකාශනයට අයකළ ශුද්ධ හානිකරණය 2019 වසර තුළ රු.බි. 0.6 ක් පමණක් වූ අතර එය 2018 දී පැවති රු.බි. 0.9 ට සාපේක්ෂව 35.1%ක අඩුවීමකි. සමාලෝචිත වසර තුළ කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයට ලබා දුන් ඩොලර් වටිනාකමින් යුත් ණයවලින් කොටසක් ශ්‍රී ලංකා රුපියලට පරිවර්තනය කිරීමත් සමඟ පුද්ගල ණය සහ උකස් අත්තිකාරම් සඳහා අදාළ වන්නා වූ අලාභ අනුපාතවල අඩුවීම ද හානිකරණ වෙන්කිරීම්වල අඩුවීම සඳහා විශාල වශයෙන් ආරෝපනය වූ හේතු විය. බැංකුව එහි ලාභදායිතාව කෙරෙහි හානිකරණ වියදම්වල බලපෑම අවම කිරීම සඳහා එකතු කිරීමේ සහ අයකරගැනීමේ ක්‍රියාවලි කෙරෙහි වඩා ඉහළ අවධානයක් යොමු කිරීම අඛණ්ඩව සිදු කර ඇත.

විශේෂ සහ සාමාන්‍ය වෙන්කිරීම් ඇතුළුව වෙන්කිරීම් ආවරණ අනුපාතය ණය සහ අත්තිකාරම්වල වර්ධනය හේතු කොට ගෙන 2018 දී වාර්තා කළ 42.6% සිට 2019 දෙසැම්බර්වල 50.7%ක් දක්වා ඉහළ ගියේය.

### වෙන්කිරීම් ආවරණය




### අනාගත දැක්ම

වෙන්කිරීම් ආවරණ අනුපාතය පවත්නා මට්ටමින් පාලනය කිරීම.

## D ආයෝජනය කරමින් මනාව පාලනය කළ පිරිවැය


සේවක වියදම්, ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය සහ අනෙකුත් වියදම්වලින් සමන්විත වන මුළු මෙහෙයුම් වියදම් 2018 දි වාර්තා කළ රු.බි. 14.1 ට සාපේක්ෂව සමාලෝචිත වසර තුළ රු.බි. 15.7 දක්වා 11.2%කින් ඉහළ ගියේය.

මෙහෙයුම් වියදම් වලින් 64.8%ක් නියෝජනය කරන සේවක වියදම් 2018 දි වාර්තාකළ රු.බි. 9.3 සිට රු.බි. 10.2 දක්වා ලඟාවෙමින් 9.7%කින් ඉහළ ගියේය. මේ සඳහා අළුතින් සේවකයින් බඳවාගැනීම මෙන්ම කොන්ත්‍රාත් පදනමේ සිටි සේවකයින් ස්ථිර සේවක පදනමට අන්තර්ග්‍රහණය කිරීම ප්‍රධාන වශයෙන් හේතු විය.

මෙහෙයුම් වියදම් වලින් 6.7%ක් සඳහා පමණක් දායක වුවද, ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය වියදම් විශාල වශයෙන් 2018 දි පැවති රු.බි. 0.6ට අනුව 2019 දී රු.බි. 1.0 දක්වා 63.3%කින් වැඩිවී ඇත. ගනුදෙනුකාර අත්දැකීම වැඩිකිරීම සඳහා නව තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්වල සිදුකළ ආයෝජන මෙන්ම සයිබර් ආරක්ෂාව ශක්තිමත් කිරීම, එක් නව භෞතික ශාඛාවක් විවෘත කිරීම සහ නව සුහුරු ATM/ CRM කලාප පහසුකම් 34ක් එකතු කිරීම තුළින් ජාලවලට ලඟාවීම ශක්තිමත් කිරීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය

පරිපාලන සහ ආයතනික වියදම් පිළිබිඹු කරන අනෙකුත් මෙහෙයුම් වියදම් 2019 වසර තුළ රු.බි. 4.5 දක්වා 6.7%කින් වැඩිවිය. එම වියදම හමුවේ වුවත්, බැංකුව එහි ආදායමට පිරිවැය අනුපාතය (එ.ක.අ.බදු පෙර) 2018 වසර තුළ වාර්තාකළ 54.18% සිට 2019 දී 49.35% දක්වා සාර්ථකව වර්ධනය විය. යටිතලපහසුකම්, ක්‍රියාවලි කාර්යක්ෂමතාවන්, සේවකයින් සහ තාක්ෂණය තුළ ආයෝජනයන් හේතු කොට ගෙන, මෙහෙයුම් නම්‍යතාවය අඛණ්ඩව වර්ධනය විය.

### පිරිවැය සහ ආදායම් වර්ධනය




### අනාගත දැක්ම


නව බඳවාගැනීම්, උපායමාර්ගික ස්ථානවල නව ශාඛා ආරම්භ කිරීම සහ ඩිජිටල් යටිතල පහසුකම්වල ආයෝජනය (ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය) යන ඒවා පිළිබඳ සැලසුම් හේතු කොට ගෙන මැදි තනි අංකයකට වඩා තරමක් වර්ධනයවූ වියදම් කිරීම.

## E ඵලදායි බදු අනුපාතය සාපේක්ෂව ඉහළව පැවතීම

මෙම වසරේදී බැංකුව බදු වලින් ජාතියට දැක්වූ දායකත්වය 2018 දී රු.බි. 6.7 ට සාපේක්ෂව රු.බි. 9.0 දක්වා 34.3% කින් ඉහළ ගියේය. මුළු බදුවලට මූල්‍ය සේවා, මත අගය එකතුකළ බදු (VAT) සහ ජාතිය ගොඩගැනීමේ බදු (NBT), ණය නැවත ගෙවීමේ බදු (DRL) සහ ආදායම් බදු ඇතුළත් විය.

වසර තුළ ආදායම් බදු රු.බි. 3.8 ක් වූ අතර, එය 2018 දී වාර්තාකළ රු.බි. 3.4 ට වඩා 9.4% ක ඉහළයාමක් වූ අතර මූල්‍ය සේවා මත බදු වසරකට පෙර වාර්තා කළ රු.බි. 3.2ට සාපේක්ෂව 2019 දී රු.බි. 5.2 දක්වා 60.9% කින් වැඩිවිය. 2018 වසරේ අවසාන කොටසේදී හඳුන්වා දෙන ලද ණය නැවත ගෙවීමේ බදුවල (DRL) සම්පූර්ණ වසරේ බලපෑම මූල්‍ය සේවා මත බදු රු.බි. 2.0 කින් වැඩිවීමකට හේතු විය. එසේවුවත් වඩා ඉහළ ණය ආපසු ගෙවීමේ බදු හමුවේ ඉඩදුන් වියදම්වල වැඩිවීම හේතු කොට ගෙන, ඵලදායී බදු අනුපාතය 2018 දි පැවති 59.7% සිට 2019 දී 57.2% දක්වා අඩුවිය.

### ලාභදායිතාවයට බදු බලපෑම




### අනාගත දැක්ම

ඵලදායී බදු අනුපාතය සුළු වශයෙන් අඩුවිය හැකිය.

## F ප්‍රත්‍යස්ථ ප්‍රතිඵල

අභියෝගාත්මක ආර්ථික කොන්දේසි සහ ඉහළ බදු බර හමුවේවුවත්, බැංකුව 2019 වසර සඳහා රු.බි. 10.5ක බදු පෙර ලාභයක් වාර්තා කරන ලද අතර, එම අගය 2018 දී වාර්තාකළ රු.බි. 7.9ට වඩා 31.7%ක වර්ධනයකි. බැංකුවේ බදු පසු ලාභය රු.බි. 6.7ක් වූ අතර එය පසුගිය වසරේ පැවති රු.බි. 4.5 ට සාපේක්ෂව 48.8%ක වැඩිවීමකි.


එහි ප්‍රතිඵලයක් ලෙස, සාමාන්‍ය කොටසක ඉපයීම් ද 2018 පැවති රු. 6.72 සිට 2019 දී රු. 7.13 දක්වා 6.1%කින් වැඩි විය. 2019 වසර සඳහා බැංකුවේ ලාභදායිතාව තුළ මෙම ඉහළයාම තැන්පතු සඳහා වන පිරිවැය අඩුවීම හා ආදායම් මාර්ග තුළ අත්කරගත් වර්ධනයන් මගින් තහවුරු කරන ලදී.

ප්‍රතිපත්ති සහ දේශපාලන ස්ථාවරත්වය, මූල්‍ය ආයතන ඇතුළුව පුද්ගලයින්ට සහ ආයතන වෙත ලබා දෙන ලද බදු සහන සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ලබාදෙන ලද සහන යෝජනාවලිය තුළින් (ප්‍රතිසාධනය) වේගවත් කිරීමට අපේක්ෂිත බැවින්, ආර්ථිකය සහ බැංකු ක්ෂේත්‍රය 2020 දී වර්ධනය වනු ඇති බවට අපේක්ෂිත බැවින්, බැංකුවේ මූල්‍ය සහ මෙහෙයුම් කාර්යසාධනය 2020 දී තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරමු.

අපගේ ස්කන්ධය මත ඉපයීම පසුගිය වසරේ 10.95% සිට 15.32% දක්වා සැලකියයුතු ලෙස වර්ධනය විය. මෙයට හේතුව ඉපයීම් ඉහළ යාම සහ දැඩි මෙහෙයුම් පරිසරය හමුවේ ඉහළ ඉපයීම් සහ ප්‍රත්‍යස්ථ කාර්යසාධනය ඉහළයාමයි. පසුගිය වසරේ වාර්තා කළ 0.78% ක වත්කම් මත ඉපයීම් ද මේ වසරේ 0.95% දක්වා වර්ධනය විය.


අපගේ බදු පසු ලාභය බැංකුවේ තිරසාර මෙහෙයුම් කාර්යසාධනය පිළිබඳ සුදුසු දර්ශකයක් ලෙස අපි සලකමු. පහතින් දැක්වෙන ප්‍රස්තාරය තුළින් 2019 වසරේ ඉපයීම් කාර්යසාධනය ඉදිරියට ගෙනගිය සාධක සාරාංශගත කරයි.

### ඉපයීම් මත බලපෑම




A – බදු පසු ලාභය 2018
B – ශුද්ධ පොළී ආදායම
C – ශුද්ධ පොළී නොවන ආදායම
D – හානිකරණය
E – පරිපාලන සහ අනෙකුත් පොදු කාර්ය වියදම්
F – බදු
G – බදු පසු ලාභය 2019

### කොටසක ඉපයීම්





### අනාගත දැක්ම

ස්කන්ධය මත ඉපයීම මධ්‍ය සිට ඉහළ අංක දෙකක මට්ටම්වල පවත්වා ගැනීම.


### විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙහි වෙනස්වීම්

විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙහි අලාභය වැඩිවීම සඳහා ප්‍රධාන සහභාගික සාධකය වූයේ ආදායම් ප්‍රකාශනයට නැවත වර්ගීකරණය කරනු නොලබන අයිතමයන්ය. වාර්තාකළ අලාභවලින් 92%ක් සඳහා දායක වූයේ පශ්චාත්-රැකියා ප්‍රතිලාභබැඳීම් නැවත තක්සේරුකිරීම හේතු කොට ගෙන සිදු වූ අලාභයයි. 2018 වසරේ වාර්තා කල රු.මි. 418.3 ක අලාභයට සාපේක්ෂව 2019 වසරේදී බැංකුව ආදායම් ප්‍රකාශනයට නැවත වර්ගීකරණය කරනු ලබන අයිතමවලින් රු.මි. 114.2ක ලාභයක් වාර්තා කරන ලද අතර ඊට හේතු වී ඇත්තේ වෙනත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මනින ලද භාණ්ඩාගාර බැඳුම්කර කළඹ මත වෙළෙඳපොළට ළකුණු කළ ලාභයයි.

## ස්කන්ධය මත ඉපයීම වියෝජනය (ස්කන්ධය මත ඉපයීම හි මූලිකාංග)




## ලාභදායිතා අනුපාති




| | | 2019 % | 2018 % | 2017 % | 2016 % | 2015 % |
|---|---|---|---|---|---|---|
| | ශුද්ධ පොළී ආන්තිකය | **2.63** | 2.43 | 2.61 | 2.89 | 3.32 |
| එකතුකලා | ශුද්ධ පොළී ආදායම/සාමාන්‍ය වත්කම් | **0.28** | 0.12 | 0.45 | 0.10 | 0.13 |
| අඩුකලා | හානිකරණ/සාමාන්‍ය වත්කම් | **0.05** | 0.09 | 0.08 | (0.01) | 0.26 |
| අඩුකළා | මුළු මෙහෙයුම් වියදම්/සාමාන්‍ය වත්කම් | **1.43** | 1.38 | 1.15 | 1.18 | 1.28 |
| අඩුකළා | මූල්‍ය සේවා මත බදු/සාමාන්‍ය වත්කම් | **0.47** | 0.32 | 0.36 | 0.32 | 0.30 |
| සමානයි | වත්කම් මත ඉපයීම | **0.95** | 0.78 | 1.47 | 1.51 | 1.60 |
| වැඩිකිරීම | 1 – සෘජු බදු අනුපාතය | **64.03** | 56.67 | 68.74 | 71.40 | 66.54 |
| සමානයි | බදු පසු ලාභය/සාමාන්‍ය වත්කම් | **0.61** | 0.44 | 1.01 | 1.08 | 1.07 |
| වැඩිකිරීම | ස්කන්ධය වැඩිකිරීම | **25.09** | 24.92 | 26.95 | 27.21 | 29.23 |
| සමානයි | ස්කන්ධය මත ඉපයීම | **15.32** | 10.95 | 27.24 | 29.37 | 31.15 |

# සාරාංශ ගතකළ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | | | 2019<br>රු. මිලියන | 2018<br>රු. මිලියන | 2017<br>රු. මිලියන | (2018ට එදිරිව 2019)<br>වාර්ෂික වෙනස<br>% |
|---|---|---|---|---|---|---|
| පිටුව 99 | A | **මුළු වත්කම්** | **1,157,966.7** | 1,036,845.6 | 1,010,977.4 | 11.7 |
| පිටුව 100 | E | මුදල් හා මුදලට සමාන දෑ | **5,376.7** | 3,434.5 | 3,849.5 | 56.5 |
| | | බැංකුවල ඇති තැන්පතු | **12,364.5** | 17,588.5 | 23,437.3 | (29.7) |
| පිටුව 99 | C | ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **11.6** | 4,740.1 | 1,360.7 | (99.8) |
| | | සාධාරණ වටිනාකමට අගයකළ ලාභය සහ අලාභය තුළින් හඳුනාගත් මූල්‍ය වත්කම් | **11,459.9** | 16,680.4 | 6,472.3 | (31.3) |
| | | ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් | | | | |
| පිටුව 99 | B | – ණය සහ අත්තිකාරම් | **454,395.0** | 422,894.7 | 375,703.7 | 7.4 |
| පිටුව 99-100 | C | – ණය සහ වෙනත් උපකරණ | **615,634.3** | 518,948.0 | 555,468.6 | 18.6 |
| | | අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණය වටිනාකමට අගයකළ මූල්‍ය වත්කම් | **3,478.8** | 6,184.4 | 5,693.8 | (43.7) |
| | | පරිපාලිත සමාගම්වල ආයෝජන | **4,811.0** | 1,700.0 | 900.0 | 183.0 |
| | | දේපල, පිරියත සහ උපකරණ | **14,163.5** | 13,465.8 | 12,395.7 | 5.2 |
| | | භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කම් | **1,073.5** | 0.0 | 0.0 | 100.0 |
| පිටුව 100 | D | වෙනත් වත්කම් | **35,197.9** | 31,209.2 | 25,695.7 | 12.8 |
| පිටුව 100 | F | **මුළු වගකීම්** | **1,113,589.3** | 993,750.3 | 971,881.7 | 12.1 |
| පිටුව 100 | G | බැංකුවලට ගෙවිය යුතු | **35,045.3** | 77,119.1 | 48,596.6 | (54.6) |
| | | ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **0.0** | 1.5 | 956.9 | (100.0) |
| | | ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් | | | | |
| පිටුව 100 | H | – තැන්පත්කරුවන්ට ගෙවිය යුතු | **1,016,574.3** | 839,574.4 | 737,212.6 | 21.1 |
| පිටුව 100 | G | – අනෙකුත් ණයකරුවන්ට ගෙවියයුතු | **21,203.2** | 14,804.8 | 12,837.0 | 43.2 |
| පිටුව 101 | I | කල්බදු පහසුකම | **1,066.9** | 0.0 | 0.0 | 100.0 |
| පිටුව 100 | G | නිකුත්කළණය සුරැකුම්පත් | **26,691.7** | 52,389.1 | 162,709.0 | (49.1) |
| පිටුව 101 | I | විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | **6,508.7** | 3,830.8 | 3,711.4 | 69.9 |
| | | විලම්භිත බදු වගකීම් | **547.2** | 582.5 | 507.1 | (6.0) |
| | | වෙනත් වගකීම් | **5,951.5** | 5,447.3 | 5,350.2 | 9.3 |
| | | පරිපාලිත සමාගම්වලට ගෙවියයුතු | **0.5** | 0.8 | 0.8 | (27.0) |
| පිටුව 101 | J | **මුළු කොටස්හිමියන්ගේ ස්කන්ධය** | **44,377.3** | 43,095.3 | 39,095.7 | 3.0 |
| | | ප්‍රකාශිත ප්‍රාග්ධනය/පැවරුණු ප්‍රාග්ධකය | **9,400.0** | 9,400.0 | 6,700.0 | 0.0 |
| | | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | **3,562.9** | 3,228.0 | 3,003.0 | 10.4 |
| | | රඳවාගත් ඉපයීම් | **4,464.4** | 3,984.7 | 1,102.8 | 12.0 |
| | | අනෙකුත් සංචිත | **26,950.0** | 26,482.6 | 28,289.9 | 1.8 |
| | | **මුළු ස්කන්ධය සහ වගකීම්** | **1,157,966.7** | 1,036,845.6 | 1,010,977.4 | 11.7 |
| පිටුව 101 | I | අසම්භාව්‍ය බැරකම් සහ බැඳීම් | **10,355.2** | 4,481.4 | 18,320.3 | 131.1 |

## A වඩා ශක්තිමත් ශේෂ පත්‍ර වර්ධනය

බැංකුවේ වත්කම් පසුගිය වසර අවසානයේදී වාර්තාකළ රු.ට්‍රි. 1.04 ට වඩා 2019 අවසානයේදී රු.ට්‍රි. 1.16 ට ලඟාවෙමින් 11.7% කින් වර්ධනය විය. ශේෂ පත්‍ර වර්ධනයට ආයෝජනයන් සහය වූ අතර එය 2018 දී පැවති රු.බි. 565.8 ට අනුව රු.බි. 647.8 දක්වා 14.5%කින් වැඩි වූ අතර ඒ සමගම ශුද්ධ ණය සහ අත්තිකාරම්වල පුළුල්වීම 2018 අවසානයේදී පැවති රු.බි. 422.9ට අනුව රු.බි. 454.4 දක්වා ලඟාවීමට 7.4% කින් වර්ධනය විය.

වගකීම් සම්බන්ධයෙන් ගත් කල, බැංකුවේ තැන්පතු පදනම 2019 අවසානයේදී රු.ට්‍රි. 1.02 දක්වා වැඩි වී ඇති අතර එය රු.බි. 839.6 ක්වූ පසුගිය වසරේ පදනමට වඩා 21.1%ක වර්ධනයකි. කෙසේවෙතත්, අපගේ ණයගැනීම් වසරකට පෙර වාර්තාකළ රු.බි. 144.3 හා සැසැඳීමේදී 2019 අවසානයේදී රු.බි. 82.9 දක්වා 42.5%කින් පහත වැටුණි.

## B අභියෝග හමුවේ ණය ලබාදීමේදී මධ්‍යස්ථ වර්ධන ගමන් මඟක් පවත්වා ගැනීම

ණය සහ අත්තිකාරම් නිවාස සහ දේපල ණය. පුද්ගල ණය, වාහන ණය, අධ්‍යාපනික ණය, සම්මේලන ණය, බැංකු සහ මූල්‍ය ආයතනවලට ණය මෙන්ම උකස් අත්තිකාරම්, සේවක ණය, රජයට ණය සහ ප්‍රති විකුණුම් ගිවිසුම් (Reverse REPO) යටතේ මිලදීගත් සුරැකුම්පත් වැනි කාලීන ණයවලින් සමන්විත වේ. ණය සහ අත්තිකාරම් පසුගිය වසර අවසානයේදී වාර්තාකළ රු.බි. 422.9ට සාපේක්ෂව 2019 වසර අවසානයේදී රු.බි. 454.4 දක්වා 7.4%කින් වර්ධනය වූ අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් පාරිභෝගික ණය හේතු විය. පුද්ගල පරිභෝජනය සඳහා ලබාදෙන ලද ණය (35.7%), ඉදිකිරීම/නිවාස (27.9%), සහ යටිතල පහසුකම් (15.5%) අවශ්‍යතා, ණය සහ අත්තිකාරම් කළඹෙහි 2019 අවසාන වන විට දළ වශයෙන් ආධිපත්‍ය දරයි.

දළ අක්‍රීය ණය (NPL) අනුපාතය 2019 අවසානයේදී 1.57% හි පැවති අතර, 2018 අවසානයේ සිට 13BPS ක සුළු වැඩිවීමක් වූ අතර, රටතුළ පැවති අනෙකුත් අභියෝගාත්මක කොන්දේසි සමඟ පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පසු ණය අයකර ගැනීමේදී ඇති වූ දුෂ්කරතා මගින් ඇති වූ බලපෑම ක්ෂේත්‍රය තුළ අක්‍රීය ණයවල වඩා පුළුල් නැමියාව පිළිබිඹු කරන ලදී. කෙසේ වෙතත්, බැංකුවේ ණයවල ගුණාත්මකභාවය 2019 අවසානයට 4.7%ක් වූ ක්ෂේත්‍රයේ සාමාන්‍යය හා සැසැඳීමේදී ස්ථීර ආකාරයකින් පවත්වා ගනු ලැබීය.

### අනාගත දැක්ම

මධ්‍ය සිට ඉහළ තනි අංකයක මට්ටමක ණය ලබාදීමේ වර්ධනය අත්කර ගැනීම සහ ක්ෂේත්‍රයේ සාමාන්‍යයට වඩා (අක්‍රීය ණය අනුපාතය) අඩුකරගැනීම.

## C ආයෝජන සඳහා අවස්ථාවන් තෝලනය කිරීම

### ණය සහ ස්නක්ධ සුරැකුම්පත්වල ආයෝජන

ස්කන්ධ සහ ණය උපකරණවල බැංකුවේ මුළු ආයෝජන කළඹ තුළ 2018 දී වාර්තාකළ රු.බි. 541.8ට සාපේක්ෂව 2019 අවසානයේදී රු.බි. 630.6ක් අත්කර ගනිමින් 16.4%ක වර්ධනයක් දක්නට ලැබුණි. රජයේ සුරැකුම්පත්, ආයතනික ණය උපකරණ සහ භාර සහතික ඇතුළත්වන ණය උපකරණ මුළු කළඹින් 99.2%ක් නියෝජනය කළ අතර, ඉතිරි කොටස ස්කන්ධ සුරැකුම්පත්වලින් සමන්විත විය. කොටස් අපසරණය හේතු කොට ගෙන බැංකුවේ ස්කන්ධ කළඹ 2018 දි පැවති රු.මි. 1,878.9 සිට 2019 දී රු.මි. 1,782.3 දක්වා 5.1%කින් පහත වැටුණි.

බැංකුව රජයේ මූල්‍ය අවශ්‍යතාවන්ට දායකවීම මගින් එහි නියෝග ප්‍රකාර කාර්යභාරය අඛණ්ඩව ඉටුකරමින් සිටී. ඒ අනුව, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර (මුළු ආයෝජන කළඹ තුළ 98.0%තට දායකවන) ඇතුළත් රජයේ සුරැකුම්පත් කළඹ පසුගිය වසරේ රු.බි. 523.2 සිට රු.බි. 612.7 දක්වා 17.1%කින් වැඩිවූ අතර, භාණ්ඩාගාර බැඳුම්කර කළඹ තුළ වාර්තාකළ 17.8%ක වැඩිවීම මගින් මෙය සිදුවී ඇත. ආයතනික ණය සුරැකුම්පත් සහ භාර සහතික ඇතුළත් අනෙකුත් ණය උපකරණ භාර සහතිකපත් කළඹ තුළ පහත වැටීම හේතු කොට ගෙන රු.බි. 12.6 දක්වා 3.0%කින් පහත වැටුණි.

### ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

2019 දෙසැම්බර් අවසානයට බැංකුවේ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ 2018 අවසානයේදී වාර්තා කළ රුබි. 4.7 ට සාපේක්ෂව රු.මි. 11.6 ක් පමණක් විය. මෙම සැලකියයුතු අඩුවීම සඳහා විදේශ ව්‍යවහාර මුදල් උච්ඡාවචනය මගින් ඇති වූ අවදානම වලක්වා ගැනීම සඳහා විදේශ ව්‍යවහාර මුදල් හුවමාරු ගිවිසුමේ කල්පිරීම හේතු විය. ශ්‍රී ලංකා රු./ඇ.එ.ඩො. හුවමාරු අනුපාතය තුළ වෙනස්වීම්වලට ආරෝපිත විදේශ ව්‍යවහාර මුදල් වලින් නම්කළ ණයගැනීම්වල ප්‍රාග්ධන කොටස මත අවදානම් වැටයීමේ අරමුණ ඇතිව මාසිකව අළුත්කිරීමේ පදනමක් මත ඇඑඩො මිලියන 249.31ක් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ඇතුළත් වූ හුවමාරු ගිවිසුමට අනුව වසර පහක කාලසීමාවක් සඳහා ඇඑඩොවලින් නම්කළ විදේශීය ණය ගැනීම් තුළින් 2014 සැප්තැම්බර් ඇඑඩො මිලියන 250 ක් බැංකුව ලබාගෙන ඇත. මෙම ණය 2019 සැප්තැම්බර් කල්පිරුනු අතර එය නිරවුල් කරන ලදී.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ රු.මි. 11.6ක්වන පවත්නා ශේෂය ශ්‍රී ලංකා ටෙලිකොම් වෙත සපයන ලද කාලීන ණය රු.බි.2.0 මගින් ඇති වූ පොළී අනුපාත අවදානමට අනුව වැටයීම පිණිස ඩීඑෆ්සීසී බැංකුව සමඟ ඇතුළත් වූ හුවමාරු නියෝජනය කරයි.

### දේපල, පිරියත සහ උපකරණ

දේපල, පිරියත සහ උපකරණ පසුගිය වසරේ වාර්තාකළ රු.බි. 13.5 සිට රු.බි. 14.2 දක්වා 5.2%කින් වැඩි වූ අතර මේ සඳහා ඉඩම්, ගොඩනැගිලි සහ පරිගණක දෘඩාංග මිලදී ගැනීම ප්‍රධාන වශයෙන් හේතු විය.

### භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කම්

2019 සිට ක්‍රියාත්මක කරන ලද SLFRS 16, "කල්බදු" මගින් සමහර කෙටි කාලීන කල්බදු වත්කම් සහ අඩු වටිනාකම් ඇති වත්කම් ඉවත් කරමින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය මත සියලුම කල්බදු ගිවිසුම් හඳුනා ගැනීම බදු ගැණුම්කරුට අවශ්‍ය වන අතර, LKAS 17, "කල්බදු" මගින් මූල්‍ය කල්බද්දක් (මූල්‍ය තත්ත්වය මත) සහ මෙහෙයුම් කල්බද්දක් (ශේෂ පත්‍රයෙන් පිට) අතර වෙනසක් සිදු කිරීම අවශ්‍ය විය. ඒ අනුව,

බැංකුව විසින් 2019 දෙසැම්බර් 31 දිනට එහි මූල්‍ය තත්ත්වය තුළ "භාවිතා කිරීමට අයිතිය ඇති වත්කම්" ලෙස රු.බි. 1.1ක් වන සියලුම කල්බදු ගිවිසුම් සඳහා අනුරූප කල්බදු වගකීමක් හඳුනා ගන්නා ලදී.

### පරිපාලිත සමාගම්වල ආයෝජන

පරිපාලිත සමාගම්වල ආයෝජන 2018 දී වාර්තාකළ රු.බි. 1.7ට සාපේක්ෂව 2019 වසර අවසානයේදී රු.බි. 4.8 දක්වා වැඩිවී ඇත. 2016 රජයේ අයවැය තුළ සිදුකළ යෝජනාවට අනුව යමින් 2019 ඔක්තෝබර් 11 දින සම්පූර්ණයෙන්ම අයත් පරිපාලිත සමාගමක් ලෙස ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව (SLSB) තුළ රු.බි. 3.1 ක් ආයෝජනය කරන ලදී. (වැඩිදුර විස්තර සඳහා 68 සිට 69 පිටු බලන්න)

## D අනෙකුත් වත්කම්වල ඉහළයාම

2019 අවසානයට. ලැබියයුතු දෑ, පෙර ගෙවීම්. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොළී ගෙවීම මත භාණ්ඩාගාරයෙන් ලැබියයුතු දෑ, භාණ්ඩාගාරයට දුන් අත්තිකාරම් ලැබිය යුතු කාල්පනික බදු/රඳවාගැනීමේ බදු ඇතුළත්වන අනෙකුත් වත්කම් වසරකට පෙර රු.බි. 31.2 සිට රු.බි. 35.2 දක්වා 12.8%කින් ඉහළ ගියේය. මෙම පොළී නොවන ඉපයීම් වත්කම් මුළු වත්කම්වලින් 3%ක් නියෝජනය කරන බැවින්, එකී මුදල් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට බැංකුව කටයුතු කරමින් සිටී.

## E මුදල් සහ මුදලට සමාන දෑ කළමනාකරණය

### මුදල් හා මුදලට සමන දෑ සහ බැංකු සමඟ ස්ථාපනයන්

මුදල් හා මුදලට සමාන දෑ අතැති මුදල්, බැංකුවල ශේෂ සහ ඇමතුම් සහ කෙටි දැන්වීමට මුදල්වලින් සමන්විත වේ. 2019 වසර අවසානයට, මුදල් හා මුදලට සමාන දෑවල රු.බි. 5.4 ක් බැංකුව සතු වූ අතර එය 2018ට වඩා 56.5% ක වැඩි වීමකි. එයට හේතුව බැංකුවල ශේෂ වැඩිවීමයි. බැංකු සමඟ ස්ථාපනයන් කෙටි කාලීන තැන්පතු වන අතර, එය පසුගිය වසරේ වාර්තා කළ රු.බි. 17.6ට සාපේක්ෂව 2019 දී රු.බි. 12.4 දක්වා 29.7%කින් පහත වැටුණි. මුදල් හා මුදලට සමාන දෑ සහ බැංකු සමඟ ස්ථාපනයන් යන ද්විත්වය ප්‍රශස්ථ මට්ටම්වල පවත්වා ගන්නා අතර, කෙටිකාලීන බැඳීම් සහ ද්‍රවශීලතා අවශ්‍යතා පහසුවෙන් සපුරාලීම සඳහා බැංකුව විසින් භාවිතා කරයි.

## F මුළු වගකීම්

පසුගිය වසර තුළ 42.5%කින් මුළු ණය ගැනීම්වල අඩුවීම හමුවේ ගනුදෙනුකාර තැන්පත්වල වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන මුළු වගකීම් 2018 තිබූ රු.බි. 993.8 සිට රු.ට්‍රි. 1.1 දක්වා 12.1%කින් වැඩිවී ඇත.

## G අපගේ ණය කළඹ විචක්ෂණ ලෙස කළමනාකරණය

අපගේ ණය ගැනීම් බැංකුවලට ගෙවියයුතු දෑ සහ අනෙකුත් ණයකරුවන්ට ගෙවීම් සහ නිකුත්කළ ණය සුරැකුම්පත්වලින් සමන්විත වන අතර. අනෙකුත් ණය ගැනීම් වසරකට පෙර වාර්තාකළ රු.බි. 144.3 හා සැසඳීමේදී 2019 අවසානයට රු.බි. 82.9 දක්වා 42.5% කින් පහත වැටුණි. මේ සඳහා ප්‍රධාන වශයෙන් 2019 සැප්තැම්බර් ඇ.එ.ඩො මිලියන 250 බැඳුම්කරය නිරවුල් කිරීම සහ ප්‍රතිමිලදීගැනීම්/ණය ගැනීම්වල පහත වැටීම හේතු විය.

### බැංකුවලට ගෙවියයුතු දෑ

අයිරා, ඇමතුම් මුදල් ණයගැනීම්, බැංකුවලින් ණයගැනීම් සහ ප්‍රති මිලදී ගැනීම්/ණය ගැනීම් නියෝජනය කරන බැංකුවලට ගෙවියයුතු දෑ, විදේශ ව්‍යවහාර මුදල් ණය ගැනීම් සම්බන්ධ ආපසු ගෙවීම් සහ ප්‍රතිමිලදීගැනීම්වල පහත වැටීම නිසා 2018 දී පැවති රු.බි. 77.1 සිට 2019 දී රු.බි. 35.0 දක්වා 54.6%කින් පහත වැටුණි.

### අනෙකුත් ණයකරුවන්ට ගෙවියයුතු දෑ

අනෙකුත් ණයකරුවන්ට ගෙවියයුතු දෑ බැංකුවලට ගෙවියයුතු දෑ හැර ප්‍රතිමිලදීගැනීම් ණයගැනීම්වලින් සමන්විත වන අතර පසුගිය වසරේ වාර්තා කළ රු.බි. 14.8ට සාපේක්ෂව 2019 දී රු.බි. 21.2 දක්වා 43.2%කින් ඉහළ ගියේය.

### නිකුත්කළ ණය සුරැකුම්පත්


නිකුත්කළ ණය සුරැකුම්පත් ඇ.එ.ජ ඩොලරයෙන් නම්කළ ජාත්‍යන්තර ජ්‍යෙෂ්ඨ නෝට්ටුව, සුරැකුම් නොකළ නිදහස් කළ හැකි ද්විතියික ණයකර සහ ජ්‍යෙෂ්ඨ සුරැකුම් නොකළ නිදහස් කළ හැකි ණයකරවලින් සමන්විත වේ. 2019 සැප්තැම්බර්, බැංකුව විසින් කල්පිරීම මත ඇ.එ.ඩො මිලියන 250 ක් වටිනා ඇ.එ.ජ.ඩොලරයෙන් නම්කළ ජාත්‍යන්තර ජ්‍යෙෂ්ඨ නෝට්ටුව නිරවුල් කරන ලදී. කෙසේවෙතත්, ඉහත සඳහන් ඇ.එ.ඩොලරයෙන් නම්කළ ජාත්‍යන්තර ජ්‍යෙෂ්ඨ නෝට්ටුවට අනුව පිළියෙල කළ ශ්‍රී ලංකා රු./ඇ.එ.ඩො හුවමාරු ගිවිසුම් අවලංගු කිරීමේ මූල්‍ය අවශ්‍යතා සඳහා මුදල් යෙදවීමේ අරමුණ ඇතිව ජ්‍යෙෂ්ඨ ණයකර නිකුතුවක් තුළින් රු.බි. 20.0 ක් බැංකුව රැස් කරගන්නා ලදී. 2019 දී සිදුවූ ඉහත සංවර්ධනයන් හේතු කොට ගෙන, 2019 දෙසැම්බර් අවසානයට නිකුත්කළ ණය සුරැකුම්පත් කළඹ වසරකට පෙර වාර්තාකළ රු.බි. 52.4 සිට 2019 දී රු.බි. 26.7 දක්වා 49.1% කින් පහත වැටුණි. තවද, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය වැඩිකිරීම සහ බැංකුවේ වත්කම් සහ වගකීම් කළඹ අතර කල්පිරීම තුළ නොගැළපීම අඩු කිරීම පිණිස බැංකුවේ ප්‍රාග්ධනය වැඩි කිරීම සඳහා 2016 දී නිකුත්කළ රු.බි.6.0ක් වටිනා වසර පහේ ද්විතියික ණයකරවලින් මෙම කළඹ සමන්විත විය.

## H ඉතිහාසය තුළ ඉහළම වාර්ෂික තැන්පතු සංචලනය සමඟ ට්‍රිලියන එකක තැන්පතු සන්ධිස්ථානය අත්කර ගැනීම

තැන්පතු යනු බැංකුවේ තනි විශාලතම අරමුදල් මූලාශ්‍රය වන අතර එය 2019 අවසන් වන විට මුළු වත්කම්වලින් 87.8% ක් වන අතර එය වසරකට පෙර වාර්තා වූ 81% සිට ඉහළ යාමකි. බැංකුවේ තැන්පතු පදනම 2019 අවසානයට රු.ට්‍රි. 1.02 දක්වා ළඟාවීමට වසර තුළ රු.බි. 171.4 ක් සංචලනය කරමින් වසරක් තුළ මේ දක්වා වූ ඉහළම අගය වාර්තා කර ඇති අතර එය රු.බි. 839.6 ක් වූ පසුගිය වසරේ පදනමට වඩා 21.1%ක වර්ධනයකි. මෙයට ප්‍රධාන හේතුව කාලීන තැන්පතවලට ආරෝපනය කළ හැකි අතර එය 2019 දී පැවති රු.බි. 641.2 ට සාපේක්ෂව රු.බි. 798.0 දක්වා ළඟාවීමට 24.4%කින් වැඩිවිය. මෙය තැන්පතු මුසුව තුළ කාලීන තැන්පතු සමාලෝචිත වසර තුළ 75.6% සිට 77.8% දක්වා වැඩිවීමට හේතු විය. ඉතුරුම් තැන්පතු ද පසුගිය වසර තුළ රු.බි. 198.3 ට සාපේක්ෂව රු.බි. 218.5 ක් වාර්තා කරමින් 10.2%ක යහපත් වර්ධනයක් වාර්තා කළේය.

ණය කළඹ තුළ මධ්‍යස්ථ වර්ධනය සහ තැන්පතු පදනම තුළ වඩා ඉහළ වැඩිවීම පසුගිය වසරට සාපේක්ෂව 2019 වසර තුළ තැන්පතුවලට ණය අනුපාතයෙහි අඩුවීමකට හේතු විය.

**තැන්පතුවලට ණය**




## I අනෙකුත් වගකීම්වල ඉහළ යාම

### විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම

විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම පසුගිය වසරේ අනුරූප කාලසීමාව තුළ වාර්තාකළ රු.බි. 3.8ට සාපේක්ෂව රු.බි. 6.5 දක්වා 69.9% කින් 2019 දෙසැම්බර් අවසානයේදී ඉහළ ගොස් ඇත. වට්ටම් අනුපාතවල වෙනස්වීම් සහ වර්තමාන සේවකයින්ගේ සේවක වෛද්‍ය සහන යෝජනා ක්‍රමයට සමාන කිරීම සඳහා විශ්‍රාමිකයින්ගේ වෛද්‍ය සහන යෝජනා ක්‍රමය තුළ සිදුකළ සංශෝධන සමඟ ලබාදෙන ලද විශ්‍රාම වැටුප් ප්‍රමාණයේ වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, සේවකයෙක් සඳහා සංශෝධිත විශ්‍රාමිකයින්ගේ වෛද්‍ය සහන යෝජනා ක්‍රමයේ සීමාව දැනට පවත්නා සීමාවට සාපේක්ෂව 87.0%ක ඉහල යාමක් දක්නට විය.

### කල්බදු වගකීම

SLFRS 16,"කල්බදු" පළමු වරට යොදා ගැනීමේ අවශ්‍යතාවන්ට අනුකූලව කල්බදු වගකීමක් ලෙස රු.බි. 1.1 ක් හඳුනාගනු ලැබීය.

### අනෙකුත් වගකීම

ගාස්තු සහ වියදම් මත කරන ලද ප්‍රතිපාදන සහ ගෙවිය යුතු දේ මූල්‍ය සේවා මත බදු සහ වෙනත් ණයහිමියන් ඇතුළත් වන අනෙකුත් වගකීම් 2018 දී පැවති රු.බි. 5.4 ට සාපේක්ෂව 2019 දී රු.බි. 6.0 දක්වා 9.3% කින් වැඩිවිය.

### අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්

වසර තුළ, බැංකුව විසින් එහි මුළු බැඳීම් සහ අසම්භාව්‍යතා පසුගිය වසරේ රු.බි. 4.5 ට සාපේක්ෂව රු.බි. 10.4 දක්වා 131.1%ක වැඩිවීමක් වාර්තා කරන ලදී. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ එකඟ වූ නමුත් මධ්‍ය බැංකුකරණ ව්‍යාපෘති සඳහා නොගෙවන ලද ප්‍රමාණයෙන් ඇති වූ භාවිතා නොකළ ණය පහසුකම් සහ ප්‍රාග්ධන බැඳීම්වල ඉහළයාමයි.

## J අපගේ ප්‍රාග්ධනය ශක්තිමත්ව පැවතිම


### කොටස්හිමියන්ගේ ස්කන්ධය

මුළු කොටස්හිමියන්ගේ ස්කන්ධය පසුගිය වසර තුළ රු.බි. 43.1 සිට 2019 දී රු.බි. 44.4 දක්වා ඉහළ ගියේය. වසර තුළ, කොටසක ඉපයීම කොටස්හිමියන්ට ආරෝපිත ලාභය වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස 2018 දී රු .6.72 විට රු. 7.13 දක්වා වැඩිවිය. බැංකුවට එහි ප්‍රාග්ධන පදනම් වැඩි කිරීම සඳහා ලබාගතහැකි අවස්ථාවන් සීමිත නිසා, 29.9% දක්වා ලාභාංශ ක්‍රම ක්‍රමයෙන් අඩුකිරීමට අප පොළඹවන ලද අතර ඒ තුළින් වසර තුළ අභ්‍යන්තරව උත්පාදනය කළ අරමුදල්වල වැඩිවීමකට මඟ පැදුණි.

## ප්‍රාග්ධන කළමනාකරණය

බැංකුවේ ප්‍රාග්ධන කළමනාකරණය තුළින් බැංකුවේ දිගු කාලීන සහ කෙටි කාලීන ඉලක්ක අත්කර ගැනීම සඳහා පහසුකම් ඇති කරමින් කොටස්හිමියා සඳහා වටිනාකම නිර්මාණය කිරීමට අපේක්ෂා කෙරේ. ජාතික ඉතිරි කිරීමේ බැංකුව ගනු ලබන අවදානම් මට්ටම පිළිබඳ අපගේ අභ්‍යන්තර ඇගයීම, ශ්‍රේණිගතකරණ ආයතවල අපේක්ෂාවන්, නියාමකයින්ගේ අවශ්‍යතා සහ කොටස්හිමියා විසින් අපේක්ෂිත ප්‍රතිඵල ඇතුළත් සාධක ගණනාවකට අනුව එහි ප්‍රාග්ධන මට්ටම් කළමනාකරණය කරයි. ජාතික ඉතිරි කිරීමේ බැංකුව එහි ප්‍රාග්ධන ව්‍යුහය මගින් ප්‍රාග්ධන උපකරණ සහ මූල්‍යමය කාර්යක්ෂමතාව ප්‍රශස්ථකරණය තුළ ලබාගතහැකි ප්‍රාග්ධන කළමනාකරණ කටයුතු රාශියක සහ එහි ප්‍රාග්ධන පදනමෙහි අලාභ අන්තර්ග්‍රහනය කර ගැනීමේ හැකියාවේ සම්පූර්ණ වාසිය ලබාගන්නා බව සහතික කිරීමට උත්සාහ ගනී.

**ස්කන්ධයට ණය**




### ප්‍රාග්ධන කළමනාකරණ අරමුණු

ප්‍රාග්ධන කළමනාකරණයේ ප්‍රධාන අරමුණු වන්නේ බැංකුවේ ව්‍යාපාර ක්‍රමෝපායට සහයවීම සහ නියාමන අවශ්‍යතා කඩකිරීමක් නොමැතිව බරපතල පහත වැටීමකදී පවා රඳා පැවතීමට තරම් ප්‍රමාණවත් ප්‍රාග්ධන මට්ටමක් සහතික කිරීමයි.

බැංකුවේ ප්‍රාග්ධන කළමනාකරණ පරමාර්ථ පහත පරිදි සාරාංශ කළ හැකිය:

ණය ශ්‍රේණිගතකරණ අරමුණු අත්කරගැනීම සහ වියහැකි පීඩන අවස්ථාවල බලපෑමට ඔරොත්තු දීම පිණිස බැංකුවේ ප්‍රාග්ධනය කළමනාකරණය කරන බව සහතික කිරීම.

අවම නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් ප්‍රාග්ධනය පවත්වා ගැනීම.




බැංකුවේ උපාය මාර්ගික අරමුණු සහයවීමට ව්‍යාපාරයට ප්‍රාග්ධනය වෙන්කිරීම.

බැංකුවේ අවදානම් රුචියට සහයවීම සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධනය රඳවා ගැනීම.

## ක්‍රියාවලිය

අධ්‍යක්ෂ මණ්ඩලය (මණ්ඩලය) අපගේ ප්‍රාග්ධන කළමනාකරණ පරමාර්ථ සකස් කිරීම සඳහා වගකීමට බැඳී සිටී. අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රාග්ධන ඉලක්ක ආකාරයෙන් මෙම පරමාර්ථය පැහැදිලි කරයි. කොටස්හිමියාට ප්‍රතිඵල ලබාදෙමින් සහ ව්‍යාපාරයේ වර්ධනය සහ ආයෝජන අවස්ථාවන් සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධන සම්පත් ලබාගත හැකි බව සහතික කරමින් සහ අපගේ ක්‍රමෝපායික සැලසුම් සහ අවදානම් රුචිය සැලකිල්ලට ගනිමින් අහිතකර තත්ත්වයන්ට ඔරොත්තු දෙමින් මෙම පරමාර්ථ නොනැවත කරගෙන යයි. අපගේ ලාභාංශ ප්‍රතිපත්තිය වන්නේ අපගේ ප්‍රාග්ධන කළමනාකරණ පරමාර්ථවලට සහ දිගු කාලීන වර්ධන අපේක්ෂාවන්ට අනුරූපව කාලය පුරා තිරසාර ලාභාංශ ගෙවීමයි. අපගේ ලාභාංශ ප්‍රතිපත්තියට අනුකූලව, බැංකුව 2019 වසර තුළ රු.බි. 2.0 ක අවසාන ලාභාංශයක් ගෙවන ලදී.

අපගේ ප්‍රග්ධන කළමනාකරණ පරමාර්ථ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) තුළින් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රාග්ධන කළමනාකරණය සහ සැලසුම් කිරීමේ ක්‍රියාවලියක් හරහා ක්‍රියාත්මක කරන අතර වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව (ALCO) මගින් අධීක්ෂණය කෙරේ. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුවේ මුලසුන දරයි. මෙම කමිටුව වර්තමාන සහ ප්‍රක්ෂිප්ත ප්‍රාග්ධන තත්ත්වය පිළිබඳ යාවත් කිරීම් නිතිපතා ලබා ගනී.

ප්‍රාග්ධනය සැලසුම් කිරීම සඳහා ප්‍රධාන මෙවලම වාර්ෂික අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා ඇගයීම් ක්‍රියාවලිය (ICAAP) වන අතර මේ තුළින් අපගේ ප්‍රක්ෂිප්ත ප්‍රාග්ධන සැපයුම් සහ නියාමන අවශ්‍යතාවන්ට අදාළ ඉල්ලුම සහ අපගේ ප්‍රාග්ධන ඉලක්ක අපි තක්සේරු කරමු. වාර්ෂික අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා ඇගයීම් ක්‍රියාවලියට වසර තුනක සීමාවක් ඇති අතර, විවිධ විෂයපථයන් සහ එහි දැඩිබව පිළිබඳ ආතති අවස්ථා ඇතුළුව විවිධ සිදුවීම් පෙළ ආවරණය කරයි.

වසර තුළ, ණය සඳහා සම්මත ප්‍රවේශය, වෙළෙඳපොල අවදානම සඳහා සම්මත මැනුම් ප්‍රවේශය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් පරිදි 1 ස්ථරය යටතේ මෙහෙයුම් අවදානම සඳහා මූලික දර්ශක ප්‍රවේශය භාවිතා කරමින් වාර්ෂික අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා ඇගයීම් ක්‍රියාවලිය යටතේ එහි ප්‍රාග්ධන අවශ්‍යතා බැංකුව තක්සේරු කළ අතර, ක්ෂේත්‍රය මනා පරිචයන්ට අනුව පුළුල් පරාසයක අවදානම් සහ බැංකුවේ අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණ හැකියාවන් පිළිබඳ සැලකිල්ලට ගනිමින් 2 ස්ථරයේ අවදානම් තක්සේරු කිරීමට අභ්‍යන්තරව ඇතිකළ ආකෘතියක් භාවිතා කරන ලදී. අයවැයකරණ ක්‍රියාවලියේ කොටසක් ලෙස ව්‍යාපාර මාර්ග මගින් ප්‍රාග්ධන වෙන්කිරීම් සිදු කෙරෙන අතර ඒවා වසර පුරා නියාමනය කෙරෙමින් පවතී. බැංකුවේ ආයතනික කළමනාකරණය ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව සහ අනෙකුත් ප්‍රාග්ධන ආශ්‍රිත ගැටළු තක්සේරු කිරීමට සහ ක්‍රමෝපායන් මගින් ක්‍රියාත්මක කිරීම සඳහා එහි යෝජනාවන් ක්‍රමයෙන් වැඩි කිරීමට කලින් කල හමුවිය.


සමාලෝචිත වසර තුළ බැංකුව විසින් පුළුල් සහ විස්තීර්ණ පීඩන පරීක්ෂාව සිදුකර ඇති අතර බැංකුව එහි ව්‍යාපාර කටයුතු, අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ක්‍රමෝපායික සැලැස්ම, අවදානම් රුචිය, අවදානම් පැතිකඩ සහ එය ක්‍රියාත්මක වන බාහිර පරිසරයට අදාළව මනාව ප්‍රාග්ධනකරණය වී පවත්නා බවට නිගමනය කරන ලදී.

බැංකුව රඳවාගත් ඉපයීම් තුළින් ඓතිහාසිකව ප්‍රාග්ධනය උත්පාදනය කරමින් සිටී. 2019 වසර සඳහා ලාභාංශ ගෙවීම් අනුපාතය 29.9%ක් විය.

## ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත පහසු මට්ටමක පැවතීම

අපගේ අවදානම මත බරතබන ලද වත්කම් (RWA) 2018 දී වාර්තාකළ රු.බි. 227.8ට අනුව රු.බි. 255.4 දක්වා 12.1%කින් වැඩිවිය. මේ සඳහා වත්කම් වර්ධනය සහ මෙහෙයුම් අවදානම මත බරතබන ලද වත්කම්වල 10.2%ක වැඩිවීම සමඟ ණය අවදානම මත බරතබන ලද වත්කම්වල 13.7% ක වැඩිවීම විශාල වශයෙන් හේතු විය. (අවදානම මත බරතබන ලද වත්කම් පිළිබඳ වැඩිදුර විස්තර සඳහා පිටු 433 සිට 445 දක්වා බාසල් III යටතේ ස්ථර 3 අනාවරණය බලන්න)


### සාමාන්‍ය අවදානම මත බරතබන ලද වත්කම් මත ඉපයීම





ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාළ ලකුණු පදනමක් මත බැංකු හඳුනාගමිනින් 2019 දෙසැම්බර්වල දේශීය ක්‍රමානුකූලව වැදගත් බැංකු (D-SIBs) සමඟ ගනුදෙනුකිරීම සඳහා වැඩරාමුවක් පිළිබඳ නියෝගයක් නිකුත් කරන ලදී. වත්කම පදනම් තුළ රුපියල් ට්‍රිලියන එක පසුකරනු ලැබුවද, ස්ථර I ප්‍රාග්ධනය සහ මුළු ප්‍රාග්ධනය පිළිවෙලින් 8.5% සහ 12.5%අවම

ප්‍රාග්ධන අවශ්‍යතා මට්ටම් අනුව, යන බැංකු තවදුරටත් දේශීය ක්‍රමානුකූල වැදගත් නොවන බැංකුවක් ලෙස පවතී. 2019 දෙසැම්බර් 31 දිනට බැංකුවේ ස්ථර I ප්‍රාග්ධන සහ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මත අනුපාත පිළිවෙලින් 12.02% සහ 14.35% මට්ටමේ පැවති අතර එය අවම ප්‍රාග්ධන අවශ්‍යතාවන්ට ඉහළ අගයකි. අදාල ගැලපීම් සමග මුළු දළ නිරාවරණය මත ස්ථර I ප්‍රාග්ධනය මගින් මනිනු ලබන තෝලන අනුපාතය 3.0% අවම අවශ්‍යතාවට වඩා ඉහළින් 5.13% දක්වා වර්ධනය විය.

### මුළු වත්කම්වලට එරෙහිව අවදානම මත බර තැබූ වත්කම්




### බාසල් III – ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව




A – සාමාන්‍ය RWA මත ඉපයීම් (බදු පෙර)
B – සාමාන්‍ය RWA මත ඉපයීම් (බදු පෙර) ක්ෂේත්‍රය
C – ස්ථර I ප්‍රාග්ධනය
D – මුළු ප්‍රාග්ධනය

## අනාගත දැක්ම

ප්‍රාග්ධන ප්‍රමාණාත්මත සහ ද්‍රවශීලතා අනුපාත නියාමන් අවශ්‍යතාවන්ට ඉහළින් පවත්වා ගනු ලැබේ.

## අරමුදල් මූලාශ්‍ර සහ උපයෝජනය

බැංකුව ගනුදෙනුකරුවන්ගේ තැන්පතු සහ අනෙකුත් මූලාශ්‍ර රාශියකින් මූලිකවම අරමුදල් ලබාගැනීම සමඟ ඉදිරියට යන පදනමක් මත ශක්තිමත් ද්‍රවශීලතා තත්ත්වයක් ඇති බව සහතික කිරීමට ණය අවස්ථාවන්හි වාසිය ලබා ගනිමින් එහි මූල්‍ය තත්ත්වය සක්‍රීයව කළමනාකරණය කරමින් සිටී.

රජයට අයත් බැංකුවක් ලෙස ලබාගත හැකි ප්‍රාග්ධනයෙහි සීමාවන් සමඟ බැංකු ක්ෂේත්‍රයේ ස්වභාවය අනුව යමින්, අපගේ ස්කන්ධයට ණය අනුපාතය 2019 අවසානයේ දී 25 ස් ගුණයක් විය.

බැංකුව අරමුදල් පිරිවැය අවම මට්ටමේ පවත්වා ගනිමින් දැනට පවත්නා සහ අනාගත වත්කම් පදනමට සහයවීමට සුදුසු අරමුදල් මූලාශ්‍ර ප්‍රමාණයක්, කාලසීමාවක් සහ විවිධාංගීකරණයක් ඇති බවත් අඛණ්ඩව සහතික කරයි. සුදුසු කණ්ඩායම් අරමුදල් ක්‍රමෝපායන් තරඟකාරී සහ නියාමන පරිසරය මත රැඳී පැවතෙමින් ක්‍රියාත්මක කරන බව සහතික කිරීමට ඉදිරියට යන පදනමක් ලෙස අරමුදල් වෙළෙඳපොල තක්සේරු කෙරේ. බැංකුව තම අරමුදල් මුසුව තුළ ප්‍රධාන සංරචකයක් ලෙස එහි තැන්පතු පදනම ගොඩනැගීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කරයි.


බැංකුව එහි එහි මූලික අරමුදල් මූලාශ ලෙස ගනුදෙනුකරුවන්ගේ තැන්පතු, ණය සුරැකුම්පත්, කාලීන ණය සහ ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ අලෙවිකළ සුරැකුම්පත් මත විශ්වාසය තබයි. ගනුදෙනුකරුවන්ගේ තැන්පතු පොදුවේ වඩා කෙටිකාලීන කල්පිරීම් ඇති අතර, ඒවායින් විශාල කොටසක් ඉල්ලීම මත ගෙවිය යුතුය. මෙම තැන්පතුවල කෙටි කාලීන ස්වභාවය වත්කම් වගකීම් කල්පිරීම්වල ඇති නොගැලපීමෙන් බැංකුවේ ද්‍රවශීලතා අවදානම වැඩි කරන අතර තරඟකාරී මිලකරණය සහ වෙළෙඳපොල ප්‍රවණතා දැඩි ලෙස නියාමනය තුළින් බැංකුව මෙම අවදානම කළමනාකරණය කරයි.

| | 2019<br>රු. මිලියන | 2018<br>රු. මිලියන | 2017<br>රු. මිලියන |
|---|---|---|---|
| **අරමුදල් මූලාශ්‍රය** | | | |
| මෙහෙයුම් කාර්යයන්ගෙන් ආදායම | **117,998** | 110,454 | 100,543 |
| තැන්පතු | **170,677** | 101,634 | 75,188 |
| ණයගැනීම් | **6,288** | 31,086 | 32,251 |
| ආයෝජනවල කල්පිරීම | **18,132** | 43,245 | 17,167 |
| වෙනත් | **15** | 7 | 1,136 |
| | **313,110** | 286,426 | 226,285 |
| **අරමුදල් උපයෝජනය** | | | |
| ණය සහ අත්තිකාරම් | **31,734** | 48,291 | 63,125 |
| ණය සහ අනෙකුත් උපකරණ | **94,261** | 15,976 | 39,002 |
| ණය මුදල් ආපසු ගෙවීම | **67,873** | 107,553 | 21,197 |
| ගෙවූ පොළිය | **83,363** | 86,068 | 73,070 |
| සේවකයින්ට ගෙවීම | **9,576** | 8,944 | 6,977 |
| අනෙකුත් මෙහෙයුම් කාර්යයන් මත ගෙවීම | **4,450** | 3,732 | 3,411 |
| ප්‍රාග්ධන වියදම | **1,505** | 1,742 | 1,050 |
| පරිපාලිත සහ ආශ්‍රිත සමාගම්වල ආයෝජනය | **3,111** | 800 | – |
| ලාභාංශ | **2,000** | 500 | 5,111 |
| ගෙවන ලද බදු | **8,725** | 6,738 | 7,620 |
| වෙනත් | **6,512** | 6,082 | 5,722 |
| | **313,110** | 286,426 | 226,285 |


## 2019 බැංකුවේ අරමුදල් සහ භාවිතය

තැන්පතුවලට ණය අනුපාතය 2019 අවසානයට 44.70%ක් වූ අතර එය පසුගිය වසරේ වාර්තාකළ 48.06%ට වඩා අඩු අගයකි. මේ සඳහා විශාල වශයෙන් පසුගිය වසරට සාපේක්ෂව ණය වර්ධනය තුළ මධ්‍යස්ථතාව හේතු විය. එමෙන්ම, බැංකුව අඩු ඉපයීම්වලට හේතුවන අවදානම් රහිත අනුපාතයට වසර තුළ රජයේ සුරැකුම්පත්වල සේවයේ යොදවන ලද 60%ක් ආයෝජනය කිරීමේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාව නිසා සංරෝධකවලට යටත් වේ. 2018 දි වාර්තාකළ 60.94% සිට සුළු වශයෙන් අඩුවෙමින් 60.88% ක ප්‍රශස්ථ මට්ටමක මුළු තැන්පතු අනුපාතයට රජයේ සුරැකුම්පත් පවත්වා ගැනීමට බැංකුවට හැකි විය.

### අරමුදල් මූලාශ්‍රය




### අරමුදල් උපයෝජනය




2019 අවසානයට රු.බි. 5.3 ක් වූ අපගේ මුදල් හා මුදලට සමාන දෑ පසුගිය වසරට වඩා 57.9% ක වැඩිවීමක් වන අතර මෙහෙයුම් කාර්යයන් හි වැඩිවීම මෙයට හේතු විය. රු.බි. 3.1 ක ප්‍රතිෂ්ඨාවකට 100%ක් අයත් පරිපාලිත සමාග මක් ලෙස ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව"බීජ්* අත්කර ගැනීමේ ආයෝජන කාර්යය මෙන්ම පසුගිය වසරට සාපේක්ෂව 300% ක වැඩිවීමක් සහිතව රුපියල් බිලියන 2 ක ලාභාංශයක් ගෙවීමේ මූල්‍ය කටයුත්ත ද හේතු කොට ගෙන මෙහෙයුම් කාර්යයන්ගෙන් උත්පාදිත ධනාත්මක මුදල් ප්‍රවාහය අර්ධවශයෙන් හිලව් විය.

## සය වැදෑරුම් ප්‍රාග්ධනය තුළ ආයෝජනය

පසුගිය වසර තුන මුළුල්ලේ, රු.බි.5.6ක මුළු ප්‍රාග්ධන ආයෝජනයක් අපි සිදුකර ඇති අතර එයින් රු.බි. 2.3ක් 2019 දි ආයෝජනය කරන ලදී. මෙය අපගේ ව්‍යාපාර සැලැස්මට අනුව පෙර වසර තුළ වාර්තාකළ රු.බි. 2.1ට සාපේක්ෂව 7.3%කින් වැඩිවීමකි. අපි ප්‍රධාන වශයෙන් අපගේ ආයෝජනය ජංගම නොවන

### මුදල් ප්‍රවාහ කළමනාකරණය

| | **2019**<br>**රු. මිලියන** | 2018<br>රු. මිලියන |
|---|---|---|
| මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ | **16,462.8** | 9,117.9 |
| මෙහෙයුම් වත්කම්වල (වැඩිවීම)/අඩුවීම | **(114,421.5)** | (24,660.1) |
| මෙහෙයුම් වගකීම්වල වැඩිවීම/(අඩුවීම) | **108,707.7** | 23,714.6 |
| ගෙවන ලද ආදායම් බදු | **(3,798.6)** | (3,365.8) |
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් (භාවිතාකළ) ලැබුණු ශුද්ධ මුදල් ප්‍රවාහ** | **6,950.4** | 4,806.6 |
| **ආයෝජන කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(2,228.5)** | (3,843.8) |
| **මූල්‍ය කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(2,780.0)** | (1,280.0) |
| මුදල් හා මුදලට සමාන දෑ හී ශුද්ධ (වැඩිවීම)/අඩුවීම | **1,941.9** | (317.2) |
| වසර ආරම්භයේදී මුදල් හා මුදලට සමාන දෑ | **3,352.0** | 3,669.2 |
| වසර අවසානයේදී මුදල් හා මුදලට සමාන දෑ | **5,293.9** | 3,352.0 |

වත්කම්, නිපුණතා සංවර්ධනය, ප්‍රජා සංවර්ධන ව්‍යාපාති සහ ඩිජිටල්කරණය සහ තාක්ෂණය මත ව්‍යාපාරය පරිනාමන ව්‍යාපාති කෙරෙහි යොමු කළෙමු.

| | 2019 රු. මි. | 2018 රු. මි. | 2017 රු. මි. |
|---|---|---|---|
| දේපල, පිරියත හා උපකරණ | **1,516** | 1,295 | 396 |
| පුහුණුව සහ සංවර්ධනය | **40** | 39 | 34 |
| IT සහ ඩිජිටල් යටිතලපහසුකම් සංවර්ධනය | **691** | 772 | 712 |
| ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති | **30** | 17 | 20 |

## දිගුකාලීන අරමුදල්කරණය

අපගේ දිගුකාලීන අරමුදල්කරණය කොටස්හිමියාගේ ස්කන්ධය. දිගු කාලින ණය ගැනීම්, මූල්‍ය උපකරණ නිකුත් කිරීම්, දිගු කාලින තැන්පතු සහ අනෙකුත් දිගු කාලින වගකීම්වල සංයෝගයකි.

අපගේ දිගුකාලීන අරමුදල්කරණ අනුපාතය 2018 දි වාර්තා කළ 8.3% සිට 2019 දි 8.9% දක්වා වැඩිවිය. වසර තුළ, බැංකුව විසින් ජ්‍යෙෂ්ඨ ණයකර නිකුතුව තුළින් රු.බි. 20කින් සාර්ථකව දිගුකාලින අරමුදල් වැඩිකරන ලදී,

## ණය ආකෘතිය

අපගේ දිගුකාලීන ප්‍රාග්ධනය පුළුල් කිරීමේ ව්‍යාපෘති සඳහා අරමුදල් සපයනු ලබන්නේ පාවෙන සහ ස්ථිර අනුපාත දිගුකාලීන ණය මෙන්ම අභ්‍යන්තරව උත්පාදනය කරන අරමුදල්වල සංයෝගයකිනි.

| ණය පැතිකඩ | 2019 රු. මි. | 2018 රු. මි. | 2017 රු. මි. |
|---|---|---|---|
| කෙටි කාලීන (වසර 1 ට අඩු) | **50,994** | 126,281 | 179,857 |
| මධ්‍ය කාලීන (වසර 1 -3) | **25,623** | 12,032 | 38,286 |
| දිගු කාලීන (වසර 3 ට වැඩි) | **6,323** | 6,000 | 6,000 |
| | **82,940** | 144,313 | 224,143 |

| ණය කළඹ තුළ සංයුතිය | 2019 රු. මි. | 2018 රු. මි. | 2017 රු. මි. |
|---|---|---|---|
| Repo ණයගැනීම් | **44,142** | 73,658 | 61,253 |
| FCY ණයගැනීම් | **12,023** | 18,183 | – |
| නිකුත්කළ ජ්‍යෙෂ්ඨ නෝට්ටු | – | 46,383 | 156,703 |
| ද්විතියික වගකීම් | **6,006** | 6,006 | 6,006 |
| ණයකර | **20,685** | – | – |
| වෙනත් | **84** | 83 | 180 |
| | **82,940** | 144,313 | 224,143 |

## ණය ශ්‍රේණිගතකරණය

අපගේ ණය ශ්‍රේණිගතකරණ අපට අයත් සැලකියයුතු අවදානම් මගින් පමණක් නොව ශ්‍රී ලංකාවේ රන් ණය ශ්‍රේණිගතකරණය තුළ විතැන්වීම වැනි ක්‍රමානුකූල අවදානම් මගින් ද බලපෑමට ලක්වේ. 2018 දෙසැම්බර්, ෆිච් ශ්‍රේණිගතකරණ මගින් රන්පවුම් දිගුකාලීන විදේශිය ව්‍යවහාර මුදල් නිකුත් කරන්නාගේ පැහැර හැරීම් අනුපාතය ස්ථාවර දර්ශනයක් සමග ‘B’සහ ‘B+’ දක්වා පහත දමන ලදී. ශ්‍රී ලංකා ජාතික ශ්‍රේණිගතකරණ පරිමාව නැවත ක්‍රමාංකනය කිරීමෙන් පසු, ෆිච් ශ්‍රේණිගතකරණය ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ (NSB) ජාතික දිගුකාලීන ශ්‍රේණිගතකරණය 2019 පෙබරවාරිවල “AAA (lka)” සිට “AA+ (lka)” දක්වා සමාලෝචනය කර ඇත. 2019 අවසානයේදී නැවතත් ෆිච් ශ්‍රේණිගතකරණය විසින් ස්ථාවර සිට සෘණාත්මක දක්වා ශ්‍රී ලංකාවේ දිගුකාලීන විදේශීය ව්‍යවහාර මුදල් නිකුත් කරන්නාගේ පැහැර හැරීම් අනුපාතය මත දර්ශනය සංශෝධනය කරන ලද අතර නව රජය විසින් නිවේදනය කළ මූල්‍ය බර තවදුරටත් වැඩිකිරීමට අපේක්ෂිත බදු කපාහැරීම් හේතු කොට ගෙන “B” තහවුරු කොට ඇත.


කෙසේවෙතත්, ICRA ලංකා සමාගම විසින් 2019 තුළ ශ්‍රී ලංකාවේ නිකුත් කිරීම් අනුපාතය AAA ස්ථාවර මට්ටම පවරන ලදී.

## ලාභාංශ

2019 තුළ රජයට ලාභාංභය ලෙස රු.බි. 2.0 ක් බැංකුව ගෙවන ලද අතර එය පසුගිය වසරේ ගෙවන ලද රු.මි. 500 ට සාපේක්ෂව 4 ගුණයක වැඩිවීමකි. කොටසක ලාභාංශය 2018 දි පැවති රු.0.8ට අනුව 2019 දි රු. 2.13ක් විය.

ලාභාංශ ආවරණ අනුපාතය, ලාභාංශ ගෙවීම් අනුපාතයෙහි වැඩිවීම හේතු කොට ගෙන පසුගිය වසරේ වාර්තාකළ වාර 9.0 සිට වාර 3.35 දක්වා 2019 දි පහත වැටුණි.


### ඵලදායි ලාභාංශ අනුපාතය සහ ලාභාංශ ආවරණය




## ද්‍රවශීලතා කළමනාකරණය

දැඩි වෙළෙඳපොළ කොන්දේසි තුළ ද්‍රවශීලතා අවදානම තක්සේරු කිරීමට අනුව සුදුසු ද්‍රවශීලතා ස්වාරක්ෂක රඳවන ලදී. උච්ඡාවචනය සහ බලපාන ලද ද්‍රවශීලතා පරිසරියන් හමුවේ, සක්‍රිය ද්‍රවශීලතා කළමනාකරණ ක්‍රියාමාර්ග තුළින් ශේෂ පත්‍ර වර්ධනයට සම්පූර්ණයෙන් සහයවීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාව පවත්වා ගනු ලැබිය.

### වගකීම්වලට ද්‍රවශීල වත්කම




(ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාකරණය පරිදිව)

නියාමන සහ සත්‍යරූපී පීඩන අවස්ථාවන්ට මුහුණදීම සඳහා අලෙවිකළහැකි සහ ද්‍රවශීල උපකරණ කළඹ මුදල් ප්‍රවාහයන් හී අපෙක්ෂා නොකළ බාධාවන්ගෙන් ආරක්ෂාකාරීව පවත්වා ගනු ලැබිය. මෙම කළඹ විවිධාංගිකරණය සහ ද්‍රවශීලතාව මත නිශ්චිත සීමා තුළ කළමණාකරණය කෙරේ. කළමනාකරණය කරන ලද ද්‍රවශීලතාව නියෝජනය කරන්නේ බාසල් III ද්‍රශීලතා ආවරණ අනුමැතියය යටතේ සුදුසුකම් ලත් උසස් තත්වයේ ද්‍රවශීල වත්කම් ඇතුළුව ගණනය කළ නොහැකි අලෙවිකරණ උපකරණ වන අතර ඒ මගින් ආතති තත්වයක් තුළ ද්‍රවශීලතා ප්‍රභවයන් සැපයිය හැකිය.

පීඩන පරිසරයක් තුළ වියහැකි පිටවයාම් සපුරාලීමට ඉහළ තත්ත්වයේ ද්‍රවශිල වත්කම් ප්‍රමාණවත් ලෙස ඇති බව සහතික කරමින් බැංකුවේ ලිත් දින 30 ද්‍රවශීල අවදානම් කළඹේ කෙටිකාලීන ස්ථාවරත්වය බාසල් III යටතේ ද්‍රවශිල ආවරණ අනුපාතය මගින් ප්‍රවර්ධනය කරයි. බාසල් III ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතයේ (NSFR) පරමාර්ථය වන්නේ වත්නම් සහ ශේෂ පත්‍රයෙන් බැහැර කටයුතුවල සංයෝජනයට අදාළව ස්ථාවර අරමුදල් කළඹක් පවත්වා ගැනීම බැංකුවට අවශ්‍ය කරමින් බැංකු ක්ෂේත්‍රය තුළ ස්ථාවරත්වය සහ ස්වශක්තතාවට අරමුදල් ලබාදීම ප්‍රවර්ධනය කිරීමයි. ලබාගතහැකි ස්ථාවර අරමුදල් හීඝ්‍ර විසින් සලකා බලන එක් වසරේ සිමාව පුරා ලබාග ැනීමට අපේක්ෂිත ප්‍රාග්ධනය සහ වගකිම්වල කොටස ලෙස නිර්වචනය කෙරේ.

අපගේ ද්‍රවශීල කළඹ ද ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාත (SLAR) අවශ්‍යතාව පරිදි රු.බි. 568.5 දක්වා 33.9%කින් වර්ධනය වෙමින් ද්‍රවශීල වත්කම් සහ අනෙකුත් ද්‍රවශීල මූලාශ්‍ර සමඟ යහපත් අයුරින් පැවතිණ. දින 30 ශුද්ධ මුදල් පිටවයාම් මත මුළු ඉහළ තත්ත්වයේ ද්‍රවශිල වත්කම් මගින් අගය කරන ද්‍රවශිල ආවරණ අනුපාතය වසර පුරා 100%ට ඉහළට අඛණ්ඩව පවත්වාගනු ලැබිය. 2019 අවසානයට, පහත දැක්වෙන අපගේ ද්‍රවශීල ආවරණ අනුපාතය ද අවම සීමාවට වඩා මනාව ඉහළින් පැවතිණ. බැංකුවේ දිගුකාලින අරමුදල් ස්ථාවරත්වය මැනිමට භාවිතා කරන NSFR ද 100% අවම අවශ්‍යතාවන්ට අනුකූල වෙමින් 175.18% දක්වා වර්ධනය විය. බැංකුව අඛණ්ඩ පදනමක් මත පහත දැක්වෙන අනුපාත ගණනය කරයි.

| | 2019 | 2018 | වැඩිවීම (අඩුවීම) |
|---|---|---|---|
| SLAR – අවම අවශ්‍යතාවය 20% | **60.20** | 54.88 | 5.32 |
| රුපියල් LCR – අවම අවශ්‍යතාවය (2019 – 100%, 2018 – 90%) | **278.12** | 245.06 | 33.06 |
| සියලුම මුදල්වල LCR – අවම අවශ්‍යතාවය (2019 – 100%, 2018 – 90%) | **276.64** | 321.29 | (44.65) |
| NSFR – අවම අවශ්‍යතාවය (2019 - 100%) | **175.18** | 146.67 | 28.51 |

## අරමුදල් සහ ද්‍රවශීලතා අවදානම කළමනාකරණය

මූල්‍යමය අන්තර්මැදිහත්වය අනුව බැංකුවේ මූලික කාර්ය භාරය වන්නේ කෙටි කාලීන තැන්පතු වඩා දිගු කාලීන තැන්පතු බවට හැරවීමයි. මෙම කාර්යභාරය ඉටු කිරීමේදී, බැංකුව ද්‍රවශිලතා නොගැලපීම් සහ පසුකාලීන අරමුදල් සහ වෙළෙඳපොල ද්‍රවශීලතා අවදානම්වලට නෛසර්ගිකව නැඹුරු වේ. ශක්තිමත් ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුව තුළින්, සාමාන්‍ය තත්ත්වයේ සහ පීඩන තත්ත්වයන් යටතේ බැංකුකරණ මෙහෙයුම් බාධා රහිතව පවත්වාගන්නා බවට සහතික කිරීමට බැංකුව එහි අරමුදල් සහ වෙළෙඳපොල ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කරයි. ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුව මගින් තහවුරු කරන ප්‍රධාන පරමාර්ථවලට සෑම අවස්ථාවකම මූල්‍ය වෙළෙඳපොල විශ්වාසය පවත්වාගැනීම, ප්‍රධාන පාර්ශ්වකාර බැඳියාවන් ආරක්ෂා කිරීම සහ නියාමන ද්‍රවශීල අවශ්‍යතා සපුරාලීම ඇතුළත් වේ.

බැංකුවට තිරසාර අරමුදල් මූලාශ්‍ර ඇති බවට සහ බැංකුව කෙරෙහි ජනතා විශ්වාසය සහ මූල්‍ය සේවා ක්‍රමය පවත්වා ගැනීමට සෑම අවස්ථාවකදීම ප්‍රමාණවත් ද්‍රවශීලතා මට්ටම් පවත්වා ගන්නා බව සහතික කිරීම සඳහා අරමුදල්කරණය සහ ද්‍රවශීලතාවයේ වැදගත්කම පිළිගනී. ජාතික ඉතිරි කිරීමේ බැංකුව පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිඵල ඇති කිරීම සඳහා එහි වැඩපිළිවෙල තුළ එහි ද්‍රවශීලතාව කිසිවිටක අමාරුවේ නොදමයි.

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට වත්කම් සහ වගකිම් කමිටුව විසින් විධිමත් ද්‍රවශීලතා තත්ත්වය විශ්ලේෂණය සහ නියාමනය සහ වෙළෙඳපොල පිවිසීම පවත්වා ගැනීම ඇතුළත්ය. නිතිපතා මුදල් ප්‍රවාහ පුරෝකථන. ද්‍රවශීලතා අනුපාත, සහ කල්පිරීමේ පරතර විශ්ලේෂණ මෙම අරමුණ සඳහා විශ්ලේෂණාත්මක මෙවලම් භාවිතා කෙරේ. ද්‍රවශීලතා සහ අරමුදල් අවදානම ද්‍රවශීලතා ආවරණ අනුපාතය සහ ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය ඇතුළුව මිණුම් රාශියක් භාවිතයෙන් අගය කරනු ලැබේ. ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ පිළිබඳ වැඩි විස්තර සඳහා 263 සිට 266 දක්වා පිටුවල අවදානම් කළමනාකරණ වාර්තාව බලන්න.

## මූල්‍ය කාර්යසාධන දැක්ම

ණය ශ්‍රේණිගතකරණය සඳහා අවදානම සමඟ මූල්‍ය සම්පිණ්ඩනය ගැටළුවක්ව පැවතියද, ස්ථිර ආයෝජනවලින් ඉහළ විභවතාව. ගෝලීය වර්ධනය තුළ විශ්වාසය නැවත ඇතිවීම සහ දේශපාලන ස්ථාවරත්වය සමඟ 2020 දී ශ්‍රී ලංකාව තුළ තත්‍ය දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය 3.5% දක්වා මධ්‍යස්ථ වර්ධනයක් අපි බලාපොරොත්තු වෙමු. ශ්‍රී ලංකා මහ බැංකුව යම් කාලයක් සඳහා පොළී අනුපාත ස්ථාවරව තබාගනු ඇති බව අපි විශ්වාස කරමු.

මෙම උපකල්පන අනුව සහ ප්‍රධාන දේශපාලන, සාර්ව ආර්ථික, හෝ නියාමන සංවර්ධනයන් හැර, 2020 දී අපගේ ණය සහ තැන්පතු වර්ධනය ඉහළ නංවා ගැනීමට අපි අපේක්ෂා කරමු. අපගේ ශුද්ධ පොළී ආන්තිකය ණය සහ අත්තිකාරම් කළඹ පුළුල්වීම හා පොලී අනුපාතයේ හැසිරීම හේතු කොට ගෙන ඉදිරි වසරේ සුළු වශයෙන් වර්ධනය විය හැක.

මෙහෙයුම් පිරිවැය මනාව පාලනය කර පවත්වා ගන්නා අතර. අපගේ මෙහෙයුම් කළඹ පසුගිය වසරේ සිට වර්ධනය කළ යුතු අතර, SLFRS 9 හි බලපෑම හේතුවෙන් උච්ඡාවචනය වැඩි කරන අතර අපි ස්ථාවර ණය අලාභ අනුපාතයක් පවත්වාගෙන යාමට අපේක්ෂා කරමු. අපගේ ප්‍රාග්ධන අනුපාතය නියාමන අවශ්‍යතාවයන්ට ඉහළින් පවතිනු ඇති අතර, එය අපගේ වර්තමාන ලාභාංශ ආවරණ අනුපාතය පවත්වා ගැනීමට අපට ඉඩ දෙනු ඇත. අවසාන වශයෙන්. අපගේ සාමාන්‍යකරණය ලද ස්කන්ධය මත ඉපයීම් ද 2020 දී තරමක වර්ධනය කරගත යුතුය.


එසේවුවත්, මෙම වැඩපිළිවෙල කොවිඩ් 19 පැතිරීම සමඟ වෙනස්වී ඇත. මෙම රෝගය ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO), විසින් වසංගයක් ලෙස ලොව පුරා බලපෑම් කරන බවට ප්‍රකාශයට පත් කර ඇති අතර මෙමඟින් බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රය ඇතුළුව ශ්‍රී ලංකා ආර්ථිකය වැඩි පිඩනයක් නිර්මාණය කරනු ඇත. වැඩිදුර විස්තර ණිමෙහෙයුම් පරිසරය□යටතේ පිටු අංක 34 හි බැලිය හැකිය.



| මූලික කාර්යසාධන දර්ශකය | 2019 කාර්යසාධනය | 2020 දැක්ම | මධ්‍ය කාලයේ සිට දිගු කාලීන ඉලක්ක |
|---|---|---|---|
| ස්කන්ධය මත ඉපයීම | **15.32%** | ඉලක්කයට අනුකූලව | 10.0% – 12.5% |
| ශුද්ධ පොළී ආන්තිකය | **2.63%** | ඉලක්කයට අනුකූලව | 2.5% – 3.0% |
| තැන්පතුවල වර්ධනය | **21.1%** | ඉලක්කයට අනුකූලව | 10.0% – 12.0% |
| පොළී ආදායමේ වර්ධනය | **7.4%** | ඉලක්කයට අනුකූලව | 11.0% – 11.5% |
| සමස්ථ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය | **14.35%** | අවම නියාමන අවශ්‍යතාවයට ඉහළව | අවම නියාමන අවශ්‍යතාවයට ඉහළව |
| ආදායමට පිරිවැය අනුපාතය | **49.35%** | ඉලක්කයට අනුකූලව | 53% – 54% |

# ප්‍රධාන ව්‍යාපාරික කටයුතු පිළිබඳ සමාලෝචනය

## ශාඛා බැංකුකරණය



### නිෂ්පාදන සහ සේවා

තැන්පතු භාර ගැනීම, පාරිභෝගික ණයදීම, බැංකු ඇපවීම්, කාඩ්පත් විසඳුම් සහ ගනුදෙනුකාර බැංකුකරණය ඇතුළුව පුළුල් පරාසයක සේවා ලබාදීම.

### ගනුදෙනුකරුවන්

ස්වභාවික පුද්ගලයින් සහ නෛතික පුද්ගලයින්.

### බෙදාහැරීමේ මාර්ග

ශාඛා, ස්වංයක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATMs), තැපැල් කාර්යාල. උප තැපැල් කාර්යාල, (CDM/ CRM) මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර, මාර්ගගත බැංකුකරණය. දුරකථන, ඇමතුම් මධ්‍යස්ථානය සහ අතින් දරන POS යන්ත්‍ර,

### මෙහෙයුම් පරිසරය

- පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පසු අඩු වූ ආර්ථික කටයුතු
- අනෙකුත් මූල්‍ය ප්‍රතිපත්ති පහසු කිරීමේ තීරණ සහ සම්බන්ධිත තැන්පතු සහ ණයදීම මත පනවනලද පොලී මට්ටම
- ණය වර්ධනයේ පහත වැටීම

### අවදානම සහ අභියෝග

- අඛණ්ඩව වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීම
- ඉතුරුම් මිශ්‍රණය වැඩිකරමින් අඩු පිරිවැය අරමුදල් සංචලනය කිරීම
- පොලී ආදායම සහ පොලී ආන්තිකය මත ඇති කරන පොළී අනුපාතයේ බලපෑම
- වෙළෙඳපොල කොටස අඩුවීම
- ග්‍රාමීය අංශයේ තැන්පතු ක්‍රමයෙන් බිම් මට්ටමේ මූල්‍ය සමාගම් කරා විතැන්වීම
- අවම කාඩ්පත් සහ විනිවිදයාමේ මට්ටම
- රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම අනිවාර්ය අවශ්‍යතාවයක් වීම හේතු කොට ගෙන ඇතිවූ සීමිත අවස්ථාවන්

### උපායමාර්ගික අවධානිත ක්ෂේත්‍ර

- අපගේ ගනුදෙනුකරුවන් රඳවා ගැනීම සහ නව ගනුදෙනුකරුවන් අත්කරගැනීම කෙරෙහි අවධානය
- සම්බන්ධතා අපගේ හරය ලෙස අවධානය යොමු කිරීම හේතුවෙන් නිෂ්පාදන අවධානයේ සිට ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ජීවිතයේ අදියරයන් තුළින් සේවය කිරීමේ පදනමට යොමුවීම
- ශුද්ධ පොළී ආදායම සහ ගනුදෙනු සංඛ්‍යාව කෙරෙහි ශක්තිමත් අවධානය
- ණය ප්‍රතිපත්තිය ආරක්ෂා කිරීම සහ අයකරගැනීම සහ හානිකරණ කෙරෙහි අවධානය
- පිරිවැය කාර්යක්ෂමතා ඉදිරියට ගෙනයාම
- සමහර වර්ගවල සැලකිය යුතු වර්ධනයක් සමඟ වෙළෙඳපොළ කොටස පවත්වා ගැනීම

### 2019 වසරේදී වූ ප්‍රධාන සංවර්ධනයන්

- ශාඛා සහ තැපැල් ජාලය තුළින් රු. බිලියන 171.4 ක මේ දක්වා ඉහළම තැන්පතු සංචලනය අත් කර ගැනීම
- නව ශාඛා 1ක් විවෘත කිරීම සහ CRMs යන්ත්‍ර 26ක් වසර තුළ ස්ථාපනය කරන ලදි.
- නව ගනුදෙනුකරුවන් 13,000කට වඩා පිරිසක් අන්තර්ජාල බැංකුකරණය සඳහා එකතු කර ඇත.
- DMS ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
- "සිහින මාලිගා" නමින් විදේශගත ශ්‍රමිකයින් සඳහා විශේෂ ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී
- "NSB E-conect ඕනෑම වේලාවක සම්බන්ධ කරයි" යන තේමාව සමඟ ප්‍රතිචාරාත්මක අන්තර්ජාල බැංකුකරණ යෙදුම හඳුන්වා දෙන ලදී.
- ග්‍රාමීය මට්ටමේ තැන්පතු වැඩි කිරීමට ප්‍රාදේශීය කළමනාකරුවන්ගේ අධීක්ෂණය යටතේ තැපැල් බැංකුකරණ අංශය ශක්තිමත් කිරීම
- අන්තර්ජාල බැංකුකරණ යෙදුම සඳහා ලංකා පේ නිෂ්පාදන හඳුන්වාදීම (රේගුබදු ගෙවීම, ආයෝජන මණ්ඩලයට කරන ගෙවීම්, සෘජු ණය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට කරන ගෙවීම්)
- අලාභ ලබන ශාඛා 54%කින් අඩුකිරීම
- යෞවනයන් ඉලක්ක කරගත් ප්‍රාර්ථනා ප්ලස් ඉතුරුම් නිමැවුම යළි අළුත් කිරීම
- රු. මිලියන 7.5 දක්වා කාර්ය මණ්ඩල නිවාස ණය මුදල වැඩිකරන ලදී
- හර කාඩ්පත් සම්බන්ධයෙන් ආරක්ෂාව ශක්තිමත් කිරීම පිණිස (PCIDSS) ගෙවීම් කාඩ් ක්ෂේත්‍රයේ දත්ත ආරක්ෂක ප්‍රමිතිය) සහතිකකරණය ලබාගන්නා ලදී.
- අක්‍රීය ණය අයකරගැනීමේ මාසය ලෙස මාර්තු මාසය ප්‍රකාශයට පත්කරමින් ණය අයකරගැනීම කඩිනම් කරන ලදී
- EMV චිපය මෙන්ම හඝ්‍ය තාක්ෂණය සහිත හර කාඩ්පත් හඳුන්වාදීම

### මූලික කාර්යසාධන දර්ශක (KPIs)

- තැන්පතුවල 21.1% ක වර්ධනය
- තැපැල් කාර්යාලවල තැන්පතු සංචලනය 168.9% කින් වර්ධනය
- පාරිභෝගික ණයවල 15%ක වර්ධනය
- 2018 දී 9.58% ක්ව තිබූ තැන්පතුවල වෙළෙඳපොළ කොටස මෙම වසරේදී 10.75% ක් දක්වා වර්ධනය වීම.
- 1.5%ක දළ අක්‍රීය ණය අනුපාත බැංකු ක්ෂේත්‍රයේ සාමාන්‍ය අනුපාතය වන 4.7%ට වඩා අඩුවීම

### ඉදිරි ගමන්මග

- ඩිජිටල් පාරිනාමනය වේගවත් කිරීම සහ ඩිජිටල් හැකියාවන් හි ආයෝජනය
- ඉහත සඳහන්කළ ආරක්ෂණ ලක්ෂණ සමඟ ස්වයං සේවා මාර්ග කෙරෙහි ඩිජිටල් ගනුදෙනුකාර අත්දැකීම වර්ධනය කිරීම
- සාර්ව-ආර්ථික ස්ථාවරත්වය වැඩිදියුණු කිරීම සහ ණය වර්ධනයක් යළි අත්කර ගැනීම
- පහත වැටුණ වෙළෙඳපොල කොටස අත්කරගැනීම
- මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉදිරියට ගෙන යාමට පිරිවැය ප්‍රශස්ථකරණ උපායමාර්ගයන් සහ තාක්ෂණයේ උපකාර කිරීම් ලබා ගැනීම

### ඉලක්ක

- හඳුනාගත් අංශ/නිෂ්පාදන තුළ ඉලක්කගත වර්ධනය අත්කර ගනිමින් වෙළෙඳපොල කොටස පවත්වා ගැනීම
- අඩු පිරිවැය අරමුදල් සහ ග්‍රාමීය තැන්පතු වැඩි කිරීම
- අංක දෙකේ වර්ධනයකින් පාරිභෝගික ණය කළඹ වැඩි කිරීම
- බැංකු ක්ෂේත්‍රයේ සාමාන්‍ය අනුපාතයට වඩා අඩුවෙන් පාරිභෝගික ණයවල අක්‍රීය ණය අනුපාතය කළමනාකරණය කිරීම

# ආයතනික ණය



## නිෂ්පාදන සහ සේවා

- මූල්‍ය ආයතන සහ ඒවායේ පරිපාලිත සමාගම්වලට සෘජු ණයදීම
- මූල්‍ය පහසුකම් ව්‍යුහගතකරණය
- (සේවාදායකයින් සඳහා ව්‍යුත්පන්න නිෂ්පාදන)
- ණය දෙන්නන් සහ ණය ගන්නන් අතර ගනුදෙනු සම්බන්ධීකරණය හා පියවීම් සිදු කරන සම්මේලන/ඒකාබද්ධ පහසුකම් සඳහා නියෝජිත කාර්යභාරයන් ඉටුකරයි
- භාර සහතික, පුද්ගලික කොටස් නිකුතු සහ ණයකරවල ආයෝජනය කිරීම
- යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා අරමුදල්කරණය තුළ ක්ෂේත්‍රයේ ප්‍රවීනත්වය
- ණය සුරැකුම්පත් නිකුතුව

## ගනුදෙනුකරුවන්

ආයතනික, රජයට අයත් ව්‍යවසාය, මූල්‍ය ආයතන, සහ පුද්ගලික ආයතන, මධ්‍යම පරිමාණයේ ව්‍යවසායකයින්

## බෙදාහැරීමේ මාර්ග

සෘජු ප්‍රවේශය

## මෙහෙයුම් පරිසරය

- සාර්ව-ආර්ථික මූලධර්ම දුර්වලවීම සහ අඩු ආර්ථික වර්ධනය
- ඉදිකිරීම, සංචාරක කර්මාන්තය සහ කෘෂිකර්මය වැනි සමහර අංශ මන්දගාමී වීම
- ආයෝජකයින්ගේ විශ්වාසය සහ ප්‍රාග්ධන ගලායාම් අඩුවීම
- අපේක්ෂිත ණය වර්ධනය අඩුවීම

## අවදානම් සහ අභියෝගයන්

- ණය ඉල්ලුම තුළ මධ්‍යම මට්ටමක පැවතීම
- වෙළෙඳපොළ ද්‍රවශීලතාවයේ පැවති උච්ඡාවචනය
- අක්‍රිය ණය වැඩිවීමේ විභවතාව
- රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම අනිවාර්ය අවශ්‍යතාවයක් හේතු කොට ගෙන ඇති වූ සීමිත අවස්ථාවන්

## උපායමාර්ගික අවධානිත ක්ෂේත්‍ර

- නව සේවාදායකයින් අත්කරගැනීම
- ගාස්තු පදනම් ආදායම් උත්පාදන කටයුතු කෙරෙහි අවධානය
- ඉහළ අවදානම් ආවරණ අංශයන් කෙරෙහි විමසිල්ලෙන් සිටීම තුළින් ඉහළ වර්ධන වාණිජකරන හැකියාවන් සහිත ක්ෂේත්‍ර කෙරෙහි අවධානය (විදුලිබලය, උපයෝගිතා, යටිතල පහසුකම්, පුනර්ජනනීය බලශක්තිය, හරිත ව්‍යාපාර සහ මූල්‍ය ආයතන)
- ශ්‍රී ලංකාව තුළ අපගේ පියසටහන් පුළුල් කිරීම සඳහා සම්බන්ධතාව ශක්තිමත් කිරීම සහ හවුල්කරුවන් උත්තේජනය කිරීම
- ණයවල ගුණාත්මකභාවය කළමනාකරණය කිරීම
- මිල ආකෘති නිවැරදි කිරීම සහ ප්‍රාග්ධනය බෙදීම ප්‍රශස්ථ ලෙස සිදු කිරීම

## 2019 දී වූ ප්‍රධාන සංවර්ධනයන්

- රු. බිලියන 20.2ක ණයකර සාර්ථකව නිකුත් කිරීම
- වසර තුළ ව්‍යාපෘති මූල්‍යකරණය යටතේ ආයතනික ගනුදෙනුකරුවන්ට රු.බිලියන 20.0ක පමණ ණය මුදලක් ලබාදීම
- අනෙකුත් මූල්‍ය සේවා ආයතනවලට ණයදීම තුළින් කෘෂිකර්මය සහ සුළු හා මධ්‍ය පරිමාණ අංශයට සහයවීම සඳහා රු. බිලියන 10.0 ක ණය මුදලක් ලබාදීම
- යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති දියත් කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය වෙත රු. බිලියන 7.5 ක ණය මුදලක් ලබාදීම
- ගුවන් තොටුපල සහ ගුවන් සේවා සමාගම විසින් නිකුත් කළ ණයකරවල රු. බිලියන 4.0 ක් ආයෝජනය කිරීම

## මූලික කාර්යසාධන දර්ශක (KPIs)

- ආයතනික ණය ලබාදීම 14.87%කින් වර්ධනය
- ආයතනික මූල්‍ය මෙහෙයුම්වලින් ජනිත වූ ගාස්තු පදනම් ආදායමෙහි 11.5%ක වර්ධනය
- අක්‍රීය ණය අනුපාතය – 0%

## ඉදිරි ගමන්මග

- ණයවල කළඹෙහි ගුණාත්මකභාවය සුරක්ෂිත කිරීම
- ක්‍රියාවලි වැඩි දියුණු කිරීම සහ ස්වයංක්‍රීයකරණය
- වෙළෙඳපොල ප්‍රවණතා නියාමනය කිරීමෙන් දූරදර්ශී ණයදීමේ ප්‍රවේශය
- ඉහළ වර්ධනයක් ඇති මුත් අඩු සිට මධ්‍යම ප්‍රමාණයේ අවදානම් ආකෘති ඇති අංශ සඳහා ණය ලබාදීම
- යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා ණය දීම තුළින් රජයේ මූල්‍යයන කටයුතු වලට සහයවීම

## ඉලක්ක

- මැදි තනි අංකයේ වාර්ෂික වර්ධනයක් අත්කර ගනිමින් ගාස්තු පදනම් ආදායම් වැඩි කිරීමට දායකවීම
- පවත්නා අපේක්ෂිත මට්ටමින් අක්‍රීය ණය අනුපාතය පවත්වාගෙන යාම

# ජාත්‍යන්තර බැංකුකරණය



## නිෂ්පාදන සහ සේවා

- USD, EUR, GBP, AUD සහ JPY යන විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු (ඉතුරුම් සහ ස්ථාවර තැන්පතු)
- ආමුඛ සහ ප්‍රතිමුඛ ප්‍රේෂණ
- විදේශ ව්‍යවහාර මුදල් හුවමාරුව
- ආනයනය ණයවර ලිපි නිකුතුව
- ආනයන බිල්පත් සම්බන්ධව කටයුතු හැසිරවීම
- නෞහාර සහ ගුවන් ඇප නිකුත් කිරීම

## ගනුදෙනුකරුවන්

ශ්‍රී ලංකාවේ සේවාසික පුද්ගලයන්, රටින් බැහැර ශ්‍රී ලංකාවේ පදිංචිකරුවන්, ශ්‍රී ලංකාව තුළ පදිංචි විදේශකයින්.

## බෙදාහැරීමේ මාර්ග

ශාඛා, මාර්ගගත බැංකුකරණය. අනුරූප බැංකු, විදේශ විනිමය හුවමාරු ආයතන, ලොව්වටා මුදල් හුවමාරු සමාගම, යුරෝගිරෝ තැපැල් ජාලය, සහ විදේශිය නියෝජිතයින් සහ දුරකථන සහ ඇමතුම් මධ්‍යස්ථානය

## මෙහෙයුම් පරිසරය

- ගෝලීය වෙළෙඳ කටයුතුවල මන්දගාමී විම
- ආනයන අධෛර්යමත් කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග
- ප්‍රධාන වෙළඳපොළ මූලාශ්‍ර (උදා: මැද පෙරදිග) වලින් විදේශ විනිමය ඉපයීම් පහත වැටීම
- විවිධ ඩිජිටල් තාක්ෂණික සමාගම් සහ වෙනත් මුදල් හුවමාරු කරන ආයතනවල වර්ධනය

## අවදානම සහ අභියෝග

- ශුද්ධ පොළී ආන්තිකය පහත වැටීම
- වෙළෙඳපොල තුළට මූල්‍ය නොවන ආයතන ඇතුළත්වීම

## උපායමාර්ගික අවධානිත ක්ෂේත්‍ර

- ප්‍රේෂණ සඳහා ප්‍රධාන වෙළෙඳපොල තුළ වෙළෙඳපොල විනිවිදයාම සහ වෙළෙඳපොල සංවර්ධනය
- මැදපෙරදිග වෙළෙඳපොල කෙරෙහි යැපීම අඩු කිරීමට වෙනත් වෙළෙඳපොළ වල් සොයා බැලීම
- රජයේ ආයතන/ වෘත්තීය සමිති/නව මෝටර්රථ අලෙවිකරුවන් සමග ඇති වැඩපිළිවෙල තුළින් බැංකුවට අවසර දී ඇති වෙළෙඳ සේවා සඳහා වෙළෙඳපොල ප්‍රවේශය
- ගාස්තු පදනම් ආදායම වැඩි කිරීම

## 2019 දී වූ ප්‍රධාන සංවර්ධනයන්

- රු. බිලියන 40.1 ක විදේශීය ප්‍රේෂණ වාර්තා කිරීම
- නියම කර ඇති මූල්‍ය ඉලක්ක ඉක්මවායාම
- එමිරේට්ස් NBD බැංකුව PJSC (UAE) සහ අර්ස්ට් සමූහ බැංකුව AG (ඔස්ට්‍රියා) මෙන්ම G-money Trans Co Ltd (කොරියාව) සමග විදේශ විනිමය හුවමාරු ආයතන සමග නව අනුරූප බැංකු සම්බන්ධතා ස්ථාපිත කිරීම
- මාසිකව පොළී ගෙවන විදේශ ව්‍යවහාර මුදලින් ක්‍රියාත්මක වන මාස 12 ස්ථාවර තැන්පතු හඳුන්වාදීම
- CAD (කැනේඩියන් ඩොලර්), SGD (සිංගප්පූරු ඩොලර්), CHF (ස්විස් ෆ්‍රෑන්ක) සහ AED (එක්සත් අරාබි එමීර් රාජ්‍ය දිරාම්) වලින් විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පවත්වා ගැනීමට ගනුදෙනුකරුවන්ට හැකිවීම

## මූලික කාර්යසාධන දර්ශක (KPIs)

- රු. බිලියන 11.86 ක් සහිත විදේශීය ව්‍යවහාර මුදලින් ක්‍රියාත්මක තැන්පතුවල 9.1%ක වර්ධනය අත්කර ගැනීම
- රු. මිලියන 79 ක් අත්කර ගනිමින් රු.මි. 30 ක් වන ගාස්තු පදනම් ආදායම් ඉලක්කය ඉක්මවීම
- 3.29% දක්වා පදනම් ලක්ෂයන් 22 කින් ප්‍රේෂණවල වෙළෙඳපොල කොටස වැඩිවීම

## ඉදිරි ගමන්මග

- මෙහෙයුම් විශිෂ්ඨත්වය – (උදා: කාර්යක්ෂම මුදල් හුවමාරුව)
- ඉහළ වර්ධිත ප්‍රෙෂණ වෙළඳපළක් කරා ව්‍යාප්ත කිරීම
- අපනයන වෙළෙඳ මූල්‍ය ව්‍යාපාරයට වඩාත් නැඹුරුවිම
- ගනුදෙනුකාර අත්දැකීම වැඩිදියුණු කිරීම

## ඉලක්ක

- විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු හා ප්‍රේෂණවල අංක දෙකේ ප්‍රතිශත වර්ධනයක් කරා ලගාවීම
- ප්‍රේෂණ වෙළෙඳපොල තුළ වෙළෙඳපොල කොටස වැඩිදියුණු කිරීම

# භාණ්ඩාගාරය



## නිෂ්පාදන සහ සේවා

- රජයේ සුරැකුම්පත්වල ආයෝජනය, හිමිකම් සහ විදේශ විනිමය ප්‍රතිමිලදී ගැනීම් මඟින් ණය ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ණය දීම

## ගනුදෙනුකරුවන්

මූල්‍ය ආයතන. මූල්‍ය නොවන ආයතන, පුද්ගලයින් හා රාජ්‍ය ව්‍යවසායන්

## බෙදාහැරීමේ මාර්ග

ඍජු පිවිසීම. මාර්ගගත වෙළෙඳ අවකාශ.

## මෙහෙයුම් පරිසරය

- වෙළෙඳපොල ද්‍රවශීලතාවයෙහි පැවති උච්ඡාවචනය
- වෙළෙඳපොල තුළ ඌණ ද්‍රවශීලතාවයන්
- පොළී අනුපාත අඩු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව ගත් ක්‍රියාමාර්ග
- රජයේ සුරැකුම්පත්වල අඩු ඉපයීම්
- රජයේ සුරැකුම්පත් වෙළෙඳපොලින් ආයෝජන ගලායෑම

## අවදානම සහ අභියෝග

- වඩා අඩු පොළී අනුපාතයක් යටතේ රජයේ සුරැකුම්පත්වල ප්‍රති ආයෝජනය
- ද්‍රවශීලතාව හා ආයෝජනය කළමනාකරණය
- ගනුදෙනුකරුවන්ගේ තැන්පතු භාවිතා කරමින් අනිවාර්ය අවශ්‍යතාවයක් වන රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කිරීම හා ණයදීම අතර සමතුලිතතාවයක් ඇති කිරීම
- රජයේ සුරැකුම්පත් සඳහා ද්විතියික වෙළෙඳපොල තුළ ක්‍රියාකාරිත්වය

## උපායමාර්ගික අවධානිත ක්ෂේත්‍ර

- ස්ථිර ආදායම හා ප්‍රතිඵල ප්‍රශස්ථ කිරීමට සහ සුරැකුම්පත් කළඹ නැවත හැඩගැස්වීම
- ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයක් වන රජයේ සුරැකුම්පත්වල ආයෝජනය පවත්වා ගැනීම

## 2019 දී වූ ප්‍රධාන සංවර්ධනයන්

- මාර්ගගත මුදල් කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම
- ඇළුඩො මිලියන 250ක ජ්‍යෝෂ්ඨ බැඳුම්කරය එහි කල්පිරීමේ දිනයට සාර්ථකව ගෙවා නිරවුල් කරන ලදී

## මූලික කාර්යසාධන දර්ශක (KPIs)

- තැන්පතුවලින් රජයේ සුරැකුම්පත් ආයෝජන අනුපාතය 60.9% ක ප්‍රශස්ථ මට්ටමේ පවත්වා ගැනීම
- මුළු පොළී ආදායමෙන් 48.50%ක් රජයේ සුරැකුම්පත්වල පොළී ආදායමෙන් දායකවීම
- රජයේ සුරැකුම්පත්වලින් ඉපයීම් 10.8%ක ස්ථාවර මට්ටමක පැවතීම

## ඉදිරි ගමන්මග

- ගෝලීය සිදුවීම්වල සංවර්ධනයන්ගේ බලපෑම, රුපියලේ අගය කෙරෙහි බලපෑම,
- දේශීය හා විදේශීය සිදුවීම්වල බලපෑම, වෙළඳපොළ තුළ ආයෝජන හා ප්‍රාග්ධන ප්‍රවාහ හා ආයෝජකයින්ගේ විශ්වාසය ඇති කරන ප්‍රතිපත්ති වල බලපෑම
- බැංකුවේ ශේෂ පත්‍රයේ කල්පිරීම් නොගැලපීම අවම කිරීම පිණිස ඵලදායී ද්‍රවශීලතා කළමනාකරණය කෙරෙහි අවධානය
- නව ක්‍රම සහ ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම තුළින් ඉදිරි-මධ්‍යම-පසු පෙළ කාර්යාලවල මෙහෙයුම් අනර්ඝත්වය

## ඉලක්ක

- රාජ්‍ය බැඳුම්කරවල ආකර්ෂණීය වෙළඳ විකුණුම් අවස්ථාවලින්, හිමිකම් කොටස් වලින්, බැංකුවේ ශේෂපත්‍රය තුළ ඇති විදේශ විනිමය වෙළඳ ගනුදෙනු වලින් ප්‍රශස්ත ප්‍රතිඵල ලැබීම
- උපරිම ප්‍රතිලාභ සඳහා සංචලනය කරගත් අරමුදල් යෙදවීම සහ ආයෝජනය

# නිෂ්පාදිත ප්‍රාග්ධනය

**බැංකුවේ භෞතික සහ ඩිජිටල් යටිකල පහසුකම් ඇතුළත්වන නිෂ්පාදිත ප්‍රාග්ධනය වැදගත් වටිනාකම් ධාවකයෙකි. අපි අඛණ්ඩව උසස් තත්ත්වයේ වත්කම් පදනමක් සංවර්ධනය කිරීමට අඛණ්ඩව උත්සාහ ගන්න අතර ඒ තුළින් සුවිශේෂී තරඟකාරී වාසියක් ලබා දේ.**

## එයට ඇතුළත් දෑ

බැංකුවේ නිෂ්පාදිත ප්‍රාග්ධනය භෞතික සහ යටිතලපහුසකම්වලින් සමන්විත වන අතර, එය අපට ගනුදෙනුකරුවන් කරා ළඟාවීමට සහ මෙහෙයුම් අනර්ඝත්වය අත්කර ගැනීමට සහය වේ. මෙය දේපළ, පිරියත, උපකරණ සහ ශාඛා ජාලය, ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර ජාලය. තොරතුරු තාක්ෂණ ක්‍රම සහ මෘදුකාංග සහ අනෙකුත් ඩිජිටල් මාර්ග ඇතුළත් යටිතලපහුසකම්වලින් සමන්විත වේ.

- **භෞතික යටිතල පහසුකම්:**
  දේපළ, පිරියත, උපකරණ සහ ශාඛා ජාලය, ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර ජාලය. CRMs, වාණිජ විකුණුම් ඒකක, අත් රඳවන POS යන්ත්‍ර, තැපැල් කාර්යාල සහ උප තැපැල් කාර්යාල සහ mCash විකුණුම්කරුවන්
- **ඩිජිටල් යටිතල පහසුකම්ඨ**
  තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්‍රම, සහ අන්තර් ජාල බැංකුකරණය, වැට් බොක්ස් සහ සමාජ මාධ්‍යවල පැවැත්ම ඇතුළු ඩිජිටල් අවකාශයන්

## යෙදවුම්

- දේපළ, පිරියත සහ උපකරණ – රු.මි. 14,163
- ප්‍රාග්ධන වියදම – රු.මි. 2.207
- භෞතික පිවිසුම් ස්ථාන
- තත්‍ය පිවිසුම් ස්ථාන/ඩිජිටල් මාර්ග
- ඩිජිටල් යටිතල පහසුකම්

## වටිනාකම් එකතු කරන ආකාරය

නිෂ්පාදිත ප්‍රාග්ධනයේ විධිමත් කළමනාකරණය සම්බන්ධතා ශක්තිමත් කරන අතර, එය ප්‍රශස්ථ පිවිසීම සහ සුපිරි ගනුදෙනුකාර අත්දැකීම ලබාදෙමින් ස්වයං සේවා මාර්ග තුළින් පහසුවෙන් පිවිසීමට ගනුදෙනුකරුවන්ට හැකියාව ඇති කරයි. මෙම ප්‍රාග්ධනය සෘජුවම මෙහෙයුම් කාර්යක්ෂමතාවයට, පිරිවැය පහළ දැමීමට, ලාභදායිතා වර්ධනයට සහ බැංකුවේ තිරසාර වර්ධනයට දායක වේ.


## අපගේ ප්‍රවේශය

නිෂ්පාදිත ප්‍රාග්ධනය තුළ ආයෝජනය බැංකුවට එහි ක්‍රමෝපාය ලබාදීමට ඇති හැකියාව සහතික කිරීම සඳහා අඛණ්ඩ සහ කරගෙන යන ක්‍රියාවලියකි. නිෂ්පාදිත ප්‍රාග්ධනය තුළ යම් ආයෝජනයක පිළිබඳ තීරණය කිරීමේ ප්‍රධාන සාධකය වන්නේ බැංකුවේ ක්‍රමෝපායික පරමාර්ථ අත්කර ගැනීම සඳහා පිරිනමන වටිනාකමයි. උසස් තත්ත්වයේ වත්කම් පදනමක් සංවර්ධනය කිරීමට අපි උත්සාහ ගනිමු. ඒ තුළින් සුවිශේෂී තරඟකාරී වාසියක් ලබාදෙන අතර එය බැංකුවේ දිගුකාලීන වර්ධන අපේක්ෂාවන් සුරක්ෂිත කරයි. සියලුම වත්කම් සෑමවිටම වැඩි කාලය හෝ නැවත කිරීම ඉවත් කිරීම සඳහා ප්‍රශස්ථ මට්ටමක පවත්වාගන්නා බව අපි සහතික කරමු.

## 2019 සඳහා ප්‍රධාන අභියෝග සහ අවස්ථාවන්

**ප්‍රධාන අභියෝග** →

- අඛණ්ඩව වෙනස්වන ගනුදෙනුකාර වරණය
- අඛණ්ඩ ආයෝජනය සහ ව්‍යාපෘතිවල මූල්‍ය හැකියාව අවශ්‍යවීම
- භූගෝලීය පැවැත්ම පුළුල්කිරීමේ සීමාවන්
- තොරතුරු පද්ධති ආරක්ෂාව
- නව තාක්ෂණය කරා සමහර ගනුදෙනුකරුවන්ගෙන් ප්‍රතිරෝධය



**අවස්ථා**

- අපගේ මෙහෙයුම් කාර්යක්ෂමතාව වර්ධනය
- අපගේ බැංකුවේ ඵලදායිතාව ඉහළ නැංවීම
- ගනුදෙනුකාර අත්දැකීම ඉහළ නැංවීම
- ක්‍රමෝපායික වෙනස්කරුවෙක් ලෙස අපගේ ඩිජිටල් හැකියාව භාවිතය
- ඩිජිටල් බැංකුකරණයට වේගවත් පරිනාමයක් ඇති කිරීම
- අප ආයතනයේ කඩිසරකම ශක්තිමත් කිරීම

## නිෂ්පාදිත ප්‍රාග්ධනයේ වටිනාකම ඉහළ නැංවීමේ උපාය මාර්ග

- අපගේ දිගුකාලීන වර්ධන අපේක්ෂාවන් සඳහා සුවිශේෂී තරඟකාරී වාසියක් ලබාදෙන උසස් මට්ටමේ වත්කම් පදනමක් සංවර්ධනය කිරීම
- සියලුම වත්කම් සෑමවිටම වැඩි කාලය හෝ නැවත කිරීම ඉවත් කිරීම සඳහා ප්‍රශස්ථ මට්ටමක පවත්වාගන්නා බව සහතික කිරීම
- පිරිවැය අඩු කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රාග්ධන ව්‍යාපෘති
- ගනුදෙනුකාර අත්දැකීම වැඩි කිරීමට සහ ගනුදෙනුකාර පිවිසීම පුළුල් කිරීමට ඩිජිටල් හැකියාවන් තුළ ආයෝජනය
- නව භෞතික ශාඛාවන් සහ ඩිජිටල් මාර්ග විවෘත කිරීම අතර ගැලපීම
- වඩාත් ක්‍රමෝපායික ස්ථාන වෙත තෝරාගත් ශාඛා නැවත ස්ථානගත කිරීම
- තොරතුරුවල ආරක්ෂාව ශක්තිමත් කිරීම
- මෙහෙයුම් අනර්ඝත්වය උපරිම කිරීමට ඉදිරිපෙළ සහ පසු පෙළ මෙහෙයුම් ස්වයංක්‍රීයකරණය

## ප්‍රමාණාත්මක කරුණු


## අදාළ ඇල්මැති පාර්ශ්වකරුවන්

## කෙටි හා මධ්‍ය කාලීන උපාය මාර්ගික ප්‍රමුඛතා


## නිමැවුම්

- නව අන්තර්ජාල බැංකුකරණ ගනුදෙනුකරුවන් – 17,847
- ශාඛා ජාලය – 256
- ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර – 286
- මුදල් ප්‍රතිචක්‍රීයකරණ යන්ත්‍ර – 48
- තැපැල් කාර්යාල සහ උප තැපැල කාර්යාල 4,063
- එම්කෑෂ් වෙළෙන්දන් – 16,000+
- ICT පද්ධති, ඩිජිටල් අවකාශ සහ මේස සේවය
- සූර්ය කෝෂ ස්ථාපිත ශාඛා – 42

## වටිනාකම් නිර්මාණයේ මූලිකාංග




## වැදගත් සිදුවීම්



| | | | |
|---|---|---|---|
| **256**<br>දිවයින පුරා ශාඛා | 286 ATMs<br>48 CRMs | **450+**<br>අතින් දරන POS යන්ත්‍ර සහ ටැබ් | NSB අයි සේවර්<br>**16,000+**<br>mCash වෙළෙන්දන් |
| **4,063**<br>තැපැල් කාර්යාල සහ උප තැපැල් කාර්යාල | රු. මිලියන 691<br>ඩිජිටල් ප්‍රාග්ධනය තුළ ආයෝජනය | **39**<br>සුහුරු කලාප | |

## මිණුම් දර්ශකය

| | වැඩිවීම (අඩුවීම) | **2019** | 2018 |
|---|---|---|---|
| ශාඛා ගණන | 1 | **256** | 255 |
| සුහුරු කලාප ගණන | 34 | **39** | 5 |
| ATMs ගණන | (2) | **286** | 288 |
| CRMs ගණන | 26 | **48** | 22 |
| දේපළ, පිරියත සහ උපකරණවල ශුද්ධ පොත් වටිනාකම (රු.මි.) | 697 | **14,163** | 13,466 |

## අනෙකුත් ප්‍රාග්ධනයන්ට සම්බන්ධතාව

නිෂ්පාදිත ප්‍රාග්ධනය බැංකුවේ එක් එක් ප්‍රාග්ධනයන්ට සහ ප්‍රාග්ධනයන් වෙතින් බලපෑමට ලක්වෙයි.

ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් සහ නව ක්‍රම ක්‍රියාත්මක කිරීම තුළින් අමතර රැකියා, පුහුණුව සහ හැකියාවන් නිර්මාණය පුළුල් කිරීම

කාර්යක්ෂමතාවන් සහ ඵලදායිතා වැඩිදියුණු කිරීම් පිරිවැය අඩුකිරීමකට හේතු වේ



ශාඛා ව්‍යාප්තිය, සන්නාම දෘශ්‍යතාව වැඩි කරයි


නවීන තාක්ෂණය තුළින් කාර්යක්ෂමතා වර්ධනය

බලශක්ති කාර්යක්ෂමතා ගොඩනැගිලි සහ ඩිජිටල් යටිතල පහසුකම්වල ආයෝජනය අඩු බලශක්ති පරිභෝජනය ඇතිකරන අතර කාබන් පාසටහන අඩුකරයි


භෞතික සහ ඩිජිටල් යටිතල පහසුකම් පුළුල් කිරීම තුළින් වැඩිකළ ගනුදෙනුකාර පහසුව, සහ ශක්තිමත් ගනුදෙනුකාර සැපයුම්කාර සම්බන්ධතාව

## විභව සමතුලිතතා

- අපගේ භෞතික ජාලය පුළුල් කිරීම
- අපගේ ඩිජිටල් මාර්ග පුළුල් කිරීම



- ඩිජිටල් තාක්ෂණය සහ යටිතලපහසුකම්වල ආයෝජනය




## තිරසාර සංවර්ධන පරමාර්ථ සඳහා දායකත්වය

1 NO POVERTY — ආර්ථික සම්පත්වලට සමාන හිමිකම් සහ මූල්‍ය සේවා කරා පිවිසීම සහතික කිරීම

12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION — බැංකුකරණ සේවා ඩිජිටල්කරණය තුළින් කඩදාසි අඩුකිරීම සඳහා දායකවීම

7 AFFORDABLE AND CLEAN ENERGY — ශාඛාවල සූර්ය බලශක්තිය ස්ථාපිත කිරීම

10 REDUCED INEQUALITIES — දිවයින පුරා සුහුරු කලාප ඇතුළුව ශාඛා ස්ථාපිත කරමින් පුළුල් ප්‍රජාවකට බැංකුකරණ සේවා පිවිසුම ලබාදීම

13 CLIMATE ACTION — බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලිවල බැංකුකරණ සේවා ඩිජිටල්කරණය තුළ ආයෝජනයන් මගින් කාබන් පියසටහන අඩු කිරීම

11 SUSTAINABLE CITIES AND COMMUNITIES — බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලිවල ආයෝජනය

## අපගේ පැවැත්ම

### අපගේ විස්තීර්ණ බාහිර පැවැත්ම

මූල්‍ය අන්තර්කරණය ප්‍රවර්ධනය කරන බැංකුවක් ලෙස. අපගේ රට තුළ සෑම පළාතක් සහ දිස්ත්‍රික්කයක් ආවරණය කරන අපගේ විස්තීර්ණ ජාලය තුළින් සමාජයේ සෑම කොටසකටම අපි සේවය කරමු. මෙම ජාලය සුපිරි ශාඛා 6ක් ප්‍රාදේශිය කාර්යාල 9ක් ඇතුළත් ශාඛා 256 කින්, තැපැල් කාර්යාල, උප තැපැල් කාර්යාල 4063 කින් සහ විසා සහ මාස්ටර් කාඩ් ණයකාඩ් පහසුකම් සපයන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර/මුදල් ප්‍රතිචක්‍රියකරණ යන්ත්‍ර 334 කින් සමන්විත වේ.

අපි රටපුරා මුදල් තැන්පතු යන්ත්‍ර සහ මුදල් ප්‍රතිචක්‍රියකරණ යන්ත්‍ර ඇතුළුව 4900 වැඩි මුදල් ප්‍රතිචක්‍රියකරණ යන්ත්‍ර සම්බන්ධකරන ගෙවීම් ජාලයක් වන ලංකා පේ පොදු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර දාමයේ කොටසක් වෙමු. ඊට අමතරව. 16,000 කට වැඩි එම් කැෂ් වෙළෙන්දන් සහ අතින් දරන විකුණුම් ස්ථාන (POS) යන්ත්‍ර තුළින් අප කරා පිවිසිය හැකිය.


ශාඛා ලැයිස්තුව පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර අපගේ වෙබ් පිටුව බලන්න.

GRI 102-4, 6

| | ශාඛා | ATM/ CRM | Smart Zone |
|---|---|---|---|
| **උතුරු මැද පළාත** | 15 | 17 | 1 |
| 6. අනුරාධපුර | 12 | 14 | 1 |
| 7. පොළොන්නරුව | 3 | 3 | - |

| | ශාඛා | ATM/ CRM | Smart Zone |
|---|---|---|---|
| **උතුරු පළාත** | 20 | 25 | 4 |
| 1. යාපනය | 14 | 19 | 4 |
| 2. කිලිනොච්චිය | 1 | 1 | - |
| 3. මන්නාරම | 2 | 2 | - |
| 4. මුලතිව් | 2 | 2 | - |
| 5. වව්නියාව | 1 | 1 | - |

| | ශාඛා | ATM/ CRM | Smart Zone |
|---|---|---|---|
| **වයඹ පළාත** | 26 | 35 | 5 |
| 8. කුරුණෑගල | 18 | 22 | 1 |
| 9. පුත්තලම | 8 | 13 | 4 |




| | ශාඛා | ATM/ CRM | Smart Zone |
|---|---|---|---|
| **මධ්‍යම පළාත** | 28 | 34 | 3 |
| 16. මහනුවර | 17 | 21 | 1 |
| 17. මාතලේ | 4 | 5 | 1 |
| 18. නුවරඑළිය | 7 | 8 | 1 |

| | ශාඛා | ATM/ CRM | Smart Zone |
|---|---|---|---|
| **බස්නාහිර පළාත** | 81 | 126 | 23 |
| 10. කොළඹ | 43 | 71 | 13 |
| 11. ගම්පහ | 26 | 39 | 7 |
| 12. කළුතර | 12 | 16 | 3 |

| | ශාඛා | ATM/ CRM | Smart Zone |
|---|---|---|---|
| **නැගෙනහිර පළාත** | 17 | 17 | - |
| 19. අම්පාර | 8 | 7 | - |
| 20. මඩකලපුව | 7 | 8 | - |
| 21. ත්‍රිකුණාමලය | 2 | 2 | - |

| | ශාඛා | ATM/ CRM | Smart Zone |
|---|---|---|---|
| **ඌව පළාත** | 12 | 15 | - |
| 22. බදුල්ල | 6 | 9 | - |
| 23. මොනරාගල | 6 | 6 | - |

| | ශාඛා | ATM/ CRM | Smart Zone |
|---|---|---|---|
| **දකුණු පළාත** | 36 | 41 | 1 |
| 13. ගාල්ල | 13 | 15 | - |
| 14. හම්බන්තොට | 10 | 11 | - |
| 15. මාතර | 13 | 15 | 1 |

| | ශාඛා | ATM/ CRM | Smart Zone |
|---|---|---|---|
| **සබරගමුව පළාත** | 21 | 24 | 2 |
| 24. කෑගල්ල | 10 | 11 | 1 |
| 25. රත්නපුර | 11 | 13 | 1 |

## ප්‍රවර්ධනය කරන ලද අපගේ ප්‍රවේශ මාර්ග

### අපගේ දිවයින පුරා ජාලය තුළින් අපගේ දේශීය පැවැත්ම වැඩි කිරීම

ගනුදෙනුකාර මැදිහත්වීම් සිදු කිරීමේදී සහ අපගේ සන්නාමයට දෘශ්‍යතාවය ලබාදීමේදී ශාඛා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන බැවින් අපගේ නිෂ්පාදිත ප්‍රාග්ධනය පුළුල් කිරීම ක්‍රමෝපායිකව වැදගත් වේ. කෙසේවෙතත්. වෙනස්වන ගනුදෙනුකාර හැසිරීම සමඟ සහ ගනුදෙනුකරුවන් බැංකුකරණය සඳහා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සහ ඩිජිටල් අවකාශ වැනි විකල්ප මාර්ග තෝරා ගැනීම සමඟ, ඵලදායී ආකාරයකින් වෙනස්වන අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දැක්වීමට අපි හැඩගැසෙමින් සිටිමු.

අපගේ දිවයින පුරා භෞතික පිවිසුම් ස්ථාන අපගේ වටිනාකම් නිර්මාණ ක්‍රියාවලියේ ප්‍රධාන වත්කමකි. අපගේ ඩිජිටල් යටිතලපහසුකම් ගොඩනගන අතරම, ක්‍රමෝපායික ස්ථානවල නව ශාඛා එකතු කරමින් අපගේ ශාඛා ජාලය අපි අඛණ්ඩව වැඩි කරමු. 2019 දී, මාකොල ශාඛාවක් විවෘත කළෙමු. ගනුදෙනුකාර අත්දැකීම වැඩි කිරීමට සහ අපගේ සේවකයින් වෙත ප්‍රසන්න සේවා පරිසරයක් ලබාදීමට වසර තුළ ශාඛා නැවත ස්ථානගතකිරීම, පුළුල්කිරීම සහ නවීකරණ අඛණ්ඩව සිදුකරන ලදී. චුන්නාකම්, පිටකොටුව, පුත්තලම, මනිපායි, අතුරුගිරිය, මහබාගේ සහ හාලිඇල ශාඛා නව විශේෂිත ස්ථානවල නැවත ස්ථානගත කරන ලදී. අපගේ කණ්ඩායම් වෙත පහසු සේවා පරිසරයක් ලබාදීම සහ ගනුදෙනුකරුවන්ට සාකල්‍ය ඒකාබද්ධ විසඳුම් පිරිනැමීමට සහයවීම සඳහා සභාපතිවරයාගේ අංශය, ශාඛා කළමනාකරණය, නීති, අවදානම් සහ සුභසාධන ඇතුළුව ප්‍රධාන කාර්යාලයේ අංශ පහක් නවීකරණය කරන ලදී. 2019 අප්‍රේල පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පසු.

යම් ආපදාවලින් හෝ ප්‍රචණ්ඩත්වයකින් ඇති වියහැකි අවදානම්වලින් අපගේ භෞතික වත්කම් ආරක්ෂා කර ගැනීමට ආරක්ෂිත ක්‍රියාමාර්ග ශක්තිමත් කරන ලදී.

### අපගේ ආදර්ශ ශාඛා සංකල්පය සහ ස්වයං බැංකුකරණ කොටස පුළුල්කිරීම

නවීනතම බැංකුකරණ සේවාවන් තුළින් සැම පිවිසුම් ස්ථානයකදීම අපගේ ගනුදෙනුකරුවන්ට ආදර්ශවත් අත්දැකීමක් ලබා දීම සඳහා "ආදර්ශමත් ශාඛාව" සංකල්පය 2017 දී ආරම්භ කරන ලදී. මෙම සංකල්පය යටතේ, ගනුදෙනුකාර පහසුව වැඩි කිරීමට "එන්එස්බී කනෙක්ට්" සන්නාම නාමය යටතේ ඒකාබද්ධ ඩිජිටල් මාධ්‍ය සිග්නේජ් (IDMS) සමඟ ඩිජිටල් බැංකුකරණය සඳහා ඒටීඑම්, සිඩීඑම් සහ සිආර්එම්වලින් සමන්විත නියමිත පරිදි සකස් කළ "සුහුරු කලාපය" ක් ශාඛාවකට ලබා දෙනු ලැබේ. සියලුම සන්නාමකරණය ප්‍රදර්ශක එස් 5 ප්‍රමිතිවලට අනුව සැලසුම් කෙරේ.

2017 දී පළමු සුහුරු කලාපය දියත් කිරීමේ සිට, 2019 වසර අවසානයට 39 දක්වා ගෙනයමින් පසුගිය වසර දෙක පුරා සුහුරු කලාප සංඛ්‍යාව ක්‍රමානුකූලව වැඩි කරන ලදී. අපගේ සැලැස්ම වන්නේ ඉදිරි වසර තුළ නව සුහුරු කලාප 25ක් එකතු කිරීම වන අතර ඒ මගින් 2020 අවසානය වන විට මුළු ගණන 64 දක්වා ඉහළ යනු ඇත.

2019 අවසානයට, සුහුරු කලාප 29ක් අපටම අයත් ගොඩනැගිලිවල ස්ථාපිත කරනු ලැබ ඇති අතර, කල්බදු ශාඛා ගොඩනැගිලිවල සුහුරු කලාප 5ක් ස්ථාපිත කරනු ලැබ ඇත.

| | සුහුරු කලාප |
|---|---|
| 2017 | 2 |
| 2018 | 3 |
| 2019 | 34 |
| 2020 (අපේක්ෂිත) | 25 |

### ආබාධිත පුද්ගලයන් සඳහා පහසුකම් සැලසීම

ආබාධ හෝ භෞතික සීමාවන් සහිත පුද්ගලයින්ගේ සුවිශේෂී අවශ්‍යතාවන්ට අනුව යමින් විවිධ ආබාධ සහිත පුද්ගලයින්ට පිවිසුම් ඇති කරමින්, අපගේ ශාඛාවල ආබාධිතයින්ට පිවිසීම ලබාදීම මගින් යම් අපහසුවක් නොමැතිව අපත් සමඟ බැංකු කටයුතු කිරීම සඳහා පහසුකම් සලසා දී ඇත. ආබාධිත පිවිසුම් දිවයින පුරා ශාඛා 224 කදී සපයනු ලබයි. නව ශාඛා ඉදිකිරීමේදී සහ දැනට පවත්නා ශාඛා නැවත ස්ථානගත කිරීම සහ පුළුල් කිරීමේදී මෙම අවශ්‍යතාව ආමන්ත්‍රණය කිරීමට අපි පියවර ගෙන ඇත.

### බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි

කාලගුණ වෙනස කරා දායකවීම සහ තිරසාර වර්ධනය කරා විතැන්වීම සඳහා අපගේ උත්සාහයන්හිදී, අපගේ ශාඛාවල බලශක්ති කාර්යක්ෂමතාව වැඩි කිරීමට සහ පිරිවැය ඵලදායි බලශක්ති ඉතුරුම් යාන්ත්‍රණ රඳවාගැනීමට ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. බලශක්ති පරිභෝජනය අඩු කිරීමට දායකවන ස්වභාවික ආලෝකය සහ වායු සංසරණය ප්‍රශස්ථකරණය කෙරෙහි අවධානය යොමු වූ හරිත ගොඩනැගිලි සංකල්පයට අනුව සියලුම නව ශාඛා ඉදිකරන ලදී. එමෙන්ම අපි ශාඛා 42 ක සූර්ය බල පද්ධති ස්ථාපිත කර ඇති අතර එය අපගේ විදුලි පරිභෝජනය අඩු කර ඇත. හරිත සංකල්පය 166 වන පිටුවේ ස්වභාවික ප්‍රාග්ධනය යටතේ විස්තර කෙරේ.

ඇතුළට එන සහ පිටවයන උණුසුම් ප්‍රවාහය අඩුකරන තාප පරිවාරකය නිර්මාණය කරන වීදුරු ජනේල සවි කිරීම මගින් අඩු බලශක්තිය පරිභෝජනය කිරීමට අපගේ ශාඛා පරිශ්‍ර සැලසුම් කෙරේ. හරිත ගොඩනැගිල්ලක් ලෙස හඳුනාගෙන ඇති අපගේ කතරගම සංචාරක බංගලාව ආලෝකය සඳහා අවම විදුලිය පරිභෝජනය කරන සහ ස්වභාවික ආලෝකය සහ වායුව ප්‍රශස්ථ කිරීම මගින් ශීතකරණ පහසුකම් සහිතව ඉදිකරනු ලැබ ඇත.

## අපගේ ඩිජිටල් පියසටහන පුළුල කිරීම

ගනුදෙනුකරුවන්ගේ වැඩිවන විදග්ධතාව සහ පහසුව සහ නම්‍යතාවය ලබාදෙන ඩිජිටල් ස්වයං සේවා මාර්ග සඳහා ඉල්ලුමත් සමඟ, මෙම අවශ්‍යතාවන්ට ඵලදායිව ප්‍රතිචාර දැක්වීමට අපි ඩිජිටල් යටිතල පහසුකම් අඛණ්ඩව ශක්තිමත් කරමු. දැනට සිදුකරන ආයෝජන තුළින්. අපගේ ස්වයං සේවා කොටස, ගෙවීම් ස්ථාන, ඩිජිටල් විසඳුම් පුළුල් කර ඇති අතර තොරතුරුවල ආරක්ෂාව ශක්තිමත් කර ඇත. මෙවැනි ආයෝජනයන් අපගේ ගනුදෙනුකාර අත්දැකීම වර්ධනය කර ක්‍රියාවලි සරල කරන අතර, අපගේ සේවකයින්ගේ කාර්යක්ෂමතාව සහ සඵලතාව වැඩි කිරීමට සහය වේ.

### ඩිජිටල් මාර්ග අවකාශ වැඩි කිරීම

මාර්ගගත පරිශීලකයින් වැඩිවීමේ සහ තාක්ෂණය දැනුවත් ගනුදෙනුකරුවන් වේගයෙන් පුළුල්වීමේ ප්‍රවණතාවය සමඟ. විශේෂයෙන් තරුණයින් ඇතුළුව පුළුල් ගනුදෙනුකාර කොටසක් කරා ලඟාවීමට ඩිජිටල් මාර්ග කෙරෙහි අපි අවධානය යොමු කළෙමු. නව සේවාදායකයින් අත්කර ගැනීම මගින් අපගේ ව්‍යාපාරය වේගවත් කිරීමට, අපගේ දැනට සිටින ගනුදෙනුකරුවන් සමඟ මැදිහත්වීමට සහ අපගේ ශාඛාවල දෘශ්‍යතාව වැඩි කිරීමට මෙය අපට සහය වී ඇත. සමාලෝචිත වසර තුළ, අපගේ ඉන්ස්ටග්‍රෑම් පිටුව දියත් කරන ලද අතර එය විශේෂයෙන් තරුණ ප්‍රජාව අතර ජනප්‍රිය සන්නිවේදන මාධ්‍යයක් බවට පත්ව ඇත.

### සුරක්ෂිත හරපත් කළමනාකරණය

අප රටෙහි භෞතික මුදල් පරිහරනය අවම කිරීමේ වැඩසටහනට සහයවීම සඳහා අපගේ ගනුදෙනුකරුවන්ට නව්‍යකරණ සහ සුරක්ෂිත ගෙවීම් විකල්ප නිර්මාණය කර පිරි නැමීම අපි අඛණ්ඩව සිදු කරමු.

- වංචාව වැලැක්වීම සඳහා, බැංකුව EMV (Europe, Master Card and Visa) ණය කාඩ් බැංකුව තුළදීම මුද්‍රණය කිරීම ආරම්භ කළ අතර එය චුම්භක රේඛාව සහිත කාඩ්පතට එරෙහිව ආරක්ෂිත චිපයකින් ශක්තිමත් කර ඇති අතර 2019 දක්වා බැංකුව දැනට පවත්නා කාඩ්පත් 450,000ක් පමණ EMV චිපය පදනම් කාඩ්පත්වලට පරිවර්තනය කරන ලදී.
- තවද, බැංකුව NFC (සමීප ක්ෂේත්‍ර සන්නිවේදනය) තාක්ෂණය හඳුන්වා දෙන ලද අතර එය තොරතුරු පැදීම සහ සෙවීමට එරෙහිව උපරිම ආරක්ෂාව පිරිනමමින් විසා සහ මාස්ටර් ඩෙබිඩ් කාඩ්පත් ශක්තිමත් කර ඇත.
- EMV කාඩ්පත් සඳහා බැංකුව හරිත PIN නිකුතුව හඳුන්වා දුන් අතර එහිදී ජංගම දුරකථනය පදනම් කාඩ් සක්‍රීයකරණ ක්‍රියාපටිපාටිය ලබාදෙමින් ගනුදෙනුකරුවන්ගේ තොරතුරු ආරක්ෂා කරමින් කෙටි පණිවිඩයක් තුළින් PIN නිකුත් කෙරේ.
- 2018 දී ගනුදෙනුකාර සේවය වැඩි කරමින් සියලුම ශාඛාවලට කාඩ්පත් කළමනාකරණය ක්‍රමයේ (CMS) පිවිසුම ලබාදෙමින් ක්‍රියාත්මක කළ කාඩ්පත් කළමනාකරණය ක්‍රමය සමාලෝචිත වසර තුළ යාවත්කාලීන කරන ලදී.

- ණය කාඩ්පත් සම්බන්ධ ගනුදෙනුකාර පැමිණිලි කාඩ්පත් මධ්‍යස්ථානය, ඇමතුම් මධ්‍යස්ථානය සහ ඒටීඑම් සහය සේවා ඒකක ඒකාබද්ධ කරමින් ස්වයංක්‍රීයකළ පසුවිපරම් ක්‍රමය මගින් නිරාකරණය කෙරේ.
- දත්ත ආරක්ෂක ප්‍රමිති PCI-DSS සහතික කිරීම: බැංකුවේ ආරක්ෂිත ප්‍රමිති අඛණ්ඩව වැඩි කිරීමේ සහ කාඩ්පත් සම්බන්ධ වංචාවලින් ගනුදෙනුකරුවන් ආරක්ෂාකර ගැනීම සඳහා අපගේ උත්සාහයන් තුළ, ලොවවටා පිළිගත් කාඩ්පත් හිමියාගේ දත්ත ආරක්ෂක ප්‍රමිතිය වන ගෙවීම් කාඩ් ක්ෂේත්‍රයේ දත්ත ආරක්ෂක ප්‍රමිති PCI-DSS සහතිකය ලබාගත් පළමු ශ්‍රී ලංකා රාජ්‍ය බැංකුව බවට අප පත්ව ඇත. වැඩිදුර විස්තර සඳහා බුද්ධිමය ප්‍රාග්ධනය: දත්ත ආරක්ෂාව ශක්තිමත් කිරීම පිළිබඳ 127 පිටුව බලන්න.

### 2019 දී ක්‍රියාත්මකකළ ගෙවීම් විසඳුම් ක්‍රම

ශ්‍රී ලංකා මහ බැංකුව ඉ-ගෙවීම් සුරක්ෂිත කිරීම සඳහා සංක්‍රමණය පෝෂණය කිරීමට ක්‍රියාමාර්ග ගනණාවක් ගෙන ඇත. මාර්ගගත තත්‍ය කාල ගෙවීම් විසඳුම ලංකා පේ CEFTS තුළින් හඳුන්වා දෙන ලද අතර ඒ තුළින් ඉහළම මට්ටමේ ආරක්ෂාව සමඟ මාර්ගගත තත්‍ය කාල අන්තර්බැංකු අරමුදල් හුවමාරුවීම්වලට පහසුකම සලසයි. මෙම ගනුදෙනු ඒටීඑම්, ඕටීසී, අන්තර්ජාල බැංකුකරණයට හෝ ඕනෑම ජංගම ගෙවීම් උපාංග වැනි ඕනෑම ගෙවීම් මාර්ගයක් හරහා ආරම්භ කළ හැකිය. වසර තුළ. බැංකුව පහත සඳහන් පරිදි ගෙවීම් විසඳුම් කිහිපයක් වැඩි දියුණු කර ඇත

### ලංකා පේ මාර්ගගත ගෙවීම් අවස්ථාව (LPOPP)

ලංකා පේ මාර්ගගත ගෙවීම් අවස්ථාවට සම්බන්ධවෙමින්, CEFTS (අන්තර්ජාලය. ජංගම, ඒටීඑම් හෝ කවුළුව හරහා) ට සම්බන්ධ ඕනෑම මාර්ගයක් හරහා සාජුව ගෙවීම් සිදුකිරීමට අපගේ ගනුදෙනුකරුවන් ශක්තිමත් කර ඇත. මෙම ගෙවීම් තත්‍ය කාලීන සහ 24 X 7 පදනමක් මත බැර කෙරෙන අතර, ගනුදෙනුකරුවන්ට තත්‍ය කාලීන පදනමක් මත ගෙවීම් සහතික කිරීමේ විස්තරයක් ලබා දේ. තවද. බැංකුව ශ්‍රී ලංකා රේගුව වෙත සිදුකළයුතු ගෙවීම සිදුකිරීමට ගනුදෙනුකරුවන් ශක්තිමත් කර ඇත.

### ජස්ට්පේ (Just Pay)

පාරිභෝගික ගෙවීම් සඳහා මෙය පහසු ආරක්ෂිත සහ සාධාරණ විකල්පයක් වන අතර මෙය මුදල් සහ කාඩ්පත් මගින් මූලිකවම සිදු කෙරේ. ගනුදෙනුකරුවන්ගේ පහසුව වැඩ කරමින් ස්මාර්ට් දුරකථනය භාවිතයෙන් පාරිභෝගික ගෙවීම් සිදුකිරීමට ගනුදෙනුකරුවන්ට ඉඩ දේ. ගනුදෙනුකරුවන්ට තමන්ගේ ඉතුරුම් ගිණුම් රු. 10,000 ක උපරිමයකින් ඉහළ දැමීමට හෝ ස්මාර්ට් දුරකථන යෙදුම (ඇප්) එක භාවිතයෙන් වෙළෙන්දාගේ ගිණුමට රු. 10,000 ක උපරිමයක් සාජුව මාරුකිරීමට මේ තුළින් ඉඩ ලබා දේ.

### ඇ.එ.ඩො. මාර්ගගත නිෂ්කාශන ක්‍රමය

නිෂ්කාශනය වේගවත් කරන සහ ඒ නිසාම ණය ගැනීමේ ප්‍රමාදය ඉවත්කරන ලංකා පේවලින් නව එක්සත් ජනපද ඩොලර් චෙක්පත් නිශ්කාශනය තුළින් වේගයෙන් අරමුදල් ලබාගැනීමට තැන්පතුකරුවන්ට අපි පහසුකම් සලසා ඇත.

## අපගේ මෙහෙයුම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම

ඩිජිටල්කරණ බැංකු යුගය තුළ සියලුම බැංකුකරණ මෙහෙයුම්වලට තොරතුරු සන්නිවේදන තාක්ෂණය එකතු කිරීමේ වැදගත්කම අවබෝධ කරගනිමින්, අපගේ ක්‍රම සහ ක්‍රියාවලි අපි අඛණ්ඩව පවත්වාග නිමින් වර්ධනය කරමු. ආරක්ෂිත සහ සුරක්ෂිත බැංකුකරණ ක්‍රමයක් තුළින් ඩිජිටල් යුගය තුළ වෙනස්වන ගනුදෙනුකාර අපේක්ෂාවන්ට ඵලදායි අයුරින් ප්‍රතිචාර දැක්වීමට සහ මෙහෙයුම් අනර්ඝත්වය අත්කර ගැනීමේ චක්‍රයේ ඉදිරියෙන් සිටීමට මේ තුළින් හැකියාව ඇති කරයි.


අපගේ භෞතික යටිතලපහසුකම් අනුපූරණය කර ඩිජිටල් යටිතල පහසුකම් තුළ අපගේ ආයෝජනය තුළින් වේගයෙන් සහ වඩාත් කාර්යක්ෂම ආකාරයෙන් විශිෂ්ඨ ගනුදෙනුකාර සේවාවක් අපි අඛණ්ඩව ලබා දෙමු. මෙවැනි ආයෝජනයන් අපගේ දෛනික මෙහෙයුම්වල පහසු ක්‍රියාකාරිත්වයට සහය ලබා දේ.

### ඒකාබද්ධ මධ්‍ය බැංකුකරණ විසඳුම

මධ්‍ය බැංකුකරණ විසඳුම පිළිබඳ ප්‍රසම්පාදනය 2019 දී සම්පූර්ණ කරන ලදී. මෙම නවීන විසඳුම මගින් තනි අවස්ථාවක් මත තැන්පතු, ණය, චෙක්පත්, උකස්, ඈප. එකතු කිරීම සහ ගෙවීම්වල සම්පූර්ණ පරාශයක් ආවරණය කරයි. අපගේ මධ්‍ය බැංකුකරණ විසඳුම් මගින් අවධානය යොමු කරන්නේ:

අපගේ ගනුදෙනුකරුවන්ට වඩා ඉහළ නම්‍යතාව ලබාදීමට අපගේ දැනට පවත්නා තාක්ෂණය ක්‍රමයෙන් නවීකරණය කිරීමට අපගේ තොරතුරු සන්නිවේදන තාක්ෂණය පරිනාමනය කිරීම

ඩිජිටල් වශයෙන් එක දිගට සහ නිෂ්පාදන සහ සේවා ලබාදීම පරිනාමනය සහ වෙනස ඉක්මණින් යොදා ගැනීම



දත්ත විශ්ලේෂණය, කෘතිම බුද්ධිය සහ යන්ත්‍ර වැනි තාක්ෂණයන් තියුණු කිරීමට පදනම සකස් කිරීම සඳහා නව තාක්ෂණ යොදා ගැනීම සහ ගනුදෙනුකාර අවශ්‍යතා හඳුනා ගැනීමට අපගේ දෛනික මෙහෙයුම් තුළින් ඉගෙනීම

නැවත සැකසුම සහ ඩිජිටල්කරණය තුළින් පසු පෙළ මෙහෙයුම් පරිනාමනය සහ ඒ තුළින් අපගේ මෙහෙයුම් කාර්යක්ෂමව, වේගය සහ ශක්තිමත්බව වර්ධනය කිරීම සඳහා ස්වයංක්‍රීයකරණය

මධ්‍ය බැංකුකරණ විසඳුම් යොදා ගැනිම තුළින් ඉහළ මට්ටමේ ස්වයංක්‍රීයකරණය සහ අවදානම් රහිත සේවයේ යෙදවිම සහිත වඩා නවින ඒකාබද්ධ බැංකුකරණ අවශ්‍යතා හැසිරවිමට අපට හැකියාව ඇති කරයි. එය භාවිතයේ පහසුව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව උපරිම කිරිම ඇතිකරන අතර, නියාමන අවශ්‍යතා සහ ජාත්‍යන්තර මනා පරිචයන්ට අනුකූලවීම සහතික කරයි. මෙය සේවක ඵලදායිතාව වැඩි කිරීමට මෙන්ම ගනුදෙනුකාර අත්දැකීම ඉහළ නැංවිමට මඟ පාදනු ඇත. දීර්ඝ කාලීනව, වෙළෙඳපොල සහ වඩා ඉහළ ඵලදායිතාවට වර්ධිත කාලයක් සමඟ වඩාත් කාර්යක්ෂම ආකාරයකින් ගනුදෙනුකාර අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දක්වීමට හැකි වඩාත් කඩිසර සහ දත්ත මත ඉදිරියට යන ආයතනයක් බවට අපව පත්කරනු ඇත. මෙම මධ්‍ය බැංකුකරණ ක්‍රමය මුදල් විශුද්ධිකරණයට විරෝධී විසඳුම (AML), භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය (TMS) සහ මානව සම්පත් කළමනාකරණ ක්‍රමය වැනි අනෙකුත් ක්‍රම ඒකාබද්ධ කරමින් අනුපූරණය කරනු ලැබේ.

## භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය

නව භාණ්ඩාගාර කළමනාකරණ ක්‍රමය වසර තුළ ප්‍රසම්පාදනය කළ අතර ඒ මගින් එහි සියලූම භාණ්ඩාගාර කාර්යයන් ඒකාබද්ධ කිරීම, ශක්තිමත් කිරිම සහ ක්‍රමවත් කිරිම සිදු කරනු ලබයි. මුදල් හා ද්‍රවශීලතාවයට වඩා ඉහළ දෘශ්‍යතාව ඇති කිරීමට, බැංකුවේ ගිණුම්වල පාලනය ලබාගැනිමට, අනුකූලතාව පවත්වා ගැනීමට ඒකාබද්ධ වාර්තාකරණ මෙවලම්වල වාසි ලබාගැනීමට සහ වඩාත් කාර්යක්ෂමව අභ්‍යන්තර බැංකුකරණ සහ මූල්‍ය ගනුදෙනු කළමනාකරණය සඳහා අපට හැකියාව ඇති කරයි. මෙම විසඳුම වාර්තාකරණය, වැඩප්‍රවාහය සහ සැසැඳීම් ක්‍රියාවලිය තුළ වඩා ඉහළ නම්‍යතාව ලබා දි ඇති අතර, අතින් සිදුවන දෝෂවල අවදානම අඩුකර බැංකුව තුළ විදේශ විනිමය ගාස්තු අඩුකර ඇත.

## මානව සම්පත් කළමනාකරණ පද්ධතිය

මානව සම්පත් කාර්යයන් ස්වයංක්‍රීයකරණය කිරීමේ අදහස ඇතිව, මානව සම්පත් තොරතුරු පද්ධතියක් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අපි සිටිමු. මෙම පද්ධතිය මගින් සේවක තොරතුරු රැස්කිරිම, ගබඩා කිරිම සහ ඇගයීම සහ බඳවාගැනීම් කළමනාකරණය සහ පුහුණුව, සේවක පඩි ලැයිස්තුව, කාර්යසාධන ඇගයීම, සේවක ප්‍රතිලාභ පරිපාලනය සහ ඉගෙනුම සහ සංවර්ධනය ඇතුළුව මානව සම්පත් කාර්යයන් හී කාර්යක්ෂමතාව සහ සඵලත්වය වැඩි කරනු ඇත.

## මුදල් විශුද්ධිකරණයට විරෝධී විසඳුම (AML)

මුදල් විශුද්ධිකරණයට විරුද්ධවීමේ විසඳුම 2019 දි ක්‍රියාත්මක කරන ලද අතර ඒ තුළින් වංචා සහ මුදල් විශුද්ධිකරණය කටයුතු වැලැක්වීමට ගනුදෙනු නියාමනය සහ පසුවිපරම පහසු විය. මුදල් විශුද්ධිකරණයට විරුද්ධවීමේ විසඳුම යොදා ගැනිම ගනුදෙනුකරුවා පිළිබඳව දැනගැනිම. ගනුදෙනුකරුවාගේ දුර දැක්ම පිළිබඳ කාර්යභාරය, තහනම් ලැයිස්තුවට අනුව ගනුදෙනුකරුවන් සහ ගනුදෙනු නිවාරකය සහ මුදල් විශුද්ධිකරණයට විරුදධ රෙගුලාසිවලට අනුකූලවිම සඳහා අනුරූප ජීවන චක්‍ර ආවරණයක් ලබා දි ඇත. අපගේ දුර දැක්ම පිළිබඳ ක්‍රියාපටිපාටි පද්ධති අසාදු ලේඛනගත ගනුදෙනුකරුවන් පිළිබඳ ශක්තිමත්කළ පසුවිපරම සහ  නියාමනය හේතු කොට ගෙන තවදුරටත් වර්ධනය කරනු ලැබේ. මෙම විසඳුම මධ්‍ය බැංකුකරණ ක්‍රමයට අනුපූරණය කරන අතර, බැංකුවේ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කර ඇත.

## Cash@Ease ක්‍රමය

2019 දි Cash@Ease ක්‍රමය ක්‍රියාත්මක කිරීම මගින් බැංකුවේ මුදල් කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රමවත් කරන ලදි. මෙම ක්‍රමය දෛනික මුදල් තත්ත්වය බැලිම පහසුකරමින් සහ භාණ්ඩාග ාරයෙන් මුදල් සඳහා ඉල්ලුම් කරමින් ශේෂ කළමනාකරණය කරමින් සහ ගනුදෙනුවල මාර්ගගත තහවුරු කිරිම යැවිම මගින් ශාඛා සහ භාණ්ඩාගාර අංශයේ මුදල් කළමනාකරණ ක්‍රියාවලිය තුළ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කර ඇත. එමෙන්ම මෙය පිරිවැය ඉතුරුම්, වර්ධිත නිරවද්‍යතාවය  සහ බැංකුව තුළ වැඩිකළ කාර්යක්ෂමතාවන් සහ ගනුදෙනුකාර සේවා මට්ටම් සඳහා සැලකියයුතු ලෙස දායක වි ඇත.

## අනාගත ප්‍රමුඛතා

### කෙටිකාලින

ලංකා QR පදනම් නිෂ්පාදන දියත් කිරීමට ඩිජිටල් අවකාශ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සහ ගෙවීම් කාඩ් සහිත මොබයිල් යෙදුම් අන්තර්ගත කිරීම.

ඊ-වාණිජ්‍ය සඳහා ලබාගතහැකි ඉහළම ආරක්ෂක ප්‍රතිපත්තිය වන 3DS2.0 ලබාගැනිම

සිආර්එම්, ස්මාර්ට් ඒටිඑම් ප්‍රදේශ සහ ඩිජිටල් අවකාශ සමඟ ගනුදෙනුකාර පිවිසුම් ස්ථාන පුළුල් කිරීම

නව රෙගුලාසිවලට අනුකූලවිම සඳහා බැංකුවේ මුදල් විශුද්ධිකරණ ක්‍රමය පුළුල් කර යාවත්කාලීන කිරීම

### මධ්‍ය කාලින

ඕනැම ස්ථානයක, ඕනැම වේලාවක ස්මාර්ට් දුරකථනයක් හෝ ඩිජිටල් උපාංගයක් භාවිතා කරමින් බැංකු කටයුතු කිරිම සඳහා ගනුදෙනුකරුවන්ට හැකියාව ඇති කිරීමට අංග සම්පූර්ණ ඩිජිටල් බැංකුකරණ විසඳුමක් විම

මානව සම්පත් කළමනාකරණ ක්‍රමය සහ භාණ්ඩාගාර කළමනාකරණ ක්‍රමය සමඟ ඒකාබද්ධවිමට මධ්‍ය බැංකුකරණ විසඳුම්

තොරතුරු ආරක්ෂණ කළමනාකරණ ක්‍රමය (ISMS) ක්‍රියාත්මක කිරීම සහ ISO 27001 සහතිකකරණ ක්‍රියාවලිය ලබා ගැනීම

බැංකුවේ තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය ශක්තිමත් කිරිම

ශාඛා ජාලය සඳහා සම්ප නියාමනය ඇති කිරීමට සහ "මාර්ගගත අනුකූලතා ඇගයිම්" කරා විතැන්වීම

### දිගු කාලින

කඩිසර සහ දත්ත මත පදනම් ආයතනයක් බවට පත්වීම



# බුද්ධිමය ප්‍රාග්ධනය

**අස්පෘශ්‍ය වත්කම් ඇතුළත්වන බුද්ධිමය සම්පත තරඟකාරී වාසි ලබාගැනීම සඳහා අවශ්‍යම මූලාශ්‍රයකි. බුද්ධිමය ප්‍රාග්ධනයේ වටිනාකම වැඩි කිරීම දීර්ඝ කාලීනව වටිනාකම් ලබාගැනීමට අපට හැකියාව ඇති කරයි.**

## එයට ඇතුළත් දෑ

බුද්ධිමය ප්‍රාග්ධනය යනු අපගේ පාර්ශ්වකරුවන් සඳහා වටිනාකම නිර්මාණය කිරීමට අත්‍යවශ්‍ය අපගේ ආයතනගත දැනුම, ගනුදෙනුකාර පක්ෂපාතිත්වය. අපගේ සන්නාමය සහ කීර්තිනාමය, අභ්‍යන්තර ක්‍රම සහ ක්‍රියාවලි, ව්‍යාපාර ආචාරධර්ම, ආයතනික වටිනාකම්, ප්‍රතිපත්ති සහ අපගේ ආයතනික සංස්කෘතිය ඇතුළත් අස්පෘශ්‍ය වත්කම්වලින් සමන්විත අපගේ සියලූම ප්‍රාග්ධනයේ සංයෝජනයකි.

## යෙදවුම්

- ඉගෙනුම සහ සංවර්ධනය
- ප්‍රතිපත්ති, වැඩරාමු සහ ක්‍රියාවලි
- සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි
- ආයතනික සංස්කෘතිය
- වගකීම්සහගත නායකත්වය

## වටිනාකම් එකතුකරන ආකාරය

බුද්ධිමය ප්‍රාග්ධනය දීර්ඝ කාලීනව බැංකුව සඳහා වටිනාකම් ඇති කළ හැකි තරඟකාරී වාසියේ අත්‍යවශ්‍ය මූලාශ්‍රයක් වන බව අපි දැඩිව විශ්වාස කරමු. එය තරඟකාරී වාසි ලබාගැනීමේ මූලාශ්‍රයක් වන නව්‍යකරණය උත්තේජනය කරන අතර අනාගත ධනය උත්පාදනය කරයි.

## අපගේ ප්‍රවේශය

ශක්තිමත් ක්‍රියාවලි ප්‍රවාහ, අනෙකුත් ආයතන සමඟ හවුල්කාරත්වය සහ ඉගෙනුම සහ නව්‍යකරණය සඳහා දිරිගැන්වීම තුළින් අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය අප සංවර්ධනය කරමු. පාරිසරික බලපෑම සහ මෙහෙයුම් පිරිවැය අවමකරමින්, සහ අපගේ ආයතනික ප්‍රතිරූපය සහ ගනුදෙනුකාර විශ්වාසය වැඩිකරමින්, නව නිෂ්පාදන සංවර්ධනය තුළින් හා අපට වඩාත් කාර්යක්ෂමවීමට හැකිවන පද්ධති සහ ක්‍රියාවලි වර්ධනය තුළින් අපි අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය පෝෂණය කරමු.

## 2019 සඳහා ප්‍රධාන අභියෝග සහ අවස්ථා

**මූලික අභියෝගි**

- තොරතුරුවල ආරක්ෂාව
- ප්‍රාග්ධනය වෙන්කිරීම් තුළ සීමා හේතු කොට ගෙන අන්‍යෝන්‍ය වශයෙන් සීමා කරන ලද ව්‍යාපෘති
- වෙනසට ප්‍රතිරෝධය දැක්වීම
- සන්නාම වටිනාකම රඳවාගැනීම

**අවස්ථා**


- වැඩප්‍රවාහ ක්‍රම ඩිජිටල්කරණය
- දැනුවත් තීරණ ගැනීම
- කඩිසර සේවා පරිසරය
- මෙහෙයුම් කාර්යක්ෂමතාව වර්ධනය




## බුද්ධිමය ප්‍රාග්ධනයේ වටිනාකම ඉහළ නැංවීමේ උපායමාර්ග

- අපගේ සේවකයින්ගේ ප්‍රවීණත්වය සහ දක්ෂතා තුළින් බුද්ධිමය ප්‍රාග්ධනය තියුණු කිරීම
- ව්‍යාපාර ක්‍රියාවලි සහ කළමනාකරණ ක්‍රමවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම
- ආයතනික ප්‍රතිරූපය වැඩි කිරීම සහ ආචාර ධර්ම, අවංකකම සහ වගවීම තුළින් ගනුදෙනුකාර විශ්වාසය ඉහළ නැංවීම
- තොරතුරු තාක්ෂණය තුළ ආයෝජන ප්‍රශස්ථකරණය
- නව්‍යකරණය ඉදිරියට ගෙන යන ආයතනික සංස්කෘතියක් පෝෂණය කිරීම
- තිරසාර ව්‍යාපාර භාවිතයන් තුළින් පාරිසරික බලපෑම අවම කිරීම

## වටිනාකම් නිර්මාණයේ මූලිකාංග



## ප්‍රමාණාත්මක කරුණු



## අදාළ ඇල්මැති පාර්ශ්වකරුවන්



## කෙටි හා මධ්‍ය කාලීන උපායමාර්ගික ප්‍රමුඛතා



## වැදගත් සිදුවීම්



**ආරක්ෂිත**

4 වැනි වරටත් ශ්‍රී ලංකාවේ ආරක්ෂිතම බැංකුව




**දත්ත ආරක්ෂාව**

ගෙවීම් කාඩ් ක්ෂේත්‍රයේ දත්ත ආරක්ෂක ප්‍රමිති PCI- DSS සහතිකකරණය ලද ශ්‍රී ලංකාවේ පළමු රාජ්‍ය බැංකුව



**AA- සිට AA**

සන්නාම ශ්‍රේණිගතකරණය ඉහළයාම



**රු.මිලියන 34,771**

සන්නාම වටිනාකම 20% කින් වැඩිවිය



**AAAAA**

ICRA ලංකා ලිමිටඩ් විසින් ණය ශ්‍රේණිගතකරණය



**28.4%**


වසර 10 ට වැඩි සේවාවක් සහිත සේවකයින්

## මිණුම් දර්ශකය

| | වැඩිවීම/(අඩුවීම) | 2019 | 2018 |
|---|---|---|---|
| සන්නාම වටිනාකම (රු.මි.) | 6,969 (වාර්ෂිකව 25% කින් වැඩිවීම) | **34,771** | 27,802 |
| සන්නාම ශ්‍රේණිගතකරණය | මට්ටම එකකින් වැඩිවීම | **AA** | AA- |
| ණය ශ්‍රේණිගතකරණය | – | **AAA** | AAA |
| වසර 10 ට වැඩි සේවාවක් සහිත සේවකයින් (%) | 2.0 | **28.4** | 26.4 |

## අනෙකුත් ප්‍රාග්ධනයට සම්බන්ධතාව

බුද්ධිමය ප්‍රාග්ධනය බැංකුවේ එක් එක් ප්‍රාග්ධනයන්ට සහ ප්‍රාග්ධනයන් වෙතින් බලපෑමට ලක්වෙයි.



පුහුණුව සහ සංවර්ධනය තුළ ආයෝජනය අපගේ සේවකයින්ගේ ආයතනික දැනුම, නිපුණතා සහ පළපුරුද්ද වැඩිකරන අතර එය මෙහෙයුම් අනර්ඝත්වය තහවුරු කරයි

පාරිසරික තිරසාරභාවය කෙරෙහි අපගේ අවධානය පාර්ශ්වකරුවන් අතර අපගේ තිරසාර වැඩසටහන් කෙරෙහි විශ්වාසය ඇති කරයි


යටිතලපහසුකම්, පද්ධති සහ ක්‍රියාවලි තුළ ආයෝජනය වර්ධිත ව්‍යාපාර ක්‍රියාවලිවලට හේතු වේ.

මූල්‍ය ප්‍රාග්ධනය තුළ වර්ධනය අපගේ ක්‍රියාවලි වර්ධනය කිරීමට සහ සන්නාම සංවර්ධනය සහ සේවක සංවර්ධනය වැනි ක්ෂේත්‍රවල ආයෝජනය කිරීමට හැකියාව ඇති කරන අතර එය අපගේ ආයතනික කීර්තිනාමය සහ අපගේ පාර්ශ්වකරුවන් අතර බැංකුව කෙරෙහි ඉහළ විශ්වාසය වැඩි කර ඇත.


අපගේ වටිනාකම්, ව්‍යාපාර ආචාර ධර්ම සහ අවදානම් කළමනාකරණ වැඩරාමුව අපගේ ආයතනික කීර්තිනාමය ඉහළ නංවා ගනුදෙනුකරුවන්ගේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය ශක්තිමත් කරයි

## විභව සමතුලිතතා

- පුහුණුව සහ සංවර්ධනය තුළ ආයෝජනය
- ඩිජිටල් යටිතලපහසුකම් සහ ජාලය පුළුල් කිරීම



- **නව ඩිජිටල් තාක්ෂණය තුළ ආයෝජනය සහ ඉහළ නැංවීම**




## තිරසාර සංවර්ධන අරමුණු සඳහා දායකත්වය




බැංකුව තුළ සදාචාර හැසිරීම, යහපාලනය සහ අනුකූලතාවය ප්‍රවර්ධනය කිරීම




නව්‍යකරණය ඉදිරියට යන සංස්කෘතියක් පෝෂණය කිරීම සහ තාක්ෂණය සහ යටිතල පහසුකම්වල ආයෝජනය

## යෙදවුම්

- රු.බි. 34.77 ක සන්නාම වටිනාකමක් සහිත පස් වැනි වඩාත් වටිනා සන්නාමය
- PCIDSS සහතිකකරණය ලබාගත් පළමු රාජ්‍ය බැංකුව වීම
- ගෘහස්ථව සැලසුම්කළ දත්ත කළමනාකරණ පද්ධතිය සහ කාඩ් කළමනාකරණ පද්ධතිය
- ආසන්න ක්ෂේත්‍ර සන්නිවේදනයෙන් (NFC) ශක්තිමත්කළ ණය කාඩ්පත් සහ EMV ණය කාඩ්පත් අභ්‍යන්තර මුද්‍රණය හඳුන්වාදීම
- අන්තර්ජාල ඇ.එ.ඩො. ගෙවීම් සහ ජස්ට් පේ විසඳුම්වලින් ශක්තිමත් ගෘහස්ථව වැඩි දියුණු කළ ලංකා පේ ගෙවීම් විසඳුම්
- අභ්‍යන්තර දැනුම සහ පළපුරුද්ද සමඟ ක්ෂේත්‍රයේ ආරක්ෂක ප්‍රමිති ක්‍රියාත්මක කිරීම

## කීර්තිමත් ආයතනයක් ගොඩනැගීම

ජාතික ඉතිරි කිරීමේ බැංකුව 1972 එහි ආරම්භයේ සිට සියලුම ශ්‍රී ලාංකිකයින් සඳහා ගෘහස්ථ නමක් බවට පත්ව ඇත. ලංකා ඉතුරුම් බැංකුවේ (CSB) අපගේ පුරෝගාමීන්ගේ වසර 185ක බැංකු උරුමයක් මත හිඳිමින්, සියලුම තැන්පතු සහ පොළී මත හිමිකම් දරාගැනීමට අපගේ ඉතාමත් අසමසම රාජ්‍ය ආරක්ෂාව සමඟ අපගේ සියලුම ගනුදෙනුකරුවන් සඳහා ආරක්ෂාව තහවුරු කිරීමේදී අපි පෙරමුණේ සිටිමු. ශ්‍රී ලංකාව තුළ ප්‍රමුඛ ඉතුරුම් බැංකුව ලෙස අපගේ සන්නාමය විශ්වාසය සහ ආරක්ෂාව සමඟ තුලනය වන අතර මෙම සාධකය පැහැදිලි කරමින් 2019 දී අඛණ්ඩව හතරවැනි වරටත් ග්ලෝබල් ෆිනෑන්ස් සඟරාව විසින් ශ්‍රී ලංකාවේ ආරක්ෂිතම බැංකුව ලෙස පිළිගනු ලැබීය. මූල්‍ය සහ මූල්‍ය නොවන දෙඅංශයෙන්ම සන්ධිස්ථාන කිහිපයක් අත්කර ගනිමින් ශක්තියෙන් ඉදිරියට යමින් ක්‍රමයෙන් වර්ධනය වී ඇත. දිවයින පුරා අපගේ පුළුල් ජාලය වඩා පුළුල් ගනුදෙනුකාර කොටසකට ලඟාවීමට අපව ශක්තිමත් කරයි.


### අපගේ සන්නාම වටිනාකම සහ ශ්‍රේණිගතකරණය ඉහළ නැංවීම

100%ක් රජයේ හිමිකාරත්වය සහ තැන්පතු මත පැහැදිලි වගකීම සහ මනා තත්ත්වයේ ණය කළඹ, දැනට පවත්නා ප්‍රමාණවත් ප්‍රාග්ධන කළඹ සහ අඩු අවදානම් ආයෝජන කළඹ පිළිබිඹු කරමින් ICRA ලංකා සමාගම විසින් බැංකුවට ස්ථාවර දර්ශනයක් සමඟ [SL] AAA ශ්‍රේණිගතකරණය පැවරීම තහවුරු කරමින් අපගේ සන්නාම තත්ත්වය සමාලෝචිත වසර පුරා ශක්තිමත්ව පැවතිණ. 2019 දී රු.මි. 34,771 ක සන්නාම අගයක් වාර්තා කරමින් බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් විසින් ශ්‍රී ලංකාවේ පස්වැනි වඩාත් වටිනා සන්නාමය ලෙස බැංකුව ශ්‍රේණිගත කරන ලදී. අපගේ සන්නාම අගය තුළ අනුරූපී වර්ධනයක් පිළිබිඹු කරමින් අපගේ සන්නාම වටිනාකම 25% කින් ඉහළ ගියේය. සන්නාම ශ්‍රේණිගතකරණය ද 2018 දී පැවති AA- සිට 2019 AA දක්වා වර්ධනය විය.

| වසර | සන්නාම වටිනාකම රු. බිලියන |
|---|---|
| 2015 | 22.65 |
| 2016 | 26.47 |
| 2017 | 24.59 |
| 2018 | 27.80 |
| 2019 | 34.77 |

(මූලාශය - බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් වාර්තාව 2019 මැයි)

**NSB සන්නාම වටිනාකම**




### ආයතනික දැනුම

බැංකුවේ තාක්ෂණික දැනුම 1972 සිට ජාතියට සේවය කිරීමෙන් වසර 47 ක් පුරා රැස්කරගත් දැනුම අපගේ තරඟකාරී වාසියේ නිසග කොටසකි. දශක ගණනාවක් පුරා පරිණත වී ඇති ක්‍රියාවලි සහ භාවිතයන් සහ වසර දහයකට වැඩි කාලයක් බැංකුව සමඟ සිටි සේවකයින්ගෙන් ඉහළ ප්‍රතිශතයකින් සමන්විත අපගේ පළපුරුදු සේවාබලකාය මූලිකවම අපගේ ආයතනික දැනුමට දායක වේ. අපි එකී දැනුම උතුම් කොට සලකන අතර එක් එක් සේවකයා විසින් අයත් කරගත් ආයතනික දැනුම් ගබඩා හඳුනාගනිමින් සහ අපි වඩාත් වැදගත් සේවකයින් රඳවාගන්නා බව සහතික කරමින් පරිස්සමින් කළමනාකරණය කරමු. ඊට අමතරව, විවිධ භූගෝලීය ප්‍රදේශවලට, පරම්පරාවන්ට සහ පසුබිම්වලට අයත් වන අපගේ සේවකයින් ජාතික ඉතිරි කිරීමේ බැංකු පවුලට විවිධ දැනුම සහ දක්ෂතා ගෙන එයි.

අපගේ මානව සම්පත් ප්‍රතිපත්තිය ඉහළ මට්ටමේ සේවක සහභාගිත්වය ඇති කරන අතර රැස්කල දැනුම බෙදාහැරීමට සහ ලේඛනගත කිරීමට ව්‍යුහගත වැඩසටහන් කිහිපයක් දියත් කර ඇත.

මෙයට ව්‍යුහගත පුහුණු වැඩසටහන්, දැනුම හුවමාරු සැසි, උපදේශනය සහ පුහුණු මෙවලම් පිළිබඳ අනෙකුත් අවිධිමත් මාර්ග ඇතුළත්ය. අපගේ පළපුරුදු කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් පවත්වනු ලබන අපගේ අභ්‍යන්තර පුහුණුව සහ ප්‍රාරම්භක වැඩසටහන් මගින් අපගේ නව සේවකයින් වෙත පවත්නා දැනුම හුවමාරුව සඳහා උපකාර කරයි. ආයතනික කළමනාකරණ කණ්ඩායමේ 55% කට වැඩි ගණනක් වසර පහළොවකට වැඩි කාලයක් පුරා බැංකුවට සේවය කර ඇති අතර සේවකයින්ගෙන් 28.4% කට බැංකුව තුළ වසර දහයකට වැඩි පළපුරුද්ද ඇත. කාර්ය මණ්ඩලය රඳවා ගැනීම සඳහා අපගේ හැකියාව 98.1% ක ඉහළ සේවක රඳවා ගැනීමේ අනුපාතය මගින් පිළිබිඹු කරයි. මෙම සාධක අප බැංකුවේ ආයතනික දැනුම පොහොසමත් කිරීමට දායක වී ඇත.

### අපගේ ආයතනික සන්නාමය ගොඩ නැගීම

ප්‍රචාරණය, උත්සව, ප්‍රදර්ශන, අනුග්‍රාහ, සහ සමාජීය ප්‍රවර්ධන කටයුතු ආදී සන්නාම ගොඩනැගීමේ අභ්‍යාස රාශියක් වසර පුරා කරගෙන යන ලදී. අපි අපගේ නිෂ්පාදන ජනමාධ්‍ය, සමාජ මාධ්‍ය, වෙබ් අඩවිය සහ අනෙකුත් වෙබ් පදනම් ප්‍රචාරණය, සහ රටවටා දැන්වීම් පුවරු සහ බස් නැවතුම් ස්ථානවල ප්‍රවර්ධනය කරන ලදී. මෙවැනි වර්ගයේ ප්‍රචාරණය අපගේ සන්නාම දෘශ්‍යතාව වැඩි කර ඇති අතර එය ජීවිතයේ සෑම අවධියක සිට පුළුල් ප්‍රදේශයක් දක්වා පුළුල් වනු ඇත. ආගමික උත්සව ඇතුළුව විවිධ ජාතික, සමාජීය සහ සංස්කෘතික උත්සව සඳහා අනුග්‍රහකත්වය සහ සම අනුග්‍රහකත්වය අපගේ සන්නාම ප්‍රතිරූපය සංවර්ධනය කිරීමට සහ මහජන සම්බන්ධතා වැඩි කිරීමට දායක වී ඇත.

GRI 102-16

## වටිනාකම් සහ ආචාරධර්ම

### අපගේ වටිනාකම

අපගේ බැංකුව පදනම් වන මූලික විශ්වාසයයන් වන අපගේ ආයතනික වටිනාකම් වසර 47 ක් පුරා අපි පරිණාමනය කොට ඇත. ඒවා අපගේ ආයතනික දැක්ම, අපගේ මෙහෙවර සහ අපගේ කටයුතු කරගෙන යන ආකාරය පිළිබඳ පැහැදිලි ප්‍රකාශනයකි. මෙවැනි වටිනාකම් අපගේ ආයතනික සංස්කෘතිය හැඩගසා ඇති අතරම අපගේ ආචාර විධිය, අපගේ අනන්‍යතාව සහ අපගේ දර්ශනයට දායක වී ඇත.




**විශ්වාසය**

සම්බන්ධ සියලූම පුද්ගලයින්ගේ බැඳියාවන් කෙරෙහි සම්පූර්ණ විශ්වාසය ඇති කර ගනිමින් සම්බන්ධතා ගොඩ නැගිම



**අනෝන්‍ය ගෞරවය**

සෑම පුද්ගලයෙකුටම ආවේනික වටිනාකම පිළිගැනිම සහ සෑම දෙනාටම ගෞරවයෙන් සැලකිම



**අවංකකම**

අපගේ සියලූම කාර්යයන්හිදි සහ තීරණවලදි අවංකවිම. අනුරූප විම හා විනිවිදභාවය



**නිර්මාණකරණය**

නව සංකල්ප අඛණ්ඩව සොයා යමින් දැනට පවත්නා භාවිතයන් අභියෝගයට ලක් කිරිම

## සදාචාර සම්පන්න ව්‍යාපාර හැසිරීම

ජාතියේ ප්‍රමුඛ ඉතුරුම් බැංකුව ලෙස, සදාචාරය සහ අවංකකම අපගේ ජානවල සහජයෙන්ම පවතී. අපගේ ප්‍රධාන පාර්ශ්වකරුවන් සඳහා සදාචාරාත්මක වගකීම වැළඳගැනිමට අපි බැංකුකරණයෙන් ඔබ්බට ගමන් කරන බව අපි විශ්වාස කරමු. සදාචාර හැසිරීම සඳහා ස්වරය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරන අතර සදාචාර හැසිරීම සහ ප්‍රමිති කරා උපරිම බැඳිම පෙන්නුම් කිරීමට සියලූම සේවකයින් උත්සාහ ගන්නා ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ආයතනය පුරා පතුරුවනු ලබයි. අපගේ අභ්‍යන්තර ප්‍රමිති, සංග්‍රහ, සහ පාලන යාන්ත්‍රණ නියාමන සහ අනුකූලතා අවශ්‍යතා අඛණ්ඩව සමාලෝචනය කරන අතර ක්ෂේත්‍රයේ මනා පරිචයන් සහ අදාළ නියාමන ආයතනවල අවශ්‍යතාවන්ට අනුව යාවත්කාලීන කෙරේ.

මෙවැනි අංග උපායමාර්ගික ආයෝජනයේ අත්‍යවශ්‍ය අංග ලෙස සලකමින් සහ බැංකුව තුළ අවදානම දැනුවත් සංස්කාතියක් මත ඉදිරියට යමින් අවදානම් කළමනාකරණයට සහ අනුකූලතාවට අධ්‍යක්ෂ මණ්ඩලය උපරිම ප්‍රමුඛතාව ලබාදේ. ආරක්ෂක මාර්ග ත්‍රිත්වයේ පළමුවැන්න වන අවදානම දැනුම පිළිබඳ ශක්තිමත් සංස්කෘතිය අනුකූලතාව සහ වගවිම සඳහා පදනම් සකස් කරයි. ආයතනික පාලනය, ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුව සහ අනුකූලතාවය පිළිබඳ අපගේ ප්‍රමිති ඉහළ නංවමින් අපගේ සදාචාර පදනම් අවදානම කේන්ද්‍රිය සංස්කෘතිය අපි අඛණ්ඩවම ශක්තිමත් කරමු.

## අනර්ඝත්වය සහ නව්‍යකරණ සංස්කෘතියක් පෝෂණය කිරීම

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ පවත්නා ආයතනික සංස්කෘතිය අපගේ වටිනාකම් සහ මෙහෙවර අනුනාද කරන අතර එය අපගේ දිගු කාලීන සාර්ථකත්වයේ කේන්ද්‍රය වේ. එය උපරිම වෘත්තීයමභාවය, කණ්ඩායම් වැඩ, වගවීම. විනිවිදභාවය. විවිධත්වය සහ පුද්ගලයන් අතර ගෞරවය පිළිබඳ සංස්කෘතියකි. වඩා ශක්තිමත් මට්ටමක අනුකූලතාව සහ පාලනයක් සමඟ පුද්ගල වගකීම සහ සාමුහික තීරණ ගැනීම පෝෂණය කරමින් ශක්තිමත් කණ්ඩායමක් ගොඩ නැගිමට අපි ස්ථිරවම උත්සාහ ගනිමු. ආයතනය කෙරෙහි පවුලක හැගිමක් සහ සේවක පක්ෂපාතිත්වය පිළිබඳ ශක්තිමත් හැගීමක් ඇත.

ජාතික ඉතිරි කිරීමේ බැංකු පවුලේ සහෝදර හැගිමක් ඇති කිරීම සඳහා, අපගේ මානව සම්පත් කොටස තුළ දක්වා ඇති පරිදි විවිධ උත්සව සහ වැඩසටහන් වසර පුරා සංවිධානය කෙරේ. මෙවැනි කාර්යයන් බැංකුවේ ක්‍රීඩා සමාජය, බෞද්ධ සංගමය. ක්‍රිස්තියානි සමාජය. බැංකුවේ සුභසාධන සංගමය සහ කලා කවය තුළින් සංවර්ධනය කෙරේ. අප විසින් අපගේ සේවකයින් පෝෂණය කරන ආකාරය සහ අපගේ සේවකයින් සඳහා සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සඳහා අපි ස්ථාපිත කර ඇති සන්නිවේදන මාර්ග පිළිබඳ පිළිවෙලින් විස්තර 142 පිටුවේ මානව සම්පත් කොටස යටතේ සහ 70 පිටුවේ පාර්ශ්වකරුවන් සමඟ සහභාගිත්වය කොටස යටතේ විස්තර කෙරේ.

වෙනස්වන වෙළෙඳපොලට හුරුවීම සහ වේගයෙන් වෙනස්වන ගනුදෙනුකරුවන්ගේ ඉල්ලුම පිළිබඳ අවශ්‍යතා සහ අපේක්ෂාවන් සපුරාලිම සඳහා, නව්‍යකරණය දරාගන්නා සහ එයට සහයවන සංස්කාතියක් අපි දිරිගන්වමු. කාර්යයන් වෙනස්ව සිදුකිරීමට. වෙළෙඳපොල අවශ්‍යතා සපුරාලිමට සහ ක්‍රියාවලි, සේවකයින් සහ ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා වෙනස්වන තාක්ෂණයන්ට හැඩ ගැසිමට අපි නිත්‍ය වශයෙන් උත්හාස කරමු. අපගේ ස්ථිර උත්සාහය වූයේ  අපගේ සේවකයින් සඳහා පුහුණුව සහ සංවර්ධනය තුළ ආයෝජනය කරමින් බැංකුව පුරා නව්‍යකරණ සංස්කෘතියන් ඉදිරියට ගෙන යාමයි. අඛණ්ඩව වෙනස්වන මෙහෙයුම් පරිසරයකට කාර්යක්ෂමව ප්‍රතිචාර දැක්වීමට අපව ශක්තිමත් කරන දක්ෂ, පළපුරුදු, සහ තාක්ෂණිකව සුදුසුකම්ලත් සේවකයින්, සහ ක්ෂේත්‍රයේ නායකයින් සහ ප්‍රවීණයින් නිර්මාණය කිරිමට මෙය මඟ පාදා ඇත. වසර තුළ කොරියාවට සංක්‍රමණය වන සේවකයින් සඳහා පිටත්විමට පෙර ණය යෝජනා ක්‍රමයක් අපි දියත් කළෙමු.

අපි ජාතික ආයතනයක් වන බැවින්, දේශිය ප්‍රජාව සමඟ සම්බන්ධවිම සහ ඔවුන්ට ආපසු යම්දෙයක් ලබාදීම අපගේ ආයතන සංස්කාතියේ වැදගත් කොටසකි. ජාතික සහ ප්‍රජා සංවර්ධනයට අපගේ බැඳීම සහ සමාජීය සම්බන්ධතා ප්‍රාග්ධනය  පිළිබඳ වැඩි විස්තර පිටු අංක 158 සිට 161 දක්වා විස්තර කෙරේ.


## පද්ධති සහ ක්‍රියාවලි ශක්තිමත් කිරීම

### තාක්ෂණික හැකියාව පුළුල් කිරීම/ ඩිජිටල් දැනුම කළමනාකරණය

ඩිජිටල් බැංකුකරණයේ වෙනස්වන ප්‍රවණතාවන්ට හුරුවීම සඳහා අපගේ උත්හායන් තුළ, අපගේ ඩිජිටල් හැකියාවන් වැඩි කිරීම සඳහා නවීන පන්නයේ තාක්ෂණය තුළ ආයෝජනය අපි ආරම්භ කර ඇත. ජාත්‍යන්තරව පිළිගත් ටී 24 මධ්‍ය බැංකුකරණ විසඳුම සඳහා සංක්‍රමණය අපට ස්ථිර තරඟකාරී වාසියක් ලබා දෙමින් අපගේ සමස්ථ බැංකුකරණ මෙහෙයුම් වඩාත් කාර්යක්ෂම, ඵලදායී සහ කඩිසර බවට පත්කරනු ඇත. වැඩි විස්තර 117 සිට 119 දක්වා පිටුවල නිෂ්පාදන ප්‍රාග්ධනය කොටස යටතේ විස්තර කෙරේ.

නව තාක්ෂණයන්හි ආයෝජනය කිරීමට අමතරව. අපගේ වෙළෙඳපොල අවකාශයයෙහි ඩිජිටල් සහ දත්ත විශේෂඥයින්ගේ අවශ්‍යතාව පිරවීමට නව දක්ෂතාවයන් තියුණු කිරීමට සහ අත්කර ගැනීමට අපගේ මානව ප්‍රාග්ධනය සංවර්ධනය තුළ අපි අඛණ්ඩව ආයෝජනය කරමු. අපගේ ශක්තිමත් තොරතුරු තාක්ෂණයට සහයවීම සඳහා යෙදුම් සංවර්ධනය සහ තොරතුරු ආරක්ෂාව තුළ විශේෂඥයින්ගේ සමාලෝචනය යටතේ වසර තුළ තොරතුරු තාක්ෂණ විශේෂඥයින් 12 ක් බඳවා ගනු ලැබීය. මෙම ප්‍රවිණයින් වැඩිවන ඉල්ලුම සහ ගනුදෙනුකාර අපේක්ෂාවන් සපුරාලීමට නව නිෂ්පාදන නව්‍යකරණ සහ නිෂ්පාදන පුළුල්කිරීම් සඳහා වගකීමට බැඳී සිටී.

අපගේ තොරතුරු තාක්ෂණ අංශය අපගේ නව ඩිජිටල් පදනම් විසඳුම් ක්‍රියාත්මක කිරීමට සහ ජාත්‍යන්තර මනා පරිචයන්ට අනුකූලව සියලුම තොරතුරු තාක්ෂණ මෙහෙයුම් ප්‍රමිතිගත කිරීමට බඳවා ගැනීමේ ක්‍රියාවලිය සිදුකරන ලදී. මෙම සංකීර්ණතාවට සහ අළුතින් එකතුකළ කාර්යයන්ට සහයවීම පිණිස, බැංකුවේ තොරතුරු තාක්ෂණ යාන්ත්‍රණය අනෝන්‍ය වශයෙන් රඳා පවත්නා කොටස් හයකට කැබලි කරන ලදී. කොටස් සහ ඒවායේ වගකීම් පහතින් දක්වේ.




### මෙහෙයුම් අනර්ඝත්වය වැඩි කිරීමට අපගේ පද්ධති සහ ක්‍රියාවලි ඉහළ නැංවීම

ආරක්ෂිත, සුරක්ෂිත සහ විශ්වාසදායී බැංකුකරණ පද්ධති නගාසිටුවීමට සහ මෙහෙයුම් අනර්ඝත්වය තුළින් ගනුදෙනුකාර අත්දැකීම වැඩි කිරීමට ශක්තිමත් ක්‍රම සහ ක්‍රියාවලි පවත්වා ගැනීම අත්‍යවශ්‍යය. අනවශ්‍ය කාලය අඩුකිරීමට, කාර්යක්ෂමතාව සහ ගනුදෙනුකාර සේවා ප්‍රමිති වැඩි කිරීමට අපගේ ක්‍රම අඛණ්ඩව සමාලෝචනය කර ගලපනු ලබයි. විශෙෂයෙන්. අපගේ තොරතුරු ආරක්ෂා කරගැනීම සහ තාක්ෂණය වේගයෙන් වෙනස් වන සහ ආරක්ෂක තර්ජන වේගයෙන් වැඩිවෙමින් පවත්නා පරිසරියක් තුළ තිරණාත්මක ව්‍යාපාර කාර්යයක් වන අපගේ පද්ධතිවල අවංකකම පවත්වා ගැනීම කෙරෙහි අපි අවධානය යොමු කරමු. ආරක්ෂක යටිතල පහසුකම් ඉහළ නැංවීමට සහ ආයතනික ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි කාලිනව යාවත්කාලීන කිරීමට විධිමත් ආයෝජන තුළින්, අවදානම අවම කිරීමට අපි උත්සාහ ගනිමු. සමාලෝචිත වසර තුළ, පද්ධති ඒකාබද්ධකරමින් සහ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය, ඩිජිටල්කරණය සහ සරල කිරීම තුළින් අපගේ භාවිතයන් සංවර්ධනය තුළ අපි සංධිස්ථාන ගණනාවක් අත්කරගෙන ඇත.

## ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ ක්‍රමය (BCMS)

බැංකුව ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ රාමුව යාවත්කාලීන කරන ලද අතර, ඉන් යම් ව්‍යාපාර බිඳවැටීමකදී ව්‍යාපාර මෙහෙයුම්වල අඛණ්ඩතාව සහතික කරයි. පහත සඳහන් තොරතුරු අදාළ අංශ සමඟ සහයෝගිත්වයෙන් වැඩි දියුණු කරන ලදී. මෙයට කාර්යාත්මක අයකරගැනීමේ ක්‍රියාපටිපාටි, ව්‍යාපාර බලපෑම් ඇගයීම සහ අංශය තුළ සියලුම නිලධාරීන්ගේ ඇමතුම් විස්තර ඇතුළත් ඇමතුම් පොත ඇතුළත් වේ.

## නිෂ්පාදන දත්ත මධ්‍යස්ථානය

දත්ත කේන්ද්‍රීය ගනුදෙනුකාර අත්දැකීම ඩිජිටල් ආර්ථිකයක් තුළ තරඟකාරී වාසියක් ලබාගැනීමට ප්‍රධාන වන බව අපි අවබෝධ කරගනිමු. අපගේ (TIA 942 Tier III) ජාත්‍යන්තර ප්‍රමිතිය මත පදනම් ව්‍යුහගත අංග සම්පූර්ණ දත්ත මධ්‍යස්ථානය වසර තුළ නිම කරන ලදී. දත්තවල පරිමාව සහ ධාරිතාව සහ එහි ගබඩාව කාර්යක්ෂම අයුරින් කළමනාකරණයට මෙයින් පහසුකම් සපයා ඇති අතර එය 360º ගනුදෙනුකාර දැක්මක් ඇතිකරගැනීමට සහ පහසු ගනුදෙනුකාර අත්දැකීමක් ලබාදීමට අත්‍යවශ්‍යය. දත්ත මධ්‍යස්ථානය අපගේ සේවාන්හි වේගය, විශ්වාසනීයත්වය. සහ ඵලදායි ඒකාබද්ධ බැංකුකරණ සේවාවක් ලබා ගැනීමේ හැකියාව ඉහළ නංවන අතර අභ්‍යන්තර සේවා අනර්ඝත්වය වැඩිකරයි.

## ක්‍රියාත්මක කරමින් පවතින අපගේ අනෙකුත් පද්ධති

- මුදල් විශුද්ධිකරණ විරෝධී ගනුදෙනුකාර විසඳුම, අසාදු ලේඛනගත ගනුදෙනුකරුවන් හඳුනා ගැනීම පහසුකිරීමට ක්‍රියාත්මක කරන ලදී. මෙම ක්‍රමය මධ්‍ය බැංකුකරණ විසඳුම් ක්‍රියාත්මක කිරීම සමඟ තවදුරටත් වැඩි කරනු ලැබේ. (වැඩි විස්තර සඳහා 119 පිටුවේ නිෂ්පාදිත ප්‍රාග්ධනයඃ මුදල් විශුද්ධිකරණ විසඳුම පිළිබඳ බලන්න.)
- අභ්‍යන්තරව වැඩි දියුණු කළ මුදල් කළමනාකරණ ක්‍රියාවලිය Cash@Ease ක්‍රමය ක්‍රියාත්මක කිරීම සමඟ ක්‍රමවත් කරන ලදී. (වැඩි විස්තර සඳහා 119 පිටුවේ නිෂ්පාදිත ප්‍රාග්ධනය (Cash@Ease පිළිබඳ බලන්න.)
- වඩා ඉහළ මට්ටමක් දක්වා බැංකුවේ ක්‍රියාකාරිත්වයන් වර්ධනය කිරීමේ අදහස් ඇතිව අනෙකුත් ක්‍රම එනම් භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය සහ මානව සම්පත් කළමනාකරණ පද්ධතිය සමඟ මධ්‍ය බැංකුකරණ විසඳුම් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය තුළ බැංකුව නිරත වී සිටී. (වැඩි විස්තර සඳහා 118 සහ 119 පිටුවල නිෂ්පාදිත ප්‍රාග්ධනය'. අපගේ මෙහෙයුම් ක්‍රියාවලි වැඩි දියුණු කිරීම පිළිබඳ බලන්න.)
- බැංකුව ණයකාඩ්පත් සහ දත්ත ආරක්ෂාව සම්බන්ධයෙන් නව තාක්ෂණයන් හඳුන්වා දී ඇති අතර ලංකා පේ ගෙවීම් විසඳුම සංවර්ධනය කර ඇත. (වැඩි විස්තර සඳහා 117 සහ 118 පිටුවල නිෂ්පාදිත ප්‍රාග්ධනය'. අපගේ ඩිජිටල් පියසටහන් පුළුල් කිරීම පිළිබඳ බලන්න.)

## වසර තුළ අනෙකුත් ක්‍රියාවලි වැඩිදියුණු කිරීම්

- පැමිණීමේ ක්‍රියාවලිය ක්‍රමවත් කිරීම සඳහා නව ඇඟිලි සලකුණු ක්‍රමයක් බැංකුව තුළ ක්‍රියාත්මක කරන ලදී
- හදිසි මධ්‍ය ප්‍රමාණයේ ශාඛා ව්‍යාපෘතිවල ප්‍රසම්පාදනය සඳහා බලතල පැවරීම, සේවක ණය, ණය අයකරගැනීම සහ අක්‍රිය ණය සඳහා අනුමැතිය ලබාදීම
- අක්‍රිය ණය අයකරගැනීමේ ක්‍රියාපටිපාටිය සහ නීතිකරණ ක්‍රියාවලිය ක්‍රමවත් කරන ලදී. නිදසුනක් ලෙස. පාරිභෝගික ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය තුළ අනවශ්‍ය ප්‍රමාදය අඩුකර ගැනීමට. අයකර ගැනීම් ප්‍රතිපත්තියේ සමථ මණ්ඩලය කැඳවීමේ විධිවිධානය සංශෝධනය කරන ලද අතර ණය සහ ස්ථිර දේපළ උකස් මත ණය නියමයන් සහ කොන්දේසි සංශෝධන කරන ලදී
- කලාප ගණන අට දක්වා අඩු කර ප්‍රතිව්‍යුහගත කරන ලදී
- මුදල් ගනුදෙනු වාර්තාකරණ පනතට අනුකූලව සැකසහිත ගනුදෙනු පිළිබඳ වාර්තා කිරීමේ තත්ත්වය උසස් කිරීම සඳහා පියවර ගනු ලැබීය.
- අපගේ විශාල ගනුදෙනුකාර පදනම ඵලදායිව කළමනාකරණය කරමින් බැංකුව තුළ ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව සහතික කිරීමට සහය ඇමතුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන ලදී.
- අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීමේ අදහස ඇතිව උකස්කරන ක්‍රියාවලිය තුළ ශාඛා මට්ටමේ අවධානය හඳුනා ගැනීමට අවදානම සහ පාලනය ස්වයං ඇගයීමේ (RCSA) ක්‍රියාවලිය ක්‍රමවත් කරන ලදී.
- ආයතන/සංගම්/ක්‍රීඩා සමාජ සහ සමිති/ භාර/රාජ්‍ය නොවන සංවිධානවලින් ගනුදෙනුකරුවා හඳුනා ගැනීම (KYC) සඳහා වන ආකෘති ප්‍රතිනිර්මාණය කරන ලදී.
- සේවකයින් සඳහා ආපදා ණය/පාරිභෝජන ණය සඳහා අයදුම්පත් ආකෘතිය ප්‍රතිනිර්මාණය කරන ලද අතර පහසුව වැඩි කිරීමට එකක් ලෙස ඒකාබද්ධ කරන ලදී.
- ණය මුදල තැන්පතු වටිනාකම ඉක්මවන අවස්ථාවක ගනුදෙනුකරුවන්ගේ අනෙකුත් තැන්පතු ගිණුම් කරා පිවිසීමට තැන්පතුවලට අනුව ණය සඳහා අයදුම්පත් ආකෘතිය නැවත සැලසුම් කරන ලදී.

### දත්ත ආරක්ෂාව ශක්තිමත් කිරීම

නිරන්තරයෙන් අනන්‍යතාව සොරකම් කරන සහ දත්තවලට වලට අනවසරයෙන් ඇතුළුවීම නිතර සිදුවන වර්තාමන ලෝකය තුළ සයිබර් ආරක්ෂාව ඉහළ ප්‍රමුඛතාවයකි. අපගේ දත්ත ආරක්ෂා කිරීම විශේෂයෙන් ගනුදෙනුකරුවන්ගේ තොරතුරු ආරක්ෂා කිරීම අපට සියල්ලටම වඩා වැදගත්ය. දත්ත ආරක්ෂාව සහ ගනුදෙනුකාර රහස්‍යතාව තුළ යම් කඩවීමක සෘණාත්මක ප්‍රතිවිපාක අපි අවබෝධකරගෙන ඇති අතර විශ්වාසය කඩකිරීම ගනුදෙනුකරුවාට විනාශකාරී විය හැකි අතර එය අපගේ හැකියාව කෙරෙහි පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය මත විශාල බලපෑමක් විය හැකිය. කාඩ්හිමියන්ගේ දත්ත ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අපගේ උත්සාහය තුළ, 2019 දී ගෙවීම් කාඩ් ක්ෂේත්‍රයේ දත්ත ආරක්ෂක ප්‍රමිතිය (PCI DSS) අපි ලබාගත් අතර ඒ සමගම PCI DCC අනුකූල වූ ශ්‍රී ලංකාවේ පළමු රාජ්‍ය බැංකුව බවට ජාතික ඉතිරි කිරීමේ බැංකුව පත්විය. එය කාඩ් මෙහෙයුම් සඳහා විශේෂ තාක්ෂණික සහ මෙහෙයුම් පාලන සහ අදාළ තොරතුරු පද්ධති මත පදනම් වූ ගෙවීම් කාඩ් ආරක්ෂාව සඳහා වඩාත් පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතියකි. අනුකූලතාව පිළිබඳ සහතික කිරීම දැඩි ක්‍රියාවලියක් වන අතර එහිදී අදාළ සියලුම මෙහෙයුම් සහ තාක්ෂණික ක්ෂේත්‍රවලින් ඉහළ මට්ටමේ බැඳීමක් ඉල්ලුම් කරයි. අප විසින් නිකුත් කළ මාස්ටර් කාඩ් හෝ විසා බ්‍රෑන්ඩඩ් කාඩ් භාවිතා කරන මිලියනයකට වැඩි කාඩ්පත් හිමියන්ගේ දත්ත ආරක්ෂාව අප වැඩි කර ඇත. මෙය කාඩ්පත් හිමියන්ගේ දත්තවලට අදාළ අපගේ තොරතුරු තාක්ෂණ පද්ධති, ක්‍රියාවලි සහ ක්‍රියාපටිපාටි ගෝලීය වශයෙන් පිළිගත් ආරක්ෂිත ප්‍රමිතිවලට අනුකූල වන බව සහතික කිරීමට අප විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගවල

ප්‍රතිඵලයකි. අපි ගොණුවල අවංකකම නියාමන (FIM) මෘදුකාංගය ක්‍රියාත්මක කළ අතර එය අඛණ්ඩ පදනමක් මත අපගේ මෙහෙයුම් පද්ධතිය (OS), දත්ත පදනම, සහ යෙදුම් මෘදුකාංග ගොණුවල අවංකකම වලංගු කිරීමට තොරතුරු ආරක්ෂණ යටිතල පහසුකමකි. බහු සාධක සත්‍ය බව සහතික කිරීමක් (MAF) ක්‍රියාත්මක කිරීම් මගින්, දුරස්ථ ප්‍රහාරවලින් අපි බැංකුව ආරක්ෂා කරගෙන ඇත. උවදුරට පත්වීම් හඳුනා ගන්නා අතර අපගේ ජාල අවහිරවීම, එන්ඩ්පොයින්ට්ස්, ලොග්ස් සහ ආරක්ෂක අවස්ථා නියාමනය කිරීමට ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථාන තාක්ෂණය භාවිතයෙන් වලක්වනු ලබයි.

ශ්‍රී ලංකා මහ බැංකුව 2019 සිට 2020 දක්වා ක්‍රියාත්මක කිරීමේ කාලරාමුවක් සහිතව තාක්ෂණිකමය ප්‍රත්‍යස්ථිතිය වර්ධනය කිරීමට මාර්ග සැලැස්මක් නිකුත් කරන ලදී. ඒ අනුව. එහි දක්වා ඇති සියලුම සන්ධිස්ථාන සමඟ බැංකුව සමාන්තරව සිටින අතර 2020 දී අඛණ්ඩව ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරනු ලැබේ.

## සම්මානයන් සහ පිළිගැනීම්

අපගේ සන්නාමය ජාතික ඉතිරි කිරීමේ බැංකුව මත ප්‍රදානය කරන විවිධ පිළිගැනීම් මගින් සැම වසරකම අපව ශක්තිමත් කරයි.

වැඩිකළ පාර්ශ්වකාර වටිනාකම ලබාදීමට, සහ අපගේ තිරසාරභාවය ශක්තිමත් කිරීමට අපගේ සියලුම මෙහෙයුම්වල අනර්ඝත්වය අත්කර ගැනීම සඳහා අපි උත්සුක වෙමු. අපගේ ගමන්මග තුළ අප ලද පිළිගැනීම දිරිමත් කිරීමක් සහ අපගේ කළමනාකරණ ප්‍රවේශයේ සාර්ථකත්වය පිළිබඳ සාක්ෂියකි. 2019/20 වසර තුළ, පහත ප්‍රදාන අප වෙත තිළිණ කර ඇත.

**Bestweb.lk** සම්මානය



විශිෂ්ඨතම බැංකුකරණය හා මූල්‍ය වෙබ් අඩවිය – ලෝකඩ සම්මානය

ටෙක්නෝවේෂන් සම්මානය 2019



ගනුදෙනුකාර පහසුව තුළ අනර්ඝත්වය සඳහා වසරේ බැංකුව – කුසලතා සම්මාන



මූල්‍ය අන්තර්කරණය සඳහා වසරේ බැංකුව – කුසලතා සම්මාන

විශිෂ්ඨතම සේවායෝජක සන්නාම සම්මානය 2019






විශිෂ්ඨතම දෙමළ වෙබ් අඩවිය – කුසලතා සම්මානය

**ගණකාධිකාරිවරුන්ගේ දකුණු ආසියානු සම්මේලනයේ (S FA) BPA වාර්තා සම්මානය සහ ආයතනික පාලන අනාවරණ 2018 සඳහා SAARC සංවත්සර සම්මානය**



රාජ්‍ය අංශයේ බැංකුකරණ ආයතන – ජයග්‍රාහක

**CA** ශ්‍රී ලංකා 55 වැනි වාර්ෂික වාර්තා සම්මානය 2019



රාජ්‍ය බැංකු – රිදී සම්මානය

## ARC වාර්ෂික වාර්තා සම්මාන 2019




"ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම" සහ "මූල්‍ය තොරතුරු" සඳහා ඉහළම සම්මාන




මූල්‍ය දත්තඃ පාඨයඃ බැංකු ඉතුරුම් සහ ණය – රන් සම්මානය




ඉන්පොග්‍රැපික්ස්ඃ බැංකුඃ ඉතුරුම් සහ ණය – රන් සම්මානය




ලිඛිත පාඨය බැංකුඃ ඉතුරුම් සහ ණය – රිදී සම්මානය




සභාපති/ සභාපතිගේ ලිපියඃ බැංකුඃ ඉතුරුම් සහ ණය – ලෝකඩ සම්මානය




අභ්‍යන්තර සැලැසුම බැංකුඃ ඉතුරුම් සහ ණය – ලෝකඩ සම්මානය




මුද්‍රණය සහ නිෂ්පාදනයඃ බැංකුඃ ඉතුරුම් සහ ණය – ලෝකඩ සම්මානය

## පස්වන CMA විශිෂ්ඨත්වය පිළිබඳ ඒකාබද්ධ වාර්තාකරණය 2019







රජයට අයත් ව්‍යවසාය/ව්‍යාපාර සඳහා වූ විශිෂ්ඨතම සම්මානය සහ ඉහළම විශිෂ්ඨ ඒකාබද්ධ වාර්තා 10 අතර පැවතීම

## අනාගත ප්‍රමුඛතා

### කෙටිකාලීන

ඔරකල් පද්ධතිය සඳහා උකස් පද්ධති දත්ත සංක්‍රමණය

පසු පෙළ මෙහෙයුම් සඳහා අභ්‍යන්තර ලේඛණ කළමනාකරණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම

ඵලදායිතාව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීමට ශාඛාවල එස් 5 ක්‍රියාත්මක කිරීම

ඊ-වාණිජ්‍ය සඳහා ලබාගතහැකි ඉහළම ආරක්ෂක ප්‍රමිතිය වන 3DS2.0 ප්‍රශස්ථ කරමින් අපගේ කාඩ් පදනම පුළුල් කිරීම කෙරෙහි අවධානය

### මධ්‍ය කාලීන

ඊ-ඉගෙනුම් අවස්ථාව හඳුන්වාදීම

ඉලක්ක පදනම් ක්‍රමයට කාර්යසාධන කළමනාකරණ ක්‍රමය

පරිණාමන ඩිජිටල් පරිසරය සමඟ වෙනස කළමනාකරණය


මධ්‍ය කාර්යාල සහ පසු පෙළ ස්වයංක්‍රීයකරණය/කාර්යක්ෂමතාව වැඩි කිරීම

QR කේත ජංගම ගෙවීම් ශක්තිමත් කිරීම

වැඩි දියුණු කළ ගනුදෙනුකාර අත්දැකීම ලබාදීමට සහ බැංකුවේ තිරසාරභාවය ශක්තිමත් කිරීමට ඩිජිටල් බැංකුකරණ විසඳුම ක්‍රියාත්මක කිරීම

### දිගුකාලීන

සමස්ථ බැංකුව සඳහා විශාල දත්තවල විභවතාව සන්නද්ධ කිරීම



# මානව ප්‍රාග්ධනය

**මානව ප්‍රාග්ධනය අපගේ බැංකුවේ වඩාත්ම වටිනා වත්කමයි. ඉතා දක්ෂ සහ කාර්යයේ නියුතු ශ්‍රමබලකායක් පෝෂණය කිරීමෙන් අපගේ ආයතනික පරමාර්ථ කාර්යක්ෂමව අත්කර ගැනිමට සහ අපගේ සියලූම පාර්ශ්වකරුවන් වෙත වටිනාකම නිර්මාණය කර ගැනිමට හේතු වේ.**

## එයට ඇතුළත් දෑ

අපගේ මානව ප්‍රාග්ධනය යනු අපගේ සේවකයින්ගේ පළපුරුද්ද, දක්ෂතාව, යහපැවැත්ම සහ සහභාගිත්වයේ වටිනාකමයි.

## යෙදවුම්

- පුහුණුව සහ සංවර්ධනය
- ධනාත්මක සේවා පරිසරය
- ස්ථාවර ස්ථිර සේවක සම්බන්ධතා
- වැදගත් දක්ෂතා සහ අනුප්‍රාප්ත සැලසුම්කරණය සංවර්ධනය
- කාර්යසාධනය සහ හැකියා කළමනාකරණය
- සේවය සැපයීම වර්ධනය කිරිමේ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි

අපගේ සේවකයින්ට ඔවුන්ගේ කාර්යභාරයන් ඉටු කිරීමට සුදුසු දැනුම, පුහුණුව සහ දක්ෂතාව ඇති බව සහතික කරමින් අපගේ සේවකයින් සමඟ අපි සම්බන්ධ වෙමු.

වගකීම් සහගත සේවායෝජකයෙක් ලෙස, අපගේ සේවකයින්ගේ විවිධත්වය අපි දිරිමත් කරන අතර, යහපත් සෞඛ්‍ය සහ ආරක්ෂාව ප්‍රවර්ධනය කරන පුද්ගල සංවර්ධනය සඳහා අවස්ථාවන් ලබාදෙන සේවා පරිසරයක් පිරිනමමු. විවිධත්වය පිළිබඳ සංස්කෘතියක් ප්‍රවර්ධනය කරමින්, කණ්ඩායම් කාර්යසාධනය සහ නව්‍යකරණය සඳහා හැකියාව අපි වැඩි කර ඇත. අපගේ සේවකයින්ට කටයුතු කිරීම සඳහා සහය වීමට අපි සකස් කරන ලද ප්‍රමිති, ප්‍රතිපත්ති සහ මඟ පෙන්වීම් තුළ අපගේ සාරධර්ම ඇතුළත් කර ඇත.

## මානව ප්‍රාග්ධනයේ වටිනාකම ඉහල නැංවීමේ උපාය මාර්ග

- වෘත්තිය සංවර්ධනය සහ තෝරා ගැනිම සහ අභ්‍යන්තර ක්‍රියාවලිය තුළ කුසලතා පදනම් නිර්ණායක ප්‍රවර්ධනය කිරීම
- සේවකයින්ගේ සංවර්ධනය තුළ ආයෝජනය කිරීම තුළින් සහ වෘත්තීය වර්ධන අවස්ථා පිරිනැමීම තුළින් ඔවුන් සවිබලගැන්වීම
- සේවකයින්ට සෞඛ්‍ය සහ නීරෝගි වැඩසටහන් රාශියක් සහ සේවාවන් ලබාදීම

## වටිනාකම එකතුකරන ආකාරය

ඉතා දක්ෂ සහ සේවයේ නියුතු සේවකයින් අපගේ ව්‍යාපාර කාර්යසාධනය සාර්ථකව ඉදිරියට ගෙන යමින් අපගේ ගනුදෙනුකරුවන් අවබෝධ කරගෙන සේවය කිරීමේ හැකියාව වර්ධනය කරයි. ආයතනික පරමාර්ථ අත්කර ගැනිමට සහ අපගේ සියළුම පාර්ශ්වකරුවන්ට වටිනාකම එකතු කිරීම සඳහා අපගේ උපාය මාර්ග ඵලදායි ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට ඔවුන් පහසුකම් ඇති කරයි. ඔවුන් වේගයෙන් සහ අනපේක්ෂිත සංවර්ධනයන් සිදුවන ගතික සහ කලින් කිව නොහැකි පරිසරයක් තුළ වටිනාකම් නිර්මාණය සිදු කරයි.

## අපගේ ප්‍රවේශය

සැම සේවකයෙකුටම වැඩ කරන සේවා සංස්කෘතියක් නිර්මාණය කිරීමට අපි උත්සාහ ගන්නා අතර ඒ තුළ පුද්ගල සහ වෘත්තීය වර්ධනය සඳහා අවස්ථාවන් සහිත ආරක්ෂිත සේවා පරිසරයක් කරා සේවකයින්ට පිවිසුමට ඉඩ ඇත. සේවක සහභාගිත්වය, ව්‍යාපාර කාර්යසාධනය සහ ගනුදෙනුකරුවන්ට සේවය කිරිමේ හැකියාව අතර ඍජු සම්බන්ධතාවයක් ඇති බව අපි විශ්වාස කරමු. එමනිසා, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තම වෘත්තිය කාලය පුරා ධනාත්මක සේවක අත්දැකීමක් වෙනුවෙන් අපි කැපවී සිටිමු.


## 2019 සඳහා ප්‍රධාන අභියෝග සහ අවස්ථාවන්

**ප්‍රධාන අභියෝග**

- වයස්ගත ශ්‍රම බලකාය සමඟ බද්ද වූ නව තාක්ෂණික ප්‍රවණතාහි සුදුසුකම් ලත් ශ්‍රම බලකායේ හිඟය
- බැංකුවේ පරමාර්ථ අත්කර ගැනිමට තාක්ෂණයෙන් දැනුමැති සම්ප්‍රදායික බව අඩු නව පරම්පරාවේ ශ්‍රම බලකායක් හා සම්බන්ධවීම
- වඩාත් සුදුසුකම් සහිත, විවිධ දක්ෂතා ඇති දක්ෂ සේවකයින්ගේ ඉහළ වැටුප් හා ප්‍රතිලාභ අපේක්ෂාවන් වැඩිවීම
- වෘත්තිය සමිති සහ දේශපාලන තලයේ බලපෑම් මානව සම්පත් කළමනාකරණයේ යහ භාවිතයන් වලට බාධා කිරීම
- නව තරඟකරුවන්ගේ සහ නව ශ්‍රම වෙළෙඳපොල ප්‍රවණතාව වැඩිවිම තුලින් මානව සම්පත් කළමනාකරණය සහ මෙහෙයවීම සඳහා නවීන දක්ෂතා අවශ්‍යවීම

**අවස්ථා**

- ඉතා දක්ෂ සහ සුදුසුකම් සහිත තරුණ සේවකයින් ආකර්ෂණය කර ගැනිමේ හැකියාව.
- සේවයේ නිරත රඳවා තබාගත් ගුණාත්මකභාවයෙන් ඉහළ සේවකයින් හරහා ඵලදායිතාවය වර්ධනය වීම.
- වර්තමාන සහ අනාගත අවශ්‍යතා සපුරාලිමට විවිධ සහ පළපුරුදු දක්ෂයින්.
- ශ්‍රී ලංකා රැකියා වෙළෙඳපොල තුළ මානව හැකියාවන් සහ නිෂ්පාදන හැකියාව වැඩි කර වර්ධනය කිරීම.



- යහපත් රැකියා-ජීවිත තුලනයකට සහය වෙමින් සේවක පළපුරුද්ද සහ පක්ෂපාතිත්වය ඉහළ නැංවීම.
- වේගයෙන් වෙනස්වන පරිසරය තුළ අපගේ සේවකයින්ට කඩිසරවීමට සහ එයට අදාල අයුරින් අනුවර්තනය වීමට ඉඩ සැලසීම.

## ප්‍රමාණාත්මක කරුණු




## අදාළ ඇල්මැති පාර්ශ්වකරුවන්



## කෙටි හා මධ්‍ය කාලීන උපාය මාර්ගික ප්‍රමුඛතා



## වටිනාකම් නිර්මාණයේ මූලිකාංග




## වැදගත් සිදුවීම්




**296**

නව බඳවාගැනීම්



**91.6%**

සාමූහික ගිවිසුමෙන් ආවරණය




**28.4%**

බැංකුව තුළ වසර 10ට වැඩි පළපුරුද්ද සහිත සේවකයින්



**55%**

කාන්තා සේවකයින් (ස්ථිර)



**98.1%**


රඳවාගැනීමේ අනුපාතය

## මිනුම් දර්ශකය

| | වැඩිවීම/ අඩුවීම | **2019** | 2018 |
|---|---|---|---|
| සේවකයින් ගණන | 188 | **4319** | 4131 |
| පුහුණුව සහ සංවර්ධනය තුළ ආයෝජනය (රු.මි.) | 1.7 | **40.3** | 38.6 |
| එක් සේවකයෙකුගේ සාමාන්‍ය පුහුණු කාලය (පැය) | (6) | **7** | 13 |
| කාන්තා සේවකයින් ගණන | 76 | **2380** | 2304 |
| එක් සේවකයෙකුගේ සාමාන්‍ය ආදායම (රු.මි.) | 1.1 | **28.2** | 27.1 |
| රඳවාගැනීමේ අනුපාතය (%) | 0.2 | **98.1** | 97.9 |
| සේවක පිරිවැටුම් අනුපාතය (%) | (0.2) | **1.9** | 2.1 |


## අනෙකුත් ප්‍රාග්ධනයන්ට සම්බන්ධතාවය

මානව ප්‍රාග්ධනය බැංකුවේ එක් එක් ප්‍රාග්ධනයන්ට සහ ප්‍රාග්ධනයන් වෙතින් බලපෑමට ලක්වෙයි.




## විභව සමතුලිතතා

- රැකියා අවස්ථාවන් ලබාදීම සහ නව සේවකයින් බඳවාගැනීම
- පුහුණුව හා සංවර්ධනයඃ ගනුදෙනුකාර සේවය, නව්‍යකරණය, මෙහෙයුම් අනර්ඝත්වය සහ ආයතනික සංස්කෘතිය සහ වටිනාකම් තුළ හැකියාවන් ගොඩනැගීම




↑ වැඩිවීම ↓ අඩුවීම

## තිරසාර සංවර්ධනය පරමාර්ථ සඳහා දායකත්වය

1 NO POVERTY — රැකියා අවස්ථා ලබාදෙමින් ආර්ථික සංවර්ධනයට සහයවීම

2 ZERO HUNGER — සෘජු රැකියා අවස්ථා ලබාදෙමින් සේවකයින්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම

4 QUALITY EDUCATION — පුහුණුව සහ සංවර්ධනය තුළින් විශේෂ දක්ෂතා සංවර්ධනය කිරීමෙන් සේවකයින් සඳහා නව මාවත් බිහිකිරීම

5 GENDER EQUALITY — ශ්‍රම බලකායට වැඩිපුර කාන්තාවන්ගේ ප්‍රවේශය දිරිගැන්වීමේ අවස්ථා ඇති කිරීම

8 DECENT WORK AND ECONOMIC GROWTH — අපගේ සේවකයින්ට ආරක්ෂිත, උපකාරී සහ අගනා ප්‍රතිඵල ලබාදෙන සේවා පරිසරයක් සහතික කිරීම සහ දේශීය සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන් සඳහා ආර්ථික වර්ධනය ඇති කිරීම

10 REDUCED INEQUALITIES — කාන්තා සහභාගිත්වය සඳහා උපකාරීවන පරිසරයක් නිර්මාණය කිරීම


## නිමවුම්

- වෘත්තිමය වශයෙන් වඩා දක්ෂ සේවකයින්
- ඉහළ රඳවාගැනීමේ අනුපාතය
- අභිප්‍රේරිත සහ සේවයේ නියුතු සේවකයින්
- කඩිසර ශ්‍රම බලකාය
- විවිධත්වය සහ සියළු දෙනා ඇතුලත්


GRI 102-8, 401-1

## අපගේ කණ්ඩායම

සේවකයින් බැංකුවේ කොඳු නාරටිය සහ ශක්තිය වන අතර අපගේ දිගුකාලීන සාර්ථකත්වයට සහ තිරසාරාත්වයට අත්‍යවශ්‍යය. අපගේ විවිධ වූ ශ්‍රමබලකාය 2019 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් සේවකයින් 396ක් සහ ස්ථිර සේවකයින් 4,319 ක් ඇතුළුව 4,715 ක සේවකයින්ගෙන් සමන්විත විය. වසර තුළ, නව සේවකයින් 296ක් බැංකුවේ පවුලට පිළිගනු ලැබීය. කාන්තා සේවකයින්ගේ ගණන 76 කින් වසර තුළ වැඩි විය. අපගේ රඳවා ගැනීමේ අනුපාතය 98.1% ක් වන ඉහළ රඳවා ගැනීමේ අනුපාතයකි. මේ තුළින් බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්තිවල ඵලදායිත්වය සහ අපගේ සේවකයින්ගේ වටිනාකම පිළිබිඹු කරයි. අපගේ සේවකයින්ගෙන් 28.4% කට වැඩි පිරිසක් වසර 10 කට වඩා බැංකුවේ සේවය කර ඇති අතර ඒ තුළින් ආයතනය කෙරෙහි අපගේ සේවකයින්ගේ විශ්වාසය සහ පක්ෂපාතිත්වය පිළිබිඹු කරයි. පහතින් දැක්වෙන්නේ 2019 දී බැංකුවේ ශ්‍රමබලකාය පිළිබඳ විස්තරාත්මක සංඛ්‍යාලේඛන නියෝජනයකි:





නව බඳවාගැනීම්වල සංයුතිය





A – කාන්තා – 48%
B – පිරිමි – 52%


## සේවක වර්ගය සහ ස්ත්‍රීපුරුෂභාවය අනුව සේවක ප්‍රභේදනය




## ශ්‍රේණි සංයුතිය





## කාර්ය මණ්ඩල ශ්‍රේණි සංයුතිය – 2019




A – ජ්‍යෙෂ්ඨ ශ්‍රේණිය – 1%
B – කළමනාරුවන් – 15%
C – විධායක නිලධාරීන් – 28%
D – මාණ්ඩලික සහකාර – 44%
E – කාර්යාල සහයකයින් – 12%


## රැකියා වර්ගය





| | 2019 % | 2018 % |
|---|---|---|
| A – ස්ථිර | **91.60** | 91.56 |
| B – කොන්ත්‍රාත් | **8.40** | 8.44 |

| 2019 | අවුරුදු 25 ට අඩු | | අවුරුදු 25-35 | | අවුරුදු 36-45 | | අවුරුදු 46-55 | | අවුරුදු 55ට ඉහළ | | මුළු ගණන | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ශ්‍රේණි කාණ්ඩය | පිරිමි | කාන්තා | පිරිමි | කාන්තා | පිරිමි | කාන්තා | පිරිමි | කාන්තා | පිරිමි | කාන්තා | පිරිමි | කාන්තා |
| ජ්‍යෙෂ්ඨ ශ්‍රේණිය | – | – | 1 | – | 4 | 1 | 5 | 8 | 7 | 7 | 17 | 16 |
| කළමනාරුවන් | – | – | 74 | 104 | 87 | 74 | 119 | 125 | 35 | 40 | 315 | 343 |
| විධායක නිලධාරීන් | 4 | 16 | 248 | 434 | 196 | 173 | 42 | 74 | 12 | 5 | 502 | 702 |
| මාණ්ඩලික සහකාර | 21 | 90 | 455 | 1,114 | 71 | 96 | 40 | 8 | 6 | 1 | 593 | 1,309 |
| කාර්යාල සහයකයින් | 59 | 2 | 282 | 4 | 114 | 4 | 43 | – | 14 | – | 512 | 10 |
| **මුළු ගණන** | 84 | 108 | 1,060 | 1,656 | 472 | 348 | 249 | 215 | 74 | 53 | 1,939 | 2,380 |


## ස්ත්‍රී පුරුෂභාවය අනුව සේවා කාලය




## ශ්‍රේණිය අනුව සේවා කාලය





## ස්ථිර සේවකයින්ගේ සේවා කාලය





A – වසර 5 ට අඩු – 48%
B – වසර 5-10 – 24%
C – වසර 11-15 – 16%
D – වසර 16-20 – 1%
E – වසර 21 ට වැඩි – 11%


## ස්ත්‍රී පුරුෂභාවය අනුව භූගෝලීය බෙදීම




## ස්ථිර කාර්ය මණ්ඩලය තුළ වෘත්තීමය සුදුසුකම්ලත් සේවකයින් – 2019




## ස්ත්‍රී පුරුෂභාවය අනුව ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය – 2019




GRI 202-2, 401-1


## වඩාත් සුදුසු දක්ෂයින් ආකර්ෂණය

අප ආයතනයේ සාර්ථකත්වය සේවයට කැපවූ සේවකයින් විසින් ඉදිරියට ගෙන යන අතර අවශ්‍ය දැනුම, දක්ෂතාවන් ඔවුන් සතු වේ. එම නිසා, දැඩි බඳවා ගැනීමේ ප්‍රතිපත්තියක් යොදා ගනිමින්, නිවැරදි රැකියාව සඳහා නිවැරදි අපේක්ෂකයා ආකර්ෂණය කර ගැනීමට අපි උත්සාහ දරමු. සියළුම බඳවා ගැනීම් අනුග්‍රහය, පක්ෂපාතිත්වය, වෙනස් කොට සැලකීම නොමැතිව සාධාරණ සහ විවෘත තරඟ තුළින් කුසලතාව මත පදනම් වේ. තරඟකාරී විභාග හා ඉන්පසු සම්මුඛ පරීක්ෂණ ඇතුළත් බඳවාගැනීමේ ක්‍රියාවලි විනිවිද ආකාරයකින්

පවත්වනු ලබයි. බඳවා ගනු ලැබූ සියලුම දෙනා එක් වසරක පරිවාස කාලයක් සම්පූර්ණ කිරීම අවශ්‍ය වන අතර මෙම කාලසීමාව සාර්ථකව සම්පූර්ණ කළ පුද්ගලයින් ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ගහනය කෙරේ. 2019 වසර තුළ, සේවකයින් 296ක් බැංකුවට බඳවා ගන්නා ලදී. කුසලතා පදනම් බඳවා ගැනිම පිළිබඳ අවධානය යොමු කරමින්, විශේෂ පුද්ගලයින් විශේෂයෙන් තොරතුරු තාක්ෂණ (IT) පද්ධති ශිල්පය, IT පද්ධති ආරක්ෂාව,අභ්‍යන්තර විගණනය හා මූල්‍යකරණය වැනි ක්ෂේත්‍රවල සුවිශේෂී පුද්ගලයින් අපි අඛණ්ඩව බඳවා ගනිමු. සමාන අවස්ථා සේවා යෝජකයෙක් වශයෙන්, බඳවාගැනීම්වලින් 48%ක් කාන්තාවන් විය


අපි දේශීය ප්‍රජාවගෙන් සේවකයින් බඳවා ගැනිමට කැපවී සිටින අතර, අපගේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයෙන් 100%ක් දේශීය වශයෙන් බඳවාගෙන ඇත. අපගේ විවිධ ගනුදෙනුකාර අංශ පිළිබිඹු කරන විවිධ වර්ගයේ ජනතාවක් අපි ආකර්ෂණය කර ගන්නා බව සහතික කිරීම තුළින් ගනුදෙනුකරුවන්ගේ බැංකුකරණ අවශ්‍යතාවන්ට සේවය කිරීමේදී අපගේ අදාළත්වය සහ ඵලදායිත්වය පවත්වා ගැනිම සඳහා අත්‍යවශ්‍යය. යහපත් තිරණ ගැනිම, නව්‍යකරණය සහ නිර්මාණශීලීබව ඇතිකරන විවිධ දෘෂ්ටිකෝණ එකතුකර ගැනිමට අපට සහය වේ. සේවක විවිධත්වය ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබාගනිමින් ඔවුන්ගේ අවශ්‍යතා ඵලදායිව සපුරාලිමට සහාය වේ. රටේ ප්‍රමුඛ ආයතනයක සේවය කරමින් වටිනා අත්දැකීම් ලබාගැනීමට අපගේ තරුණ පරම්පාරාවට රැකියා අවස්ථාවන් පිරිනැමීමේ අපගේ උත්සාහය තුළ, සමාලෝචිත වසර තුළ රැකියා සහ සීමාවාසික අවස්ථා 21 ක් අපි ලබා දී ඇත. අළුතින් බඳවාගත් සියළුම දෙනා සම්පූර්ණ ප්‍රාරම්භක වැඩසටහනකට සහභාගිවීම අත්‍යවශ්‍ය වන අතර, බැංකුවේ සංස්කෘතිය, වටිනාකම්, සදාචාර, මෙහෙයුම් ක්‍රියාවලි, පද්ධති සහ ව්‍යාපාර සම්බන්ධ ඔවුන් හුරු කිරීම සඳහා එම වැඩසටහන් සැලසුම් කෙරේ.

**නව පත්වීම්හි සංයුතිය**




A – කාන්තා – 48%
B – පිරිමි – 52%

**ස්ත්‍රී පුරුෂභාවය අනුව නව පත්වීම්**




GRI 404-2, 404-18

## ජයග්‍රාහි කණ්ඩායමක් පෝෂණය සහ සංවර්ධනය කිරීම

ජාතික ඉතිරි කිරීමේ බැංකුව තුළ, අපි අපගේ සේවකයින් අගයන්නෙමු. ශ්‍රී ලංකාව තුළ ප්‍රමුඛ රාජ්‍ය බැංකුවක් ලෙස, ඉතා දක්ෂ සහ කාර්යක්ෂම ශ්‍රම බලකායක් අපට ඇත්නම්, අපට අපගේ විධි නියෝගය ඉටුකරමින් අසමසම ගනුදෙනුකාර අත්දැකීමක් ලබාදීමට හැකිය. වෘත්තිමය සංවර්ධනය හා වෘත්තීය ප්‍රගතිය සේවක සහභාගිත්වය සඳහා ශක්තිමත් බලපෑමක් ලබාදෙන අතර, අපගේ ආයතනයේ පරමාර්ථ අත්කර ගැනීමට සමත් ඉතා දක්ෂ, සුදුසුකම සහ පළපුරුද්ද සහිත කණ්ඩායමක් අපට ඇති බව සහතික කරමු. එම නිසා, සේවක සංවර්ධනය දිගුකාලින ආයෝජනයක් ලෙස අපි සලකමු.

### පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය (TNA)

පුහුණු අවශ්‍යතා විශ්ලේෂණයක් පවත්වමින්, ක්‍රම කිහිපයක් භාවිතා කරමින් අපගේ සේවකයින්ගේ පුහුණු සහ සංවර්ධන අවශ්‍යතා අපි හඳුනාගනිමු. මෙයට වාර්ෂික පුහුණු අවශ්‍යතා සංගණනය, අදාළ කණ්ඩායම් නායකයින් සමඟ සම්මුඛ සාකච්ඡා, සාමාන්‍යාධිකාරී (GM)/ප්‍රධාන විධායක නිලධාරී (CEO) සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරු සමඟ උපදේශනයන් සහ ගනුදෙනුකාර පැමිණිලි සමාලෝචන, කාර්යසාධන ඇගයීම් සහ ප්‍රශ්නාවලි ඇතුළත් වේ.

අපගේ TNA ක්‍රියාවලිය:



## පුහුණුව සහ සංවර්ධනය තුළින් ඉහළ කාර්යසාධන කණ්ඩායමක් සංවර්ධනය

අපගේ සේවකයින් වෘත්තිමය සහ පුද්ගලිකව සංවර්ධනය කිරීම සහ ඔවුන්ගේ වෘත්තින් උසස් කිරිම සඳහා සහයදිම කෙරෙහි අපගේ බැඳිම පිළිබිඹු කරමින්, අපගේ සේවක සංවර්ධන වැඩසටහන් ඒකාබද්ධ කිරිමට සහ බැංකුව තුළ ඉහළ කාර්යසාධන සේවක පිරිසක් ගොඩ නැගීමට අපි සැලකියයුතු ප්‍රගතියක් සිදුකර ඇත. සේවාස්ථ, දේශීය සහ විදේශිය ස්ථානවල අභ්‍යන්තර සහ බාහිර පුහුණු, අනුග්‍රහ සහ අධ්‍යාපනික දිරිගැන්වීම් ඇතුළුව වෘත්තිය සංවර්ධන අවස්ථා රාශියක් අපගේ සේවකයින්ට අපි ලබාදෙන්නෙමු. ඔවුන්ගේ කාර්යය සහ තාක්ෂණික ප්‍රවීණත්වය ඉහළ නැංවීමට ඔවුන්ගේ වෘත්තිය ජීවන චක්‍රය පුරාම විවිධ වර්ගයේ පුහුණු අපි ලබාදෙමු. පහත සඳහන් වැඩසටහන් අළුතින් බඳවාගත් අයට වටිනා පළපුරුද්ද සහ රැකියාවට විශේෂ දැනුම ලබාගැනිමට සහ බැංකුව සමඟ දීර්ග කාලයක් සිටින සේවකයින්ගේ හැකියාවන් වැඩි කිරීමට කටයුතු කරයි.

මෙයට පහත දෑ ඇතුළත්ය:

- ප්‍රාරම්භක පුහුණුව
- සේවාස්ථ පුහුණුව
- ප්‍රතිපෝෂණ මගින් ඉගෙනුම
- තාක්ෂණික කුසලතා සංවර්ධනය
- මෘදු කුසලතා සංවර්ධනය
- නායකත්ව කුසලතා සංවර්ධනය

පුහුණු වැඩසටහන් කාර්යාත්මක සහ තාක්ෂණික ප්‍රවීණත්වය සංවර්ධනය කරා යොමු වන අතර යම් සේවකයෙක් ජාතික ඉතිරි කිරීමේ බැංකුව සමඟ සේවකයෙක් ලෙස බැඳෙන අවස්ථාවේදී සිට මෙය අවශ්‍ය වේ. සමාලෝචනයට ලක්වන වසර තුළ, පළමු වරට කළමණාකරණ සංවර්ධන පුහුණු වැඩසටහන් තෝරාගත් ශාඛා 30 ක කළමනාකරුවන් සඳහා සංවිධානය කරන ලදී. මධ්‍ය බැංකුකරණ පුහුණුව සහ ක්‍රියාත්මක කිරීමේදී වෙනස්වීම් කළමනාකරණයේ දක්ෂයින් 260ක් හඳුනාගනු ලැබිය. එමෙන්ම, "ඊ-ඉගෙනුම හරහා දැනුම් හුවමාරුව" වැඩසටහන යටතේ වෙබ් සැසි තුළින් වඩා ඉහළ සේවක දැනුවත්කම සඳහා පුහුණු වැඩසටහන් නවයක් පවත්වන ලදී. මෙම වැඩසටහන සේවකයින් මෙරට කුමන ස්ථානයක සිටියද තොරතුරු හුවමාරුව සහ තත්‍ය කාලයේදී ගැටළු විසඳිම සඳහා ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය සහ ශාඛා අතර සම්බන්ධතාවයට ඉඩ දෙන ලදී.

බැංකුව සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළ වැඩි පුහුණු වැඩසටහන් ප්‍රමාණයක් පැවැත්වීම සඳහා ගලකිස්ස නව පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන ලදී. 2019 දී, දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන් 131 ක් තුළ රු.මි. 40.3 කට වැඩි මුදලක් අප ආයෝජනය කළෙමු. මෙම ප්‍රමාණය පසුගිය වසරේ පැවති රු.මි. 38.6 ට වඩා ඉහළ අගයකි. මේ සමඟම 2019 දී අපගේ සේවකයින් පුහුණු පැය 32,138 ක් තුළ යොදවා ඇත. වසර තුළ සේවකයින් 75 ක් විදේශීය පුහුණු වැඩසටහන්වලට සහභාගි වූහ. එක් සේවකයෙකුට පුහුණු පැයවල සාමාන්‍ය ගණන පැය 7 ක් වූ අතර සහභාගිත්ව අනුපාතය 90% ක් විය.



**රු. මිලියන 40.3**

පුහුණුව මත ආයෝජනය



**131**

දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන්





**32,138**

පුහුණු පැය ගණන




**90%**

සහභාගිත්ව අනුපාතය



**7**

එක් සේවකයෙකුට සාමාන්‍ය පුහුණු කාලය (පැය)



**75**

විදේශීය පුහුණු ලද සේවකයින් ගණන

# අපගේ හැකියා කළමනාකරණය

බඳවාගත් සියළුම දෙනා බැංකුවට දායක වීම සඳහා සහ ඔවුන්ගේ පුද්ගලභාවය සහ නිර්මාණශීලිත්වය තුළින් හැකියා සංචිතය පොහොසත් කිරීමට පෙළඹවමින් වඩා පුළුල් NSB පවුලට එකතු කරගනී. ආරම්භක හෝ සම්ප්‍රදායික නොවන වර්ගයේ ව්‍යාපාරයක් හා සැසඳීමේද බැංකුවේ වෘත්තිය ප්‍රගතිය වඩා අඩුවුවත්, බැංකුව තුළ වෘත්තිය වර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා අපි සෑම උත්සාහයක්ම ගනිමු.


## වඩාත් සුදුසු අය ප්‍රවර්ධනය

බැංකුව තුළ උසස්වීම් සහ ඇබෑර්තු සඳහා, අපි අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා ප්‍රමුඛතාව ලබා දෙමු. මෙය අපට වෘත්තිය ප්‍රගතිය සඳහා සහ දක්ෂ පළපුරුදු සේවකයින් රඳවා ගැනීමට මඟ පාදනු ලබයි. උසස්වීම් සඳහා අයදුම් කරන සේවකයින් සඳහා ඔවුන්ගේ සුදුසුකම්, දක්ෂතාව සහ අතීත කාර්යසාධනයේ තත්ත්වය වැනි සේවයට අදාළ සාධක මත විස්තරාත්මක සමාලෝචනයක් පවත්වනු ලබයි. සමාන අවස්ථා සේවා යෝජකයෙක් ලෙස, සමාන සහ සාධාරණ තෝරාගැනීමේ ක්‍රියාවලියක් සහතික කිරීමට පරිබාහිර සහ අදාළ නොවන සාධක පිළිබඳ අපි සැලකිලිමත් නොවෙමු.


එක් එක් ශ්‍රේණිය සඳහා උසස්වීම් බැංකුවේ උසස්වීම් දින දර්ශනය මත පදනම් වේ. බැංකුවේ වාර්ෂික මිනිස්බල සැලැස්ම පරිදි, අභ්‍යන්තර උසස්වීම්වලින් පිරවිය හැකි ඇබෑර්තු සඳහා බැංකුවේ අභ්‍යන්තර ජාලය තුළින් අයදුම්පත් කැඳවනු ලබයි. බැංකුකරණ සහ බැංකකරණ නොවන අවකාශය තුළ උසස්වීම් යෝජනා ක්‍රම බැංකුකරණ චක්‍රලේඛය තුළ වෙන වෙනම දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත අදාළ උසස්වීම් ක්‍රියාපටිපාටි අනුව අපේක්ෂකයින් තෝරා ගනු ලබයි.

වසර තුළ, කාන්තාවන් 336ක් සහ පිරිමින් 309 ක් සඳහා උසස්වීම් අපි ලබාදුන් අතර ඔවුන්ගෙන් බහුතරය වයස අවුරුදු 25 - 35 ක් අතර වූ අතර බැංකුකරණ සහ බැංකුකරණ නොවන ක්ෂේත්‍ර සඳහා විය.


### ශ්‍රේණිය සහ ස්ත්‍රී පුරුෂභාවය අනුව උසස්වීම්




### වයසය සහ ස්ත්‍රී පුරුෂභාවය අනුව උසස්වීම්




### ස්ත්‍රී පුරුෂභාවය අනුව උසස්වීම්





A – කාන්තා – 52%
B – පිරිමි – 48%

GRI 404-3

## කාර්යසාධන කළමනාකරණය

ප්‍රතිපෝෂණ සහ තත්ත්ව සාකච්ඡා මත අවධානය යොමු කරමින් අපගේ සේවකයින්ගේ කාර්යසාධනය ඇගයීමට කර්යසාධන කළමනාකරණ ක්‍රමයක් අපි යොදාගනිමු. අපගේ කර්යසාධන කළමනාකරණ ක්‍රමයේ අංග තුන පහත දැක්වේ:



කර්ය සාධන ඇගයීම තුළින් එක් එක් සේවකයාගේ පරමාර්ථ බැංකුවේ අරමුණු සමඟ ගැලපෙන බව සහතික කිරීමට එක් එක් සේවකයාගේ කාර්ය සාධනය සොයා බැලීමට සහ නියාමනය කිරීමට අපට හැකියාව ඇති කරයි. මේ තුළින් මෙහෙයුම් කාර්යක්ෂමතාව වර්ධනය කිරීම පමණක් නොව ඉගෙනුම සහ සංවර්ධනය මෙන්ම සේවක සහභාගිත්වය වැඩි කරයි. අපි සාධාරණ විනිවිද ඇගයීමේ ක්‍රමයන් යොදා ගනිමු. එහිදී සියළුම සේවකයින් වාර්ෂික පදනමක් මත විධිමත්ව අගය කරන අතර එක් එක් වසරේ පෙර නිර්ණය කළ නිර්ණායකවලට අනුව ඇගයීමට ලක් කෙරේ. ආයතනික කළමනාකරණය සමබර ලකුණු ක්‍රමය භාවිතා කරමින් මූලික කාර්යසාධන දර්ශක (KPI) මත පදනම් වී ඇගයීමට ලක් කෙරේ. බැංකුව තුළ සම්පූර්ණ මූලික කාර්යසාධන දර්ශක (KPI) මත පදනම් කාර්යසාධන කළමනාකරණයක් සහ ඇගයීම් ක්‍රමයක් මගින් ඉදිරියට යන කාර්යසාධන පදනම් සංස්කෘතියක් සංවර්ධනය කිරීමට අපි අරමුණු කරමු. මෙය යම් බලපෑම් ඉවත්කරන අතර විෂයගාමී ඇගයීමට පහසුව ඇති කරයි.

## ඉහළම වෘත්තිය සහ සදාචාර ප්‍රමිති නගාසිටුවීම

GRI 406-1, 205-2

බැංකුවේ අචාරධර්ම සංග්‍රහය විසින් සදාචාර, චර්යාව සහ අනුකූලතාව සම්බන්ධයෙන් අපගේ සේවකයින්ගෙන් අපේක්ෂිත පුද්ගලික සහ වෘත්තිය චර්යාව පිළිබඳ මූලධර්ම නියම කරයි. මෙම සංග්‍රහය තුළින් කුසලතා පදනම් කරගත් සමාන රැකියා අවස්ථාවන් පිළිබිඹු කරන අතර කොන් කිරීම සහ හිරිහැර කිරීමෙන් තොර ආරක්ෂිත සේවා පරිසරයක් සහතික කිරිමට අපට අවශ්‍ය ප්‍රමිති පැහැදිලි කරයි. අළුතින් බඳවාගත් සියළුම දෙනාට බැංකුවට බඳවාග ැනිම මත ඔවුන්ගේ බැඳීම් සහ චර්යා සංග්‍රහය යටතේ ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කෙරේ.

බැංකුවේ විනය චර්යා සංග්‍රහය මගින් විනය සම්බන්ධ කරුණුවලදී සේවකයින්ට මඟ පෙන්වීම් ලබා දේ. රජයේ ආයතන සංග්‍රහයේ II කොටසේ විධිවිධාන මත පදනම්වී විනය චර්යා සංග්‍රහය 2017 දී සංශෝධනය කරන ලද අතර, සියළුම ආකාරයේ දූෂණ, අල්ලස් සහ මුදල් පැහැරගැනිම සඳහා "ශූන්‍ය ඉවසුම" ඇතුළත් කරමින් බැංකුවේ විශේෂ අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි වෙනස් කරන ලදී. නියමිත ප්‍රමිති, ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ ව්‍යවහාර සමඟ යම් පුද්ගලයෙකුගේ හැසිරීම අනුකූල නොවීම සහ මෙහෙයුම්වලට අදාළ යම් ආරාවුල් විනය සංග්‍රහයට අනුකූලව විධිමත්ව සහ විනිවිදව මෙහෙයවනු ලබයි.

## විවිධත්වය සහ සමාන අවස්ථාවට සහයවීම

GRI 405-2, 406-1, 401-3

සමාන අවස්ථා සේවායෝජකයෙක් ලෙස, අපි සේවා ස්ථානයේ විවිධත්වය දිරිගන්වන අතර අඛණ්ඩව සියලු දෙනා ඇතුළත් පරිසරයක් පෝෂණය කර එයට සහයවන අතර එය තෘප්තියට පත් සහ ඵලදායි සේවා ස්ථානයක් ප්‍රවර්ධනය කරනු ඇත. ජාතිය, ආගම, ස්ත්‍රීපුරුෂභාවය, වයස, ජනවර්ගය, සමාජ මූලය හෝ ආබාධිතතාව මත පදනම්වී සිදුවන භෞතික, සහ වාචික හිරිහැරකිරීම් සහ වෙනස්ව සැලකීමෙන් නිදහස් සේවා ස්ථානයක් සඳහා අපි කැපවෙමු. අපගේ වෙනස්ව නොසැලකීමේ සහ සමාන අවස්ථා ප්‍රතිපත්තිය බඳවා ගැනීම, පුහුණුව සහ සංවර්ධනය, වැටුප් ගෙවිම සහ ප්‍රදාන, ප්‍රතිලාභ සහ ස්ථානමාරු සහ උසස්වීම් ඇතුළුව සේවකයින්ගේ අත්දැකීම් සම්බන්ධ සෑම අංගයක්ම සඳහා යොදා ගනී.

2019 දි අපගේ කණ්ඩායම තුළ කාන්තා නියෝජනය 55%ක් වු අතර නව බඳවා ගැනීම් වලින් 48%ක් කාන්තාවන් විය. ජ්‍යෝෂ්ඨ කළමනාකරණය සහ මධ්‍යම කළමනාකරණය අතර කාන්තා නියෝජනය පිළීවෙලින් 49%ක් සහ 52% විය. අපගේ කාන්තා සේවකයින්ට සම්පූර්ණ ප්‍රතිලාභ සහිතව වැඩකරන දින 84ක් ප්‍රසූත නිවාඩු සහ පිරිමි සේවකයින්ට දින තුනක පීතෘ නිවාඩු පිරිනමයි. 2019 දි කාන්තා සේවකයින් 317ක් ප්‍රසූත නිවාඩු ලබාගෙන ඇති අතර එයින් 99.7%ක් තම නිවාඩුව අවසන් විමෙන් පසු සේවයට ආපසු පැමිණි ඇත. පිරිමි සේවකයින් 153ක් පීතෘ නිවාඩු ලබාගෙන ඇත.

සමාන රැකියා අවස්ථා පිළිබඳ ප්‍රතිපත්තිය කඩකිරීම සම්බන්ධ සියළුම පැමිණිළි කඩිනමින් විමර්ෂණය කෙරේ. 2019 වසර තුළ එවැනි කඩකිරීම් පිළිබඳ පැමිණිළි කිසිවක් නොමැත.

## සේවකයින් පිළිගැනීම

අපගේ සේවකයින්ගේ ආයතනය සඳහා බැඳිම සහ පක්ෂපාතිත්වය සහ ඔවුන්ගේ දිගුකාලින සේවය හඳුනාගැනිම පිණිස, වසර තුළ උපහාර උත්සවයක් සංවිධානය කරන ලදී. වසර 25 සහ 35ක සේවා කාලය සම්පූර්ණ කර ඇති සේවකයින් මෙම වාර්ෂික උත්සවයේදි උපහාර කරන ලදී. සේවකයින් 14 දෙනෙක් ප්‍රදාන ලද අතර එයින් 6 දෙනෙක් වසර 35ක සේවය වෙනුවෙන් පිදුම් ලැබීය.

සේවකයින්ගේ ළමුන්ගේ අධ්‍යාපනික ජයග්‍රහණයන් (ආපොස සාමාන්‍ය පෙළ, අපොස උසස් පෙළ සහ පහ වසර ශිෂ්‍යත්ව විභාගය) සහ ක්‍රීඩා සහ විෂය පරිබාහිර ක්‍රියාකාරකම් උපහාරයට ලක්කිරීම කිරීම සඳහා වාර්ෂික ජයග්‍රාහන ප්‍රදාන උත්සවය පවත්වනු ලබයි.

## සේවකයින්ගේ සෞඛ්‍ය, ආරක්ෂාව සහ සුභසාධනය සහතික කිරිම

GRI 403-9

විවිධ කටයුතු තුළින් අපි සේවකයින්ගේ භෞතික සහ මානසික සුභසාධනය දිරිගන්වමු. බැංකුවේ ක්‍රීඩා සමාජය ප්‍රධාන වශයෙන් බැංකු මූලස්ථානයේ අංග සම්පූර්ණ සරඹ ශාලාවක් පවත්වාගෙන යයි. මානසික සුභසාධනය පවත්වා ගැනිම පිණිස, යෝග සහ භාවනා පන්ති ද වසර තුළ ආරම්භ කරන ලදී. එමෙන්ම, වෛද්‍ය සැසිවලට සහභාගිවීමට සහ අයදුම්කාර සැසිය තුළින් විශේෂඥයින්/ උපදේශකයින්ගෙන් උපදෙස් ලබාගැනීමට සේවකයින්ට අවස්ථාව ලබා දි ඇත. විෂේශ වෛද්‍ය අයදුම්කාර සැසි 2018 දි පැවති 396 සිට 423 දක්වා 7%කින් වැඩි කරන ලදී. තවද, කොන්ත්‍රාත් සේවකයින් ඇතුළුව කිරි මව්වරුන් සඳහා නම්‍යශීලී වැඩ පිළිවෙලක් අපි පිරිනමන ලද අතර එහිදි පැය එකේ සිට පැය දෙක දක්වා කිරි දීමේ විවේක කාලය එකක් උදෑසන සහ අනෙක සවස් වරුවේදී ලබා දේ. අළුත උපන් දරුවාට එක් වසරක් පිරෙනතුරු මෙම නිවාඩු පිරිනමයි.

ධනාත්මක සේවා පරිසරයක් සඳහා විශිෂ්ඨ කොන්දේසි සහතික කිරීමට වැඩසටහන් රාශියක් ක්‍රියාවට නංවා ඇත. මේවාට පහත දෑ අතුළත්ය:

- ප්‍රමුඛ පෞද්ගලික රෝහලක් විසින් ක්‍රියාත්මක කරන බැංකුවේ සුභසාධක අංශය විසින් කළමනාකරණය කරන බැංකුවේ මූලස්ථානයේ පවතින ගෘහස්ථ වෛද්‍ය මධ්‍යස්ථානය
- මෙම වෛද්‍ය මධ්‍යස්ථානයේදී ද්විමාසිකව විශේෂඥ වෛද්‍යවරුන් හමුවිය හැකිය
- ප්‍රමුඛ පෞද්ගලික රෝහලක් විසින් ක්‍රියාත්මක කරන වෛද්‍ය සායනය
- පීඩන කළමනාකරණය, ඇස් ආරක්ෂාව සහ හෘද රෝගවලින් වැලකීම වැනි ක්ෂේත්‍ර පිළිබඳව වෘත්තිකයින් විසින් නිරතුරුව පවත්වනු ලබන සම්මන්ත්‍රණ

බැංකුව තුළ සෞඛ්‍ය සහ ආරක්ෂක ගැටළුවලට ප්‍රමුඛස්ථානය ලබාදෙන සහ ඒවා ආමන්ත්‍රණය කර සහතික කිරීමට පියවර අරගනිමින් අපගේ සියළුම සේවකයින් සඳහා ආරක්ෂිත සේවා පරිසරයක් තහවුරු කිරීම පිළිබඳ අපි සැලකිය යුතු අවධානයක් යොමු කරමු. ආරක්ෂිත සහ සුරක්ෂිත සේවා ස්ථානයක් සහතික කිරීමට බැංකුවේ ආරක්ෂක අංශය සෑම ජාතික ඉතිරි කිරීමේ බැංකු ශාඛාවකම ඇත. විශේෂයෙන් පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පසු, ආරක්ෂක ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි බැංකු පුරා ශක්තිමත් කරන ලදී. වසර තුළ, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ගිනි නිවීම කෙරෙහි අවධානය යොමුකළ පෙරහුරු තුළින් හැකියා සංවර්ධනය ගොඩ නගන ලදී. සමාලෝචිත වසර තුළ, අපගේ පරිශ්‍රය තුළ සුළු සිදුවීම් තුනක් වාර්තා විය.

මෑත කාලයේදී අපගේ සෞඛ්‍ය සහ ආරක්ෂක ප්‍රතිපත්තිය තුළින් පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරන ලදී:

- ජාතික වෘත්තීමය ආරක්ෂාව සහ සෞඛ්‍ය ප්‍රතිපත්තිය සහ 1954 අංක 19 දරණ සාප්පු සහ කාර්යාල පනතේ විධිවිධානවලට අනුකූලව අපගේ වෘත්තීමය ආරක්ෂාව සහ සෞඛ්‍ය ක්‍රමය ඉහළ නැංවීම
- ශාඛාව/අංශය තුළ යහපත් සහ ආරක්ෂක සේවා පරිසරය සහතික කිරීමට අදාළව ශාඛාව/අංශයෙන් පුද්ගලයින් දෙදෙනෙක් පත් කිරීම
- නව භෞතික ආරක්ෂක ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීම මගින් රැකියාවේ යෙදී සිටින සේවකයින්ගේ සෞඛ්‍ය, ආරක්ෂාව සහ සුභසාධනය සුරක්ෂිත කිරීම.
- පෙර නිශ්චිත අවදානම් ඇගයීම තුළින් සේවා ස්ථානයේදී සේවකයින්ට සිදුවියහැකි අවදානම් හඳුනාගැනීම.
- තම සෞඛ්‍ය සහ ආරක්ෂක අවශ්‍යතා යොදා ගන්නා සේවකයින් සඳහා කාර්යාල පරිසරයක් නිර්මාණය කිරීම
- ගිනි නිවීමේ උපකරණ සවිකිරීම සහ ගිනි නිවීමේ පෙරහුරු පැවත්වීම

## යහපත් රැකියා - ජීවිත තුලනයක් ප්‍රවර්ධනය

GRI 401-2

නිරෝගී රැකියා ජීවිත තුලනයක් අත්කර ගැනීම සඳහා වෘත්තිය සහ පෞද්ගලික බැඳිම කළමනාකරණය කර ගැනිම සඳහා අපගේ සේවකයින්ට සහයවීමට ප්‍රතිලාභ රාශියක් අපි පිරිනමමු. දක්ෂයින් කළමනාකරණය කරන ක්‍රමවේද භාවිතා කරමින්, සේවකයින්ට තම ජීවිතයේ වැදගත් අංශ කෙරෙහි අවධානය යොමු කිරීමට ඉඩදෙමින් රැකියා ජීවිත තුලනයක් අත්කර ගැනීමට අපගේ සේවකයින්ට අපි සහයවෙමු. විනෝද ගමන්වලට අනුග්‍රහය ලබාදෙමින් සහ ජනප්‍රිය නිවාඩු ගමනාන්තයන් හී පහසුවෙන් නවාතැන් ලබාදිම සඳහා සංචාරක බංගලා ස්ථාපිත කරමින් යහපත් රැකියා ජීවිත තුලනයක් අත්කර ගැනීමට අපගේ සේවකයින්ට අපි අවස්ථාව ලබා දෙමු.

2019 මූල්‍ය වර්ෂය අවසානයේදී දිවයින පුරා විවිධ ස්ථානවල සංචාරක බංගලා 15ක් අපි නඩත්තු කළෙමු. මෙම ස්ථානවලට අනුරාධපුරය, මහනුවර, අම්බලන්තොට, නුවරඑළිය (බංගලා 2ක්), මහියංගය, ගාල්ල, බණ්ඩාරවෙල, බදුල්ල, දඹුල්ල, චාවාකච්චෙරි, බෙලිඅත්ත, මාරවිල. කතරගම සහ දියතලාව ඇතුළත්ය. වසර තුළ, ශාඛා සහ අංශ විසින් සංවිධානය කරනු ලබන එක් දින සංචාරයක් සඳහා මුදල් සහය ලබාදෙන ලදී.

සේවකයින් අතර අධ්‍යාත්මික සහ ආගමික එකමුතුව ඇති කිරීම සඳහා වෙසක් භක්ති ගී, අවුරුදු උත්සවය සහ ක්‍රිස්තියානි කැරොල් වැනි විවිධ ආගමික උත්සව සුභසාධන අංශය විසින් සංවිධානය කරන ලදී. අපගේ සේවකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සහභාගිත්වයෙන් "අවුරුදු උත්සවය" සෑම වසරකදීම පැවැත්වේ. ක්‍රීඩා සමාජය විසින් සංවිධානය කරන ලද කාර්ය මණ්ඩලය එක්ව "එන්එස්බී කලර්ස් නයිට්" වසර තුළ පවත්වන ලදී. අපගේ සේවකයින්ගේ සෞන්දර්යාත්මක දක්ෂතාව හඳුනා ගැනීමට සහ එයට සහයවීම පිණිස, තවත් එක් වැඩසටහනක් වන "එන්එස්බී වැලන්ට් ෂෝ" පවත්වන ලදී. එන්එස්බී කලා කවය නාට්‍ය/චිත්‍රපට/සංගීත සංදර්ශන සංවිධානය කරමින් සේවක මණ්ඩලයට විනෝදාත්මක පහසුකම් සලසයි.

අපගේ සේවකයින් විවිධ සමාජ සත්කාරක වැඩසටහන්වල (CSR) කටයුතු කරන අතර, ඒවා වසර පුරාම පවත්වනු ලබයි. සමාජ සත්කාරක ව්‍යාපෘතිවල විස්තර පිටු අංක 159 සිට 161 දක්වා "ශක්තිමත් ප්‍රජාවක් ගොඩ නැගීම" යටතේ විස්තර කෙරේ. වාර්ෂික ක්‍රීඩා තරගය ප්‍රාදේශීය ක්‍රීඩා තරඟ පැවැත්වීමෙන් පසු පවත්වනු ලබයි. ක්‍රිකට්, පාපන්දු, දැල්පන්දු, යනාදි ක්‍රීඩා රාශියක් තුළ සහභාගිවීමට අපගේ සේවකයින්ට අපි අවස්ථාවන් ලබා දෙමු. එමෙන්ම, අපගේ සේවකයින්ට පුස්තකාල පහසුකම් අපි ලබා දෙන අතර අපගේ ප්‍රධාන කාර්යාලයේ ආපන ශාලාවෙන් සහනදායි මිලකට අපගේ සේවකයින්ට ආහාර සපයමු.

කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ළමුන් අභ්‍යාසලාභින් ලෙස බඳවා ගැනීම සඳහා පියවර බැංකුව රැගෙන ඇත.

## අගනා ප්‍රතිඵල ලබාදෙන සංස්කෘතියක් නිර්මාණය

GRI 202-1, 401-2, 405-2

### වේතන

සේවකයින් වෙත ඔවුන්ගේ කාර්යභාරය සහ කාර්ය සාධනය මත පදනම් සාධාරණ, තරගකාරී සහ ආකර්ෂණීය පාරිශ්‍රමික ක්‍රමයක් අපි ලබාදෙමු. 2018 දී, 2018 - 2020 කාලසීමාව සඳහා වැටුප් ප්‍රතිශෝධනය සඳහා සාමූහික ගිවිසුම කළමනාකරණය සහ වෘත්තිය සංගම් අතර සාර්ථකව අත්සන් කරන ලදි. ප්‍රධාන කළමනාකාර ශ්‍රේණිය සහ ඊට පහළ වැටුප් සහ අනෙකුත් මූල්‍ය ප්‍රතිලාභ වෘත්තිය සංගම් සමඟ සාමූහික ගිවිසුම තුළ දක්වා ඇති නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව ව්‍යුහගත කෙරේ.

විනිවිදභාවය සහතික කිරීම සඳහා සියළුම වැටුප් පරිමාණ බැංකුවේ අභ්‍යන්තර ජාලයේ ප්‍රකාශයට පත් කෙරේ. වැටුප් සහ වැටුප් නොවන ප්‍රතිලාභ සඳහා ගිවිසුම් බැංකුවේ කළමනාකරණය සහ වෘත්තිය සංගම් අතර සාකච්ඡාවකින් පසු වසර තුනකට වරක් සංශෝධනය කෙරේ. සමාන වගකීම් සහිත සියළුම කාර්ය මණ්ඩලය ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂභාවය නොසලකා සමාන වැටුප් තලවල ඇති බව අපි සහතික කරමු.

පුද්ගලයින්ගේ වැටුප් සේවකයාගේ සේවා කාලයේ ප්‍රමාණය සහ පසුගිය කාර්යසාධනය මත වෙනස් වේ.

## ප්‍රතිලාභ

### මූල්‍ය ප්‍රතිලාභ

සේවකයින්ට කරනු ලබන ගෙවීම් තුල ප්‍රතිලාභ වැදගත් අංශයක් නියෝජනය කරයි. බැංකුව තුළ අඛණ්ඩ සේවය සඳහා සේවකයෙක් විසින් ලබන මූල්‍ය ගෙවීම්වලින් එය සමන්විත වේ. සියළුම ස්ථිර පූර්ණ කාලීන සේවකයින් ඔවුන්ගේ සේවය ස්ථිර කිරීමෙන් පසු පහත සඳහන් මූල්‍ය ප්‍රතිලාභ සඳහා හිමිකම් ලබයි.

ස්ථාවර සහ විචල්‍ය මුදල් ප්‍රතිලාභ

i. තරඟකාරී වැටුප
ii. නියමකළ ඉලක්ක සපුරා ගැනීම අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත පදනම් වී සෑම වසරකම අප්‍රේල් සහ දෙසැම්බර් ගෙවනු ලබන ප්‍රසාද දීමනා
iii. එක් එක් වසර අවසානයේ එක් එක් වර්ගයේ නිවාඩු වෙනුවෙන් උපරිමය දින හතක් දක්වා වරප්‍රසාද සහ වෛද්‍ය නිවාඩු මුදල් බවට පත්කිරීම
iv. පූර්ව මාස 12ක කාලසීමාව තුළ සතුටුදායක අයුරින් කටයුතු ඉටුකළ අය සඳහා වාර්ෂික දිරිදීමනාවක්
v. ඉන්ධන/ සංචාර, නවාතැන් සහය, සංයුක්ත දීමනා, සහ රාජකාරි ගමන් වෙන්කිරීම
vi. රැකියාවට විශේෂ දීමනාව සහ අතිකාල දීමනා
vii. දායක නොවන විශ්‍රාම යෝජනා ක්‍රමයක් සහ දායක වැන්දඹු සහ අනත්දරු යෝජනා ක්‍රමය

ප්‍රතිපූරණය කිරීම්

i. වෘත්තිමය ආයතන සඳහා සාමාජික ගාස්තු
ii. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (IBSL) ව්‍යවහාරික බැංකුකරණය සහ මූල්‍යකරණය පිළිබඳ මධ්‍යම මට්ටම සහ ව්‍යවහාරික බැංකුකරණය සහ මූල්‍යකරණය පිළිබඳ ඩිප්ලෝමා මට්ටම සම්පූර්ණ කරන සේවකයින් සඳහා සම්මානනීය ගෙවීම
iii. සේවකයින් විසින් සම්පූර්ණ කරන තෝරාගත් අදාළ අධ්‍යයන පාඨමාලා සඳහා අනුග්‍රහකත්වය

සහන ණය ප්‍රතිලාභ

i. නිවාස, වාහන ණය සහ පරිභෝජන සහ ආපදා ණය සහ උත්සව අත්තිකාරම් වැනි අනෙකුත් සහන ණය

වෛද්‍ය සහන යෝජනා ක්‍රමය

i. සේවක වෛද්‍ය සහන යෝජනා ක්‍රමය - පරිවාස සේවකයින් ඇතුළුව සියලුම ස්ථිර සේවකයින් සඳහා මේ මගින් විශේෂඥ/බාහිර රෝගී වෛද්‍ය ගාස්තු, රෝහල්ගතකිරීම, බරපතල රෝග, ඇස සහ දන්ත ආරක්ෂාව ආවරණය පිරිනමයි. මරණය, ස්ථිර ආබාධය, හෝ අංගභාගය වැනි අවස්ථාවක රු.මි. 1 ක් දක්වා ස්ථිර සේවකයින්ට ලබාදෙන වන්දි යෝජනා ක්‍රමය

### විශ්‍රාම ප්‍රතිගලාභ

GRI 201-3

සියලූම ස්ථිර සේවකයින් දායකත්ව නොවන විශ්‍රාම යෝජනා ක්‍රමයක් තුළ සහභාගිවීමට හිමිකම ලබන අතර අදාළ නියමයන් සහ කොන්දේසි පත්වීම් අවස්ථාවේදී ක්‍රියාත්මක විශ්‍රාම යෝජනා ක්‍රමය මත රඳා පවතී.

විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් බැඳීම්වල වර්ගයන්ට පහත දෑ ඇතුළත්ය:

- විශ්‍රාම අරමුදල (1 යෝජනා ක්‍රමය සහ 11 යෝජනා ක්‍රමය)
- දායක වැන්දඹු සහ අනත්දරු අරමුදල (11 යෝජනා ක්‍රමය සඳහා පමණී)
- දායකත්ව විශ්‍රාම වෛද්‍ය යෝජනා ක්‍රමය

බැංකුවේ විශ්‍රාම අරමුදල සම්පූර්ණයෙන්ම රක්ෂණය කෙරේ. නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලැස්ම යටතේ ප්‍රතිලාභවල වෙන්කිරීමේ පිරිවැය ප්‍රක්ෂේපිත ඒකක ණය ආයුගණක ඇගයීම් ක්‍රමය මත පදනම්ව විනිශ්චය කෙරේ. බැංකුවේ විශ්‍රාම අරමුදල (1 යෝජනා ක්‍රමය) 1995 ඔක්තෝබර් 1ට පෙර විශ්‍රාමගත් සේවකයින්ට පමණක් අදාළ වන අතර රු.මි. 400 ක් වන දායකත්වයක් බැංකුව විසින් 2019 දී සිදුකරන ලදී. මූල්‍යනය නොකළ වගකීම රු.මි. 4,862 ක් විය.

1995 ඔක්තෝබර් 1ට පසු බඳවා ගනුලබන සේවකයින්ට අදාළ වන විශ්‍රාම අරමුදල (11 යෝජනා ක්‍රමය) සඳහා බැංකුවේ දායකත්වය 2019 දී රු.මි. 263.5 ක් විය. සේවකයින්ගේ වැටුපෙන් 12% ක් මෙම අරමුදල සඳහා බැංකුව විසින් දායක කෙරේ.

විශ්‍රාම වෛද්‍ය යෝජනා ක්‍රමය සහ වැන්දඹු, වැන්දඹු පුරුෂ සහ අනත්දරු අරමුදල යන දෙකම දායක යෝජනා ක්‍රම වෙති. බැංකුව මෙම යෝජනා ක්‍රමයට රු.මි. 187.4 ක් දායක වී ඇති අතර වසර අවසානයේදී මූල්‍යනය නොකළ වගකීම් රු.මි. 1,739.6 ක්ව පැවතිණ. විශ්‍රාම වෛද්‍ය යෝජනා ක්‍රමයට මාසික දායකත්වය සේවකයාගේ වයස අනුව තීරණය කෙරේ.

වැන්දඹු, වැන්දඹු පුරුෂ සහ අනත්දරු අරමුදල සඳහා සේවකයා/සාමාජිකයාගේ දායකත්වය සේවකයින්ගේ මූලික වැටුප මත පදනම් වී තීරණය කරන අතර සාමාජිකයින් සෑම මාසයකදීම තම මූලික වැටුපෙන් 5% ක් දායක වීම අනිවාර්ය වේ.

2019 දී සේවක ප්‍රතිලාභවලට සිදුකළ නව එකතු කිරීම්


- සේවක නිවාස ණය සඳහා ණය මුදල රු.මි. 7.5 දක්වා වැඩිකර ඇත.
- ස්ථිර කළ සේවකයින්ට පරිභෝජන ණයවල ප්‍රමාණය රු.මි. 1 සිට රු.මි. 1.5 දක්වා වැඩි කරන ලදී.
- වෘත්තිය ආයතන/සංගම් වෙත කාර්ය මණ්ඩලය විසින් සිදුකරන දායක ගෙවීම් ප්‍රතිපූරණය වැඩිකර ඇත.
- විශ්‍රාම සේවකයින් සඳහා දායක වෛද්‍ය සහන යෝජනා ක්‍රමය සංශෝධනය කර කාර්ය මණ්ඩල වෛද්‍ය සහය යෝජනා ක්‍රමයට සමානව ප්‍රතිලාභ පිරිනමන ලදි.
- එක් දිනක ආහාර දීමනාවක්, ශාඛා කළමනාකරුවන්ට මාසික දීමනාවක්, සේවකයෙකුගේ මරණය මත ගෙවන ලද වන්දිය ඇතුළු අනෙකුත් සේවක සුභසාධන පහසුකම් සහ වාර්ෂික සේවක සංචාරය සඳහා සේවා සහ ප්‍රවාහන දීමනාව වැඩිකරන ලදී.
- කාර්යසාධනය පදනම් සංස්කෘතියක් දිරිගැන්වීමේ අදහස ඇතිව, 2018 දී නියම කළ ඉතුරුම් ඉලක්ක අත්කර ගැනීම වෙනුවෙන් ශාඛා වෙත විශේෂ කාර්යසාධන දීමනාව ලබාදෙන ලදී.

GRI 401-1


## සේවකයින් රඳවා ගැනීම

අපි අඛණ්ඩවම අපගේ සේවකයින්ගේ රඳවාගැනීම නියාමනය තරන අතර විශේෂයෙන් සේවකයින් සහභාගිවන සක්‍රීය වැඩසටහන් ක්‍රියාත්මක කරමින් අවම මට්ටමක සේවක ඉවත්ව යාමක් තබාගැනීමට අපි උත්සාහ කරමු. 2019 වසරේදී ස්ථිර සේවකයින් සඳහා රඳවා ගැනීමේ අනුපාතය 2018 දී පැවති 97.9%ට සාපේක්ෂව 98.1% ක් විය. වසර සඳහා සේවක පිරිවැටුම පසුගිය වසරේ වාර්තාකළ 2.1% සිට අඩුවීමක් පිළිබිඹු කරමින් 1.9% ක් විය. අපට ඉහළ රඳවා ගැනීමේ අනුපාතයක් සහ ක්ෂේත්‍රය තුළ තවත් එක් අඩුම සේවක පිරිවැටුම් අනුපාතයක් ඇත. මෙය තිරසාර වැඩකරන සංස්කෘතිය පිළිබඳ සහ අපගේ සේවකයින් සඳහා අප පෝෂණය කළ නිරත සහ දිරිගැන්වූ ශ්‍රමබලකාය පිළිබඳ ශක්තිමත් පිළිබිඹුවකි. විශ්‍රාමයාම හේතු කොට ගෙන, 2019 දී මුළු සේවක පිරිවැටුම 82 ක් වූ අතර සේවකයින්ගෙන් 56% ක් පිරිමි වූ අතර 79% ක් වයස අවුරුදු 55ට වැඩි අය විය. 61% ක් වන ඉහළ පිරිවැටුම 2019 දී කළමනාකාරිත්ව මට්ටමේ විය. ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස අපගේ ඉහළ කාර්ය සාධනයක් සහිත සියලු මට්ටම්වල සිටින කාර්ය මණ්ඩලය බඳවා ගනිමු. අභිප්‍රේරණය කිරීම සහ ඉහළ කාර්යසාධනයක් සහිත අය බඳවා ගැනීමට පහසුකම් සැපයීම සඳහා අපි අඛණ්ඩව උත්සහ කරමු.


### වයස් කාණ්ඩය අනුව පිරිවැටුම




### ශ්‍රේණි අනුව පිරිවැටුම




### ස්ත්‍රීපුරුෂභාවය අනුව පිරිවැටුම සඳහා හේතුව – 2019




## ඵලදායි සන්නිවේදනය

ප්‍රධාන කාර්යාලය සහ ශාඛා ජාලය අතර විවෘත සහ ඵලදායි සන්නිවේදන මාර්ග අපි පවත්වන බැවින් අපගේ සියලුම සේවකයින්ට ඔවුන්ගේ භූගෝලීය ස්ථාන පිළිබඳ නොසලකා මනාව සම්බන්ධ වී සිටී. යහපත් සහ තිරසාර සේවා සම්බන්ධතාවයක් සඳහා කළමනාකරණය සහ සේවකයින් අතර සන්නිවේදනයෙ වැදගත්කම අවබෝධ කර ගනිමින්, කළමනාකරණය විසින් සක්‍රිය ආකාරයෙන් යෝජනා, ගැටළු, සහ විසඳුම් ඉදිරිපත් කරන මෙන් සේවකයින් සක්‍රියව දිරිගන්වයි. මෙය යහපත් පරිසරයකට මඟ පාදන අතර සේවක සහභාගිත්වයට සහ ඵලදායිතාව වැඩි කිරීමට සේවකයින්ට උපකාරී වේ. බැංකුවේ ඵලදායිතාවට බාධා කරන යම් ගැටළු සන්නිවේදනය කිරීමට සේවකයින්ට විධිමත් මාර්ග සපයනු ලැබ ඇත.

### සේවක සන්නිවේදන මාර්ග

ස්වකයින්ට පහසු සන්නිවේදනයක් ඇති කිරීම පිණිස අපි මාර්ග කිහිපයක් ආරම්භ කර ඇත. බැංකුවේ උපාය මාර්ගික දිශානතිය, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි පිළිබඳ සේවකයින් දැනුවත් කර තබා ගනිමින්, මෙම සන්නිවේදන මාර්ග කළමනාකරණයට ප්‍රතිපෝෂණ ලබාදීමට සේවකයින්ට හැකියාව ඇති කරයි. හැකි සෑමවිටම භාෂා ත්‍රිත්වයෙන්ම එනම් ඉංග්‍රීසි, සිංහල හා දෙමළ භාෂාවන්ගෙන් සන්නිවේදනය සඳහා අපි උත්සාහ ගනිමු.

සේවක සන්නිවේදන මාර්ග

- වෙබිනාර්-දිවයින පුරා පිහිටි ශාඛා සහ ජාතිය අතර සජීවී සන්නිවේදනය සහ විවෘත සාකච්ඡාවන් පහසු කිරීම
- සේවක සමීක්ෂණ
- අභ්‍යන්තර ජාලය
- චක්‍රලේඛ
- සේවක දැන්වීම් පුවරුව
- කළමනාකරණයෙන් විද්‍යුත් ලිපි
- මානව සම්පත් දෙපාර්තමේන්තුවෙන් විධිමත් ලිපි

GRI 102-41

### රැස්වීමේ නිදහස සහ සාමූහික කේවල් කිරීම

අපගේ සේවකයින්ගේ රැස්වීමේ නිදහස නඟා සිටුවමින් සහ සාමූහික කේවල් කිරීමට ඔවුන්ට ඇති අයිතිය පිළිගනිමින්, වෘත්තීය සංගම් සමඟ සන්නිවේදන මාර්ග අපි තබා ගනිමු. වෘත්තීය නියෝජිතයින් සමඟ සන්නිවේදන තොරතුරු ලබාදීමට වැඩිදුර අවස්ථාවක් නිර්මාණය කරන අතර, ඒ තුළින් ඔවුන්ගේ සාමාජිකයින්ට සහ අනෙකුත් නියෝජිත සංවිධානවලට බැංකුවේ ව්‍යාපාර කටයුතු සහ අරමුණු පිළිබඳ සම්පූර්ණ අවබෝධයක් අත්කර ගැනීමට ඉඩ දේ. ජාතික සේවක සංගමය, ලංකා බැංකු සේවක සංගමය, ශ්‍රී ලංකා ස්වාධීන බැංකු සේවක සංගමය

විධායක නිළධාරීන්ගේ සංගමය සහ සමස්ත ලංකා බැංකු සේවක සංගමය සමඟ අපගේ සම්බන්ධතාව අඛණ්ඩව යහපත් මට්ටමක විය.

සේවකයින්ගේ රැස්වීමේ නිදහස සහ සාමූහික කේවල් කිරීම සඳහා අයිතිය ඵලදායිව පිළිගැනීම බැංකුව විසින් අඛණ්ඩව රඳවා ගෙන ඇත. වැටුප් සහ වැටුප් නොවන ප්‍රතිලාභ සඳහා සාමූහික ගිවිසුම වසර තුනකට වරක් බැංකුවේ කළමනාකරණය සහ වෘත්තිය සංගම් අතර අත්සන් කෙරේ. වෘත්තිය සංගම් සමඟ සාමූහික ගිවිසුම තුළ දක්වා ඇති එකඟ වූ නියමයන් සහ කොන්දේසි බැංකුවේ සේවකයින්ගේ වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ කෙරෙහි බලපායි.

## සේවක මැසිවිලි යාන්ත්‍රණය

යම් පුද්ගලයෙකුගේ ආසන්නතම අධීක්ෂකගෙන් ආරම්භ වී ධුරාවලියක් අනුව මැසිවිලි විසඳීමට "පියවර ඉණිමඟ පද්ධතිය" ක්‍රමයක් යොදා ගනී. "දොර විවෘත ප්‍රතිපත්තිය" මගින් මානව සම්පත් කමිටුව විසින් නම් කරන ස්වාධීන පාර්ශ්වයක් වෙත මැසිවිලි සෘජුවම ඉදිරිපත් කිරීමට ඉඩ ලබා දේ. හැකි තරම් පළමුව කී තැනැත්තා භාවිතා කරමින් ගැටළු විසඳා ගැනීමට අපි සේවකයින් දිරි ගන්වමු. වසර තුළ. විධිමත් මැසිවිලි යාන්ත්‍රණය තුළින් ගොනුකළ මුළු මැසිවිලි ගණන 30ක් වූ අතර 2019 වසර තුළ ඉන් 19ක් විසඳන ලදී. සියලුම මැසිවිලි අපක්ෂපාතීව මෙහෙයවනු ලබයි.

## තොරතුරු දැනුම්දීමේ ප්‍රතිපත්තිය

දූෂණය හෝ වංචාව වැනි සිදුවීම් වාර්තා කිරීම වෙනුවෙන් කිසිදු සේවකයෙක් යම් ආකාරයක කොන් කිරීමකට හෝ සේවයෙන් ඉවත් කිරීමටකට යටත් නොවන බව සහතික කිරීමට බැංකුවේ තොරතුරු දැනුම්දීමේ ප්‍රතිපත්තිය ස්ථාපිත කරන ලදී. මෙම ප්‍රතිපත්තියෙන් වැලැක්වීම, මුලින් සොයා ගැනීම, වාර්තා කිරීම, නියාමනය, ප්‍රති සාධනය. සහ පසුවිපරම් කටයුතු ආවරණය කරයි. ගිණුම්කරණය, විගණනය, බලපෑම් කිරීම, වංචාවට හවුල්වීම, දූෂණය, අභ්‍යන්තර පාලනයන්, අක්‍රමිකතාවන්, මූල්‍ය වාර්තාකරණය. වංචාව සහ අයුතු ලෙස අත්කරගැනීම ඇතුළුව ක්ෂේත්‍ර ගණනාවක විෂමාචාර පිළිබඳ දැනුවත් කිරීමට මෙම ප්‍රතිපත්තිය තුළින් සේවකයින්ට හැකිවේ.

## අනාගත ප්‍රමුඛතා

| කෙටිකාලීන | මධ්‍ය කාලීන | දිගුකාලීන |
|---|---|---|
| අපගේ සේවකයින්ට ඔවුන්ගේ ජීවිත පොහොසත් කිරීමට විවිධ සෞඛ්‍ය සහ සුභසාධන සේවා අඛණ්ඩව ලබාදීම | මානව ප්‍රාග්ධන ක්‍රියාවලි ඩිජිටල්කරණය සහ ස්වයංක්‍රීයකරණය | තෝරාගත් ඉහළම සේවායෝජකයා බවට පත්වීම |
| තෘප්තිමත් ගනුදෙනුකාර අත්දැකීමක් ලබාදීම පිළිබඳ ඇගයීමක් සමඟ නිෂ්පාදන දැනුම. ගනුදෙනුකාර ශිල්ප සහ මෘදු කුසලතා පිළිබඳ ඉදිරි පෙළ සේවකයින්ට පුහුණුව ලබාදීම | කාර්යසාධනය පදනම් සංස්කෘතියක් කරා යොමු වීමට ඉලක්ක පදනම් කාර්යසාධන ඇගයීම් ක්‍රමයක් (KPI based) යොදා ගැනීම | අප සේවකයින් නිරතවන ඔවුන්ගේ සුභසාධනය ශක්තිමත් කරන පරිසරයක් නිර්මාණය කිරීම |
| ගනුදෙනුකාර අත්දැකීම වැඩි කිරීමට ක්‍රියාශීලී ඉදිරි පෙළ කාර්යාල කණ්ඩායමක් සංවර්ධනය කිරීම | ඊ-ඉගෙනුම් බිහිදොර හඳුන්වාදීම | |
| බඳවාගැනීමේ ක්‍රියාවලිය ඉහළ නැංවීම | | |



# සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

**සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය අපගේ සමාජීය සහ නෛතික බලපත්‍රයේ හැකියාව ක්‍රියාත්මක කිරීම තීරණය කරන ප්‍රජාවන්, පාර්ශ්වකාර කණ්ඩායම, සහ අනෙකුත් ජාල සමඟ අපගේ සම්බන්ධතාවය ආවරණය කරයි.**

## එයට ඇතුළත් දෑ

අපගේ ආරම්භයේ සිට ප්‍රජාවට දායක වෙමින් සහ අපගේ පරිසරය ආරක්ෂා කරමින් විශ්වාසය, අවංකකම සහ වටිනාකම් හුවමාරුව මත පදනම් වී සමීප සම්බන්ධතා ගොඩනැගීම අපගේ සාරධර්මවලට මූලික වේ. සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය ප්‍රජාවන්, පාර්ශ්වකාර කණ්ඩායම් සහ අනෙකුත් ජාල සමඟ අපගේ සම්බන්ධතා ආවරණය කරයි.

## යෙදවුම්

- ගනුදෙනුකරුවන් සමඟ ශක්තිමත් සහ කල්පවත්නා සම්බන්ධතා
- සේවකයින් සමඟ අර්ථාන්විත සහභාගිත්වය
- රජය සහ නියාමකයින් සමඟ ධනාත්මක සම්බන්ධතාවයක්
- ප්‍රජාව, පුරවැසියන් සහ මාධ්‍ය සමඟ සක්‍රීය මැදිහත්වීමක්
- ව්‍යාපාරි හවුල්කරුවන් සහ සැපයුම්කරුවන් සමඟ සහයෝගී සහ ගනුදෙනුකාර සම්බන්ධතා

## වටිනාකම් එකතු කරන ආකාරය

අපගේ සමාජ සහ නෛතික බලපත්‍රයේ හැකියාව රඳා පවතින්නේ අපි තනි තනිව සහ සාමූහිකව වටිනාකම් නිර්මාණය කරන අපගේ පාර්ශ්වකරුවන් සමඟ ශක්තිමත් සම්බන්ධතා රඳවා ගැනීම සඳහා අපගේ හැකියාව මතය. මෙවැනි සම්බන්ධතා අපගේ බැංකුවේ වැදගත් අනුබෝධය හැඩගස්වනු ලබයි. විශ්වාසය ගොඩ නැගීම සහ සියලුම දෙනා සඳහා වටිනාකම නිර්මාණය කිරීම සඳහා දැනුවත් තීරණ ගැනීම සඳහා අපගේ සියලුම පාර්ශ්වකරුවන් සමඟ අපගේ සම්බන්ධතාව අත්‍යවශ්‍ය වේ.

## අපගේ ප්‍රවේශය

- වටිනාකම් ලබාදෙමින් සහ ගනුදෙනුකාර අපේක්ෂාවන් අභිභවමින් ස්ථිර දිගු කාලීන ගනුදෙනුකාර සම්බන්ධතා ගොඩ නැගීම
- ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් තුළින් අපගේ මෙහෙයුම් තුළ සහ ඒ වටා ප්‍රජාවන් සඳහා සහය ලබාදීම
- අපගේ සැපයුම් දාමය තුළින් නිෂ්පාදනයට සහ සේවාවන්ට සහයවීම
- සේවක දක්ෂතා වැඩි කිරීම සහ ඔවුන්ට නව වෙළෙඳපොල අවස්ථා නිර්මාණය කිරීම
- වටිනාකම උපරිම කරමින් නෛතික සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලවීම
- "පාර්ශ්වකරුවන් සහභාගිත්වය" යටතේ 70 පිටුව තුළ දක්වා ඇති ස්ථිර සහ විනිවිද භාවයකින් පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය තුළින් අප ක්‍රියාත්මක වන සමාජයට සහ ප්‍රජාවට වැඩිකල වටිනාකමක් ලබාදීමට සහ සවිබලගැන්වීමට අර්ථවත් දායකත්වයක් සිදු කිරීමට අපි උත්සාහ ගනිමු
- පාර්ශ්වකරුවන් සම්බන්ධකර ගැනීම සඳහා සමස්ථ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරෙන අතර එහි අධිකාරිය සාමාන්‍යාධිකරී/ප්‍රධාන විධායක නිලධාරි වෙත පැවරේ

අපගේ සේවකයින් සමඟ සම්බන්ධතාව 130 පිටුවේ මානව ප්‍රාග්ධනය තුළ දක්වා ඇති අතර පරිසරය සමඟ සම්බන්ධතාව 162 පිටුවේ ස්වභාවික ප්‍රාග්ධනය තුළ සාකච්ඡා කෙරේ. එබැවින්, මෙම කොටසින් අපගේ ගනුදෙනුකරුවන්, නියාමකයින්, ව්‍යාපාර හවුල්කරුවන් සහ ප්‍රජාව සමඟ සම්බන්ධතා සාකච්ඡා කරයි.

## 2019 සඳහා ප්‍රධාන අභියෝග සහ අවස්ථාවන්


| ප්‍රධාන අභියෝග → | අවස්ථා |
|---|---|
| • පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් තුළ අඛණ්ඩ පරිණාමනය<br>• පාර්ශ්වකරුවන් අතර ඇල්ම පිළිබඳ ගැටුම් ආමන්ත්‍රණය සහ කළමනාකරණය<br>• විවිධ පාර්ශ්වකාර අවශ්‍යතා සපුරාලීමට සම්පත් වෙන්කිරීම<br>• සුහද සම්බන්ධතා පවත්වාගැනීමට අසමත්වීම කීර්තිනාම හානිවලට හේතු වේ | • අපගේ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා අපගේ ව්‍යාපාරයට ඒකාබද්ධ කිරීමට සහ අපගේ බැඳීම් ලබාදීමට ඇති හැකියාව<br>• අපගේ විවිධ පාර්ශ්වකරුවන්ගේ ගැටළුවලට වැඩි මැදිහත්වීමක් සහ ප්‍රතිචාරාත්මක බවක් සහතික කිරීම.<br>• දිගුකාලීනව ප්‍රජාව කෙරෙහි ධනාත්මක බලපෑමක් කිරීමට ඇති හැකියාව |



## සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනයේ වටිනාකම වැඩි කිරීමේ උපාය මාර්ග

- අපගේ ව්‍යාපාරයේ රඳා පැවැත්ම සඳහා පාර්ශ්වකරුවන් සමඟ දිගුකාලීන සම්බන්ධතා ගොඩ නැගීම
- තිරසාර සමාජ ආර්ථික සංවර්ධනය සඳහා හුවමාරු වටිනාකම නිර්මාණය
- ශක්තිමත් සමාජීය පාලනය සහ සාධාරණත්වය තුළින් නිෂ්පාදන සහ සේවාවන්හි තිරසාරභවය සහතික කිරීම

## වටිනාකම නිර්මාණයේ මූලිකාංග




## ප්‍රමාණාත්මක කරුණු



## අදාළ ඇල්මැති පාර්ශ්වකරුවන්



## වැදගත් සිදුවීම්


| | | |
|---|---|---|
| **මිලියන 20.9**<br>ගිණුම් සංඛ්‍යාව | **රු. මිලියන 8,095.3**<br>POS ගනුදෙනුවල වටිනාකම | **351**<br>ලියාපදිංචි සැපයුම්කරුවන් |
| **963**<br>සහායවූ ව්‍යවසායකයින් | **රු. මිලියන 29.8**<br>CSR ව්‍යාපෘතිවල මුළු ආයෝජනය | **348,904**<br>දුරකථනය හරහා ලද පැමිණිලි ගණන |
| **2,142,769**<br>භාවිත කඩ්පත් ගණන | **රු. 63.6**<br>POS ගනුදෙනුකරුවන්ට ලබාදුන් ණය | **රු. මිලියන 75,966.5**<br>ගනුදෙනුකරුවන්ට ගෙවූ පොලිය |

## මිනුම් දර්ශකය

| | වැඩිවීම/ අඩුවීම | **2019** | 2018 |
|---|---|---|---|
| මුළු ගිණුම් ගණන (මි.) | 0.5 | **20.9** | 20.4 |
| CSR ව්‍යාපෘතිවල මුළු ආයෝජනය (රු.මි.) | 13 | **30** | 17 |
| සැපයුම්කරුවන් ගණන | 198 | **351** | 153 |
| යටිතලපහසුකම්වල මූල්‍යකරණය (රු.මි.) | 2,458 | **7,520** | 5,062 |
| නිකුත් කළ කාඩ් ගණන | 19,367 | **251,471** | 232,104 |


## අනෙකුත් ප්‍රාග්ධනයන්ට සම්බන්ධතාවය

සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය එක් එක් ප්‍රාග්ධනයන්ට සහ ප්‍රාග්ධනයන් වෙතින් බලපෑමට ලක් වෙයි.




## විභව සමතුලිතතා

- ගනුදෙනුකාර අත්දැකීම ලබාදීම සහ ගනුදෙනුකාර අපේක්ෂාවන් ඉක්මවායාම
- ප්‍රජා සංවර්ධන වැඩසටහන් තුළ සහභාගීවීම
- නියාමන අවශ්‍යතා සමඟ අනුකූලතාව



## තිරසාර සංවර්ධන පරමාර්ථ සඳහා දායකත්වය

මෙම සෞඛ්‍ය වැඩසටහන තුළින් නීරෝගී ජාතියක් ගොඩනැගීමට අපගේ සහය ලබාදීම


අපගේ ශක්තිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළින් වගකීම් සහගත පරිභෝජනය සහ නිෂ්පාදනය අපි දිරිගන්වමු

ජාතියේ යටිතල පහසුකම් සංවර්ධනයට සහය වෙමින් තිරසාර ප්‍රජාවන් ගොඩ නැගීම කරා දායකවීම

මූල්‍ය අන්තර්කරණය මගින් දරිද්‍රතාව සහ විෂමතාව අඩුකිරීම කරා දායකවීම

"හපන්" ශිෂ්‍යත්ව වැඩසටහන,"ඉංග්‍රීසි සරලයි" ව්‍යාපෘතිය තුළින් සාක්ෂරතාව සහ අධ්‍යාපනය ප්‍රවර්ධනය සහ NSBM හි උසස් අධ්‍යාපනය ලබාදීමට සහනශීලී මූල්‍ය අනුග්‍රහකත්වය ලබාදීම

- ව්‍යාපාර හවුල්කාරත්ව ගොඩනැගීම




## නිමවුම්

- සමාජයතුල ක්‍රියාත්මක වීම සඳහා අනුකූලතාවය රඳවාගැනීම
- ගනුදෙනුකාර කේන්ද්‍රිය සහ විශ්වාසි සේවයක් ලබාදීම
- සාධාරණ සහ සමාන ටෙන්ඩර් ක්‍රියාවලිය
- සංවිධිත වෘත්තිය සමිති සමඟ සාමූහික ගිවිසුම්
- සාධාරණ, විනිවිද පෙනෙන සහ සදාචාර සම්පන්න කළමනාකරණය

## පක්ෂපාතී ගනුදෙනුකකාර පදනමක් ගොඩ නැගීම - ගනුදෙනුකාර ප්‍රාග්ධනය

### අපට ගනුදෙනුකාර ප්‍රාග්ධනය වැදගත්වන ආකාරය

අප සතු මිලියන 20 කට වැඩි ගිණුම්වලින් අපගේ ජාතිය තුළ වඩාත් විවිධාංගීකරණය වූ ගනුදෙනුකාර පදනමක් අප සතුවන බවට සහතික කරයි. අපගේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා ඵලදායී ආකරයෙන් සපුරාලීමට සහ ඔවුන්ගේ මූල්‍ය ශුභසාධනය වර්ධනය කිරීම පිණිස, සේවා ගුණාත්මකභාවය සහ ගනුදෙනුකාර අත්දැකීම් අපගේ මූලික වැදගත් ගැටළුව ලෙස අපි හඳුනාගෙන ඇති අතර අපගේ මූලික උපායමාර්ගික පරමාර්ථ ලෙස ගනුදෙනුකරුවන් මත පදනම්වීම හැඳින්විය හැක. අප කරන සෑම දෙයකම මධ්‍යයේ ගනුදෙනුකරු තබා ගනිමින්, අපගේ දැනට සිටින ගනුදෙනුකරුවන් රඳවාගැනීමට සහ නව ගනුදෙනුකරුවන් අත්කර ගැනීමට සුදුසු සහ නව්‍යකරණ පිරිවැය ඵලදායී නිෂ්පාදන සහ විසඳුම් පිරිනමමින් අපි අර්ථාන්විතව රැඳී සිටිමු.


### අපගේ ප්‍රවේශය

ඒකාබද්ධ ප්‍රවේශයක් යොදා ගනිමින්, අපගේ පුළුල් ශාඛා ජාලය, ජංගම සහ අන්තර්ජාල බැංකුකරණය, සහ අනෙකුත් අවකාශයන් වැනි විවිධ මාර්ගවලින් අපගේ සියලුම මැදිහත්වීම් තුළ උසස් ගනුදෙනුකාර සේවාවක් අපි ලබා දෙමු. අපගේ ගනුදෙනුකාර අත්දැකීම වර්ධනය කිරීම සඳහා. ගනුදෙනුකාර තෘප්තිය මැනීමට සහ වේගයෙන් සහ ඵලදායීව ගනුදෙනුකාර විමසීම් සහ පැමිණිලිවලට ප්‍රතිචාර දැක්වීමට සහ සමාජයේ සෑම අංශයකයම ගනුදෙනුකරුවන්ට සේවය සලසමින් පුළුල් නිෂ්පාදන කළඹක් ලබාදීමට සහ සියලුම ශ්‍රී ලාංකිකයින් සඳහා වන බැංකුවක් ලෙස අප ගොඩනගාගෙන ඇති විවිධ පරම්පරා සම්බන්ධතා ඉදිරියට ගෙනයාමට නවීන ක්‍රමයක් අපි යොදා ගෙන ඇත.

### ගනුදෙනුකාර ප්‍රාග්ධනයේ වටිනාකම වැඩි කිරීමේ ක්‍රමෝපායන්

- ගනුදෙනුකරුවන්ට වඩා ඉහළ වටිනාකම් ලබාදීමට බෙදාහැරීම් ජාලය පරිණාමනය කිරීම
- ඩිජිටල් ගනුදෙනුකාර සේවා ආකෘතිය ශක්තිමත් කිරීම
- ගනුදෙනුකරුගේ ගමන්මග කෙරෙහි ශක්තිමත් අවධානය

### වැදගත් තේමාවන්



### උචිත ක්‍රමෝපායික පරමාර්ථ



### විශ්වාසවන්ත ගනුදෙනුකාර පදනමක් ගොඩනැගීම සඳහා වටිනාකම් නිර්මාණය කිරීමේ මූලිකාංග

- උසස් ගනුදෙනුකාර අත්දැකීමක් ලබාදීම
- විවිධ ගනුදෙනුකාර පදනමකට සේවය
- ගනුදෙනුකාර දත්ත හා රහස්‍යභාවය ආරක්ෂා කිරීම
- ගනුදෙනුකාර තෘප්තිය වර්ධනය
- ගනුදෙනුකාර පැමිණිලි විසඳීම
- ගනුදෙනුකරුවන් කෙරෙහි වගකීමෙන් කටයුතු කිරීම
- ගනුදෙනුකරුවන් අතර දැනුම ඇති කිරීම

### උසස් ගනුදෙනුකාර අත්දැකීමක් ලබාදීම

මිලියන 20 කට අධික ගිණුම් සංඛ්‍යාවක් සමඟ ජාතියේ වඩාත් විවිධාංගීකරණය වූ ගනුදෙනුකාර පදනම අප සතුය. එම එක් එක් කාණ්ඩයන් පිළිබඳ සමීප අවබෝධයන් වර්ධනය කර ගැනීම සඳහා අප විසින් නිර්මාණය කරන ලද අගය වැඩිදියුණු කිරීම් ඔවුන් තෝරාගන්නා මාර්ග තුළින් අදාළ නිෂ්පාදන ලබාදීම තුළින් ඔවුන්ගේ විවිධ අවශ්‍යතා සපුරාලීමට සහ ආදර්ශවත් ගනුදෙනුකාර අත්දැකීමක් ලබාදීමට අපි උත්සාහ ගනිමු. අපගේ පුළුල් ගනුදෙනුකරු පදනම් නිෂ්පාදන කළඹ තුළින් ශ්‍රී ලංකා සමාජයේ සෑම කොටසක්ම ඉලක්ක කරමු. පුළුල් ශාඛා ජාලය, ජංගම සහ අන්තර්ජාල බැංකුකරණය සහ වෙනත් ඩිජිටල් අවකාශ තුළින් ලබාදෙන අපගේ උසස් තත්ත්වයේ සේවාව තුළින් අපගේ ගනුදෙනුකරුවන්ට බැංකුව සමඟ වඩා සරල, පහසු සෘජු සම්බන්ධතාවයකට අවස්ථාව ලබා දෙයි.

### ඩිජිටල්කරණය තුළින් තෘප්තිමත් ගනුදෙනුකාර අත්දැකීමක් ලබාදීම

ගනුදෙනුකාර අත්දැකීම අපගේ ව්‍යාපාරයේ තිරසාර වර්ධනයට අත්‍යාවශ්‍යය. අපගේ මාර්ග, සේවකයින් සහ නිෂ්පාදන තුළින් ගනුදෙනුකාර ගමන් මගේ සෑම අදියරකදීම ඉතා වැදගත් අවස්ථා නිර්මාණය කිරීමට අපි උත්සාහ ගනිමු. බාධා රහිත බැංකුකරණය ලබාගැනීමට සහ තෘප්තිමත් ගනුදෙනුකාර අත්දැකීමක් ලබාදීමට ගනුදෙනුකාර පහසුව වැඩිකිරීම, ප්‍රවේශතාවය වැඩිදියුණු කිරීම සහ කාර්යක්ෂමතාව, මූල්‍ය යහපැවැත්ම සහ සාක්ෂරතාව වර්ධනය සහ අපගේ ගනුදෙනුකරුවන්ට නව නිෂ්පාදන හඳුන්වාදීම අඛණ්ඩව සිදු කළෙමු.

ඩිජිටල් බැංකුකරණ යුගය තුළ, සියලුම බැංකුකරණ මෙහෙයුම් ඒකාබද්ධ කිරීමේ වැදගත්කම අපි හඳුනාගත් අතර අපගේ පද්ධති සහ ක්‍රියාවලි වර්ධනය කර පවත්වා ගැනීම අපි අඛණ්ඩව සිදු කරමු. ඒ අනුව, බැංකුව සමාලෝචිත වසර තුළ භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය සහ මානව සම්පත් කළමනාකරණ පද්ධතිය සමඟ ජාත්‍යන්තරව පිළිගත් ඒකාබද්ධ T24 මධ්‍ය බැංකුකරණ විසඳුම ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. ගනුදෙනුකරුවන් සඳහා ඩිජිටල් අත්දැකීම වැඩිදියුණු කිරීමේ බැංකුවේ මුලපිරීම් සහතික කරමින්, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ආයතනික වෙබ් අඩවිය වන www.nsb.lk සඳහා LK ඩොමේන් රෙජිස්ට්‍රි විසින් සංවිධානය කළ Bestweb.lk 2019 තරඟයේදී අඛණ්ඩව දෙවන වරටත් වඩාත් ජනප්‍රිය ආයතනික වෙබ් අඩවිය සම්මානය (ලෝකඩ) අප වෙත ප්‍රදානය කරන ලදී.

ගනුදෙනුකාර අත්දැකීම වර්ධනය පිණිස, අපගේ නිෂ්පාදන සහ සේවා ඉහළ නැංවීමට, නව්‍යකරණය ඉදිරියට ගෙනයාමට, කඩිසරකම වැඩි කිරීමට සහ අපගේ ගනුදෙනුකරුවන්ට ඔවුනගේ අවශ්‍යතා ඉටුකර ගැනීමට ස්වයං සේවා සඳහා හැකියාව වැඩි කිරීමට අපගේ ඩිජිටල් හැකියාවන් තුළ දැනුවත් සහ ස්ථාවර ආයෝජනය සිදු කිරීමට අපි කටයුතු කරමු.

අපගේ ගනුදෙනුකරුවන්ගේ වේගයෙන් වෙනස්වන ජීවන රටාවන්ට සේවය සැලසීම සහ ඉහළ මට්ටමේ සහභාගිත්වය ගෙන යාමට ගනුදෙනුකාර පහසුව ඉහළ නැංවීම පිණිස, 24/7 බැංකුකරණය ඇති කරමින් ඒටීඑම්, සී ආර් එම් (මුදල් ප්‍රතිචක්‍රීය යන්ත්‍ර) සහ IDMS වලින් සමන්විත එන්එස්බී සම්බන්ධිත කලාප පිහිටුවීම අපි තවදුරටත් සිදු කරමු. එමෙන්ම, ගනුදෙනුකාර සේවය කෙරෙහි අවධානය යොමු කරමින් අපගේ ශාඛා ජාලය ස්වයංක්‍රීයකරණය කිරීමට සහ ගනුදෙනුකාර පිවිසුම් ස්ථාන වැඩි කිරීමට අපි කටයුතු කරමු.

වැඩිදුර විස්තර සඳහා, කරුණාකර 112 පිටුවේ නිෂ්පාදිත ප්‍රාග්ධනය සහ 120 පිටුවේ බුද්ධිමය ප්‍රාග්ධනය බලන්න.

## ඩිජිටල් සහභාගිත්වය

වසර තුළ, සමාජ මාධ්‍ය තුළින් අපගේ ගනුදෙනුකරුවන් සමඟ අපගේ මාර්ගගත සහභාගිත්වය තවදුරටත් පුළුල් කරන ලදී.



www.nsb.lk
සාමාන්‍ය මාසික නරඹන්නන් – 51,000
2019 තුළ ලද සම්මාන – 2
613,000
**120.6%**

twitter.com/NSBSLOfficial
භාවිතාකරන්නන් 116 – හුදෙක් ඓන්ද්‍රීය වර්ධනය
116
**84%**

www.facebook.com/NSBSLOfficial
ප්‍රේක්ෂක පදනම – 109,640
109,640
**27%**

www.youtube.com/c/NationalSavingsBankNSBSLOfficial
දායකයින් 920 – හුදෙක් ඓන්ද්‍රීය වර්ධනය
920
**65%**

www.linkedin.com/company/nsbslofficial
භාවිතා කරන්නන් 512 – හුදෙක් ඓන්ද්‍රීය වර්ධනය
512
**33%**

www.instagram.com/NSBSLOfficial
භාවිතා කරන්නන් 908 – 2019 මාර්තු 1 දින ආරම්භ කරන ලදී
908

### අපගේ නිෂ්පාදන පිරිනැමීම වැඩි කිරීම

විවිධ ගනුදෙනුකාර අංශවල අවශ්‍යතා සපුරාලීමට අපි පුද්ගලගත නිෂ්පාදන සහ සේවා පිරිනමමු. වෙනස්වන ගනුදෙනුකාර අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි, ගනුදෙනුකරුවන්ගේ වෙනස්වන අවශ්‍යතාවන් තෘප්තිමත් කරමින් පහත සඳහන් නිෂ්පාදන සහ වැඩිදියුණු කිරීම් සිදුකරන ලදී.

- **ඊ-කනෙක්ට් දියත් කිරීම**

අපගේ අන්තර්ජාල බැංකුකරණ අවකාශය "NSB e-connect connect anytime." හැඳුනුම් සංකේතය යටතේ නැවත දියත් කරන ලදී.

මෙම සේවාවන් සම්පූර්ණයෙන්ම නොමිලේ වන අතර ඉන් බැංකුකරණ සේවාවන් ලබාගැනීමේ පහසුව අත්විඳිය හැක. මෙම සේවාවන්ට ශේෂය විමසීම, උපයෝගිතා බිල්පත් ගෙවීම සහ අරමුදල් මාරුකිරීම ඇතුළත්ය.

- **එන්එස්බී ඉන්ස්ටග්‍රෑම් මාර්ගය දියත් කිරීම**

සමාජ මාධ්‍ය පරිශීලකයින්ගේ වැඩිවන සංඛ්‍යාවත් සමඟ, අපි ගනුදෙනුකරුවන් සමඟ විශේෂයෙන් සහශ්‍ර වර්ෂිකයින් සමඟ ඉහළ මට්ටමේ සහභාගිත්වයක් ඇති කිරීමට එන්එස්බී ඉන්ස්ටග්‍රෑම් ආරම්භ කළෙමු. මේ තුළින් ඉහළ සන්නාම දෘශ්‍යතාවක් ලබාගැනීමට, අපගේ දෘශ්‍ය අලෙවිකරණය වැඩිදියුණු කිරීමට සහ වඩාත් කාර්යක්ෂමව වඩා විශාල ගනුදෙනුකාර පදනමක් සමඟ සම්බන්ධවීමට අපට හැකියාව ලැබී ඇත.

- **ප්‍රාර්ථනා+ ඉතුරුම් සහතිකය**

මෙය 2019 ලෝක සකසුරුවම් දිනය ඉලක්ක කරමින් හඳුන්වා දෙන ලද ප්‍රාර්ථනා ඉතුරුම් සහතිකයේ පුළුල් පිටපතකි. ප්‍රාර්ථනා+ තුළින් එක් වසරක සිට වසර 20 ක කාල පරාසයක් සඳහා රු. 25,000/= සිට රු. 10,000,000 දක්වා කල්පිරීමේ වටිනාකමක් තෝරාගැනීමට ගනුදෙනුකරුවන්ට ඉඩ ලබා දේ. මූලික තැන්පතුව කල්පිරීමේ කාලය සහ කල්පිරීමේ වටිනාකම මත පදනම් වේ. මෙම නිෂ්පාදනයෙන් බැංකුවේ දිගුකාලීන තැන්පතු පදනම වැඩි කරමින් ගනුදෙනුකරුවන් සඳහා ඉහළ ප්‍රතිලාභ ලබා දේ.

- කොරියාවට සංක්‍රමණය වන සේවකයින් සඳහා පිටත්වීමට පෙර ණය යෝජනා ක්‍රමය
- මාස 12 මාසිකව පොළී ගෙවන විදේශ ව්‍යවහාර මුදල් සඳහා (ඇ.එ.ඩො, බ්‍රිතාන්‍ය පවුම් සහ ඕස්ට්‍රේලියානු ඩොලර්) ස්ථාවර තැන්පතු යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම
- සංක්‍රමණික සේවකයින් සඳහා "සිහින මාලිගා" විශේෂ ණය යෝජනා ක්‍රමය

### බැංකුකරණය සරල කිරීම


වේගයෙන් වෙනස්වන ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දැක්වීමට සහ දෝෂ රහිත වේගවත් ගනුදෙනුකාර සේවාවක් ලබාදීමට නම්‍යතාව සහිතව කාර්යක්ෂමවීමට අපි අඛණ්ඩව අවධානය යොමු කරමු. වටිනාකමක් එකතු නොකරන ක්‍රියාකාරකම් ඉවත් කිරීමෙන් (පිටු අංක 127 දක්වා බලන්න) සහ රැඳී සිටීමේ කාලය අඩු කරන අධිකාරී මට්ටම් පැවරීමෙන්ද, වඩාත් වැදගත් දේ කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා ඉහළ මට්ටමේ කළමනාකරණය නිදහස් කිරීමෙන්ද, වසර තුළ ඉතිරිකිරීමේ ගිණුම්, ණය සහ ගනුදෙනුකරුවන්ට සහ සැපයුම්කරුවන්ට ගෙවීම් සම්බන්ධ ක්‍රියාවලි නැවත සැලසුම් කර සරල කරන ලදී. තවද, පද්ධති වැඩි දියුණු කිරීම සහ ඒකාබද්ධකිරීම තුළින් ගනුදෙනුකාර ගමන් මඟ එකපෙළට ස්වයංක්‍රීයකරණය වැඩි කිරීමට වසර තුළ ව්‍යාපාති කිහිපයක් ආරම්භ කරන ලදී (පිටු අංක 118 සිට 119).

### විශේෂ අවශ්‍යතා සහිත ගනුදෙනුකරුවන්ට සේවය සැලසීම

අපගේ බැංකුවට පැමිණෙන සෑම පුද්ගලයෙකුටම ගෞරවයෙන් සහ ආචාරශීලීව සැලකීම අනර්ඝ ගනුදෙනුකාර සේවාවක වටිනාම දෙය වේ. සියලූම දෙනා ඇතුළත් සමාජයක් කරා ගමන් කිරීම තුළ සක්‍රිය කාර්යභාරයක් අරගනිමින් අපි ගනුදෙනුකරුවන්ගේ විශේෂ අවශ්‍යතා හඳුනාගෙන අපගේ ශාඛාවලදී ඔවුන් සඳහා පහසු බැංකුකරණ සේවාවක් සපයමු. විවිධ ආබාධ සහිත පුද්ගලයින් සඳහා පිවිසීම සහිතව අපගේ ශාඛා ස්ථාපිත කිරීමට අපි උත්සාහ දරන අතර, එය සියලූම නව ශාඛා සහ දැනට පවත්නා ශාඛා නැවත ස්ථානගත කිරීමේදී අනිවාර්ය අංගයකි. මේ දක්වා, අපගේ ශාඛා 224ක විවිධ ආබාධ සහිත පුද්ගලියන්ට ප්‍රවේශය ඇත.

### විවිධ ගනුදෙනුකාර පදනමකට සේවය කිරීම

ශ්‍රී ලංකාව තුළ ප්‍රමුඛ මූල්‍ය ආයතනයක් ලෙස, සමාජයේ සියලුම අංශවල ගනුදෙනුකරුවන්ට අපි සේවය සලසමු. අපගේ එන්එස්බී සන්නාම නාමයේ අංගයක් වන "ජාතිය" යන්නට එකඟව කටයුතු කරමින්, බැංකු පහසුකම් නොමැති සහ බැංකු සේවාවන් අඩුවෙන් ඇති පුරවැසියන් ඇතුළුව අපගේ ජාතියේ සියලුම පුරවැසියන්ට අපි සේවය කරමු. අපගේ පුළුල් පරාසයක නව්‍යකරණය සහ දැරිය හැකි විසඳුම් තුළින්, ජීවිතයේ සෑම අදියරකම සිටින ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා අපි සපුරාලන්නෙමු.


පළමු ඉතුරුම් ගිණුම
උසස් අධ්‍යාපනය
පළමු රැකියාව
විවාහය සහ පවුලක ආරම්භය
වාහනයක් හෝ දේපල මිලදී ගැනීම
විශ්‍රාම ගැනීමේ සැලසුම්
විශ්‍රාම ගැනීම
0
10
20
30
40
50
60
70
හපන්
ප්‍රාර්ථනා
I'm
ගෞරවය
ජ්‍යෙෂ්ඨ පුරවැසි
Neo
බුද්ධි
පෙන්ෂන් +
වාහන ණය
දිරිය
පරිසර ණය
පුද්ගල ණය (තනිපුද්ගල)
රිච්
නිවාස ණය (ගේදොර අලංකාර සහ විතසිත)
චාරිකා
රන්සහන
ස්ත්‍රී
හැපි
පස් අවුරුදු

GRI 418-1

## ගනුදෙනුකාර දත්ත සහ රහස්‍යතාව ආරක්ෂා කිරීම

ගනුදෙනුකාර දත්ත සහ රහස්‍යතාව ආරක්ෂා කිරීම ගනුදෙනුකාර විශ්වාසය පවත්වාගෙන යාමේදී තීරණාත්මක වේ. ඩිජිටල් බැංකුකරණය වැඩි වීමත් සමඟ, සයිබර් අපරාධ අවදානම් වැඩි වී ඇත. ඒ නිසාම අපි බැංකුවේ වැදගත් ගැටළුවක් ලෙස සයිබර් ආරක්ෂාව හඳුනාගෙන ඇත. ගනුදෙනුකාර රහස්‍යතාව සහ අපගේ පද්ධති ආරක්ෂා කිරීමේ අපගේ උත්සාහය තුළ, නවීන තාක්ෂණය සඳහා අපි ආයෝජනය කර ඇත. අපගේ පද්ධතිවල ආරක්ෂාව බැංකුවේ පනත, ගනුදෙනුකාර ප්‍රඥප්තිය සහ අපගේ තොරතුරු පද්ධති ආරක්ෂණ ප්‍රතිපත්තිය මගින් තවදුරටත් ශක්තිමත් කෙරේ. අපගේ පද්ධතිවල ආරක්ෂාව තක්සේරු කිරීම සහ සහතික කිරීම සඳහා නිරන්තර පරීක්ෂණ සහ ඇගයීම් පවත්වනු ලැබේ. බැංකුවේ තොරතුරු ආරක්ෂණ නිලධාරියා (ISO) විසින් සයිබර් ආරක්ෂක අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීම සහ යම් ව්‍යතිරේක ඇත්නම් ඒවා ස්වාධීනව අධීක්ෂණය කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි.

2019 දී ගනුදෙනුකාර රහස්‍යතාව කඩකිරීම හෝ ගනුදෙනුකාර දත්ත නැතිවීම සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් හෝ බැංකුව මත පනවන ලද කිසිදු දඩමුදලක් හෝ වෙනත් සම්බාධක පැනවීමක් නොමැත. ගනුදෙනුකාර දත්ත සහ රහස්‍යතාව ආරක්ෂා කිරීමට බැංකුව විසින් ගෙන ඇති පියවර පිළිබඳ වැඩිදුර දැනගැනීම සඳහා, 127 පිටුවේ බුද්ධිමය ප්‍රාග්ධනය බලන්න.

## ගනුදෙනුකාර තෘප්තිය වර්ධනය

සුවිශේෂී ගනුදෙනුකාර අත්දැකීමක් ලබාදෙමින් අපි ගනුදෙනුකාර සම්බන්ධතා පෝෂණය කරමු. අපගේ සියලුම ගනුදෙනුකරුවන්ට අපගේ මැදිහත්වීම තුළ විශිෂ්ඨ අත්දැකීමක් ලැබෙන බව සහතික කිරීමට අපි උත්සාහ ගනිමු. ගනුදෙනුකාර සේවය අඛණ්ඩවම වර්ධනය කිරීමේ අපගේ උත්සාහයන් තුළ, ඔවුන්ගේ සියලුම මූල්‍ය අවශ්‍යතා සඳහා ඒකාබද්ධ, පරිපූර්ණ විසඳුම් පිරිනැමීමට අපි කැපවී සිටිමු.

ගනුදෙනුකාර සේවය වර්ධනය කිරීමේ අපගේ උත්සාහයන් තුළ, ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත් මට්ටම නිවැරදිව ඇගයීම මගින් ඔවුන්ගේ අපේක්ෂාවන්ට අනුකූලව ගනුදෙනුකාර වටිනාකම් ලබාදීම සඳහා ගනුදෙනුකාර අත්දැකීම වැඩිදියුණු කිරීම තුළ අපි තවදුරටත් ආයෝජනය කරමු. මෙවැනි සමීක්ෂණවල ප්‍රතිඵල සමස්ත උපායමාර්ග සකස් කිරීමේදී වැදගත් යෙදවුමක් ලබ දේ. අපගේ නම්කළ ගනුදෙනුකාර සේවා නිලධාරීවරුන් හරහා, ශාඛා මට්ටමින් සකස්කරන ලද සේවාවක් අපි අඛණ්ඩව පිරිනමමු. හරපත් හිමියන් වෙත ලෝයල්ටි වැඩසටහන් සහ ප්‍රතිලාභ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම මගින් ගනුදෙනුකරුවන්ගේ පක්ෂපාතිත්වය ඉදිරියට ගෙන යාමට අපි කටයුතු කරමු. ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ පැමිණිලි, විමසීම් දුක් ගැලවිලි සහ වෙනත් අදහස් ඉදිරිපත් කිරීම සඳහා අවකාශ කිහිපයක් ස්ථාපිත කර ඇත. 24/7 ක්‍රියාත්මක වන බැංකුවේ අමතුම් මධ්‍යස්ථානය. දිවයින පුරා අපගේ ශාඛාවල පුහුණු කාර්ය මණ්ඩලය, ශාඛා පරිශ්‍රයන් හි යෝජනා පෙට්ටි, සමාජ මාධ්‍ය සහ www.nsb.lk වෙබ් අඩවිය සහ විද්‍යුත් ලිපි, ස්කයිප් සහ
වෙබ් චැට් වැනි අනෙකුත් ඩිජිටල් ක්‍රම මෙයට ඇතුළත්ය.

## ගනුදෙනුකාර ගැටළු විසඳීම

අත්දැකීම්වල ගමන්මග ගනුදෙනුකරුගේ ආරම්භක සබැඳුම සමඟ ආරම්භ වන අතර ඔවුන්ගේ බැංකුකරණ ගැටළු සපුරාලීම දක්වා එය පුළුල් වේ. කාර්යක්ෂම ආකාරයකින් සියලුම ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි විසඳීම සඳහා ශක්තිමත් ක්‍රමයක් අපි ක්‍රියාත්මක කර ඇත. ඇමතුම් මධ්‍යස්ථානය, මාර්ගගත නාලිකා සහ ශාඛා ඇතුළුව විවිධ අවකාශ ගනුදෙනුකාර දුක්ගැනවිලි ඉදිරිපත් කිරීම සඳහා ස්ථාපිත කර ඇත.

ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ විමසීම්, පැමිණිලි සහ දුක්ගැනවිලි සහ අනෙකුත් අදහස් 24/7 ක්‍රියාත්මක වන බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය. දිවයින පුරා අපගේ ශාඛාවල පුහුණු කාර්ය මණ්ඩලය, ශාඛා පරිශ්‍රයන් හි යෝජනා පෙට්ටි, සමාජ මාධ්‍ය සහ www.nsb.lk, වෙබ් අඩවිය සහ විද්‍යුත් ලිපි, ස්කයිප් සහ වෙබ් චැට් වැනි අනෙකුත් ඩිජිටල් ක්‍රම තුළින් ද ඉදිරිපත් කළ හැකිය.

බැංකුව සහ අපගේ ගනුදෙනුකරුවන් අතර මූලික සන්නිවේදනය මාධ්‍ය වන්නේ ඇමතුම් මධ්‍යස්ථානය වන අතර එය ගනුදෙනුකාර විමසීම් සහ දුක්ගැනවිලි නිරාකරණය කිරීමට කැපවී සිටී. සියලුම ඇමතුම් ඉහළ පුහුණුවලත් සහ දක්ෂ ගනුදෙනුකාර සේවා නියෝජිතයින් මගින් හසුරුවන ලබයි. විමසුමක් මුලින්ම නියෝජිතයා විසින් මෙහෙයවන අතර ඔහු එය අදාළ දෙපාර්තමේන්තුව වෙත යොමු කරයි. සෑම විමසීමක් සඳහාම යොමු අංකයක් සකස් කරන අතර එය ගනුදෙනුකරුවාට පසුවිපරම් සඳහා භාවිතා කිරීමට දෙනු ලබයි.

ගනුදෙනුකාර පැමිණිල්ල සහ එය විසඳීමට ගනුලැබූ ක්‍රියාමාර්ගය පිළිබඳ වාර්තාවක් සෑම මාසයකදීම සම්පාදනය කර කළමනාකරණය වෙත ඉදිරිපත් කරනු ලබයි. ගනුදෙනුකාර පැමිණිලිවලට අවධානය යොමු කිරීමට, ගැටළු විසඳීමට සහ දුෂ්කර අවස්ථාවන් වෙනස් කිරීමට අවශ්‍ය දක්ෂතා සමග "බැංකුව හරහා" පුහුණු වැඩසටහන තුළින් අපගේ සේවකයින් අඛණ්ඩව සවිමත් කරමු. 2019 දී විසඳන ලද සිදුවීම් 84.7% දක්වා වැඩිවීම ගනුදෙනුකාර පැමිණිලි මෙහෙයවා නිරාකරණය කරන ලද බවට සැලකියයුතු සාක්ෂියකි.

ඇමතුමකට පිළිතුරු දීමට ගතකළ සාමාන්‍ය කාලය

**<30Sec**





ලද ගනුදෙනුකාර පැමිණිලි ගණන

**203**
(2018 – 220)



විද්‍යුත් ලිපිමගින් ලද විමසීම් ගණන

**4,759**
(2018 – 2,539)

දුරකථනය තුළින් ලද විමසීම් ගණන

**348,904**
(2018 – 248,977)

විසඳන ලද ගනුදෙනුකාර පැමිණිලි ගණන

**172**
(2018 – 160)



ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලද පැමිණිලි ගණන – නොමැත

මූල්‍ය ඔම්බුඩ්ස්මන් වෙත ලද පැමිණිලි ගණන – නොමැත

කාඩ්පත්වලට අදාළව ලද පැමිණිලි ගණන – විකුණුම් ස්ථානය

**2,706**
(2018 – 1,588)

කාඩ්පත්වලට අදාළව ලද පැමිණිලි ගණන-කාඩ් විමසීම්

**957**
(2018 – 836)



GRI 417-2, 3

## ගනුදෙනුකරුවන් වෙත වගකීමෙන් කටයුතු කිරීම

නිෂ්පාදන සහ සේවා සංවර්ධනය කිරීමේ සිට අලෙවිකරණය සහ විකුණුම් දක්වා අපගේ ක්‍රියාකාරකම් සහ ගනුදෙනුකරුවන් සමඟ ඇති සම්බන්ධතාවයන්හිදී සියළු අංශයන්හි වගකීම ගැඹුරින් අන්තර්ගත වේ. පහත සඳහන් කටයුතු තුළින් අපි වගකීම සහතික කරමු:

- අපගේ ගනුදෙනුකරුවන්ට සුදුසු සහ ආරක්ෂිත නිෂ්පාදන සහ සේවා පිරිනැමීම
- දැනුවත් තීරණ ගැනීම සඳහා පැහැදිලි, අදාළ සහ කාලීන තොරතුරු සන්නිවේදනය
- ඵලදායි සහ කඩිනම් ආකාරයක් තුළ ප්‍රතිචාර සමඟ කටයුතු කිරීම
- ගනුදෙනුකරු හඳුනාගෙන ගුණාත්මක සේවයක් ලබාදීම සඳහා අපගේ ශ්‍රමබලකායේ නිපුණතා ගොඩනැගීම
- පොළී අනුපාත, විනිමය අනුපාත, ණය අනුපාත වැනි අපගේ ණය සහ තැන්පතු පිළිබඳ අදාළ සියලුම දත්ත ශාඛා, විද්‍යුත් මාධ්‍ය සහ ආයතනික වෙබ් අඩවිය තුළ ප්‍රදර්ශනය කිරීම.
- නිෂ්පාදන සහ සේවාවන්ට අදාළ සියලුම නියමයන් සහ කොන්දේසි සහ පැමිණිලි නිරාකරණ ක්‍රියාපටිපාටි ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශවලට අනුකූලව සකස් කළ ගනුදෙනුකාර ප්‍රඥප්තියට අනුව ගනුදෙනුකරුවන් වෙත පැහැදිලිව සන්නිවේදනය කෙරේ. මූල්‍ය ඔම්බුඩ්ස්මන් තුළින් බැංකුවේ පැමිණිලි නිරාකරණ ක්‍රියාවලිය ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශවලට අනුකූලව සියලුම ශාඛාවල ප්‍රදර්ශනය කෙරේ.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතට අනුව, මහජන තොරතුරු නිලධාරියෙක් පත්කරනු ලැබ ඇති අතර ජනතාව සඳහා තොරතුරු ලබා ගැනීමේ අයිතිය සහතික කිරීමට ක්‍රියාපටිපාටිය අපි සකස් කර ඇත.

රෙගුලාසිවලට අනුකූලව, අපගේ සියලුම ප්‍රචාරණවල පහත සඳහන් තොරතුරු ඇතුලත්ය:

- අපගේ ඇමතුම් මධ්‍යස්ථානයේ ඇමතුම් විස්තර සහ ආයතනික වෙබ් ලිපිනය
- බැංකුවේ ණය ශ්‍රේණිගතකරණය – ICRA ලංකා ශ්‍රේණිගතකරණය
- ජාතික ඉතිරි කිරීමේ බැංකුව සඳහා සුවිශේෂී ලක්ෂණය – 100% රජයේ සහතිකය, බැංකුවේ ලාංඡනය සහ උද්‍යෝග පාඨය

සමාලෝචිත වසර තුළ යම් නිෂ්පාදනයක් සහ සේවාවක් ලේබල්කරණය හෝ අලෙවිකරණ සන්නිවේදනයට අදාළ රෙගුලාසි හෝ අනෙකුත් මාර්ගෝපදේශවලට අනුකූල නොවූ අවස්ථාවන් කිසිවක් නොමැත.

### ගනුදෙනුකරුවන් අතර දැනුවත්භාවය ඇති කිරීම

සෑම වසරකදීම, ගනුදෙනුකාර ලඟාවීම සහ තෘප්තිය වර්ධනය කිරීමට අපගේ ගනුදෙනුකරුවන් සඳහා දිවයින පුරා පිවිසුම් ස්ථානවල අලෙවිකරණ වැඩසටහන් අපි පවත්වන්නෙමු. අලෙවිකරණ නිලධාරීන් සහ අලෙවිකරණ සහයකයින් 76 දෙනෙක් සක්‍රියකරණය කිරීම තුළින් අපගේ අලෙවිකරණ යාන්ත්‍රණය වසර තුළ ශක්තිමත් කරන ලදී. ගනුදෙනුකරුවන්ගේ දැනුවත්භාවය වැඩි කිරීමට දිවයින පුරා ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම සඳහා ක්ෂේත්‍ර අලෙවිකරණ නිලධාරීන් ලෙස ඔවුන් සේවයේ යොදවා ඇත. විශේෂයෙන් ස්ත්‍රී සහ හපන් තැන්පතු වැඩසටහන් වඩාත් සාර්ථක වූ වැඩසටහන් වන අතර ඒවායින් ගනුදෙනුකරුවන්ගේ දැනුවත්භාවය වැඩි කර ඇත.

දෙසැම්බර් සහ ජනවාරි යන මාසවල නව පාසල් ප්‍රවේශකයින් ඉලක්ක කරමින් හපන් ළමා ඉතුරුම් නිෂ්පාදනය සඳහා විශේෂ ත්‍යාග වැඩසටහනක් සංවිධානය කරන ලදී. හපන් ගිණුම් දරන ගනුදෙනුකාර සංඛ්‍යාව තුළ වැඩිවීමකට මෙය හේතු වූ අතර එය සැලකියයුතු ජයග්‍රහනයකි.

ජාත්‍යන්තර කාන්තා දිනය සමරනු ලබන මාර්තු මාසය තුළ ස්ත්‍රී ප්‍රවර්ධන වැඩසටහන ස්ත්‍රී ඉතුරුම් නිෂ්පාදනය සඳහා ඉහළම බලපෑම සිදුකළ අතර එය මේ දක්වා ඉහළම සේවයේ යෙදවීම වාර්තා කිරීමට හැකියාව ඇති කරමින් නව ස්ත්‍රී ගිණුම් හිමියන් විශාල ප්‍රමාණයක් අළුතින් නිර්මාණය කරන ලදී.

GRI 102-9

## ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය – ව්‍යාපාර හවුල්කරුවන් සමග ශක්තිමත් සම්බන්ධතා ගොඩනැගීම

### ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය අපට වැදගත් වන ආකාරය

ශ්‍රී ලංකාව තුළ විශ්වාසී මූල්‍ය සේවා සපයන්නා ලෙස, අනුරූප බැංකු, විනිමය හුවමාරු නිවාස, සැපයුම්කරුවන්, බාහිර සේවා සපයන්නන්, සහ අනෙකුත් ව්‍යාපාර හවුල්කරුවන් ඇතුළුව අපගේ ව්‍යාපාර හවුල්කරුවන් සමඟ ශක්තිමත්, ඵලදායී සහ දිගුකාලීන සම්බන්ධතා අපි ගොඩ නගා ඇත. මෙම සම්බන්ධතා අපගේ ගනුදෙනුකරුවන්ට පහසු සහ බාධා රහිත සේවාවක් ලබාදීම තුළ අපගේ වටිනාකම් නිර්මාණ ක්‍රියාවලියේ වැදගත් අංගයක් සාදනු ලබන අතර කිසිදු බාධාවකින් තොරව වඩා පහසු ආකාරයෙන් ව්‍යාපාරය කරගෙන යාමට සහය වේ.

### අපගේ ප්‍රවේශය

අපගේ ව්‍යාපාර හවුල්කරුවන් අපගේ ව්‍යාපාරයේ පුළුල්වීමක් ලෙස සහ තෝරාගත් බැංකුව බවට අපව පත්කිරීමේ දී සහයවන මූලිකයා ලෙස අපි සලකමු. රාජ්‍ය බැංකුවක් ලෙස, අපගේ දේශීය සහ ජාත්‍යන්තර ව්‍යාපාර හවුල්කරුවන් සමඟ අපගේ සහභාගිත්වය තුළ ක්‍රමානුකූල, විනිවිද, සදාචාර ආයතනික ප්‍රතිපත්ති තුළින් අපි සීමා සකස් කරමු. මෙහෙයුම් සහ ක්‍රියාකාරකම්, වෙළෙඳපොල පිවිසීම සහ ව්‍යාපාර අවස්ථා අනුව අන්‍යෝන්‍ය වටිනාකම ඇති කරමින් මෙම දිගුකාලීන තිරසාර ව්‍යාපාර සම්බන්ධතා ගොඩනැගීමට අපි උත්සාහ ගනිමු.


### ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනයේ වටිනාකම වැඩි කිරීමේ උපායමාර්ග

- නිරන්තර සහභාගිත්වය
- විනිවිද සහ තිරසාර ප්‍රසම්පාදන ක්‍රියාවලි සහතික කිරීම

### ප්‍රමාණාත්මක කරුණු




### කෙටි කාලයේ සිට මධ්‍ය කාලය දක්වා උපාය මාර්ගික ප්‍රමුඛතා

### ව්‍යාපාර හවුල්කරුවන් සමඟ ශක්තිමත් සම්බන්ධතා ගොඩ නැගීම සඳහා වටිනාකම් නිර්මාණය කිරීමේ මූලිකාංග

- වගකීම් සහගත ප්‍රසම්පාදනය
- බාහිර සේවා සපයන්නන්ට වටිනාකම ලබාදීම
- වගකීම් සහගත සන්නිවේදනය
- අපගේ උපාය මාර්ගවල සම්බන්ධතා ශක්තිමත් කිරීම
- කර්මාන්තයේ සාමාජිකත්වයන්

## අපගේ ව්‍යාපාර හවුල්කාර කළඹ




### මූල්‍ය සේවා සපයන්නන්

- බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන
- අනුරූප බැංකු
- විනිමය හුවමාරු ආයතන
- යුරෝජයිරෝ සමාගම්



### බාහිර සේවා සපයන්නන්

- ආරක්ෂාව
- ආහාර සහ පානීය ජලය
- සනීපාරක්ෂාව සහ පිරිසිදු කිරීමේ සේවා
- ප්‍රවාහනය සහ වෙනත්
- ඉදිකිරීම සහ නඩත්තු සේවා



### IT (තොරතුරු තාක්ෂණ) ආශ්‍රිත සේවා

- IT දෘඩාංග සැපයුම්කරුවන්
- IT මෘදුකාංග සංවර්ධකයින් සහ සැපයුම්කරුවන්
- ජාල සේවා ආරක්ෂාව



### වෘත්තීමය සේවා

- විගණකයින්
- උපදේශන සේවා සපයන්නන්



### ස්ථාවර වත්කම් සහ ද්‍රව්‍ය

- මෝටර් රථ
- ලීබඩු
- ඉඩම් සහ දේපල
- කාර්යාල උපකරණ
- ලිපිද්‍රව්‍ය
- වෙනත් ද්‍රව්‍ය





### උපයෝගිතා සපයන්නන්

- විදුලිය/ජලය/බලශක්තිය

GRI 204-1

## වගකීම් සහගත ප්‍රසම්පාදනය

අපගේ සැපයුම්කරුවන් උපාය මාර්ගික හවුල්කරුවන් බවට අපි සලකනු ලබන අතර ඒ අනුව, ගුණාත්මකභාවය, සේවා සහ සදාචාර පිළිබඳ ඉහළම ප්‍රමිතීන් පිළිපැදීම අපි අපේක්ෂා කරමු. 2019 දි මුළු ප්‍රසම්පාදනය රු.බි. 2.2ක් වූ අතර අපගේ භාණ්ඩ සහ සේවාවලින් 100% ක් දේශීය ප්‍රජාවන් සමඟ සම්පව කටයුතු කිරීම මගින් දේශිය සැපයුම්කරුවන්ගෙන් ප්‍රසම්පාදනය කෙරේ. අපගේ සියලූම සැපයුම්කරුවන් ශ්‍රී ලංකා රජය විසින් නියමකළ ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල වන බව අපි සහතික කරමු.

අපි විනිවිද සැපයුම්කාර තෝරා ගැනිමේ ක්‍රියාවලියක් ක්‍රියාවේ යොදවා ඇත. අපගේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය වෙනස් ලෙස නොසැකීම සහ සමානව සැලකීම, රහස්‍යතාව, සාධාරණත්වය, විවෘතබව සහ වගවීම තුළ කටයුතු කරයි. සමතුලිත ආකාරයකින් වටිනාකම උත්පාදනය කිරීම සඳහා, අපට විවිධාංගීකරණය වූ සැපයුම් දාමයක් ඇත. අපගේ ශක්තිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රධාන ලක්ෂණ පහත දැක්වේ:

- ප්‍රසම්පාදනය තුළ ආර්ථිකය සහ කාර්යක්ෂමතාව උපරිම කිරීම
- නියමිත ප්‍රමිති, පිරිවිතර, නියමයන් සහ රෙගුලාසිවලට අනුකූලවීම
- අත්කරගත් වත්කම් බැහැර කිරීමේදි හෝ හිමිකම්, අනුග්‍රහ හෝ පරම ප්‍රතිලාභ ලබාදීමේදී ආදායම උපරිම කිරීම
- ප්‍රසම්පාදනය තුළ සහභාගිවීමට උනන්දුවක් දක්වන පාර්ශ්වයන් සඳහා සාධාරණ සහ සමාන අවස්ථාව ලබාදීම
- භාණ්ඩ සහ සේවා ලබාදීමේදී වේගවත් ක්‍රියාදාමය
- දේශිය සහ ජාත්‍යන්තර නීති සහ රෙගුලාසිවලට අනුකූලවීම
- ඇගයිම සහ තෝරාගැනීමේ ක්‍රියාවලිය තුළ විනිවිදභාවය සහ ඒකාකාරිබව සහතික කිරීම
- ලංසුකරු විසින් සපයන ලද තොරතුරුවල රහස්‍යතාව සුරක්ෂිත කිරීම

වෙනස්වන අවශ්‍යතාවන්ට අනුව අපගේ ප්‍රසම්පාදන සැලැස්ම අපි යාවත්කාලීන කරමු. බාහිර සැපයුම්කරුවන්ගේ සේවය ස්ථාවර වත්කම්, පාරිභෝගික භාණ්ඩ, අයිතම, මුද්‍රණය, අලෙවිකරණයල ප්‍රවර්ධන කටයුතු, නඩත්තුව සහ ඉදිකිරිම් සේවා සහ විශේෂ අවස්ථාවලදී උපදේශන සේවා මිලදී ගැනීම සඳහා භාවිතා කරයි.

විවිධ ප්‍රසම්පාදන සඳහා බැංකුවේ ප්‍රතිපත්තිය මගින් විවිධ ක්‍රියාපටිපාටි පැහැදිලිව දක්වා ඇත. බැංකුවේ සැපයුම් අංශය ප්‍රසම්පාදනය කරන අතර ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී හෝ බලයලත් බලධාරීන් විසින් පත් කරන ලද අදාළ ප්‍රසම්පාදන කමිටු, තාක්ෂණික ඇගයීම් කමිටු, සහ ලංසු විවෘත කිරීමේ කමිටු විසින් අධීක්‍ෂණය කරයි. ප්‍රසම්පාදන අංශය විසින් ආරම්භක පාරිසරික පරීක්ෂණ (IEE), පාරිසරික බලපෑම් ඇගයීම (EIA), සහ අවශ්‍යනම් අධිකාරීන්ගෙන් අවශ්‍ය අනුමැතිය, නියාමනය සහ සහතික කිරීම සඳහා වගකීමට බැඳි සිටී. ක්‍රියාවලිය තුළට ආර්ථික, සමාජ සහ පාරිසරික බලපෑම් ඒකාබද්ධ කරමින් අපගේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට තිරසාරභාවය අපි එකතු කර ඇත. පොදු තෝරා ගැනීමේ නිර්ණායකවලට සේවාවේ තත්ත්වය, තරඟකාරී මිලගණන්, පළපුරුද්ද සහ දක්ෂතාව, මූල්‍ය යහපත් බව, නම්‍යතාව සහ හැකියාව මෙන්ම නීතිමය අවශ්‍යතාවන්ට අනුකූලතාවය ඇතුළත්ය.

## බාහිර සේවා සපයන්නන්ට වටිනාකම ලබාදීම

වසර තුළ, බැංකුව තුළ කොන්ත්‍රාත් පදනම මත සිටින සේවකයින් ඇතුළුව බාහිර සේවා සපයන්නන් වෙත රු.මි. 398.7 ක් ගෙවන ලදී. බාහිරින් ලබාගැනීම සඳහා උපදෙස් ලබාදෙන අපගේ බාහිරින් ලබාගැනීමට අදාළ ප්‍රතිපත්තිය මගින් බාහිර ක්‍රියාව, සේවය ක්‍රියාවලිය හෝ කාර්යය සහ එය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව ඇගයීමේ නිර්ණායක විස්තර කරයි. බලපත්‍රලාභි වාණිජ බැංකුවක් සහ බලපත්‍රලාභි විශේෂ බැංකුවක් පිළිවෙලින් ව්‍යාපාර මෙහෙයුම් බාහිරට ලබාදීම පිළිබඳ 2006 අංක 46 බැංකු පනත (සංශෝධිත) මගින් අවසන් වරට සංශෝධනය කළ 1988 අංක 30 දරන බැංකු පනතේ 46 (1) සහ 76 (J) (1) වගන්ති අනුව පවරන ලද බලය ක්‍රියාත්මක කරමින් 2012 අංක 2 දරන බැංකු පනත් නියෝගයට අනුව එය සකස් කරයි.

## වගකීම් සහගත සන්නිවේදනය

අපගේ සන්නිවේදන ප්‍රතිපත්තියේ දක්වා ඇති සියලූම අභ්‍යන්තර සහ බාහිර සන්නිවේදන උපරිම වගකිම, වගවීම, අනුකූලව සහ විනිවිදභාවය සමඟ මෙහෙයවනු ලබයි. අපගේ සන්නිවේදන ප්‍රතිපත්තිය ඵලදායි රාමුවක් බව සනාථ කර ඇති අතර ඉන් අපගේ සන්නාම ප්‍රතිරූපය, ගනුදෙනුකාර පක්ෂපාතිත්වය, සහ පාර්ශ්වකාර දැනුම වර්ධනය කිරීමට වගවීම සහිතව කාලීනව තොරතුරු බෙදාහැරීමට පහසුකම් ඇති කරයි.

## අපගේ උපාය මාර්ගික සබඳතා ශක්තිමත් කිරීම

සම්පත් සහ ප්‍රවීනත්වය හුවමාරුව සහ හුවමාරු ව්‍යාපාර පරමාර්ථ අත්කරගැනීමේ අදහස ඇතිව, ජාත්‍යන්තර ආයතන කිහිපයක් සමඟ අපි උපාය මාර්ගික සබඳතා ඇති කරගෙන ඇත. මෙම සම්බන්ධතා තරඟකාරී වාසියක් ලබා ගැනීමට අපට හැකියාව ඇති කරන අතර ලාභ වර්ධන සහ ව්‍යවසාය වටිනාකම ඉදිරියට ගෙන යාමට අවස්ථාවන් නිර්මාණය කරයි.

ලෝකයේ කුමන ස්ථානයක සිට හෝ එවන ලබන ප්‍රේෂණවල ආරක්ෂාව ඇති කිරිම සඳහා ගෝලීය මුදල් හුවමාරු සමාගම් කිහිපයක් සමඟ අත්‍යවශ්‍ය සම්බන්ධතා අපි ගොඩනගා ඇත. අපි SWIFT සාමාජිකයෙක් වන අතර ශ්‍රී ලංකාවේ ප්‍රවාසිකයින්ට සහ සංක්‍රමණික සේවකයින්ට අපගේ ප්‍රේෂණ සේවය වන, NSB U-Trust තුළින් අපි සේවය කරමු. වේගයෙන්, පහසුවෙන් සහ විශ්වාසයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රතිලාභින්ට ප්‍රේෂණ ලබාදිමට ජාත්‍යන්තර මුදල් හුවමාරු සමාගම් සහ විදේශ බැංකු ගණනාවක් සමඟ බැංකුව ප්‍රේෂණ ව්‍යාපාර සම්බන්ධතා සහ අනුරූප වැඩපිළිවෙල තුළට ඇතුළත් වි ඇත. එමෙන්ම, බැංකුව ප්‍රේෂණ සඳහා අවම පිරිවැයකට තම සේවා ස්ථානය තුළින් රටවල් කිහිපයක සිට යුරෝජයිරෝ තැපැල් සාමාජික සංවිධාන හරහා මුදල් ප්‍රේෂණය කිරීමට පහසුකම් සපයයි.

අපගේ ගෝලීය මුදල් හුවමාරු සේවාවන් විනිමය හුවමාරු ආයතන 35ක් සහ අනුරූප බැංකු 14ක් සමඟ අපගේ සම්බන්ධතාවය හරහා ලබා දේ. ජාත්‍යන්තර මුදල් හුවමාරු සේවාව තුළ නිරත විනිමය හුවමාරු ආයතන/බැංකු සහ බැංකුව සමඟ සම්බන්ධ යුරෝජයිරෝ සාමාජික සංවිධාන, බැංකුවේ අනුරූප

බැංකු සහ බැංකුවේ විදේශීය නියෝජිතයින්ගේ ලැයිස්තුවක් පිටු අංක 458 සිට 461 දක්වා විස්තර කෙරේ.

2019 දී ව්‍යාපාර සම්බන්ධතා ශක්තිමත් කිරීමට ගනුලැබූ පියවර පහත දැක්වේ:

- NSB විසින් අනුරූප බැංකු සමඟ නව සම්බන්ධතා ඇති කරගනිමින් එහි ප්‍රේෂණ පුළුල් කරන ලදී. එමිරේට්ස් එන්ඩ්බී බැංකුව, සහ ජේඑස්සී සහ අර්ස්ට් සමූහ බැංකුව ඒජී, විනිමය හුවමාරු ආයතන, පීමනි ට්‍රාන්ස් කො ලිමිටඩ් සහ යුරොජයිරෝ සාමාජිකයින් ලෙස ඊශ්‍රායලයේ තැපැල් සමාගම සහ කොරියාවේ තැපැල් වැනි ප්‍රේෂණ මාර්ග මෙයට ඇතුළත්ය.
- මුදල් හුවමාරු සේවා, ප්‍රේෂණ සහ අනුරූප බැංකු ගිවිසුම් සඳහා විනිමය හුවමාරු ආයතන සමඟ ශක්තිමත් සම්බන්ධතා ගොඩ නැගීම සහ මැද පෙරදිග, ඉතාලිය, සයිප්‍රසය, දකුණු කොරියාව, ඕස්ට්‍රේලියාව තුළ වෙළෙඳපොළ ආවරණය වැඩිකිරීම.
- ශ්‍රී ලාංකීය සංක්‍රමණික සේවකයින්ට කාර්යක්ෂම ප්‍රේෂණ සේවා ලබාදීමේ අරමුණ ඇතිව, ව්‍යාපාර ප්‍රවර්ධනයට සහ නව ගනුදෙනුකරුවන් අත්කර ගැනීමට ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරීන් බැංකුව විසින් සේවයේ යොදවා ඇත.
- නිවාස සහ පුද්ගල ණය කළඹ වැඩි කිරීමට රජය සහ පුද්ගලික ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් 56ක් අත්සන් කරන ලදී.

**GRI 102-13**

### ක්ෂේත්‍රයේ සාමාජිකත්වයන්

ශ්‍රී ලංකාව තුළ මූල්‍ය සේවා ක්ෂේත්‍රයෙහි ප්‍රධාන තරඟකරුවෙක් ලෙස, ක්ෂේත්‍රයේ තරඟකරුවන් සමඟ අපගේ සහභාගිත්වය තුළින් අපගේ ජාතියේ මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගතියට දායකවීමේදී වැදගත් කාර්යභාරයක් අපි ඉටුකර ඇත. ක්ෂේත්‍රයේ අභියෝග විසඳීමට සහ උපකාරී මෙහෙයුම් පරිසරයක් නිර්මාණය කිරීමට පහත සඳහන් ආයතනවල අපි සාමාජිකත්වයන් දරමු.

- ජාතික වාණිජ මණ්ඩලය
- ලංකා ක්ලියර් පුද්ගලික සමාගම
- ලංකා හාම්පුතුන්ගේ සංගමය
- වර්ල්ඩ් වයිඩ් ඉන්ටර් බෑන්ක් ෆිනෑන්සියල් ටෙලිකොමිනිකේෂන් (SWIFT) සඳහා සමාජය.
- ශ්‍රී ලංකා SWIFT පරිශීලක සමාජය
- යුරෝජයිරෝ ගෝලීය ගෙවීම් ප්‍රජාව
- ලෝක ඉතුරුම් බැංකුකරණ ආයතනය

## නියාමන අනුකූලතාව ශක්තිමත් කිරීම – නියාමන ප්‍රාග්ධනය

### නියාමන ප්‍රාග්ධනය අපට වැදගත්වන ආකාරය

රජය සහ නියාමන ආයතන යහපත් සහ ස්ථාවර බැංකු පද්ධතියක් සහ ආර්ථිකයේ යහපත් ක්‍රියාකාරිත්වයට පහසුකම් සපයයි. රජයට අයත් බලපත්‍රලාභී විශේෂ බැංකුවක් ලෙස, ජාතික ඉතිරි කිරීමේ බැංකුව 1971 අංක 30 දරන ජාතික ඉතුරුම් බැංකු පනත සහ එහි සංශෝධන, සහ 1988 අංක 30 දරන බැංකුකරණ පනත සහ එහි සංශෝධන අනුව සංස්ථාපිත කෙරේ. අපගේ ආයතනය තුළ ජනතා විශ්වාසය සහ සමස්ථයක් ලෙස ආර්ථිකය ශක්තිමත් කිරීමට නියාමන අවශ්‍යතා සපුරාලීමට සහ මනා පාලන ව්‍යවහාර අනුගමනය කිරීමට අපි දැඩිව කැපවී සිටිමු.

අදාල රෙගුලාසිවලට අනුකූලවීම අපගේ මෙහෙයුම් බලපත්‍රය ඉදිරියට ගෙනයාමට සහ අපගේ කීර්තිනාමය ශක්තිමත් වීමට ඉවහල් වේ. රජය වෙත අපි ගෙවන බදු රටේ ආර්ථික සහ සමාජ සංවර්ධනය සඳහා දායකවේ.


### අපගේ ප්‍රවේශය

අපගේ සියලුම ව්‍යාපාර මෙහෙයුම් තුළ රෙගුලාසිවලට අනුකූලවීමෙන් සහ සදාචාර සහ වගකීම්සහගත ව්‍යාපාරය තුළ අවශ්‍ය ප්‍රමිති සහ ජාත්‍යන්තර මනා පරිචයන් අනුග මනය කිරීමෙන් අපගේ අවදානම් සංස්කෘතිය සවිබලගැන්වීම කරා අපි කටයුතු කරමු. අවිනිශ්චිතතා සහ අවදානම් විචක්ෂණව කළමනාකරණය කර ප්‍රතිචාර දැක්වීමට ශක්තිමත් ව්‍යාපාර ආදර්ශයක් සමඟ අපගේ ක්‍රමෝපායන් සහ මෙහෙයුම් අපි පෙළ ගස්වා ඇත.

### නියාමන ප්‍රාග්ධනයේ වටිනාකම වැඩි කිරීමේ ක්‍රමෝපායන්

- නියාමන වෙනස්වීම් හඳුනාගෙන ඇගයීමට සහ ප්‍රතිචාර දැක්වීම සඳහා සම්බන්ධිත විස්තීර්ණ සහ කාලීන ප්‍රවේශයක් පවත්වා ගැනීම
- මෙහෙයුම් ස්ථාවරත්වය ශක්තිමත් කිරීම, පීඩන පරීක්ෂණ ප්‍රමිති වර්ධනය, බලපෑම් ඉවසුම සමාලෝචනය සහ කාර්යසාධන අනුමිති අළුත් කිරීම
- ක්ෂේත්‍රයේ නියාමන වැඩසටහන් (උපදේශක පත්‍රිකා) තුළ සහභාගිවීම

### ප්‍රමාණාත්මක කරුණු



### කෙටි කාලයේ සිට මධ්‍ය කාලය දක්වා උපාය මාර්ගික ප්‍රමුඛතා



### නියාමන අනුකූලතාවය ශක්තිමත් කිරීම සඳහා වටිනාකම් නිර්මාණය කිරීමේ මූලිකාංග

- නියාමකයින් සමඟ  අනුකූලතාව
- මුදල් විශුද්ධිකරණ, අල්ලස සහ දූෂණ විරෝධය
- ශක්තිමත් පාලනය සහ විචක්ෂණ අවදානම් කළමනාකරණය
- රජයට දායකත්වය

### නියාමකයින් සමඟ  අනුකූලතාව

මූල්‍ය සේවාවල වැඩිවන ඩිජිටල්කරණය සහිත ගතික බැංකුකරණ පරිසරය තුළ මතුවන අභියෝග සහ වැඩිවන අවදානම් සපුරාලීම කරා පරිනාමනය වීම බැංකුව සහ නියාමන ආයතන සඳහා අත්‍යවශ්‍යය. වැඩිකල නියාමනය සහිත රජයට අයත් බැංකුව ලෙස, අපි බැංකුව තුළ අනුකූලතා සංස්කෘතියක් පෝෂණය කර ඇත.

අපි බැංකුකරණ පනත. මූල්‍ය පනත, මුදල් ගනුදෙනු වාර්තාකරණ පනත. විනිමය පාලන පනත, ජා.ඉ.කි. බැංකු පනත සහ ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් නිකුත් කරන වෙනත් රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල වෙමු. ඊට අමතරව, අපි මුදල් අමාත්‍යංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,විගණකාධිපති දෙපාර්තමේන්තුව. නීතිපති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති නියාමන මණ්ඩලය සහ පාර්ලිමේන්තුව සමඟ සමීප සම්බන්ධතා පවත්වාගන්නා අතර අනෙකුත් අවශ්‍ය නියාමන අවශ්‍යතා සමඟ අනුකූල වෙමු.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින්  නිකුත්කළ නියෝගයන්ට අනුව, කාලින ආකාරයකින් බැංකුවේ මෙහෙයුම්වලට අදාළ කාලීන තොරතුරු අපි ඉදිරිපත් කරමු.

GRI 205-2, 3 & 206-1

## මුදල් විශුද්ධිකරණ විරෝධය, අල්ලස සහ දූෂණය

වැඩිකළ ඩිජිටල්කරණය සමඟ සයිබර් ආරක්ෂාව පිළිබඳ ඇතිවන ගැටළු පිළිබඳ දැනුවත් වෙමින්, ප්‍රධාන වැදගත් ගැටළුවක් ලෙස සයිබර් ආරක්ෂාව, වංචාව වැලැක්වීම සහ මුදල් විශුද්ධිකරණය අපි හඳුනාගෙන ඇත. වංචාවෙන් අපගේ ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමට ක්‍රියාත්මක ශක්තිමත් අවදානම් කළමනාකරණ පද්ධතියක් අපට ඇති අතර සැකසහිත කටයුතු හඳුනාගෙන වාර්තා කිරීම තුළින් සයිබර් ආරක්ෂාව, මුදල් විශුද්ධිකරණය, සහ ත්‍රස්තවාදයට මුදල් යෙදීම වැලැක්වීමට නියාමකයින්ට අපි අඛණ්ඩව සහයවෙමු. සමාලෝචිත වසර තුළ දූෂණය, තරඟකාරී විරෝධී හැසිරීම, විශ්වාස විරෝධය, ඒකාධිකාරී ව්‍යවහාර,සහ නිෂ්පාදන සහ සේවා භාවිතය සම්බන්ධ නීති හා රෙගුලාසිවලට  අනුකූල නොවීම මත කිසිදු දඩමුදලක් හා මූල්‍යමය නොවන සම්බාධක කිසිවක් පනවා නොමැත.

## ශක්තිමත් පාලනය සහ විචක්ෂණ අවදානම් කළමනාකරණය

බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රමයේ ඵලදායිත්වය නියාමනය කිරීමට දැඩි අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් සහ පාලන ක්‍රමයක් අපි ක්‍රියාත්මක කර ඇත.

අපගේ බැංකුවේ කෙටිකාලීන සිට මධ්‍ය කාලීන උපාය මාර්ගික ප්‍රමුඛතාවක් ලෙස අවදානම් සංස්කෘතියක් සවිබලගැන්වීම තුළීන්, අභ්‍යන්තර සහ බාහිර පරිසරයෙන් ඇතිවන අවදානම ඵලදායීව අපේක්ෂා කරන, කළමනාකරණය කරන සහ අවම කරන ශක්තිමත් අවදානම් සංස්කෘතියක් අපි සංවර්ධනය කර ඇත. ක්‍රමානුකූල ප්‍රවේශයක් සහිත අවදානම් කළමනාකරණ අධීක්‍ෂණයක් ලබා දෙමින් බැංකුවේ පාලන රාමුව අවදානම් කළමනාකරණයට සහය වේ. මේ පිළීබඳ වැඩි විස්තර අවදානම් කළමනාකරණ කොටස යටතේ පිටුඅංක 248 සිට 274 දක්වා බලන්න.

## රජයට දායකවීම

රජයට අයත් ප්‍රමුඛ රාජ්‍ය බැංකුවක් ලෙස, රජය වෙනුවෙන් බදු ගෙවීම සහ එකතු කිරීම මගින් අපි ආදර්ශයක් ලබා දේ. රජය සහ වෙනත් අදාළ නියාමන සහ ව්‍යවස්ථාපිත ආයතන වෙත අපගේ සේවකයින්, වෙනුවෙන් ගෙවිය යුතු  අදාළ බදු සහ ව්‍යවස්ථාපිත ගෙවිය යුතු මුදල් අපි ගෙවමු.

# තෘප්තිමත් ප්‍රජාවක් ගොඩනැගීම – ප්‍රජා ප්‍රාග්ධනය

### ප්‍රජා ප්‍රාග්ධනය අපට වැදගත් වන ආකාරය

රජයට අයත් බැංකුවක් ලෙස, අපි අපගේ සේවකයින් සහ අපගේ ගනුදෙනුකරුවන් ඔවුන්ගේ ජීවිත ගොඩනගන ප්‍රජාව වෙත යම් ප්‍රතිඵලයක් ආපසු දීම මගින් තෘප්තිමත් දේශිය ප්‍රජාවක්  නිර්මාණය කිරීම අපගේ යුතුකමකි. එමනිසා, අප ක්‍රියාත්මක ප්‍රජාව තුළ අත්‍යවශ්‍ය කාර්යභාරයක් අපි අඛණ්ඩව ඉටු කරමු.

### අපගේ ප්‍රවේශය

ආර්ථිකයට ධනාත්මක බලපෑමක් නිර්මාණය කරන ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිවල ආයෝජනය සහ ජාතික සංවර්ධන වැඩසටහන් සහ තිරසාර සංවර්ධන පරමාර්ථ තුළ දක්වා ඇති මූලික ප්‍රමුඛතා ගැටළු ආමන්ත්‍රණය කිරීම.

### ප්‍රජා ප්‍රාග්ධනයේ වටිනාකම වැඩිකිරීමේ ක්‍රමෝපාය

- සමාජ, ආර්ථික සහ පාරිසරික ගැටළු සලකා බලමින් ආයෝජනය කිරීම
- ප්‍රජාව තුළ ස්වේච්ඡාවෙන් කටයුතු කිරීම
- දේශිය සේවකයින්ට සහ ව්‍යාපාරවලට සහයවීම

### ප්‍රමාණාත්මක කරුණු



### කෙටි කාලයේ සිට මධ්‍ය කාලය දක්වා උපාය මාර්ගික ප්‍රමුඛතා



GRI 203-1

### තෘප්තිමත් ප්‍රජාව ගොඩනැගීම සඳහා වටිනාකම් නර්මාණය කිරීමේ ධාවකයින්

- ජාතික සංවර්ධනයට දායකවීම
- මූල්‍ය අන්තර්කරණය ඇති කිරීම
- ප්‍රජාවට ආපසු ලබාදීම
- ප්‍රජා සංවර්ධනය ගෙනයාමට උපාය මාර්ගික සම්බන්ධතා

## ජාතික සංවර්ධනයට දායකවීම

අපගේ තිරසාර ව්‍යාපාර ප්‍රවේශයේ කොටසක් ලෙස, දීර්ඝ කාලීන ආර්ථික වර්ධනය සහ දේශීය ප්‍රජාවන් සවිබලගැන්වීම තුළින් සියලුම පුරවැසියන්ගේ ජීවන තත්ත්වයන් වර්ධනය කරන ආයෝජන වර්ධනයක් අපි ඉදිරියට ගෙන යමු. රජයේ මහ පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවලට සහයෝගය ලබාදෙමින්, ජාතික සංවර්ධනය අපි ඉදිරියට ගෙන යන අතර දේශීය ප්‍රජාවන් නගාසිටවමු. අපගේ අවධානය වන්නේ එය දීර්ඝ කාලීන ප්‍රගතිය සහ සමෘද්ධිය ලබාදෙන අංශවල ආයෝජනය කිරීමයි. වසර තුළ අපි පහත සඳහන් ව්‍යාපෘතිවලට සහය වූවෙමු:

- වසර තුළ, ජලය සහ විදුලිය සම්බන්ධ යටිතල පහසුකම් සඳහා රු.බි. 7.5ක් අපි ලබාදී ඇත.
- කෘෂිකර්මය සහ සුළු හා මධ්‍ය පරිමාණ අංශ සංවර්ධනය සඳහා, අනෙකුත් මූල්‍ය ආයතන තුළින් වක්‍රව රු.බි. 10.0ක් අපි බෙදා ඇත.

## මූල්‍ය අන්තර්කරණය ඇති කිරීම

විශේෂයෙන් වරප්‍රසාද නොලත් සහ බැංකු සේවය නොලබන පුරවැසියන් ඇතුළුව අපගේ ජාතියේ සියලුම පුරවැසියන් වෙත ඩිජිටල් සහ ඩිජිටල් නොවන මාර්ග තුළින් මූල්‍ය සේවා කරා පහසු පිවිසුමක් ලබාදෙමින් මූල්‍ය අන්තර්කරණය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අපි අඛණ්ඩව අවධානය යොමු කරමු. අපගේ තැපැල් සහ උප තැපැල් කාර්යාල ජාලය තුළින් අප රටේ විශේෂයෙන් දුෂ්කර ප්‍රදේශවල බැංකු සේවය නොලබන ගනුදෙනුකරුවන් අතර ඵලදායි ඉතුරුම් සංස්කෘතියක් අපි ඇති කළෙමු. තැපැල් තැන්පතු මුළු තැන්පතු පදනමෙන් 1.5% කින් සමන්විත වේ. ඊට අමතරව, නිත්‍ය බැංකුකරණ කාලවේලාවන් තුළ ශාඛාවකට පැමිණීමට අසමත්වන ගනුදෙනුකරුවන් සඳහා POS යන්ත්‍ර සහ අතින් දරන යන්ත්‍ර භාවිතා කරමින් නිවසටම පැමිණ මුදල් තැන්පත් කිරීමේ පහසුකම අපි ලබා දෙමු.

NSB iSaver, තුළින්, මොබිටෙල් අලෙවිහලක් තුළ නොමිලේ බැංකුකරණ සේවා සඳහා පිවිසීමට පැය 24 පහසුකම ගනුදෙනුකරුවන්ට අපි ලබා දෙමු. මෙම සේවය ධනය නිර්මාණය කිරීමට සහ ආයෝජනය සඳහා අරමුදල් යෙදවීමට දායක වන ජනතාව අතර ඉතිරිකිරීමේ පුරුද්ද තවදුරටත් ශක්තිමත් කරන ලදී.

ගනුදෙනුකාර අවශ්‍යතා සපුරාලන නිෂ්පාදන සහ සේවා පිරිනමමින්, මූල්‍ය සාක්ෂරතාව තුළින් අපි ගනුදෙනුකරුවන් සවිබලගන්වමු. ශාඛා සහ අලෙවිකරණ අංශය විසින් පවත්වන ලද ශාඛා සක්‍රියකරණ වැඩසටහන සහ ප්‍රවර්ධන තුළ, ගනුදෙනුකරුවන් වෙත අපි සකසුරුවම සහ ඉතුරුම්වල වැදගත්කම පෙන්වා දෙමු. විශේෂයෙන්. iSaver සහ NSB Reach ප්‍රවර්ධන වැඩසටහන් දෛනික ඉතුරුම්වල වැදගත්කම අවධාරණය කරන ලදී.

2017 දී දියත් කළ ග්‍රාම ශක්ති මහජන (GSP) වැඩසටහන 2030 වන විට දිළිඳුකම තුරන් කිරීමට සහයවීම සඳහා විශේෂයෙන් සැලසුම් කෙරේ. ග්‍රාම ශක්ති මහජන (GSP) වැඩසටහනේ මූලික අදියර යටතේ ග්‍රාම ශක්ති මහජන (GSP) සමිති තෝරාගත් ග්‍රාම නිලධාරී වසම් 1,000ක පිහිටුවනු ලබන අතර ඒවා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කරනු ලැබේ. රජය සමඟ හවුල්වෙමින්, ග්‍රාම ශක්ති මහජන සමිතිය තුළින් රාජ්‍ය බැංකුවක රු. 10,000ක මූලික තැන්පතුවක් සමඟ ගිණුමක් විවෘත කිරීමට අපේක්ෂා කෙරේ.

පහත සඳහන් මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් 2019 දී පවත්වන ලදී.

| වැඩසටහන | ඉලක්ක වෙළෙඳපොල | ප්‍රවර්ධන කාලසීමාව | වැඩසටහන් ක්‍රමය |
|---|---|---|---|
| 1 ශ්‍රේණියේ හපන් ගිණුම් විවෘත කිරීමේ වැඩසටහන | 1 ශ්‍රේණියේ දෙමව්පියන් සහ පෙර පාසල් ප්‍රවේශකයින්ගේ දෙමව්පියන් | 2019 ජනවාරි | රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත්, සමාජ මාධ්‍ය, ශාඛා මට්ටමින් සංවිධානය කරන ප්‍රවර්ධන වැඩසටහන් |
| කාන්තා දින වැඩසටහන | වයස අවුරුදු 16 ට වැඩි කාන්තාවන් | 2019 මාර්තු | රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත්, සමාජ මාධ්‍ය, කෙටි පණිවිඩ, අලෙවිකරණය, ශාඛා රූපවාහිනී තිර, ATM තිර, ශාඛා මට්ටමින් සංවිධානය කරන සක්‍රියකරන වැඩසටහන්. |
| යූ ට්‍රස්ට් | ශ්‍රී ලාංකිය සංක්‍රමණිකයින් සහ ඔවුන්ගේ පවුල් | 2019 ජනවාරි සහ අප්‍රේල් සිට සැප්තැම්බර් | රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත්, සමාජ මාධ්‍ය, අත්පත්‍රිකා බෙදාහැරීම, ශාඛා රූපවාහිනී තිර, ATM තිර, ශාඛා මට්ටමින් සංවිධානය කරන සක්‍රියකරන වැඩසටහන්. |
| එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා යටතේ ණය | මැදි ආදායම් උපයන්නන් SMEs, ව්‍යවසායකයින් | වසර පුරා | පුවත්පත්, ඩිජිටල් මාර්ග, ණය පොලවල් |
| රන්සහන | වයස අවුරුදු 18ට ඉහළ වැඩිහිටියන් | වසර පුරා | රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත්, සමාජ මාධ්‍ය, රැලිකල පුවරු, සහ ශාඛා මට්ටමින් සංවිධානය කරන ප්‍රවර්ධන වැඩසටහන් |
| හැපි සේවින්ග්ස් | වයස අවුරුදු 16 ට වැඩි ශ්‍රී ලාංකික පුරවැසියන් | 2019 මාර්තු සිට සැප්තැම්බර් | රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත්, සමාජ මාධ්‍ය |

| වැඩසටහන | ඉලක්ක වෙළෙඳපොල | ප්‍රවර්ධන කාලසීමාව | වැඩසටහන් ක්‍රමය |
|---|---|---|---|
| බුද්ධි ණය වැඩසටහන | වයස අවුරුදු 18ට ඉහළ වැඩිහිටියන් | වසර පුරා | සමාජ මාධ්‍යල e-flyers, ආයතන මට්ටමින් සංවිධානය කරන ප්‍රවර්ධන වැඩසටහන්, ශාඛා මට්ටමින් සංවිධානය කරන ප්‍රවර්ධන වැඩසටහන්, අධ්‍යාපනික ප්‍රදර්ශන |
| ප්‍රාර්ථනා | දෙමව්පියන් | 2019 ඔක්තෝබර් සිට ඉදිරියට | රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත්, සමාජ මාධ්‍ය, අත්පත්‍රිකා බෙදාහැරීම, ශාඛා රූපවාහිනී තිර, ATM තිර |
| ප්‍රාර්ථනා + | වයස අවුරුදු 16 ට වැඩි පුද්ගලයින් | 2019 ඔක්තෝබර් සිට ඉදිරියට | රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත්, සමාජ මාධ්‍ය, අත්පත්‍රිකා බෙදාහැරීම, ශාඛා රූපවාහිනී තිර, ATM තිර |
| සිංහල සහ හින්දු අළුත් අවුරුද්ද සඳහා ඩිජිටල් අලෙවිකරණවැඩසටහන් – "නැකැත් සීට්ටුව", "අමතකවුණු අවුරුදු" සහ "ආහාර සකස් කිරීම" වීඩියෝ ක්ලිප් | සමාජ මාධ්‍ය අනුගාමිකයින් | 2019 අප්‍රේල් 05 – 2019 අප්‍රේල් 14 | සමාජ මාධ්‍ය සහ වෙබ් අඩවිය |
| බැක් ටු කලම්බු – ආයුබෝ ලයිෆ් සමඟ තත්‍ය පියවර අභියෝගය | NSB ගනුදෙනුකරුවන් | 2019 මාර්තු 18 – 2019 අප්‍රේල් 12 | සමාජ මාධ්‍ය |
| ලෝක සකසුරුවම් දිනය – ඡායාරූප තරගය | මුහුණු පොත අනුගාමිකයින් | 2019 අගෝස්තු 1 – 2019 ඔක්තෝබර් 31 | මුහුණු පොත |

GRI 413-1

## ප්‍රජාවට ආපසුදීම

අප ක්‍රියාත්මක කරනු ලබන ප්‍රජාවට ආපසු දීමේ සමාජ වැඩසටහන ශක්තිමත් කිරීමේ අපගේ උත්සාහයන් තුළ, ප්‍රජාවන් සඳහා තුලනයකළ තිරසාර ප්‍රතිඵල ලබාදීමට ප්‍රජා සංවර්ධන වැඩසටහන් අපි සැලසුම් කර ක්‍රියාත්මක කරමු. සමාජ සුභසාධනය වර්ධනය, අධ්‍යාපනය නගාසිටුවීම, සෞඛ්‍යාරක්ෂාව සහ සමාජ, සංස්කෘතික සහ ආගමික සංවර්ධනයට සහයවීම කෙරෙහි අවධානය යොමුකළ ප්‍රජා සංවිධාන සහ ප්‍රජා සංවර්ධන වැඩසටහන් රාශියකට අපි සහයෝගය ලබා දෙමු. ඊට අමතරව, අනුග්‍රහය, පරිත්‍යාග, සහ ශිෂ්‍යත්ව සහ අපගේ සේවකයින් මගින් රැස්කළ අරමුදල් තුළින් ප්‍රජා වැඩසටහන්වලට අපි සහය වෙමු.

### විශේෂ සිදුවීම් සහ අනුග්‍රාහකත්ව

2019 ඔක්තෝබර් 31 දින පවත්වන ලද ලෝක සකසුරුවම් දිනය සැමරීම සඳහා, බස්නාහිර පළාත තුළ ගනුදෙනුකරුවන් 700 කට BMICH හි පැවති විශේෂ උත්සවයකට ආරාධනය කර වටිනා ත්‍යාග පිළිගන්වන ලදී.

### අධ්‍යාපනය ප්‍රවර්ධනය

පහ වසර ශිෂ්‍යත්ව විභාගයේ ඉහළම ජයග්‍රහකයින් පිළිගනිමින්, හපන් ශිෂ්‍යත්ව ප්‍රදානයේ 15 වැන්න 2019 ඔක්තෝබර් 31 දින BMICH හි පවත්වන ලදී. ඉගෙනුම් දුෂ්කරතා සහිත ළමුන්ට අඛණ්ඩව සහයවීම සහ ඉදිරියට යාමට ඇති ඔවුන්ගේ ශක්තිය සහ අධිෂ්ඨානය අගය කරමින්, අඛණ්ඩව පස්වැනි වරටත් මෙම කාණ්ඩය යටතේ සිසුන් 25 කට උපහාර දැක්වුවෙමු.

### කලාව තුලින් සම්බන්ධවීම

ළමුන් තුළ නිර්මාණශීලීබව සහ කලාත්මක දක්ෂතා ඔප්නැංවීම පිණිස. 2019 දී අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අංශය සමඟ හවුල්කාරත්වයෙන් අඛණ්ඩව හතර වැනි වරටත් පාට පාට හපන්කම් තරගය පවත්වන ලදී. ජයග්‍රහකයින් විසිපහක් තෝරාගෙන BMICH හි පැවති අවසන් උත්සවයේදී සම්මාන ප්‍රදානය කරන ලදී.

### ප්‍රදර්ශන තුළ සහභාගිත්වය

අපගේ නිෂ්පාදන ප්‍රවර්ධනයට සහ අපගේ සන්නාම ප්‍රතිරූපය ඉහළ නැංවීමට 2019 දී ප්‍රදර්ශන කිහිපයක අපගේ පැමිණීම සලකුණු කරන ලදී. වසර තුළ අප සහභාගි වූ ප්‍රදර්ශන වලට පහත ඒවා ඇතුළත් වේ. කැදල්ල, ෆියුච මයින්ඩ්ස්, කැදල්ල මිඩ් ඉයර්, ඉන්ෆොටෙල් සහ මාතර, අනුරාධපුර, දඹුල්ල, හම්බන්තොට, කළුතර, කිරිඳිවෙල, මහනුවර/ගම්පොළ සහ ඇඹිලිපිටිය එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ප්‍රදර්ශන.

### අනුග්‍රහකත්වයන්

බෞද්ධාලෝක වෙසක් උත්සවය, ජාතික විශ්‍රාමිකයින්ගේ දිනය, ජාත්‍යන්තර වැඩිහිටි දිනය, හෙල්ප් ඒජ් ශ්‍රී ලංකා වෛද්‍ය කඳවුරු, ආරක්ෂක අමාත්‍යාංශයේ ශිෂ්‍යත්ව ප්‍රදාන, කොළඹ විශ්ව විද්‍යාලයේ සිංහල හින්දු අළුත් අවුරුදු උත්සවය, සියනෑ බක්මහ උළෙල, 25ස් වැනි ජාතික සිවිල් වීරකම, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ 2019 සම්මාන උත්සවය, APB

වාර්ෂික සැසිය, සිග්නිස් ශ්‍රී ලංකා, ශ්‍රී ලංකා යුධ හමුදා නාට්‍ය, ශ්‍රී ලංකා ගුවන් හමුදා සුහසාධනය, ලංකා කායික වෛද්‍යවරුන්ගේ පාසලේ වාර්ෂික සැසිය සහ CMA යුධ වාර්ෂික සම්මන්ත්‍රණය වැනි ජාතික වැදගත්කමක් ඇති උත්සව සඳහා සහය විය.

## ප්‍රජා සංවර්ධනය ඉදිරියට ගෙන යාමට උපාය මාර්ගික සම්බන්ධතා

නිරෝගි සහ උගත් සමාජයක් ගොඩනැගීම තුළ සමාජ වටිනාකමක් ලබාදීමට රජයේ අමාත්‍යංශ සමඟ අපි සම්බන්ධ විය. එසේ කිරීමෙන්, අපගේ ජාතිය තුළ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු අත්කර ගැනීම කරා අපි දායක වෙමු.

## I'm Fit වැඩසටහන

3 GOOD HEALTH AND WELL-BEING

"I'm Fit" වැඩසටහන පැවැත්වීම සඳහා අධ්‍යාපන අමාත්‍යංශය සහ සෞඛ්‍ය අමාතංශය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. 2020 වසරේදී පවත්වනු ලබන මෙම වැඩසටහන් තුළින් අපේක්ෂා කරන්නේ යහපත් සෞඛ්‍ය සහ සුහසාධනය පිළිබඳ තිරසාර සංවර්ධන අරමුණු අත්කර ගැනීමයි. මෙම ව්‍යාපෘතියෙන් කොළඹ දිස්ත්‍රික්කයේ පාසල් 10ක් ඉලක්ක කරන ලද අතර තොරාගත් පාසල්වල 6, 7 සහ 8 ශ්‍රේණිවල සිසුන්ගේ සෞඛ්‍ය සහ පෝෂණ තත්ත්වයන් වැඩි කිරීම අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතියෙන් සමාජයට ධනාත්මක බලපෑමක් කිරීමට සහ බැංකුව සඳහා ධනාත්මක සන්නාම ප්‍රතිරූපයක් ඇති කිරීමට අරමුණු කෙරේ.

## එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු යටතේ ඉංග්‍රීසි අධ්‍යාපනික ව්‍යාපෘතිය

4 QUALITY EDUCATION

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණුවලට දායක වීම සඳහා, තෝරාගත් පාසල්වල 'English is Simple' වැඩසටහන පැවැත්වීම සඳහා 2020 දී අධ්‍යාපන අමාත්‍යංශය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙම ව්‍යාපෘතිය තුළින් 8,9, 10 සහ 11 ශ්‍රේණිවල සිසුන්ගේ ඉංග්‍රීසි දැනුම වැඩි කිරීම අපගේ අරමුණ වූ අතර අධ්‍යාපන අමාත්‍යංශයේ ඉංග්‍රීසි සහ විදේශීය භාෂා ඒකකය විසින් පැවැත්වීමට නියමිතය. 2017 අපොස සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල මත පදනම් වි ජාතික පාසල් අටක් තෝරා ගෙන ඇත. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ තෝරාගත් පාසල්වල සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි සමත් අනුපාත වැඩි කිරීමයි. මෙම සමාජ සත්කාරක ව්‍යාපෘතිය තුළින් "ගුණාත්මක අධ්‍යාපනය" පිළිබඳ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු ආමන්ත්‍රණය කිරීම අරමණු කෙරේ.

## අනාගත ප්‍රමුඛතා

| කෙටි කාලීන | මධ්‍ය කාලීන | දිගුකාලීන |
|---|---|---|
| වටිනාකම සමඟ දැනට පවත්නා නිෂ්පාදන නැවත දියත් කිරීම සහ තරුණ ප්‍රජාව අත්කර ගැනීම කෙරෙහි විශේෂ අවධාරණයක් සහිතව ප්‍රධාන නිෂ්පාදන කරා ගනුදෙනුකාර සහභාගිත්වය වැඩි කිරීමට ශාඛා මට්ටමේ වැඩසටහන් පැවැත්වීම<br><br>කල්පනාකාරී සන්නිවේදන වැඩසටහන් නිර්මාණය සහ ධනාත්මක සන්නාම ප්‍රතිරූපයක් ගොඩ නැගීමට සන්නාමකරන උපාය මාර්ගික | ස්මාර්ට් දුරකථනයක් හෝ ඩිජිටල් උපාංගයක් භාවිතා කරමින් ඕනෑම ස්ථානයක, ඕනෑම වේලාවක බැංකු කටයුතු සිදුකිරීමට ගනුදෙනුකරුවන්ට හැකියාව ඇති කිරීම සඳහා අංග සම්පූර්ණ ඩිජිටල් බැංකුකරණ විසඳුමක් ක්‍රියාත්මක කිරීම<br><br>ආර්ථිකය තුළ බැංකු පහසුකම් රහිත සහ අඩුවෙන් බැංකු පහසුකම් ඇති ජනතාව සඳහා මූල්‍ය අන්තර්කරණය ඉහළ නැංවීම<br><br>තිරසාර මූල්‍යකරණ ව්‍යාවහාර යොදා ගැනීම සහ තෝරාගත් එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු සඳහා සකස් කළ ඉලක්කවල ප්‍රගතිය අත්කර ගැනිම | ආරක්ෂිත සහ ස්ථාවර මූල්‍ය පරිසර පද්ධතියක් ඇති කිරීම<br><br>තෘප්තිමත් සමාජය පිළිබඳ ධනාත්මක බලපෑම |



# ස්වභාවික ප්‍රාග්ධනය

**ස්වභාවික ප්‍රාග්ධනය ගොඩ නැගීම කාබන් අවම වූ ආර්ථිකයක් කරා දායකවීමට උපකාරී වන අතර ඒ තුළින් වර්තමාන සහ අනාගත පරම්පරාවන් සඳහා මිහිතලය ආරක්ෂා කරමින් බැංකුවේ දිගුකාලීන තිරසාර වටිනාකම නිර්මාණය සහතික කරයි.**

## එයට ඇතුළත් වන දෑ

ස්වභාවික ප්‍රාග්ධනයට ස්වාධීන ප්‍රාග්ධනයේ තොගය සහ අපට අවශ්‍ය පරිදි මෙහෙයුම් සිදු කිරීම සඳහා අපි රඳා පවත්නා පරිසර පද්ධති සේවා ඇතුළත්ය.

මෙයට වායු, ජලය, සහ ස්වභාවික පරිසරය ඇතුළත් වේ.

## යෙදවුම්

- වායු
- ජලය
- ඉඩම්
- ඛණිජ
- වනාන්තර
- ජෛව විවිධත්වය සහ පරිසරපද්ධති සෞඛ්‍ය

## එය වටිනාකම් එකතු කරන ආකාරය

ස්වභාවික ප්‍රාග්ධනය ගොඩ නැගීම පාරිසරක පියසටහන අවම කිරීමට සහයවන අතර ඒ තුළින් කාබන් අවම වූ ආර්ථිකයක් කරා යෑමට දායක වේ. මෙය වර්තමාන සහ අනාගත පරම්පරා සඳහා අපගේ මිහිතලය සුරක්ෂිත කිරීමට සහයවන අතර, බැංකුවේ දිගුකාලීන තිරසාර වටිනාකම් නිර්මාණය කිරීම සහතික කරයි.

## අපගේ ප්‍රවේශය

අපගේ ප්‍රවේශය හරිත මෙහෙයුම් සිදුකරමින්, තිරසාර මූල්‍ය ප්‍රවර්ධනය කරමින් සහ පරිසරය සුරැකීමේ වැඩසටහන්වලට සහය වීමෙන් අපගේ කාබන් පියසටහන අඩුකිරීම කෙරෙහි අපි අවධානය යොමු කරන්නෙමු. බැංකුවට බලපාන වැදගත් ගැටළුවක් ලෙස පාරිසරක පියසටහන හඳුනා ගැනීමෙන් පසු, මූල්‍ය ප්‍රතිඵල උත්පාදනය කරමින් මෙම කාරණය ආමන්ත්‍රණය කිරීමට සහ බැංකුවේ තිරසාරභාවය සහතික කිරීමට ක්‍රමෝපායන් අපි සකස් කොට ඇත. පාරිසරික කළමනාකරණය තුළ ආයතනික ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ පරිචයන් අඛණ්ඩව වර්ධනය කිරීමට සහ අපගේ ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාවලීන් තුළට පාරිසරික අවබෝධය ඇති කර ගැනීමට අපි උත්සාහ ගනිමු.

## 2019 වසර සඳහා ප්‍රධාන අභියෝග සහ අවස්ථා

**ප්‍රධාන අභියෝග** →

- හරිත වැඩසටහන් ඇරඹීම සඳහා ඉහළ ආයෝජනයේ අවශ්‍යතාව
- බැංකුව විසින් පරිසරයට ඇති කළ බලපෑම ඇගයීම
- බැංකුව තුළ කාබනික පියසටහන අවම කිරීම
- ස්වභාවික ප්‍රාග්ධනය සහ හරිත ව්‍යාපෘති කළමනාකරණය කිරීමේ වැදගත්කම පිළිබඳ ඇල්මැති පාර්ශ්වකරුවන් අතර දැනුම ඇති කිරීම
- ගණුදෙනුකරුවන් හා සේවකයින්ට ඩිජිටල් තක්ෂණය භාවිත කිරීමට සැලසීමෙන් කඩදාසි භාවිතය අඩු කිරීම
- ස්වභාවිත ආපදාවලින් ඇතිවූ අහිතකර ප්‍රතිඵල

**අවස්ථා**


- පාරිසරික පියසටහන අවම කිරීමෙන් බැංකුවේ දිගුකාලීන තිරසාරභාවය සහතික කරයි.
- හරිත වැඩසටහන්වල නව්‍යකරණයන් ප්‍රවර්ධනය (හරිත නිෂ්පාදන, හරිත මූල්‍යකරණය. හරිත ගොඩනැගිලි)
- මෙහෙයුම්වලින් ඇතිවන පාරිසරික බලපෑම් අවම කිරීමේ හැකියාව
- සම්පත්වල භාවිතය කාර්යක්ෂම කිරීම. පිරිවැය අඩු කිරීම හා ධනාත්මකව මූල්‍ය තිරසාරත්වය කෙරෙහි බලපාන උපාය මාර්ග.




## ස්වභාවික ප්‍රාග්ධනයේ වටිනාකම වැඩි කිරීමේ උපාය මාර්ගයන්

- විශේෂ වැඩසටහන් තුළින් දීර්ඝ කාලීනව බලශක්ති කාර්යක්ෂමතාව වර්ධනය සහ පුනර්ජනනීය බලශක්ති භාවිතය වැඩි කිරීම
- ඩිජිටල්කරණය සහ නිෂ්පාදන සංවර්ධනය තුළ ආයෝජන තුළින් අපගේ වටිනාකම් එකතු කිරීමේ නිෂ්පාදන පරාසය පුළුල් කිරීම කෙරෙහි අඛණ්ඩ අවධානය
- බැංකුව විසින් භාවිතා කරන පරිසරයට බලපාන ස්වභාවික සම්පත් සහ ස්වාභාවික සම්පත් පරිභෝජනය පහත දැමීම (උදා: බලශක්තිය, ජලය, කඩදාසි සහ අපද්‍රව්‍ය කළමනාකරණය


## වැදගත් තේමාවන්




## අදාළ ඇල්මැති පාර්ශ්වකරුවන්



## ක්‍රමෝපායික ප්‍රමුඛතා



## වටිනාකම් නිර්මාණයේ මූලිකාංග





## වැදගත් සිදුවීම්




ලබාදුන් හරිත ණය ගණන 222




2019 දී ලබාදුන් හරිත ණය රු. මිලියන 193.2



ශුද්ධ විදුලි මීටර් ක්‍රමය සම්බන්ධිත ශාඛා 26




ජාතික පද්ධතියට මාරුකළ ඒකක ගණන 40,210



බලශක්ති පරිභෝජනය ගිගාජුල් 35,696



ජලය පරිභෝජනය කියුබික් මීටර 79,368



සූර්ය බල කෝෂ ස්ථාපිත ශාඛා 42

## මිණුම් දර්ශකයන්

| | වැඩිවීම/ අඩුවීම | 2019 | 2018 |
|---|---|---|---|
| සූර්ය බලශක්තියෙන් ආවරණය වන ශාඛා ගණන | 13 | **26** | 13 |
| ලබාදුන් හරිත ණය ගණන | (559) | **222** | 781 |
| ලබාදුන් හරිත ණය වටිනාකම (රු.මිලියන) | (463.4) | **193.2** | 656.6 |
| එක් සේවකයෙකුගේ බලශක්ති පරිභෝජනය (ගිගාජුල්) | 0.16 | **7.57** | 7.41 |
| එක් ශාඛාවකට බලශක්ති පරිභෝජනය (ගිගාජුල්) | 8.39 | **139.44** | 131.05 |
| ජල පරිභෝජනය (කියුබික් මීටර්) | 3,207 | **79,368** | 76,161 |

## අනෙකුත් ප්‍රාග්ධනයන්ට ඇති සම්බන්ධතාවය

ස්වභාවිත ප්‍රාග්ධනය බැංකුවේ එක් එක් ප්‍රාග්ධනයන්ට සහ ප්‍රාග්ධනයන් වෙතින් බලපෑමට ලක්වෙයි.



තිරසාර වැඩසටහන් මුලපිරීම් සේවකයින්ගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව වර්ධනය කරන අතර හරිත දැනුමැති සංස්කෘතියක් ප්‍රවර්ධනය කරයි.

ස්වභාවික ප්‍රාග්ධනය තුළ ආයෝජනය, බැංකුවේ සන්නාම ප්‍රතිරූපය ඉහළනංවයි.


හරිත ගොඩනැගිලි සහ පුනර්ජනනීය බලශක්ති තුළ ආයෝජනය නිෂ්පාදිත ප්‍රාග්ධනය ගොඩනංවයි

පුනර්ජනනීය බලශක්ති සහ තිරසාර වැඩසටහන් මුලපිරීම තුළ ආයෝජනය දිගුකාලීන පොදු කාර්ය වියදම්වල අඩුවීමට දායක වේ

ස්වභාවික ප්‍රාග්ධනය ගොඩනගමින් සැපයුම් දාමයේ තිරසාරභාවය ශක්තිමත් කිරීම.

## සමතුලිතතා

- මෙහෙයුම් තුළ භාවිතා කරන ස්වභාවික සම්පත්
- කාලගුණ සහ ස්වභාවික ව්‍යවසන වෙනස්වීම්
- හරිත වැඩසටහන් මුලපිරීම් වල ආයෝජනය



## තිරසාර සංවර්ධන අරමුණු සඳහා දායකත්වය


6 CLEAN WATER AND SANITATION — බැංකුව තුළ ජල සුරැකුම් සහ වගකීම්සහගත පරිභෝජන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම තුළින් පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව ප්‍රවර්ධනය කිරීම.

7 AFFORDABLE AND CLEAN ENERGY — හරිත ශාඛා ගොඩනගමින් සහ ශාඛා සූර්ය බලශක්ති යොදාගන්නා ශාඛා බවට පරිවර්තනය කිරීම මගින් දැරිය හැකි පහසු සහ පිරිසිදු බලශක්ති භාවිතය කරා යාමට දායකවීම.


11 SUSTAINABLE CITIES AND COMMUNITIES — බැංකුවේ කෘෂි වනවගා වැඩසටහන තුළින් තිරසාර නගර සහ ප්‍රජාවන් ගොඩනැගීම.

12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION — සම්පත් වගකීම්සහගත පරිභෝජනය තුළින් සහ ඩිජිටල්කරණය තුළින් කඩදාසි භාවිතය අඩුකිරීමට දායක වෙමින්, අපි වගකීම් සහගත පරිභෝජනය සහ නිෂ්පාදනය ප්‍රවර්ධනය කරමු.

13 CLIMATE ACTION — හරිත ගොඩනැගිලි, මෙහෙයුම් ඩිජිටල්කරණය, වගකීම් සහගත ණයදීම් සහ සම්පත් වගකීම් සහගත කළමනාකරණය කිරීම යන ඒවා තුළ ආයෝජන සිදුකරමින් කාබන් පියසටහන අඩු කිරීම කරා දායකවීම




## තිරසර ලොවක් කරා දායකත්වය




## නිමවුම්

- බලශක්ති කාර්යක්ෂම වැඩසටහන්
- වගකීම් සහගත පරිභෝජනය
- පුනර්ජනනීය බලශක්තිය සඳහා ණයදීම
- හරිත වැඩසටහන් මුලපිරීම්
- ඩිජිටල්කරණය කරා ඉදිරියට යාම

### හරිත ගොඩනැගිලි

කාලගුණික විපර්යාසයන් වෙනස ආමන්ත්‍රණය කිරීම, තිරසාර සහ තෘප්තිමත් ප්‍රජාවක් නිර්මාණය කිරීම සහ ආර්ථික වර්ධනය කරා ගමන් කිරීම පිළිබඳ අපගේ උත්සාහයන් තුළ, අපි හරිත ගොඩනැගිලි සංකල්පය වැළඳගෙන ඇති අතර එය බලශක්තිය, ජලය සහ ස්වභාවික සම්පත් ජනතාවගේ සුභසාධනය සහ ජීවන තත්ත්වයන් පවත්වා ගනී. අපගේ දනට පවත්නා ශාඛාවලින් 3%ක් සමග විකල්ප බලශක්ති ප්‍රභවයක් ලෙස සූර්ය බලශක්ති ක්‍රම ස්ථාපිත කරමින් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව කරා අප ක්‍රමානුකූලව පරිවර්තනය වි ඇත. ඒ අනුව, මුළු ශාඛා ගණන 26 දක්වා ඉහළ නංවමින් 2019 දි පමණක් ශාඛා 13 ක් සූර්ය බලශක්ති ප්‍රභවයට පරිවර්තනය කර ඇත.

අපගේ ශාඛා පරිශ්‍ර බලශක්ති කාර්යක්ෂම සේවා ස්ථාන ලෙස අප ශක්තිමත් කර ඇත. ඒවා වීදුරු ජනේල සමග සැලසුම්කර ඇති අතර එහි තාප පරිවහනය මගින් ඇතුළට එන සහ පිටතට යන ප්‍රවාහ අඩුකරමින් සිසිලනය කිරීමට භාවිතා කරන අඩු බලශක්තිය හේතුකොට ගෙන අඩු බලශක්ති පරිභෝජනයට මග පාදන අතර ස්වභාවික අලංකාරය ඇති කරමින් කාර්යාල පරිශ්‍රය සතුටුදායක ස්ථානයක් බවට පත් කරයි. අපගේ නව ශාඛා හරිත ගොඩනැගිලි සංකල්පය අනුගමනය කරමින් ඉදිකරන අතර, එහිදී එම අවකාශ ස්වභාවික වායුන් සහ ආලෝකය භාවිතය උපරිම කිරීමට සැලසුම් කරයි. වඩාත් මෑතකාලීනව විවෘත කළ කතරගම අපගේ නිවාඩු නිකේතන ආලෝකකරණ හා සිසිලන (A/C) පහසුකම් සඳහා වැයවන විදුලි පරිභෝජනය අඩු කරමින් ස්වභාවික ආලෝකය සහ වායුව ප්‍රශස්ථ කිරීමට ගොඩ නගා ඇත.

ශාඛාතුළ ඇති විදුලි උපාංග ආරක්ෂා කර ගැනීම සඳහා අකුණු සන්නායක ස්ථාපිත කිරීමට අපි පියවර ගෙන ඇත. එමෙන්ම අපි බලශක්ති කාර්යක්ෂම විදුලි උපකරණ ස්ථාපිත කර ඇති අතර අපගේ ගොඩනැගිල්ල තුළ බලශක්ති ඉතුරුම් ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. පරිසරයට හිතැති ආකාරයෙන් අපජලය සහ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා යෝජිත නව අනුරාධපුර ගොඩනැගිල්ලේ අපජලය පිරිපහදු පිරියතයක් ස්ථාපිත කරනු ලැබේ.

### NSB වනවගා ව්‍යාපෘතිය - ඉදිරි පරම්පරාවන් සඳහා වෙනසක් සිදු කිරීම

"ගසක් සිටවමු" යනු 2019 වසරේ දී සිංහල සහ දෙමළ අළුත් අවුරුද්ද සඳහා හඳුන්වා දුන් නව සම්ප්‍රදායකි. මීට සමගාමීව, 2018 වසරේදී ආරම්භ කළ NSB වන වගා ව්‍යාපෘතිය අප ඉදිරියට දියත් කර ගෙනයන ලදී. හැකි සෑම අවස්ථාවකදීම දනට පවත්නා ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට සහ රඳවා ගැනීමට සහ තමන්ට අයත් ගෙවත්තෙන් ඉතුරුම් පිළිබඳ පුරුද්ද ඇති කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. 2019 සිංහල සහ දෙමළ අළුත් අවුරුද්ද සඳහා ගණුදෙනු කිරීම සඳහා ශාඛා වෙත පැමිණි ගනුදෙනුකරුවන් අතර 6,500කට වැඩි පැලබෑදා දෙන ලදී. එමෙන්ම මාකොළ අපගේ නව ශාඛාව විවෘත කරන අවස්ථාවේදී ද නව පැල බෙදාහරින ලදී. මෙවැනි වැඩසටහන් තුළින් වඩා හරිත ලොවකට දායකවීමට අපි කටයුතු කරමු.

### ඩිජිටල්කරණය තුළින් තිරසර ලොවකට දායකවීම.

අපගේ මෙහෙයුම් ඩිජිටල්කරණය තුළින්, අවම ස්වභාවික සම්පත් අවශ්‍ය වන සහ තිරසාර ලොවක් කරා දායක වන අපගේ පාරිසරික පියසටහන අවම කිරීමට අපි උත්සාහ ගනිමු. කාලය සහ සම්පත් ඉතිරිකර ගැනීමට අපගේ පුළුල් පරාසයක පවත්නා ඩිජිටල් නිෂ්පාදන භාවිතා කරමින් බැංකුකරණ කටයුතු පවත්වා ගැනීම සඳහා අන්තර්ජාල පදනම් හෝ ජංගම බැංකුකරණ මාර්ග කරා යොමුවීමට අපගේ ගනුදෙනුකරුවන් අපි දිරිගන්වමු. මුද්‍රිත ප්‍රකාශන වෙනුවට ඉලෙක්ට්‍රොනික් ලිපි වෙත ගනුදෙනුකරුවන් දායක කිරීම තුළින් කඩදාසි භාවිතය අඩු කර ඇත. දිරා පත්වන ප්‍රවර්ධනිය ද්‍රව්‍ය කරා විතැන්වීම සහ ඩිජිටල් සහ සමාජ මාධ්‍ය ප්‍රවර්ධන වැඩි කිරීම මගින් පාරිසරික තිරසාරභාවයට අපි දායක වී ඇත.

වසර තුළ, කඩදාසි පදනම් කරගත් තැපැල් භාවිතය ඉවත් කරමින් හරිත සංකල්පයට සහයවන කෙටිපණිවුඩ භාවිතය තුළින් පුද්ගලික රහස්‍ය අංකය නිකුත් කිරීමේ විකල්ප ක්‍රමයක් සහිත EMV තාක්ෂණය සහිත කාඩ්පත් අපි නිකුත් කළෙමු. එමෙන්ම, ජංගම දුරකතනය පදනම් කරගත් කාඩ් සක්‍රියකරණ ක්‍රියාපටිපාටිය භාවිතා කිරීම මගින් ගනුදෙනුකරුගේ තොරතුරුවල ආරක්ෂාව මෙම විකල්පය තුළින් ඇති කරයි.

### බාහිර සහතික කිරීම්

2018 තක්සේරු කාලසීමාව සඳහා 2019 දී ශ්‍රී ලංකා කාලගුණ අරමුදල විසින් ඉදිරිපත්කළ 1460 $tCO_2$ සහිත කාබන් උදාසින සහතිකය අපි ලබාගතිමු. අපි දනටමත් 2019 සහතික කිරීමට අයදුම්කර ඇති අතර සම්මානය 2020 දි පිරිනැමීමට නියමිතය.




### කිගලි සංශෝධනයට රජය සමග සම්බන්ධවීම

පරිසර සහ වනජීවී අමාත්‍යාංශය විසින් මෙහයවන ලද කිගලි සංශෝධනය සහ විකල්ප තාක්ෂණයන් පිළිබඳ දැනුවත් කිරීමේ වටමේස සාකච්ඡාමය වැඩමුළුවකට අපි සහභාගි වූවෙමු. මෙම වැඩමුළුවේ අරමුණ වූයේ එම සංශෝධනය පිළිබඳ ආයතන තුළ දැනුවත්කම ඇති කිරීමයි. ඕසෝන් ස්ථරයට හානිකරන වස්තූන් පිළිබඳ මොන්ට්‍රියල් සම්මුතියට සිදුකළ කිගලි සංශෝධනය ශ්‍රී ලංකාවද සාමාජිකයෙක් වූ රටවල් 65ක් විසින් අපරානුමත කිරීමෙන් පසු 2019 ජනවාරි1 දින සිට බලාත්මක විය. මෙම සංශෝධනයෙන් මෙම සහශ්‍රයේ ගෝලීය උෂ්ණසම 0.4°කින් වලක්වා ගැනිමට හයිඩ්‍රොෆ්ලෝරෝ කාබන් (HFCs) සහ ප්‍රබල හරිතාගාර වායු (GHGs) නිෂ්පාදනය සහ පරිභෝජනය අඩු කිරීමට උත්සාහ කරයි.

## වගකීම් සහගත පාරිභෝජනය


GRI 302-1

### බලශක්ති පරිභෝජනය


විදුලිය, ඩීසල්, සහ පෙට්‍රල් වැනි පුනර්ජනනීය නොවන හිඟ ශක්ති ප්‍රභවයන් ගෙන් උත්පාදිත බලශක්තිය සම්බන්ධව වගකියයුතු ආකාරයේ අපගේ භාවිතය කළමනාකරණය කර ගැනීමට අපි සෑම උත්සාහයක්ම දරමු. වගකීම්සහගත නිෂ්පාදනය සහ සම්පත් පරිභෝජනය තුළින්, අපගේ පාරිසරික පියසටහන අඩු කිරීමට සහ අනාගගත පරම්පරාවන් සඳහා එකී මූලාශ්‍ර ආරක්ෂා කිරීමට අපි කැපවී සිටිමු.

බලශක්තිය පිළිබඳ අපගේ මූලික මූලාශය වන්නේ ජාතික පද්ධතියෙන් ලබාගන්නා විදුලිය සහ සූර්ය කෝෂ තුළින් උත්පාදිත විදුලියයි. බැංකුව පුරා කාර්යක්ෂම බලශක්ති පරිභෝජනය සඳහා වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මකව පවතී. එකී වැඩසටහන්වලට පහත දෑ ඇතුළත් වේ:


- බලශක්ති පරිභෝජනය අඩු කිරීමට ප්‍රධාන කාර්යාලයේ සහ ශාඛාවල ස්ප්ලිට් වායුසමීකරණ වෙනුවට බලශක්ති කාර්යක්ෂමව ක්‍රියාත්මක වන ඉන්වර්ටර් වායුසමීකරණ සවිකිරීම.
- සම්ප්‍රදායික බල්බ වෙනුවට අවම විදුලියක් පරිභෝජනය කරන LED බල්බ සහ CFL බල්බ සවිකිරීම
- බලශක්ති ඉතුරුම්වල වැදගත්කම පිළිබඳ අඛණ්ඩව දැනුවත් කිරීම සහ විදුලිය ඉතිරි කිරීමට සම්පත් සංරක්ෂණය තුළින් බැංකුව තුළ තිරසාරභාවය දැනුවත් සංස්කෘතියක් පෝෂණය කිරීම.
- A4 කඩදාසි සහ ලියුම් කවර සහ ගොනු (File) වැනි ලිපිද්‍රව්‍ය අයිතම ප්‍රතිචක්‍රීයකරණය ප්‍රවර්ධනය කිරීම.
- පරිසර හිතකාමී CFC රහිත වායු සමීකරණ ඒකක භාවිතා කිරීම
- බලශක්ති සංරක්ෂණයට දායක වන බලශක්ති ඉතුරුම් විදුලි බල්බ සහ LED තිර සහිත මොනිටර් භාවිතා කිරීම.
- සාමාන්‍ය බැංකුකරණ කාලවේලාවන් වලට වායු සමීකරණ භාවිතය සීමා කිරීම.
- නිවාඩු දිනවල සේවය කිරීමට සේවකයින් අධෛර්යමත් කිරීම.



ශාඛාවල සූර්ය පැනල ස්ථාපිත කිරීමට සිදුකළ ආයෝජනය
**රු. මිලියන 80**




සූර්ය පැනල ස්ථාපිත ශාඛා
**42**



ජාතික පද්ධතියට සම්බන්ධ ශාඛා
**26**



එක් සේවකයෙකුගේ බලශක්ති පරිභෝජනය
**ගිගාජූල් 7.57**




ශාඛාවක බලශක්ති පරිභෝජනය
**ගිගාජූල් 139.44**

GRI 303-5

## ජල පරිභෝජනය

ගුණාත්මක පානීය ජල පහසුකම් ලබාගැනීම දැඩිසේ අභියෝගාත්මක වන බැවින්, අඩු ජල පරිභෝජනය හා වැසි ජලය එකතු කිරීම තුළින් ජල පරිභෝජනය අවම කිරීමට අපි සෑම පියවරක්ම ගනිමු. අප විසින් ජලය විචක්ෂණව භාවිතය සඳහා අවස්ථා හඳුනාගනිමින්, ජලය කළමනාකරණය කිරීමේ වර්තමාන භාවිතයන් අඛණ්ඩව වර්ධනය කරමු. වසර තුළ අපගේ ජල පරිභෝජනය පසුගිය වසරේ 76,161 (M3) ට සාපේක්ෂව 79,368 (M3) ක් විය. ඉවත්කරන ජලය පොදු කාණු පද්ධතියට බැහැර කරන අතර අපජලය පරිශ්‍රය තුළ පවත්නා පෙඟවුම් වලවල් තුළින් බැහැර කෙරේ. අපගේ අළුතින් ඉදිකරන ලද ශාඛා කිහිපයක වැසි ජලය එක්රැස් කිරීම් සඳහා පහසුකම් සලසා ඇති අතර එමගින් මතුපිට සහ භූගත නැවුම් ජලය භාවිතා කිරීම වලක්වයි.



එක් සේවකයෙකුට ජලය පරිභෝජනය
**17 (M3)**



ශාඛාවකට ජල පරිභෝජනය
**310 (M3)**

## අපද්‍රව්‍ය කළමනාකරණය


අප විසින් ඝන ද්‍රව්‍ය වගකීම් රහිත ආකාරයෙන් බැහැර කිරීමේ බරපතලකම, සහ ජෛව විවිධත්වය සහ මානව සෞඛ්‍ය මත ප්‍රතිවිපාක අවබෝධය කරගනිමින්, අපද්‍රව්‍ය වගකීම්සහගතව බැහැර කිරීම සඳහා අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යවහාරයන් ක්‍රියාත්මක කර ඇත. ශාඛා ජාලය තුළ පවත්වන දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින්, අපගේ සේවකයින් අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යවහාරයන් සම්බන්ධයෙන් මනාව දැනුවත් කෙරේ. අපගේ සේවකයින්, අදාළ නාගරික/මහනගර සභා/ සහ මධ්‍යම පරිසර අධිකාරියේ අනුමත තෙවැනි පාර්ශව ප්‍රතිචක්‍රියකරණ සේවා සපයන්නන්ගේ සහය ඇතිව අපද්‍රව්‍ය කාණ්ඩ කිරීම සිදු කරන්නෙමු. ඉවතලන කඩාදාසි ප්‍රතිචක්‍රීයකරණය සඳහා කඩදාසි සංස්ථාවට භාර දී ඇති අතර, ආහාර සහ පොලිතීන් අපද්‍රව්‍ය එකතු කර නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට භාරදෙනු ලැබේ.



ප්‍රතිචක්‍රීයකරණ සමාගමක් තුළින් ප්‍රතිචක්‍රීයකරණය කළ පුවත් පත්
**කි.ග්‍රෑ. 3000**



කොළඹ මහ නගර සභාව විසින් එකතුකල ආහාර අපද්‍රව්‍ය සහ පොලිතීන්




සැපයුම් අංශය තුළින් වෙන්දේසි කළ ද්‍රව්‍ය

# තිරසාර මූල්‍යකරණය

## වගකීම්සහගත ණයදීම

පාරිසරික සහ සමාජීය ප්‍රගතිය උසස් කරගනිමින් වගකීම්සහගත ආකාරයකින් අපගේ ව්‍යාපාරය පවත්වා ගැනීමට අපි කැප වී සිටිමු. අපගේ ණය දීමේ කටයුතුවලින් පරිසරය කෙරෙහි සෘණාත්මක බලපෑමක් තිබිය හැකි බව අපි අවබෝධ කරගෙන ඇති අතර අපගේ අඛණ්ඩ සාර්ථකත්වය සඳහා දිගුකාලීන තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍යය. එමනිසා, අපි පාරිසරික, සමාජීය සහ පාලන (ESG) ප්‍රතිෂ්ඨාවන් අපගේ ණය දීමේ ක්‍රියාවලි සඳහා අපගේ ණය සහ අවදානම් ඇගයීමට ඇතුළත් කර ඇත. බැංකුව විසින් ණය නොදිය යුතු කටයුතු ඇතුළත් කරමින්, බැහැර කිරීම් ලැයිස්තුවක් අපගේ ආයතනික ණය ප්‍රතිපත්තියට ඇතුළත් කර ඇත. අප දැනුවත්ව පරිසරියට, සේවකයින්ට හෝ සමාජයට අහිතකර බලපෑමක් පිළිබඳ පැහැදිලි සාක්ෂියක් ඇති කටයුතු සඳහා මූල්‍යකරණය නොකරන්නෙමු. ණය ලබා ගැනීම සඳහා ණය ගැණුම්කරුවන් විසින් පාරිසරික බලපෑම් තක්සේරු කිරීමක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. කාලය සමඟ උසස් කර්මාන්ත ESG අපේක්ෂාවන් සපුරාලීමට සුදුසු තිරසාර ව්‍යවහාර තවදුරටත් යොදා ගැනීමට අපගේ ගනුදෙනුකරුවන් ධනාත්මකව පෙළඹවීමට අපි උත්සාහ ගනිමු. ඉහළ ESG අවදානම් දරන ගනුදෙනු වැඩිකළ ඇගයීම්වලට සහ අනුමත කිරීමේ අවශ්‍යතාවන්ට යටත් කරනු ලබයි. අප විසින් දුර දැකුම් විමර්ශනයක් (due diligence) සහ පාලනය සඳහා පැහැදිලි මාර්ගෝපදේශ, කාර්යභාරයන් සහ වගකීම් සහිත පුළුල් පාරිසරික සමාජීය අවදානම් කළමනාකරණ (ESRM) ප්‍රතිපත්තියක් සකස් කර ඇත. වසර තුළ, පරිසරය කෙරෙහි අහිතකර බලපෑම් හේතු කොට ගෙන ප්‍රතික්ෂේප කරන ලද පහසුකම් හෝ ණය නොමැත.

ESRM වැඩරාමුව



### "හරිත" ණය තුළින් "හරිත" ආර්ථිකය ප්‍රවර්ධනය

අපගේ නිෂ්පාදනයක් වන ප්‍රජා පදනම් බලශක්ති උත්පාදන ව්‍යාපෘතිය වන, සූර්ය බල සංග්‍රාමය වෙත අපි අඛණ්ඩව සහාය වෙමු. විදුලි බල සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය, ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලිබල පුද්ගලික සමාගම හවුල්කරුවන් වන මෙම වැඩසටහන නිවාස, ආගමික ස්ථාන, හෝටල්, වාණිජ ස්ථාන, සහ කර්මාන්තවල වහල මත කුඩා සූර්ය බලශක්ති පිරියත සවිකිරීම ප්‍රවර්ධනය කිරීමට 2016 දී ආරම්භ කරන ලදී. සහන ණය යෝජනා ක්‍රමයක් තුළින්, තමන්ගේ විදුලි බිල් ඉතුරු කරගනිමින් මිහිතලය සුරක්ෂිත කරන පුනර්ජනනීය බලශක්තිය කරා විතැන්විමට ගනුදෙනුකරුවන්ට සහය වෙමින් පුනර්ජනනීය බලශක්තිය ක්‍රියාත්මක කිරීමට සහ ව්‍යාප්තිය සඳහා අපි සහය වෙමු. ගනුදෙනුකරුවන්ට තමන්ගේ විදුලි භාවිතය මත පදනම් වී ශුද්ධ මීටර් ක්‍රමය, ශුද්ධ ගිණුම්කරණ ක්‍රමය සහ ශුද්ධ ප්ලස් යෝජනා ක්‍රමය ඇතුළු විකල්පවලින් එකක් තෝරාගත හැකිය.

| වසර | ලබාදුන් ණය ගණන | ලබාදුන් මුදල රු. මිලියන |
|---|---:|---:|
| 2016 | 35 | 26.42 |
| 2017 | 902 | 685.58 |
| 2018 | 781 | 656.61 |
| 2019 | 222 | 193.2 |

## අනාගත ප්‍රමුඛතා

**කෙටි කාලීන**


- ඩිජිටල්/ස්වයං සේවා මාර්ග කරා විතැන්විමට ගනුදෙනුකරුවන් දිරිමත් කිරීම
- ශාඛාවල සූර්ය බලශක්ති අඛණ්ඩව ස්ථාපිත කිරීම
- පාරිසරික වැඩසටහන්වල ආයෝජනය

**මධ්‍ය කාලීන**

- ණයදීමේ පහසුකම්වල පාරිසරික සහ සමාජීය නිර්ණායක ශක්තිමත් කරමින් තිරසාර මූල්‍යකරණය වර්ධනය කිරීම
- සූර්ය බලශක්ති සහිත හරිත ශාඛා තුළින් කාබන් විමෝචන අඩුකිරීම
- බලශක්තිය, කඩදාසි සහ ජලය පරිභෝජනය අඩුකිරීම
- කඩදාසි රහිත පරිසරියකට විතැන්වීම
- හරිත ණයදීම තුළින් කාබන් අවම ආර්ථිකයකට සහයවීම

**දිගුකාලීන**

- පාරිසරිකමය සහ සමාජීය වශයෙන් වගකීයන නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය
- ජෛව පද්ධතිය සංරක්ෂණය සඳහා ආයෝජනය



# මූලික නිර්ණායකවලට අනුකූලව ගෝලීය වාර්තාකරණ මූලපිරීම් (GRI) දර්ශකය

| GRI ප්‍රමිතිය | අනාවරණයන් | පිටු අංකය | වෙනත් කරුණු/ ඉවත්කිරීම් |
|---|---|---|---|
| **ගෝලීය වාර්තාකරණ ප්‍රවේශය (GRI) අන්තර්ගත දර්ශකය – "In Accordance Core"** | | | |
| GRI ප්‍රමිති අනාවරණ | | | |
| 102-1 | ආයතනයේ නම | 4 | |
| 102-2 | ක්‍රියාකාරකම්, සන්නාම, නිෂ්පාදන, සහ සේවා | 306 හා 426-429 | |
| 102-3 | ප්‍රධාන කාර්යාලය පිහිටි ස්ථානය | 192 | |
| 102-4 | මෙහෙයුම් ස්ථානය | 116 | |
| 102-5 | අයිතිය සහ නෛතිකභාවය | 192 | |
| 102-6 | සේවය සලසන වෙළෙඳපොල | 116 | |
| 102-7 | ආයතනයේ ප්‍රමාණය | 7-11 | |
| 102-8 | සේවකයින් සහ අනෙකුත් සේවකයින් පිළිබඳ තොරතුරු | 133 | |
| 102-9 | සැපයුම් දාමය | 154-157 | |
| 102-10 | ආයතනයට සහ එහි සැපයුම් දාමයට සැලකිලිවත් වෙනස්වීම් | 68-69 | |
| 102-11 | පූර්වෝපාය මූලධර්මය සහ ප්‍රවේශය | 36-47 | |
| 102-12 | බාහිර වැඩසටහන් | 5 | |
| 102-13 | සංගම්වල සාමාජිකත්වය | 157 | |
| 102-14 | ජ්‍යෙෂ්ඨ තීරණ ගන්නාගෙන් ප්‍රකාශය | 12-18 | |
| 102-16 | චර්යාව පිළිබඳ වටිනාකම්, මූලධර්ම, ප්‍රමිති, සහ ප්‍රතිමාන | 124-125 | |
| 102-18 | පාලන ව්‍යුහය | 198 | |
| 102-40 | පාර්ශ්වකාර කණ්ඩායම්වල ලැයිස්තුව | 70 | |
| 102-41 | සාමුහික කේවල් කිරීමේ ගිවිසුම් | 142-143 | |
| 102-42 | පාර්ශ්වකරුවන් හඳුනාගැනීම සහ තෝරා ගැනීම | 70-77 | |
| 102-43 | පාර්ශ්වකාර සහභාගිත්වයට ප්‍රවේශය | 70-77 | |
| 102-44 | ප්‍රධාන මාතෘකා සහ මතුකළ අදහස් | 70-77 | |
| 102-45 | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ආයතන | 4 | |
| 102-46 | වාර්තා අන්තර්ගතය සහ මාතෘකා සීමා නිර්වචනය | 4 | |
| 102-47 | වැදගත් මාතෘකාවල ලැයිස්තුව | 80 | |
| 102-48 | තොරතුරු නැවත ප්‍රකාශනයන් | 4 | |
| 102-49 | වාර්තාකරණය තුළ වෙනස්වීම් | 4 | |
| 102-50 | වාර්තාකරණ කාලසීමාව | 4 | |
| 102-51 | වඩාත් මෑතකාලින වාර්තාවේ දිනය | 4 | |
| 102-52 | වාර්තාකරණ චක්‍රය | 4 | |
| 102-53 | වාර්තාව සම්බන්ධ ප්‍රශ්න සඳහා ඇමතුම් ස්ථාන | 6 | |
| 102-54 | GRI ප්‍රමිතිවලට අනුකූලව වාර්තාකරණ හිමිකම් | 5 | |
| 102-55 | කේන්ද්‍රිත නිර්ණායක වලට අනුකූලව ගෝලීය වාර්තාරණය ප්‍රවේශයේ අන්තර්ගත දර්ශක | 170 | |
| 102-56 | බාහිර සහතිකය | 288 | |

| GRI ප්‍රමිතිය | අනාවරණයන් | පිටු අංකය | වෙනත් කරුණු/ ඉවත්කිරීම් |
|---|---|---|---|
| **GRI විශේෂිත නිරාවරණ** | | | |
| **ආර්ථිකය** | | | |
| **ආර්ථික කාර්යසාධනය** | | | |
| **GRI 103: කළමනාකරණ ප්‍රවේශය** | | | |
| 103-1 | වැදගත් තේමාවන් සහ එහි සීමාවන් පිළිබඳ පැහැදිලි කිරීම | 78-88 | |
| 103-2 | කළමනාකරණ ප්‍රවේශය සහ එහි සංරචකයන් | 78-88 | |
| 103-3 | කළමනාකරණ ප්‍රවේශය ඇගයීම | 78-88 | |
| **GRI 201: ආර්ථික කාර්යසාධනය** | | | |
| 201-1 | උත්පාදනය කළ සහ බෙදාහරින ලද සෘජු ආර්ථික වටිනාකම | 91 | |
| 201-3 | නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මේ වගකීම් සහ අනෙකුත් විශ්‍රාම සැලසුම් | 141 | |
| **වෙළෙඳපොල පැවැත්ම** | | | |
| **GRI 103: කළමනාකරණ ප්‍රවේශය** | | | |
| 103-1 | වැදගත් තේමාවන් සහ එහි සීමාවන් පිළිබඳ පැහැදිලි කිරීම | 78-88 | |
| 103-2 | කළමනාකරණ ප්‍රවේශය සහ එහි සංරචකයන් | 78-88 | |
| 103-3 | කළමනාකරණ ප්‍රවේශය ඇගයීම | 78-88 | |
| **GRI 201: වෙළෙඳපොල පැවැත්ම** | | | |
| 202-1 | දේශීය අවම වැටුපට සාපේක්ෂව ස්ත්‍රීපුරුෂභාවය අනුව සම්මත අනුපාතය | 140 | |
| 202-2 | දේශීය ප්‍රජාවගෙන් බඳවාගත් ජ්‍යෙෂ්ඨ කළමනාකරණය | 135 | |
| **වක්‍ර ආර්ථික බලපෑම්** | | | |
| **GRI 103: කළමනාකරණ ප්‍රවේශය** | | | |
| 103-1 | වැදගත් තේමාවන් සහ එහි සීමාවන් පිළිබඳ පැහැදිලි කිරීම | 78-88 | |
| 103-2 | කළමනාකරණ ප්‍රවේශය සහ එහි සංරචකයන් | 78-88 | |
| 103-3 | කළමනාකරණ ප්‍රවේශය ඇගයීම | 78-88 | |
| **GRI 203: වක්‍ර ආර්ථික බලපෑම්** | | | |
| 203-1 | යටිතල පහසුකම්වල ආයෝජනය සහ සහය සේවා | 158 | |
| **ප්‍රසම්පාදන ව්‍යවහාර** | | | |
| **GRI 103: කළමනාකරණ ප්‍රවේශය** | | | |
| 103-1 | වැදගත් තේමාවන් සහ එහි සීමාවන් පිළිබඳ පැහැදිලි කිරීම | 78-88 | |
| 103-2 | කළමනාකරණ ප්‍රවේශය සහ එහි සංරචකයන් | 78-88 | |
| 103-3 | කළමනාකරණ ප්‍රවේශය ඇගයීම | 78-88 | |
| **GRI 204: ප්‍රසම්පාදන ව්‍යවහාර** | | | |
| 204-1 | දේශීය සැපයුම්කරුවන් සඳහා කළ වියදම් අනුපාතය | 156 | |
| **දූෂණ විරෝධීබව** | | | |
| **GRI 103: කළමනාකරණ ප්‍රවේශය** | | | |
| 103-1 | වැදගත් තේමාවන් සහ එහි සීමාවන් පිළිබඳ පැහැදිලි කිරීම | 78-88 | |
| 103-2 | කළමනාකරණ ප්‍රවේශය සහ එහි සංරචකයන් | 78-88 | |
| 103-3 | කළමනාකරණ ප්‍රවේශය ඇගයීම | 78-88 | |

| GRI ප්‍රමිතිය | අනාවරණයන් | පිටු අංකය | වෙනත් කරුණු/ ඉවත්කිරීම් |
|---|---|---|---|
| **GRI 205: දූෂණ විරෝධීබව** | | | |
| 205-2 | දූෂණ විරෝධි ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි පිළිබඳ සන්නිවේදනය සහ පුහුණුව | 139 ) 158 | |
| 205-3 | දූෂණය පිළිබඳ තහවුරු වූ සිදුවීම් සහ ගනු ලැබූ පියවරයන් | 158 | |
| **තරඟකාරීත්ව විරෝධි හැසිරීම** | | | |
| **GRI 103: කළමනාකරණ ප්‍රවේශය** | | | |
| 103-1 | වැදගත් තේමාවන් සහ එහි සීමාවන් පිළිබඳ පැහැදිලි කිරීම | 78-88 | |
| 103-2 | කළමනාකරණ ප්‍රවේශය සහ එහි සංරචකයන් | 78-88 | |
| 103-3 | කළමනාකරණ ප්‍රවේශය ඇගයීම | 78-88 | |
| **GRI 206: තරඟකාරීත්ව විරෝධි හැසිරීම** | | | |
| 206-1 | තරඟතාරි විරෝධි හැසිරීම, සංගත විරෝධී, සහ ඒකාධිකාරී පරිචයන් සඳහා නීතිමය ක්‍රියාමාර්ගයක් | 158 | |
| **පාරිසරික** | | | |
| **බලශක්තිය** | | | |
| **GRI 103: කළමනාකරණ ප්‍රවේශය** | | | |
| 103-1 | වැදගත් තේමාවන් සහ එහි සීමාවන් පිළිබඳ පැහැදිලි කිරීම | 78-88 | |
| 103-2 | කළමනාකරණ ප්‍රවේශය සහ එහි සංරචකයන් | 78-88 | |
| 103-3 | කළමනාකරණ ප්‍රවේශය ඇගයීම | 78-88 | |
| **GRI 302: බලශක්තිය** | | | |
| 302-1 | ආයතනය තුළ බලශක්ති පරිභෝජනය | 166 | |
| **ජලය සහ අපජලය** | | | |
| **GRI 103: කළමනාකරණ ප්‍රවේශය** | | | |
| 103-1 | වැදගත් තේමාවන් සහ එහි සීමාවන් පිළිබඳ පැහැදිලි කිරීම | 78-88 | |
| 103-2 | කළමනාකරණ ප්‍රවේශය සහ එහි සංරචකයන් | 78-88 | |
| 103-3 | කළමනාකරණ ප්‍රවේශය ඇගයීම | 78-88 | |
| **GRI 303: ජලය සහ අපජලය** | | | |
| 303-5 | ජල පරිභෝජනය | 167 | |
| **සමාජීය** | | | |
| **සේවා නියුක්තිය** | | | |
| **GRI 103: කළමනාකරණ ප්‍රවේශය** | | | |
| 103-1 | වැදගත් තේමාවන් සහ එහි සීමාවන් පිළිබඳ පැහැදිලි කිරීම | 78-88 | |
| 103-2 | කළමනාකරණ ප්‍රවේශය සහ එහි සංරචකයන් | 78-88 | |
| 103-3 | කළමනාකරණ ප්‍රවේශය ඇගයීම | 78-88 | |
| **GRI 401: සේවා නියුක්තිය** | | | |
| 401-1 | නව සේවකයින් බඳවා ගැනීම හා සේවක පිරිවැටුම | 135 ) 142 | |
| 401-2 | තාවකාලින හෝ අර්ධ කාලීන සේවකයින්ට ලබා නොදෙන එහෙත් පූර්ණ කාලීන සේවකයින්ට ලබාදෙන ප්‍රතිලාභ | 136 ) 140 | |
| 401-3 | දෙමාපිය නිවාඩු | 139 | |

| GRI ප්‍රමිතිය | අනාවරණයන් | පිටු අංකය | වෙනත් කරුණු/ ඉවත්කිරීම් |
|---|---|---|---|
| **වෘත්තීමය සෞඛ්‍ය සහ ආරක්ෂාව** | | | |
| **GRI 103: කළමනාකරණ ප්‍රවේශය** | | | |
| 103-1 | වැදගත් තේමාවන් සහ එහි සීමාවන් පිළිබඳ පැහැදිලි කිරීම | 78-88 | |
| 103-2 | කළමනාකරණ ප්‍රවේශය සහ එහි සංරචකයන් | 78-88 | |
| 103-3 | කළමනාකරණ ප්‍රවේශය ඇගයීම | 78-88 | |
| **GRI 403: වෘත්තීමය සෞඛ්‍ය සහ ආරක්ෂාව** | | | |
| 403-9 | රැකියාව ආශ්‍රිත අදාළ තුවාල | 139 | |
| **පුහුණුව සහ සංවර්ධනය** | | | |
| **GRI 103: කළමනාකරණ ප්‍රවේශය** | | | |
| 103-1 | වැදගත් තේමාවන් සහ එහි සීමාවන් පිළිබඳ පැහැදිලි කිරීම | 78-88 | |
| 103-2 | කළමනාකරණ ප්‍රවේශය සහ එහි සංරචකයන් | 78-88 | |
| 103-3 | කළමනාකරණ ප්‍රවේශය ඇගයීම | 78-88 | |
| **GRI 404: පුහුණු සහ සංවර්ධනය** | | | |
| 404-1 | සේවකයකුගේ එක් වසරක සාමාන්‍ය පුහුණු පැය ගණන | 136 | |
| 404-2 | සේවක කුසලතා ඉහළ නැංවීම හා ඊට අදාළ වෙනස්වීම් වලට ආධාර කිරීම සඳහා පුහුණු වැඩසටහන් | 136 | |
| 404-3 | නිරන්තර කාර්යසාධනය සහ වෘත්තීය සංවර්ධන සමාලෝචන ලද සේවකයින්ගේ ප්‍රතිශතය | 138 | |
| **විවිධත්වය සහ සමාන ඉඩ ප්‍රස්ථා** | | | |
| **GRI 103: කළමනාකරණ ප්‍රවේශය** | | | |
| 103-1 | වැදගත් තේමාවන් සහ එහි සීමාවන් පිළිබඳ පැහැදිලි කිරීම | 78-88 | |
| 103-2 | කළමනාකරණ ප්‍රවේශය සහ එහි සංරචකයන් | 78-88 | |
| 103-3 | කළමනාකරණ ප්‍රවේශය ඇගයීම | 78-88 | |
| **GRI 405: විවිධත්වය සහ සමාන ඉඩ ප්‍රස්ථා** | | | |
| 405-2 | කාන්තාවන් හා පිරිමින් අතර මූලික වැටුප් හා පාරිශ්‍රමික අනුපාතය | 139 ) 140 | |
| **වෙනස් ලෙස නොසැලකීම** | | | |
| **GRI 103: කළමනාකරණ ප්‍රවේශය** | | | |
| 103-1 | වැදගත් තේමාවන් සහ එහි සීමාවන් පිළිබඳ පැහැදිලි කිරීම | 78-88 | |
| 103-2 | කළමනාකරණ ප්‍රවේශය සහ එහි සංරචකයන් | 78-88 | |
| 103-3 | කළමනාකරණ ප්‍රවේශය ඇගයීම | 78-88 | |
| **GRI 406: වෙනස් ලෙස නොසැලකීම** | | | |
| 406-1 | වෙනස් ලෙස සැලකීමේ සිදුවීම් සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග | 139 | |

| GRI ප්‍රමිතිය | අනාවරණයන් | පිටු අංකය | වෙනත් කරුණු/ ඉවත්කිරීම් |
|---|---|---|---|
| **ප්‍රාදේශිය ප්‍රජාවන්** | | | |
| **GRI 103: කළමනාකරණ ප්‍රවේශය** | | | |
| 103-1 | වැදගත් තේමාවන් සහ එහි සීමාවන් පිළිබඳ පැහැදිලි කිරීම | 78-88 | |
| 103-2 | කළමනාකරණ ප්‍රවේශය සහ එහි සංරචකයන් | 78-88 | |
| 103-3 | කළමනාකරණ ප්‍රවේශය ඇගයීම | 78-88 | |
| **GRI 413: ප්‍රාදේශිය ප්‍රජාවන්** | | | |
| 413-1 | ප්‍රාදේශිය ප්‍රජා සහභාගිත්වය  සමඟ මෙහෙයුම්, බලපෑම් තක්සේරු කිරීම් සහ සංවර්ධන වැඩසටහන් | 160 | |
| **අලෙවිකරණය සහ ලේබල් කරණය** | | | |
| **GRI 103: කළමනාකරණ ප්‍රවේශය** | | | |
| 103-1 | වැදගත් තේමාවන් සහ එහි සීමාවන් පිළිබඳ පැහැදිලි කිරීම | 78-88 | |
| 103-2 | කළමනාකරණ ප්‍රවේශය සහ එහි සංරචකයන් | 78-88 | |
| 103-3 | කළමනාකරණ ප්‍රවේශය ඇගයීම | 78-88 | |
| **GRI 417: අලෙවිකරණය සහ ලේබල්** | | | |
| 417-2 | නිෂ්පාදන සහ සේවා තොරතුරු සහ ලේබල්කරණය සම්බන්ධ අනුකූල නොවීමේ සිදුවීම් | 153 | |
| 417-3 | අලෙවිකරණ සන්නිවේදනය සම්බන්ධ අනුකූල නොවීමේ සිදුවීම් | 153 | |
| **ගනුදෙනුකරුවන්ගේ පෞද්ගලිකත්වය** | | | |
| **GRI 103: කළමනාකරණ ප්‍රවේශය** | | | |
| 103-1 | වැදගත් තේමාවන් සහ එහි සීමාවන් පිළිබඳ පැහැදිලි කිරීම | 78-88 | |
| 103-2 | කළමනාකරණ ප්‍රවේශය සහ එහි සංරචකයන් | 78-88 | |
| 103-3 | කළමනාකරණ ප්‍රවේශය ඇගයීම | 78-88 | |
| **GRI 418: ගණුදෙනුකරුවන්ගේ පෞද්ගලිකත්වය** | | | |
| 418-1 | ගණුදෙනුකරුවන්ගේ පෞද්ගලිකත්වය උල්ලංගනය කිරීම් හා ගණුදෙනුකරුවන්ගේ දත්ත අහිමි වීම පිළිබඳ සනාථවූ පැමිණිලි | 152 | |

# පාලනය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආයතනික පාලනය, අනුකූලතාවය සහ අවදානම් කළමනාකරණ කාර්යරාමුව යන සාධක වලින් සුසැදි ඒකාබද්ධ පද්ධතිය පිළිබඳ සමාලෝචනයකි. බැංකුව තුල ආයතනික පාලනය ස්ථාපිත කිරීම තුළින් කාර්යක්‍ෂම මෙහෙයුම්, ප්‍රාග්ධනය සඳහා වැඩි දියුණු කළ ප්‍රවේශ හිමිවීම, අවදානම් අවම කිරීම, සහ ඇල්මැති පාර්ශවයන්ට ආරක්‍ෂා වීම සිදු වේ.


**176**
අධ්‍යක්ෂ මණ්ඩලය

**180**
ආයතනික කළමනාකාරීත්වය

**182**
විධායක කළමනාකාරීත්වය

**184**
ප්‍රධාන කළමනාකරුවන්

**185**
ආයතනික පාලනය පිළිබඳ ප්‍රකාශය

**186**
අවදානම් කළමනාකරණය පිළිබඳ ප්‍රකාශය




# අධ්‍යක්ෂ මණ්ඩලය



**1. කේෂිලා ජයවර්ධන මිය**

සභාපති
ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

**පත්කරන ලද දිනය**

2020 ජනවාරි 2

**නිපුණතා සහ අත්දැකීම්**

ශාස්ත්‍රඥයෙක්/විශ්වවිද්‍යාල කථිකාචාර්යවරියක් වූ ජයවර්ධන මහත්මිය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යාව පිළිබඳ කථිකාචාර්යවරියක් ලෙස වසර 15 ක් සේවය කර ඇත. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යාව පිළිබඳ ගෞරව උපාධියක් සහ ශාස්ත්‍රපති උපාධියක් ඇය සතුය. ඇය මෙරට සංවර්ධන බැංකු දෙකක සභාපතිතුමිය ලෙස වසර 7 ක් කටයුතු කර ඇත.

**වෙනත් වර්තමාන තනතුරු**

සභාපතිනි, NSB ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ් හී සභාපතිනි,
ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

**මීට පෙර දැරූ ප්‍රධාන තනතුරු**

සභාපතිනි, කඳුරට සංවර්ධන බැංකුව, සභාපතිනි, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පළාත් පාලන ආයතන සාමාජිකා.

**අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සාමාජිකත්වය**

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුවේ සභාපතිනි

**2. යූ පී ආර් ආරියරත්න මහතා**

නිළ බලයෙන් පත්වූ අධ්‍යක්ෂ
ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

**පත්කරන ලද දිනය**

2018 අගෝස්තු 31

**නිපුණතා සහ අත්දැකීම්**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිළධාරියෙක් වන ආරියරත්න මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ වසර 23 කට වැඩි අත්දැකීම් සමුදායකට හිමිකම් කියයි. ඔහු කැළණිය විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී උපාධිය, සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය සහ ප්‍රාදේශීය සැලසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හදාරා ඇත. එසේම, පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ඔහු විසින් සම්පූර්ණ කර තිබේ. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ නිළධාරීන් සඳහා පවත්වනු ලබන රාජ්‍ය පරිපාලනය, පොදු කළමනාකරණය සහ නිපුණතා සංවර්ධනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලා ද ඒ මහතා විසින් සාර්ථකව හදාරනු ලැබ ඇත.

**වෙනත් වර්තමාන තනතුරු**

තැපැල්පති, තැපැල් දෙපාර්තමේන්තුව, NSB ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ් හී අධ්‍යක්ෂ

**මීට පෙර දැරූ ප්‍රධාන තනතුරු**

පොලොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ලේකම්, අතිරේක ලේකම් (සමාජ සංවර්ධන), සමාජ සවිබලගැන්වීම සහ සුභසාධන අමාත්‍යංශයේ අතිරේක ලේකම් (ග්‍රාමීය සංවර්ධන), රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ අතිරේක රජයේ මුද්‍රණාලාධිපති (පරිපාලන), පොල් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල්, ඉඩම් අමාත්‍යංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ඉඩම්), ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ විධායක අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (පරිපාලන සහ මුදල්), තැපැල් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය තැපැල්පති (වයඹ පළාත සහ මධ්‍යම පළාත), මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්, කෘෂිකර්ම සේවා දෙපාර්තමේන්තුවේ සහකාර/නියෝජ්‍ය කොමසාරිස් (කුරුණෑගල), සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පළාත් කොමසාරිස් (වයඹ පළාත), තිරප්පනේ රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම්, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සහකාර ඉඩම් කොමසාරිස්

**අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සාමාජිකත්වය**

අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සභාපති

### 3. මනෝහාරි අබයසේකර මිය

අධ්‍යක්ෂ
ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

**පත්කරන ලද දිනය**

2020 ජනවාරි 14

**නිපුණතා සහ අත්දැකීම්**

අබයසේකර මහත්මිය කොළඹ විශ්වවිද්‍යාලයෙන් ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධියක් (පළමු පන්තියේ සාමාර්ථයක් සමග) සහ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් (MBA) හදාරා තිබේ. ඇය වරලත් කළමණාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ (CIMA-UK) අධි සාමාජිකයෙකු මෙන්ම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (CA Sri Lanka) ද අධි සාමාජිකත්වය දරයි. එමෙන්ම KPMG ආයතනයේ Alumnus සංගමයේ සාමාජිකාවකි. ඇය වසර 19 ක පශ්චාත් සුදුසුකම් අත්දැකීම් වලට හිමිකම් කියයි. ඇය බණ්ඩාරනායක ජාත්‍යන්තර ඩිප්ලෝමා පුහුණු ආයතනය විසින් මෙහෙයවන ලද පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර තිබේ. එමෙන්ම, ඉන්දියාවේ හයිද්‍රාබාද්හි පිහිටි ඉන්දියානු ව්‍යාපාරික පාසැල (Indian School of Business), මැනිලාහි පිහිටි ආසියානු සංවර්ධන බැංකුව, ජර්මනියේ බී එච් එෆ් බැංකුව (BHF Bank) යන ආයතන වෙතින් ඇය විධායක මට්ටමේ අධ්‍යාපනයක් ලබාගෙන ඇත. ඇය ශ්‍රී ලංකා ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ විධායක කමිටු සාමාජිකාවක ලෙස කටයුතු කර තිබේ.

**වෙනත් වර්තමාන තනතුරු**

අධ්‍යක්ෂ - උපායමාර්ග සහ ව්‍යාපාරික සංවර්ධනය, ෆෙන්ටන්ස් ලිමිටඩ්, හේලීස් සමූහසේවා (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ, පශ්චාත් ව්‍යාපාර කළමනාකරණ ආදි විද්‍යාර්ථයින්ගේ සංගමය (MBA Alumni Association), අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව, අධ්‍යක්ෂ, NSB ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ්.

**මීට පෙර දැරූ ප්‍රධාන තනතුරු**

ගණකාධිකාරී, හේලීස් පුද්ගලික සමාගමේ දීර්ඝ කාලීන සැලසුම් ඒකකය, හේලීස් පොදු සමාගමේ ඒකකය (Long Range Planning Unit), කළමනාකරු - උපයාමාර්ගික ව්‍යාපාර සංවර්ධන සහ ප්‍රධානී - උපයාමාර්ගික ව්‍යාපාර සංවර්ධනී, මූල්‍ය පාලක, ඊඑසීස් රෝහල් (පුද්ගලික) සමාගම

**අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සාමාජිකත්වය**

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපතිනි, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ග කමිටුවේ සාමාජික

### 4. එරංග ජයවර්ධන මහතා

අධ්‍යක්ෂ
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

**පත්කරන ලද දිනය**

2020 ජනවාරි 23

**නිපුණතා සහ අත්දැකීම්**

ජයවර්ධන මහතා ඇමරිකා එක්සත් ජනපදයේ රෙන්සෙලර් පොලිටෙක්නික් අධ්‍යාපන ආයතනයෙන් (Rensselaer Polytechnic Institute) විද්‍යාවේදී උපාධියක් සහ ඇමරිකා එක්සත් ජනපදයේ ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ විදුලි ඉංජිනේරු විද්‍යාව (Electrical Engineering) පිළිබඳ විද්‍යාපති උපාධියක් හදාරා තිබේ.

**වෙනත් වර්තමාන තනතුරු**

හිගා ෆුඩ්ස් පුද්ගලික සමාගමේ ප්‍රධාන විධායක නිළධාරී.

**මීට පෙර දැරූ ප්‍රධාන තනතුරු**

අධ්‍යක්ෂ - ඩිජිටල්කරණ, මාස් ඉන්ටිමේට්ස් පුද්ගලික සමාගම, සාමාන්‍යාධිකාරී/අධ්‍යක්ෂ, මාස් ඉනෝවේෂන්ස් (MAS Innovations), සාමාන්‍යාධිකාරී - සැපයුම් සහ සැපයුම් දාමය (Sourcing & Supply Chain), මාස් ඉන්ටිමේට්ස් පුද්ගලික සමාගම, ප්‍රධාන විධායක නිළධාරී - සිලුටා (Silueta) පුද්ගලික සමාගම (මාස් ඉන්ටිමේට්ස් ආයතනයේ පරිපාලිතයකි), ජ්‍යෙෂ්ඨ කළමනාකරු - නවෝත්පාදන සැපයුම් දාම, සැලසුම්කරණය හා ප්‍රසම්පාදන, ඇපල් කෙයා (Apple Care), ඇපල් ඉන්කෝපරේෂන් ආයතනය (Apple Inc. Cupertino, CA, USA), ඉල්ලුම සැලසුම්කරණ කළමනාකරු, සිස්කෝ සිස්ටම්ස් ආයතනය (Cisco Systems, San Jose, CA, USA)

**අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සාමාජිකත්වය**

අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ග කමිටුවේ කමිටු සාමාජික

### 5. බ්‍රිගේඩියර් (විශ්‍රාමික) ආචාර්ය තිරාන් ද සිල්වා

අධ්‍යක්ෂ
ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

**පත්කරන ලද දිනය**

2020 ජනවාරි 17

**නිපුණතා සහ අත්දැකීම්**

ආචාර්ය ද සිල්වා ශ්‍රී ලංකා හමුදා ඉතිහාසයේ ලාබාලතම බ්‍රිගේඩියර්වරයා, ශ්‍රී ලංකා හමුදාවේ අධ්‍යක්ෂ ධූරයකට පත් කරන ලද ලාබාලතම නිළධාරියා සහ ආරක්ෂක අමාත්‍යංශයේ සේවය කළ ලාබාලතම අධ්‍යක්ෂ ජෙනරාල්වරයා ලෙස ඉතිහාසයට එක්වේ. එසේම, ඔහු ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රයේ ප්‍රධාන තොරතුරු නිළධාරියෙකු ලෙස කටයුතු කළ ලාබාලතම පුද්ගලයාද වේ. ඒ මහතා රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේම විවිධ තනතුරු හොබවා තිබෙන අතර විසල් අත්දැකීම් සමුදායකට හිමිකම් කියයි. ඕස්ට්‍රේලියාවේ මධ්‍යම ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලයේ (Central Queensland University) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධියක්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශනය පිළිබඳ ආචාර්ය උපාධියක්, ඔස්ට්‍රේලියාවේ චාර්ල්ස් ස්ටුර්ට් විශ්වවිද්‍යාලයේ (Charles Sturt University) තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් සහ ඔස්ට්‍රේලියාවේ ස්වින්බර්න් විශ්වවිද්‍යාලයේ (Swinburne University) තොරතුරු තාක්ෂණය (ගෞරව) පිළිබඳ මූලික උපාධියක් ඔහු සතුය. ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ මයික්‍රොසොෆ්ට් ආයතනයේ සර්වර් (Server) කළමනාකරණය (Server Management) පිළිබඳ මයික්‍රොසොෆ්ට් සහතිකලත් වෘත්තිකයෙක් (Microsoft Certified Professional on Server Management) වන අතර ශ්‍රී ලංකාවේ කෘතිම බුද්ධිය පිළිබඳ සහතිකලත් ස්නායුක ජාල (Certified Artificial Neural Networks on Artificial Intelligence) පිළිබඳ පාඨමාලාවක් හදාරා ඇත.

**වෙනත් වර්තමාන තනතුරු**

සභාපති/ප්‍රධාන විධායක නිළධාරී, සෙලාටා ටෙක් පුද්ගලික සමාගම (Celata Tech (Pvt) Ltd), අධ්‍යක්ෂ, NSB ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ්.

**මීට පෙර දැරූ ප්‍රධාන තනතුරු**

ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව, MBSL ෆයිනෑන්ෂල් සර්විසස් ලිමිටඩ් (MCSL Financial Services Ltd), සිටි හවුසින්ග් ඇන්ඩ් රියල් එස්ටේට් පුද්ගලික සමාගම (City Housing and Real Estate PLC), ට්‍රිලියම් රෙසිඩෙන්සීස් පුද්ගලික සමාගම (Trillium Residencies (Pvt) Ltd) යන ආයතනවල අධ්‍යක්ෂ ධූරය දරා ඇත.

අධ්‍යක්ෂ ජෙනරාල්, ආරක්ෂක අමාත්‍යංශයේ පර්යේෂණ සහ සංවර්ධනය සඳහා වන මධ්‍යස්ථානය, සයිබර් ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයේ නිර්මාතෘ සහ ප්‍රධානී, ප්‍රධාන තොරතුරු නිළධාරී/තොරතුරු තාක්ෂණ ප්‍රධානී, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, තොරතුරු උපදේශක, ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව, තොරතුරු උපදේශක, ශ්‍රී ලංකා උකස් හා අයෝජන බැංකුව, අධ්‍යක්ෂ/තොරතුරු තාක්ෂණ, ශ්‍රී ලංකා යුධ හමුදාව, තොරතුරු තාක්ෂණ ප්‍රධානී, ආරක්ෂක අමාත්‍යංශයේ පර්යේෂණ සහ සංවර්ධනය සඳහා වන මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කරනු ලබන භූගෝලීය තොරතුරු තාක්ෂණ පද්ධතිය (Head of IT/ GIS, Centre for Research and Development) සහ සමූහ සාමාන්‍යාධිකාරී/ටෙක් සමාගම් සමූහය.

**අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සාමාජිකත්වය**

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ග කමිටුවේ සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ කමිටු සාමාජික

**6. ආචාර්ය කපිල සේනානායක මහතා**

නිල බලයෙන් පත්වන අධ්‍යක්ෂ
ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

**පත්කරන ලද දිනය**

2020 ජනවාරි 22

**නිපුණතා සහ අත්දැකීම්**

වෘත්තියෙන් සිවිල් නිළධාරියෙකු වන ආචාර්ය කපිල කපිල සේනානායක මහතා ශාස්ත්‍රඥයෙකු ලෙස ඔහුගේ ප්‍රවීණතාවයට අදාළව විවිධ ජාත්‍යන්තර හා දේශීය ප්‍රකාශන සඳහා ශාස්ත්‍රීය ලිපි සපයා ඇති අතර ලොව පුරා පැවති ජාත්‍යන්තර සමුළු හා සම්මන්ත්‍රණ රැසකදී විවිධ කරුණු සම්බන්ධයෙන් දේශන පවත්වා තිබේ. ඔහු ඔස්ට්‍රේලියාවේ නිව් සවුත් වේල්ස් විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු ලෙසද කටයුතු කර ඇත. ආචාර්ය කපිල සේනානායක මහතා ඔස්ට්‍රේලියාවේ නිව් සවුත් වේල්ස් විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක්, ජපානයේ හිතොත්සුභාෂි විශ්වවිද්‍යාලයේ ව්‍යාපාරික උපයාමාර්ග පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ පශ්චාත් උපාධියක්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් 2 වන පන්තියේ ඉහළ සාමාර්ථයක් සමග වාණිජවේදී (විශේෂ) උපාධියක් හිමි කරගෙන ඇත. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සහ ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් (SLIDA) මෙහෙයවන කළමනාකරණය හා පරිපාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලා ඒ මහතා විසින් සාර්ථකව සම්පූර්ණ කරනු ලැබ තිබේ.

**වෙනත් වර්තමාන තනතුරු**

අධ්‍යක්ෂ ජෙනරාල් – රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යංශය

**මීට පෙර දැරූ ප්‍රධාන තනතුරු**

නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැඩබලන) සහ සහකාර අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ සහකාර අධ්‍යක්ෂ, ජාතික සැලසුම්කරණ දෙපාර්තමේනතුව, මුදල් හා සැලසුම් අමාත්‍යංශය

**අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සාමාජිකත්වය**

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ කමිටු සාමාජික

**දමිතා රත්නායක මිය**

වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී

පත්කරන ලද දිනය

2020 පෙබරවාරි 25

**නිපුණතා සහ අත්දැකීම්**

රත්නායක මහත්මිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ මූලික උපාධියක්, කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ ඔස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය ශාස්ත්‍රපති පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් ලබාගෙන තිබේ.

**වෙනත් වර්තමාන තනතුරු**

අධ්‍යක්ෂ, NSB ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ්, අධ්‍යක්ෂ, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යංශය සහ අධ්‍යක්ෂ, ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව

**මීට පෙර දැරූ ප්‍රධාන තනතුරු**

සහකාර අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව, නියෝජ්‍ය අධ්‍යක්ෂ, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ, මහජන බැංකුව, අධ්‍යක්ෂ – වයඹ සංවර්ධන බැංකුව සහ සභාපතිනි – කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය.

**අනුපමා මුහන්දිරම් මිය**

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

පත්කරන ලද දිනය

2015 නොවැම්බර් 16

**නිපුණතා සහ අත්දැකීම්**

නීතිඥවරියක් වන අනුපමා මුහන්දිරම් මහත්මිය එක්සත් රාජධානියේ කාර්ඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයෙන් නීතිපති උපාධියක්, ඉන්දියාවේ මනිපාල් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් සහ නීති අධ්‍යාපනය පිළිබඳ ශ්‍රී ලංකා සංස්ථාපිත කවුන්සිලයෙන් පශ්චාත් නීතිඥ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා ඇත.

2016 දෙසැම්බර් 6 වන දින ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් තනතුරට පත්වීමට ප්‍රථම ඇය 2015 නොවැම්බර් මස සිට 2016 දෙසැම්බර් මස දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සහකාර ලේකම්වරයා ලෙස කටයුතු කළාය. එසේම, ඇය 2015 සිට 2017 දක්වාවූ කාල සීමාව තුලදී NSB ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ්හි සමාගම් ලේකම් වශයෙන්ද කටයුතු කළාය. ඒ මහත්මියගේ වසර 23 කට වැඩි බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ අත්දැකීම් අතුරින් වසර 18 කට වැඩි කාල සීමාවක් ඇය මහජන බැංකුවේ නීති නිළධාරිනියකු හා අධ්‍යක්ෂ මණ්ඩල සහකාර ලේකම් ලෙස සේවය කර ඇත.

මුහන්දිරම් මහත්මිය සබරගමුව විශ්වවිද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරියක් (වාණිජ නීතිය) ලෙසද සේවය කරන අතර ශ්‍රී ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩල/සමාගම් ලේකම්වරුන්ගේ සංගමයේ නිර්මාතෘ වේ.

# ආයතනික කළමනාකාරීත්වය

(1)
**කේ බී විජයරත්න මයා**
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

(2)
**දමිතා රත්නායක මිය**
වැඩ බලන සාමාන්‍යාධිකාරී

(3)
**කේ රවීන්ද්‍රන් මයා**
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

(4)
**කේ කේ වී වී එල් ඩබ්ලිව් කරුණාතිලක මයා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි)

(5)
**සී එස් ජේසුඩියන් මෙය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය)

(6)
**එම් කිරිදරන් මයා**
උපදේශක (නීති)

(7)
**ජී වී ඒ ඩී ඩී සිල්වා මෙය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (භාණ්ඩාගාර)

(8)
**එම් පී ඒ ඩබ්ලිව් පීරිස් මයා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)

(9)
**බී පී ජේ ගුණසේකර මිය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ජාත්‍යන්තර)

(10)
**ජී ඩබ්ලිව් ඊ ජයවීර මයා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විගණන)




8
7
6
5
1
2
3
4

# විධායක කළමනාකාරීත්වය




18
17
16
15
14
13
12
11
10
9
8
7
1
2
3
4
5
6

1
**ජේ එච් ටී චන්ද්‍රරත්න මයා**
සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු)

2
**එම් එන් ඒ ප්‍රනාන්දු මෙය**
සහකාර සාමාන්‍යාධිකාරී
(මානව සම්පත් සංවර්ධන)

3
**එම් ටී ඒ ජේ එෆ් ගෝමිස් මයා**
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම් II)

4
**කේ එම් ඩබ්ලිව් එච් කේ කරුණාරත්න මයා**
සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු)

5
**කේ පී ඩී එම් ද සිල්වා මිය**
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම් I)

6
**කේ එස් වීරසේන මයා**
සහකාර සාමාන්‍යාධිකාරී
(මානව සම්පත් සංවර්ධන)

7
**ආර් ඒ එන් එන් විජේසිංහ මයා**
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම් III)

8
**එම් සී රාජපක්ෂ මයා**
සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)

9
**සී ඩබ්ලිව් පතිරණ මිය**
සහකාර සාමාන්‍යාධිකාරී (උපකාරක සේවා)

10
**එම් ඒ පී මුහන්දිරම් මිය**
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

11
**ඩබ්ලිව් එම් ආර් බී වීරකෝන් මයා**
සහකාර සාමාන්‍යාධිකාරී (ශාඛා සංවර්ධන)

12
**අයි කේ එල් ශෂී මහෙන්ද්‍රන් මිය**
අනුකූලතා නිළධාරී

13
**ඒ එල් ඒ හලීම් මයා**
සහකාර සාමාන්‍යාධිකාරී (ශාඛා සුපරීක්ෂණ)

14
**ඩබ්ලිව් පී යූ ඒ ද සිල්වා මිය**
සහකාර සාමාන්‍යාධිකාරී (අයකරගැනීම්)

15
**එම් ඩී සුරන්ජන් මයා**
සහකාර සාමාන්‍යාධිකාරී (විගණන)

16
**ඩී ඩී වික්‍රමසිංහ මිය**
සහකාර සාමාන්‍යාධිකාරී (ශාඛා ණය)

17
**එල් සී සේනානායක මයා**
සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)

18
**ආර් පී ඒ එම් පී රාජනායක මිය**
ප්‍රධාන අවදානම් නිළධාරී

19
**ඒ කේ එල් ඉලේසිංහ මයා**
ප්‍රධාන තොරතුරු නිළධාරී

20
**ආර් සී සමරසිංහ මිය**
සහකාර සාමාන්‍යාධිකාරී (ණය)

21
**එම් ඒ ගෝමස් මිය**
සහකාර සාමාන්‍යාධිකාරී (සැලසුම්)

22
**ටී එච් එස් අතපත්තු මයා**
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)

23
**එස් ඩබ්ලිව් ඒ වීරසිංහ මිය**
සහකාර සාමාන්‍යාධිකාරී (භාණ්ඩාගාර)

24
**එච් එම් එස් එල් ප්‍රනාන්දු මිය**
සහකාර සාමාන්‍යාධිකාරී (ජාත්‍යන්තර)



# ප්‍රධාන කළමනාකරුවන්

**එච් ආර් කරුණාමුනි මිය**
ප්‍රාදේශීය කාර්යාලය (බස්නාහිර 2)
ප්‍රාදේශීය කළමනාකරු

**ඩී සී ඔලබොඩුව මයා**
ප්‍රාදේශීය කාර්යාලය (වයඹ)
ප්‍රදේශීය කළමනාකරු

**සී එන් ඒකනායක මිය**
ප්‍රාදේශීය කාර්යාලය (බස්නාහිර 1)
ප්‍රාදේශීය කළමනාකරු

**ඒ එම් සී අත්තනායක මිය**
ප්‍රාදේශීය කාර්යාලය (සබරගමුව)
ප්‍රාදේශීය කළමනාකරු

**එස් සිවසොරූපන් මයා**
ප්‍රාදේශීය කාර්යාලය (නැගෙනහිර)
ප්‍රාදේශීය කළමනාකරු

**එන් බහීරදන් මයා**
ප්‍රාදේශීය කාර්යාලය (උතුර)
ප්‍රාදේශීය කළමනාකරු

**එස් බී සුරංග මයා**
ප්‍රාදේශීය කාර්යාලය (දකුණ)
ප්‍රාදේශීය කළමනාකරු

**ආර් පී ජයතිලක මයා**
ප්‍රාදේශීය කාර්යාලය (මධ්‍යම)
වැඩ බලන ප්‍රාදේශීය කළමනාකරු

**එච් එම් ජී පී ජේ හේරත් මයා**
භාණ්ඩාගාර අංශය
ප්‍රධාන කළමනාකරු

**ඒ බී සී ආර් විජයපාල මයා**
ශාඛා කළමනාකරණ අංශය
ප්‍රධාන කළමනාකරු - උකස්

**එම් වී ජී සුසිල් කුමාර මයා**
ජාත්‍යන්තර බැංකුකරණ අංශය
ප්‍රධාන කළමනාකරු

**කේ ටී එස් එස් ගුණවර්ධන මයා**
ආරක්ෂක අංශය
ප්‍රධාන කළමනාකරු

**ඩී එල් පී අබයසිංහ මයා**
NSB ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ්
ප්‍රධාන විධායක නිළධාරී

**එම් ඩබ්ලිව් කේ සී ද සිල්වා මයා**
ශාඛා කළමනාකරණ අංශය
ප්‍රධාන කළමනාකරු (මෙහෙයුම්)

**කේ ඩී කේ කේ විජයවර්ධන**
කාඩ්පත් මධ්‍යස්ථානය
ප්‍රධාන කළමනාකරු

**ඩී එම් සී පී බී දිසානායක මයා**
සාමාන්‍යාධිකාරී අංශය
ප්‍රධාන කළමනාකරු

**ඒ පී ආර් ද සොයිසා මයා**
තොරතුරු තාක්ෂණ අංශය
ප්‍රධාන කළමනාකරු (තොරතුරු ආරක්ෂණ)

**කේ ඒ ආර් ගුණතිලක මයා**
සුභසාධක අංශය
ප්‍රධාන කළමනාකරු

**එස් එස් ජේ පී එස් ද සිල්වා මිය**
මුදල් හා සැලසුම් අංශය
ප්‍රධාන කළමනාකරු

**එච් එස් පී රණවීර මයා**
මුදල් හා සැලසුම් අංශය
ප්‍රධාන කළමනාකරු

**එස් ඒ එම් ඒ සී ජේ එස් කේ සේනාරත්න මිය**
නීති අංශය
ප්‍රධාන කළමනාකරු

**එස් ඒ ඒ බටුවන්තුඩාව මයා**
ණය අංශය
ප්‍රධාන කළමනාකරු

**ඩී ඒ වී විජේවන්ත මිය**
කිරිබත්ගොඩ ශාඛාව
ශාඛා කළමනාකරු

**එස් එච් ඒ එස් කුමාරි මිය**
සේවාවසාන ප්‍රතිලාභ අංශය
ප්‍රධාන කළමනාකරු

**එන් අයි ගුණතිලක මිය**
ණය අංශය
ප්‍රධාන කළමනාකරු

**එච් ඩී යූ සුසන්ත කුමාර මයා**
බදුල්ල ශාඛාව
ශාඛා කළමනාකරු

**පී ඒ ජී එල් හේමාල් මයා**
වෙන්නප්පුව ශාඛාව
ශාඛා කළමනාකරු

**එස් මිෂ්බා මිය**
මහනුවර තැපැල් බැංකු ශාඛාව
ශාඛා කළමනාකරු

**ජී හපුආරච්චි මිය**
මහනුවර ශාඛාව
ශාඛා කළමනාකරු

**ජේ එම් ඒ කේ ජයසිංහ මිය**
නගර ශාඛාව
ශාඛා කළමනාකරු

**කේ බී එන් සී කුමාරි මිය**
මුදල් හා සැලසුම් අංශය
ප්‍රධාන කළමනාකරු

**එම් එස් ඊ හල්කෙවෙල මිය**
ගාල්ල ශාඛාව
ප්‍රධාන කළමනාකරු (නීති)

**ඒ එම් ජී අලහකෝන් බණ්ඩා මයා**
ගම්පහ ශාඛාව
ශාඛා කළමනාකරු

**ටී ඩී පී පෙරේරා මයා**
මානව සම්පත් සංවර්ධන අංශය
ප්‍රධාන කළමනාකරු (පිරිස්)

**එම් ටී හුසේන් මයා**
තොරතුරු තාක්ෂණ අංශය
ප්‍රධාන කළමනාකරු
(තොරතුරු සන්නිවේදන තාක්ෂණ මෙහෙයුම්)

**ආර් ආර් ඩී එස් ධර්මවික්‍රම මිය**
ජා-ඇල ශාඛාව
ශාඛා කළමනාකරු

**කේ සී තයාන්තන් මිය**
චුන්නාකම් ශාඛාව
ශාඛා කළමනාකරු

**එම් ඩී ටී පෙරේරා මිය**
අලෙවි අංශය
ප්‍රධාන කළමනාකරු

**ඩබ්ලිව් ඊ සී පෙරේරා මිය**
අවදානම් කළමනාකරණ අංශය
ප්‍රධාන කළමනාකරු

**ජේ එල් පී මංජුල මයා**
අවදානම් කළමනාකරණ අංශය
ප්‍රධාන කළමනාකරු

**ඕ ජී ඩබ්ලිව් එම් ගෞරවවංස මිය**
භාණ්ඩාගාර ගිණුම් අංශය
ප්‍රධාන කළමනාකරු


# ආයතනික යහපාලනය පිළිබඳ ප්‍රකාශය

පාලනය යනු හුදෙක් අනුකූලතාවය හා බැඳුණු කරුණක් නොවන බව ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අපගේ අවබෝධයයි. එය වටිනාකම් නිර්මාණය කිරීමට අදාළ අපගේ ක්‍රියාවලියේ සියළු සාධක එකිනෙක හා සම්බන්ධ කරන රන් හුය වේ. අපගේ ක්‍රියා පිළිබඳව විනිවිදභාවය පවත්වාගන්නා හා වගවන අතර දිගු කාලීන වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියකට ඉඩ ලබාදීම සඳහා අපගේ වටිනාකම් සහ උපායමාර්ගික අරමුණු වලට අනුරූපව අප විසින් තෝරාගැනීම් සිදු කරනු ලබන බව සහතික කරමින් පාලනය අපගේ චින්තනය හා අප ක්‍රියාත්මක වන ආකාරය සමග ඒකාබද්ධ කර ඇත.

මනා ආචාරධර්ම පද්ධතියක් මත පදනම්වූ ඵලදායී නායකත්වය, අධීක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ වගවීම මත යහපාලනය අර්ථවත්වේ. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පනත මගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ කළමනාකාරීත්වයේ වගකීම් නිශ්චිතව දක්වා ඇත. බැංකුවේ ආර්ථික, සමාජයීය සහ පාරිසරික තිරසාරභාවය සහතික කරන අතර කොටස් හිමිකරු සහ කොටස් හිමිකරුගේ අභිලාෂ අතර තුලනයක් ඇති කරමින් බැංකුවේ කටයුතු නිවැරදිව දිශානුගත කිරීම සහ අධීක්ෂණය කිරීම යන වගකීම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. බැංකුවේ සමස්ත උපායමාර්ගය හා ආශ්‍රිත මෙහෙයුම් අරමුණු ළඟා කරගැනීම සඳහා බැංකුව යොමු කිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලය නායකත්වය සපයයි. බැංකුවේ උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි බලතල, අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හා සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී ප්‍රධාන කොටගත් ආයතනික කළමනාකාරීත්වය වෙත පවරනු ලැබ ඇත.

බැංකුව ආචාර ධර්ම මත පදනම්ව සහ ඵලදායීව මෙහෙයවීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. වගකිවයුතු ආයතනික පුරවැසියෙක් ලෙස එහි වගකිම් අවධාරණය කරමින් නීති සම්පාදනය, අදාළ වන ප්‍රතිපත්ති, රීති, අනුගම්‍ය නීති සහ සංග්‍රහ සමග අනුකූලතාවය ඔස්සේ අවංකභාවය, නිපුණතාවය, වගකීම, සාධාරණත්වය සහ විනිවිදභාවය රෝපණය කිරීම සහ ප්‍රදර්ශනය කිරීම සිදු කෙරේ. එබැවින්, පාලනය යනු බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතා සහ පාර්ශවකරුවන්ගේ අභිලාෂ සපුරාලීමෙහිලා ව්‍යාපාරික පහසුකම් සලසන්නනෙක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගනු ලබයි.

බැංකුවේ ආයතනික පාලනය සහ අනුකූලතා තත්ත්වය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සඳහා ග්‍රන්ථය 02 ඇමුණුම බලන්න.



# අවදානම් කළමනාකරණය පිළිබඳ ප්‍රකාශය

අවදානම් කළමනාකරණය, තිරසාර වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය උදෙසා බලගන්වන ලද අපගේ ව්‍යාපාරික ආකෘතියෙහි සහ ආයතනික උපායමාර්ගයෙහි කේන්ද්‍රීය සාධකයකි. අවදානම් කළමනාකරණයෙහිලා අපි තොරතුරු මත පදනම්වූ සහ විනිවිදභාවයෙන් යුත් ප්‍රවේශයක් අනුග මනය කරමු. පාර්ශවකරුවන්ගේ අභිලාෂ මුදුන්පමුණුවාලීමට කටයුතු කරමින් විචක්ෂණශීලී ආකාරයෙන් මෙහෙයුම් හා ඒ ආශ්‍රිත අවදානම් කළමනාකරණය කිරීම අපගේ සමස්ත පරමාර්ථය වේ. අවදානම් හඳුනාගැනීම, ඇගයීම, තක්සේරු කිරීම, සමාහාර කිරීම සහ කළමනාකරණය කිරීම මෙන්ම ව්‍යාපාරික මෙහෙයුම් අතර ප්‍රාග්ධනය ප්‍රශස්ත ලෙස බෙදී යන ආකාරය නිරීක්ෂණය කිරීම යන සාධක වලින් බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යභාරය සමන්විත වේ. අභ්‍යන්තර හා බාහිර අවදානම් වල බලපෑම කළමනාකරණය කිරීමෙහි පැවතිය හැකි ඕනෑම අඩුපාඩුවක් වටිනාකම් නිර්මාණය කිරීම සඳහා වන අපගේ මූලික උපායමාර්ගික අරමුණ කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කිරීම, කීර්තනාමය හානි කිරීම, මූල්‍ය සාධනයට බලපෑමක් ඇති කිරීම හෝ නියාමන සමග අනුකූල නොවීමක් ලෙස තහවුරු වනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේදී ස්ථාපිත කර ඇති අවදානම් කළමනාකරණ උපායමාර්ගය සහ අවදානම් අභිරුචිය සමග බැංකුවේ ව්‍යාපාරික උපායමාර්ගය පෙළගස්වා ඇත. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද අනුකමිටුවක් වන අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුන්වාදෙන ලද අවදානම් කළමනාකරණ උපායමාර්ග වල ඵලදායීතාවය සහ උපයෝගීතාවය පිළිබඳව දැනුවත්භාවය ඇති කරයි. අවදානම් කළමනාකරණයේ විෂයය පථය අපගේ පූර්ණ පරිපාලිත වන NSB ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව වෙතද විහිද යයි.

## දැක්ම

තාක්ෂණික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හේතුවෙන් ව්‍යාපාරික මෙහෙයුම් වල සිදුවන උපායමාර්ගික වෙනස්කම් සමග බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යාරාමුව ශක්තිමත් කෙරේ. ජාත්‍යන්තර යහපරිචයන් සහ ශ්‍රී ලංකා මහ බැංකු නියාමන කාර්යරාමුව සමග අනුකූල වෙමින් අවදානම් කළමනාකරණ කාර්යාරාමුව ආශ්‍රිතව අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සිදු කිරීමට එය උපකාර වනු ඇත.

## ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අවදානම් කළමනාකරණය

2019 වර්ෂය තුල පැවති අභියෝගාත්මක මෙහෙයුම් සන්දර්භය මධ්‍යයේ වුවද ඵලදායී සහ දැඩි අවදානම් කළමනාකරණ කාර්යරාමුවක් අනුගමනය කරමින් බැංකුව නොසැලී සිය ස්ථාවරත්වය පවත්වාගැනීමට සමත්විය. සක්‍රිය හා අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයක් තුලින් මතුවන අවදානම් ආශ්‍රිතව අපගේ අවදානම් කළමනාකරණ කාර්යරාමුව සකස්වේ. අපගේ අවදානම් අභිරුචිය ඉහළ සිට පහළට යන ප්‍රවේශය හා පහළ සිට ඉහළට යන ප්‍රවේශය සංයෝජනය කිරීම ඔස්සේ ස්ථාපිත කර ඇත. කලින් කලට ඉදිරිපත් කෙරෙන පූර්ව නිශ්චිත සීමා වලට අනුරූපව අවදානම් අභිරුචිය සමීපව තක්සේරු කෙරේ.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අවදානම් කළමනාකරණය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා ග්‍රන්ථය 02 ඇමුණුම පිටු අංක 248 සිට 274 දක්වා වන කොටස බලන්න.

# මූල්‍ය වාර්තා

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ 2019 වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධනය සහ මූල්‍ය තත්ත්වය, ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය මගින් නිරූපණය කරනු ලබයි. මූල්‍ය ප්‍රකාශන සමග මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් මූල්‍ය වාර්තා යටතේ 2 වන ග්‍රන්ථයෙහි දක්වා ඇත.

**188**
ආදායම්
ප්‍රකාශය

**189**
විස්තීර්ණ
ආදායම් ප්‍රකාශය

**190**
මූල්‍ය තත්ත්වය
පිළිබඳ ප්‍රකාශය



# ආදායම් ප්‍රකාශය

| | | බැංකුව | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2019 රු. '000 | 2018 රු. '000 | වෙනස % | 2019 රු. '000 | 2018 රු. '000 | වෙනස % |
| දළ ආදායම | 3 | **121,929,059** | 111,902,078 | 9 | **125,810,171** | 112,760,454 | 12 |
| පොළී ආදායම | | **118,729,784** | 110,506,931 | 7 | **120,351,774** | 111,718,948 | 8 |
| අඩුකළා: පොළී වියදම | | **89,897,770** | 85,622,275 | 5 | **90,868,139** | 86,460,269 | 5 |
| **ශුද්ධ පොළී ආදායම** | 4 | **28,832,014** | 24,884,656 | 16 | **29,483,635** | 25,258,679 | 17 |
| ගාස්තු සහ කොමිස් ආදායම | | **1,261,268** | 1,005,262 | 25 | **1,269,521** | 1,008,482 | 26 |
| අඩුකළා: ගාස්තු සහ කොමිස් වියදම | | **131,954** | 141,196 | (7) | **136,838** | 144,685 | (5) |
| **ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම** | 5 | **1,129,314** | 864,066 | 31 | **1,132,683** | 863,797 | 31 |
| වෙළඳාම් කටයුතුවලින් ලද ශුද්ධ ලාභය/(අලාභය) | 6 | **1,491,610** | (707,433) | 311 | **1,963,229** | (1,062,421) | 285 |
| ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණයන්ගෙන් ලත් ශුද්ධ ලාභය/(අලාභය) | 7 | **–** | – | | **–** | – | |
| මූල්‍ය වත්කම් හඳුනාගැනීම අත්හැරීම තුළින් ලත් ශුද්ධ ලාභය/(අලාභය) | 8 | **22,021** | 6,906 | 219 | **22,021** | 6,906 | 219 |
| වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ) | 9 | **424,376** | 1,090,412 | (61) | **2,203,626** | 1,088,539 | 102 |
| **මුළු මෙහෙයුම් ආදායම** | | **31,899,335** | 26,138,607 | 22 | **34,805,194** | 26,155,500 | 33 |
| අඩුකළා: හානිකරණ වියදම් | 10 | **565,536** | 871,049 | (35) | **590,700** | 870,994 | (32) |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම** | | **31,333,799** | 25,267,558 | 24 | **34,214,494** | 25,284,506 | 35 |
| **අඩුකළා: වියදම්** | | | | | | | |
| සේවක මණ්ඩල වියදම් | 11 | **10,157,926** | 9,262,705 | 10 | **10,217,978** | 9,302,548 | 10 |
| ක්ෂයවීම් හා ක්‍රමක්ෂය වියදම් | | **1,042,933** | 638,795 | 63 | **1,048,095** | 639,779 | 64 |
| වෙනත් වියදම් | 12 | **4,474,053** | 4,194,979 | 7 | **4,461,457** | 4,160,782 | 7 |
| **මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු සහ ණය ආපසු ගෙවීමේ බදු පෙර මෙහෙයුම් ලාභය** | | **15,658,887** | 11,171,079 | 40 | **18,486,964** | 11,181,397 | 65 |
| අඩුකළා: මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු | | **3,045,921** | 2,577,657 | 18 | **3,208,584** | 2,584,220 | 24 |
| මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බදු | | **366,157** | 343,688 | 7 | **383,614** | 344,563 | 11 |
| මූල්‍ය සේවා මත ණය ආපසු ගෙවීමේ බදු | | **1,785,171** | 308,371 | 479 | **1,803,225** | 308,371 | 485 |
| **මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු සහ ණය ආපසු ගෙවීමේ බදු පසු මෙහෙයුම් ලාභය** | | **10,461,638** | 7,941,364 | 32 | **13,091,541** | 7,944,243 | 65 |
| ආශ්‍රිත සමාගම්වල සහ බද්ධ ව්‍යාපාර වල ලාභයෙන් හිමි කොටස | | **–** | – | – | **–** | – | – |
| **ආදායම් බදුවලට පෙර ලාභය** | | **10,461,638** | 7,941,364 | 32 | **13,091,541** | 7,944,243 | 65 |
| අඩුකළා: ආදායම් බදු වියදම | 13 | **3,763,405** | 3,441,213 | 9 | **4,061,569** | 3,444,056 | 18 |
| **වර්ෂය සඳහා ලාභය** | | **6,698,233** | 4,500,151 | 49 | **9,029,972** | 4,500,187 | 101 |
| **ලාභය බෙදී යන ආකාරය** | | | | | | | |
| පාලක සමාගමේ හිමිකරුවන් | | **6,698,233** | 4,500,151 | 49 | **9,029,972** | 4,500,187 | 101 |
| පාලනයට යටත් නොවන හිමිකම් | | **–** | – | – | **–** | – | – |
| **වර්ෂය සඳහා ලාභය** | | **6,698,233** | 4,500,151 | 49 | **9,029,972** | 4,500,187 | 101 |
| **ලාභය මත කොටසක ඉපයීම** | | | | | | | |
| සාමාන්‍ය කොටසක මූලික ඉපයීම් (රු.) | 14 | **7.13** | 6.72 | 6 | **9.61** | 6.72 | 43 |
| සාමාන්‍ය කොටසක තනුක ඉපයීම් (රු.) | | **7.13** | 6.72 | 6 | **9.61** | 6.72 | 43 |
| **වර්ෂය සඳහා ලාභය** | | **6,698,233** | 4,500,151 | 49 | **9,029,972** | 4,500,187 | 101 |

# විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | බැංකුව | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2019 රු. '000 | 2018 රු. '000 | වෙනස % | 2019 රු. '000 | 2018 රු. '000 | වෙනස % |
| **වර්ෂය සඳහා ලාභය** | **6,698,233** | 4,500,151 | 49 | **9,029,972** | 4,500,187 | 101 |
| **ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කළ යුතු වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | | |
| විදේශ ගනුදෙනු පරිවර්තනය මත වූ විනිමය වෙනස්කම් | – | – | – | – | – | – |
| ඉදිරි රැකුම් මුදල් ප්‍රවාහ කටයුතු වලින් ලත් ශුද්ධ ලාභ/(අලාභ) | – | (291,924) | (100) | – | (291,924) | (100) |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට පවතින ණය උපකරණ මත ශුද්ධ ලාභ/(අලාභ) | – | – | – | – | – | – |
| ආශ්‍රිත සමාගම් සහ බද්ධ ව්‍යාපාර වල ලාභයෙන් හිමි කොටස | – | – | – | – | – | – |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට පත් කළ ණය උපකරණ | **127,928** | (127,741) | 200 | **227,305** | (149,144) | 252 |
| අඩුකළා: වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කළ ණය උපකරණ ඉවත් කිරීම මත සාධාරණ අගය මත ලාභ/(අලාභ) | **(13,717)** | 1,370 | (1,101) | **(13,717)** | 1,370 | (1,101) |
| අඩුකළා: ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කළ යුතු අයිතමයන්ට අදාළ බදු වියදම් | – | – | – | – | – | – |
| **ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කළ යුතු වෙනත් විස්තීර්ණ ආදායම් එකතුව** | **114,211** | (418,295) | 127 | **213,588** | (439,698) | 149 |
| **ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කළ යුතු නොවන වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | | |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට පවතින හිමිකම් උපකරණවල ආයෝජනයන්හි සාධාරණ අගයෙහි වෙනස්වීම | **(324,635)** | (690,435) | (53) | **(320,297)** | (690,435) | (54) |
| ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට පවතින මූල්‍ය වගකීම් මත බැංකුවේ ණය අවදානම ආරෝපණය කිරීමේ සාධාරණ වෙනස්වීම | – | – | – | – | – | – |
| සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් නැවත ආගණනය | **(3,700,967)** | (210,861) | 1,655 | **(3,702,344)** | (211,258) | 1,653 |
| ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි වෙනස්වීම් | – | – | – | – | – | – |
| ආශ්‍රිත සමාගම් සහ බද්ධ ව්‍යාපාර වල ලාභයෙන් හිමි කොටස | – | – | – | – | – | – |
| අඩුකළා: ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය නොකළ යුතු අයිතමයන්ට අදාළ බදු වියදම | – | – | – | – | – | – |
| **ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණ කළ යුතු නොවන වෙනත් විස්තීර්ණ ආදායම් එකතුව** | **(4,025,602)** | (901,296) | 347 | **(4,022,641)** | (901,694) | 346 |
| වර්ෂයට අදාළ වෙනත් විස්තීර්ණ ආදායම්, බදු ගෙවූ පසු | **(3,911,391)** | (1,319,591) | 196 | **(3,809,053)** | (1,341,392) | 184 |
| වර්ෂයට අදාළ මුළු විස්තීර්ණ ආදායම | **2,786,842** | 3,180,560 | (12) | **5,220,919** | 3,158,795 | 65 |
| **ලාභය බෙදී යන ආකාරය** | | | | | | |
| පාලක සමාගමේ හිමිකරුවන් | **2,786,842** | 3,180,560 | (12) | **5,220,919** | 3,158,795 | 65 |
| පාලනයට යටත් නොවන හිමිකම් | – | – | – | – | – | – |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | **2,786,842** | 3,180,560 | (12) | **5,220,919** | 3,158,795 | 65 |

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | | බැංකුව | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2019 රු. '000 | 2018 රු. '000 | වෙනස % | 2019 රු. '000 | 2018 රු. '000 | වෙනස % |
| **වත්කම්** | | | | | | | |
| මුදල් හා මුදල්වලට සමානයන් | 16 | **5,376,715** | 3,434,524 | 57 | **5,564,824** | 3,436,929 | 62 |
| මහ බැංකුව වෙතැති ශේෂයන් | 17 | **–** | – | – | **58** | 177 | (67) |
| බැංකුවල ඇති තැන්පතු | 18 | **12,364,469** | 17,588,445 | (30) | **15,745,184** | 17,588,445 | (10) |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 19 | **11,622** | 4,740,106 | (100) | **11,622** | 4,740,106 | (100) |
| ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම් | 20 | | | | | | |
| - සාධාරණ අගයට ගණනය කළ | | **11,459,882** | 16,680,382 | (31) | **22,130,273** | 26,867,533 | (18) |
| - සාධාරණ අගයට නම් කළ | | **–** | – | – | **–** | – | – |
| ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් | | | | | | | |
| - ණය හා අත්තිකාරම් | 21 | **454,394,957** | 422,894,740 | 7 | **456,636,285** | 422,919,713 | 8 |
| - ණය හා වෙනත් උපකරණ | 22 | **615,634,321** | 518,947,969 | 19 | **619,567,786** | 522,973,159 | 18 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් | 23 | **3,478,811** | 6,184,430 | (44) | **4,626,582** | 7,788,560 | (41) |
| පාලිත සමාගම්වල ආයෝජනයන් | 24 | **4,811,000** | 1,700,000 | 183 | **–** | – | – |
| ආශ්‍රිත සමාගම්වල සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජනය | 25 | **–** | – | – | **–** | – | – |
| දේපල, පිරියත සහ උපකරණ | 26 | **14,163,454** | 13,465,755 | 5 | **14,457,494** | 13,468,776 | 7 |
| භාවිතයට අයිතිය ඇති වත්කම් | 27 | **1,073,507** | – | 100 | **1,130,868** | – | 100 |
| දේපල ආයෝජන | 28 | **–** | – | – | **333,315** | – | 100 |
| කීර්තිනාමය හා අස්පෘශ්‍ය වත්කම් | 29 | **–** | – | – | **–** | – | – |
| විලම්බිත බදු වත්කම් | 30 | **–** | – | – | **338** | 73 | 363 |
| වෙනත් වත්කම් | 31 | **35,197,923** | 31,209,216 | 13 | **35,370,115** | 31,532,684 | 12 |
| **මුළු වත්කම්** | | **1,157,966,664** | 1,036,845,567 | 12 | **1,175,574,745** | 1,051,316,155 | 12 |
| **වගකීම්** | | | | | | | |
| බැංකු වලට ගෙවිය යුතු | 32 | **35,045,251** | 77,119,146 | (55) | **36,139,122** | 83,615,264 | (57) |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 33 | **–** | 1,533 | (100) | **–** | 1,533 | (100) |
| ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වගකීම් | 34 | **–** | – | – | **–** | – | – |
| ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වගකීම් | 35 | | | | | | |
| - තැන්පත්කරුවන්ට ගෙවියයුතු | | **1,016,574,286** | 839,574,411 | 21 | **1,015,635,421** | 839,574,411 | 21 |
| - ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවියයුතු | | **–** | – | | **–** | – | – |
| - වෙනත් ණය ගැනීම් සඳහා ගෙවියයුතු | | **21,203,242** | 14,804,802 | 43 | **32,808,023** | 21,750,178 | 51 |
| කල්බදු වගකීම් | 36 | **1,066,882** | – | 100 | **1,121,441** | – | 100 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | 37 | **26,691,711** | 52,389,133 | (49) | **26,955,697** | 52,389,133 | (49) |
| සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් | 38 | **6,508,707** | 3,830,795 | 70 | **6,536,687** | 3,832,777 | 71 |
| ප්‍රවර්තන බදු වගකීම් | 39 | **–** | – | – | **565,704** | – | 100 |
| විලම්බිත බදු වගකීම් | 30 | **547,250** | 582,463 | (6) | **548,014** | 582,463 | (6) |
| වෙනත් වෙන්කිරීම් | 40 | **–** | – | – | **–** | – | – |
| වෙනත් වගකීම් | 41 | **5,951,464** | 5,447,277 | 9 | **7,430,415** | 5,452,317 | 36 |
| පාලිත සමාගම්වලට ගෙවියයුතු | 42 | **547** | 750 | (27) | **–** | – | – |
| **මුළු වගකීම්** | | **1,113,589,340** | 993,750,308 | 12 | **1,127,740,523** | 1,007,198,076 | 12 |

| දෙසැම්බර් 31 දිනට | සටහන් | බැංකුව 2019 රු. '000 | බැංකුව 2018 රු. '000 | බැංකුව වෙනස % | සමූහය 2019 රු. '000 | සමූහය 2018 රු. '000 | සමූහය වෙනස % |
|---|---|---|---|---|---|---|---|
| **හිමිකම්** | | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය | 43 | **9,400,000** | 9,400,000 | – | **9,400,000** | 9,400,000 | – |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 44 | **3,562,872** | 3,227,960 | 10 | **3,571,214** | 3,227,960 | 11 |
| රඳවාගත් ඉපයීම් | 45 | **4,464,442** | 3,984,674 | 12 | **7,233,981** | 4,561,045 | 59 |
| වෙනත් සංචිත | 46 | **26,950,010** | 26,482,625 | 2 | **27,629,027** | 26,929,074 | 3 |
| අයිතිකරුවන්ගේ මුළු හිමිකම | | **44,377,324** | 43,095,259 | 3 | **47,834,222** | 44,118,079 | 8 |
| පාලනයට යටත් නොවන හිමිකම් | 47 | **–** | – | – | **–** | – | – |
| **මුළු හිමිකම** | | **44,377,324** | 43,095,259 | 3 | **47,834,222** | 44,118,079 | 8 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **1,157,966,664** | 1,036,845,567 | 12 | **1,175,574,745** | 1,051,316,155 | 12 |
| **අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්** | 48 | **10,355,197** | 4,481,397 | 131 | **10,691,602** | 4,481,397 | 139 |
| **නාමික තොරතුරු** | | | | | | | |
| සේවක සංඛ්‍යාව | | **4,715** | 4,512 | | | | |
| ශාඛා සංඛ්‍යාව | | **256** | 255 | | | | |

**සටහන:** හානිකරණයෙන් හා ක්ෂය කිරීමෙන් පසු ශුද්ධ අගයන් දක්වා ඇත.

306 පිටුවේ සිට 424 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

**සහතික කිරීම**

ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට බැංකුවේ කටයුතු සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි ලාභය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පෙන්නුම් කරන බවට සහතික කරමි.

**කිත්සිරි විජයරත්න**

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල් හා සැලසුම්)

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

අනුමත කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

**කේෂිලා ජයවර්ධන මිය**
සභාපතිනිය
නිලධාරී

**ආචාර්ය කපිල සේනානායක**
අධ්‍යක්ෂ

**දමිතා රත්නායක මිය**
වැ.බ. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක

2020 මාර්තු 24

කොළඹ,
ශ්‍රී ලංකාව

# ආයතනික තොරතුරු

**බැංකුවේ නම**
ජාතික ඉතිරිකිරීමේ බැංකුව

**නෛතික ස්වරූපය**

**GRI 102-5**

1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත මගින් ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලද රජයට අයත් බැංකුවක් වන අතර, 1988 අංක 30 දරණ බැංකු පනත මගින් ඊට බලපත්‍රලාභී විශේෂිත බැංකුවක තත්ත්වය පිරිනමන ලදී

**ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන කාර්යාලය**

**GRI 102-3**

"ඉතිරිකිරීමේ මන්දිරය",
අංක 255, ගාලු පාර,
කොළඹ 03, ශ්‍රී ලංකාව.
දුරකථනය: +94 11 257 3008-15
ෆැක්ස්: +94 11 257 3178
ඊමේල්: nsbgen@nsb.lk
වෙබ් අඩවිය: http://www.nsb.lk
ස්විෆ්ට් කේතය: NSBALKLX
බැංකු කේතය: 7719
බදු ගෙවන්නන්ගේ හඳුනාගැනීමේ අංකය: 409046266

**සේවා මධ්‍යස්ථාන**
ශාඛා - 256
ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර/ප්‍රතිචක්‍රීයකරණ යන්ත්‍ර - 334

**නියෝජිතායතන ජාලය**
දිවයින පුරා පැතිර පවතින තැපැල් කාර්යාල 653 ක් සහ උපතැපැල් කාර්යාල 3,410

**දේශීය ශ්‍රේණිගත කිරීම**
(SL) AAA (stable) ණය ශ්‍රේණිගත කිරීම
ICRA Lanka සමාගම විසින්

**ගෝලීය ශ්‍රේණිගත කිරීම**
ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම B ස්ථාවර දෘෂ්ටිය සමඟ

**අධ්‍යක්ෂ මණ්ඩලය**
කේෂිලා ජයවර්ධන මිය - සභාපතිනිය
යූ. ජී. ආර් ආරියරත්න මහතා - අධ්‍යක්ෂ (නිල බලයෙන් පත්)
ආචාර්ය එම්.කේ.සී.සේනානායක මහතා - අධ්‍යක්ෂ (නිල බලයෙන් පත්)
ආචාර්ය තිරාන් ද සිල්වා මහතා - අධ්‍යක්ෂ
මනෝහාරී අබේසේකර මිය - අධ්‍යක්ෂ
එරංග ජයවර්ධන මහතා - අධ්‍යක්ෂ

**වැඩබලන සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී**
දමිතා රත්නායක මිය

**අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**
එම්. ඒ. පී. මුහන්දිරම් මිය

**අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC)***
මනෝහාරී අබේසේකර මිය - සභාපතිනිය
ආචාර්ය එම්.කේ.සී.සේනානායක මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)***
ආචාර්ය එම්.කේ.සී.සේනානායක මහතා - සභාපති
මනෝහාරී අබේසේකර මිය

**අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව (BHRRC)***
කේෂිලා ජයවර්ධන මිය - සභාපතිනිය
ආචාර්ය තිරාන් ද සිල්වා මහතා
යූ. ජී. ආර් ආරියරත්න මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව (BNC)***
යූ. ජී. ආර් ආරියරත්න මහතා - සභාපති
ආචාර්ය තිරාන් ද සිල්වා මහතා
ආචාර්ය එම්. කේ. සී.සේනානායක මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව (BCC)***
කේෂිලා ජයවර්ධන මිය - සභාපතිනිය
එරංග ජයවර්ධන මහතා
මනෝහාරී අබේසේකර මිය

**අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපාය මාර්ග කමිටුව (BITSC)***
ආචාර්ය තිරාන් ද සිල්වා මහතා - සභාපති
එරංග ජයවර්ධන මහතා
මනෝහාරී අබේසේකර මිය

**අනුකූලතා නිලධාරී**
අයි. කේ. එල්. සසී මහේන්ද්‍රන් මිය

**විගණකවරුන්**
විගණකාධිපති

**ගිණුම්කරණ වසර**
දෙසැම්බර් 31

**ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පරිපාලිත සමාගම්**
සී.ස. එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම

**ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන කාර්යාලය**
අංක 400, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව
දුරකථනය: +94 11 2425010-12, 2565957
ෆැක්ස්: +94 11 1564706, 2574387
ඊමේල්: nsbfmc@nsb.lk
වෙබ් අඩවිය: https//www.nsb.lk/fund-management
ස්විෆ්ට් කේතය: NSBFLKLXXXX)
බදු ගෙවන්නන්ගේ හඳුනාගැනීමේ අංකය: 134008512

**අධ්‍යක්ෂ මණ්ඩලය**
කේෂිලා ජයවර්ධන මිය - සභාපතිනිය
යූ. ජී. ආර් ආරියරත්න මහතා - අධ්‍යක්ෂ
මනෝහාරී අබේසේකර මිය - අධ්‍යක්ෂ
ආචාර්ය තිරාන් ද සිල්වා මහතා - අධ්‍යක්ෂ
ඩබ්ලිව්. ඕ. රොඩ්‍රිගෝ මහතා - අධ්‍යක්ෂ
දමිතා රත්නායක මිය - අධ්‍යක්ෂක

**ප්‍රධාන විධායක නිලධාරී**
ඩී. එල්. පී. අබයසිංහ

**විගණකවරුන්**
විගණකාධිපති

**සමාගමේ ලේකම්**
ෆර්සානා අනීෆ් මිය

**සමාගමේ නම**
සී.ස. ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

**ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන කාර්යාලය**
අංක 265, වෝඩ් පෙදෙස, කොළඹ 07, ශ්‍රී ලංකාව
දුරකථනය: +94 11 2674700-3, 2691721-2
ෆැක්ස්: +94 11 2674705 - 7
ඊමේල්: info@slsbl.lk
බදු ගෙවන්නන්ගේ හඳුනාගැනීමේ අංකය: 134013370

**අධ්‍යක්ෂ මණ්ඩලය**
කේෂිලා ජයවර්ධන මිය - සභාපතිනිය
සුනිල් ගලගම මහතා - අධ්‍යක්ෂ
එච්. ඩී. පී. ගමගේ මහතා - අධ්‍යක්ෂ
එන්. පී. ඉඹුලගොඩ මහතා - අධ්‍යක්ෂ
ජනක අරුණශාන්ත මහතා - අධ්‍යක්ෂ

**විගණකවරුන්**
විගණකාධිපති

**සමාගමේ ලේකම්**
ජ්.ආර්.රම්‍යා පියසේකර මිය

*ලබා දී ඇති තොරතුරු වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය හා මණ්ඩල උප කමිටු වලය. 2019 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය හා මණ්ඩල උප කමිටු වල විස්තර සඳහා ආයතනික පාලන අංශයේ 201 සිට 205 දක්වා පිටු පරිශීලනය කරන්න.

★

**This Annual Report is Carbon Neutral**

Produced by Smart Media (Pvt) Limited, a carbon neutral company that offsets its direct and indirect GHG emissions through verified sources.


GSARN©
www.gsarn.org
Global Standard Annual Report Number©
LKA8355NSBXX0190000E106

SMART MEDIA
The ANNUAL REPORT Company
www.SmartAnnualReport.com

PARTNER Carbonfree® Carbonfund.org
www.carbonfund.org

9 789551 619190